වි.ජී. අපනාසියෙව්

මාක්ස්වාදී දර්ශනයේ මූලධර්ම

LIBERATIONBASE
https://liberationbase.wordpress.com
https://liberationbase.wordpress.com

LIBERATIONBASE
ඩිජිටල් පුස්තකාලය

ඩිජිටල් පුස්තකාලය සහ ලේඛණ සංරක්ෂණ ව්‍යාපෘතිය
ආරම්භය (*NMSG Library* ලෙස): 2010
LIBERATIONBASE ලෙස නැවත නාමකරණය: 2013

සූචිකරණ දත්ත

කෘතිය: මාක්ස්වාදී දර්ශනයේ මූලධර්ම
කතෘ/පරිවර්තක: වී. ජී. අපනාසියෙව්/ ඇදිගම. වී. රුද්රිගු
ප්‍රකාශක: ප්‍රගති ප්‍රකාශක මන්දිරය, මොස්කව්
පළමු ඩිජිටල් පළ කිරීම: 2016-05-07
ඩිජිටල් සංස්කරණයන්: V1:2016-05-07, V2:2019-05-31
පිටු ගණන: 225
භාෂා මාධ්‍ය: සිංහල
ගොනු ආකෘතිය: PDF

Web: https://liberationbase.wordpress.com
Email: slradical@ymail.com

LIBERATIONBASE
ඩිජිටල් පුස්තකාලය

ඩිජිටල් පුස්තකාලය සහ ලේඛණ සංරක්ෂණ ව්‍යාපෘතිය
ආරම්භය (*NMSG Library* ලෙස): 2010
LIBERATIONBASE ලෙස නැවත නාමකරණය: 2013

සූචිකරණ දත්ත
කෘතිය: මාක්ස්වාදී දර්ශනයේ මූලධර්ම
කතෘ/පරිවර්තක: වී. ජී. අපනාසියෙව්/ ඇදිගම. වී. රුද්රිගු
ප්‍රකාශක: ප්‍රගති ප්‍රකාශක මන්දිරය, මොස්කව්
පළමු ඩිජිටල් පළ කිරීම: 2016-05-07
ඩිජිටල් සංස්කරණයන්: V1:2016-05-07, V2:2019-05-31
පිටු ගණන: 225
භාෂා මාධ්‍ය: සිංහල
ගොනු ආකෘතිය: PDF

Web: https://liberationbase.wordpress.com
Email: slradical@ymail.com

වි.ජී. අපනාසියෙව්

මාක්ස්වාදී දර්ශනයේ මූලධර්ම

LIBERATIONBASE

ඓතිහාසික
භෞතිකවාදය

මොස්කව්
ප්‍රගති ප්‍රකාශක මන්දිරය
1978

https://liberationbase.wordpress.com

අනුවාදය: දුදිගම වී. රුද්රිගු

В. Г. Афанасьев
ОСНОВЫ ФИЛОСОФСКИХ ЗНАНИЙ
(Исторический материализм)
на языке сингала

පාඨකයින් වෙතටයි

මේම පොතේ අනුවාදය මුද්‍රණය හා සකස්කිරීම පිළිබඳව ඔබගේ අදහස්ද, ඔබගේ වෙනත් කිසියම් යෝජනාවක් වෙතොත් එයද දන්වා එවීමෙන් ප්‍රගති ප්‍රකාශක මන්දිරයේ කෘතඥතාවය ඔබට හිමි වේ.

අපේ ලිපිනය:
Progress Publishers,
17, Zubovsky Boulevard,
Moscow, USSR

© සිංහල අනුවාදය, ප්‍රගති
ප්‍රකාශක මන්දිරය, මොස්කව්, 1978

A $\frac{10503-702}{014(01)-78}$ 807—78

පටුන

I. ඓතිහාසික භෞතිකවාදය අධ්‍යයනය කරන්නේ මොනවාද

1. ඓතිහාසික භෞතිකවාදයේ බිහිවීම — සමාජය පිළිබඳ මත විප්ලවීය පෙරළියකට භාජනය වීම . . . .
2. ඓතිහාසික භෞතිකවාදයට විෂය වන කරුණු . .
3. ඓතිහාසික අවශ්‍යතාවය සහ මිනිස් නිදහස . . .
4. සමකාලීන ධනපති සමාජ විද්‍යාවේ අවිද්‍යාත්මක ස්වභාවය . . . .

II. සමාජ-ආර්ථික රටාව . . . .

1. සමාජ ජීවිතයේ ස්වාභාවික තත්ත්වයන් . . . .
2. සමාජ සංවර්ධනයේ ප්‍රධාන, තීරණාත්මක බලවේගය — නිෂ්පාදන ක්‍රමය ය . . . .
3. ආර්ථික පදනම සහ සමාජයේ උඩු ව්‍යුහය සහ ඒවායේ අන්‍යෝන්‍ය ක්‍රියාකාරිත්වය . . . .
4. සංකීර්ණ සමාජමය ජෛන්ද්‍රියයක් වශයෙන් සමාජ-ආර්ථික සැකැස්ම . . . .
5. සමාජ ඉතිහාසය සමාජ-අර්ථික සැකැස්මේ නියමානුකූල අනුප්‍රාප්තියේ සහ සංවර්ධනයේ ඉතිහාසය හැටියට . .
6. කොමියුනිස්ටවාදී සමාජ-ආර්ථික සැකැස්ම . . .

III. සමාජ සංවර්ධනයේ තීරණාත්මක බලවේගය පොදු ජනතාවය. සමාජය සහ පෞද්ගලිකත්වය . . . . . .

1. ජනතාව — ඓතිහාසික ක්‍රියාදාමයේ සැබෑ නිර්මාණකයාය, සමාජ සංවර්ධනයේ තීරණාත්මක

https://liberationbase.wordpress.com

බලවේගය එයයි 59
2. සමාජය හා පෞද්ගලිකත්වය 66
3. පුද්ගලයා ඉතිහාසය විෂයෙහි ඉටුකරන කාර්ය කොටස 70

IV. පංති සහ පංති සටන 76

1. පංතිවල සම්භවය සහ හරය 76
2. සතුරු පංති සහිත සමාජ සංවර්ධනයේ උල්පත පංති සටනය 78
3. ධනපති සමාජයේ පංති සටන 81
4. ධනවාදයේ සිට සමාජවාදය දක්වා පරිවර්තනය වන යුගයේදී පංති සහ පංති සටන 92
5. සමාජවාදී සමාජයේ පංති සංයෝජනය 97
6. පංති භේද නැති කිරීමේ මාර්ග 99

V. මිනිසුන්ගේ පොදුබවේ ඓතිහාසික ආකාර 104

1. වර්ගය, ගණ ගෝත්‍රය, වංශය, ජාතිය 104
2. ධනපති සමාජයේ ජාතිය හා ජාතික සම්බන්ධකම් 107
3. සමාජවාදය හා ජාතිය 113
4. පවුල 119

VI. රජය 123

1. රජයේ සම්භවය සහ එහි ස්වභාවය 123
2. සූරාකන සමාජයේ රජය 125
3. නිර්ධන පංතික ආඥාදායකත්වය 131
4. සමාජවාදී සමාජයේ රජය 142
5. රජය අභාවයට යාම පිළිබඳව 151

VII. සමාජ විප්ලවය 153

1. සමාජ විප්ලවය — ප්‍රතිවිරුද්ධ පංති සහිත සමාජයේ සංවර්ධන නියාමයකි 153
2. සමාජවාදී විප්ලවය 157
3. සමකාලීන යුගයේ සමාජවාදී විප්ලවය පිළිබඳව ලෙනින්වාදී න්‍යායයේ ජයග්‍රහණය 162

VIII. සමාජ විඥානය සහ එය සමාජ සංවර්ධනයේදී ඉටුකරන ක්‍රියා කලාපය 180

1. සමාජමය විඥානය සමාජීය සත්තාවෙහි පිළිබිඹුවකි 180
2. පෞද්ගලික හා සමාජීය විඥානය. සමාජීය මනෝවිද්‍යාව සහ දෘෂ්ටිය 186
3. මාක්ස්-ලෙනින්වාදී දෘෂ්ටිය 191

IX. සමාජීය විඥානයේ ආකාර. විද්‍යාව 193

1. දේශපාලන හා නීති සංකල්ප 193
2. සදාචාරය 199
3. ආගම 205
4. කලාව 209
5. විද්‍යාව 214

සමාප්තිය 223

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

I

ඓතිහාසික භෞතිකවාදය අධ්‍යයනය කරන්නේ මොනවාද

ප්‍රකෘතියේ පමණක් නොව සමාජයේද සංවර්ධනයෙහි දක්නට ඇත්තාවූ දයලෙක්තික භෞතිකවාදී ස්වභාවය හෙළිදරව් කිරීමෙන් මාක්ස් හා එංගල්ස් සමාජ සංවර්ධනය පිළිබඳ එකම විද්‍යාත්මක න්‍යාය වන ඓතිහාසික භෞතිකවාදය නිර්මාණය කළහ. අපි දැන්, ඓතිහාසික භෞතිකවාදය කුමක්ද යනු විග්‍රහ කරමු.

සමාජය පිළිබඳ මතවල මාක්ස්වාදය විසින් ඇතිකරන ලද විප්ලවයේ ස්වභාවය පිළිබඳව අපි මුලින් විස්තර කරමු.

LIBERATIONBASE

1. ඓතිහාසික භෞතිකවාදයේ බිහිවීම — සමාජය පිළිබඳ මත විප්ලවීය පෙරළියකට භාජනය වීම

බොහෝ ඈත කාලයක සිට චින්තකයෝ මිනිස් සමාජයේ සංවර්ධනය පිළිබඳ ප්‍රශ්න ගැනත්, එහි ගාමක බලවේගයන් ගැනත් සමාජයේ වෙනස්වීම් ආකස්මිකව සිදු වෙතැයිද නැතිනම් ඒවා අවශ්‍යතාවයන් විසින්, වාස්තවික නියාම විසින් සිදුකෙරේද යන්න ගැනත් කල්පනා කළහ. සමාජයේ සංවර්ධනය හේතු ඵල අනුව සිදුවේ නම් සමාජ ජීවිතයේ ප්‍රධාන හේතුව කුමක්ද? එහි පදනම කුමක්ද? මේවා සහ වෙනත් බොහෝ ප්‍රශ්න පැන නැගීම ස්වාභාවිකය. සමාජයේ ජීවත් වන මිනිසා එය සමග දහසක් සම්බන්ධකම් ඇතිකරගෙන සිටී. සමාජයේ ඉරණම හා එහි සංවර්ධන මාර්ගය පිළිබඳව නොසළකා සිටීමට මිනිසාට නොහැකිය.

මාක්ස්වාදය බිහි වීමට කලින් පවා වියතුන් සමාජ සංවර්ධනය පිළිබඳව නිවැරදි අදහස් රැසක් පළකොට තිබිණි. නිදසුනක් වශයෙන්

https://liberationbase.wordpress.com

දහඅටවැනි සියවසේ වුසූ ප්‍රංශ භෞතිකවාදියෝ, මිනිසා, ඔහුගේ සිතුම් පැතුම් හා හැසිරීම සමාජ පරිසරයේ බලපෑමේ ප්‍රතිඵලයක් වන බව පැවසුවෝය. ප්‍රංශ ධනපති ඉතිහාසඥයෝ (ගිසෝ, තියෙරී, මින්යේ) සමාජය තුළ ප්‍රති විරුද්ධ පංති සහ පංති සටන පවතින බව පෙන්වා දුන්හ. බ්‍රිතාන්‍ය ආර්ථික විද්‍යාඥයෝ (ඇඩම් ස්මිත්, ඩේවිඩ් රිකාඩෝ) සමාජයේ පංතිවල පැවැත්මේ පදනම ආර්ථික ජීවිතය තුළින් සොයා ගැනීමේ උත්සාහයක යෙදුනහ. මනෝරාජික සමාජවාදියෝ (සැන් සිමොන්, ෆූරියේ, ඕවන්) අනාගත කොමියුනිස්ට් සමාජයේ එක් හෝ තවත් අංගයක් කල් තියා දුටහ.

සමාජ සංවර්ධනය පිළිබඳ න්‍යායයට දහනවවැනි සියවසේ වුසූ රුසියානු විප්ලවවාදී ප්‍රජාතන්ත්‍රවාදීහු — බෙලින්ස්කි, හෙර්ට්සන්, චෙර්නිෂේව්ස්කි සහ අනිකුත් අය විශාල සේවයක් කළහ. සමාජ සංවර්ධනයේදී ආර්ථික ජීවිතය ඉටු කරන කාර්ය කොටසද, ඉතිහාසයේ නිර්මාණකයෝ මිනිස්සුය යන මතයද, සූරාකන සහ සූරාකනු ලබන පංතිවල අයිතිවාසිකම් අතර ගැලපීමක් ඇති විය නොහැකි බවද, දර්ශනවාදයේ, සාහිත්‍යයේ සහ කලා ශිල්පයේ පංතිමය ස්වභාවයද යනාදීවූ කරුණු ගැන ඔවුන් ඉදිරිපත් කළ අදහස් එම කාලය අනුව බලන කල අතිශයින්ම ගැඹුරු විය.

එසේවුවද, මාක්ස්වාදයට පෙර පැවති සමාජ විද්‍යාව* විද්‍යාත්මක නොවීය. එහි මූලික අඩුපාඩුකම් මොනවාද?

මාක්ස්ට පෙර සමාජ විද්‍යාව සම්පූර්ණයෙන්ම විඥානවාදයට යටත්ව තිබීම ඉන් පළමුවැන්නය. සමාජමය පරිසරය මිනිසා කෙරෙහි බලපාන බව කියා සිටි ප්‍රංශ භෞතිකවාදියෝ එම පරිසරය මිනිස් විචාර ශක්තියේ ප්‍රතිඵලයක් බව සාවද්‍ය ලෙස පිළිගත්හ. "අදහස් විසින් ලෝකය පාලනය කෙරෙයි" යන්න සමාජය පිළිබඳ ඔවුන්ගේ මතවල සංක්ෂේපය විය.

මාක්ස්ට පෙර වුසූ වෙනත් භෞතිකවාදීහුද සමාජය ගැන විඥානවාදී මතයක් දැරූහ. සමාජ සංවර්ධනය පිළිබඳවූ විඥානවාදී මතවල අවිද්‍යාත්මක ස්වභාවය පැහැදිලිය. ඓතිහාසික අවශ්‍යතාවය ගැනවූ චින්තනය මගින් හේගල් දර්ශනවාදයට අගනා සේවයක් කළද, මිනිස් ඉතිහාසය දයලෙක්තික ලෙස විග්‍රහ කිරීමට තැත් කළද, අවසානයේදී ඔහු එළඹුනේ දේව කැමැත්ත අනුව ලෝකය පාලනය වන්නේය යන සාවද්‍ය නිගමනයටය. "දෙවියෝ ලොව පාලනය කරති. උන්වහන්සේගේ සැලසුම් සපුරාලීමෙන් ලෝක ඉතිහාසය සකස්වෙයි."

---

* සමාජ විද්‍යාව — සමාජය පිළිබඳ උගන්වන විද්‍යාව.

ඉතිහාසය පිළිබඳ හේගල්ගේ දර්ශනික මතයේ සංක්ෂිප්තය එසේය.

විඥානවාදී ලෙස සමාජය වටහා ගැනීමට යාමෙන් ප්‍රාග් මාක්ස්වාදීය සමාජ විද්‍යාවේ තවත් දුර්වල කමක් ඇතිවිය. අදහස් විසින් ලෝකය පාලනය කෙරෙයි යන මතය පිළිගත් ප්‍රාග් මාක්ස්වාදී සමාජ විද්‍යාඥයෝ රජුන්, යුද්ධ සේනාධිපතීන්, විද්‍යාඥයින් ආදීවූ සම්භාවනීය පුද්ගලයින් එම අදහස් ක්‍රියාවට නගන අය ලෙස සිතා කටයුතු කළහ. එබැවින් මේ ශ්‍රේෂ්ඨ නායකයින් පමණක් ඉතිහාසය නිර්මාණය කරතියි යන සාවද්‍ය නිගමනයට ඔවුහු එළඹුණහ. ඓතිහාසික සංවර්ධනයේදී වැඩ කරන ජනතාව ඉටුකරණ තීරණාත්මක කාර්ය කොටස ඔවුහු නොදුටුවෝය.

ඓතිහාසික ක්‍රියාවලියෙහි වන දයලෙක්තික ස්වභාවය හෙළිදරව් කිරීමද ප්‍රාග් මාක්ස්වාදී සමාජ විද්‍යාවට කළ නොහැකි විය. ඔවුන් ඉතිහාසය ඉදිරිපත් කළේ එකිනෙකට අසම්බන්ධ කොටස් වලින් යුත් කැටියක් ලෙසටය. සමාජ ජීවිතයේ ඒකීයතාවය සහ අන්තර් සම්බන්ධතාවයන්ද ඓතිහාසික සිද්ධීන් පිටුපස ඇති සැබෑ ගාමක බලවේගයන් හා ද්‍රව්‍යමය උල්පත්ද, විඥානවාදීන්වන මොවුනට අවබෝධ කරගැනීමට බැරිවිය.

සමාජයේ ස්වභාවය තුළට ගැඹුරු ලෙස කාවැදීමටද එහි සංවර්ධනයේ සංකීර්ණත්වය සහ ප්‍රතිවිරුද්ධතාවය සම්පූර්ණයෙන් හෙළිකිරීමටද, සමත්වූයේ මාක්ස් හා එංගල්ස් පමණකි. පරණ සමාජ විද්‍යාවේ අඩුපාඩුකම් මැඩ නැගී සිටි ඔවුහු, සමාජ සංවර්ධනය පිළිබඳ ගුණාත්මක වශයෙන් අළුත් න්‍යායයක් වන ඓතිහාසීය භෞතිකවාදය නිර්මාණය කළහ. එමගින් සමාජය පිළිබඳ මතවල විප්ලවයක් ඇති කළහ.

මේ විප්ලවයෙහි හරය කුමක්ද?

මාක්ස් හා එංගල්ස් සමාජ විද්‍යාවෙන් විඥානවාදය පන්නා දැමූහ. ඔවුහු දර්ශනවාදයේ මූලික සිද්ධාන්තය නිවැරදි ලෙස සමාජයට ගැලපීමේ ප්‍රශ්නය විසඳාලූහ. ඓතිහාසීය භෞතිකවාදයේ ප්‍රධාන සිද්ධාන්තය එනම් සමාජ සත්තාව සමාජමය විඥානය තීරණය කරයි යන්න නිර්මාණය කළහ.

සමාජ සත්තාව සහ සමාජමය විඥානය යනු කුමක්ද?

සමාජ සත්තාව නැමති ක්ෂේත්‍රයට සමාජයේ ද්‍රව්‍යමය ජීවිතය අයත්වේ. මින් ප්‍රධාන දේ වන මිනිසුන්ගේ නිෂ්පාදනමය ක්‍රියා-කාරිත්වයද, නිෂ්පාදන ක්‍රියා දමයේදී මිනිසුන් අතර ඇතිවන ආර්ථික සම්බන්ධකම්ද මීට අයත්ය. සමාජමය විඥානය යනු මිනිසුන්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

සිය ප්‍රායෝගික ක්‍රියාකාරිත්වයේදී මෙහෙයැවීම් හා මග පෙන්වීම් ලබා ගන්නා අදහස් න්‍යායයන් හා දෘෂ්ටි සහිත ජනතාවගේ අධ්‍යාත්මික ජීවිතයයි.

සමාජ සත්තාව මූලික ස්ථානයත් සමාජමය විඥානය ද්වීතියික ස්ථානයත් දරන බව ස්ථිර කළ මාක්ස් සහ එංගල්ස් මිනිසුන් විද්‍යාව, කලා ශිල්ප, දර්ශනවාදය ආදී දේ ගැන ව්‍යාවෘත වන්නට පෙර ඔවුන්ට ආහාර පාන, වස්ත්‍ර හා නිවාස ලබාගත යුතු බවත්, ඒ සඳහා ඔවුන් වැඩ කර ද්‍රව්‍යමය සම්පත් නිෂ්පාදනය කළයුතු බවත් පෙන්වා දුන්හ. ඒ අනුව බලන කල ''ජීවත්වීම සඳහා අත්‍යාවශ්‍ය ද්‍රව්‍යමය මාධ්‍යයන් නිෂ්පාදනය කිරීම හා එහි ප්‍රතිඵලයක් වශයෙන්, එක් ජනතාවකගේ හෝ එක් නියමිත අවධියකදී හෝ ලබාගන්නා ආර්ථික සංවර්ධනය විසින් ඇති කරනු ලබන පදනම මත රාජ්‍ය ආයතනයන්ද, නීති පිළිබඳ සංකල්පයන්ද, කලා ශිල්පද, එපමණක් නොව ජනතාවගේ ආගමික අදහස් වුවද වර්ධනය විය. එබැවින් ඒ අනුව මිස ඒවා ගැන විස්තර කළ යුත්තේ මෙතෙක් කළ පරිදි අනිත් අතට නොවේ.''* ඓතිහාසික භෞතිකවාදය ඉතිහාසය පිළිබඳ සැබෑ විද්‍යාත්මක ද්‍රව්‍යවාදී උගැන්වීමකි.

අති විශාල සංඛ්‍යාවක්වූ සමාජමය සම්බන්ධතාවයන් අතුරෙන් ආර්ථික, නිෂ්පාදන සම්බන්ධතා ප්‍රධාන තීරණාත්මක ඒවා වශයෙන් වෙන්කොට පෙන්වූ මාක්ස් සහ එංගල්ස් ඓතිහාසික භෞතිකවාදයේ මූලික සංකල්පයක් වන සමාජ-ආර්ථික රටාව පිළිබඳ සංකල්පය නිර්මාණය කළහ.

සමාජ-ආර්ථික රටාව යනු මිනිසුන් අතර පවත්නා නිෂ්පාදන සහ ආර්ථික සම්බන්ධතාවයන්ගේ එක්තරා ක්‍රමයක් මත රඳා පවතින සමාජ සිදුවීම් හා ක්‍රියාදමයන් (ආර්ථිකයට, දෘෂ්ටියට, පවුලට හා ජීවන ක්‍රමය, ආදියට සම්බන්ධ) සියල්ල ඇතුලත් සමස්තයක් වන්නේය. එක් සමාජ-ආර්ථික රටාවක තැන තවත් වඩාත් දියුණු රටාවක් විසින් ගනු ලැබීමෙන් සමාජය වර්ධනයවෙයි. ආදි කල්පික සමූහ සමාජ රටාවේ සිට වහල් සමාජය දක්වාද, වහල් සමාජයේ සිට රදළ සමාජය දක්වාද, එතැන් සිට ධනපති සමාජය දක්වාද මිනිස් ඉතිහාසය වර්ධනය විය. අවසානයේදී එය කොමියුනිස්ට් සමාජ රටාව දක්වා වර්ධනය වනු ඇත.

---

* කාල් මාක්ස්, ප්‍රෙඩරික් එංගල්ස්. කෘති එකතුව, වෙළුම 19, පිටු 350—351. (මෙහි සඳහන්වන උප ග්‍රන්ථ සියල්ලම රුසියානු මුද්‍රණයන් බව සලකන්න. — සංස්කාරක)

ඓතිහාසික භෞතිකවාදය නිර්මාණය කළ මාක්ස් හා එංගල්ස් ඉතිහාසයේ සැබෑ නිර්මාණකයින් වන්නේ පොදු ජනතාව, වැඩකරන ජනතාව බව පෙන්වා දුන්හ. මිනිස්සු සිය ශ්‍රමය වැය කරමින් සියලු ද්‍රව්‍යමය වස්තු නිෂ්පාදනය කරති. මිනිස් සංහතියේ ජීවිතයට ප්‍රගතියට නැතිවම බැරි පදනම සකස් වන්නේ කෝටි සංඛ්‍යාත සාමාන්‍ය මිනිසුන් විසින් වැය කරනු ලබන ශ්‍රමයෙනි.

පැරණි සමාජ විද්‍යාවේ අධ්‍යාත්මකවාදී ස්වභාවය මැඩ ගෙන නැගී සිටි මාක්ස් හා එංගල්ස් සමාජ සංවර්ධනයේ වාස්තවික දයලෙක්තිකය හෙළි කළහ. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ඉතිහාසය තව දුරටත් එකිනෙකට අසම්බන්ධ සිද්ධීන් කැටියක් වශයෙන් නොව දයලෙක්තික නියාමයන් අනුව පාලනය වන අංගසම්පූර්ණ සහ සංගත ක්‍රියාදමයක් වශයෙන් පෙනිණි.

2. ඓතිහාසික භෞතිකවාදයට විෂය වන කරුණු

සමාජය සහ එහි සංවර්ධනයේ නියාම අධ්‍යයනය කිරීම ඓතිහාසික භෞතිකවාදයට විෂය වන කාරණා වන්නේය.

ස්වභාව ධර්මය පිළිබඳ වර්ධනයේ නියාම මෙන්ම මේ නියාමද වාස්තවිකය, එනම් මිනිසාගේ විඥනයෙන් නිදහස්ය. ස්වභාව ධර්මයේ නියාම මෙන්ම මේවා දැනගත හැකිවන අතර සිය ප්‍රායෝගික ක්‍රියාකාරිත්වයේදී මිනිසා ඒවා ක්‍රියාවට යොදවයි. එසේවූවද, සමාජ ජීවිතයේ නියාම සහ ස්වභාව ධර්මයේ නියාම අතර වැදගත් වෙනස්කම් ඇත්තේය. සමාජ සංවර්ධනයේ නියාම නිතරම ප්‍රකාශිතවන්නේ, තමන් සඳහා නිශ්චිත අරමුණු නියම කරගන්නා හා ඒවා සාර්ථක කිරීමට කටයුතු කරන බුද්ධිමත් මිනිසුන් මගින් වන අතර ස්වභාව ධර්මයේ නියාම වලින් පිළිබිඹු වන්නේ අන්ධ ස්වයංසිද්ධික බලවේගයන්ගේ ක්‍රියාකාරිත්වයයි.

සමාජ සංවර්ධනයේ නියාම ඓතිහාසික භෞතිකවාදය විසින් පමණක් නොව, වෙනත් සමාජ විද්‍යාවන් වන දේශපාලන අර්ථ ශාස්ත්‍රය, ඉතිහාසය, සෞන්දර්ය විද්‍යාව, ශික්ෂණ විද්‍යාව ආදී විද්‍යා විසින්ද හදුරනු ලැබේ. එහෙත් මේ සියළු විද්‍යා සමාජ සිද්ධීන් එක්තරා කණ්ඩායමක් පමණක් හදරයි, සමාජ සංවර්ධන ක්‍රියාදමය සමස්තයක් වශයෙන් ගෙන ඒගැන වැටහීමක් ලබාදීමට යොමු නොවී සමාජය එක් අංශයකින් පමණක් පිරික්සුමට භසු කරයි. නිදසුනක් වශයෙන්,

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

දේශපාලන අර්ථ ශාස්ත්‍රයෙන් මිනිසුන් අතර ඇති ආර්ථික නිෂ්පාදන සම්බන්ධතාවයන් හදුරනු ලැබේ. විවිධ යුගවලදී හා විවිධ රටවල සමාජ සංවර්ධනය පිළිබඳව ඉතිහාසයෙන් හදුරනු ලැබේ. සෞන්දර්ය විද්‍යාව කලා ශිල්ප ක්ෂේත්‍රයට සීමාවී ඇත, මේ ආදී වශයෙනි.

සමාජ විද්‍යාවන්ට වඩා වෙනස් ඓතිහාසික භෞතිකවාදය සමාජ සංවර්ධනයේ ඉතාම පොදු නියාම පමණක් හදරයි. මාක්ස්-ලෙනින්වාදී ලෝක දෘෂ්ටියේ අඛණ්ඩ කොටසක් වන ඓතිහාසික භෞතිකවාදය සමාජ ජීවිතයේ සිදුවීම්වලට විද්‍යාත්මක දයලෙක්තික භෞතිකවාදී විවරණයක් දෙයි. සමාජමය සත්තාව සහ සමාජමය විඥනය අතර ඇති සම්බන්ධයද, ද්‍රව්‍යමය සම්පත් නිෂ්පාදනය කිරීම ජන ජීවිතයට වැදගත් වීමද, සමාජමය අදහස්වල හා ඊට අනුරූපී සමාජ ආයතනවල ප්‍රභවය හා ඒවා ඉටුකරන කාර්ය කොටසද වැනි ඓතිහාසික වර්ධනය හා සම්බන්ධ පොදු වැදගත් ගැටළු එය විසින් නිරාකරණය කරනු ලබේ. ඉතිහාසය විෂයයෙහි පොදු ජනතාව හා පුද්ගලයින් ඉටුකරන කාර්ය කොටස කුමක්ද, පංති සහ පංති සටන් ඇතිවූයේ කෙසේද, රජය පැන නැංගේ කෙසේද, සමාජ විප්ලවයක් ඇතිවන්නේ මන්ද, ඓතිහාසික ක්‍රියාවලියෙහිදී ඒවායේ ඇති වැදගත්කම කුමක්ද යන සහ සමාජ සංවර්ධනයේ වෙනත් පොදු ගැටළු ගැනද දැනීමක් ලබා ගැනීමට ඓතිහාසික භෞතිකවාදය අපට හැකියාව ලබාදෙයි.

ඓතිහාසික භෞතිකවාදය විසින් හදුරනු ලබන නියාමයන් සියල්ලම ක්‍රියාකාරී වන්නේ එකම ක්ෂේත්‍රයේ නොවේ. මින් සමහර නියාමයන් සමාජ සංවර්ධනයේ සියලු අවධිවලදී ක්‍රියාකාරී වන අතර අනිත් ඒවා එහි විශේෂ අවධිවලදී ක්‍රියා කාරී වේ. සමාජ විඥනය හා සම්බන්ධයෙන් සමාජ සත්තාව ඉටුකරන තීරක කාර්ය කොටස පිළිබඳ නියාමයත්, සමාජ සංවර්ධනය සම්බන්ධයෙන් නිෂ්පාදන ක්‍රමය ඉටුකරන තීරක කාර්ය කොටස පිළිබඳ නියාමයත්, ඉහත කී ප්‍රථම කොටසට අයත් වේ. වෙනත් සමහර නියාම සමාජ සංවර්ධනයේ නියමිත අවධිවලදී පමණක් ක්‍රියාකාරී වේ. සතුරු පංතිවලට බෙදී තිබෙන සමාජ තුළ පමණක් ක්‍රියාත්මක වන පංති අරගලය පිළිබඳ නියාමය පසුකී කොටසට අයත්ය.

සමාජ සංවර්ධනයේ ඉතාමත් පොදු හා වැදගත් අංශ පිළිබිඹු කරන සමාන්තර ප්‍රවර්ග හා සංකල්ප පිළිබඳ පැහැදිලි කිරීමක්ද ඓතිහාසික භෞතිකවාදයෙන් සැපයේ. ''සමාජමය සත්තාව'', ''සමාජ විඥනය'', ''නිෂ්පාදන ක්‍රමය'', ''පදනම'' සහ ''උඩු ව්‍යුහය'' එම සංකල්පයනට ඇතුළත්. සමාජ වර්ධනය ගැන ඒකීය හා සංගත චිත්‍රයක් සැපයිය හැක්කේ ඓතිහාසික භෞතිකවාදයේ නියාම හා ප්‍රවර්ග සමස්තයට පමණකි.

ඉතිහාසය මුළුල්ලේම මිනිසුන් ලැබූ ප්‍රායෝගික අත්දැකීම් හා සමාජ විද්‍යාවන් ගේ ජයග්‍රහණයන් සාධාරණීකරණයේ ප්‍රතිඵලයක් වශයෙන් ඓතිහාසික භෞතිකවාදය බිහිවිය. ඉන් පරිබාහිරව එය ගැන සිතීමට නොපුළුවන. ඓතිහාසික භෞතිකවාදයෙන් තොරව, සමාජ සංවර්ධනයේ සාමාන්‍ය නියාම පිළිබඳ දැනීමකින් තොරව, කිසිම සමාජ විද්‍යාවකට ඵලදායී ලෙස වර්ධනය විය නොහැක. අනිකුත් සියලු සමාජ විද්‍යාවන්ගේ විධි ශාස්ත්‍රමය පදනම ඓතිහාසික භෞතිකවාදයයි. සමාජමය සිදුවීම් පිළිබඳ සංකීර්ණ අවුල් ජාලය තුළ මග තෝරා ගැනීමටද, සමාජ ජීවිතයේ වන ඒ හැම සිදුවීමකටම නියමිත ස්ථානය හා දැක්විය යුතු සැලකිල්ල විග්‍රහ කිරීමටද, ඉතිහාසඥයින්ට, ආර්ථික විද්‍යාඥයින්ට සහ අනිකුත් විද්‍යාඥයින්ටද එයින් හැකියාව ලැබේ. නිදර්ශනයක් වශයෙන්, සමාජ සංවර්ධනයේදී පොදු ජනතාව ඉටුකරන තීරණාත්මක කාර්ය කොටස පිළිබඳවූ ඓතිහාසික භෞතිකවාදී නියාමය ගැන දන්නා ඉතිහාසඥයකුට කිසියම් විශේෂ ඓතිහාසික සිදුවීමක සැබෑ ස්වභාවය හෙළිකළ හැකිය. සමාජයේ අධ්‍යාත්මික ජීවිතය රඳා පවත්නේ මිනිසුන්ගේ ආර්ථික, ද්‍රව්‍යමය සම්බන්ධකම් මත බව දන්නා ඉතිහාසඥයකුට විවිධ සිද්ධාන්ත සහ මතවල මූලාශ්‍රයන් සොයාගෙන ඒවා ඉටුකරන ඓතිහාසික කාර්ය කොටස නිසිලෙස තක්සේරු කළ හැකිවේ.

එමෙන්ම, වෙනත් සමාජමය විද්‍යාවන් සඳහාද ඓතිහාසික භෞතිකවාදය ඉතා වැදගත් වේ.

ඓතිහාසික භෞතිකවාදයේ නියාම පිළිබඳ දැනීම ඇතිකල අපට සමාජ ජීවිතයේ ගැටළු සහිත සිද්ධීන් වටහා ගැනීමට පමණක් නොව, සමාජ ජීවිතය කෙරෙහි බලපෑමට හා වැඩකරන ජනතාවගේ යහපත පිණිස එය වෙනස් කිරීමටද හැකියාව ලැබේ. සමාජ සංවර්ධනයේ නියාම අනුව යථාර්ථය වෙනස් කිරීම යනු මිනිස් සංහතියේ ප්‍රගතිශීලී සංවර්ධනය පිළිබඳ ඓතිහාසික අවශ්‍යතාවය ක්‍රියාවට නැංවීමය. මේ සංවර්ධන ක්‍රියාවලියේදී මිනිස් සංහතිය සැබෑ නිදහස දිනාගන්නේය. අවශ්‍යතාවය සහ නිදහස යන පාඨවලින් ඓතිහාසික භෞතිකවාදය අවබෝධ කරගන්නේ කුමක්ද යන්න ගැන අපි දැන් සොයා බලමු.

3. ඓතිහාසික අවශ්‍යතාවය සහ මිනිස් නිදහස

ඓතිහාසික අවශ්‍යතාවය යනු සමාජ සිද්ධිවල අභ්‍යන්තරික සම්බන්ධතාවයෙන් ස්වභාවික ලෙස පැන නගින්නක් බැවින් එය

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

අනිවාර්යයෙන්ම සිදුවිය යුත්තකි. නිදසුනක් වශයෙන් ද්‍රව්‍යමය නිෂ්පාදනය සමාජ ජීවිතයේ සියලු අංශ ගැන අවශ්‍යයෙන්ම තීරණය කරයි. එමෙන්ම සමාජමය විප්ලවයන් ඇතිවීම, නැතහොත් එක් සමාජ ක්‍රමයක් වෙනුවට තවත් සමාජ ක්‍රමයක් ඇතිවීම අවශ්‍යයෙන්ම සිදුවන්නකි.

ප්‍රතිගාමී ධනවාදී සමාජ විද්‍යාඥයෝ සහ ආගම් වාදීහු ඓතිහාසික අවශ්‍යතාවය නොපිළිගනිති. ඓතිහාසික ක්‍රියාදමයන් හැම එකක්ම දේව නියමය හෝ කැමැත්ත අනුව සිදුවන බවත්, මිනිසුන් සර්වබලධාරී දෙවියන්ගේ සෙල්ලම් බඩු පමණක් වන බවත් ආගමික පූජකවරු පවසති. දෙවියන් වහන්සේගේ කැමැත්තෙන් තොරව මිනිසකුගේ හිසින් කෙස් ගහක් හෝ බිම නොවැටෙන බව බයිබලයේ ලියා ඇත.

සමාජ සංවර්ධනයේ හරය විකෘති කරන ප්‍රතිගාමී ධනපති සමාජ විද්‍යාඥයෝ ඓතිහාසික අවශ්‍යතාවය නොපිළි ගනිති. එතැනින් නොනැවතී ඔවුහු මෙහිදී අනිත් අන්තයටම ගමන් කරමින් සමාජ ක්‍රියාකාරිත්වයේදී හිතුවක්කාරී භාවය රජකරන්නේයයි කියන මනෝමූල ධර්මයක් දේසනා කරති. ඔවුන්ගේ මතයේ හැටියට, මිනිසුන්ගේ හැසිරීම හා ක්‍රියාකාරිත්වය කිසිවක් විසින් නිගමනය නොකෙරෙන අතර එය කිසිවක් මත රඳා නොපවතියි. ඒ අතරම් ධනපති සමාජ විද්‍යාඥයෝ මාක්ස්වාදීන් දෛව වාදීන් වන බවත්, ඓතිහාසික අවශ්‍යතාවයට වඳින්නන් වන බවත් කියමින් සමාජමය නියාමයන් ඉදිරියේ මිනිසා බලහීන බව පවසති.

ඓතිහාසික අවශ්‍යතාවය විසින් මිනිසුන්ගේ විඥත ක්‍රියාකාරිත්වය කිසිසේත් ප්‍රතික්ෂේප නොකෙරෙන බවත්, එපමණක් නොව, එම ක්‍රියාකාරිත්වය මුලින්ම පිළිගෙන තිබෙන බවත් අවබොධ කර ගැනීම ධනවාදී දෘෂ්ටිවාදීන් දැඩි ලෙසම ප්‍රතික්ෂේප කරන්නේ ඔවුන්ගේ පංතිමය සීමාවන් නිසාය. සමාජ සංවර්ධනයේ නියාම අහෝසි කිරීමට හෝ අලුත් නියාම නිර්මානය කිරීමට හෝ මිනිසුන්ට නොපුළුවන. එහෙත් ඔවුනට මේ නියාම හා ඓතිහාසික අවශ්‍යතාවය ගැන අවබෝධ කර ගැනීමට පුළුවන. මේ අවශ්‍යතාවය ගැන දැනගැනීම නිසා සමාජ -ඓතිහාසික ක්‍රියාදමයට ක්‍රියාශීලී ලෙස බලපෑමට ඔවුන්ට පුළුවන. වාස්තවික අවශ්‍යතාවය අවබෝධ කර ගැනීමෙන්, නවීන විද්‍යාවේ හා තාක්ෂණික ශිල්පයේ ජයග්‍රහණ විසින් පෙන්වා දී ඇති පරිදි, මිනිසුන් ප්‍රකෘතියේ නියාම තම කැමැත්තට අවනත කර ගන්නවා පමණක් නොව, සමාජ සිද්ධීන් ගන්නා මාර්ගයද එලෙසම නිගමනය කර ගන්නා බව ප්‍රායෝගික අත්දැකීම් විසින් ප්‍රත්‍යක්ෂ ලෙස පෙන්වා දී තිබේ.

වාස්තවික අවශ්‍යතාවය පිළිබඳ දැනීම සහ එය මිනිසාගේ යහපත සඳහා යෙදවීම මිනිස් නිදහස වන්නේය.

නිදහසෙන් වාස්තවික අවශ්‍යතාවය අවලංගු නොවේ. මිනිසා අවශ්‍යතාවය අවබෝධකර ගන්නා බවත් එය සිය යහපත සඳහා උපයෝගී කර ගන්නා බවත් එයින් අදහස් වේ. මිනිස් නිදහස රඳා පවතින්නේ ප්‍රකෘතියේ හා සමාජයේ නියාමයන්ගෙන් ලබන කල්පිත නිදහසක් මත නොවේ, ඒ නියාම දැනගැනීම සහ ඒවා මිනිස් අවශ්‍යතාවයන් සඳහා උපයෝගී කර ගැනීමේ හැකියාව මතය. මිනිසාගේ ක්‍රියාකාරිත්වය නිදහස් වන්නේ එය වාස්තවික අවශ්‍යතාවයට අනුරූපී වූ කල්හි පමණකි.

නිදහස යනු දීර්ඝ කාලයක ඓතිහාසික සංවර්ධනයේ ප්‍රතිඵලයකි. විද්‍යාව හා නිෂ්පාදනය දියුණු වත්ම, මිනිසා ප්‍රකෘතිය සිය පාලනය යටතට ගෙන ඒමට පටන් ගත්තේය. ප්‍රකෘතියේ වාස්තවික නියාමයන් දැනගත් ඔහු, එමගින් ප්‍රකෘතියේ ක්‍රියාකාරීවන අවශ්‍යතාවය ක්‍රමයෙන් සිය අණසක යටතට ගෙනාවේය. එසේ කිරීමෙන් ඔහු ප්‍රකෘතිය සම්බන්ධයෙන් නිදහස ලැබීය. කෙසේ වුවද, ප්‍රකෘතියේ ක්‍රියාදමයන් නතු කරගත් පමණින්, මිනිසාට සමාජමය ක්‍රියාදමයන් නතු කර ගැනීමට හැකියාවක් නොලැබේ. ප්‍රාග් සමාජවාදීය සමාජවල නියාම අනුකූල සංවර්ධනය පිළිබඳ ඓතිහාසික අවශ්‍යතාවය මිනිසාට පාලනය නොකළ හැකි සාංසිද්ධික බලවේගයක් ලෙස ක්‍රියා කාරී විය. නිදසුනක් වශයෙන් ධනපති ක්‍රමය යටතේ අරාජික භාවයේ සහ තරඟයේ නියාමය විසින් මිනිසා අහඹුවට හසුවූ ඉත්තකු බවට පත්කරන අතර ඔහුට තම ක්‍රියාකාරිත්වය කල් ඇතිව සැලසුම් කර ගැනීමට අවස්ථාවක් නොලැබේ.

ඓතිහාසික අවශ්‍යතාවය පාලනය කිරීමටද සැබෑ නිදහස දිනාගැනීමටද හැකියාව පළමුවැනි වරට නිර්මානය කෙරෙන්නේ සමාජවාදයෙනි. සමාජවාදී විප්ලවය ජනසතු අයිතිය ප්‍රමුඛත්වයට පත් කරන අතර පංති ප්‍රතිවිරෝධතා ඉවත් කරයි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, මිනිසුන්ට විඥත ලෙස සමාජ ජීවිතය හසුරුවා ගැනීමට හැකිවේ. සමාජවාදයේ ජයග්‍රහණයත් සමගම අවශ්‍යතාවය රජයන තත්වයේ සිට ස්වාධීනත්වය රජයන තත්වයන් දක්වා සමාජය දැවැන්ත ඉදිරි පිම්මක් පනී. එපමණක් නොව සමාජය කොමියුනිස්ට් ක්‍රමය කරා වර්ධනය වත්ම, මිනිස් නිදහසද වඩාත් පුළුල් වී, වඩාත් විවිධ වන්නේය. ප්‍රකෘතිය සහ සමාජ ක්‍රියාදමයන් කෙරෙහිවූ ඔහුගේ ආධිපත්‍යය වර්ධනය වන්නේය. ඔහු තම පෞද්ගලික වුවමනාවන්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

සහ අපේක්ෂාවන් සමාජයේ උත්තරීතර පරමාර්ථ සමග ඒකාබද්ධ කිරීමට ඉගෙන ගනී.

මාක්ස්-ලෙනින්වාදී න්‍යායය පිළිබඳ දැනීම සහ එය ප්‍රවීණ ලෙස ක්‍රියාවට යෙදවීම පදනම් කරගත් වැඩකරන ජනතාවගේ විඥානීය නිෂ්පාදන සහ සමාජමය-දේශපාලන කටයුතු සමාජයේ මිනිසාගේ සැබෑ නිදහස වර්ධනය වීම සඳහා අවශ්‍ය අනිවාර්ය කොන්දේසියක් වන්නේය.

සෝවියට් සංගමයේ සහ අනිකුත් සමාජවාදී රටවල්වල අවශ්‍යතාවය හා නිදහස පිළිබඳ මාක්ස්-ලෙනින්වාදී න්‍යාය ක්‍රියාවට පෙරළා ඇත. අවසාන ලෙසත් අනුල්ලංඝනීය ලෙසත් නියම නිදහස මුල් බැස තිබේ. විජයග්‍රාහී සමාජවාදී විප්ලවයත් ජනතාවන්ගේ වීරෝදාර ශ්‍රමය හා ආත්ම-අභිබවන පරිශ්‍රමයත් නිසා එය දිනා ගෙන තිබේ. මේ සියලු දේටම නායකත්වය දී තිබෙන්නේ කොමියුනිස්ට් පක්ෂය විසිනි. සිය රටේ සැබෑ ස්වාමිත්වය ලැබූ, එමෙන්ම ඓතිහාසික අවශ්‍යතාවය අවබෝධ කරගත් ජනතාවෝ විඥත ලෙසත්, අරමුණු සහගතවත් තම ඉතිහාසය නිර්මාණය කිරීම සඳහා සීමා රහිත අවස්ථාවන් සලසාගෙන සිටිති.

එසේවුවද සමාජවාදය යටතේ නිදහස දිනා ගැනීම නිසා ඓතිහාසික අවශ්‍යතාවයේ වාස්තවික නියාමයන් ක්‍රියාකාරීවීම අවලංගු නොවේ. සමාජවාදය යටතේද අවශ්‍යතාවය, මිනිසාගේ ස්වාධීන ක්‍රියාකාරීත්වයේ වාස්තවික පදනම වන්නේය, වාස්තවික නියාමයන් ක්‍රියාකාරී වන්නේය. එහෙත් ජනතාව විඥත ලෙස එම නියාම උපයෝගී කර ගනිති.

4. සමකාලීන ධනපති සමාජ විද්‍යාවේ අවිද්‍යාත්මක ස්වභාවය

මිනිසාට වඩාත් යහපත් අනාගතයක් සඳහා සැබෑ මග පෙන්වන සමාජ සංවර්ධනය පිළිබඳ විද්‍යාත්මක න්‍යායය වන ඓතිහාසික භෞතිකවාදය ප්‍රතිගාමී ධනපතීන්ගේ සහ ඔවුන්ගේ දෘෂ්ටිවාදීන්ගේ වෛරයට පාත්‍ර වී ඇත. අනාගතය දෙස බියෙන් බලන ධනපති පංතිය, මිනිස් සංහතිය කොමියුනිස්ට්වාදය කරා යන නොවැලැක්විය හැකි ඉදිරි ගමන නවතාලිය නොහී යටත් පිරිසෙයින් ඓතිහාසික ප්‍රගතියට බාධා කිරීමට සහ ධනපති ක්‍රමයේ ආයුෂ දිගු කිරීමටවත් වෙර දරයි. ඒ සඳහා ආර්ථික, දේශපාලනමය හා දෘෂ්ටිමය යන හැම මාධ්‍යයක්ම

යොදු ගැනීමට ඔවුහු උත්සාහ දරති. ඔවුන්ගේ දෘෂ්ටිමය ආයුධ අතුරෙන් සමකාලීන ධනවාදී සමාජ විද්‍යාව වැදගත් ස්ථානයක් උසුලයි.

ධනවාදී සමාජ විද්‍යාවට අති විශාල ගණනක් නිකායයන් සහ ප්‍රවණතා ඇත්තේය. එහෙත් මේ හැම එකක්ම විඥානවාදය සහ අධ්‍යාත්මවාදය මත පදනම් වී ඇත.

සමාජ සංවර්ධනයේ වාස්තවික නියාමයන් ප්‍රතික්ෂේප කිරීම

සමකාලීන ධනවාදී සමාජ විද්‍යාවේ අතිශයින්ම කැපී පෙනෙන ලක්ෂණයක් නම්, සමාජ සංවර්ධනයේ වාස්තවික නියාමයන් ප්‍රතික්ෂේප කිරීමය. නොයෙක් සමාජ විද්‍යා ප්‍රවණතාවයන් මගින් කෙරෙන මෙම ප්‍රතික්ෂේපය ඉතාමත් විවිධාකාර ස්වරූපයක් ගනී. විවෘතව විඥානවාදීන් ලෙස පෙනී සිටින කණ්ඩායම පැහැදිලිවම කියන්නේ ඓතිහාසික නියාමයක් නැති බවත්, ඉතිහාසය යනු මිනිසාට අවබෝධ කරගත නොහැකි, ව්‍යාකූලත්වයේ හා අහඹුවේ රාජ්‍යයක් බවත්ය.

සමාජ විද්‍යාවේ මනෝවිද්‍යාත්මක නිකායේ නියෝජිතවරු මිනිසාගේ අභිප්‍රායයන්, අධිෂ්ඨානයන් සහ හැඟුම් මාත්‍ර යන මනෝවිද්‍යාත්මක සාධක සමාජ සංවර්ධනයේ පදනම හැටියට පිළිගනිති. ඔවුන්ගේ මතයේ හැටියට සමාජයේ අවුල් වියවුල් සහ ධනපති සමාජයේ වැඩකරන ජනතාවගේ දුක් කරදර වලට හේතු ගැබ්වී ඇත්තේ ධනපති ක්‍රමයේ වාස්තවික නියාම තුළ නොව, ධනවාදී පෞද්ගලික අයිතිය තුළ නොව, කම්කරුවන්ගේ මනෝ ස්වභාවයෙහි ඇති දුර්වලකම් තුළය. සමාජයේ බරපතල විපත්ති සුවකරලිය හැක්කේ ධනපති ක්‍රම අහෝසිකර දැමීමෙන් පමණක් නොව, මනෝ ස්වභාවය අංග සම්පූර්ණ කිරීමෙන් බව ඔවුහු පවසති.

ජීව විද්‍යා නිකාය වචනයෙන් පමණක් විද්‍යානුකූල සමාජ විද්‍යාවට පක්ෂපාතකම් දක්වයි. එහෙත් ඇත්ත වශයෙන්ම එය සැබෑ සමාජ සංවර්ධන නියාම වෙනුවට ජීව විද්‍යා නියාම ආදේශ කරන අතර මිනිසා සහ අන්ධ ලෙස පැවැත්ම සඳහා සටන් කරන සත්ව ගණයා එක මට්ටමක ලා සලකයි. සූරාකෑම කොල්ලකාරී යුද්ධ යටත් විජිතවාදය වර්ග භේදවාදයේ වෙනත් කැත අංග ලක්ෂණ ''ස්වාභාවික'' නියාම අනුව සාධාරන බව පෙන්වීමේ වෑයමක් එයින් දරනු ලැබේ.

සමාජ සංවර්ධනයේ නියාම, ජීව විද්‍යාවේ නියාමවලට සමාන වන සේ සරල කොට ගත නොහැකි බවත් ඒවා සත්ව ලෝකයේ සහ පැලෑටි ලෝකයේ නියාම වලට වඩා ගුණාත්මක වශයෙන් වෙනස් බවත් අවබෝධ කර ගැනීමට ජීව විද්‍යා නිකායේ නියෝජිතවරු මැලිවෙති. සමාජ සංවර්ධන නියාම සහ ප්‍රකෘතියේ නියාම සර්වසම

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

කිරීම ඉතාමත් පහසු වුවද, එය ඉතාමත් හිස්, පන්ඩිතමානී සහ නිරර්ථක වෑයමක් වශයෙන් වී. අයි. ලෙනින් හඳුන්වා දුන්නේය.

මයික්‍රො (කුඩා පරිමාන) සමාජ විද්‍යාව හෙවත් අනුභූතික සමාජ විද්‍යාව වශයෙන් හඳුන්වන නිකායේ නියෝජිතවරුද සමාජ සංවර්ධනයේ ප්‍රධාන නියාම ප්‍රතික්ෂේප කරති. මයික්‍රො සමාජ විද්‍යාව සමාජමය ජීවිතය ගැන දැනුම කෙළින්ම ප්‍රතික්ෂේප නොකළද සමාජමය සිද්ධි ප්‍රපංච පිළිබඳ සංකීර්ණ ජාලයෙන් ඔවුන් හදරන්නේ ධනපති යථාර්තයේ ඉතා සුළු සාධක පමණකි. එම සාධකවලට පසුබිම් වූ සමාජයේ සංවර්ධනය පිළිබඳ අභ්‍යන්තර නියාමයන් දැකීමට ඔවුන් මැලි වෙති. එයින් පෙනෙන්නේ ඔවුන් විද්‍යාවත්, අපේ යුගයේ මූලික සමාජමය ප්‍රශ්න විසඳීමත් ප්‍රතික්ෂේප කරන බවය.

සමාජ සංවර්ධනයේ නියාම ප්‍රතික්ෂේප කිරීම යනු සමාජ ජීවිතයේදී ආගමික විශ්වාසයනට ඉඩ සැලසීමේ ප්‍රයත්නයක් වන්නේය. ඓතිහාසික ක්‍රියාදමය දෙවියන්ගේ පූර්ව නිගමනය අනුව සිදුවන බව ධනවාදී සමාජ විද්‍යාඥයින්ගෙන් බොහෝ දෙනකු කියා පෑම අහම්බෙන් සිදුවූවක් නොවේ. ඉතිහාසයේ අරමුණ දෙවියන්ගේ රජය ඇති කිරීමයයිද ''ඉතිහාසය යනු දෙවියන්ගේ ස්වයං අනාවරණය'' යිද ඉංග්‍රිසි ජාතික ඉතිහාසඥයකු වන අනෝල්ඩ් ටොයින්බී ලියයි.

සමාජ සංවර්ධනයේ නියමානුකූල ස්වභාවය ප්‍රතික්ෂේප කරන ධනපති දෘෂ්ටිවාදීහු බොහෝ දෙනෙක් ඉතිහාසයේ නියම ගමන් මග විකෘති කර දක්වති. ධනපති ක්‍රමය හුවා දක්වති. ප්‍රතිගාමී දේශීය සහ විදේශීය ප්‍රතිපත්ති සාධාරණයැයි පෙන්වීමටද තැත් කරති.

ඓතිහාසික ප්‍රගතිය සහ සමාජ සංවර්ධනය ප්‍රතික්ෂේප කිරීමෙන්ද සමකාලීන ධනපති සමාජ විද්‍යාවේ අවිද්‍යාත්මක ස්වභාවය හෙළිවෙයි.

සමාජ ප්‍රගතිය ප්‍රතික්ෂේප කිරීම

ඓතිහාසික ක්‍රියාදමයේ ස්වභාවය පිළිබඳව සමාජ විද්‍යාඥයින්ගේ මතවල වැදගත් වෙනස්වීම් සිදුවී ඇති බව මෙහිලා සටහන් කරගත යුතුය. නැගී එන ධනපති පංතිය බලය අල්ලා ගැනීම සඳහා සටන් කළ සමයේ ධනපති ප්‍රගතිශීලීනට සමාජ ප්‍රගතිය ගැන කීමට බොහෝ දේ තිබිණ. පැරණි රදළ ක්‍රමය බිඳ දමා වඩාත් ප්‍රගතිශීලී ධනපති සමාජයක් ඇති කිරීම සඳහා ධනපති ප්‍රගතිවාදීහු, ප්‍රගතිය පිළිබඳ අදහස අවියක් කොට ගත්හ. එහෙත් ධනපති පංතිය බලයට පැමිණි විගසම, සමාජ ප්‍රගතිය පිළිබඳ එහි අවබෝධය පුදුමාකාර ලෙස එක පැත්තකට බර විය. ධනපති දෘෂ්ටිවාදී හු ධනපති ක්‍රමය අහස උසට වැනීමටත්, එය ස්වාධිනත්වයේ සහ සාධාරනත්වයේ සදාකාලික රාජ්‍යය හැටියටත්, ප්‍රගතියේ අදහස්වල මූර්තියක් හැටියටත් පෙන්වීමට

පටන් ගත්හ. සමාජ ප්‍රගතියේ පරමාර්ථය මුදුන් පමුණුවාගෙන ඇති බවත් තවත් ඉදිරි මගක් නැති බවත් ධනපති සමාජ විද්‍යාඥයෝ පවසති. ධනපති ක්‍රමයේ විනාශය හැර අනාගතය තුළින් අන් කිසි බලාපොරාත්තුවක් නොදකින ඔවුහු, ඒ ගැන ඇති බිය හා නව කොමියුනිස්ට් ලෝකයට ඇති බිය නිසා සමාජ ප්‍රගතිය ප්‍රතික්ෂේප කරති.

''ප්‍රගතිය'' සහ ''සංවර්ධනය'' යන සංකල්ප වෙනුවට ''සමාජ වෙනස්වීම'' යන පාඨය ඉදිරිපත් කරන සම කාලීන ධනවාදී සමාජ විද්‍යාඥයෝ, ඉතිහාසයේ ක්‍රියාදමයට සැලකිය යුතු ලෙසින් බල නොපාන, සමාජයේ ඇතිවන නොවැදගත්, ද්වීතියික වෙනස් කම් හැඳින්වීමට එය යොදා ගනිති. එමගින් ඔවුන් බලාපොරොත්තුවන්නේ දැන් සමාජයේ ඇතිවන මූලික විප්ලවවාදී වෙනස්වීම් කෙරෙන් ජනතාවගේ සිත් වෙනත් අතකට යොමු කරවීමටත් ඒවායේ වැදගත්කම ලඝුකොට පෙන්වීමටත්, එමෙන්ම අපේ යුගයේ දැවෙන ප්‍රශ්න විසඳාලීමෙන් වැළකී සිටීමටත්ය.

සමාජයේ 'චක්‍රය', 'එකතැන පල්වීම' සහ 'ප්‍රතිවර්තනය' යන හැඳින්වීම් වලින් කියවෙන න්‍යාය දැන් කොර තෝංචියක් නොමැතිව ප්‍රචාරය කිරීමෙන්ද පෙනෙන්නේ ධනපති සමාජ විද්‍යාඥයන් සමාජ ප්‍රගතිය පිළිබඳ අදහස ප්‍රතික්ෂේප කරන බවයි.

1920 ගණන් වලදී ජර්මන් අධිරාජ්‍යවාදයේ දෘෂ්ටිවාදියෙකුවූ ඔස්වල්ඩ් ස්පෙන්ග්ලර් 'චක්‍රය' පිළිබඳ න්‍යාය ඉදිරිපත් කළේය. ''යුරෝපයේ පරිහානිය'' නැමැති පොතේ ඔහු සමාජයට මෙම ''උර චක්‍ර මාලාවෙන්'' බේරීමට බැරි බවත්, එම චක්‍ර තුළ නැගීම, උච්ච අවස්ථාව හා පරිහානිය යන මේ තුන් අවධියම අනිවාරණීය ලෙස පුනරාගමනය වන බවත් ඔප්පු කිරීමට මහන්සි දැරීය. ස්පෙන්ග්ලර්ගේ මතය අනුව, ධනපති ක්‍රමය සභ්‍යත්වයේ සහ සංස්කෘතියේ උච්ච අවස්ථාව වන්නේය. එහි පරිහානියත් සමගම මිනිස් වර්ගයා නොවැලැක්විය හැකි ලෙස ම්ලේච්ඡත්වය කරා ආපසු යනු ඇත. මෙයින් අදහස් වන්නේ ධනපති ක්‍රමයට විරුද්ධව සටන් කිරීම (උසස්ම තත්වයේ සිට නරකම තත්වයකට වැටෙන්නේ කුමටද?) නිශ්ඵල බවයි. සමාජයට අළුත් දෙයක් වෙත ළඟා විය නොහැකි හෙයින්, කුමණ ලෙසින් ඉටු කර නොගත හැකියයි කියනු ලබන, සමාජවාදයත්, ඒ සඳහා කරන නිර්ධන පංති විප්ලවයත්, අවශ්‍ය නැති බවයි.

මෑත කාලයේදී 'ඓතිහාසික චක්‍රය පිළිබඳවූ ප්‍රතිගාමී න්‍යායයට පුනර්ජීවයක් දුන් ආනෝල්ඩ් ටොයින්බී සමාජයේ විශ්වමය ප්‍රගතිශීලී

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

සංවර්ධනය ප්‍රතික්ෂේප කරමින් එය ''ප්‍රගතියේ මායාවක්'' ලෙස අවඥාවෙන් හඳුන්වයි. සමාජවාදයට විරුද්ධව නැගී සිටින ඔහු, ධනපති ක්‍රමය පෙරළා දැමීමට තැත් කරන හැම වාරයකදීම සභ්‍යත්වය අභාවයට යන බවත්, පෙන්වමින් එමගින් ධනපති සමාජයේ සදාකාලිකත්වය සහ අනභිභවනීයත්වය ඔප්පු කිරීමටත් වෙර දරයි.

ඓතිහාසික ක්‍රියාදාමයේ ඉදිරිගමන සමකාලීන ධනපති පංතියේ ප්‍රතිගාමී දෘෂ්ටිවාදීන් විසින් විකෘති කරනු ලැබේ. ධනපති ක්‍රමයේ විනාශය ළංවී ඇති බව හඟින ඔවුහු සභ්‍යත්වයේ සහ මුළු මහත් මිනිස් සංහතියේ විනාශය ළංවී ඇති බව කියති. ධනවාදයේ විනාශය මිනිස් සංහතියේ විනාශය සමග සර්වසම කරති. ධනපති ක්‍රමය විනාශවනවාට සැක නැත. මිනිස් සංහතිය තවත් දුර සංවර්ධනය වී කොමියුනිස්ට් සමාජයේ දීප්තිමත් උච්චස්ථානය කරා ළංවනු නිසැකය.

ජීවිතය ධනපති සමාජ විද්‍යාඥයින් ප්‍රතික්ෂේප කරයි

ඓතිහාසික ක්‍රියාදාමය විකෘති කරන ධනපති දෘෂ්ටිවාදීහු එක්තරා අරමුණක් අනුව ක්‍රියා කරති. ධනපති ක්‍රමයේ විනාශය කල්දැමීමත්, ධනපති සමාජය නැමති ගොඩනැගිල්ලේ මූණත අලුත්වැඩියා කිරීමත්, සමාජවාදයට දෙස් පැවරීම සහ සමාජය පිළිබඳ එකම විද්‍යාත්මක උගැන්වීම වන මාක්ස්-ලෙනින් වාදය ප්‍රතික්ෂේප කිරීමත් සඳහා ක්‍රියා කරති.

මේ සඳහා ධනපති දෘෂ්ටිවාදීන් නොකරන කූට උපක්‍රමයක් නැත. සමාජවාදයටත් මාක්ස්-ලෙනින් වාදයටත් දෙස් පැවරීමද, ධනපති ක්‍රමය ආරක්ෂා කිරීමද, ''ජනතා ධනපති ක්‍රමයක්'' ගැන බොරු විස්තර ඉදිරිපත් කිරීම ද, ''පොදු ජන සමෘද්ධියේ රජය'' හැටියට ධනපති රජය හැඳින්වීමද කරති. ''කෝන්වෙර්ගෙන්ට්සියා'' නමින් හැඳින්වෙන (කොන්වෙර්ගේරේ නම්වූ ලතින් වචනය සමීප වීම, ළංවීම යන තේරුම ගෙන දෙයි) න්‍යායය කියන පරිදි දියුණු ධනපති සහ සමාජවාදී රටවල් අතර ඉතා කිට්ටු සමානත්වයක් — උසස් ලෙස වර්ධනයවූ කර්මාන්තයක්, තාක්ෂණිකයක්, විද්‍යාවක් තිබෙන නිසාත්, මේ සමාජ ක්‍රම දෙකම පරිභෝජනය උසස් කිරීමට හා වෙනත් එවැනි දෑ කිරීමට උත්සාහ කරන නිසාත්, දැන් ධනවාදය හා සමාජවාදය එකිනෙකට ළංවීමට සහ මේ දෙකම පරිණාමනය වී යම්තම් නවීන ධනපති සමාජයක් වශයෙන් කෘත්‍රිම සමාජයකට එකතු වෙමින් සිටී. සමහර අවස්ථාවලදී මේ කෘත්‍රිම සමාජය ''ඒකීය කර්මාන්ත සමාජය'' හැටියට නම් කරනු ලැබේ. මෑත කාලයේදී එය ''පශ්චාත් කර්මාන්ත'' සමාජය ලෙස හැඳින්වේ. එකිනෙකට ප්‍රතිවිරුද්ධ සමාජක්‍රම ඇති

මේ සමාජ දෙක එක්වීම සිදුවිය නොහැක්කක් බවට සැක නැත. එයට හේතුව ප්‍රධාන වශයෙන්, ධනපති ක්‍රමය පෞද්ගලික අයිතිය හා සූරාකෑම පදනම් කරගෙන ගොඩනගා තිබෙන අතර සමාජවාදය දේපල සමාජය සතු, වැඩ කරන ජනතාවගේ අන්‍යොන්‍යාධාරය සහ සුහද සම්බන්ධකම් අනුව ගොඩනැගී තිබීමය.

විද්‍යාව මිනිසුන්ගේ සමාජ ඓතිහාසික සම්භාවිතය විසින් සමාජය මිනිසාගෙන් ස්වාධීනව වාස්තවික නියාම අනුව, වර්ධනය වන බවත් එය ස්වාභාවික ක්‍රියාදාමයක් බවත් ඔප්පු කර තිබේ. සමාජ ඉතිහාසය වර්ධනයේ ඉවක් නැති දම්වැලකට සමානය. එය සරල සාමාන්‍ය තත්වයන්ගේ සිට වඩාත් සංකීර්ණ උසස් තත්වයන් දක්වා වර්ධනය වෙයි. සමාජ සංවර්ධනයේ පදනම ද්‍රව්‍යමය නිෂ්පාදනය වර්ධනය කිරීම හා අංග සම්පූර්ණ වන්නේය.

අධිරාජ්‍යවාදයේ ගැත්තන් කොතෙක් විකෘති කිරීමට දඟලුවද ඉතිහාසය ඉදිරියට යයි. ශ්‍රෙෂ්ඨ මාක්ස්-ලෙනින් වාදය නිවැරදි බව ඉතිහාසය ඉමහත් බලයකින් හා ස්ථිරතාවකින් ඔප්පු කර පෙන්වයි.

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

II

සමාජ-ආර්ථික රටාව

සමාජ සංවර්ධනයේදී නිෂ්පාදන ක්‍රමය ඓතිහාසික තීරණාත්මක කාර්‍ය කොටසක් ඉටු කිරීම මත පදනම්වන සමාජ-ආර්ථික රටාව පිළිබඳ උගැන්වීම ඓතිහාසික භෞතිකවාදයේ හරය වන්නේය. එහෙත් නිෂ්පාදනය කළ හැක්කේ ඒ සඳහා නිශ්චිත අවශ්‍යතාවයන් වන භූගෝලීය පරිසරය සහ ජනගහණය ඇතොත් පමණකි. එබැවින් මේ අවශ්‍යතාවයන් මොනවාද යන්න සොයා බලා සමාජ ජීවිතයේදී ඒවා දරන වැදගත්කම විභාග කර බලමු.

1. සමාජ ජීවිතයේ ස්වාභාවික තත්ත්වයන්

සමාජය ප්‍රකෘතියේම වෙන්වූ එක් කොටසකි. එය ප්‍රකෘතියෙන් ඉවත් කර ගත නොහැකි අතර නිත්‍ය ලෙසම එය සමග අන්‍යොන්‍ය ක්‍රියාකාරිත්වයේ යෙදෙයි. සමාජය හා ඉතා

භූගෝලීය පරිසරය හා සමාජය

කිට්ටුවෙන් අන්‍යොන්‍ය ක්‍රියාකාරිත්වයේ යෙදෙන හා සමාජය කෙරෙහි බලපාන ප්‍රකෘතියේ කොටස භූගෝලීය පරිසරය ලෙස හැඳින්වේ. භූගෝලීය පරිසරයට කාලගුණයද, පසද, ගංගා හා මුහුදුද, පැලෑටි සහ සත්ත්ව ලෝකයද, බිම් පෙදෙස්ද, ඛනිජ ද්‍රව්‍යද ආදිය අයත් වේ.

මිනිසාගේ නිෂ්පාදන ක්‍රියාකාරිත්වයට භූගෝලීය පරිසරය අවශ්‍ය තත්ත්වයක් වන්නේය. ඔහු යැපීම් මාර්ගය සලසා ගන්නේ ප්‍රකෘතියෙනි. ඒ සඳහා ප්‍රකෘතියට විරුද්ධවත්, එය කෙරෙහි බලපෑමටත් ඔහු කරන අරගලයෙන් තොරව ශ්‍රමය ගැන සිතිය නොහැකිය.

භූගෝලීය පරිසරය සමාජ සංවර්ධනයට දෙයාකාර ලෙස බලපායි. වාසිදායක ස්වාභාවික තත්ත්වයන් (ඛනිජ සම්පත්, කැලෑ, ගංගා, හිතකර දේශගුණය ආදිය) සමාජ සංවර්ධනයට උපකාර වේ. අනිත් අතට අවාසිදායක ස්වාභාවික තත්ත්වයන් සමාජ සංවර්ධනය කෙරෙහි අයහපත් ලෙස බලපායි. නිදර්ශනයක් වශයෙන්, ඛනිජ ද්‍රව්‍ය නොතිබීමෙන් කර්මාන්තයට බාධා ඇතිවේ. වියලි දේශගුණය නිසා කෘෂිකර්මයට බාධා අතිවේ.

භූගෝලීය පරිසරය සමාජ සංවර්ධනය සඳහා වැදගත්ය යන කරුණු ගුරු කොට ගන්නා සමාජ විද්‍යාවේ භූගෝලීය ප්‍රවණතාවයේ නියෝජිතවරු එහි කාර්ය කොටස ගැන අධි තක්සේරුවක් කරමින් සමාජ සංවර්ධනය තීරණය කරන්නේ සමස්තයක් වශයෙන් භූගෝලීය පරිසරය විසින් හෝ එහි සමහර අංග වන කාල ගුණය, ගංගා ආදිය විසින් බව පවසති.

භූගෝලීය ප්‍රවණතාවය විද්‍යාත්මක වශයෙන් කොහෙත්ම පිළිගත නොහැකිය. සමාජ සංවර්ධනය ඇතිවන්නේ කිනම් බලවේගයක් නිසාද, වර්ධනය වන සමහර රටවල භූගෝලීය තත්ත්වයන් බොහෝ සෙයින් සමාන වුවද, ආර්ථික හා දේශපාලන වර්ධනය අනුව ඒවා විවිධ අවස්ථාවල පසුවන්නේ මන්ද යන ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමට එයට කොහෙත්ම බැරිය.

ප්‍රකෘතියේ බලපෑමට හසුවන සමාජය, අනිත් අතින් ප්‍රකෘතිය මත ක්‍රියාශීලී ලෙස සිය බලය යොදවා එය වෙනස් කොට, සිය උවමනාවන්ට යටත් කර ගැනීමත්, ප්‍රකෘතියේ සමහර ක්‍රියාදාමයන්ගේ වර්ධනය සියුම් කොට, සමාජය එය තමාට අවශ්‍ය පරිදි වෙනස් කර ගැනීමත්, භූගෝලීය ප්‍රවණතාවය ගණන් නොගනී. සමාජය භූ පරිසරය මත සහ ප්‍රකෘතිය මත ඇති කරන බලපෑමේ මට්ටම අවසානයේදී රඳා පවතින්නේ සමාජ ක්‍රමය සහ නිෂ්පාදනයේ, තාක්ෂණිකයේ සහ විද්‍යාවේ සංවර්ධන තත්වය අනුවය. වැඩකරන ජනතාවගේ උවමනාවන්ට සරිලන සේ ඉතිහාසයේ පළමුවැනි වරට විඥත ලෙස සහ සැලැස්මානුකූල ලෙස සමාජය වෙනස් කරන සමාජවාදී ක්‍රමය ප්‍රකෘතිය මත බලපෑමට විශේෂ හිතකර තත්ත්වයන් ඇති කරයි.

භූගෝලීය පරිසරය සමාජ ජීවිතයේ අවශ්‍ය තත්ත්වයක් වන නමුදු, එය සමාජ සංවර්ධනයේ නියත සාධකය නොවන බව මින් පෙනේ. සමාජ සංවර්ධනය වේගවත් කිරීමට හෝ එයට බාධා කිරීමට හෝ පමණක් එයට පිළිවන.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ජනගහනය සහ සාමාජය

සමාජ ජීවිතයට අවශ්‍ය අනිත් දෙය නම් ජනගහණය ය. මිනිසුන් නැතිව කොහෙත්ම නිෂ්පාදනය කළ නොහැකිය. ප්‍රකෘතිය මෙල්ල කර එය මිනිසාගේ සේවය සඳහා යොදන මහා බලවේගය මිනිස් ශ්‍රමය වන්නේය. එබැවින් සමහර තත්වයන් යටතේ ජනගහණයේ අඩු වැඩි ප්‍රමාණයන්ද, ජනගහණය වැඩිවීමේ වේගය අඩු වැඩි වීමද අනුව රටක වර්ධනය වේගවත් විය හැකිය. නැතිනම් ප්‍රමාද විය හැකිය. විශාල මිනිස් බල සම්පතක් තිබීමද, උසස් ජනගහණ වර්ධන වේගයක් තිබීමද සමාජවාදී සෝවියට් සංගමයේ ශ්‍රේෂ්ඨ ජයග්‍රහණයන්ට අදාල වැදගත් සාධකයක් වන්නේය.

එහෙත් සමාජ සංවර්ධනයේදී ජනගහණය තීරණාත්මක කාර්ය කොටසක් ඉටු කරන්නේද? එසේ ඉටුකරන්නේ නම්, නිදසුනක් වශයෙන් ජනගහණය අනුව ඝනත්වයෙන් වැඩි, උසස් වැඩිවීමක් ඇති රටවල් ආර්ථික, දේශපාලන සහ සංස්කෘතික ලෙස, ඝනත්වය අනුව අඩු ජනගහණයක් සහ වැඩිවීම අඩු රටවලට වඩා පහත් වන්නේ කුමක් නිසාද?

ජනගහණයේ ඝනත්වය සහ එය වැඩිවීමේ වේගය සමාජයේ ප්‍රගතිය තීරණය කරන සාධක නොවන බව මින් පෙනේ. විලෝම වශයෙන්, රටක ජනගහණය හා එහි ඝනත්වය එහි සමාජ ක්‍රමයේ ස්වභාවය මත රඳා පවතී. නිදසුනක් වශයෙන් සෝවියට් සංගමයේ ඉතා උසස් ජනගහණ වර්ධන වේගයක් ඇති අතර එහි ඇත්තේ ලෝකයේ අඩුම මරණ ප්‍රමාණයයි. එසේ වන්නේ සමාජවාදයේ ස්වභාවය නිසාය. ජනතාවගේ ශුභ සිද්ධිය ගැන සමාජවාදී සමාජය දක්වන බලවත් සැලකිල්ල නිසාය.

එසේ වුවද ප්‍රතිගාමී ධනපති සමාජ විද්‍යාඥයින් කොටසක් වන මැල්තුස් වාදීහු සමාජ සංවර්ධනය තීරණය කරන්නේ ජනගහණයේ වැඩිවීම විසිනැයි යන මතය ගුරු කොට ගනිති. මේ න්‍යායයේ පීතෘවරයා වන ඉංග්‍රීසි ජාතික පූජකයකු හා ආර්ථික විද්‍යාඥයකු වූ තෝමස් මැල්තුස් 18 වැනි සියවසේ අග භාගයේදී සිය ''සොයාගැනීම'' වන ''සර්ව සාමාන්‍ය මූලධර්මය'' ප්‍රකාශයට පත් කළේය. ඒ අනුව යැපීම් මාර්ග ගණිතමය ලෙස වැඩිවන අතර ජනගහණය ජ්‍යාමිතික ලෙස වැඩිවන බවත්, වැඩ කරන ජනතාව මූණපාන දුගී බව, සාගතය විරැකියාව සහ අනිකුත් විපත් වලට හේතුව මෙය බවත් ඔහු පැවසීය. කම්කරුවන් හා දුප්පතුන් විවාහවීමෙන් සහ දරුවන් බෝකිරීමෙන් වැළකී සිටීම මින් ගැළවීමේ ''මග'' හැටියට මැල්තුස් පෙන්වා දුන්නේය.

මැල්තුස්ට මේ ව්‍යාජ විද්‍යාත්මක ''න්‍යාය'' අවශ්‍යවූයේ ධනපති ක්‍රමයට සුදුහුණු ගා, වැඩ කරන ජනතාවට එම ක්‍රමය ගෙන දෙන විපත් සාධාරණ බව පෙන්වා දීමටය. අධිරාජ්‍යවාදය දැන් මැල්තුස් වාදයේ පිහිටෙන්, එහි ගැඹුරු ප්‍රතිවිරෝධීතාවයන් විස්තර කිරීමට පමණක් නොව, තම සූරාකෑමේ විදේශීය ප්‍රතිපත්තිය සාධාරණයැයි පෙන්වීමටද තැත් කරයි. සමකාලීන මැල්තුස්වාදය විවෘත ලෙසම මානව ද්වේෂී ස්වරූපයක් ගෙන සිටී. විවාහ නොවන ලෙසටත් උපත් පාලනය කරන ලෙසටත් උපදෙස් දීමෙන් නොනැවතී, ''අතිරේක'' කටවල් නැතිකර දැමීම සඳහා ජලකර බෝම්බ, විෂබීජ යොදු ගන්නා යුද්ධ ක්‍රම හා වෙනත් ඝෝරතර විනාශකාරී මාධ්‍යයන් උපයෝගී කර ගන්නා ලෙස දැන් එය යෝජනා කරයි.

විද්‍යාව සහ සම්භාවිතය බොහෝ කලක සිටම මැල්තුස්වාදය ප්‍රතික්ෂේප කර ඇත. ධනපති ක්‍රමය යටතේ වැඩ කරන ජනතාවගේ දුගීබව සහ දුර්භික්ෂයට හේතුව පිහිටා ඇත්තේ ජනගහණය පිළිබඳ ස්වාභාවික නියාමයන් තුළ නොව, ධනපති සමාජ ක්‍රමයේ මූලිකම හරය වන ඉතාමත් අසාධාරණ අන්දමට ද්‍රව්‍යමය සම්පත් බෙදු හැරීම තුළ බව කාල් මාක්ස් පෙන්වා දුන්නේය. මෙම සම්පත්වලින් ඉතා විශාල වැඩි කොටස ධනපති පංතිය අත්කරගන්නා අතර වැඩකරන ජනතාවට බොහෝ විට ජීවත්වීමට අත්‍යාවශ්‍ය දේ පවා නොලැබේ. සෝවියට් සංගමය හා අනිකුත් සමාජවාදී රටවල් ලබාගත් ආර්ථික ප්‍රගතිය විසින් මැල්තුස්වාදයේ ව්‍යාජභාවය ස්ථිර ලෙසම ඔප්පු කොට තිබේ. ධනපති ක්‍රමය අහෝසි කර දමා ඇති මේ රටවල දුර්භික්ෂය, දුගීබව හා විරැකියාව සදහටම තුරන් කර තිබේ. ජනතාවගේ ජීවිතය වැඩි වැඩියෙන් සුරක්ෂිත වීමට හා සමෘධිමත් වීමට පටන් ගෙන තිබේ.

ඒ අනුව සමාජ සංවර්ධනයේ තීරණාත්මක හේතුව භූගෝලීය පරිසරයවත්, ජනගහණයවත් නොවේ. ඊට තීරණාත්මක හේතුව ද්‍රව්‍යමය සම්පත් නිෂ්පාදනය කිරීමේ ක්‍රමයයි. එබැවින් අපි එය දැන් විභාග කර බලමු.

2. සමාජ සංවර්ධනයේ ප්‍රධාන, තීරණාත්මක බලවේගය — නිෂ්පාදන ක්‍රමය ය

ආහාර, වස්ත්‍ර, නිවාස සහ ජීවනය සඳහා අවශ්‍ය අනිකුත් ද්‍රව්‍යමය සම්පත් රහිතව මිනිසුන්ට පැවතිය නොහැක. ප්‍රකෘතිය මිනිසුන්ට මේ සම්පත් සාදු නිමකළ තත්ත්වයෙන් නොසපයයි. මේවා ලබාගැනීමට

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

මිනිස්සු වැඩ කළ යුත්තාහ. එනිසා, මිනිසාගේ ස්වාභාවික අවශ්‍යතාවයක් වන ශ්‍රමය, සමාජ ජීවිතයේ අඩිතාලම වෙයි. වැඩ කිරීමෙන් සහ නිෂ්පාදන ක්‍රියාකාරිත්වයෙන් තොරව මිනිස් ජීවිතයට පැවතිය නොහැක. එබැවින් ද්‍රව්‍යමය සම්පත් නිෂ්පාදනය කිරීම සමාජ සංවර්ධනයේ ප්‍රධාන, තීරණාත්මක හේතුව වන්නේය.

නිෂ්පාදනීය බලවේග

මිනිස්සු වැඩ කිරීමේ ක්‍රියාවලිය තුළින් සිය අවශ්‍යතාවයන් සපුරා ගැනීම සඳහා ස්වාභාවික වස්තූන් වෙනස් කර සාද ගනිති. නිදර්ශනයක් වශයෙන් යන්ත්‍රයක් සෑදීම සඳහා මිනිස්සු යපස් හාරා ගෙන උණුකර වානේ සාද ගනිති. අනතුරුව එය අවශ්‍ය පරිදි, පදම් කර ගනිති.

ශ්‍රම වස්තු සහ ශ්‍රම මාධ්‍යයන්ගෙන් තොරව නිෂ්පාදනය නොකළ හැකිය.

ශ්‍රම වස්තු මත මිනිස් ශ්‍රමය යොදවනු ලැබේ. ශ්‍රම මාධ්‍යය යනු යන්ත්‍ර, යන්ත්‍රෝපකරණ, අවි-ආයුධ, නිෂ්පාදන ගොඩනැගිලි, ප්‍රවාහණය ආදිය වේ. නිෂ්පාදන මාධ්‍යය ශ්‍රම වස්තූන්ගෙන් සහ ශ්‍රම මාධ්‍යයන්ගෙන් යුක්ත වේ.

සියලු ශ්‍රම මාධ්‍යයන් අතුරෙන් ඉතා වැදගත් වන්නේ නිෂ්පාදන උපකරණය. මේවායේ ආධාරයෙන් මිනිස්සු ශ්‍රම වස්තු තමන්ට වුවමනා විධියට සාද පිළියෙල කර ගනිති. නිෂ්පාදන උපකරණ රහිතව නිෂ්පාදනය කළ නොහැකිය. ස්වභාව ධර්මය සිය ධන නිධානයන් ලෙහෙසියෙන් අත්නොහරී. එනිසා මිනිස් කායික ශක්තිය පමණක් යොදවා ඒවා උදුරා ගැනීම කොහෙත්ම ලෙහෙසි නැත. මිනිස් ජීවිතයට අවශ්‍ය දෑ නිපදවීම සඳහා මෙම උපකරණ අනිවාර්ය වන අතර, ඒවායේ තත්ත්වය උසස් වන පමණට මිනිසාගේ ජීවන මාධ්‍යයද උසස් වේ.

ඒසේ වුවද හුදෙක් ශ්‍රම උපකරණ වලින් පමණක් මිනිසාට ද්‍රව්‍යමය සම්පත් නොලැබෙයි. එම උපකරණ තැනීම පමණක් නොව වැඩට යොද ගැනීමද කළ යුතු වේ. මිනිස් අත් විසින් නොඅල්ලන ලද, ඉතාමත් උසස් අංග සම්පූර්ණ යන්ත්‍රය වුවද ප්‍රයෝජනයක් නැති යකඩ ගොඩක් බවට පත්වේ. උපකරණයක් චලනයෙහි යෙදවීමෙහිත්, ද්‍රව්‍යමය නිෂ්පාදනය සංවිධානය කිරීමෙහිත් සමත් වන්නේ මිනිසා පමණකි. ඔහු නිෂ්පාදනයේ අත්‍යාවශ්‍ය අංගයක් වන්නේය.

නිෂ්පාදනීය බලවේග යනු සමාජය විසින් නිපදවන ලද නිෂ්පාදන මාධ්‍යයන්ද, ඉන් ප්‍රධාන කොටම ශ්‍රම උපකරණද ද්‍රව්‍යමය සම්පත් නිපදවන මිනිසුන්ද වේ. අප යුගයේ විද්‍යා-තාක්ෂණික විප්ලවය ඉමහත් පරිමාණයකින් පැතිර යන නිසා, නියම නිෂ්පාදන බලවේගයක්

වශයෙන් විද්‍යාව වඩ වඩාත් ඉදිරියට එයි. අපි මේ ගැන පසුව විස්තර ලෙස විභාග කර බලමු.

නිෂ්පාදනීය බලවේග ප්‍රකෘතිය කෙරේ මිනිසා දක්වන සම්බන්ධකම්ද, ප්‍රකෘතිය කෙරෙහි ඔහු පාන බලයේ ප්‍රමාණයද සම්බන්ධයෙන් තීරණය කරයි. නිෂ්පාදනීය බලවේගයන්ගේ ප්‍රධාන අංගය වැඩකරන ජනතාවය. ජනතාවගේ නිර්මාණාත්මක ශ්‍රමය නිෂ්පාදන උපකරණ නිපදවයි; ක්‍රියාත්මක කරයි. එසේ කිරීමෙන් එය මිනිසාට අවශ්‍ය අපරිමිත ප්‍රමාණයක් යැපීම් මාධ්‍ය සම්පාදනය කිරීමට එම උපකරණ මෙහෙයවයි.

නිෂ්පාදනීය බලවේග ද්‍රව්‍යමය නිෂ්පාදනයේ එකම සාධකය නොවේ. මිනිසුන්ට තනිවම නිෂ්පාදන කළ නොහැකි අතර ඔවුන්ට නිෂ්පාදන

නිෂ්පාදන සම්බන්ධකම්

කටයුත්ත කළ හැක්කේ සමාජයක් තුළ සාමූහික ලෙස සංවිධානය වීමෙනි. ශ්‍රමය හැමදම සමාජමය ස්වරූපයක් දැරුවේත් දරන්නේත් මේ හේතුව නිසාය. වැඩ කිරීමේදී මිනිස්සු නොවැළැක්විය හැකි ලෙස එකිනෙකා සමග නියමිත සම්බන්ධකම් ඇති කර ගනිති. "නිෂ්පාදනය කිරීම සඳහා මිනිස්සු එකිනෙකා සමග නිශ්චිත බැඳීම් සහ සබඳකම් ඇති කර ගනිති. ප්‍රකෘතිය වෙනස් කිරීම සඳහාවූ ඔවුන්ගේ කටයුතු, එනම් නිෂ්පාදන කටයුත්ත සිදුවන්නේ මෙම සමාජ බැඳීම් හා සම්බන්ධකම් තුළ පමණකි"* යයි මාක්ස් ලියුවේය.

නිෂ්පාදනයෙහි දී මිනිසුන් අතර ඇති සම්බන්ධකම්, නිෂ්පාදන සම්බන්ධකම් වන අතර ඒවා ද්‍රව්‍යමය නිෂ්පාදනයේම අවශ්‍ය කොටසක් වන්නේය. මේ අනුව, කිසි යම් ඓතිහාසික නිෂ්පාදන ක්‍රමයක් නිෂ්පාදනීය බලවේගයන්ගේ සහ ඊට ගැලපෙන නිෂ්පාදන සම්බන්-ධකම් වල නොබිඳිය හැකි ඒකත්වයක් ලෙස පෙනේ.

ආදි කල්පික යුගයේ ආරම්භයේ සිටම මිනිසුන් අතර අන්‍යෝන්‍ය ශ්‍රම සම්බන්ධකම් ඇතිවිය. නිදසුනක් වශයෙන් සංචාරක දඩයක්කාර ගෝත්‍ර තුළ සම්බන්ධය දඩයක්කාර සගයින් අතර වූ සම්බන්ධය විය. නිෂ්පාදන බලවේග සහ ශ්‍රම විභජනය වර්ධනය වීමත් සමගම මිනිසුන් අතර ඇති සම්බන්ධකම් වඩාත් විවිධාකාර විය. ගොවියා සහ එඬේරා අතරද, ගොවියා සහ හස්ත කර්මාන්ත කරුවා අතරද, හස්ත කර්මාන්ත කරුවා සහ වෙළෙන්දා අතරද ආදී වශයෙන් සම්බන්ධකම් ඇතිවිය.

---

* කාල් මාක්ස් සහ ෆ්‍රෙඩ්රික් එංගල්ස්. කෘති එකතුව, 6 වෙළුම, 441 පිටුව.

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

යන්ත්‍ර කර්මාන්තය දියුණුවීමත් සමගම නිෂ්පාදකයින්ගේ සම්බන්ධකම් විශේෂ නානාවිධත්වයකින් හා බහු පාර්ශ්වීය තාවයකින් යුක්ත විය.

නිෂ්පාදන සම්බන්ධකම් පදනම් වී ඇත්තේ හිමිකම් රටාව එනම්, නිෂ්පාදන මාර්ග වන ඉඩම්, ස්වාභාවික ධන නිධාන, කැලෑ, ගංගා, අමු ද්‍රව්‍ය, නිෂ්පාදන ගොඩනැගිලි, ශ්‍රම උපකරණ ආදිය කෙරෙහි මිනිසුන් දක්වන සම්බන්ධකම් මතය. හිමිකම් රටාව අනුව නිෂ්පාදනයේ යෙදී සිටින විවිධ සමාජමය කණ්ඩායම්වල ප්‍රධාන හෝ අප්‍රධාන තත්ත්වයද, නිෂ්පාදන ක්‍රියාදමයේදී වන ඔවුන්ගේ සම්බන්ධකම්ද, නැතිනම් මාක්ස් කීවාක් මෙන්, ඔවුන්ගේ අන්‍යොන්‍ය ක්‍රියා කාරිත්ව හුවමාරුවද තීරණය වේ. දේපල පොදු හිමි කමට යටත් (නිෂ්පාදන මාර්ග වැඩකරන ජනතාවට අයත්) නම්, නිෂ්පාදන සම්බන්ධකම්, සමාජවාදී සමාජයේ මෙන් සූරාකෑමෙන් තොර ජනයා අතර සහයෝගිතාවයේ සහ අන්‍යොන්‍ය ආධාරයේ ස්වරූපයක් ගනී. දේපල පුද්ගලයින්ට (නිෂ්පාදන මාධ්‍යයන් සූරාකන සුළු පිරිසකට) අයත් නම් නිෂ්පාදන සම්බන්ධකම්, ධනේශ්වර ක්‍රමයේ මෙන්, ආධිපත්‍යයේ හා යටත් භාවයේ සම්බන්ධකම් වෙති. අන් කවර ආකාරයකට හෝ එය වෙනස් විය නොහැකිය. ඊට හේතුව ප්‍රතිවිරුද්ධ පංති සහිත සමාජයක වැඩකරන ජනතාවට නිෂ්පාදන මාර්ග අහිමිකර ඔවුන්ගේ බඩ වියත රැක ගැනීම සඳහා ඔවුන්ට නිෂ්පාදන මාර්ග හිමි සූරාකන්නන් යටතේ වැඩ කිරීමට සිදුවී තිබීමයි.

නිෂ්පාදන මාධ්‍යයන් අයිතියේ ස්වභාවය මත බෙදහැරීමේ රටාවද රඳා පවතී. ධනපති ක්‍රමය යටතේ සමාජයේ ද්‍රව්‍යමය සම්පත් ඉතාමත් අසාධාරන ලෙසට බෙදහැරීමට තීරණය කරනු ලබන්නේ පෞද්ගලික ධනේශ්වර හිමිකම විසිනි. නිෂ්පාදන මාධ්‍යයන් අයිති කරුවා තමා කෙළින්ම නිෂ්පාදනයෙහි නොයෙදුනද, නිපදවන ධනයෙන් ඉතා විශාල වැඩි කොටසක් අයත් කර ගනී. සමාජවාදී සමාජයේ පොදු හිමි කම බලපවත්නා බැවින්, සියලු වැඩකරන ජනතාවගේ වුවමනාවන්ට සරිලන, කරන වැඩ අනුව වැටුප් ගෙවීමේ මූලධර්මය ක්‍රියාවේ යෙදවේ. සමාජවාදය යටතේ නිෂ්පාදනය කෙරෙන ද්‍රව්‍යමය සම්පත් සියල්ලම ජනතාවට අයත්ය.

ඒ අනුව නිෂ්පාදන සම්බන්ධකම් ක්ෂේත්‍රයට නිෂ්පාදන මාර්ග හිමිකම් රටාවන්ද, එහි ප්‍රතිඵලයක් වශයෙන් නිෂ්පාදනයේදී විවිධ සමාජමය කණ්ඩායම් දරන තත්ත්වයද, ද්‍රව්‍යමය සම්පත් බෙදහැරීමේ රටාවන්ද අයත් වේ.

මිනිසුන්ගේ කැමැත්තෙන් හා අභිප්‍රායෙන් බාහිරව, නිෂ්පාදන සම්බන්ධකම් වාස්තවික ලෙස හැඩ ගැසෙයි. නිෂ්පාදන ක්‍රියාදමයේ

නිරත මිනිසුන් අතර නිශ්චිත සම්බන්ධතාවයන් ඇතිවන්නේ, එම සම්බන්ධතාවයන්ට අදල නිෂ්පාදන බලවේගයන් මුහුකුරා ගිය කල පමණකි.

නිෂ්පාදන ක්‍රම ඒවාට ආවේණික වූ හේතූන් නිසා, එහි අභ්‍යන්තරික දයලෙක්තික ස්වභාවය නිසා වර්ධනය වන්නේය. මේ හේතූන් මොනවාද, නිෂ්පාදන සංවර්ධනයේ අභ්‍යන්තරික දයලෙක්තික ස්වභාවය කුමක්දැයි අපි විභාග කර බලමු.

නිෂ්පාදන බලවේගයන්ගේ සහ නිෂ්පාදන සම්බන්ධතාවයන්ගේ දයලෙක්තික ස්වරූපය

නිෂ්පාදනය එක තැන රැඳී නොපවතී. එය නිරතුරුවම සංවර්ධනය වෙයි — වැඩි දියුණු වෙයි. මෙය වෙනත් ආකාරයකින් සිදුවිය නොහැකිය. මන්දයත් ජීවත්වීම සඳහා ජනතාව ද්‍රව්‍යමය සම්පත් නිපදවිය යුතු හා වර්ධනය වන පරිමානයකින් එසේ කළයුතු බැවිනි. මෙය අවශ්‍යවන්නේ අප පෘථිවියේ ජනගහණය නිරතුරුවම වැඩිවන නිසාත්, ඔවුන්ගේ අවශ්‍යතාවයන් නිතරම වැඩිවන නිසාත්ය. ආදි කල්පික මිනිසාට අවශ්‍යවූයේ රළු ආහාරත්, වස්ත්‍ර වෙනුවට සතකුගේ සමකුත්, හිසට උඩින් වහළකුත්, ගිනි මැලයකුත් වැනි කළමනා ස්වල්පයක් පමණකි. එහෙත් අද මිනිසාගේ ද්‍රව්‍යමය හා සංස්කෘතික අවශ්‍යතාවයන් ඉතා විශාලය.

නිරතුරුවම සංඛ්‍යාවෙන් වැඩිවන ජනගහණයේ නොකඩවා වැඩිවන ඉල්ලීම් සපුරාලීමේ එකම මග නිෂ්පාදනය වඩ වඩාත් පුළුල් කොට, වැඩි දියුණු කිරීමය. නිෂ්පාදනය සංවර්ධනය කිරීම වාස්තවික අවශ්‍යතාවයකි, සමාජ ජීවිතයේ නියාමයකි. ඉතිහාසය අන් කිසිවක් නොව, සමාජමය නිෂ්පාදනයේ නියමානුකූල සංවර්ධනයකි. පහළ මට්ටමේ නිෂ්පාදන ක්‍රමයක් වෙනුවට, වෙනත් උසස් නිෂ්පාදන ක්‍රමයක් ඇති කරන, අවශ්‍යයෙන්ම විය යුතු ක්‍රියාදමයකි.

නිෂ්පාදනය වර්ධනය වන්නේ කෙසේද?

නිෂ්පාදනයේ සංවර්ධනය ආරම්භ වන්නේ නිෂ්පාදන බලවේගයන්ගේ වෙනස්වීමත් සමගමය. එහෙත් අප දන්නා පරිදි, නිෂ්පාදන බලවේග යනු නිෂ්පාදන උපකරණ සහ ඒවා පාවිච්චි කරන මිනිසුන්ය. නිෂ්පාදන බලවේගයන්ගේ මේ කොටස් දෙකෙන් පළමුවෙන්ම වර්ධනය වන්නේ කුමක්ද? නිෂ්පාදන බලවේගයන්ගේ රාමුව තුළ පළමුවෙන් නිෂ්පාදන උපකරණ වර්ධනය වන බව ඉතිහාසය පෙන්වා දෙයි. ශ්‍රමය සැහැල්ලු කරනු වස්, අඩුවෙන් ශ්‍රමය වැය කර, වැඩියෙන් ද්‍රව්‍යමය සම්පත් ලබා ගැනීම් වස් මිනිස්සු පවත්නා උපකරණ වැඩි දියුණු කරන අතර, අලුත්, වඩාත් කාර්යක්ෂම උපකරණ නිර්මානය කරති.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

නිෂ්පාදන උපකරණ නිපදවීම සහ වැඩි දියුණු කිරීමද, තාක්ෂණික ප්‍රගතියද නිෂ්පාදනයේ යෙදී සිටින මිනිසුන්ගේ ක්‍රියාකාරීත්වයේ ප්‍රතිඵලයකි. එහෙත් ශ්‍රම උපකරණ වැඩිදියුණු කිරීමත් සමගම මිනිස්සුද දියුණු වෙති. නිෂ්පාදනය පිළිබඳ ඔවුන්ගේ තාක්ෂණික දැනුමද, නිපුණත්වයද උසස් වේ. අලුත්, අලුත් කර්මාන්තද බිහිවේ. නිෂ්පාදන යන්ත්‍රෝපකරන සහ නිෂ්පාදනයෙහි යෙදී සිටින්නන්ද වෙනස්වීමත් සමගම අවසානයේදී නිෂ්පාදන ක්‍රියාදමයෙහි යෙදී සිටින මිනිසුන්ගේ සම්බන්ධකම්, එනම් නිෂ්පාදන සම්බන්ධකම්ද වෙනස් වේ.

නිෂ්පාදනීය බලවේග, නිෂ්පාදන සම්බන්ධකම් බිහිකොට, ඒවා නිශ්චිත සම්බන්ධකම් රටාවක් බවට පත් කරයි. එහෙත් කිසියම් කාලයක් පවතින නිෂ්පාදනීය බලවේග ඇතිකරන්නේ එම නිෂ්පාදනීය බලවේගවල සහජ ස්වභාවයට ගැළපෙන, ඒවායේ ස්වරූපයට අනුකූල නිශ්චිත ස්වභාවයක නිෂ්පාදන සම්බන්ධකම් පමණකි. රදළ ක්‍රමය තුළ බිහිවූ ධනපති නිෂ්පාදනය, අන් කිසි සම්බන්ධකමක් ඇති නොකොට ධනවාදී නිෂ්පාදන සම්බන්ධකම් පමණක් ඇති කෙළේය.

නිෂ්පාදනීය බලවේග පදනම් කරගෙන පැන නගින නිෂ්පාදන සම්බන්ධතා අකර්මණ්‍ය ලෙස නොපවතී. නිෂ්පාදනීය බලවේගයන්ගේ සංවර්ධනය සීඝ්‍ර කරවීමෙන් හෝ පමා කරවීමෙන් හෝ ඒවා එම බලවේග කෙරෙහි ක්‍රියාශීලී ලෙස බලපායි. නිෂ්පාදන බලවේගයන්ට සරිලන ප්‍රගතිශීලී අලුත් නිෂ්පාදන සම්බන්ධකම් සමාජ නිෂ්පාදනයේ ව්‍යාප්තිය සීඝ්‍ර කරවයි. ඒවා නිෂ්පාදනීය බලවේගයන්ගේ සංවර්ධනයෙහි ප්‍රථම ප්‍රේරකයාද වන්නේය. අනිත් අතට නිෂ්පාදනීය බලවේගයන්ගේ වර්ධනයට වඩා අඩු වර්ධනයක් ඇති පැරණි නිෂ්පාදන සම්බන්ධකම්, එහි වර්ධනයට බාධා කරයි.

නිෂ්පාදනය සංවර්ධනයවීමට නම්, නිෂ්පාදන සම්බන්ධකම්, නිෂ්පාදනීය බලවේගයන්ගේ ස්වභාවයට සරිලන සේ තිබීම අනිවාර්ය අවශ්‍යතාවයකි. එක් හෝ තවත් ආකාරයකින් සියලු සමාජ-ආර්ථික සැකැස්මක් තුළම එය දක්නට ලැබිණි. එසේ වුවද, පෞද්ගලික දේපල හිමිකම සහ සූරාකෑම පදනම් කරගත් ප්‍රාග් සමාජවාදී සමාජ-ආර්ථික රටාවන් තුළ වර්ධනය වන නිෂ්පාදනීය බලවේගයන්ට සරිලනසේ නිෂ්පාදන සම්බන්ධතාවයන්ගේ නිත්‍ය අනුකූලතාවයක් තිබිය නොහැක. නිෂ්පාදන සම්බන්ධතාවයන්, එවන් ඕනෑම නිෂ්පාදන ක්‍රමයක මුල් අවධියේදී පමණක්, නිෂ්පාදනීය බලවේගයන්ගේ ස්වභාවයට ගැලපෙන නිසා ඒ අවධියේදී පමණක් නිෂ්පාදන සංවර්ධනයේ ප්‍රධාන ප්‍රේරකයා ලෙස ක්‍රියාත්මක වෙයි. අනතුරුව නිෂ්පාදන සම්බන්ධකම් ක්‍රම ක්‍රමයෙන් යල් පැනීමට පටන් ගනී.

ඒවා නිෂ්පාදන බලවේග වලට වඩා පසුවී ගාටන තත්වයට වැටෙයි. මේ නිසා අලුත් නිෂ්පාදනීය බලවේගයන් සහ පැරණි නිෂ්පාදන සම්බන්ධකම් අතර ප්‍රතිවිරෝධීතාවයක් පැන නගී.

මේ ප්‍රතිවිරෝධීතාවය අහඹුවක් නොවේ. එය සමාජ නිෂ්පාදනයේ විවිධ අංශවල සහජ ස්වභාවය නිසා පැන නගී. නිෂ්පාදනයේ අතිශයින්ම ගාමක කොටස නිෂ්පාදනීය බලවේග වන්නේය. මේවා නිරතුරුවම වෙනස් වේ. එකම නිෂ්පාදන ක්‍රමයක සීමා තුළ වුවද, මේ වෙනස්වීම් සැලකිය යුතු තරම් විශාල විය හැකිය. නිෂ්පාදන සම්බන්ධකම්, යම් කිසි ලෙසකින් වෙනස් වුවද, එක් නියමිත නිෂ්පාදන ක්‍රමයක් තුළදී ඒවා මූලික වශයෙන් වෙනස් නොවී පවතී. නිදසුනක් වශයෙන්, ධනපති ක්‍රමය පැවැත්මේ කාලය තුළදී, නිෂ්පාදන බලවේග ගැඹුරු වෙනස්වීම්වලට භාජනය වූ නමුත් පවත්නා නිෂ්පාදන සම්බන්ධතාවයද, පෙර මෙන්ම, පෞද්ගලික ධනපති අයිතිය මත පදනම් වී ඇත.

නිෂ්පාදන සම්බන්ධකම් ජංගම ශීලීත්වයෙන් අඩු බැවින් නිෂ්පාදනීය බලවේග සමග සමාන ලෙස වර්ධනය නොවේ. මෙසේ එම බලවේග වලට පසුවන නිෂ්පාදන සම්බන්ධකම්, නිෂ්පාදන බලවේගයන්ගේ සංවර්ධනයට බාධා කිරීමටද පටන්ගෙන ඒවා සමග ප්‍රතිවිරෝධීතාවයකට එළඹේ. නිෂ්පාදනීය බලවේග වඩ වඩාත් වර්ධනය වත්ම, නිෂ්පාදන සම්බන්ධතාවයන්ගේ බාධා කිරීම් වැඩි වැඩියෙන් දැනේ. එවිට මේ දෙක අතර ඇති ප්‍රතිවිරෝධතාවය වඩාත් උග්‍රවී, එය අවසානයේදී ඝට්ටනයක් දක්වා වැඩේ. පැරණි නිෂ්පාදන සම්බන්ධකම් විනාශ කොට, අලුත් ඒවා ඇතිකිරීම සඳහා සමාජමය විප්ලවයක් අවශ්‍ය වන්නේය.

සතුරු පංති සහිත සමාජයක නිෂ්පාදන බලවේගයන් සහ නිෂ්පාදන සම්බන්ධකම් අතර පවතින වාස්තවික දයලෙක්තික ස්වභාවය එසේය. මිනිස් සමාජයේ වර්ධනයේදී මෙම දයලෙක්තික ස්වභාවය ක්‍රියාකාරීවන සැටි මීළඟට අපි සොයා බලමු.

3. ආර්ථික පදනම සහ සමාජයේ උඩු ව්‍යුහය සහ ඒවායේ අන්‍යොන්‍ය ක්‍රියාකාරීත්වය

සමාජ සංවර්ධනයේ ප්‍රධාන තීරණාත්මක බලවේගය ද්‍රව්‍යමය සම්පත් නිෂ්පාදනය කිරීමේ ක්‍රමය බව අපි දැනගතිමු. නිෂ්පාදන ක්‍රමය හා නිෂ්පාදන සම්බන්ධකම් විසින් අනිකුත් සියලු සමාජ සම්බන්ධකම් (දේශපාලන, නීතිමය, සදචාරමය සහ අනිකුත් සම්බන්ධකම්) තීරණය

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

කෙරෙන්නේ කිනම් අන්දමකින්ද යනුත්, අනතුරුව, පසුකී සමාජ සම්බන්ධකම් සමාජයේ ආර්ථික සංවර්ධනය කෙරෙහි බලපාන්නේ කෙසේද යනුත්, අඩිතාලම හා අධි ව්‍යුහය පිළිබඳවූ මාක්ස්-ලෙනින්වාදී න්‍යායය විසින් විග්‍රහ කරනු ලැබේ.

විවිධ සමාජ සම්බන්ධකම් අතුරෙන්, ප්‍රධාන සහ තීරණාත්මක ඒවා වශයෙන් ගෙන ඓතිහාසික භෞතිකවාදය විසින් විග්‍රහ කෙරෙන්නේ ද්‍රව්‍යමය, නිෂ්පාදනමය සම්බන්ධකමය. මේ නිෂ්පාදන සම්බන්ධකම් සමස්තයෙන් සමාජයේ ආර්ථික ව්‍යුහය නැතහොත් එහි පදනම සෑදේ. නිෂ්පාදන සම්බන්ධකම් සමස්තය යන්නෙන් දේපල හිමිකම් රටාවන්, නිෂ්පාදන ක්‍රියාදමයේදී මිනිසුන් අතර එයින් ඇතිවන සම්බන්ධකම් සහ ද්‍රව්‍යමය සම්පත් බෙදහැරීමේ ක්‍රම අදහස් වේ.

අඩිතාලම සහ උඩු ව්‍යුහය යනු කුමක්ද?

හැම සමාජයකටම ස්වකීයමය අඩිතාලමක් ඇත්තේය. නිෂ්පාදන සම්බන්ධකම් සමස්තය වන මේ අඩිතාලමේ වර්ගය රඳා පවතින්නේ නිෂ්පාදනීය බලවේගයන්ගේ තත්ත්වය අනුවය. අලුත් අඩිතාලමකට සරිලන ද්‍රව්‍යවය තත්ත්වයන්, එනම් එහි උපත සඳහා අවශ්‍ය නිෂ්පාදන බලවේගයන්, පැරණි සමාජය තුළ පැන නගින තෙක්, කිසි විටෙකත් එවැන්නක් ඇති විය නොහැක.

අඩිතාලම පැන නැඟුණු පසු එය සමාජ ජීවිතයේ ඉතා බලවත් කාර්ය කොටසක් ඉටු කරයි. නිෂ්පාදනය සංවිධානය කිරීමේ සහ ද්‍රව්‍යමය සම්පත් බෙදහැරීමේ හැකියාව එයින් ජනතාවට ලැබේ. ආර්ථික සම්බන්ධකම් වලට නොබැඳී මිනිසුන්ට නිෂ්පාදනය කළ නොහැක. එනිසාම යැපීම් මාධ්‍යයන් බෙදහැරීමටද නොපුළුවන.

උඩු ව්‍යුහය ඉදිවීම සඳහා, එනම් දේශපාලනය හා නීතියත්, දර්ශනවාද, ආචාරධර්ම, ලලිත කලා හා ආගම් පිළිබඳවූ සමාජයේ දෘෂ්ටිවාදයත් ඒවාට සරිලන ව්‍යවසායයන් සංවිධාන සහ ආයතනත් ඉදිවීම සඳහා අත්තිවාරම වශයෙන් අඩිතාලම වැදගත් වේ. අඩිතාලම යනු සමාජයේ මුණුවරද, එහි අදහස් හා ආයතනද කෙළින්ම සකස් කරන්නාවූ නිෂ්පාදන ක්‍රමයේ අංශය වන්නේ එහෙයිනි.

සමාජ සංවර්ධනයේදී උඩු ව්‍යුහයෙන් ඉටුවන කාර්ය කොටසද ඉමහත්ය. එක්තරා නිශ්චිත ආර්ථික අඩිතාලමක් මත පැන නගින උඩු ව්‍යුහය, මෙම අඩිතාලම කෙරෙහි මිනිසුන් දක්වන ආකල්පය අවසාන වශයෙන් පිළිබිඹු කරයි. යම්කිසි පදනමක් ශක්තිමත් කිරීම හෝ විනාශ කිරීම හෝ යුක්ති සහගත බව ඒත්තු ගැනීමට විවිධ අදහස් මිනිසුන්ට ආධාරකාරී වේ. ආයතන හා සංවිධාන (රජය,

දේශපාලන පක්ෂ ආදිය) එම අදහස් ක්‍රියාවට පෙරළීමට මිනිසුන්ට ඉඩ සලසා දෙයි. නිෂ්පාදනීය බලවේගයන්ගේ සංවර්ධනයට උඩු ව්‍යුහය බලපාන්නේ අඩිතාලම මගිනි. නිදසුනක් වශයෙන්, කොමියුනිස්ට් ක්‍රමයට අවශ්‍ය ද්‍රව්‍යමය හා තාක්ෂණික අඩිතාලම දැමීම සඳහාද, කොමියුනිස්ට් නිෂ්පාදන බලවේග නිර්මාණය කිරීම සඳහාද, කොමියුනිස්ට් පක්ෂයත්, සෝවියට් රජයත්, සමස්තයක් වශයෙන් මුළු සමාජවාදී උඩු ව්‍යුහයත් කොතරම් වැදගත් කාර්ය කොටසක් ඉටු කරන්නේද යන්න සුප්‍රකට කරුණකි.

අඩිතාලම නිසා ජීවය ලබන උඩු ව්‍යුහය එය සමග අවියෝජ්‍ය ලෙස වෙළී පවතී. අඩිතාලම කෙසේද, උඩු ව්‍යුහයද ඒ අනුව වන්නේය.

උඩු ව්‍යුහය සම්බන්ධයෙන් අඩිතාලම ඉටු කරන තීරක කාර්ය කොටස

නිදසුනක් වශයෙන් ආදි කල්පික සමාජයේ පදනම ගෙන බලමු. එහි පෞද්ගලික දේපල හිමිකම සහ එයින් පැන නගින පංති සහ පංතිමය ප්‍රති විරෝධතාවයන්ද නොවීය. එබැවින් එම සමාජයේ උඩු ව්‍යුහයෙහි රාජ්‍යයක් දේශපාලන හා අධිකරණ අදහස් හෝ ඊට සරිලන ආයතන හෝ නොවීය.

පෞද්ගලික දේපල හිමිකමෙහි සහ පංතිවල උපත, එනම් වහල් සමාජයේ අඩිතාලම ඇතිවීම නිසා වෙනත් ආකාරයක උඩු ව්‍යුහයක් ජනිත විය. වහලුන් මත වහල් හිමියන්ගේ ආධිපත්‍යය තහවුරු කිරීමේ යුක්ති සහගත භාවය පෙන්වන අදහස ඇතිවිය. එමෙන්ම එම පාලනය ආරක්ෂා කරන ආයතනද (රජය ආදිය) ඇති විය.

සතුරු පංති සහිත සමාජයක පදනමෙහි ප්‍රතිවිරෝධතා ඇත. නිෂ්පාදන මාධ්‍යයන් කෙරෙහිවූ මිනිසුන්ගේ විවිධ සම්බන්ධකම් එනම් පංතිමය වුවමනාවන්ගේ ප්‍රතිපාක්ෂිකතාවය හා සූරා කන්නන් සහ සූරාකනු ලබන්නන් අතර ඇති විරුද්ධතාවයද එයින් පිළිබිඹු වේ. ධනපති පංතිය සහ නිර්ධන පංතිය අතර ඇති ප්‍රතිවිරුද්ධතාවය ප්‍රධාන සලකුණ කොටගත් සමකාලීන ධනපති පංතියේ උඩු ව්‍යුහය මීට නිදසුනකි. එහෙත් ධනපති සමාජයේ ආර්ථික ව්‍යුහය මූලික සතුරු පංති දෙක අතර සම්බන්ධතාවයන්ට පමණක් සීමාවන බවක් මෙයින් අදහස් නොවේ. ධනපති සමාජයේ ධනපති පංතිය හා නිර්ධන පංතිය හැරුණු විට, කෘෂිකාර්මික කම්කරුවන්, හස්ත කර්මාන්ත කරුවන්, නගරවල හා ගම්වල සුළු ධනේශ්වරයින් වැනි පංති හා සමාජ කොටස් ඇත්තේය. මේ කොටස්වල උවමනාවන්ද ඒකාධිකාරී ධනපති පංතියේ උවමනාවන් සමග ගැටෙන්නේය.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

අඩිතාලමේ ඇති ප්‍රතිවිරුද්ධතාවය පිළිබිඹු කරන, සතුරු පංති සහිත සමාජයේ උඩු ව්‍යුහය එමෙන්ම ප්‍රතිවිරෝධතා සහිතය. එම උඩු ව්‍යුහයට විවිධ පංතිවල සහ සමාජ කණ්ඩායම්වල අදහස් සහ සංවිධාන ඇතුලත්වන අතර ආර්ථික ආධිපත්‍යය උසුලන පංතියේ අදහස් ආයතන හා සංවිධාන එහි වඩාත් බලවත් වේ. "සමාජයේ ද්‍රව්‍යමය බලය පාලනය කරන පංතිය. ඒ සමගම, බුද්ධිමය බලයත් පාලනය කරන්නේය"*යි මාක්ස් හා එංගල්ස් ලියුවෝය. ධනපති ක්‍රමය යටතේ ආර්ථික ආධිපත්‍යය ධනපති පංතිය සතුය. එබැවින් එම සමාජය තුළ ධනපති අදහස් හා ආයතන බලවත්ය. නිර්ධන පංතියට විරුද්ධව සටන් කිරීම සඳහාත්, සිය ආධිපත්‍යය සදාකාලික කිරීම සඳහාත් ධනපති පංතිය ඒවා පාවිච්චි කරයි.

ධනපති සමාජයේදී ධනපති පංතියට විරුද්ධව නැගී සිටින නිර්ධන පංතිය ස්වකීයම වූ අදහස් හා ආයතන සකස් කරගනී. ක්‍රම ක්‍රමයෙන් නිර්ධන පංතිය ධනපති ක්‍රමයේ හරය අවබෝධ කරගැනීමට පටන්ගෙන, එය විනාශ කර දැමීමේ අවශ්‍යතාවය වටහා ගනී. ධනපති පංතියට විරුද්ධව සටන් කිරීම සඳහා නිර්ධන පංතිකයෝ තමන්ගේම සංවිධාන වන දේශපාලන පක්ෂයක්ද, වෘත්තීය සමිතිද, සමුපකාර සමිතිද ආදී වූ සංවිධාන සාද ගනිති. විප්ලවවාදී සටන් අතර තුරදී මාක්ස්වාදී න්‍යායය ප්‍රවීණ කර ගන්නා නිර්ධන පංතිය තමන්ගේම සදාචාරයක්ද, දේශපාලනය (අධිකරණ) නීති සහ ආචාර ධර්ම පිළිබඳවූ තමන්ගේම මතද නිර්මාණය කරයි.

උඩු ව්‍යුහය අඩිතාලම විසින් තීරණය කෙරෙන බව පෙනෙන්නේ, එය පදනම නිසා බිහිවීමෙන් පමණක් නොව, ආර්ථික ව්‍යුහයේ ඇතිවන අත්‍යාවශ්‍ය වෙනස් කම් විසින් උඩු ව්‍යුහයේද අනිවාර්යයෙන්ම වෙනස් කම් ඇති කරනු ලැබීමෙන්ද එය පැහැදිලි වේ. නිදසුනක් වශයෙන්, ප්‍රාග් ඒකාධිකාරී ධනපති ක්‍රමයේ සිට අධිරාජ්‍යවාදය දක්වා පරිවර්තනය වීමේදී ධනපති ආර්ථිකය විශාල වෙනස් කම් වලට පාත්‍ර විය. නිදහස් තරඟය වෙනුවට ඒකාධිකාරය ඇතිවිය. ඒ අනුව ධනපති උඩු ව්‍යුහයද වෙනස් විය. රටවල් කීපයකම ධනපති පංතිය ධනපති ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු ක්‍රමයේ සිට ප්‍රතිගාමී පැසිස්ට්වාදී නැතිනම් අර්ධ පැසිස්ට්වාදී ක්‍රම දක්වා පරිවර්තනය විය. පරිවර්තනය වේ. වැඩ කරන ජනතාවගේ අයිතිවාසිකම් වැඩි වැඩියෙන් සීමා කෙරෙයි. කොමියුනිස්ට් පක්ෂ හා ප්‍රගතිශීලී සංවිධානවලට අධික ලෙස හිරිහැර

---

* කාල් මාක්ස් සහ ෆ්‍රෙඩරික් එංගල්ස්. කෘති එකතුව, වෙළුම 3, පිටුව 45.

පීඩා කරනු ලැබේ. ධනවාදී ලලිත කලා ශිල්ප හා දර්ශනවාද ජරාවට යමින් පවතින අතර විඥානවාදයේ අන්ත ප්‍රතිගාමී ස්වරූප ඉස්මතුවේ.

සමාජ විප්ලවයේ ප්‍රතිඵලයක් වශයෙන් එක් ආර්ථික අඩිතාලමක් වෙනුවට තවත් එකක් ස්ථාපිත වූ කල්හී උඩු ව්‍යුහයේ ඇතිවන වෙනස්වීම් ඉතා ගැඹුරුයි. විප්ලවයක් සිදුවන විට, පැරණි පංතියේ දේශපාලන ආධිපත්‍යය බිඳ දමා නව පංතියේ ආධිපත්‍යය ස්ථාපිත කරනු ලැබේ. පැරණි රාජ්‍ය යන්ත්‍රය වෙනුවට අලුත් රාජ්‍ය යන්ත්‍රයක් (දේශපාලන හා අධිකරණ ආයතන පද්ධතියක්) ඇති කරනු ලැබේ. මෙහිදී සමාජ විඥානයද වෙනස් වේ. පැරණි දෘෂ්ටිය පන්නා දමා, නව පදනමට සරිලන නව දෘෂ්ටියක් එයි. වි. අයි. ලෙනින් පෙන්වා දුන් පරිදි, "පැරණි උඩු ව්‍යුහය පුපුරා හැලෙන අතර විවිධතම සමාජ බලවේගයන්ගේ ස්වාධීන ක්‍රියාකාරිත්වය තුළින් නව උඩු ව්‍යුහයක් නිර්මානය වේ".*

උඩු ව්‍යුහයේ සාපේක්ෂ ස්වාධීනත්වය සහ එහි ක්‍රියාශීලීභාවය

අඩිතාලම විසින් බිහි කරනු ලබන උඩු ව්‍යුහයත් සාපේක්ෂ ස්වාධීනත්වයකට හිමිකම් කියයි. එහි වර්ධනයේ අවිච්ඡේදතාවයෙන් එම ස්වාධීනත්වය ප්‍රකට වෙයි. පැරණි අඩිතාලම වෙනුවට අලුත් එකක් ස්ථාපිත වූ විට, උඩු ව්‍යුහයේ ඇතිවන විප්ලවය නිසා පැරණි උඩු ව්‍යුහයේ තිබූ සියලු අංග ලක්ෂණ ඉබේටම අහෝසි වී යන්නේ නැත. පැරණි අඩිතාලම විනාශවීමත් සමගම පැරණි උඩු ව්‍යුහය සමස්තයක් වශයෙන් හා පැරණි සමාජයේවූ මත සහ ආයතන පද්ධතියක් වශයෙන්ද විනාශයට යයි. එම උඩු ව්‍යුහයේ සමහර අංග, එය බිහිකළ අඩිතාලමට වඩා වැඩි කලක් පවතිමින්, අලුත් සමාජයේ උඩු ව්‍යුහයට ඇදෙයි. ඒවා මෙම නව සමාජයේ පංතිවලට සේවය කරමින් ඒවායේ උවමනාවන් ඉටුකරයි. මෙහිදී අලුත් උඩු ව්‍යුහය, නව සමාජයේ පංතිවලට සේවය කළ හැකි, එම පංතීන්ගේ වුවමනාවලට ගැලපෙන අංග පමණක් තෝරා ගනී. අලුතින් ඇතිවන සූරාකන සමාජය එයට පෙර පැවති සමාජයේ උඩු ව්‍යුහයෙන් සූරාකෑම ශුද්ධවූ දෙයක් හැටියට පෙන්වන අදහස්ද, සූරාකන්නන්ගේ අධිකරණ සංස්ථාද ආගම්ද පිළිගනී. නිදසුනක් වශයෙන් වහල් සමාජයේදී ඇතිවූ ක්‍රිස්තියානි ආගම රදළ ක්‍රමයේදී විශ්වාසවත් ලෙස රදළ ස්වාමිවරුන්ට සේවය කළ අතර, දැන් ධනපති පංතියට සේවය කරයි.

---

* වි. අයි. ලෙනින්. සම්පූර්ණ කෘතීන්, වෙළුම 9, පිටු 125—126.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ඕනෑම සමාජයක උඩු ව්‍යුහයේ මුළු මහත් මිනිස් සංහතියටම වැදගත් කමක් ගෙන දෙන ස්ථාවර අංග ලක්ෂණද ඇත්තේය. පොදු ජනතාවගේ සදචාරමය දියුණුවද, සාහිත්‍යයේ හා කලා ශිල්පවල ඉතාම උසස් කෘතීන්ද මේවාට අයත්ය. උඩු ව්‍යුහයේ අවිච්ඡේද ස්වභාවය නිසා හැම සමාජයක්ම ඉතාමත් සංකීර්ණය. පැරණි සමාජයෙන් දායාද වශයෙන් ලැබුණු අදහස් හා ආයතනද, ඒ ඒ ආර්ථික අඩිතාලම මත ඇතිවුණු අදහස් හා සංස්ථාද එයට ඇතුලත් වේ.

ආර්ථික අඩිතාලම පදනම් කරගෙන පැන නගින එය, එම ව්‍යුහයේම වර්ධනය සඳහා ක්‍රියාකාරී වැඩ කොටසක් ඉටු කිරීමෙන්ද උඩු ව්‍යුහයේ සාපේක්ෂ ස්වාධීනතාවය දක්නට ලැබේ. සතුරු පංති සහිත සමාජයක බලපවත්වන අදහස් සහ ආයතන එම සමාජයේ පදනම ආරක්ෂා කිරීම සහ ශක්තිමත් කිරීම සඳහා කටයුතු කරයි. ඒවායින් බලාපොරොත්තු වන්නේ ඒවා බිහි කළ පංතියේ පාලනය යුක්තියුක්ත බව ඒත්තු ගැන්වීමයි. එවා එම පංතියේ උවමනාවන් ආරක්ෂා කිරීමට ඉරනම්ව ඇත. සතුරු පංති සහිත සමාජවල පාලන පංතිවලට එරෙහිවූ අනිකුත් පංතීන්ට විරුද්ධව පාලන පංතිය කරන සටන් ශුද්ධ අරගල බවට පත් කිරීමේ හා ඒවා සංවිධානය කිරීමේ න්‍යායික මාධ්‍යවන්නේ එම අදහස් හා ආයතනය. පාලන පංති එම අරගල මෙහෙයවමින් සූරාකෑමෙන් සහ යටත් විජිතවාදයෙන් හා අනිකුත් පෑගීම්වලින් මිදීම සඳහා විරුද්ධ පංති දරන අභිප්‍රාය මර්ධනය කරයි. එම පාලක පංතිය මෙම අරගලය එල්ල කරන්නේ වැඩියෙන්ම කම්කරු පංතියට විරුද්ධවය.

නිදසුනක් වශයෙන් අපි ධනපති පංතියේ අදහස් හා ආයතන ගෙන බලමු. ධනවාදී අඩිතාලම මුල් බැස ගන්නා කාලයේදී, එය සංවර්ධනය කිරීමට සහ තහවුරු කිරීමට ඉවහල් වූ ඒවා රදළ පංතියට විරුද්ධව කළ සටනේදී බලසම්පන්න අවියක් බවට පත්විය. එහෙත් වත්මන් කාලයේදී, කෙසේ හෝ ධනපති අඩිතාලම ආරක්ෂා කර ගැනීම සඳහා ධනපති ක්‍රමය බිඳ වැටීම වැලැක්වීම හෝ යටත් පිරිසෙයින් කල්දැමීම හෝ සඳහා සියලු ප්‍රගතිශීලී බලවේග පාගා දැමීමට එම ධනපති අදහස් හා ආයතන උපයෝගී කරගනු ලැබේ. සමකාලීන ධනපති ක්‍රමය තවමත් විනාශ නොවී රැකෙන්නේ, එහි හිමිකම් ආරක්ෂා කිරීම සඳහා ප්‍රධාන කොටම ධනපති රජයද, නීතියද ධනපති ක්‍රමය ආරක්ෂා කිරීම සඳහා ඉතා විශාල කාර්ය කොටසක් ඉටු කරමින් දෘෂ්ටිමය බලපෑම් කරන සියලුම මාධ්‍යයන්ද මෙහෙවරෙහි යෙදෙන නිසාය.

4. සංකීර්ණ සමාජමය ඓන්ද්‍රියයක් වශයෙන් සමාජ-ආර්ථික සැකැස්ම

ද්‍රව්‍යමය සම්පත් නිෂ්පාදනය කිරීමේ ක්‍රමද, සමාජයේ ආර්ථික පදනම සහ උඩු ව්‍යුහයද හැදෑරූ අපට සමාජ ආර්ථික සැකැස්ම පිළිබඳ අපේ දැනීම පුළුල් කර ගැනීමට සහ ගැඹුරු කර ගැනීමටද, සැකැස්ම සංකීර්ණ සමාජමය ඓන්ද්‍රියයක් ලෙස වටහා ගැනීමටද හැකියාවක් ලැබී ඇත්තේය. ද්‍රව්‍යමය සම්පත් නිෂ්පාදන කිරීමේ ක්‍රමය ද්‍රව්‍යමය ආර්ථික සැකැස්මේ පදනම වේ. එහි අස්ථි පංජරය හෙවත් පදනම ආර්ථික ව්‍යුහය විසින් සෑදේ. සමාජ-ආර්ථික සහ අධ්‍යාත්මික මූණුවර උඩු ව්‍යුහය විසින් පෙන්නුම් කෙරේ. ඒ අනුව නිෂ්පාදනය, පදනම හා උඩු ව්‍යුහය ඕනෑම සමාජ-ආර්ථික සැකැස්මක වැදගත්ම පුරුක් සහ සියලු කොටස් නියෝජනය කරයි. හැම සැකැස්මයකම ඒවා විශේෂ වැදගත් කමක් ප්‍රකාශ කරයි.

සමාජ-ආර්ථික සැකැස්මට නිෂ්පාදනය, පදනම හා උඩු ව්‍යුහය හැරුණ විට, වෙනත් සමාජමය ප්‍රපංච — මිනිසුන්ගේ නියමිත ඓතිහාසික පොදුබව (වර්ගය, වංශය, ගොත්‍රය, ජාතිය), පැවැත්ම, පවුල සහ විවාහය, භාෂාව, ප්‍රකෘති විද්‍යා, සමහර සමාජ සංවිධාන (විද්‍යා-තාක්ෂණික, ක්‍රීඩා) — අයත් වේ. පදනමට හෝ උඩු ව්‍යුහයට කෙළින්ම අයත් නොවන ප්‍රපංච වන මේවා ඕනෑම සැකැස්මක අවශ්‍ය කොටස් වශයෙන් පවතී. සම්බන්ධකම් ඇතිකර ගැනීමේ සහ අදහස් හුවමාරු කර ගැනීමේ මාධ්‍යය වන භාෂාවෙන් තොරව, මිනිසුන්ට වැඩකිරීමට හා කල්පනා කිරීමට පුළුවන්ද? පවුල හා විවාහයෙන් තොරව මිනිස් වර්ගයා බෝ කිරීමට හැකිද? සත්තකින්ම නොපුළුවන.

ඉහත සඳහන් කරන ලද ප්‍රපංච, රීතියක් වශයෙන් හැම සැකැස්මකටම විශේෂ වන්නේය. එක් සැකැස්මක සිට තවත් සැකැස්මකට පරිවර්තනය වෙද්දී ගැඹුරු වෙනස්කම් ඇතිවේ. මිනිසුන් අතර සම්බන්ධකම් ඇතිවීමේ ආකාරයද වෙනස් වේ. අප පසුව දකින පරිදි, ආදි කල්පික සමාජයට වංශය හා ගණ ගෝත්‍රය ස්වභාවික වී නම්, රදළ ක්‍රමයට කුල ක්‍රමයද, ධනපති ක්‍රමයට ජාතියද ස්වාභාවික වන්නේය. ධනපති ක්‍රමයේ සිට සමාජවාදය දක්වා පරිවර්තනය වීමේදී ජනතාව ධනවාදී ජාතීන්ගේ සිට සමාජවාදී ජාතීන් දක්වා වෙනස් වේ. සැකැස්ම වෙනස්වන විට, මිනිසුන්ගේ පැවැත්මද පවුල හා විවාහය ආදියද වෙනස් වේ. එහෙත් භාෂාව වෙනස් වන්නේ සමාජය වර්ධනය වීමත් සමගය. භාෂාවට එක් සමාජයක සිට තවත් සමාජයක්

https://liberationbase.wordpress.com

දක්වා පැවතිය හැකිය. විවිධ සැකැස්ම වලදී මිනිසුන් විසින් ශ්‍රමයේදී හා ජීවිතයේදී පාවිච්චියට ගනු ලබන ප්‍රකෘති විද්‍යාවේ ජයග්‍රහණ සහ සොයා ගැනීම්ද එලෙසම පරිවර්තනය වේ.

සමාජ-ආර්ථික සැකැස්ම නිර්මාණය කරන සමාජ ප්‍රපංච ඓන්ද්‍රියමය ලෙස සම්බන්ධවී ඇත. කෙළින්ම හෝ අනියම් ලෙස හෝ ඒවා එකිනෙක මත බලපායි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් සැකැස්ම සංකීර්ණ, වර්ධනය වන, සමාජමය ඉන්ද්‍රියයක් ලෙස ක්‍රියාකාරී වේ.

නිෂ්පාදන බලවේග හා නිෂ්පාදන සම්බන්ධකම් අතරද පදනම සහ උඩු ව්‍යුහය අතරද ඒකීයතාවය ගැනද, ස්ථිර අන්‍යොන්‍ය ක්‍රියාකාරිත්වය ගැනද අපි කලින් විස්තර කළෙමු. උඩු ව්‍යුහය එමෙන්ම නියම ලෙස නොව අනියම් ලෙස ආර්ථික ව්‍යුහය තුළින් නිෂ්පාදන බලවේග සමග සම්බන්ධ වී ඇත්තේය. උඩු ව්‍යුහයේ මූලිකාංගද එලෙසම අන්‍යොන්‍ය ක්‍රියාකාරිත්වයේ යෙදේ. නිදසුනක් වශයෙන් දේශපාලනය කලා ශිල්ප, සදචාර ධර්මය දර්ශනවාදය සහ මිනිසුන්ගේ අධ්‍යාත්මික දේ මත බලපායි. නිෂ්පාදනය, පදනම හා අධි ව්‍යුහය මිනිසුන්ගේ පවුල් සම්බන්ධකම් ආදිය මත සටහන් තබයි. සමාජ ආර්ථික සැකැස්ම, අතිශයින්ම විවිධ සමාජ ප්‍රපංචවල අන්‍යොන්‍ය වෙළීමක් සහ අන්‍යොන්‍ය ක්‍රියාකාරිත්වයකි. මෙහි පළමු හේතුව සහ මුල් පදනම ද්‍රව්‍යමය නිෂ්පාදනය වන්නේය. විවිධ සමාජ ප්‍රපංච සියල්ලටම කා වදින, ඒ හැම එකකම ස්ථානය හා වැදගත්කම තීරණය කරන, ඒවා තමනට යටත් කරගන්නාවූත්, තම ස්වභාවයට සරිලන සේ ඒවා වෙනස් කරන්නාවූත් නිෂ්පාදනය "විශේෂ ඊතර" හැටියට කාල් මාක්ස් හැඳින් වූයේ අහම්බෙන් නොවේ.

විවිධ සමාජ ප්‍රපංචවල නොබිඳිය හැකි ඒකීයතාවයත්, අන්‍යොන්‍ය සම්බන්ධකම් සහ ද්‍රව්‍යමය පදනමත් සමාජ-ආර්ථික සැකැස්මේ ප්‍රභේදයත් හෙළි කිරීම නිසා ප්‍රාග් මාක්ස්වාදීය සමාජ විද්‍යාව සමාජයේ විඥානවාදී සහ පාරභෞතිකවාදී මත අහෝසි කර දමයි. සමාජ ජීවිතය පිළිබඳ ඉතිහාසයෙන් පරිබාහිර, වියුක්ත දෘෂ්ටි සැකැස්ම නිසා අහෝසි විය. පොදුවේ සමාජයක් නැත, ඇත්තේ සංයුක්ත ඓතිහාසික සමාජයකි. කාල් මාක්ස් පෙන්වා දුන් පරිදි, "ස්වකීය විශේෂ අංග ලක්ෂණ සහිත සමාජය, ඓතිහාසික සංවර්ධනයේ නියමිත අවධියක පවතී"* හැම සැකැස්මකටම සිය විශේෂ නිෂ්පාදන බලවේගයන්ද නිෂ්පාදන සම්බන්ධකම්වල නියමිත වර්ගයක්ද, එයටම ආවේණික අධ්‍යාත්මික

---

* කාල් මාක්ස් සහ ෆ්‍රෙඩරික් එංගල්ස්. කෘති එකතුව, වෙළුම 6, පිටුව 442.

ජීවිතයක් ආදියද ඇත්තේය. මේවා ඉතිහාසයේ පොදු නියාමවලට යටත්වන අතර එක් එක් සැකැස්මයකට විශේෂ එයට පමණක් ආවේනික වූ නියාමයන්ද ඇත්තේය. නිදසුනක් වශයෙන්, කොමියුනිස්ට්වාදී සැකැස්මය ක්‍රම සම්පාදක, සමානුපාතික වර්ධනයකින්ද, පොදු ජන ක්‍රියා කලාපය ඉහළ නගින නියාමයක් ආදියෙන්ද යුක්ත වේ.

එබැවින් සමාජ-ආර්ථික සැකැස්මය පිළිබඳ සංකල්පය, සංකීර්ණ ඓතිහාසික සිද්ධීන් සමූහය තෝරා බේරා ගැනීමට ඉඩ සලසයි, හැම එකක්ම තවත් එකක අනුකරණයක් වුවද, ඒවායේ හරය සාමාන්‍යය සහ අනුකරණය හෙවත් සමාජ සංවර්ධනයේ නියාමයන් හෙළිකිරීමට සංකල්පය අදාළ වේ. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ඉතිහාසය අහම්බෙන් සිදුවන, ප්‍රපංචයන්ගේ අවුල් ජාලාවක් හැටියට නොව, එක් සමාජ -ආර්ථික සැකැස්මක් තවත් වඩාත් උසස්, අංග සම්පූර්ණ සැකැස්මකින් වෙනස් වන නියමානුකූල ස්වාභාවික ඓතිහාසික ක්‍රියාදමයක් ලෙස සමාජ ඉතිහාසය ක්‍රියා කරන බව පෙනී යයි. මෙහිදී වාස්තවික පදනමේ පොදු බවද, අනුකරණයද නිෂ්පාදන සම්බන්ධකමේ ඓතිහාසික නියමිත වර්ගයක්ද එයට අනුචිත නිෂ්පාදන බලවේගයන්ගේ නියමිත ස්වභාවයක්ද හෙළිවේ. "... නිෂ්පාදනයට අනුකූල සමාජ සම්බන්ධකම් පිළිබඳ සාක්ෂිද, ඒවා නිෂ්පාදන බලවේගයන්ගේ උච්චස්ථානයට අනුකූලවද පමණක් ස්වභාවික ඓතිහාසික ක්‍රියාදමයේ වර්ධනය පිළිබඳව හැඟීමකට ස්ථිර පදනමක් දුන්නේය"*යි වී. අයි. ලෙනින් ලියූවේය.

සමාජ-ආථික සැකැස්ම සොයාගැනීමත් සමගම ඓතිහාසික ක්‍රියාදමය දෘඩ විද්‍යාත්මක කාල පරිච්ඡේදවලට බෙදෙයි. ආදි කල්පික සමාජය, වහල් සමාජය, රදළ සමාජය, ධනපති සමාජය සහ කොමියුනිස්ට් සමාජය ඓතිහාසික කාල පරිච්ඡේද වල වැදගත් අවධි වන අතර ස්වාභාවික ඓතිහාසික අවශ්‍යතාවයන් යටතේ නියමානුකූල ලෙස එකිනෙකට පරිවර්තනය වේ. හැම සැකැස්මයකම රාමුව තුළ ඉතිහාසය එක තැන රඳා නොපවතී. ඓතිහාසික සංවර්ධනය සැකැස්මයක සිට තවත් සැකැස්මයක් දක්වා ගුණාත්මක ලෙස යෝධමය පිම්මි අනුව ඇති වනවා පමණක් නොව, එකම සැකැස්මයක් තුළ එක් තත්ත්වයක සිට තවත් තත්ත්වයක් දක්වා පහළ සිට ඉහළ දක්වා ඉදිරියට යයි. ධනවාදය සංවර්ධන අවධි දෙකක් (ප්‍රාග් ඒකාධිකාරී සහ ඒකාධිකාරී, අධිරාජ්‍යවාදී) පසු කරයි. කොමියුනිස්ට්වාදී සැකැස්මද

---

* වී. අයි. ලෙනින්. සම්පූර්ණ කෘතීන්, වෙළුම 1, පිටුව 123.

https://liberationbase.wordpress.com

අවධි දෙකක් — සමාජවාදී පහත් අවධියේ සිට කොමියුස්ට්වාදී උසස් අවධිය දක්වා වර්ධනය වේ.

සෑම සැකැස්මයක්ම පසු කරමින් වර්ධනය වූයේ හැම ජනතාවක්ම නොවන බව ඉතිහාසය පෙන්වා දෙයි. ආදි කල්පික යුගයේ සිට කෙළින්ම රදළ යුගය දක්වා, එනම් වහල් යුගයට පා නොතබා ස්ලාව් හා ජර්මන් ජාතික ගණ ගෝත්‍ර වර්ධනය වූහ. සමහර ජන කොටස් (සෝවියට් සංගමයට අයත් මධ්‍යම ආසියාතික සෝවියට් සමූහාණ්ඩු, මොන්ගෝලියානු මහජන සමූහාණ්ඩුව) ධනපති ක්‍රමය පමණක් නොව, රදළ ක්‍රමයේ වර්ධනය වූ අවධිය පවා මග හැර සමාජවාදී සමාජ ක්‍රමය දක්වා පැමිණ සිටිති. එසේ වුවද මිනිස් සංහතිය එක් ක්‍රමයක සිට තවත් ක්‍රමයක් දක්වා වර්ධනයවීමේ පොදු වාස්තවික ප්‍රවණතාවය මෙයින් අහෝසි නොවන අතර ඓතිහාසික ක්‍රියාදාමයේ ඒකීයතාවය සහ සම්පූර්ණත්වය මින් උල්ලංඝණය නොකෙරේ.

විවිධ මහාද්වීපවල, විවිධ ජන කොටස් අතර දක්නට ඇති, පොදු සමාජ-ආර්ථික සැකැස්ම නැමැති සංකල්පයෙන් හෙළිවන දේ විසින් එකම ක්‍රමයකට අයත් විවිධ ජන කොටස් අතර ඇති විශේෂතාවයන් අවලංගු නොකෙරේ. නිදසුනක් වශයෙන් ඒ විශේෂතාවයන්, ඒවායේ සංවර්ධනයේ අසමාන වේගයද, මට්ටමේ වෙනස අනුව ප්‍රකාශ වේ. විවිධ ජාතීන් එක් හෝ තවත් ක්‍රමයකට එක්වර ඇතුළු නොවීමද, ඔවුන් මුණ පාන අභ්‍යන්තර හා බාහිර තත්ත්වයන්ගේ වේගයේ අසමානතාවයද, ප්‍රධාන එක් හෝ තවත් ක්‍රමයක හරය සමග ඇති ස්වභාවයද සමග වෙළී පවතී. ධනපති ක්‍රමය තුළ, එහි අධිරාජ්‍යවාදී අවධියේදී, විවිධ රටවල්වල ආර්ථික හා දේශපාලන සංවර්ධනයේ අසමානතාවය පිළිබඳ නියාමය ක්‍රියාවට යෙදෙයි. සමාජවාදයට පරිවර්තනයවීමත් සමගම සංවර්ධනය වේගය සහ මට්ටම ක්‍රම ක්‍රමයෙන් සමාන වන්නේය. ලෝක පුරා කොමියුනිස්ට්වාදය ජයග්‍රහණය කිරීමෙන් අනතුරුව සංවර්ධන වේගයන්ගේ හා මට්ටම්වල විවිධත්වය සම්පූර්ණයෙන්ම අතුරුදහන් වේ.

සමාජ-ආර්ථික සැකැස්ම, ඒ ඒ රටවලට ආවේණික ක්‍රම බලන විට අතිශයින්ම සංකීර්ණ 'පලාවන්' චිත්‍රයක් පෙන්නුම් කරයි. නිරපේක්ෂ වශයෙන් 'පිරිසිදු' සැකැස්මයක් ඉතිහාසය නොදනී. එක් හෝ තවත් සැකැස්මයක් තුළ පැරණි සැකැස්මේ නටබුන්ද, සමාජ ජීවිතයේ විවිධ ක්ෂේත්‍රවල (සමාජවාදී සමාජයක විඥානයේ සහ හැසිරීමේ ධනවාදී නටබුන්) එමෙන්ම අලුත් සැකැස්මේ කලල රූප සහ පූර්ව තත්ත්වයන්ද දැකීමට පිළිවන. නිදසුනක් වශයෙන්, විශාල ප්‍රමාණ ධනවාදී නිෂ්පාදනය සමාජවාදයේ ද්‍රව්‍යමය පූර්ව තත්ත්වයක්

වන්නේය. එම පදනම මත පැන නැගුණු කම්කරු පංතියට — සමාජමය බලවේගයට සමාජවාදය ගොඩනැගීමේ කාර්ය භාරය නියම වී ඇත.

සමාජ සංවර්ධනය එක් සැකැස්මයක සිට තවත් සැකැස්මයක් දක්වා මිනිස් සංහතිය ගමන් කරන, සමාජ සංවර්ධනයේ නියමානුකූල, ස්වාභාවික ක්‍රියාදාමයකි. මේ ගමන, ප්‍රවණතාවයක් මෙන්, සංයුක්ත, අතිශයින්ම විවිධ ඓතිහාසික සිද්ධීන් තුළින් සිය මග සොයා ගනී.

5. සමාජ ඉතිහාසය සමාජ-ආර්ථික සැකැස්මේ නියමානුකූල අනුප්‍රාප්තියේ සහ සංවර්ධනයේ ඉතිහාසය හැටියට

ඉතිහාසය අනුගාමී නිෂ්පාදන ක්‍රම පහක් දනී. ආදි කල්පික සමූහ ක්‍රමය, වහල් ක්‍රමය, රදළ ක්‍රමය, ධනපති ක්‍රමය සහ කොමියුනිස්ට් ක්‍රමය ය.

ආදි කල්පික සමාජ ක්‍රමය

සමාජ ඉතිහාසය මිනිසාගේ බිහිවීමත් සමග පටන් ගනී. මිනිසා සතුන්ගෙන් වෙනස් වන්නේ ශ්‍රම උපකරණ සෑදීමට සහ ඒවා පාවිච්චි කිරීමට ඔහුට ඇති හැකියාව නිසාය. මිනිසා ඇතිවීමේ සහ ඔහුගේ වර්ධනයේ වැදගත්ම ස්ථානය ශ්‍රමයට අයත් වේ. මිනිසා හැඩගැසුනේත්, ඔහුගේ සමාජ සංවිධාන රටාවන් බිහිවී වර්ධනය වූයේත් ශ්‍රම ක්‍රියාදාමයේදීය.

ඓතිහාසික වශයෙන් මිනිස් සංවිධානයේ ප්‍රථමතම අතිශයින් පහළම ක්‍රමය වූයේ ආදි කල්පික සමාජ ක්‍රමය ය. මෙය අවුරුදු දස දහස් ගණනක් තිස්සේ පැවතිණ. මේ කාලය තුළදී මිනිසා ස්වාභාවික ශ්‍රම උපකරණ වන ගල් මුල් සහ ලී දඬු පාවිච්චි කිරීමේ සිට තමා විසින් සාදන ලද පෞරාණික උපකරණ පාවිච්චිය දක්වා ඉදිරියට යාමට සමත් විය. මුලදී ගල්වලින්, දඬුවලින් සතුන්ගේ අංවලින් හෝ කටුවලින් (ගල් පොරොව, පිහිය, උල් කටු, තෝමර, හෙල්ල සහ මසුන් මැරීම සඳහා බිලි කටු ආදිය) රළු උපකරණ සාදන ලදී. කල් යත්ම, මේ අවි වැඩි දියුණු කොට සුපරික්ෂාකාරී ලෙස හැඩ ගස්වනු ලැබිය. අනතුරුව දුන්න සහ ඊය, ඔරු, හිමයානා ආදී අලුත් උපකරණ ඇතිවිය. මිනිසා ගින්දර මොළවා ගැනීමට ඉගෙන ගත්තේය. එය මිනිස් සංහතියේ වර්ධනය සඳහා විශේෂ අති වැදගත් පියවරක් විය.

ශ්‍රම අවි, උපකරණ වර්ධනය වීම හා සමගම මිනිසාගේ වැඩද

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

වැඩි දියුණු විය. ප්‍රකෘතියේ නිපැයුම් (ආහාරයට සුදුසු පල-වැල වර්ග, පලා වර්ග) එකතු කිරීමේ සිට ගස් හා පැලෑටි වැවීම, ගොවිතැන් කිරීම දක්වාද, වන සතුන් දඩයම් කිරීමේ සිට ඔවුන් හීලෑ කිරීම හා සතුන් ඇති කිරීම සහ සත්ත්ව පාලනය දක්වාද මිනිසා දියුණු විය.

නිෂ්පාදන බලවේගයන්ගේ ඉතා පහළ මට්ටමට අනුකූලවන සේ ආදි කල්පික සමාජ ක්‍රමය යටතේ නිෂ්පාදන සම්බන්ධකම්ද පැවතිණි. එවකට පැවති නිෂ්පාදන මාධ්‍යයන් පොදුවේ පැවති අතර එය පදනම්කරගෙන මිනිසුන් අතර සහයෝගයේ හා අන්‍යොන්‍ය ආධාරයේ සම්බන්ධකම් ඇතිවිය. තිබුණු පෞරාණික ශ්‍රම උපකරණ උපයෝගී කරගෙන ප්‍රකෘතියේ මහා බලවේගවලට විරුද්ධව මිනිසුන්ට නැගී සිටීමට පුළුවන් වූයේ එකතුව, සාමූහික වශයෙන් පමණකි. නිෂ්පාදන සම්බන්ධකම් සකස්වූයේ මෙම තත්ත්වය අනුවය.

ආදි කල්පික සමාජයේදී මිනිස්සු සාමූහිකව, නෑසබඳකම් අනුව එකමුතුවූ කණ්ඩායම් හා ගෝත්‍ර වශයෙන් වාසය කළහ. ඔවුහු එක්වී පොදු ඉඩම්වල පොදු ශ්‍රම උපකරණ පාවිච්චි කරමින් පොදුවේ වැඩ කළහ. අයහපත් කාලගුණයෙන් සහ වන මෘගයින්ගෙන් ආරක්ෂා වීම සඳහා ඔවුනට පොදු වාසස්ථාන තිබුණි. ලබාගත් නිශ්පාදිත සමසමව බෙදගත්හ. නිෂ්පාදන බලවේගයන්ගේ තත්ත්වය කෙතරම් පහත් වීදයත්, ඔවුන්ට ලබාගන්ට පුළුවන්වූයේ යම්තම් කුසගිනි නිවා ගැනීමට තරම් ආහාර ස්වල්පයක් පමණකි. අයත් කරගැනීමට කිසිවක් නොතිබිණි. එබැවින් පෞද්ගලික අයිතියත්, පංති සහ සූරාකන්නන් එම සමාජයේ නොමැති විය.

ආදි කල්පික සමාජ ක්‍රමය යටතේ වුවද, නිෂ්පාදන බලවේගයන් ඉතා සෙමින් එහෙත්, නොකඩවා වැඩෙන්නට විය. ශ්‍රම උපකරණ වැඩි දියුණු කරන ලදී. ක්‍රම ක්‍රමයෙන් කුසලතාවයන් රැස් කරන ලදී. ශිලා උපකරණ වල පටන් ලෝහ උපකරණ දක්වා සංක්‍රමණ වීම නිෂ්පාදනයේ යෝධ ඉදිරි පිම්මක් විය. අලුත් ශ්‍රම උපකරණ වූ යකඩ තලයක් සහිත නගුල, තඹ හෝ යකඩ පොරව ආදිය විසින් ශ්‍රමය වඩාත් ඵලදායක කෙරිණ. වඩාත් පුළුල් පරිමාණයකින් අස්වනු වගාව සහ සත්ත්ව පාලනය කළහැකි විය. අස්වනු වගාවෙන් සත්ත්ව පාලනය වෙන්වීම හා සමග ප්‍රථම මහා සමාජමය ශ්‍රම විභජනය ඇති විය. ඊට කලකට පසු හස්ත කර්මාන්ත (උපකරණ, අවි, ඇඳුම්, පාවහන් ආදිය තැනීම) ස්වාධීන නිෂ්පාදන අංශයක් වශයෙන් වෙන්විය. නිෂ්පාදිත භාණ්ඩ හුවමාරුව දියුණු වීම ඇරඹිණ.

ශ්‍රම ඵලදායකත්වය වැඩිවීමත් සමගම ගෝත්‍ර සමාජය පවුල් වලට වෙන් වීම ආරම්භ විය. පෞද්ගලික දේපල පැන නැගිණි. පවුල

නිෂ්පාදන මාධ්‍යයන් හිමි කරුවා බවට පත් විය. කෙසේ වුවද මුල් ගණ ගෝත්‍ර සමාජයේ වංශවත් පවුල් අත නිෂ්පාදන මාධ්‍යයන් ප්‍රධාන වශයෙන් සංකේන්ද්‍රණය විය. තමාට අවශ්‍ය දේට වඩා වැඩියෙන් නිපදවීමට නිෂ්පාදකයාට හැකි වූ බැවින්, අතිරික්ත නිෂ්පාදනය හිමි කර ගැනීමේ හැකියාව ඇතිවිය. එමෙන්ම සමාජයේ සාමාජිකයන් කොටසක ශ්‍රමයෙන් තවත් සාමාජිකයන් කොටසකට පොහොසත් වීමේ හැකියාවද ඇතිවිය. පෞද්ගලික දේපල හා වෙළඳ භාණ්ඩ හුවමාරුව පැතිරීමත් සමගම ගණ ගෝත්‍ර සමාජයේ බිඳ වැටීම වඩාත් සීඝ්‍රවිය. ආදි කල්පික සමානතාවය වෙනුවට, සමාජමය අසමානතාවයක් ඇතිවිය. වහල්ලු සහ වහල් හිමියෝ යන ප්‍රථම සතුරු පංති ඇති වූහ.

නිෂ්පාදනීය බලවේගයන්ගේ සංවර්ධනය නිසා ආදි කල්පික සමාජ ක්‍රමය වෙනුවට වහල් සමාජ ක්‍රමය ඇතිවූයේ මෙසේය.

ආදි කල්පික සමාජයෙන් දායාද වශයෙන් ලැබුණු නිෂ්පාදනීය බලවේගයන් වහල් සමාජ-ආර්ථික ක්‍රමය යටතේ තවත් දියුණු විය.

වහල් සමාජ ක්‍රමය

ලීයෙන් සහ ගලින් තැනූ නිෂ්පාදන උපකරණ සම්පූර්ණයෙන්ම යටපත් කරගෙන පළමුව තඹ උපකරණද අනතුරුව යකඩ උපකරණද ඇතිවිය. යකඩ තලය සහිත ලී නගුලද, ඊ ළඟට යකඩ නගුලද, ලෝහ දෑකැත්තද හා වෙනත් යකඩ උපකරණද නිසා කෘෂිකර්මාන්තයේ ශ්‍රම ඵලදාව වැඩිවිය. අස්වනු වගාව හා සමග පලතුරු වගාව සහ එළවළු වගාවද දියුණු විය. ඉඩම්වලට වාරිමාර්ග ජලය ලබා ගැනීම සඳහා ඇලවල්, වේලි, ජල මට්ටම නැංවීමේ ක්‍රම ආදියද, ධාන්‍ය කොටා පිටි කිරීම සඳහා මෝල්ද සාදන ලදී. ආකර කර්මාන්තය දියුණු වීමත් සමගම යපස් කැණීම සඳහා යකඩ කටු සහ මිටි යොද ගනිමින්ද ලෝහ පස් කුඩු කුරීම සඳහා මෝල් හෝ වංගෙඩි යොද ගනිමින්ද ලෝපස් කැනීම හා උණු කිරීම දියුණු කරන ලදී. ලෝපස් උණු කිරීම සඳහා ආදි කාලීන උදුන්ද යොදගන්නා ලදී.

ශ්‍රම විභජනය වඩාත් ව්‍යාප්ත විය. හස්ත කර්මාන්තයේ විවිධ අංශ මතුවිය. ලෝහ උණු කිරීම, වාත්තු කිරීම, අවි තැනීම, ඇඳුම් මැසීම, සපත්තු සෑදීම, රෙදි විවීම, හම් පදම් කරීම, කුඹල් කර්මාන්තය ආදිය ඇතිවිය. හස්ත කර්මාන්තකරුවෝ වඩ වඩාත් විශේෂ උපකරණ උපයෝගීකරගත්හ. ආදිකාලීන ලියවන පට්ටල් හා මයින හමද ඇතිවිනි.

ඉදි කිරීමේ කර්මාන්තය, නැව් සෑදීම හා යුද්ධ ආයුධ තැනීමද පුළුල් ලෙස දියුණු වී වාණිජ ව්‍යාපාර පැතිර ගියේය.

වහල් සමාජයේ තත්ත්වයන් යටතේ, නිෂ්පාදනීය බලවේගයන්ගේ සංවර්ධනයට එම සමාජයේ පැවති ඒවාට ගැලපෙන සුළු නිෂ්පාදන

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

සම්බන්ධකම් අනුබලයක් විය. එම සම්බන්ධතාවයේ පදනම වූයේ වහල් හිමියා විසින් නිෂ්පාදන මාධ්‍යයන්ද, වහලාද, ඔහු නිපදවූ සියලු දේද සම්පූර්ණයෙන්ම අත්පත් කර ගැනීමය. වහලා කුසගින්නේ මිය නොයනු පිණිස අත්‍යාවශ්‍ය දේ පමණක් ඔහුට ඉතිරි කළේය. උඩු ව්‍යුහය පැන නැංගේය. වහල් හිමියන්ගේ රජය සහිත ප්‍රචණ්ඩකාරී විවිධ ආයතන (යුද්ධ හමුදව, අධිකරණය, නිලධාරී සංවිධාන ආදිය) හා වහල් හිමියන්ගේ දෘෂ්ටිය ඇතිවිය. එම උඩු ව්‍යුහය සිය පදනම හෙවත් ව්‍යුහයට අවංකව සේවය කරමින්, පෞද්ගලික අයිතිය හා සූරාකෑම ආරක්ෂා කළේය.

වහල් සමාජය තුළ ආධිපත්‍යයේ සහ යටත් භාවයේ සම්බන්ධකම්ද, කිසිදු අයිතියක් නැති වහලුන් අති විශාල සංඛ්‍යාවක්, අතලොස්සක් වහල් හිමියන් විසින් කෲර ලෙස සූරාකෑමට භාජනය කිරීමේ සම්බන්ධකම්ද පැවතුනි. ඒවා එක්තරා කාල සීමාවක් ඉකුත් වන තුරු නිෂ්පාදනීය බලවේගයන්ගේ වර්ධනයට අනුබලයක් විය. අනතුරුව ඒවායේ ශක්‍යතාවයන් සිඳී ගියෙන්, ඒවා සමාජමය නිෂ්පාදනයේ ව්‍යාප්තියට හරස්වන බාධක බවට පත්විය. නිෂ්පාදනය සඳහා උපකරණ නිරතුරුවම වැඩි දියුණු කිරීමත්, වඩා උසස් ශ්‍රම ඵලදායකත්වයකුත් අවශ්‍යවූ නමුත්, එයින් තම තත්ත්වයේ කිසිම වැඩි දියුණුවක් නොවන නිසා වහලා තුළ ඒ ගැන කිසි උනන්දුවක් නොවීය. ප්‍රධාන නිෂ්පාදන බලවේගය වන වහලා ඉතා දරුණු අමානුෂික සූරාකෑමට භාජනය වූ බැවින් ඔහු කායික වශයෙන් හා බුද්ධිමය වශයෙන් දිරාපත්වීමකට ගොදුරු විය.

කල් යත්ම, වහල් සමාජයේ නිෂ්පාදන බලවේග සහ නිෂ්පාදන සම්බන්ධකම් අතර ඇති ප්‍රතිවිරුද්ධතාවය ඉතාමත් තියුණු විය. එම ප්‍රතිවිරුද්ධතාවය වහලුන්ගේ කැරළිවලින් ප්‍රකාශිත විය. ඉතා කෲර ලෙස සූරාකෑමට භාජනයවූ වහල්ලු, ජීවන බලාපොරොත්තු නැති තත්ත්වයකට හෙළන ලද නිසාම සිය වහල් හිමියන්ට විරුද්ධව නැගී සිටියහ. වහලුන්ගේ මෙම කැරළිත් අසල්වැසි ගෝත්‍ර විසින් දෙන ලද ප්‍රහාරයනුත් නිසා වහල් සමාජ පදනම් දෙදරා, එය බිඳ වැටී, එහි නටබුන් මත අලුත් රදළ සමාජ ක්‍රමය බිහිවිය.

රදළ සමාජ ක්‍රමය

නිෂ්පාදන බලවේගයන්ගේ අනුක්‍රමික වර්ධනය රදළ සමාජීය තත්ත්වයන් යටතේදීත් සිදුවිය. මිනිසා ඔහුගේ කායික ශක්තියට අමතරව, ජලයේ හා සුළඟේ බලය පාවිච්චි කිරීමට, ජලයේ හා සුළඟේ බලයෙන් ක්‍රියා කරන මෝල්, රුවල් නැව් ආදිය උපයෝගී කරගැනීමට පටන් ගත්තේ මෙම අවධියෙහිදීය. අමු යකඩ වලින් යකඩ සෑදීමටත්, කඩදසි හා වෙඩි බෙහෙත් සෑදීමටත්, පොත් මුද්‍රණය කිරීමටත් මිනිස්සු උගත්හ. මේවා සහ වෙනත් සොයාගැනීම් විසින් මිනිස් ඉතිහාසයේ විශාල කාර්ය කොටසක් ඉටු කැරිණි.

හස්ත කර්මාන්ත තවත් දුර වර්ධනය විය. පැරණි උපකරන හා යන්ත්‍ර වැඩි දියුණු කරන ලද අතර අලුත් ඒවා සොයා ගන්නා ලදී. චර්කාව, රෙදි පටි සහ රෙදි වියන යන්ත්‍ර හා වෙනත් සොයා ගැනීම් නිසා රෙදි නිපදවන කර්මාන්තයේ විශේෂ දියුණුවක් ඇතිවිය. හස්ත කර්මාන්ත කරුවන්ගේ ශ්‍රමය විශේෂඥ තත්ත්වයට උසස් වූයෙන් ශ්‍රම ඵලදාව සෑහෙන තරම් වැඩි විය. හස්ත කර්මාන්තයේ සහ වෙළඳමේ දියුණුවත් සමගම නගර ගොඩ නැගිනි. මින් සමහර ඒවා හස්ත කර්මාන්තය හා වෙළඳාම පිළිබඳව ප්‍රධාන ජගත් මධ්‍යස්ථාන බවට පත්විය.

කෘෂිකර්මයේද දියුණුවක් දක්නට ලැබිණි. අලුත් වර්ගවලට අයත් ධාන්‍ය පලතුරු සහ එළවලු වගාකරන ලදී. පොහොර දැමීම සහ වඩාත් හොඳින් වගා බිම් කොටා සකස් කිරීම ආරම්භ විය. සත්ත්ව පාලනය ව්‍යාප්ත කරන ලද අතර, බර ඇදීම සඳහා පුළුල් පරිමානයෙන් සතුන් යෙදවීමද, සත්ත්ව නිෂ්පාදනය වැඩි කිරීමද සිදුවිය.

රදළ සමාජයේ නිෂ්පාදනීය බලවේගයන්ගේ සංවර්ධනයට ඊට ගැලපෙන නිෂ්පාදන සම්බන්ධතාවයන් උපකාරක විය. එම සම්බන්ධකම්වල අඩිතාලම වූයේ නිෂ්පාදන මාධ්‍යයන් (ප්‍රධාන වශයෙන් වගා බිම්) සම්පූර්ණයෙන්ම රදළයාට අයත් වීම හා ප්‍රවේණිදස ගොවීන්ද අඩ වශයෙන් ඔහුට අයත්වීමය. ප්‍රවේණිදස ගොවියා රදළ ස්වාමියා සඳහා සේවය කළ යුතු විය. නොයෙක් ආකාරයේ ශ්‍රම සේවාවන් කළයුතු විය. රදළ ස්වාමියාට රිසි පරිදි ප්‍රවේණිදසයින් මිළට ගැනීමට හා විකිණීමට අයිතියක් තිබිණි. එහෙත් ඔවුන්ගේ ජීවිත ඔහුට අයත් නොවීය.

වහල් සමාජයේදී මෙන්ම, රදළ සමාජයේදීත් නිෂ්පාදන සම්බන්ධකම් ආධිපත්‍යයේ සහ යටත් භාවයේ සම්බන්ධකම් විය. රදළ ස්වාමිවරුන් විසින් ප්‍රවේණිදසයින් සූරාකනු ලැබීමේ සම්බන්ධකම් විය. ඒ කෙසේ වුවද, එය වහල් සමාජයේ පැවති නිෂ්පාදන සම්බන්ධකම් වලට වඩා ප්‍රගතිශීලී විය. එයට හේතුව නිෂ්පාදකයාගේ ශ්‍රමය ගැන එක්තරා දුරක උනන්දුවක් එයින් ඔහු තුළ ඇති කිරීමයි. ගොවීන්ට සහ හස්ත කර්මාන්ත කරුවන්ට තමාගේම දේපල (ගොවියාට කුඩා ඉඩම් කැබැල්ලක්ද, අශ්වයකු හා ගව මහීසාදීන්ද, කෘෂිකාර්මික උපකරණද හිමි කරගත හැකිව තිබිණි. හස්ත කර්මාන්ත කරුවන්ට උපකරණ සහ සරල යන්ත්‍ර අයත් විය.)

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

තිබුණු අතර ඒවායින් රදළ ස්වාමියාගේ වැඩ කටයුතු සියල්ල අවසාන කළ පසු, ඔවුහු තමන් සඳහා වැඩ කළහ. උපකරණ, ගොවිතැන් ක්‍රම හා හස්ත කර්මාන්ත ක්‍රම වැඩි දියුණු කිරීම ගැන ඔවුන් තුළ උනන්දුවක් විය.

රදළ සමාජයේ උඩු ව්‍යුහය, එහි සූරාකෑමේ හරය අනුව බලන විට, වහල් සමාජයේ උඩු ව්‍යුහයට වඩා වෙනස් නොවීය. වෙනසකට ඇත්තේ එය වහල් හිමියන්ගේ අයිතිය නොව, රදළයින්ගේ අයිතිය ආරක්ෂා කිරීමය. රදළ ස්වාමිවරුන්ගේ පෞද්ගලික අයිතිය හා එය පදනම් කරගත් නිෂ්පාදන සම්බන්ධකම් එනම් රදළ ක්‍රමයේ ආර්ථික අඩිතාලම ආරක්ෂා කිරීම සහ තහවුරු කිරීම සඳහාද, උඩු ව්‍යුහය සේවය කළේය. රාජ්‍ය යන්ත්‍රයද, යුද්ධ හමුදාවද විශාල විය. සමාජයේ අධ්‍යාත්මික ආධිපත්‍යය දරූ ආගම ප්‍රධාන තැනක් ගත් අතර පෞද්ගලික දේපල අයිතියට අවංකව සේවය කරමින්, වැඩකරන ජනතාව සූරාකෑම ආරක්ෂා කළේය.

කාලය ගෙවිනි. නිෂ්පාදනීය බලවේගයන් දිගටම සංවර්ධනය විය. 16 වැනි සියවස ආරම්භයේදී නව භූමි ශාස්ත්‍රීය සොයා ගැනීම් (ඇමෙරිකාව සොයා ගැනීම, ඉන්දියාවට මුහුදු මාර්ග හා එවැනි වෙනත් සොයා ගැනීම්) නිසා ඒවායේ ප්‍රගතියට විශේෂ ධෛර්යයක් ලැබිනි. ජාත්‍යන්තර වෙළඳ පොළක් හැඩගැසෙන්නට පටන්ගත්තේය. විවිධ භාණ්ඩවල ඉල්ලුම වැඩි වූ අතර හස්ත කර්මාන්තය එය සතුටුදයක ලෙස සපුරාලීමට අපොහොසත් විය. හස්ත කර්මාන්ත කරුවන්ගේ කුඩා කම්හල් වෙනුවට භාණ්ඩ සාදන කර්මාන්ත ශාලා ඇති විය.

කර්මාන්ත ශාලා යටතේ විශාල සංඛ්‍යාවක් කම්කරුවන් එක වැඩ පලට ඒකරාශී කරන ලදී. ඔවුන් අතර පුළුල් ශ්‍රම විභජනයක් ඇති කොට, එමගින් ශ්‍රම ඵලදාව බෙහෙවින් උසස් කරන ලදී. කර්මාන්ත ශාලා පැන නැගීමෙන් රදළ සමාජය තුළ අලුත්, ධනවාදී නිෂ්පාදන ක්‍රමය හා එයට ආවේණික ධනපති පංතිය සහ නිර්ධන පංතිය යන ප්‍රතිපාක්ෂික පංති දෙක ඇති වීම සලකුණු විය.

එහෙත් කර්මාන්ත ශාලා ඇතිවීමත් සමග නිෂ්පාදනීය බලවේගයන් රදළ වාදී නිෂ්පාදන සම්බන්ධකම් හා සමග ප්‍රතිවිරෝධී තාවයකට පත්විය. කර්මාන්ත සඳහා නිදහස් කම්කරුවන් අවශ්‍යවූ අතර රදළ ක්‍රමය ප්‍රවේණිදාසයා ඉඩමට බැඳ තැබීය. කර්මාන්ත ශාලාවලට පුළුල් ජාත්‍යන්තර වෙළඳ පොළක් අවශ්‍ය විය. එහෙත් රදළ ආර්ථිකය විසින්, එහි කොන්වූ ස්වභාවය සහ ස්වාභාවික අර්ථ ක්‍රමය විසින් එවැනි වෙළඳ පොළක් ඇතිවීමට බාධා කැරිනි. රදළවාදී නිෂ්පාදන සම්බන්ධකම් වෙනුවට, ධනවාදී සම්බන්ධකම් ඇතිකරලීමේ

අවශ්‍යතාවය පැන නැගිනි. එය ඉටුකරන ලද්දේ ධනපති විප්ලව ගණනාවක් විසිනි. ධනපති පංතියේ නායකත්වය යටතේ ප්‍රවේණිදාස ගොවියෝද, නගර බද දුප්පත්තුද එම විප්ලවයේ ප්‍රධාන සටන්කාරී බලවේගය වූහ.

ධනපති සමාජ ක්‍රමය

ධනපති ක්‍රමයේ නිෂ්පාදනීය බලවේගයන්ගේ විශේෂිත අංග ලක්ෂණය වන්නේ විශාල පරිමාණයේ යාන්ත්‍රික නිෂ්පාදනය ය. හස්ත කර්මාන්ත කරුවන්ගේ කුඩා කම්හල් සහ ප්‍රාථමික කර්මාන්ත ශාලා යටපත්වී යෝධ යන්ත්‍රාගාර සහ පැක්ටරිද අති විශාල ආකාරද ඇති විය. මාක්ස් සහ එංගල්ස් ධනපති ක්‍රමයේ නිෂ්පාදනීය බලවේග ගැන කොමියුනිස්ට් පක්ෂ ප්‍රකාශනයේ සඳහන් කළේ, "ප්‍රකෘතියේ බලවේග මිනිසා නතුවීම, යන්ත්‍ර සූත්‍ර, කර්මාන්තය හා කෘෂිකර්මාන්තය සඳහා රසායනය භාවිතා කිරීම, දුම් නැව්, දුම්රිය, විදුලි පණිවුඩ ක්‍රමය, වගාව සඳහා මුළු මහත් මහා දේශම එළි කිරීම, සමස්ත ජනතාවන්ම ඉන්ද්‍රජාලමකින් මෙන් පොළොවෙන් උගුළුවා ගෙන යාම"* යනුවෙනි. මිනිස් ඉතිහාසයේ ඉහත අවධි සියල්ලම තුළදී නිෂ්පාදනීය බලවේගයන් දියුණු කිරීමට කළ සියල්ලටම වඩා අති විශාල ජයග්‍රහණයන් ධනපති ක්‍රමය එහි ප්‍රථම ශත වර්ෂ දෙකක පමණ කාලය තුළදී අත්කරගත්තේය.

නිෂ්පාදන බලවේගයන්ගේ බලවත් වර්ධනයක් ඇතිවූයේ ධනපති නිෂ්පාදන සම්බන්ධකම් නිසාය. මෙහි පදනම ක්‍රම ක්‍රමයෙන් නමුදු ස්ථිරවම රදළවාදී අයිතිය පන්නා දමන පෞද්ගලික ධනපති අයිතිය වන්නේය. ධනේශ්වර ක්‍රමය යටතේ නිෂ්පාදකයා, නිර්ධනයා නීත්‍යානුකූල වශයෙන් නිදහස්ය. ඔහු ඉඩමට හෝ කිසියම් විශේෂ පැක්ටරියකට හෝ බැඳී නැත. ඔහුට එක් හෝ තවත් ධනපතියකු වෙත වැඩට යාමට නිදහස ඇති නමුදු, ඔහු සමස්ත ධනපති පංතියෙන් නිදහස් නැත. නිෂ්පාදන මාධ්‍යයන් ඔහු සතුව නොමැති බැවින්, ඔහුට සිය ශ්‍රම ශක්තිය විකිණීමට සිදුවී ඇත. එනිසා ඔහු සූරාකෑමේ විය ගහට හසුවේ.

ධනපති ක්‍රමයේ නිෂ්පාදන සම්බන්ධකම්ද, ආර්ථික ව්‍යුහයද ඊට සරිලන උඩු ව්‍යුහයක් — ධනපති අදහස් හා ආයතන ඇති කළේය. කම්කරු පංතිය වැඩි වැඩියෙන් රජයට විරුද්ධව නැගී සිටීමද, ධනපති පංතියේ ජාතික හා ජාත්‍යන්තර ප්‍රතිගාමී දේශපාලන ප්‍රතිපත්තියද

* කාල් මාක්ස් සහ ෆ්‍රෙඩ්රික් එංගල්ස්. කෘති එකතුව, වෙළුම 4, පිටුව 429.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

නිසා, රාජ්‍ය යන්ත්‍රයද, විශේෂයෙන් යුද්ධ හමුදාව ඇතුළු අනිකුත් ප්‍රචණ්ඩකාරී සංවිධානද විශාල විය. සමාජයේ අධ්‍යාත්මික ජීවිතය (දේශපාලනය හා නීතිය පිළිබඳ මත, කලාව සදචාරය, දර්ශනවාදය) ධනවාදී ගසාකෑමේ අදහස් වලින් පිරී පවතී. ධනපති පෞද්ගලික අයිතිය හා සූරා කෑම දෘෂ්ටිමය වශයෙන් සදකාලික කිරීම හා ස්ථිර කිරීම එහි කාර්ය භාරය වන්නේය. ධනවාදී අදහස් සමග සහ එයට විරුද්ධව සටන් කරන කම්කරු පංතියේ අදහස්ද බිහිවී වර්ධනය වෙයි.

ධනපති නිෂ්පාදන සම්බන්ධකම් විසින් බිහි කළ ධනපති ලාභය නිෂ්පාදනය සංවර්ධනය සඳහා විශාල උත්තේජනයක් විය. ලාභ ලබාගැනීමට වේගයෙන් ඉදිරියට යන ධනපතියා නිෂ්පාදනය ව්‍යාප්ත කරයි. යන්ත්‍ර සූත්‍ර වැඩි දියුණු කරයි. කර්මාන්තයේ සහ කෘෂිකර්මාන්තයේ නිෂ්පාදන ක්‍රම උසස් කරයි. කෙසේ වුවද මේ සම්බන්ධකම්, නිෂ්පාදනයේ, මින් පෙර නොවූ විරූ වැඩීමක් ඇති කරනවා පමණක් නොව, මුළු මහත් ධනපති ක්‍රමයම විනාශ මුඛය කරා ගෙන යන නිෂ්පාදනීය බලවේගයන්ද ජනිත කරයි. ධනපති ක්‍රමය තමාට මෙල්ල කර ගත නොහැකි බල සම්පන්න භූතයින්ට පණ දුන් යකැදුරකු හා සමාන බව මාක්ස් හා එංගල්ස් පෙන්වා දුන්හ.

නිෂ්පාදනීය බලවේගයන් දැවැන්ත ලෙස වර්ධනය වීම නිසා ධනපති නිෂ්පාදන සම්බන්ධකම් ඒවාට නොගැලපෙන තත්ත්වයට වැටී ඒවායේ සංවර්ධනයට බාධා කිරීමට පටන් ගනී. ධනපති නිෂ්පාදන ක්‍රමයේ ගැඹුරුතම ප්‍රතිවිරෝධතාවය වන්නේ එහි නිෂ්පාදනයේ සමාජමය ස්වභාවය සහ අයත් කර ගැනීමේ පෞද්ගලික ධනපති ආකාරයත් අතර ප්‍රතිවිරෝධය ය. ධනපති ක්‍රමයේ නිෂ්පාදනය පැහැදිලිවම සමාජමය ස්වරූපයක් දරයි. දස ලක්ෂ සංඛ්‍යාත කම්කරුවෝ අති විශාල යාන්ත්‍රික කම්හල් වල වැඩ කරමින් සමාජමය නිෂ්පාදනයේ යෙදී සිටිති. ඒ අතර නිෂ්පාදන මාධ්‍යයන් අයත් අතලොස්සක් අයිති කරුවන් විසින් කම්කරු ශ්‍රමයේ සියලු ඵල තමනට අයත් කර ගනු ලැබේ. ධනපති ක්‍රමයේ මූලික ප්‍රතිවිරෝධතාවය මෙය වන්නේය.

දහනව වැනි සියවසේ අවසාන භාගයේදී ධනපති ක්‍රමය එහි උසස්තම හා අවසාන අවධිය වන අධිරාජ්‍යවාදය දක්වා වැඩීන. අධිරාජ්‍යවාදී ක්‍රමයේ හරය වන්නේ නිදහස් තරඟය වෙනුවට ඒකාධිකාරීන්ගේ සම්පූර්ණ ආධිපත්‍යයක් ඇතිවීමය. ඒකාධිකාරීන් යනු සමහර භාණ්ඩයන්ගේ නිෂ්පාදනය සහ අලෙවිය සම්පූර්ණයෙන්ම පාහේ තමන් අතට සංකේන්ද්‍රණය කරගත් ධනපතීන්ගේ විශාල සංගම්ය.

ඒකාධිකාරවල අරමුණ හැකි තරම් වැඩි ලාභ ලැබීමයි. එම පරමාර්ථය ඉටුකර ගැනීම සඳහා අධිරාජ්‍යවාදීහු තම රටවලම වැඩකරන ජනතාවන්ද, යටත් විජිතවල සහ තම ආධිපත්‍යයට හසුවූ රටවල ජනතාවන්ද සූරා කති. ලෝකය තමන් අතර බෙදා ගත් ඔවුහු, එය යළිත් බෙදාගැනීම සඳහා දරුණු අරගලයක යෙදෙති.

අධිරාජ්‍යවාදය ධනපති ක්‍රමයේ සියලු ප්‍රතිවිරුද්ධතාවයන් සීමාන්තය දක්වා උග්‍ර කරයි. විශේෂයෙන්ම, නිෂ්පාදනයේ සමාජමය ස්වභාවය සහ එහි ඵල අයත්කර ගැනීමේ ධනපති පෞද්ගලික ආකාරයත් අතර ඇති ප්‍රතිවිරෝධතාවය එසේ උග්‍ර කරයි. මේ ප්‍රතිවිරෝධතාවය විසින් අර්බුද හා රැකියා විරහිතකම ඇති කරවයි. නිර්ධන පංතිය සහ ධනපති පංතිය අතර දැඩිතර පංති සටන් ඇති කරවයි. සමාජවාදී විප්ලවයේ ආර්ථික අඩිතාලම සකස් කරයි. විජයග්‍රාහී සමාජවාදී විප්ලවය ධනවාදී නිෂ්පාදන සම්බන්ධකම් විනාශ කොට සමාජවාදී නිෂ්පාදන ක්‍රමයක් බිහි කරයි.

6. කොමියුනිස්ට්වාදී සමාජ-ආර්ථික සැකැස්ම

කොමියුනිස්ට්වාදී සමාජ-ආර්ථික සැකැස්ම මීට පෙර සඳහන් කළ පරිදි, සිය වර්ධනයේදී සමාජවාදී හා කොමියුනිස්ට්වාදී අවධි දෙකක් පසු කරයි.

සමාජවාදයේ ප්‍රධාන ලක්ෂණය නිෂ්පාදන මාධ්‍යයන් සමාජය සතුවීම සහ සූරාකෑම අහෝසිවීමය. මෙහි තේරුම රදළ ක්‍රමය තුළින් ධනපති ක්‍රමය බිහිවූවාක් මෙන්, අලුත් සමාජ ක්‍රමයට ධනපති සමාජයේ කුසින් බිහිවිය නොහැකි බවය.

සමාජවාදය

සමාජවාදය කිසිවක් නැතිව ඉබේ ඇතිවෙතැයි මින් අදහස් නොකෙරේ. ධනපති ක්‍රමයේදීම සමාජවාදී ක්‍රමයට අවශ්‍ය පූර්ව අවශ්‍යතාවයන් සැකසේ. ඒවා නම් මහා පරිමාණ යාන්ත්‍රික නිෂ්පාදනය, උසස් මට්ටමකින් ශ්‍රමය සංකේන්ද්‍රණය කිරීම සහ සමාජමය කිරීම හා විද්‍යාත්මක සහ තාක්ෂණික ප්‍රගතියේ උසස් තත්වයක් ඇතිවීමය. සමාජවාදය ඉදිකිරීමේ ඉරණම හිමි බලවේගය වන කම්කරු පංතියද, ධනපති ක්‍රමය විසින් බිහි කෙරේ. ධනපති පංතියට විරුද්ධව දරුණු සටන් අරගලවලින් ශික්ෂණය ලබන කම්කරු පංතිය, තමන්ගේම පක්ෂය සංවිධානය කොට, ප්‍රගතිශීලී විද්‍යාත්මක දෘෂ්ටියකින් ප්‍රවීණ වෙයි.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

එහෙත් සමාජවාදී නිෂ්පාදන සම්බන්ධකම් ධනේශ්වර ක්‍රමය තුළ හැඩ ගැසෙනු නොහැකිවා සේම සමාජවාදය බිහිකිරීම සඳහා මේ පූර්වාවශ්‍යතාවයන් පමණක් තිබීමද කොහෙත්ම නොසෑහේ. සමාජවාදය සම්පූර්ණයෙන්ම පෞද්ගලික අයිතිය අතුගා ඉවත් කරයි. සූරාකෑම සහ වෙනත් විධියේ සියලු පීඩා කිරීම් සඳහටම තුරන් කර දමයි. එහෙත් මේ සඳහා සමාජවාදී විප්ලවයක්ද ධනවාදයේ සිට සමාජවාදය දක්වාවූ මුළු පරිවර්තන කාල පරිච්ඡේදයක්ද අවශ්‍ය වේ. එම කාලය තුළ බලය සියතට ගෙන සිටින කම්කරු පංතිය, අනිකුත් වැඩ කරන ජනතාව සමග එකතුව, අවබෝධයෙන් යුතුව හා ක්‍රමානුකූලව අලුත් සමාජවාදී නිෂ්පාදන ක්‍රමය ගොඩ නගයි. ජාතිය සතු කිරීම සහ කෘෂිකර්මය සමූහ ගත කිරීම, රට කර්මාන්තමය කිරීම සහ සංස්කෘතික විප්ලවයක් ඇති කිරීම — කොමියුනිස්ට් පක්ෂයේ නායකත්වය යටතේ සෝවියට් ජනතාව විසින් ජයග්‍රාහී ලෙස ගොඩනගන ලද, සමාජවාදය ඉදිකිරීමේ ලෙනින්වාදී සැලැස්මේ පුරුක් එසේ විය. සමාජවාදී නිෂ්පාදනයක්ද, ආර්ථික ව්‍යූහයක් සහ සමාජවාදී උඩු ව්‍යූහයක්ද බිහි කරන ලදී.

වෙනත් හැම සමාජයක මෙන්ම, සමාජවාදී සමාජයේ පදනම ද්‍රව්‍යමය සම්පත් නිපදවීමය. සමාජවාදී නිෂ්පාදනය, නිෂ්පාදන බලවේගයන්ගේ සහ නිෂ්පාදන සම්බන්ධකම්වල දයලෙක්තික ඒකීයතාවයක් වන්නේය. සමාජවාදී කර්මාන්තය හා කෘෂිකර්මාන්තය, ප්‍රවාහණය, පණිවුඩ මාර්ග, ඉදිකිරීමේ කර්මාන්ත හා ආර්ථිකයේ මේ සියලු ක්ෂේත්‍රවලම වැඩකරන ජනතාව, සෝවියට් සමාජවාදී සමාජයේ නිෂ්පාදන බලවේග වන්නේය.

සමාජවාදී ආර්ථිකයේ තාක්ෂණික අඩිතාලම මහා පරිමාණවූත් නිරතුරුවම දියුණුවන්නාවූත් යන්ත්‍ර කර්මාන්තයයි. එහි පදනම වී ඇත්තේ පුළුල් ලෙස විදුලිබලය හා රසායනයත්, සමහර ක්ෂේත්‍රවල පරමාණු බලයත් පාවිච්චි කිරීම සහ සමස්තමය වශයෙන් නිෂ්පාදනය යාන්ත්‍රිකමය හා ස්වයංක්‍රියමය කිරීමය. සෝවියට් සංගමයේ මුළු මහත් ආර්ථිකයේම අඩිතාලම වන්නේත් එහි බලපරාක්‍රමයේ සහ වස්තුවෙහි උල්පත වන්නේත් බැර කර්මාන්තයයි.

සමාජවාදයේ නිෂ්පාදනීය බලවේගයන්ගේ ඉතා වැදගත් අංගය සෝවියට් සංගමයේ වැඩකරන ජනතාවය, කම්කරුවෝ, සමූහ ගොවියෝ, තාක්ෂණික ශිල්පියෝ සහ ඉන්ජිනේරුවරුය. සෝවියට් රාජ්‍ය කාලය තුළ ඔවුන් ඉමහත් නිෂ්පාදන කුසලතා සම්භාරයක් රැස් කරගෙන ඇත. ඔවුහු ඉතාමත් විවිධාකාර හා සියුම් යන්ත්‍ර සාර්ථක ලෙස ක්‍රියා කරවති. ස්ථිර තාක්ෂණික

ප්‍රගතියත් නිරන්තර ශ්‍රම ඵලදායකත්ව වර්ධනයත් සහතික කළහ.

නිෂ්පාදනීය බලවේගයන්ගේ, එනම්, නිෂ්පාදන මාධ්‍යයන්ගේත් ජනතා කුසලතාවයන්ගේත්, සංවර්ධනය සමාජවාදී ආර්ථිකයේ ප්‍රගතිය සඳහා අත්‍යාවශ්‍ය කොන්දේසියක් වන්නේය.

සමාජවාදයේ නිෂ්පාදනීය බලවේගයන්ගේ අඩිතාලම මත සමාජවාදී නිෂ්පාදන සම්බන්ධකම් බිහිවී වර්ධනය වන්නේය. එම සම්බන්ධකම් වල පදනම වන්නේ නිෂ්පාදන මාධ්‍යයන්ගේ සමාජමය, සමාජවාදී අයිතියයි. සමාජවාදී දේපල අයිතිය පිළිබඳ ආකාර දෙකක් ඇත. රජයේ හෙවත් සමාජවාදී රජය විසින් නියෝජනය කරන ලද මුළු මහත් ජනතාවටම අයිති දේපලත් සමුපකාර, සමූහ ගොවිපළවලට අයිති දේපල එනම් තනි සමූහ ගොවිපළවල දේපල සහ සමුපකාරවල දේපලත්ය. මෙම හිමිකම් රටා දෙකම සමාජවාදී ස්වභාවයක් දරන අතර, ඉන් කොමියුනිස්ට්වාදය ගොඩනැගීමේ කර්තව්‍යයන් සාර්ථක කිරීම සහතික කෙරෙයි. සමාජවාදී සමාජයේ දේපොල අතුරෙන් ප්‍රධාන තැන ගන්නේ රජයේ දේපලය.

සමාජවාදී දේපල හිමිකම නිසා කම්කරුවන් අතර සහෝදරාත්මක සහයෝගිතාවය සහ අන්‍යෝන්‍ය ආධාරය බලපවත්නා නිෂ්පාදන සම්බන්ධකම් ඇතිවිය. සමාජවාදී නිෂ්පාදන සම්බන්ධකම් ඉමහත් සේ වාසිදායක වූයේත්, ඒවා — සතුරු පංති සහිත සමාජවල වන නිෂ්පාදන සම්බන්ධකම්වලින් මූලික වශයෙන් වෙනස් වූයේත් මිනිසකු විසින් මිනිසා, සූරාකෑම ඉන් සම්පූර්ණයෙන්ම බැහැර කරන නිසයි.

සමාජවාදී දේපල හිමිකම පදනම් කරගෙන වැඩ අනුව බෙදහැරීමේ සමාජවාදී මූලධර්මය ක්‍රියාත්මක කර ඇත. මෙයින් අදහස් වන්නේ වැඩ කිරීම සමාජයේ සෑම සමාජිකයෙකුගේම යුතුකම වන බවත්, සෑම සමාජිකයෙකුගේම වැඩ ප්‍රමාණය හා එහි ගුණය අනුව ඔහුට සමාජයෙන් ද්‍රව්‍යමය සම්පත් ලැබෙන බවත්ය.

සමාජවාදය යටතේ නිෂ්පාදන සම්බන්ධකම්වල සාරය වශයෙන් ගැනෙන්නේ නිෂ්පාදන මාධ්‍යයන් සමාජවාදී හිමිකමට යටත්ව තිබීමද, එහි ප්‍රතිඵලයක් වශයෙන් සූරාකෑමෙන් නිදහස් කම්කරුවන් අතරවන සහෝදරාත්මක සහයෝගයේ හා අන්‍යෝන්‍ය ආධාරයේ සම්බන්ධකම්ද, වැඩ අනුව බෙදීමේ සමාජවාදී ප්‍රතිපත්තියද වේ.

ධනපති ක්‍රමයට ආවේණික නිෂ්පාදනයේ සමාජමය ස්වරූපය සහ අයත්කර ගැනීමේ පෞද්ගලික ආකාරය අතර ඇති ප්‍රතිවිරෝධීතාවය සමාජවාදී සමාජය විසින් සඳහටම අහෝසි කර දමන ලදී. මෙහිදී

https://liberationbase.wordpress.com

නිෂ්පාදනීය බලවේගයන්ගේ ස්වරූපයටම නිෂ්පාදන සම්බන්ධකම් ගැලපේ. සමාජවාදය යටතේ නිෂ්පාදනය ප්‍රකට සමාජමය ස්වරූපයක් දරයි. දශලක්ෂ සංඛ්‍යාත කම්කරුවෝ හා සමූහ ගොවියෝ කර්මාන්තවලත්, කෘෂිකර්මාන්තයෙහිත් නිරතව සිටිති. එහෙත් දසලක්ෂ සංඛ්‍යාත ජනතාවගේ ශ්‍රම ඵලය අතලොස්සක් සූරාකන්නන්ට අයත්වන ධනපති ක්‍රමයට වඩා හාත්පසින්ම වෙනස් වූ සමාජවාදී සමාජයේ ශ්‍රම ඵලය නිපදවන්නන්ට, එනම් වැඩකරන ජනතාවන්ටම අයත් වේ. සමාජවාදී නිෂ්පාදන සම්බන්ධකම් වල පදනම වන සමාජමය අයිතිය සම්පූර්ණයෙන් බලපැවැත්වීම විසින් බෙදහැරීමේ සමාජමය ස්වරූපය තීරණය කෙරෙයි. සෝවියට් සංගමයේ ජාතික ආදායමෙන් හතරෙන් තුන් පංගුවක් වැඩකරන ජනතාවගේ ද්‍රව්‍යමය හා සංස්කෘතික වුවමනාවන් සපුරාලීම සඳහා වියදම් කෙරේ. ජාතික ආදායමේ ඉතිරි කොටසද, නිෂ්පාදනය පුළුල් කිරීම සහ වෙනත් සමාජමය අවශ්‍යතාවයන් සඳහා, එනම් වැඩකරන ජනතාවගේම යහපත සඳහා වැය කරනු ලැබේ.

සමාජවාදී සමාජයේ නිෂ්පාදන සම්බන්ධකම් නිෂ්පාදනීය බලවේගයන්ගේ ස්වභාවය හා සමග මනාව ගැලපේ. මෙම ගැලපීම තාවකාලික හෝ කල්යාමෙන් පහව යන හෝ ස්වභාවයේ එකක් නොවේ. එය දක්නට ලැබෙන්නේ, ධනපති ක්‍රමයේ මෙන් නිෂ්පාදනයේ මුල් සංවර්ධන අවධියේ පමණක් නොවේ. සමාජවාදී නිෂ්පාදන ක්‍රමය පවත්නාතාක් හා සංවර්ධනය වනතාක් කල් එම ගැලපීම පවතී. මෙසේ වීමට හේතුව නිෂ්පාදනීය බලවේගයන්ගේ සමාජමය ස්වභාවයත් නිෂ්පාදන මාධ්‍යයන් සමාජමය වශයෙන් හිමිව තිබීමත් අතර ඇති ගැලපීමය.

සමාජමය නිෂ්පාදනීය බලවේගයන්ට ගැලපෙන සමාජවාදී නිෂ්පාදන සම්බන්ධකම් ඒවාට මින් පෙර නොවූ විරූ පරිදි ඉදිරියට යාමට ඉඩ කඩ සලසා දෙයි. නිෂ්පාදනයේ සංවර්ධනය සඳහා එම සම්බන්ධකම් බලගතු සාධකයක් බවට පත්වේ. සමාජවාදී ආර්ථික සංවර්ධනය පිටුපස ඇති ගාමක බලවේගය ලාභ ලැබීමේ ආශාව නොව, සමාජමය නිෂ්පාදනය දියුණු කරලීම සඳහා වැඩකරන ජනයා සියල්ලම දක්වන උනන්දුවයි.

සහයෝගිතාවයේ සහ අන්‍යොන්‍යාධාරයේ සමාජවාදී සම්බන්ධකම් ප්‍රකට ලෙස ප්‍රකාශ වන්නේ සමාජවාදී තරඟය මගිනි. මෙම තරඟය මගින් වැඩකරන ජනතාව සිය වැඩ විෂයෙහිවූ අඩුපාඩුකම් ඉවත් කිරීමට යත්න දරති. පසුබාන අයට ආධාර දී ඔවුන් ඉදිරියෙන් සිටින කම්කරුවන්ගේ තත්වයට පෙරට ගෙන ඒමට උත්සාහ කරති.

සිය ශ්‍රමයේ ප්‍රතිඵල ගැන වැඩකරන ජනතාව දක්වන ද්‍රව්‍යමය උනන්දුව සමාජවාදී නිෂ්පාදන සම්බන්ධකම්වලට ආවේණිකවූ ආර්ථික ප්‍රගතියට ඉවහල්වන බලවත් උත්තේජනයකි. කම්කරුවා, සමූහ ගොවියා, බුද්ධිමතා වඩාත් හොඳින් හා කාර්යක්ෂම ලෙස වැඩකළ තරමට වැඩි ප්‍රමාණයක පාරිශ්‍රමිකයක් ඔවුන්ට ලැබේ. ඒ අතරම ඉන් සමාජයටද යහ සාධනයක් සිදුවේ. සමාජවාදය යටතේ පෞද්ගලික හා සමාජමය වුවමනාවන් ඒකාබද්ධ වීම නිෂ්පාදන සංවර්ධනයේ වැදගත් සාධකයකි.

නොදියුණු රුසියාව, බලගතු කර්මාන්ත හා කෘෂිකර්මාන්තයක් ඇති රාජ්‍යයක් බවට පරිවර්තනය කිරීමෙහි, කොමියුනිස්ට් පක්ෂයේ නායකත්වයෙන් යුත් සෝවියට් ජනතාව සමත් වූයේ සමාජවාදී නිෂ්පාදන සම්බන්ධකම් නිසාය. 1975 දී සෝවියට් සංගමය 1913 සාර් රුසියාවට වඩා වානේ 33 න් ගුණයකින්ද, ඛණිජ තෙල් 47.5 ගුණයකින්ද, ගල් අඟුරු 24.5 ගුණයකින්ද, ජල විදුලිය 519 ගුණයකින්ද, වැඩියෙන් නිපදවිය. රටට අවශ්‍ය අමුද්‍රව්‍ය හා ආහාර සැපයීමට පුළුවන් කමක් ඇති සමාජවාදී කෘෂිකර්මාන්තය ඉතා විශාල ජයග්‍රහණ ලබාගෙන ඇත්තේය.

නිෂ්පාදනයේ සමාජවාදී සම්බන්ධකම් විසින් සියලු සමාජවාදී රටවල වේගවත් ආර්ථික වර්ධනයක් ඇති කිරීම සහතික කෙරේ. සමාජවාදී නිෂ්පාදනයේ සංවර්ධන වේගය ධනපති රටවලට වඩා සැලකිය යුතු තරමින් උසස්ය. 1974 සමාජවාදී රටවල නිෂ්පාදනය 1937 දී එම රටවල නිෂ්පාදනයට වඩා 18 ගුණයකින් වැඩි විය. එහෙත් මේ කාලය තුළදී ධනපති රටවල නිෂ්පාදනය වැඩිවූයේ 5.5 ගුණයකින් පමණකි.

සමාජවාදී ආර්ථික අඩිතාලම සමාජවාදී නිෂ්පාදන සම්බන්ධකම් වලින් සමන්විතය. ආර්ථික ව්‍යුහය බිහිකිරීමට අවශ්‍ය අනිවාර්ය කොන්දේසිය නම් නිර්ධන පංතියේ ආඥාදායකත්වය තහවුරු කිරීම හෙවත් කම්කරු පංතියේ දේශපාලනමය ආධිපත්‍යය ස්ථිර කිරීමය. අනතුරුව, නිෂ්පාදනයේ ප්‍රධාන මාධ්‍යයන් සියතට ගන්නා නිර්ධන පංතික රජය නගරවල හා ගම්වල සමාජවාදී නිෂ්පාදන සම්බන්ධකම් ගොඩනැගීම සැලැස්මානුකූල ලෙස සංවිධාන කරයි.

අඩිතාලමේ මෙන් නොව, සමාජවාදී උඩු ව්‍යුහයේ සමහර අංග ධනපති ක්‍රමය තුළින් බිහිවේ. මාක්ස් ලෙනින්වාදී න්‍යායද, කම්කරු පංතියේ දේශපාලන පක්ෂයද, කම්කරු වෘත්තීය සමිතිද, නිර්ධන පංතික සදචාරයද, සාහිත්‍යය සහ කලාවද ධනපති අඩිතාලම බලවත්ව තිබෙන කාලයේදී බිහිවී, අනතුරුව සමාජවාදී සමාජයේ උඩු ව්‍යුහයට

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

ඇතුළු වේ. එපමණක් නොව, එම උඩු ව්‍යුහය පසුගිය යුගවල විද්‍යාවේ, සංස්කෘතියේ සහ දර්ශනවාදයේ උසස්තම ජයග්‍රහණයන් ස්වීකරණය කර ගනී. එසේවුවද, මේ අංග සියල්ල සමාජවාදී උඩු ව්‍යුහයේ අදහස්, ආයතන හා සංවිධාන සමස්තය බවට පත්වන්නේ නොවේ. සමාජවාදී උඩු ව්‍යුහය සමස්තයක් වශයෙන් සකස්වන්නේ සමාජවාදී අඩිතාලම නිර්මානය කිරීමත් හා සමගමය.

සමාජවාදී දෘෂ්ටිය සහ එයට උචිත සංවිධානවලින් එනම් සමාජවාදී රජය, කොමියුනිස්ට් පක්ෂය, වෘත්තීය සමිති, කොමියුනිස්ට් තරුණ සංවිධානය, සංස්කෘතික, අධ්‍යාපනික, ක්‍රීඩා, ආරක්ෂක සංවිධාන යන මේවායින් සමස්ත සමාජවාදී උඩු ව්‍යුහය සංයුක්ත වන්නේය.

පුරෝගාමී ප්‍රගතිශීලී සමාජවාදී පදනම සමාජවාදී උඩු ව්‍යුහයේ හරයද, එහි ක්‍රියාශීලී, විප්ලවීය නිර්මාණාත්මක ස්වභාවයද තීරණය කරයි. ධනවාදයේ සිට කොමියුනිස්ට්වාදය දක්වා මිනිස් සංහතිය නොනවත්වා චලිතය වන ඉතිහාසයේ වාස්තවික ඉදිරිගමන පිළිබිඹු කරමින්, සමාජවාදී උඩු ව්‍යුහය හැම අතින්ම එම ඉදිරි ගමනට ආධාර කරයි, ශ්‍රේෂ්ඨ ඓතිහාසික කාර්ය භාරයක් සපුරාලයි, සමාජවාදී පදනම ශක්තිමත් කොට සංවර්ධනය කරයි.

සමාජවාදී සමාජයේ උඩු ව්‍යුහය ඒක ශෛලමය සමගිය, සමස්තය නිසාත්, එහි සතුරු පංතිවල ප්‍රතිවිරුද්ධතාවයක් නොමැතිවීම නිසාත් සමාජවාදී පදනමේ ඒකීයතාවයක් සහ සමස්තයක් නියෝජනය කරයි. ප්‍රතිගාමී අදහස් හා දෘෂ්ටි සහිත පංති සමාජවාදී සමාජයක් යටතේ නොමැත. සෝවියට් දේශයේ වැඩකරන ජනතාවගේ අති විශාල බහුතර සංඛ්‍යාව සමාජවාදී සමාජයේ වර්ධනය ගැනද, එය ජයග්‍රාහී ලෙස කොමියුනිස්ට්වාදය දක්වා ඉදිරියට යාම ගැනද උනන්දුවක් දක්වති. සමාජවාදයේ ආර්ථික ව්‍යුහය ශක්තිමත් කිරීම සඳහාද, එහි උඩු ව්‍යුහය සංවර්ධනය කොට අංග සම්පූර්ණ කිරීම සඳහාද ඔවුහු මුලු මහත් ශක්තිය යොදවා පරිශ්‍රම දරති.

සමාජවාදී උඩු ව්‍යුහය සැබෑ ප්‍රජාතන්ත්‍රවාදී ස්වභාවයක් උසුලයි. වැඩකරන ජනතාවගේ උවමනාවන් හා හිමිකම් ප්‍රකාශ කරමින් ඒවා ආරක්ෂා කරන සමාජවාදී උඩු ව්‍යුහය ඔවුන්ගේ නිරන්තර සහයෝගය ලබා ගනී. සමාජවාදී අඩිතාලමේ සංවර්ධනය කෙරෙහිත්, සමාජවාදී සමාජයේ සමස්ත ප්‍රගතිය කෙරෙහිත්, සමාජවාදී උඩු ව්‍යුහය පාන ඉමහත් බලයේ, නැතහොත් එම උඩු ව්‍යුහයේ ක්‍රියාකාරිත්වයේ මූලාශ්‍රය එම සහයෝගයයි. සෝවියට් සමාජය කොමියුනිස්ට් ක්‍රමය කරා ඉදිරියට යත්ම, උඩු ව්‍යුහයේ වැදගත්කමද අඩිතාලමේ හා සමස්තයක් වශයෙන් සමාජයේ සංවර්ධනය කෙරෙහි එය පාන බලය

ස්ථිර සාර ලෙස වැඩි වන්නේය. සෝවියට් සංගමයේ යෝධමය ආර්ථික හා සංස්කෘතික වැඩ පිළිවෙළවල් සහ ඉදිකිරීම්ද නිසා සමාජයේ අලුත්, අලුත් කොටස් ක්‍රියාශීලී ලෙස ඒවාට සහභාගිවීමට ඉදිරිපත්වීමද, ඔවුන්ගේ දෘෂ්ටිමය හා චරිත හැඩගැස්වන වැඩවල තත්වය උසස්වීමද එය නියෝජනය කරයි. කම්කරු පංතිය සහ එහි පුරෝගාමී කොමියුනිස්ට් පක්ෂයේ නායකත්වය යටතේ සෝවියට් ජනතාව ඉමහත් ආයාසයකින් වැඩ කරමින්, ආත්ම පරිත්‍යාගයෙන් කරගෙන ගිය සටන්වල ප්‍රතිඵලයක් වශයෙන්, සමාජ ජීවිතයේ හැම අංශයක්ම උසස් ලෙස මුහුකුරා වැඩුණු තත්වයක් පෙන්වන, වර්ධනයවූ සමාජවාදයක් සෝවියට් සංගමයේ ගොඩනගන ලදී.

ආර්ථික ක්ෂේත්‍රයේ වර්ධනයවූ සමාජවාදයට, බලගතු ද්‍රව්‍යමය තාක්ෂණික පදනමක්ද, හැම අතින්ම වර්ධනයවූ ජනතා ආර්ථිකයක්ද, ඒකීය සැලැස්මක් අනුව මග පෙන්වීමක්ද, නිෂ්පාදනයේ වේගවත් වර්ධනයක් සහ ස්ථිරතාවයක්ද, නවීනතම විද්‍යා-තාක්ෂණික ජයග්‍රහණ පාවිච්චි කිරීමේ පදනම මත ශ්‍රම ඵලදවක්ද ආවේණිකය.

දේශපාලන ක්ෂේත්‍රයේ පොදු ජන රජයක්ද, සමාජවාදී ක්‍රමයට ගැළපෙන ගැඹුරු ප්‍රජාතන්ත්‍රවාදයක්ද, සැබෑ ජනතා පාලනයක්ද සමාජවාදයට ආවේණිකය.

සමාජීය ක්ෂේත්‍රයේ සමාජවාදී දේපල හිමිකම සම්පූර්ණයෙන්ම අධිපතිත්වයෙහි තැබීම පදනම් කරගෙන මුහුකුරා වැඩුනු සමාජ සම්බන්ධකම් ඇතිවීමද, සියලු වර්ගවල සූරාකන්නන් තුරන් කරලීම සහ ශ්‍රමයේ ප්‍රමාණය හා ගුණය අනුව බෙදහැරීමේ සමාජවාදී මූලධර්මය සම්පූර්ණයෙන්ම තහවුරු වීමද, සමාජයේ සමාජදේශපාලන සහ දෘෂ්ටිමය ඒකීයතාවයක් ඇතිවීමද සමාජවාදයට ආවේණික ලක්ෂණ වන්නේය.

අධ්‍යාත්මික ක්ෂේත්‍රයේ — විද්‍යාවේ සංස්කෘතියේ සහ අධ්‍යාපනයේ උසස් තත්වයක්ද විද්‍යාත්මක මාක්ස්-ලෙනින්වාදී දෘෂ්ටිය පොදුවේ පැතිරයාම හා තහවුරුවීමද සමාජවාදයට ආවේණිකය.

වර්ධිත සමාජවාදී සමාජයේ, සමාජවාදයට ආවේණික නියාම, මූලධර්ම සහ වාසි වඩාත් පැහැදිලි ලෙස ප්‍රකාශ වේ. විද්‍යා-තාක්ෂණික විප්ලවයේ ජයග්‍රහණ සමග මේ වාසි ඓන්ද්‍රියමය ලෙස සම්බන්ධ කිරීමේ, ඓතිහාසික වැදගත් කාර්ය භාරය එය විසඳාලයි. ස්වභාව ධර්මය වෙනස් කිරීම සඳහා ඉතා අගනා වැඩ පිළිවෙළවල් ක්‍රියාවේ යෙදවීමද, සමාජ සම්බන්ධතා පද්ධතිය තවදුරටත් අංග සම්පූර්ණ කිරීමද, අධ්‍යාත්මික සංස්කෘතිය උසස් කිරීමද සඳහා ඉතා පොහොසත් ශ්‍රමීය හා ද්‍රව්‍යමය සංචිතය එම සමාජය සතුව පවතී.

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

සෝවියට් සංගමයේ වර්ධනය වූ සමාජවාදයක් ගොඩනැගීම නිසා රට වඩාත් කොමියුනිස්ට්වාදය කරා ළංවිය. කොමියුනිස්ට්වාදය ගොඩනැගීම සෝවියට් ජනතාවගේ හදිසි ප්‍රායෝගික ක්‍රියාකාරිත්වයක් බවට පත්වී තිබේ.

කොමියුනිස්ට්වාදය

කොමියුනිස්ට්වාදය යනු කුමක්ද?

සෝවියට් සංගමයේ කොමියුනිස්ට් පක්ෂයේ වැඩ පිළිවෙළේ ඒ ගැන මෙසේ සඳහන් වේ. "කොමියුනිස්ට්වාදය යනු නිෂ්පාදන මාධ්‍යයන් මත පොදුජන ඒකීය අයිතියක් ඇත්තාවූද, සමාජයේ සියලු සාමාජිකයින් අතර සම්පූර්ණ සමානතාවයක් ඇත්තාවූද, මිනිසුන්ගේ අංග සම්පූර්ණ වැඩීමක් සහ නිරතුරුවම වර්ධනයවන විද්‍යාව සහ තාක්ෂණිකය පදනම් කරගත් නිෂ්පාදන බලවේගයන් ඇති වන්නාවූද, "හැම එකකුගෙන්ම සිය දක්ෂතාවය අනුවත්, හැම එකකුටම සිය අවශ්‍යතාවය අනුවත්" යන ශ්‍රේෂ්ඨ මූලධර්මය අනුව රටේ සියලු ධන සම්භාරයන් වර්ධනය කොට ඒවා බෙදා හැරීම කරන්නාවූද පංති රහිත සමාජ ක්‍රමයක් වන්නේය. කොමියුනිස්ට්වාදය යනු සමාජමය ස්වයං පාලනයක් තහවුරුවන, සමාජයේ යහපත සඳහා ශ්‍රමය වැය කිරීම සමාජයේ හැම සාමාජිකයකුගේම ප්‍රථම ජීවමය අවශ්‍යතාවයක් බවට පත්වන, හැම කෙනෙකුගේම දක්ෂතාවයන් ජනතාවගේ යහපත සඳහා උපරිමය වශයෙන් පාවිච්චි කරන, ස්වාධීන හා විඥත වැඩකරන ජනතාවකගෙන් යුත්, උසස් ලෙස සංවිධානය වුණු සමාජයකි."*

සියලු ජනතාවම සමාජමය අසමානතාවයෙන්, සියලු ආකාර පීඩනයෙන් සහ සූරාකෑම්වලින් හා යුද්ධයේ ගොරතර බියෙන් මුදගැනීමෙන්ද, මෙලොවේ සියලු ජනයාටම සාමය, ශ්‍රමය, නිදහස, කොමියුනිස්ට් ක්‍රමය ශ්‍රේෂ්ඨතම ඓතිහාසික කාර්යයක් සපුරාලයි.

දීර්ඝ මිනිස් ඉතිහාසයේ ඇතිවන ශ්‍රේෂ්ඨතම විප්ලවය, මිහිපිට කොමියුනිස්ට් ක්‍රමය ස්ථාපිත කිරීම වනු ඇත. ජීවිතයේ හැම ක්ෂේත්‍රයකම, නිෂ්පාදනයේ, ශ්‍රම කටයුතුවල, සමාජ සම්බන්ධකම්වල, සංස්කෘතියේ සහ ජීවන පරිචයේ, ඔවුන්ගේ අදහස්වල හා චින්තනයේ අති විශාල හා ගැඹුරු වෙනස්වීම් එයින් උදවනු ඇත. කොමියුනිස්ට්වාදය මිනිසාගේ ඉතාමත් උතුම් හෘදයංගම ප්‍රාර්ථනාවන් ඉටුකරන සහ මිනිසාගේ උත්තුංග අදහස්වලට ගැලපෙන ජීවන තත්වයක් හැම කෙනෙකුටම ලබා දෙනු ඇත.

කොමියුනිස්ට් සමාජයේ විශිෂ්ටත්වය අන් සියල්ලටමත් වඩා පැහැදිලිවනු ඇත්තේ එහි නොකඩවාම ප්‍රසාරණය වන නිෂ්පාදනයේ අති උසස් මට්ටම සහ වේගවත් විද්‍යා-තාක්ෂණික ප්‍රගතිය විසින් ඇතිකරනු ලබන පෙර නොවූ විරූ සේ උසස් ශ්‍රම ඵලදාව මගිනි. කොමියුනිස්ට් සමාජය උසස්තම සැලැස්මානුකූල ආර්ථික මට්ටමට එළඹෙන අතර ද්‍රව්‍යමය සම්පත් හා ස්වාභාවික සම්පත් වලින් අතිශයින්ම සාර්ථකවත් හා තර්කානුකූල උපයෝගිතාවය ලබාගැනීම සහතික කරනු ඇත. විශිෂ්ඨතම හා බලසම්පන්නතම තාක්ෂණික ශිල්පීය ශක්තියකින් ජනතාව සන්නද්ධ කරන කොමියුනිස්ට් සමාජය ස්වභාව ධර්මය යටත් කර ගැනීමේ මිනිස් හැකියාව ඉතා උසස් තත්වයකට නංවාලයි. එමගින් ස්වභාව ධර්මයේ සාංසිද්ධික බලවේග වඩාත් විශාල පරිමාණයකින් පාලනය කරගැනීමට හා ඒවා තමාගේ වුවමනාවන් ඉටුකරගැනීම සඳහා යොදවා ගැනීමටත් මිනිසාට වඩාත් විශාල හැකියාවක් ලැබෙනු ඇත. කොමියුනිස්ට් නිෂ්පාදනයේ අරමුණ විඥත ලෙස සමාජය ප්‍රගති මගෙහි යාම සහතික කිරීමය. සමාජයේ හැම සමාජිකයකුටම, ඔහුගේ වැඩෙන අවශ්‍යතාවයන්ට වුවමනාවන්ට හා රුචියට සරිලන පරිදි ද්‍රව්‍යමය හා සංස්කෘතික සම්පත් ලබාදීමය.

එසේවුවද කොමියුනිස්ට් ක්‍රමය අරාජිකවාදයේ, අකර්මන්‍යභාවයේ හා කුසීතභාවයේ සමාජයක් නොවන්නේය. කොමියුනිස්ට් සමාජයේ ද්‍රව්‍යමය හා අධ්‍යාත්මික සම්පත් දෙන ප්‍රධාන උල්පත ශ්‍රමය වන්නේය. කොමියුනිස්ට් ක්‍රමය යටතේ හැම කෙනෙක්ම සිය කැමැත්තෙන් සිය හැකියාව අනුව වැඩ කරනු ඇත. එමගින් ඔහු සමාජමය සම්පත් වැඩිකොට සමාජයේ බලය ශක්තිමත් කරයි. වැඩෙහි ස්වභාවයද වෙනස් වනු ඇත. වැඩ කිරීම හුදෙක් යැපීම් මාධ්‍යයක් වශයෙන් නොපැවතී එය ජීවිතයේ පරම අවශ්‍යතාවයක්ද, සැබෑ නිර්මාණාත්මක ප්‍රයත්නයක්ද, සැබෑ සැපතක් හා ප්‍රීතියක්ද බවට හැරෙනු ඇත.

කොමියුනිස්ට් ක්‍රමය යටතේ සමාජය පංතිවලට සහ සමාජ කණ්ඩායම්වලට බෙදීම සදහටම අවසන් වනු ඇත. නගරයත් හා ගමත් අතර, සමාජ හා ආර්ථික ක්ෂේත්‍රවලත් සංස්කෘතික හා ජීවන රටා ක්ෂේත්‍රවලත් ඇති වෙනස සම්පූර්ණයෙන් තුරන්කර දමන්නේය. සමාජවාදය යටතේ පවතින දෙයාකාර අයිතිය කොමියුනිස්ට් ක්‍රමය යටතේදී එකාකාර අයිතියක් වශයෙන් ඒකාබද්ධ වන්නේය. එබැවින් කම්කරු පංතිය හා ගොවීන් පංති වශයෙන් පැවතීමද නැති වන්නේය. කායික ශක්තියෙන් වැඩ කරන කම්කරුවන් බුද්ධිමතුන්ගේ සංස්කෘතික හා තාක්ෂණික මට්ටමට උසස් වන බැවින්, කොමියුනිස්ට් ක්‍රමය යටතේ බුද්ධිමතුන් වශයෙන් විශේෂ සමාජ කොටසක් නොසිටිනු ඇත. සමාජයේ හැම සමාජිකයෙක්ම කය හා මොළය වෙහෙසා කරන

* "සෝ: සං: කො: පක්ෂයේ වැඩ පිළිවෙළ". මොස්කව්, 1971, 62 පිටුව, රුසියන් මුද්‍රණය.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

වැඩෙහි යෙදෙනු ඇත. කාර්යයන්ට අදල බුද්ධිමය හා කායික පරිශ්‍රමයන් ඉතා අගනා ලෙස එකට ගැලපෙනු ඇත.

කොමියුනිස්ට් සමාජයේ හැම සමාජිකයෙක්ම නිෂ්පාදන මාධ්‍යයන් කෙරෙහි දක්වන සම්බන්ධකම එක සමාන බැවින්, හැම දෙනම එක සමාන තත්වයක පවතින අතර සමාන වැඩ හා බෙදහැරීමේ තත්වයන් භුක්ති විඳිති. සමාජ වැඩකටයුතු පරිපාලනයෙහිදී ක්‍රියාශීලී ලෙස සහභාගි වෙති. සමාජ හා පෞද්ගලික වුවමනාවන් අංග සම්පූර්ණ ලෙස ඒකාබද්ධ කෙරෙන නිසා, පුද්ගලයා හා සමාජය අතර සම්බන්ධකම්වල සංගතභාවය නිතරම බලපවත්වනු ඇත.

මිනිස් සංස්කෘතිය මින් පෙර නොවූ විරූ උච්චස්ථානයකට පත්වනු ඇත. ලෝක සංස්කෘතිය විසින් නිර්මාණය කරන ලද විශිෂ්ඨ දේ සියල්ල දයාද කොට ගෙන ඒවා වර්ධනය කරන කොමියුනිස්ට් සමාජයේ සංස්කෘතිය, මිනිස් සංස්කෘතික දියුණුවේ නව හා වඩාත් උසස් අවධියක් වන්නේය. අධ්‍යාත්මික ජීවිතයේ සියලු විවිධත්වයන් සහ පොහොසත්කම් ද, නව සමාජයේ උදර දෘෂ්ටිය හා මානවවාදයද එය ඇතුලත් කරගනු ලැබේ. එය පංති රහිත ජාත්‍යන්තර සමස්ත මිනිස් වර්ගයාගේම සංස්කෘතියක් වනු ඇත.

කොමියුනිස්ට් ක්‍රමයේදී නව මිනිසෙක් දක්නට ලැබෙනු ඇත. ඔහු අධ්‍යාත්මික පිරිපුන් බවත් සදචාරමය නිර්මලභාවය හා ශාරීරික සම්පූර්ණත්වයත් ඒකාබද්ධ කරගත් අයෙකි. එමෙන්ම ඔහු උසස් කොමියුනිස්ට්වාදී විඥත කාර්යශීලී භාවය, විනය ගරුක බව හා සමාජමය වුවමනාවන්ට කැපවීම ඇති කෙනෙක්ද වේ. කොමියුනිස්ට්වාදී නිෂ්පාදනය මිනිසාගෙන් බලාපොරොත්තුවන සංවිධානාත්මක භාවය හා යථාත්‍යභාවය සහතික වනුයේ බලකිරීම මගින් නොව, ප්‍රජා වගකීම පිළිබඳව ඔහුට ඇති උසස් අවබෝධය තුළිනි. කොමියුනිස්ට් ක්‍රමය යටතේ මිනිසා අංග සම්පූර්ණ, සංගත, වර්ධනයක් ලබනු ඇත. ඔහුගේ දක්ෂතාවයන් හා කුසලතාවයන් සම්පූර්ණයෙන්ම කුළුගැන් වී පූර්ණ ප්‍රබෝධය ලබනු ඇත. ඔහුගේ මහඟු අධ්‍යාත්මික හා කායික ගති ගුණ සාකල්‍යයෙන්ම ප්‍රකට වනු ඇත.

කොමියුනිස්ට් ක්‍රමය ගොඩ නැගීමත් සමගම කොමියුනිස්ට් පක්ෂයේ ශ්‍රෙෂ්ඨ පරමාර්ථය මුදුන් පැමිනේ. ගොඩ නගන එම සමාජයේ ධජයෙහි අභිලේඛනය කර ඇත්තේ ''හැම කෙනෙකුගෙන්ම සිය දක්ෂතාවය අනුව, හැම කෙනෙකුටම ඔහුගේ අවශ්‍යතාවය අනුව'' යනුයි. ''සියල්ල මිනිසා වෙනුවෙන් මිනිසාගේ යහපත සඳහා'' යන පක්ෂයේ සටන් පාඨය පරිපූර්ණ ලෙස ක්‍රියාත්මක කරනු ලැබේ.

III

සමාජ සංවර්ධනයේ තීරණාත්මක බලවේගය පොදු ජනතාවය. සමාජය සහ පෞද්ගලිකත්වය

සමාජය ස්වකීය නියාමයන් පදනම් කරගනිමින් ඓතිහාසික අවශ්‍යතාවයන් අනුව වර්ධනය වන බව අපි සටහන් කළෙමු. එහෙත් සමාජමය නියාමයන් නිතරම ප්‍රකාශ වන්නේ, සිය ඉතිහාසය නිර්මාණය කරන මිනිසුන්ගේ පැතුම් හා ක්‍රියා තුළිනි.

ඓතිහාසික ක්‍රියාදමයේදී මිනිසුන්ගේ වැදගත්කම කවරේද? එසේම ඉතිහාස විෂයෙහි ජනතාවගේද තනි පුද්ගලයින්ගේද ක්‍රියා කලාපය කුමක්ද?

ඓතිහාසික ක්‍රියාදමයේ සැබෑ නිර්මාණකයන් පොදු ජනතාව වන බව ඓතිහාසික භෞතිකවාදයේ මූලික පිළිගැනීමය. ඉතිහාසයේ නිර්මාණකයින් ලෙස ජනතාව ක්‍රියා කරන්නේ මන්ද? සමාජ සංවර්ධනයේදී පුද්ගලයා ඉටුකරන කාර්ය කොටස කුමක්ද, යන්න ගැන පැහැදිලි කරමු.

1. ජනතාව — ඓතිහාසික ක්‍රියාදමයේ සැබෑ නිර්මාණකයාය, සමාජ සංවර්ධනයේ තීරණාත්මක බලවේගය එයයි

ඉතිහාසයේ නිර්මාණකයා වශයෙන් ජනතාව ඉටුකරන කාර්ය කොටස පැහැදිලි කිරීමට නම්, අන් හැමටම පළමුව, ජනතාව,

ජනතාව පිළිබඳ සංකල්පය

නැතහොත් පොදු ජනතාව යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි පැහැදිලි කරගත යුතුය.

ජනතාව යනු කිසි දිනක වෙනස් නොකළ හැකි ඉතිහාසයෙන් පරිබාහිර, හැමදාම එකලෙස පවතින දෙයක් නොවේ. සූරාකන පංතියේ

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

දෘෂ්ටිවාදීන් පෙන්වාදීමට තැත් කරන පරිදි, ජනතාව මෝඩ අක්‍රමික "සමූහයක්" "සැහැසි රැලක්" හෝ සභ්‍යත්වයට හා ප්‍රගතියට විරුද්ධ දුෂ්ඨයින් නොවේ.

ජනතාව යනුවෙන් හැඳින්වෙන්නේ ප්‍රධාන වශයෙන්ම වැඩ කරන ජනතාවය. සතුරු පංති සහිත සමාජයේ සූරාකෑමට හසුවී සිටින්නේ එම කොටස්ය. වහල් සමාජයේ මෙම කොටසට වැටුනු පිරිස ප්‍රධාන වශයෙන් වහලුන් විය. රදළ සමාජයේ ප්‍රවේණිදස ගොවීන් හා හස්ත කර්මාන්ත කරුවන්ය. ධනපති සමාජයේ කම්කරු පංතියත්, ගොවි ජනතාවත්, වැඩකරන බුද්ධිමතුන් සහ සමාජ ප්‍රගතියට දායක වන කොටසුත් ජනතාව හැටියට හැඳින්වේ.

සතුරු ප්‍රතිවිරෝධතා ඇති පංති සහිත සමාජයේ ජනතාව ජනගහණයේ ප්‍රධාන කොටස වන නමුදු සම්පූර්ණ ජනගහණය නොවන්නේය. සමකාලීන ධනපති සමාජයේ නිදසුනක් වශයෙන්, ප්‍රතිගාමී අධිරාජ්‍යවාදී ඉහළ කොටස ජනතාවට විරුද්ධව සිටී.

සමාජවාදී සමාජයේ මුළු මහත් ජනගහණයම, කම්කරු පංතිය, ගොවිහු සහ බුද්ධිමත්හු, ජනතාවට අයත් වෙති.

ඉතිහාසයේ නිර්මාතෘවරයා ජනතාවය

ඓතිහාසික ක්‍රියාදමයේදී ජනතාව තීරණාත්මක ලෙස වැදගත් වීමට හේතුවන්නේ, සමාජ සංවර්ධනයේදී නිෂ්පාදන ක්‍රමය ඉටුකරන තීරක කාර්ය කොටසය. අපි ඉහත ඉගෙනගත් පරිදි ද්‍රව්‍යමය නිෂ්පාදනය සමාජ ජීවිතයේ පදනම වන අතර ප්‍රධාන නිෂ්පාදන බලවේගය වැඩකරන ජනතාව වන්නේය. ඒ අනුව, සමාජ සංවර්ධනයේ තීරණාත්මක බලවේගය, ඉතිහාසයේ සැබෑ නිර්මාතෘවරයෝ ජනතාව වෙති.

ඉතිහාසය විෂයෙහි ජනතාව ඉටුකරන කාර්ය කොටස ප්‍රකාශ වන්නේ කෙසේද?

වැඩ කරන ජනතාව ප්‍රධාන වශයෙන් සිය නිෂ්පාදනීය ශ්‍රමය මගින් ඉතිහාසය නිර්මාණය කරති. සියලු ද්‍රව්‍යමය සම්පත් — නගර හා ගම්, පැක්ටරි හා කම්හල්, මාවත් හා පාලම්, මෝටර හා යන්ත්‍ර, ඇඳුම් හා පාවහන්, ආහාර හා ගෘහ භාණ්ඩ, එනම් අපේ ජීවිතයට අවශ්‍ය හැම දෙයක්ම — නිපදවන්නෝ වැඩකරන ජනතාව වෙති.

තාක්ෂණික ප්‍රගතියේ ප්‍රධාන ගාමක බලවේගයද වැඩකරන ජනතාවය. ඉමහත් වුවමනාවකින් හා නොපසුබට උත්සාහයෙන්, දවසින් දවස, වසරෙන් වසර, සිය වසරක් සිය වසරක් පාසා, බොහෝ විට තමන් කරන මහා කාර්ය ගැන දැනුමෙන් තොරව, ඔවුහු ශ්‍රම

උපකරණ සකස් කොට, අංග සම්පූර්ණ කළහ. මෙය අවසානයේදී අති විශාල තාක්ෂණික විප්ලවවලටද නිෂ්පාදන බලවේගයන්ගේ වෙනසකටද මග හෙළිකළේය. අනිත් අතින් නිෂ්පාදන බලවේගයන්ගේ වර්ධනය සමස්තයක් වශයෙන් මුළු මහත් නිෂ්පාදන ක්‍රමයේම වෙනසක් ඇති කෙළේය. අතිශයින්ම දුෂ්කර මර්දනය යටතේදී වුව, සාමාන්‍ය මිනිහාගේ ශ්‍රමය මිනිස් සංහතියේ ප්‍රගතිය සඳහාත්, නව සමාජ ක්‍රමයකට පරිවර්තනය දීම සඳහාත් ද්‍රව්‍යමය පූර්වාවශ්‍යයන් ඇති කෙළේය.

එසේ වුවද, නිෂ්පාදන බලවේග වර්ධනය කිරීමට සහ එමගින් අලුත් සමාජ ක්‍රමයක් සඳහා ද්‍රව්‍යමය තත්වයන් පිළියෙල කිරීමට පමණක් ජනතාවගේ ඓතිහාසික කාර්ය කොටස සීමා නොවේ. සමාජ විප්ලවයන්ගේ සහ ජාතික විමුක්ති ව්‍යාපාරවල ඉරණම තීරණය කිරීමේ ප්‍රධාන බලවේගයද ජනතාව වන්නේය. පංති සටනද, අන් හැමටම වඩා සිය පාගන්නන්ට විරුද්ධව වැඩකරන ජනතාව ගෙනයන අරගලයන්ද, සතුරු පංති සහිත සමාජයේ වර්ධනය සඳහා ගාමක බලවේගය හැටිමට සේවය කරයි. පාගන්නන්ට විරුද්ධව කරන අරගලයේ උසස්තම ස්වරූපය සමාජ විප්ලවයයි. වහල් සමාජයේ පදනම් දෙදරුම් කෑවේත්, ඉන් රදළ සමාජයක් දක්වා පරිවර්තනයවීමට ප්‍රධාන හේතුව වූයේත්, වහලුන්ගේ නැඟිටීම්ය. රදළවාදය ඉවත් කර ප්‍රගතිශීලී සමාජ ක්‍රමයක්වූ ධනපති ක්‍රමයට ඉඩ සලසා දුන්, ධනපති විප්ලවවලදී ප්‍රවේණිදස ගොවීන් හා නගරබද දුප්පත් ජනතාව වැදගත් ගාමක බලවේගයක් විය.

ප්‍රාග් සමාජවාදී සමාජවල ජනතාවට සිය ශ්‍රමයේ එල භුක්ති විඳීමට බැරිවිය. එහෙත් වැඩ කරන ජනතාවගේ විමුක්තිය ලබා ගැනීමත් දියුණු සමාජවාදී ක්‍රමයක් ජනිතවීම සඳහා මග පෑදූ ප්‍රධාන සාධක වූයේ ඔවුන්ගේ වැඩ සහ අරගලය.

මිනිස් වර්ගයාගේ අධ්‍යාත්මික සංස්කෘතිය සංවර්ධනය කිරීම සඳහා පොදු ජනතාව අති විශාල සේවයක් කර තිබේ. මක්සිම් ගෝර්කි මෙසේ ලියූවේය. "ජනතාව ද්‍රව්‍යමය සාර ධර්ම බිහි කළ බලවේගය පමණක් නොවේ. ඔවුහු අධ්‍යාත්මික සාර ධර්ම උපදවන එකම සහ නොසිඳෙන උල්පත වෙති. කාලය සුන්දරත්වය හා ප්‍රඥව ගැන සලකා බලන කල ප්‍රමුඛතම දර්ශනිකයා හා කවියා ජනතාවය. ලෝකයේ සියලු ශ්‍රේෂ්ඨ කාව්‍යයන්ද, සියලු ඛේදවාචකයන්ද, ඉන් ඉතාමත් අගනා ලෝක සංස්කෘතියේ ඉතිහාසය නම් වූ මහා ඛේදවාචකයද නිර්මාණය කළේත් ජනතාවය."

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ජනතාවගේ ශ්‍රමය, ඔවුන්ගේ නිර්මාණාත්මක පරිශ්‍රමය, විද්‍යාවේ හා සංස්කෘතියේ උල්පත වන්නේය. සිය ශ්‍රේෂ්ඨ නිර්මාණ නිසා මිනිස් සංහතිය පොහොසත් කළ බොහෝ සුප්‍රසිද්ධ විද්‍යාඥයෝද, ගත්කරුවෝද, කලාකරුවෝද, සංස්කෘතික ක්ෂේත්‍රයේ වෙනත් මහා පුරුෂයෝද සාමාන්‍ය ජනතාව අතරින් පැන නැගුණු අය වෙති. සෝවියට් විද්‍යාඥ ලමනෝසව් උතුරු දිග රුසියාවේ මස් මරන්නෙකුගේ පුතෙකි, අයිසැක් නිව්ටන් සුළු ගොවියෙකුගේ පුතෙකි. රුසියාවේ පළමුවැනි දුම්රිය සෑදූ චිරිපානව් පියා සහ පුත්‍ර ප්‍රවේණිදාස ගොවියෝ වූහ. ඉමහත් ප්‍රීති ප්‍රමෝදයක් ඇති කරන මහා කාව්‍ය හා සුරංගනා කතාද, ගීත හා නැටුම්ද, ජනතාව විසින් බිහි කෙරේ. අතිශයින්ම සම්භාවනීය කලාකරුවෝ, සිය උසස්තම කෘතීන් නිර්මාණය කිරීම සඳහා ජන කලාව නැමැති නොසිඳෙන නිධානයෙන් ආදර්ශ ලබා ගනිති.

ඕනෑම මිනිසකුට අවශ්‍ය දෑ නිෂ්පාදනය කරමින්, ජීවන මාධ්‍යය සඳහා අවශ්‍ය සියලු දේ නිෂ්පාදනය කරමින් ජනතාව මොළය වෙහෙසා වැඩකරන ජනතාවට සිය අධ්‍යාත්මික නිර්මාණයන් සඳහා අවශ්‍ය කාලය ලබා දෙති. ජනතාව අතර සම්බන්ධකම් ඇතිකර ගැනීමට නැතිවම බැරි භාෂාවේ නිර්මාතෘවරයෝද බහු ජනතාවය. භාෂාව නැතිව සමාජ ජීවිතයද, විද්‍යාවද, සංස්කෘතියද, කලා ශිල්පද ගැන සිතීමට පවා නොහැකිය.

ඓතිහාසික සංවර්ධනයේදී වැඩෙන ජනතා කාර්ය කොටස

ජනතාව ඉතිහාසය නිර්මාණය කරති. එහෙත් ඔවුන් එය නිර්මාණය කරන්නේ හිතු මනාපය පරිදි නොවේ, වාස්තවික තත්වයන්ට අනුකූලවය. ප්‍රධාන කොටම එය සිදුවන්නේ ඓතිහාසික වශයෙන් අනුකූලවය. ප්‍රධාන කොටම එය සිදුවන්නේ ඓහාසික වශයෙන් නිශ්චිත නිෂ්පාදන ක්‍රමය අනුවය. ද්‍රව්‍යමය නිෂ්පාදනය පහළ සිට ඉහළට නිරතුරුවම සංවර්ධනය වන] බැවින්, ඓතිහාසික ක්‍රියාදාමයේදී ජනතාව ඉටුකරන කාර්ය කොටසද වෙනස්වේ. මිනිස් සංහතිය ප්‍රගතිශීලී ලෙස වර්ධනය වත්ම, ඉතිහාසයේ ජනතා කාර්ය කොටසද වැඩිවෙයි. සමාජ පරිවර්තනයන් ගැඹුරු වත්ම, සමාජය ඉදිරියේ ඇති කාර්ය භාරයන් වඩාත් වැදගත් වේ. ඓතිහාසික ක්‍රියාදාමයන්ට සහභාගිවන මිනිසුන්ගේ සංඛ්‍යාවද වැඩිවේ. එමෙන්ම පොදු ජනතාවගේ ක්‍රියාකාරිත්වයද වැඩිවේ යයි මාක්ස්වාදය ඔප්පු කොට පෙන්වා දී ඇත. මාක්ස් මෙසේ ලියුවේය. "ජනතාව විසින් නිර්මාණය කරන ලද

ඓතිහාසික ක්‍රියාවක මනා සාර්ථකත්වය විශිෂ්ඨ වූ තරමට ඊට සහභාගි වන ජනකායද වැඩිවනු ඇත."*

වහල් සමාජයේ සහ රදළ සමාජයේ වැඩකරන ජනතාවට ඉතා මූලික අයිතිවාසිකම් පවා නොතිබුණු අතර ඔවුන්ගේ නිර්මාණාත්මක බලය අනුකම්පා විරහිත ලෙස පාගාදමන ලදී. රාජ්‍ය පාලනයත්, දේශපාලන කටයුතුත්, විද්‍යාව හා කලාව හැදෑරීමත් තම අතට ගත් වහල් හිමියෝ සහ රදළයෝ පොදු ජනතාව අන්ධකාරයේ සහ නූගත් තත්වයේ තබා ගනිමින් ඉතා බරපතල වැඩ කිරීම පමණක් ඔවුන්ට භාර කළෝය. ඒ කාලයේදී ජනතාවගේ ක්‍රියාශීලිත්වය සාපේක්ෂ වශයෙන් විශාල නොවීය. සූරාකන්නන්ට විරුද්ධව ඔවුන් ගෙනගිය ව්‍යාපාර සාර්ථක නොවීය. එද ඉතිහාසය වේදනාකාරී ලෙස සෙමින් බඩ ගාන තත්වයක විය.

ධනපති ක්‍රමය යටතේ වැඩකරන ජනතාව සූරාකෑමෙන් මුදාගැනීම සඳහා අවශ්‍ය ද්‍රව්‍යමය පූර්වාවශ්‍යයන් නිමැවේ. මහා පරිමාණ යාන්ත්‍රික නිෂ්පාදන ඇතිවේ. ධනපති ක්‍රමයට විරුද්ධව ජනතාව මෙහෙයවා සමාජවාදී ක්‍රමයේ ජයග්‍රහණය සහතික කළ හැකි නිර්ධන පංතියද ඇතිවේ. මේ පංතිය විසින් බිහි කරනු ලබන කොමියුනිස්ට් පක්ෂය මාක්ස්-ලෙනින්වාදයෙන් මග පෙන්වීම ලබා ගනිමින් වැඩකරන ජනතාවගේ විප්ලවවාදී සටන් මෙහෙයවයි. යට සඳහන් කරන ලද හේතූන් නිසා ධනපති ක්‍රමය යටතේ ජීවිතයේදී, වැඩකරන ජනතාව ඉටුකරන කාර්ය කොටස විශාල වෙයි. දසලක්ෂ සංඛ්‍යාත වැඩකරන ජනතාව ක්‍රියාශීලී දේශපාලන සටන්වලට ඇදී එන බැවින්, ඉතිහාසයේ ඉදිරිගමන සෑහෙන තරම් ඉක්මන් වේ.

සමාජවාදී විප්ලවයේ ප්‍රධාන ගාමක බලවේගය ජනතාවය, වැඩකරන ජනතාවය. කලින් විප්ලවවලදී ජනතාව පැරණි සමාජ ක්‍රමය බිඳ දැමීමට පමණක් සීමාවූ නමුත් ඊට වෙනස් වන සමාජවාදී විප්ලවයේ ක්‍රියාදාමයේදී, ඔවුන් පැරණි ධනපති සමාජය විනාශ කරනවා පමණක් නොව, නව සමාජවාදී සමාජයද ගොඩ නගන්නේය.

සමාජවාදී සමාජයේ සමාජ ජීවිතයේදී පොදු ජනතාවගේ ක්‍රියාකාරිත්වයද, ඔවුන් ඉටුකරන කාර්ය කොටසද අතිශයින් විශාලය. සමාජවාදය වැඩකරන ජනතාවගේ අතිශයින්ම අවශ්‍ය වුවමනාවන් සපුරාලයි. එබැවින්, ඔවුහු එය බිහි කිරීමෙහිලා ඉමහත් උනන්දුවක් දක්වති. "ජීවමාන, නිර්මාණශීලී, සමාජවාදය පොදු ජනතාව විසින් බිහිකරනු ලැබේ"** යයි ලෙනින් ලියුවේය. නව ජීවිතය

* මාක්ස් සහ එංගල්ස්. "ශුද්ධවූ පවුල".
** වී. අයි. ලෙනින්. සම්පූර්ණ කෘතීන්, වෙළුම 35, පිටුව 57.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ගොඩනැගීමේදී ජනතාවගේ ක්‍රියාකාරිත්වය වැඩිවීම සමාජවාදී සංවර්ධනයේ නියාමයකි. ලෝකයේ සමාජවාදය ජයගත් පළමුවැනි රට වන සෝවියට් දේශයේ එම නියාමය සිත්කාවදින ලෙස ක්‍රියාත්මක වනු දක්නට ලැබේ.

ප්‍රධාන වශයෙන් සමාජවාදී ක්‍රමයේ ස්වභාවය වන සමාජවාදී නිෂ්පාදන සම්බන්ධකම්වල ආධිපත්‍යය නිසා, සමාජවාදී තත්වයන් යටතේ ජනතාව ඉටුකරන කාර්ය කොටස බෙහෙවින් වැඩිවේ. සෝවියට් සංගමයේ මනාව තහවුරු වී ඇති සමාජවාදී දේපල අයිතිය නිසා වැඩ කරන ජනතාවගේ සියලුම කොටස් එකට සම්බන්ධ-වේ. එමෙන්ම කොමියුනිස්ට් ක්‍රමය ඉදිකිරීමේදී ඔවුන්ගේ ක්‍රියාශීලී සහභාගිත්වය එයින් සහතික වේ.

සමාජයේ හා පුද්ගලයාගේ මූලික උවමනාවන් අතර සංගත ඒකාබද්ධතාවයක් ඇතිවන්නේත්, තම ශ්‍රමයේ ප්‍රතිඵලය ගැන වැඩකරන ජනතාව තුළ ද්‍රව්‍යමය උවමනාවක් ඇතිවන්නේත් සමාජවාදය යටතේ පමණකි. ධනපති සමාජය යටතේ වැඩකරන ජනතාව අති මහත් ද්‍රව්‍යමය හා සංස්කෘතික සාර ධර්ම නිර්මාණය කරන අතර සියලු ප්‍රගතිශීලී සමාජ ව්‍යාපාරයන්ගේ ප්‍රධාන කොටස් කරුවාද වන්නේය. එහෙත් ඔවුන්ගේ ශ්‍රමයේ හා අරගලවල ඵලය සූරාකන්නන් අතලොස්සක් විසින් හිමි කර ගනී. සමාජවාදය යටතේ තත්වය මීට හාත්පසින්ම වෙනස්ය. මෙහි සමාජවාදී ක්‍රමය වර්ධනය කිරීම හා ශක්තිමත් කිරීම සඳහා වැඩකරන ජනතාව ඉමහත් වුවමනාවක් දක්වති. මන්දයත් එය ඔවුන්ගේ දේශපාලන නිදහසේ, ද්‍රව්‍යමය යහජීවිතයේ සහ සංස්කෘතික ප්‍රගතියේ පදනම වන බැවිනි. වී. අයි. ලෙනින් මෙසේ ලියුවේය. ''සියවස් කිහිපයක් තිස්සේ අනුන් සඳහා වැඩකිරීමෙන් ඉක්බිතිව, සූරාකන්නාට යටවී වැඩකිරීමෙන් ඉක්බිතිව, අයෙකුට තමා වෙනුවෙන් වැඩකිරීමට හැකියාව ලැබී ඇත. එපමණක් නොව සිය වැඩවලදී සමකාලීන තාක්ෂණික ශිල්පයේ හා සංස්කෘතියේ සියලු ජයග්‍රහණවලින් ප්‍රයෝජන ගැනීමටද හැකියාවක් ලැබී ඇත.''* තමා, තමාටත්, තම සමාජයටත් වැඩකරන බව ජනතාව දනිති. වැඩකිරීමට ඔවුන් තුළ උනන්දුවේ පදනම මෙයයි. එය ඔවුන්ගේ ක්‍රියාරම්භකත්වයත්, පුරෝගාමී ව්‍යායාමයනුත්, සමාජවාදී ශ්‍රම තරඟයත් උත්තේජනය කරයි.

* වී. අයි. ලෙනින්. සම්පූර්ණ කෘතීන්, වෙළුම 35, පිටුව 196.

කොමියුනිස්ට්වාදය ඉදිකිරීමේදී ජනතාවට මුහුණපෑමට සිදුවී තිබෙන කාර්ය භාරයන්ගේ සුවිශාලත්වය නිසා සමාජවාදය යටතේ ඔවුන්ගේ කාර්ය කොටසද වැඩි වේ. කොමියුනිස්ට් ක්‍රමයේ ජයග්‍රහණයෙන් සලකුණු වන්නේ සමාජ සංවර්ධනයේ යෝධමය පිම්මක් ඉදිරියට තබන ලද බවයි. සමාජ ජීවිතයේ සියලු ක්ෂේත්‍රවල මින් පෙර නොවූ විරූ තරම් වර්ධනයක ප්‍රතිඵලයක් වශයෙන් කොමියුනිස්ට් ක්‍රමය ස්ථාපිතවනු ඇත. කෝටි සංඛ්‍යාත වැඩකරන ජනතාවගේ උනන්දුවක් සහිත සහභාගිත්වයෙන් තොරව මේවා ගැන කිසිසේත් සිතීමට පවා බැරිය.

ජනතා වීරයා හැටියටත්, වැඩකරන ජනතාව හැටියටත් සෝවියට් ජනතාව කීර්තියක් දිනාගෙන ඇත. අතිශයින්ම අමාරු, අසීරු තත්වයන් යටතේ සෝවියට් ජනතාව සමස්ත ලෝක, ඓතිහාසික හා සමාජවාදී ජයග්‍රහණයක් ලබා ගත්තේය. 1941—1945 යන අවුරුදුවලදී සෝවියට් සංගමයේ ජනතාව ජර්මන්–පැසිස්ට් ආක්‍රමණිකයින්ට විරුද්ධ දේශ-ප්‍රේමී මහා යුද්ධයේදී අතිශයින්ම තියුණු සටනක් කරමින් සමාජවාදී ජයග්‍රහණය ආරක්ෂා කරගෙන සමකාලීන මලේච්ඡයින්ගේ බිහිසුණු ආක්‍රමණයකින් මිනිස් සංහතිය මුදගත්තේය. යුද්ධය නිසා විනාශවී ගිය ආර්ථිකය යළිත් ගොඩනගා නිර්මාණාත්මක වැඩ කිරීමෙන් ජය ලබාගත්තේය. දැන් ඔවුහු වර්ධනයවූ සමාජවාදී සමාජයක් ගොඩනගා කොමියුනිස්ට්වාදී සමාජයක් ගොඩ නගමින් සිටිති.

සෝවියට් ජනතාව කොමියුනිස්ට් ක්‍රමයට සමීපවන බව ස්පර්ශමය සහ දෘෂ්ටිමය වශයෙන් දනෝ. කොමියුනිස්ට්වාදී ශ්‍රමය සහ පැවැත්ම සඳහා ඔවුන් ඉදිරියට යන බවද, සිය ශ්‍රමය හා කාලය මෙහෙයවා කොමියුනිස්ට් ක්‍රමය ගොඩනැගීම කරගෙන යන බවද, සිය වෑයම අනුව එහි සම්පූර්ණ ජයග්‍රහණය රඳා පවතින බවද කොමියුනිස්ට් ක්‍රමය ඉදිකිරීමේ ශ්‍රේෂ්ඨ කාර්යයට තමන් කරන සේවය අනුව එය රඳා පවතින බවද සෝවියට් ජනතාව දනිති. සෝවියට් සංගමයේ කොමියුනිස්ට් පක්ෂය විසින් ඉදිරිපත් කරන ලද කොමියුනිස්ට් ක්‍රමය ඉදිකිරීමේ ශ්‍රේෂ්ඨ වැඩ පිළිවෙල සපුරාලීමට සමස්ත ජනතා ව්‍යාපාරයක් අරඹා වැඩ කිරීම සඳහාත්, දේශපාලනමය කටයුතු සඳහාත් ඔවුන් යෝධමය වුවමනාවක් දක්වන්නේ මේ නිසාය.

සමාජවාදී සමාජයේ ජනතාවගේ වැඩිවන කාර්ය කොටස පිළිබඳ මූලික සාධකය නම්, සෝවියට් සංගමයේ කොමියුනිස්ට් පක්ෂයේ නායකත්වයයි. පක්ෂය, වාස්තවික නියාමයන් මත පදනම්වූ සහ සමාජයේ ද්‍රව්‍යමය ජීවිතයේ අවශ්‍යතාවයන් සැලකිල්ලට ගන්නාවූ

https://liberationbase.wordpress.com

ප්‍රතිපත්තියකින් ජනතාව සන්නද්ධ කරයි. වර්තමාන නිෂ්පාදන මට්ටම සහ සැබෑ ශක්‍යතාවයන් මත පිහිටා කටයුතු කරන පක්ෂය ජනතාව අනාගතයේදී සපුරාලිය යුතු කාර්ය භාරයන් හඳුන්වා දී, ඒවා සාර්ථක කිරීම සඳහා මාර්ගය හා මාධ්‍යයන්ද පෙන්වා දෙයි. දිනපතා සෝවියට් ජනතාවට දැනුම දෙන පක්ෂය, ඔවුන්ගේ නිර්මාණාත්මක වැඩකටයුතුවලට ධෛර්ය දෙයි. නව සමාජය ඉදිකිරීම සඳහා ඔවුන්ගේ වඩාත් පුළුල් සහභාගිත්වය ලබාගැනීම සඳහා ක්‍රියා කරයි.

පොදු ජනතාව සමකාලීන තීරණාත්මක දේශපාලන බලවේගය වන්නේය. කොමියුනිස්ට්වාදය ඉදිකරමින් සිටින සෝවියට් ජනතාව ලත් පෙර නොවූ විරූ ජය නිසාද, සමාජවාදය ගොඩනගන සමාජවාදී රටවල ජනතාවගේ ඉමහත් නිර්මාණාත්මක උනන්දුව නිසාද, ප්‍රජාතන්ත්‍රවාදය, සමාජ ප්‍රගතිය සහ සමාජවාදය සඳහා සටන් කරන ධනවාදී රටවල වැඩකරන ජනතාවගේ සටන් නිසාද, යටත් විජිත හා පරාධීන රටවල ජාතික විමුක්ති ව්‍යාපාරයේ වර්ධනය නිසාද එය මැනවින් ප්‍රකාශ වේ. අප කාලයේ වැඩ කරන ජනතාව ලෝක සාමය ආරක්ෂා කිරීම සඳහා උණුසුම් ලෙසත්, ස්ථිර ලෙසත් සටන් කරති. සාමය සඳහා ඔවුන් ගෙන යන සටන ජාත්‍යන්තර සංහිඳියාවක් ඇති වීමට විරුද්ධව අධිරාජ්‍යවාදීන්ගේ උග්‍ර ප්‍රතිගාමී බලවේගයන් ගෙනයන ව්‍යාපාරයටද, 'සිසිල් යුද්ධය' පුළුවන් හැම තැනකම ගෙනයාමටත්, එය උග්‍රකරීමට හා ගැඹුරු කිරීමට දරන ප්‍රයත්නයටද, දිගටම ලෝකය නිත්‍ය නොසන්සුන්තාවයක තබාගෙන යුද්ධ වියදම වැඩිකර, අවි තරගය දිගටම ගෙන යාමට දරන වෑයමටද ඉමහත් බාධාවක් වී ඇත.

2. සමාජය හා පෞද්ගලිකත්වය

පොදු ජනතාව වියුක්ත ප්‍රවර්ගයක් නොවේ. පොදු ජනතාව කෝටි සංඛ්‍යාත සංයුක්ත පුද්ගලයින්ගෙන් යුක්තය. පෞද්ගලිකත්වය නැමැති සංකල්පය ගැන දැන ගැනීමට නම් මිනිසා යනු කවරෙක්දැයි මුලින්ම සොයා බැලිය යුතුය. පෞද්ගලිකත්වය යනුවෙන් කිසියම් සංයුක්ත පුද්ගලයෙකුගේ ප්‍රත්‍යකයක් හැඳින් වේ.

මිනිසාගේ හරය

මාක්ස්ට පෙරද මිනිසාගේ හරය හෙළිකිරීමට බොහෝ දෙනෙක් තැත් කළහ. සමාජ සංවර්ධනය පිළිබඳව මේ චින්තකයෝ දුරු විඥානවාදී මත නිසා එම ප්‍රයත්නය සාර්ථක නොවීය. මිනිසාගේ පරිසරයේ හා තත්වයන්ගේ ප්‍රතිඵලයක්ය යන අනුමානය දහ අටවැනි සියවසේ විසූ ප්‍රංශ උගත්තු හා ද්‍රව්‍යවාදීහු ප්‍රකාශ කළහ. එහෙත් සමාජ පරිසරය

මිනිසාගේ චින්තනයේ කිසියම් සංශෝධනයක් ලෙස ඔවුහු කල්පනා කළහ. මේ හේතුව නිසා මාක්ස්ට පෙර සමාජමය මත එකම චක්‍රයක් — මිනිහා, ඔහුගේ චින්තනය හා හැඟීම්, පරිසරයේ නිෂ්පාදනයකි. පරිසරය, මිනිසුන්ගේ හැඟීම් හා චින්තකයන්ගේ ඵලයකි — බඳුවිය. මේ මතයේ ප්‍රතිඵලයක් වශයෙන් වියුක්ත මිනිහා පිළිබඳවද, කාලයෙන් හා අවකාශයෙන් පරිබාහිරවූ ''පොදුවේ මිනිහා'' පිළිබඳවද, ජීව විද්‍යාත්මක හරයවූ මිනිසා වෙනත් මිනිසුන් සමග සම්බන්ධ වී සිටින්නේ, ප්‍රකෘතික සහ ජීව විද්‍යාත්මක වශයෙන් පමණක් බවද යන මතය හෙවත් ඇදහීම පැන නැගිණි.

මාක්ස් මේ මතයට විරුද්ධව, මිනිහාගේ හරය සමාජමය ස්වරූපයක් දරන බව පෙන්වා දුන්නේය. මිනිසාගේ ඇතිවීම සඳහා ප්‍රකෘතිය විසින් ජීව විද්‍යාත්මක ද්‍රව්‍ය සපයා ඇති බව සත්‍යයකි. එහෙත් මේ ද්‍රව්‍ය මිනිසා දක්වාත්, මිනිස් ඉන්ද්‍රිය දක්වාත්, පරිවර්තනය වූයේ, සමාජමය සාධකවල, හැමටම පළමුව ශ්‍රමය වැය කරන, නිෂ්පාදන ක්‍රියාකාරිත්-වයේ ප්‍රතිඵලයක් වශයෙනි. යට කී පරිදි, ශ්‍රමය විසින් මිනිසා බිහි කරන ලදී. මිනිස් සිරුරේ සංවිධානයේ ප්‍රතිඵලය ශ්‍රමය විය. මිනිසා, මිනිසකු වන්නේ ඔහු ඉන්ද්‍රියයන්, පටක, ශෛල, ආදියෙන් සමන්විත නිසා හෝ පෙනහළුවලින් ආශ්වාස කරන නිසා හෝ සිය දූ දරුවන්ට කිරි පොවන නිසා හෝ නොවේ, ඔහුට වැඩකිරීමට, කල්පනා කිරීමට සහ කතාකිරීමට, ශක්තියක් ඇති නිසාත්, අවට ලෝකය හා ප්‍රකෘතිය වෙනස් කරන ශ්‍රම උපකරන සෑදීමට ඔහුට ශක්තියක් ඇති නිසාත්, වෙනත් මිනිසුන් සමග සමාජමය සම්බන්ධකම් ඇති කර ගැනීමට ඔහුට ශක්තියක් ඇති නිසාත්, ඔහු මිනිසෙක් වන්නේය.

ඔහු සිය උපතේ සිට මරණය දක්වා පෞද්ගලිකව සංවර්ධනය වෙමින්, වඩාත් මානුෂික වීමකට හෙවත් සමාජමය වීමකට, ප්‍රත්‍යක්ෂීකරණයකට මුහුණ පායි, එනම් වඩාත් මිනිස් ගතිගුණ ලබාගැනීමකට අසංඛෙය පරම්පරා ගණනක් තිස්සේ මිනිසුන් විසින් සිය ශ්‍රමය සහ සටන් මගින් බිහි කරන ලද සමාජමය වටපිටාව මෙල්ල කිරීමේ කර්තව්‍යයට මුහුණ පාමින් සිටී. මිනිහකුට තනිවම අන් අයගෙන් කොන්වී, මෙලොව වැඩ කිරීමටත්, එහි ජයග්‍රහණ උකහා ගැනීමටත් අත් දැකීම් සිය ප්‍රයෝජනය සඳහා යොදවා ගැනීමටත් බැරිය. වෙනත් මිනිසුන් සමග ඇති කරගන්නා සම්බන්ධකම් හා සමාජමය සම්බන්ධකම් නිසා මිනිහා සමාජයීය වන්නේය. මිනිහා එම පද්ධතියේ සදාකාලික පුරුකකි.

මිනිහා පිළිබඳ වියුක්ත නිගමනයකට මාක්ස් හා එංගල්ස් විරුද්ධ වූහ. මිනිහා හැමදම සංයුක්ත (මූර්ත) පුද්ගලයෙකි, ඔහු නියමිත

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

සමාජ-ආර්ථික සැකැස්මකට, පංතියකට, ජාතියකට, ශ්‍රම කණ්ඩායමකට ආදියට අයත්ය.

පෞද්ගලිකත්වය

සංයුක්ත මිනිසා — පෞද්ගලිකත්වය — සියලු මිනිසුන් සතු ගුණයන් (වැඩකිරීමට හා කල්පනා කිරීමට ඇති හැකියාව, අනිකුත් මිනිසුන් සමග භාෂාව මගින් සම්බන්ධකම් ඇතිකර ගැනීම) හා තමා අයත් සමූහය (ජාතිය, පංතිය, පක්ෂය, ශ්‍රම සමූහය) සතු ගුණයන්ගෙන්ද යුක්තවීම. මේ හැර සංයුක්ත මිනිහා, ඔහුට පමණක් ආවේණික පෞද්ගලික ගති ගුණවලින්ද සමන්විතය. මේවාත් යට කියන ලද වෙනත් ගති ගුණත් එකට ගොනු කොට ගත් විට, එය ඔහුගේ පෞද්ගලිකත්වය යනුවෙන් හැඳින්වේ. ඔහුගේ පෞද්ගලික ගුණයන් හා දක්ෂකම් විවිධාකාරයෙන් — අධ්‍යාපනය, නිපුණත්වය, සංස්කෘතික මට්ටම, පවුලේ තත්වය ආදිය — හෙළිවේ.

සමාජ සම්බන්ධකම්වල බලපෑම යටතේ ජීවිතයේ විවිධත්වයද, පෞද්ගලික ගුණයන්ද ප්‍රකාශ වේ. සංයුක්ත සමාජ නිෂ්පාදනය හා ආර්ථික සම්බන්ධකම් අනුව, වහලා සහ වහල් හිමියාද, ප්‍රවේණිදසයා හා ඉඩම් හිමියාද, කම්කරුවා හා ධනපතියාද ආදී පෞද්ගලික සමාජමය වර්ග බිහිවිය.

සමාජයට ආවේණික සමාජමය සම්බන්ධකම් — පංතිමය, ජාති හා වෙනත් — ඒවායේ ධාරකයින්ගේ මාර්ගයෙන් (පංති, ජාති ආදිය) පෞද්ගලිකත්වයේ ජාතික හා පංතිමය ගුණයන් බිහිකරවයි. පුද්ගලයකුගේ සමාජමය ජීවිතය ඒවායේ හරය මගින් ප්‍රකාශ වේ. නිදසුනක් වශයෙන් කම්කරු පංතියට ආවේණික ගුණයන් — සංවිධානාත්මක භාවය, විනය ගරුක බව, පෞද්ගලික අයිතිය නොපිළිගැනීම විප්ලවවාදී භාවය ආදිය — ප්‍රකාශ වේ.

සමාජයේ ආධිපත්‍යය දරන ආර්ථික හා සමාජමය සම්බන්ධකම්ද, ඒවාට ආවේණික අධ්‍යාත්මික සංස්කෘතියද විශේෂයෙන් ආධිපත්‍යයට අයත් චින්තනයද විසින් බුද්ධිමත් ජීවිතයේ පෞද්ගලිකත්වය — අදහස් හා හැඟීම්, චරිතය, වුවමනාවන් හා අරමුණ — ගොඩනගා ප්‍රකාශ කරයි.

පෞද්ගලිකත්වයේ ගුණයන්ගේ ඒකීයතාවය එනම්, එහි ජීවමය ප්‍රකාශයේ විවිධත්වය — ආර්ථික, සමාජමය, අධ්‍යාත්මික භාවය, සමාජමය සම්බන්ධකම්වල විවිධත්වයේ සමස්ත ප්‍රකාශනයක් වන්නේය. ඒ අනුව බලන විට, පෞද්ගලිකත්වය සමාජමය සම්බන්ධකම්වල සමස්තයක්, හරයක් වන්නේය. ''...මිනිසාගේ හරය එක් පුද්ගලයකුට ආවේණික වියුක්තයක් නොවේ. වාස්තවික

වශයෙන් එය සියලු සමාජමය සම්බන්ධකම්වල සමස්තය වන්නේය''* යි කාල් මාක්ස් ලියුවේය.

අප දුටු පරිදි සංයුක්ත මිනිසා, ඔහු ජීවත්වන හා වර්ධනය වන සමාජයේ හා සාමාජයීය මාධ්‍යයේ ඵලයකි. එවිට එක් ප්‍රශ්නයක් පැන නගී. ඒකාකාර සමාජ තත්වයන් යටතේ විවිධාකාර පෞද්ගලිකත්වයන් හා ප්‍රත්‍යෙකීකරණයන් ඇති වන්නේ කවර හේතුවක් නිසාද, එක් හෝ තවත් පෞද්ගලිකත්වයක් කිසියම් සමාජයක සියලු අංග ලක්ෂණ ප්‍රකාශ නොකරන්නේ මන්ද, ප්‍රකාශ කළත්, හැම විටම එකම මට්ටමකින් එය නොසිදුවන්නේ කවර හේතුවක් නිසාද?

හැම සමාජයකම සමජාතිත්වයක්, එක හා සමාන බවක් නොමැත. හැම සමාජයකම මියයන පැරණි, දැනට පවතින, වර්තමාන, එමෙන්ම අනාගත සමාජ සම්බන්ධකම්වල කලලරූපත් ඇත්තේය. ඒ අනුව සමාජවාදී සමාජය තුළ ධනපති ශ්‍රම විභජනයේ, මිනිසුන්ගේ විඥනයේ හා හැසිරීමේ පැරණි නටබුන් හා ඉතිරිවූ කොටස්ද ශේෂව පවතී. හැම අතින්ම එක හා සමාන නොවන සමාජය සිය විවිධ පැතිවලින් මිනිසා මත බලපායි. පෞද්ගලිකත්වය හැඩ ගැස්වීමේදී තීරණාත්මක ක්‍රියා කලාපය සමාජයේ අධිපති බව දරන සම්බන්ධකම් වලට අයත් නමුදු නියමිත සමාජයේ ඉල්ලීම් සමග අනුකූල නොවන ගුණයන් බිහිකරන පැරණි සම්බන්ධකම්වල නටබුන් ඔහු මත බල පෑ හැකිය.

කිසියම් පුද්ගලයෙක් ජීවත්වන හා වර්ධනය වන සමාජය වෙනත් සමාජ ආර්ථික සහ අධ්‍යාත්මික ගුණයන් සහිත සමාජවල බලපෑම් වලින් වෙන්වී නොමැත. සමකාලීන යුගයේ සමාජවාදයත්, ධනවාදයත් එකම ලෝකයක පවතී. ප්‍රවෘත්ති මාධ්‍යයන්, ප්‍රවාහනය, පණිවුඩ සම්බන්ධකම් උසස් ලෙස වර්ධනය වී ඇති ලෝකයක සමාජවාදයට විරුද්ධ ධනපති අදහස්, සමාජවාදී සමාජයට රිංගන බව රහසක් නොවේ. සමාජයේ ඉල්ලීම්වලට පටහැනි කාර්යයන් හා මතවලින් යුත් පුද්ගලයින් සිටීමට මෙයද තවත් එක් හේතුවකි.

එකම සමාජයක විවිධාකාර පුද්ගලයින් ජීවත්වීමේ වැදගත් හේතුවක් නම්, එක්, එක් පුද්ගලයෙක් එකම සමාජයක, පොදු සාමාජයීය මාධ්‍යයන් (සමාජය සමස්තයක්) යටතේ ජීවත් වෙමින් වර්ධනය වනවා පමණක් නොව, ඔවුන් ''අන්වීක්ෂ මාධ්‍යයේ'' එනම්

* කාල් මාක්ස් සහ ෆ්‍රෙඩ්රික් එංගල්ස්. කෘති එකතුව, වෙළුම 3, පිටුව 3.

https://liberationbase.wordpress.com

තමන්ට පමණක් කෙළින්ම බලපාන පරිසරයක ජීවත් වීමය. මෙයට තම පවුල, පාසැල, වැඩපොළේ සමූහය ආදිය අයත්ය. මේ අන්වීක්ෂ මාධ්‍යය තුළින්, සමාජමය මාධ්‍යයේ ආර්ථික හා සමාජමය සම්බන්ධකම්ද, අධ්‍යාත්මික සංස්කෘතියද ප්‍රිස්මයක් තුළින් විහිදෙන ආලෝකයක් සේ බලපායි. ''අන්වීක්ෂ මාධ්‍යය'' බිහි කරන අසංඛ්‍ය විවිධ සංයුක්ත තත්වයන් නිසා පොදු සමාජයක එකම දෘෂ්ටි කෝණයක් පිළිබඳවද ඉමක් නැති විචල්‍යතාවයක් සහ අනුක්‍රමයන්ද දැකීමට පිළිවන. මේවා විස්තර කළ හැක්කේ එම තත්වයන් පිළිබඳව අංග සම්පූර්ණ අධ්‍යයනයක් කිරීමෙනි.

එකම සමාජයක බොහෝ මත දරන පුද්ගලයින් ඇතිවිය හැකි තවත් හේතුවක් නම්, පෞද්ගලිකත්වය ක්‍රියාශීලී වීමය. පෞද්ගලික ක්‍රියාකාරිත්වයේ ප්‍රමාණය රඳා පවතින්නේ, එය ක්‍රියාකාරී වන සමස්තයක් වන සමාජය සහ ''අන්වීක්ෂ මාධ්‍යයන්'', එමෙන්ම, එම ක්‍රියාකාරිත්වයට අයත් පෞද්ගලික ගුණයන්, අත්දැකීම්, සංස්කෘතික සංවර්ධනයේ මට්ටම, ව්‍යාවච්ඡේද — කායවිද්‍යාත්මක සහ මනෝවිද්‍යාත්මක (අධිෂ්ඨාන ශක්තිය, ස්වභාවය ආදිය) විශේෂතා ගුණයන් මතය.

සමාජමය මාධ්‍යයන් විසින් නිපදවනු ලබන පෞද්ගලිකත්වය සමාජය තුළ දිය නොවේ. එය සමාජමය යන්ත්‍රණයේ 'සුවච කීකරු' ඉස්කුරුප්පු ඇණයක් නොවේ. සමාජමය තත්වයන් විසින් පෞද්ගලිකත්වය බිහිකරන්නේ කිනම් ප්‍රමාණයකටද, එය විසින් එතරම් ප්‍රමාණයකට සමාජය හැඩ ගස්වයි. තත්වය වෙනස් කරන්නේ මිනිසුන් විසින්ම බව අමතක නොකළ යුතු යැයි මාක්ස් ලියුවේය.

මිනිසුන් තත්වය වෙනස් කරන්නේ කොහොමද? වෙනත් වචන වලින් කියතොත්, ඉතිහාසයේ පෞද්ගලිකත්වය ඉටු කරන ක්‍රියා කලාපය කවරේද යන්න ගැන දැන් අපි සොයා බලමු.

3. පුද්ගලයා ඉතිහාසය විෂයෙහි ඉටුකරන කාර්ය කොටස

ඓතිහාසික අවශ්‍යතාවය පිළිගන්නා නිසා මාක්ස්වාදීන්, ඉතිහාසයේ ශ්‍රේෂ්ඨ පුරුෂයින්ගේ සහ නායකයින්ගේ කාර්ය කොටස නොපිළිගනිතියි යන චෝදනාව ඉදිරිපත් කිරීම ධනපති දෘෂ්ටිවාදීන්ගේ සිරිතකි. මේ චෝදනා පදනම් විරහිතය. මාක්ස්වාදය කිසිසේත් තනි පුද්ගලයා අඩුවෙන් තක්සේරු නොකරයි. කිසියම් පුද්ගලයෙකුට සිය පෞද්ගලික මනාපය අනුව, ඉතිහාසයේ වාස්තවික ගමන් මග

වෙනස් කිරීමට බැරි බව මාක්ස්වාදීන් පිළිගන්නා නමුදු සමාජ සංවර්ධනයේදී තනි පුද්ගලයා ඉටු කරන්නේ සෙසු නොවන කාර්ය කොටසක් බවද පිළිගනී. ''... ඓතිහාසික අවශ්‍යතාවය පිළබඳ අදහසෙන් ඉතිහාසයේ පුද්ගලයින් ඉටුකරන කාර්ය කොටස කිසිසේත් යටපත් නොවේ. නිසැක ලෙසම ක්‍රියාශීලී නායකයින් වූ පුද්ගලයන්ගේ වැඩ කටයුතුවලින් ඉතිහාසය පිරීපවතී''* යයි වී. අයි. ලෙනින් ලිවේය. සමාජ සංවර්ධනයේදී පුද්ගලයාගේ යථාර්ථවාදී වැදගත්කම ගැන පමණක් නොව, පුද්ගලයාට ඉතිහාසයේ වැදගත් කොටසක් ඉටුකළ හැකි වන්නේ කුමණ තත්වයන් යටතේද, යන්න ගැනද මාක්ස්වාදය පෙන්වා දී ඇත.

පෞද්ගලිකත්වය ඉතිහාසයට සේවය කරන්නේ සිය ශ්‍රමය, දේශපාලනමය ක්‍රියාකාරිත්වය, සිය විචාර බුද්ධිය හා අධිෂ්ඨාන ශක්තිය මගිනි. සමාජමය ප්‍රගතිය වැඩිවන තරමට, ඉතිහාසය මත පුද්ගලයින්ගේ බලපෑමද වැඩිවන්නේය. ඉතිහාසය වර්ධනය වීමත් සමගම, ඓතිහාසික කාර්යභාරයේ ගැඹුරුවීම සහ පුළුල් වීමත්, විද්‍යාව, තාක්ෂණිකය හා සංස්කෘතිය දියුණුවීමත් ඓතිහාසික සිද්ධීන්වලට සම්බන්ධවන මිනිසුන්ගේ කවයද පුළුල්වීමත් වන්නේය. ඓතිහාසික ක්‍රියාවලියේ හැම පුද්ගලයකුගේම ක්‍රියාකාරිත්වයේ කොටස විශාල වන්නේය. ද්‍රව්‍යමය හා අධ්‍යාත්මික සංස්කෘතිය පොහොසත් කරවීම සඳහා ඔවුන්ගේ සේවය වැඩිවන්නේය. සමාජ ජීවිතයේ විවිධ ක්ෂේත්‍රවල ක්‍රියාකාරිත්වය සහ නිදහස් ශ්‍රමය සඳහා සතුටුදයක තත්වයන් බිහිකරන සමාජවාදය යටතේ පුද්ගලයින්ගේ නිර්මාණාත්මක ක්‍රියාකාරිත්වය විශේෂයෙන් විශාල වන්නේය.

ඉතිහාසයේ නායකයින්ගේ කාර්ය කොටස

අප විසින් පැහැදිලි කරගත් පරිදි ඉතිහාසය නිර්මාණය කරන්නේ පොදු ජනතාවය. මොවුහු පංතිවලට බෙදී සිටිති. එම පංති, පංති සටන්වලදී තමන්ගේම දේශපාලන පක්ෂ සාද ගනිති. දේශපාලන පක්ෂ සිය සාමාජිකයින් අතුරෙන් ඉතාම වැඩි පළපුරුද්දක් ලැබූ, පුහුණුවූ හා ක්‍රියාශීලී අය නායකයින් හැටියට පත් කරති. ජනතාව සංවිධානය කිරීමද, සටන් සඳහා ඔවුන් ප්‍රබෝධමත් කරවීමද, ඔවුන්ගේ කාර්යභාරයන් හඳුන්වාදීමද, ඒවා ඉටුකිරීම සඳහා ඔවුන් ඒකරාශී කරවීමද, ඉතිහාසයේ නායකයින් සතු කාර්ය කොටස වන්නේය.

* වී. අයි. ලෙනින්. සම්පූර්ණ කෘතීන්, වෙළුම 1, පිටුව 159.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ඉතිහාසයේ පොදු ජනතාව කොතරම් ක්‍රියාශීලී වන්නේද, සමාජ ජීවිතයේ නිර්මාණකයින්ගේ කවය කොතරම් පුළුල් වන්නේද, එතරම් දුරට පළපුරුදු ඇති මුහුකුරා වැඩුනු නායකයින්ගේ අවශ්‍යතාවයද වැඩි වන්නේය. නායකයින් නැතිව පුරෝගාමී පංතියට, දේශපාලන ආධිපත්‍යය ලබාගැනීමට හෝ සිය පාලනය පවත්වා ගැනීමට හා තහවුර කරගැනීමට හෝ, එසේත් නැතහොත් තම රජය ගොඩනගා දේශපාලන සතුරන්ට විරුද්ධව සාර්ථක ලෙස සටන් කිරීමට හෝ නොපුළුවන. "ව්‍යාපාරය සංවිධානය කොට, එයට නායකත්වය දිය හැකි දේශපාලන නායකයින්, ප්‍රමුඛ නියෝජිතයින් ඉදිරිපත් නොකර ඉතිහාසයේ කිසිම පංතියක් බලය ලබාගැනීමෙහි සමත් වූයේ නැතැ"* යි වි. අයි. ලෙනින් ලියුවේය.

නිර්ධන පංතික විප්ලවවාදී ව්‍යාපාරයේදී නායකයින්ගේ හා දෘෂ්ටිවාදීන්ගේ කාර්ය කොටස අති විශාලය. නිර්ධන පංතියට සංවිධානයකුත්, අයෝමය විනයකුත් තිබීම එය ඉදිරියේ ඇති අරමුණු සපුරාලීම සඳහා ඉතාම වැදගත් මාධ්‍යයන් වන්නේය. පළපුරුදු ඇති හා සටනෙහිදී පන්නරය ලැබූ නායකයින්ගෙන් තොරවූ සංවිධානයක් ගැන සිතාගැනීමට පවා බැරිය. උසස් අධිකාරයක් ඇති, නිර්භය සංවිධායකයින්ගෙන් හා බුද්ධිමත් දෘෂ්ටිවාදීන්ගෙන් තොරව, සූරාකන්නන්ට විරුද්ධව ගෙනයන සටනේදී නිවැරදි මාර්ග හා මාධ්‍යයන් සොයා ගැනීම කම්කරු පංති ව්‍යාපාරයට කළ නොහැක්කක් වන්නට තිබුණි.

විශිෂ්ට පුද්ගලයින් ඇතිවන්නේ මන්ද? ඔවුන්ට ශක්තිය ලැබෙන්නේ කෙසේද?

ශ්‍රේෂ්ඨ පුද්ගලයින් ඇතිවන්නේ අහම්බෙන් නොවේ, ඓතිහාසික අවශ්‍යතාවය අනුවය. එයට අවශ්‍ය වාස්තවික තත්වයන් මුහුකුරා වැඩුනු විටය. සමාජය මූලික වශයෙන් වෙනස් කරන විප්ලවවාදී පරිවර්තනවලදීත්, විශාල දේශපාලන සටන්වලදීත්, ජනතා නැගිටීම්වලදීත් විශිෂ්ට දේශපාලන නායකයෝ පොදු ජන නායකයෝ පෙරට එති. නිෂ්පාදනයට කිසියම් ශ්‍රේෂ්ඨ විද්‍යාත්මක සොයාගැනීමක් අවශ්‍යවූ බොහෝ අවස්ථාවල විද්‍යාවේ මහා ප්‍රාඥයෝ බිහිවෙති. රීතියක් වශයෙන්, සම්භාවනීය කලාකරුවෝ ඉතිහාසයේ ඉතාම වැදගත් පරිවර්තන අවධිවලදී ඔවුන්ගේ දක්ෂකම් පෙන්වති. එපමණක් නොව, කිසියම් දක්ෂ පුද්ගලයෙක් ඉතිහාසයට ඇතුළු වන්නේ, සමාජයේ අදාල සංවර්ධන අවධියේදී ඔහුගේ හැකියාවන්, චරිතය සහ බුද්ධියත් ඊට අවශ්‍ය වූවොත් පමණකි.

* වි. අයි. ලෙනින්. සම්පූර්ණ කෘතීන්, වෙළුම 4, පිටුව 375.

ඉතිහාස පොත්වල බොහෝ නම් සඳහන් වේ. එහෙත් ඒ හැම නමක්ම සැබෑ ශ්‍රේෂ්ඨයන්ගේ ගණයට අයත් නොවේ. ඓතිහාසික අවශ්‍යතාවයන්ට බාධා කළ, ඉතිහාසය ආපසු කැරකැවීමට දඟලූ මිනිස්සුද සිටියහ. ප්‍රතිගාමී පංතිවල අයිතිවාසිකම් ප්‍රකාශ කළ ඔවුහු, තමන් මෙහෙයැවූ ප්‍රතිගාමී ව්‍යාපාරත් සමගම විනාශ මුඛයට ඇද වැටුණාහ.

තමන්ගේ මුළු ජීවිත කාලයත්, සම්පූර්ණ ශක්තියත්, සමාජයේ ඉදිරි ගමනට කැප කරන්නාවූද, සියලු ධෛර්ය යොද සමාජයේ අලුත් දේ සඳහා සටන් කරන්නාවූද, ප්‍රගතිශීලී සමාජ ක්‍රම ඇති කිරීම සඳහා පුරෝගාමී පංතිවලට වෙහෙස නොබලා ආධාර දෙන්නාවූද අය පමණක් සැබෑ ශ්‍රේෂ්ඨයෝ වෙති.

මෙතරම් ශ්‍රේෂ්ඨ හා දුෂ්කර කාර්ය භාරයන් සපුරාලීමට විශිෂ්ට පුද්ගලයෙක් සමත් වන්නේ කවර හේතුවක් නිසාද? ඔවුන්ට ශක්තිය ලැබෙන්නේ කොහෙන්ද?

විශිෂ්ට පුද්ගලයකුගේ ශක්තිය ප්‍රධාන වශයෙන්ම රැඳී ඇත්තේ ඔහු නියෝජනය කරන හා මෙහෙයවන ප්‍රගතිශීලී සමාජ ව්‍යාපාරයේ ශක්තිය මතය. ශ්‍රේෂ්ඨ පුද්ගලයාගේ ශ්‍රේෂ්ඨත්වය ඇත්තේ ඉතිහාසයේ වාස්තවික ක්‍රියාදමය ඔහු අවබෝධ කරගත් බැවිනි. සමාජ සංවර්ධනයේ අවශ්‍යතාවය දකින ඔහු එම අවශ්‍යතාවයන් සපුරාලීමටද සමාජ ජීවිතය යහපත් කරලීමටද ක්‍රමය දන්නා බැවිනි. විශේෂයෙන් පුරෝගාමී පංතිවල වුවමනාවන් ඉටුකිරීම සඳහා සේවය කරන නිසා ඔහුට ඔවුන්ගේ සීමාරහිත විශ්වාසය හා ආධාරය ලැබෙන බැවින් එය ඔහුගේ ශක්තිය වන්නේය.

මෙහිදී ශ්‍රේෂ්ඨ මිනිසකුගේ පෞද්ගලික ගතිගුණද විශාල වැදගත්කමක් දරන බව අමතක නොකළ යුතුය. දුර්ලභ හැකියාවකින් හා උසස් පෞද්ගලික ගති ගුණවලින් යුත්, විශාල බුද්ධියකින්ද, නොසිඳෙන ධෛර්යයකින්, අධිෂ්ඨානයකින් හා නිර්භීතකමකින්ද හෙබි පුද්ගලයෙකුට පමණක් ඉතිහාසය විසින් තමා වෙත පවරා ඇති කටයුතු සපුරාලීමට හැකිවේ. ශ්‍රේෂ්ඨ පුරුෂයෙකුගේ පෞද්ගලික ගතිගුණ සමාජමය අවශ්‍යතාවයන්ට හොඳින් ගැලපෙන තරමට ඉතිහාසයේ ඔහු ඉටු කරන කාර්ය කොටසද එතරම්ම උත්තම හා වැදගත් වන්නේය.

මහා පුරුෂයන් වූ කාල් මාක්ස්, ප්‍රෙඩරික් එංගල්ස් සහ වි. අයි. ලෙනින්, ඉතිහාසයේ ගැඹුරුතම සළකුණු තැබූහ. ඔවුහු ලෝකයේ සියලු රටවල නිර්ධන පංතියේ සහ වැඩකරන ජනතාවගේ නායකයෝ වෙති. ඔවුහු අලුත් පන්නයක නායකයෝය. සියලු ජනතා ව්‍යාපාර

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

අතුරෙන් ශ්‍රෙෂ්ඨතම ව්‍යාපාරය වන නිර්ධන පංතික විප්ලවවාදී ව්‍යාපාරයේ විශිෂ්ඨ න්‍යායාචාර්යවරු සහ සංවිධායකයෝය. අධිෂ්ඨානය සහ නිර්භීතකමද, කොමියුනිස්ට්වාදය නිවැරදිය යන ගැඹුරු විශ්වාසයෙන් උපන් ස්ථිරතාවයද, ජනතාවට ඇති ආදරයද, ජනතා හතුරන්ට දක්වූ අසීමිත වෛරයද ඔවුන් තුළ විය. ඔවුහු පොදු ජනතාව සමග ඉතා කිට්ටුවෙන් වෙළී සිටි අතර ජනතාවට උගන්වමින් හා ජනතාවගෙන්ද උගෙන ගනිමින් ජනතාවගේ විප්ලවවාදී පොහොසත් අත්දැකීම් සාධාරණ කරණය කළහ.

ඔවුන් විසින් පටන් ගන්නා ලද ඒ මහඟු කාර්යය මැනවින් ඉටුකරන ඔවුන්ගේ සිසුන් හා අනුගාමිකයින් වන, සෝවියට් සංගමයේ කොමියුනිස්ට් පක්ෂයේ සහ අනික් සහෝදර කොමියුනිස්ට් හා කම්කරු පක්ෂවල නායකයින්, අපගේ යුගයේ ඉතාමත් ප්‍රබල ව්‍යාපාරය වන කොමියුනිස්ට් ක්‍රමය කරා යොමුවූ ජනතා ව්‍යාපාරය මෙහෙයවති.

ඉතිහාසයේ විශිෂ්ඨ පුද්ගලයින්ගේ විශාල කාර්ය කොටස පිළිගන්නා මාක්ස්-ලෙනින්වාදය පුද්ගලාභිවාදනයද, සිතන පරිදි ඉතිහාසය නිර්මාණය කිරීමට අධි–මානුෂික බලයක් ඇත්තෙකැයි කියන ශ්‍රෙෂ්ඨ නායකයින් ඉදිරියේ කරන අන්ධ නමස්කාරයද සමග කොහෙත්ම නොගැලපෙයි. පුද්ගලාභිවාදනය සමාජවාදී දර්ශනයට ප්‍රතිවිරුද්ධ වන අතර කොමියුනිස්ට්වාදී ව්‍යාපාරයට බරපතළ හානි සිදු කරයි. මාක්ස් එංගල්ස් හා ලෙනින් නිතරම පුද්ගලාභිවාදනයට විරුද්ධ වූහ. ඔවුහු තනි නායකයින්ගේ ක්‍රියා කලාපය අතිශයෝක්තියෙන් වර්ණනා කිරීමට විරුද්ධවද, ඔවුන්ට තුති හා ගුණ ගී ගැයීමට විරුද්ධවද කථා කළහ. විප්ලවවාදී ව්‍යාපාරයේ ජය සහතික වන්නේ සාමූහික නායකත්වයෙන් පමණක් බව, මාක්ස්–ලෙනින්වාදයේ නිර්මාතෘවරයෝ පෙන්වා දුන්හ.

ඉතිහාසයේ නිර්මාපකයා වශයෙන් ජනතාව ඉටුකරන කාර්ය කොටසත් කොමියුනිස්ට් පක්ෂය හා එහි මධ්‍යම සංවිධාන බහු ජනතාවගේ සාමූහික නායකයා ලෙස ඉටුකරන ක්‍රියා කලාපයත් අඩුවෙන් තකන්නකි පුද්ගලාභිවාදනය. එනිසා එය හානිදයකය. පක්ෂයේ දෘෂ්ටිමය ජීවිතයට සහ වැඩකරන ජනතාවගේ නිර්මාණශීලී උනන්දුවට බැම් දමූ කලෙක මෙන් හානි කරන එය ඉහළ සිට අණ ලැබෙන තුරු නිෂ්ක්‍රීය ලෙස බලා සිටීමේ පුරුද්ද ඔවුන් තුළ ඇති කරවයි. පුද්ගලාභිවාදනයද ඒ අනුව යමින් සාමූහික නායකත්වය, පක්ෂය තුළ ප්‍රජාතන්ත්‍රවාදය හා සමාජවාදී නීතිය පිළිබඳ ප්‍රතිපත්තිය උල්ලංඝණය කිරීමද සමාජවාදයේ ප්‍රජාතන්ත්‍රවාදී ස්වභාවයට සම්පූර්ණයෙන්ම පටහැනි වන්නේය. සමාජවාදයේ ස්වභාව ලක්ෂණය වන්නේ තනි

පුද්ගලයෙකුගේ සර්වබලධාරි භාවය නොව, ජනතාවගේ ස්වෛරි භාවයයි. සෝවියට් සංගමයේ කොමියුනිස්ට් පක්ෂය පුද්ගලාභිවාදනයට විරුද්ධව නැගී සිටියේත්, එහි විපාකයන් තීරණාත්මක ලෙස මුලින් උපුටා දැම්මේත් එබැවිනි.

පුද්ගලාභිවාදනය හෙළා දකින මාක්ස්–ලෙනින්වාදය එය නායකයින්ගේ අධිකාරය සමග පටලවා ගැනීම වැරදි හා හානිකර බවද පෙන්වා දෙයි. "... පූර්ණ විමුක්තිය සඳහා ලෝකය පුරාම අසීරු හා දැඩි සටනක් කරන කම්කරු පංතියට අධිකාර බලැතියන් අවශ්‍ය වේ"* යයි ලෙනින් ලීවේය. පක්ෂයට හා ජනතාවට කැපවී සිටින, සිය සම්පූර්ණ බුද්ධියත්, නිර්මාණ ශක්තියත් සිය විශාල පළපුරුද්දත්, කොමියුනිස්ට්වාදයේ ජයග්‍රහණය සඳහා වූ ශ්‍රෙෂ්ඨ කාරියට පුද කරන නායකයින්ගේ අධිකාරය ආරක්ෂා කළ යුතු යැයි මාක්ස්-ලෙනින්වාදය බලාපොරොත්තු වේ.

තනි පුද්ගලයෙක් කෙතරම් ශ්‍රෙෂ්ඨ අයෙක් වුවද, ඉතිහාසයේ ඉදිරි ගමන නියම කිරීමට ඔහුට බැරි බව, ඓතිහාසික සංවර්ධනයේ ක්‍රියාවලිය විසින් පැහැදිලි ලෙස පෙන්වා දී ඇත. ඉතිහාසයේ නිර්මාපකයා වන්නේ මිනිස්වර්ගයාගේ සියලු ද්‍රව්‍යමය හා අධ්‍යාත්මික සම්පත් නිර්මාණය කරන ජනතාවය.

---

* වි. අයි. ලෙනින්. සම්පූර්ණ කෘතීන්, වෙළුම 14, පිටුව 226.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

IV

පංති සහ පංති සටන

වැඩකරන ජනතාව සමාජ සංවර්ධනයේ ප්‍රධාන හා තීරණාත්මක බලවේගය බව ඉහත පරිච්ඡේදය මගින් පෙන්වා දෙන ලදී. සමාජය සමජාතීය නොවේ. එය නියමිත ජාතීන්ගෙන්, සමාජමය කණ්ඩායම් වලින් සමාජමය කොටස්වලින් සෑදී ඇත.

පංති යනු මොනවාද? සමාජ සංවර්ධනයේදී ඒවා ඉටුකරන කාර්ය කොටස කුමක්ද? පංති හා පංති සටන් පිළිබඳ මාක්ස්–ලෙනින්වාදී න්‍යායය එම ප්‍රශ්නයට පිළිතුරු සපයයි.

LIBERATIONBASE

1. පංතිවල සම්භවය සහ හරය

ජනතාව පංතිවලට බෙදී සිටින බවද, සමාජයේ පංති සටන පවතින බවද, මාක්ස්වාදය ඇතිවීමට පෙර සිටම වියත්හු දැන සිටියහ. සමාජ ජීවිතය අවබෝධ කරගැනීමේදී, විඥානවාදී මත දැරූ ඔවුන්ට සමාජය පංතිවලට බෙදීමේ වාස්තවික පදනම සොයාගැනීමට බැරිවිය. සමාජය පංතිවලට බෙදී තිබීමේ හේතු සෙවිය යුත්තේ මිනිස් සම්බන්ධකම්වල ප්‍රධාන ක්ෂේත්‍රය වන ද්‍රව්‍යමය නිෂ්පාදන ක්ෂේත්‍රය තුළ බව ඔවුහු නොදැන සිටියහ.

වි. අයි. ලෙනින් ''මහා ආරම්භයක්'' නැමැති කෘතියෙහි, පංති පිළිබඳ අංග සම්පූර්ණ විග්‍රහයක් ඉදිරිපත් කෙළේය. ඒ මෙසේය. ''ඉතිහාසය විසින් නිශ්චය කරන ලද සමාජ නිෂ්පාදන ක්‍රමය දරන ස්ථානය අනුවද, නිෂ්පාදන මාධ්‍යයන් කෙරෙහි (වැඩි වශයෙන් නීත්‍යානුකූලව නීතිගත කොට තහවුරු කරන ලද පරිදි) සම්බන්ධවී ඇති ආකාරය අනුවද, සමාජමය ශ්‍රම සංවිධානයේදී ඉටුකරන කාර්ය කොටස අනුවද, ඒ අනුව තමන්ගේ ප්‍රයෝජනය සඳහා සමාජමය ධන සම්පත් ලබාගැනීමේ ප්‍රමාණය හා ක්‍රම අනුවද එකකින් අනික වෙන

වෙනස්වන විශාල ජන කණ්ඩායම් පංති නමින් හැඳින්වේ. නිශ්චිත සමාජ ආර්ථික ක්‍රමයක් තුළ දරනු ලබන වෙනස් තත්වයන් නිසා එක කණ්ඩායමක ශ්‍රමය තවත් කණ්ඩායමකට අයත් කරගත හැකිවන ජන කණ්ඩායම් පංති වෙති.''*

පංතියක් සමාජමය නිෂ්පාදනය තුළ දරන තැන හා ඉටුකරන කාර්ය කොටස නිශ්චය කරන ප්‍රධාන අංග ලක්ෂණය නම් එම පංතිය නිෂ්පාදන මාධ්‍යයන් සමග සම්බන්ධ වී ඇති ආකාරයත් එය ආදයම් ලබාගන්නා ක්‍රමය හා එම ආදයමේ ප්‍රමාණයත් වේ.

පංති සදාකාලිකව පැවතියේ නොවේ. ආදිකල්පික සමාජයේ පංති නොතිබිණි. එවකට නිෂ්පාදනය ඉතාම පහත් තත්වයක පැවතිනි. ආදිකල්පික යුගයේ මිනිසුන්ට එයින් ලබාගත හැකිවූයේ යම්තම් නොමැරී ජීවත් වීමට පමණක් සෑහෙන ප්‍රමාණයක යැපීම් මාධ්‍යයන් පමණකි. එබැවින් පෞද්ගලික දේපොල, පංති හා සූරාකෑම ඇතිවීමට අවශ්‍ය ද්‍රව්‍යමය වස්තුව ගොඩ ගසා ගැනීමේ හැකියාවක් නොවිය.

එහෙත් ඉන්පසුව නිෂ්පාදන බලවේගයන්ගේ සංවර්ධනයත් ශ්‍රම ඵලදාවේ වැඩිවීමත් සමගම මිනිස්සු තමන් පරිභෝජනය කළ පමණට වඩා නිපදවීමට පටන් ගත්හ. ද්‍රව්‍යමය සම්පත් එක්රැස් කර ගැනීමටද, නිෂ්පාදන මාධ්‍යයන් අයත් කර ගැනීමටද හැකියාවක් ඇතිවිය. ව්‍යාප්තවන ශ්‍රම විභජනය සහ වෙළඳාමේ දියුණුවද උපස්තම්භක කරගෙන පෞද්ගලික දේපල අයිතිය ඇතිවිය.

සමූහය සතු දේපල වෙනුවට පෞද්ගලික දේපල අයිතිය දියුණුවීමේ හේතුවෙන් මිනිසුන් අතර ආර්ථික අසමානතාවය වැඩි විය. මොවුන්ගෙන් සමහරෙක්, ප්‍රධාන වශයෙන් ගණ ගෝත්‍රවල නායකයෝ පොහොසත් වී, ගෝත්‍රයට අයත් සාමූහික නිෂ්පාදන මාධ්‍යයන් අල්ලා ගත්හ. අනිත් අයට එම මාධ්‍යයන් අහිමි කරන ලදින්, ඒවා අයිතිකරුවන් යටතේ වැඩ කිරීමට යාමට ඔවුන්ට සිදුවිය. එවැනි ආකාරයකට ආදි කල්පික ගණ ගෝත්‍ර සමාජය කැඩීබිඳී ගොස් පංතිවලට බෙදී වෙන්වීමේ ක්‍රියාවලිය ආරම්භ විය. ප්‍රතිපාක්ෂික පංති සහ සූරාකෑම ඇතිවීමෙන් එම ක්‍රියාවලිය සම්පූර්ණ විය.

ආදි කල්පික ගණ ගෝත්‍ර සමාජය බිඳීයාමේ සහ වහල් ක්‍රමය මතුවීමේ වකවනුවේදී පංති ඇති විය. පංති එකිනෙකට ප්‍රතිවිරුද්ධව සතුරුවීම නිසා ඒවා අතර උග්‍ර අරගල පැන නැගිණි. සියවස් බොහෝ ගණනක් තිස්සේ මිනිස් සංහතියේ වර්ධනයේ වැදගත්ම ලක්ෂණයක් වූයේ පංති සටන්ය.

* වි. අයි. ලෙනින්. සම්පූර්ණ කෘතීන්, වෙළුම 39, පිටුව 15.

https://liberationbase.wordpress.com

2. සතුරු පංති සහිත සමාජ සංවර්ධනයේ උල්පත පංති සටනය

සතුරු පංති සහිත සමාජයේ ඉතිහාසය, පංති සටන්වල ඉතිහාසය වන්නේ යැයි මාක්ස් සහ එංගල්ස් පෙන්වා දුන්හ. ''නිදහස් මිනිහා සහ වහලාද, රෝම කුලීනයා සහ රෝම පොදු ජනයාද, රදළ ස්වාමියා සහ ප්‍රවේණිදාසයාද, ශිල්පියා සහ ආධුනිකයාද, එක් වචනයකින් කියතොත් පාගන්නා සහ පාගනු ලබන්නාද එකිනෙකට විරුද්ධ නිත්‍ය ප්‍රතිපාක්ෂික භාවයෙන්, වරෙක සැඟවී හා තවත් වරෙක විවෘතව කෙරෙන නොනවතින සටනක් ගෙනගියහ. හැම වාරයකදීම මේ සටන එක්කෝ සමාජය විශාල වශයෙන් වෙනස් කරන විප්ලවයකින් හෝ සටන් කරන පංතිවල පොදු විනාශයකින් හෝ කෙළවර විය.''*

එකිනෙකට විරුද්ධව සටන් කරන මේ පංතිවල අරගලය සමහන් කළ නොහැකිය. මන්දයත් එය එම පංති සමාජය තුළ දරන ආර්ථික හා දේශපාලන තත්වයන්ගේ මූලික ප්‍රතිවිරුද්ධතාවයන්ගෙන් පැන නගින බැවිනි. අවුරුදු සිය දහස් ගණනක් තිස්සේ වැඩකරන ජනතාව, වහලුන්, ගොවීන් හෝ කාර්මික කම්කරුවන් හෝ වේවා, පාලක පංති විසින් නිර්දය ලෙස සූරාකෑමට භාජනය කරන ලදී. එබැවින් වැඩකරන ජනතාව පැගීමට විරුද්ධවත් නිදහස් සහ ප්‍රීතිමත් ජීවිතයක් සඳහා සටන් කිරීම ස්වාභාවික දෙයකි.

පංති සහිත සමාජයක ප්‍රධාන පංති සහ අප්‍රධාන පංතිද ඇත්තේය. සමාජයේ බලපවත්වන නිෂ්පාදන ක්‍රමය හා සම්බන්ධ වී ඇති පංති ප්‍රධාන පංති වන්නේය. සතුරු පංති සහිත සමාජයක ඒවා එක් අතකින් නිෂ්පාදන මාධ්‍යයන් සතු පංති සහ ඒවාට ප්‍රතිවිරුද්ධ හා පීඩාවට පත් කරන ලද පංති වන්නේය. වහල් සමාජයේ වහලුන් සහ වහල් හිමියන්ද, රදළ සමාජයේ ඉඩම් හිමියන් සහ ගොවියන්ද ධනපති සමාජයේ ධනපතියන් සහ නිර්ධනයන්ද සතුරු පංති සහිත සමාජයේ ප්‍රධාන පංතිය.

ඒ හැර සතුරු පංති සහිත සමාජයේ අප්‍රධාන පංතිද ඇත්තේය. මේවා සමාජයේ බලපවත්වන ප්‍රධාන නිෂ්පාදන ක්‍රමය සමග කෙළින්ම සම්බන්ධ වී නැති (වහල් සමාජයේ නිදහස් කාර්මික ශිල්පීන්ද, ධනපති ක්‍රමයේ ගොවීන්ද ආදීන්) සහ විවිධ සමාජ කණ්ඩායම් (බුද්ධිමතුන් පූජකවරුන් සහ අනිකුත් කොටස්ද) මේ ගණයට අයත්වේ. සතුරු පංති සහිත සමාජයේ පංති සටන මූලික වශයෙන් ප්‍රධාන පංති

* කාල් මාක්ස් සහ ප්‍රෙඩරික් එංගල්ස්. කෘති එකතුව. වෙළුම 4, පිටුව 424.

අතර සිදුවේ. අප්‍රධාන පංතිවලට සහ සමාජ කණ්ඩායම්වලට සාමාන්‍යයෙන් තමන්ගේම ප්‍රතිපත්තියක් නැති නිසා අරගලයේදී ප්‍රධාන ප්‍රතිපාක්ෂික පංතිවලින් එකක් සමග එක්වී සිය අයිතිවාසිකම් ආරක්ෂා කර ගනී.

සතුරු පංති සහිත සමාජයේ වර්ධනයේ උල්පත සහ ගාමක බලවේගය පංති සටනය. සාපේක්ෂ වශයෙන් ''සාමකාමී'' කාලවලදීත්, විශේෂයෙන්ම විප්ලවවාදී කුණාටු සහ කම්පනය සහිත කාලවලදීත් යන දෙසමයේදීම සතුරු පංති සහිත සමාජයේ වර්ධනය තීරණය කරන්නේ පංති සටන විසිනි.

ධනපති තත්වයන් යටතේ නිෂ්පාදන බලවේගයන්ගේ වර්ධනය සඳහා පංති සටන වැදගත් සාධකයකි. නිදසුනක් වශයෙන් කම්කරුවන්ගේ අරගල නොතිබිණි නම්, තාක්ෂණික ශිල්ප වර්ධනය ගැන ධනපතීන් අඩු උනන්දුවක් දක්වනු ඇත. වැඩ කරන පැය ගණන වැඩි කිරීම සහ වැටුප් කැපීම වැනි අත්හද බලන ලද උපක්‍රම මගින් ඔවුන්ගේ ලාභ උපයා ගැනීම වඩාත් සරල හා අඩු වියදම් සහිත කරගනු ඇත. එහෙත් කම්කරුවන්ගේ දැඩි අරගල නිසාත්, එයට අමතරව ධනපතීන් අතර පවතින තරඟය නිසාත් ධනපතිනට අලුත් යන්ත්‍ර සූත්‍ර හා දියුණු තාක්ෂණික ශිල්පක්‍රම යෙදවීමට සිදුවේ. ''... හැම අලුත් සොයාගැනීමක්ම පාහේ කම්කරුවා සහ ස්වාමියා අතර ගැටීමේ ප්‍රතිඵලයක් විය. තරමක් වැදගත් හැම වැඩ වර්ජනයකටම අනතුරුව අලුත් යන්ත්‍රයක් ඇති විය.''*

සතුරු පංති සහිත සමාජයේ දේශපාලන ජීවිතයේදී පංති සටන වඩාත් වැදගත් වේ. තවත් ලෝක යුද්ධයක් ඇති කිරීම සඳහාත්, ජාතික විමුක්ති ව්‍යාපාරය තලා පෙළා දැමීම සඳහාත්, ප්‍රජාතන්ත්‍රවාදී නිදහසේ ඉතිරි හරියත් නැති කර දැමීම සඳහාත්, එමගින් සමාජයේ ප්‍රගතිශීලී වර්ධනය ප්‍රමාද කිරීම සඳහාත් අධිරාජ්‍යවාදීන් ගෙන යන දූෂ්‍ය කුමන්ත්‍රණවලට හරස්වන වත්මන් අවධියේ කම්කරු පංති සටන් අරගල ඔවුනට බලවත් බාධාවක් වී ඇත.

පංති සටන නැති නම් සමාජ ප්‍රගතියක් ඇති නොවන්නේය. සූරාකනු ලබන්නන් සූරාකන්නන්ට විරුද්ධව ගෙනයන සටන දැඩි ලෙසත් සංවිධානාත්මක ලෙසත් කරන තරමට සාමාන්‍ය වශයෙන් සමාජය වර්ධනයේ වේගයද වැඩිවන්නේය.

පංති සටනේ උසස්තම ආකාරය වන සමාජ විප්ලවය සමාජමය ප්‍රගතියේදී විශේෂයෙන් වැදගත් කාර්ය කොටසක් ඉටු කරයි. මෙහි

* කාල් මාක්ස් සහ ප්‍රෙඩරික් එංගල්ස්. කෘති එකතුව, වෙළුම 4, පිටුව 157.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ප්‍රතිඵලයක් වශයෙන් පැරණි සමාජය විනාශ වී, අලුත්, වඩාත් ප්‍රගතිශීලී සමාජ ක්‍රමයක් බිහිවේ.

සතුරු පංති සහිත සමාජවල ඉතිහාසය සූරාකන්නන්ට විරුද්ධව සූරාකනු ලබන්නන් විසින් ගෙනගිය සටන් අරගලවලින් පිරී ඇත.

වහල් සමාජයේදී වහල් හිමියන් හා වහලුන් අතර දරුණු අරගල ඇති විය. මේවා නිෂ්පාදන උපකරණ බිඳ දැමීමේ සිට පොදු නැගිටීම් දක්වාවූ විවිධ ස්වරූප ගත්තේය. ක්‍රි. ව. පෙර 1 වැනි සියවසේදී ස්පාටකස්ගේ නායකත්වයෙන් වහල්ලු ලක්ෂයකට අධික සංඛ්‍යාවක් කැරළි ගසමින් සටන් කළහ.

රදළ සමාජ ක්‍රමයේදී පංති සටන වඩාත් උග්‍ර ස්වරූපයක් ගත්තේය. මෙහිදී ගොවීන් හා රදළ ඉඩම් හිමියන් එකිනෙකාට විරුද්ධව සටන් කළ ප්‍රධාන ප්‍රතිපාක්ෂික පංති වූ අතර නගරවල වැඩකරන ජනතාව විශේෂයෙන්ම හස්ත කර්මාන්ත කරුවෝ ගොවීන්ගේ පැත්ත ගෙන සටන් කළහ. මේ වකවානුවේ ඇතිවූ කැරළි ගොවීන්ගේ යුද්ධවලට පරිවර්තනවූ අතර ඒවාට ලක්ෂ ගණන් ජනයා සහභාගි වූහ. එංගලන්තයේ වෝට් ටයිලර්ගේ කැරැල්ලද (14 වැනි සියවස), ප්‍රංශයේ ජාකෙරී කැරැලල්ද (14—15 වැනි සියවස්), ජර්මනියේ ගොවි යුද්ධයද (16 වැනි සියවස), රුසියාවේ බලොත්නිකව් සහ රාසින්ගේ නායකත්වයෙන් යුත් කැරළිද (17 වැනි සියවස), පුගචොව්ගේ නායකත්වයෙන් යුත් සටන්ද (18 සියවස), චීනයේ තායිපිං කැරැල්ලද (19 සියවස) වැනි ගොවි සටන් අති විශාල පෙදෙස් සිසාරා යමින් අවුරුදු ගණනාවක් තිස්සේ පැවතිණි.

එසේවුවද, වහල් සමාජයේ සහ රදළ සමාජයේ පැගී සිටි, සූරාකනු ලැබූ ජනතාවට සිය කැරළි මගින් සූරාකැම කෙළවර කර දැමීමට නොහැකි විය. මන්දයත්, එයට අවශ්‍ය තත්වයන් මුහුකුරා වැඩී නොතිබුණු බැවිනි. සූරාකෑමෙන් හා පෑගීමෙන් තොරවූ ක්‍රමයක් දක්වා වෙනස්වීමට නිෂ්පාදන මට්ටම ඉඩ නොදුන්නේය. එම නැගිටීම් අසංවිධාන ඒවා විය. අරගලයේ පරමාර්ථ හෝ ඒවා මුදුන් පමුණුවා ගැනීමේ මාර්ග හෝ කැරළිකරුවෝ නොදැන සිටියහ. සිය සටන් මග ආලෝක කිරීමට ඔවුන්ට ප්‍රගතිශීලී න්‍යායයක් හෝ තමන්ගේම දේශපාලන පක්ෂයක් හෝ නොතිබිණි. අප පසුව දකින පරිදි මෙවැනි තත්වයන් බිහිවන්නේ ධනපති ක්‍රමය යටතේය.

කෙසේවුවද, වහලුන්ගේ සහ ගොවීන්ගේ කැරළි ඉතිහාසයේ ප්‍රගතිය සඳහා විශාල සේවයක් ඉටු කළේය. වහල්ලු, වහල් ක්‍රමයේ පදනම් පුපුරුවා දැමූ අතර ගොවීන්, රදළ ක්‍රමය බිඳ හෙළීමේ හා වඩාත් ප්‍රගතිශීලී සමාජ ක්‍රමයක් වන ධනපති ක්‍රමය දක්වා පරිවර්තනය වීමේ එක් ප්‍රධාන බලවේගයක් විය.

3. ධනපති සමාජයේ පංති සටන

ධනපති සමාජයේ ප්‍රධාන පංති ධනපති සහ නිර්ධන පංති වන්නේය. ධනපති පංතිය ලාභය සොයා යමින් නිර්ධන පංතිය සූරාකයි.

ධනපතියන් හා නිර්ධන පංතිය අතර අරගලය ධනපති සංවර්ධනයේ එක් නියාමයකි

ධනපති ක්‍රමය වර්ධනයවත්ම මේ සූරාකෑමද වැඩි වෙයි. කම්කරුවාගේ ශ්‍රමයද වඩ වඩාත් ඉක්මන් වන අතර ඔහු යන්ත්‍රවල උපාංගයක තත්වය දක්වා පහත වැටේ. ධනපති ක්‍රමයේ සහජ ලක්ෂණ වන ආර්ථික අර්බුද, විරැකියාව සහ කොල්ලකාරී යුද්ධ නිසා නිර්ධන පංතිය වඩාත් දරුණු දුක් කරදර හා විපත්වලට පත්වෙයි.

මේ සියල්ල නිහඬව දරාගැනීමට නිර්ධන පංතිය කොහෙත්ම සූදනම් නැත. කම්කරුවාගේ ශ්‍රමයේ ඵලය සොරාගන්නා ධනපති ක්‍රමයේ අභ්‍යන්තර ස්වභාවයද, සමාජය තුළ ඔහු දරන තත්වයද නිසා ධනපති පංතියට විරුද්ධව සටන් කිරීමට ඔහු පෙළඹෙයි. එබැවින් ධනපති සමාජයේ ඉතිහාසය නිර්ධන පංතිය සහ ධනපති පංතිය අතර අරගලයේ ඉතිහාසයයි. එම සටන නියමානුකූල ලෙස සිදුවන්නකි. එය ධනපති වර්ධනයේ ප්‍රධාන උල්පතය. අධිරාජ්‍යවාදී යුගයේදී, ධනපති ක්‍රමයේ ආර්ථික හා දේශපාලනමය ප්‍රතිවිරෝධීතාවයන් ඉතාමත් තියුණු අන්දමින් උග්‍රවන බැවින් එම යුගයේදී ධනපති පංතියට විරුද්ධව නිර්ධන පංතිය කරන අරගලය වඩාත් උග්‍රවෙයි.

ධනපති ක්‍රමය විනාශ කරදමා පංති විරහිත කොමියුනිස්ට් සමාජයක් ගොඩනැගීමේ ශ්‍රෙෂ්ඨතම ඓතිහාසික කාර්ය භාරය පැවරී ඇත්තේ නිර්ධන පංතියටය. මෙතරම් ශ්‍රෙෂ්ඨ හා උදාරතර කාර්ය භාරයක් සපුරාලීමට වෙනත් පංති අසමත් වන්නේ ඒවා එකක්වත් ස්ථිර ලෙස විප්ලවවාදී නොවන බැවිනි.

සමාජයේ බලය අල්ලා ගැනීම සඳහා රදළයින්ට විරුද්ධව කළ සටනේදී පමණක් ධනපති පංතිය විප්ලවවාදී විය. එහෙත් බලය අල්ලා ගත් ඉක්බිතිව ධනපති පංතිය වඩ වඩාත් ප්‍රතිගාමී විය. දැන් එම පංතියේ එකම බලාපොරොත්තුව සූරාකෑම චිරස්ථායි කිරීමය.

ධනපති ක්‍රමය යටතේ විශේෂයෙන් ප්‍රමාණය හා සංඛ්‍යාව අතින් ඉතා විශාල මැද කොටස්වලට අයත් ගොවියෝ සහ හස්ත කර්මාන්ත කරුවෝ අවසානය දක්වා විප්ලවවාදී ස්වභාවයක් නොදරති. සමාජයේ ස්වාධීන තත්වයක් නොදරන මේ කොටස් ධනපති ක්‍රමය වර්ධනය වත්ම, විවිධ තට්ටුවලට බෙදෙයි. ගොවීන්ගේ හා හස්ත කර්මාන්ත

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

කරුවන්ගේ බහුතර සංඛ්‍යාව ආර්ථික විනාශයට මූණ පා නිර්ධන පංතියට ඇතුළු වන අතර ඉතා සුළු කොටසක් පමණක් ධනපති පංතියට රිංගා ගනී. දරුණු පංති සටනේදී ගොවියෝ වැනෙන සුලු තත්වයක් දරති. එබැවින් ගොවීන් තමන් වෙත දිනාගෙන, ඔවුන් තම විශ්වාසවත් හවුල් කරුවන් කරගැනීමේ කාර්ය භාරය නිර්ධන පංතිය සතුය.

බුද්ධිමත් (ඉංජිනේරුවරු, කාර්මික ශිල්පියෝ, දොස්තරවරු, ගුරුවරු, විද්‍යාඥයෝ ආදී) කොටස්ද ස්ථිර සාර විප්ලවවාදීහු නොවෙති.

පංතියක් නොවන බුද්ධිමතුන් ඒ අතරම සජාතීයද නොවේ. බුද්ධිමතුන්ගේ ඉහළ කොටස ධනපති පංතියට සිත-කය යොදවා මෙහෙවර කරයි. මොවුන්ගේ බහුතර කොටස ශ්‍රම වැටුප් ලබන්නන් බැවින් සිය තත්වය අනුව කම්කරු පංතියට බොහෝ සෙයින්ම සමාන වන්නේය.

ධනපති සමාජයේ ස්ථිර ලෙස විප්ලවවාදී වන එකම පංතිය නිර්ධන පංතිය වන්නේය. ඉතාමත් පුරෝගාමී, දියුණුවන නිෂ්පාදන ආකෘතිය වන යාන්ත්‍රික කර්මාන්තය සමග සම්බන්ධ වී ඇති නිර්ධන පංතිය නිරතුරුව වැඩෙමින්, දියුණු වේ. නිර්ධන පංතිය සමගි කිරීමටද, සංවිධාන කිරීමටද, ඔවුන්ට අධ්‍යාපනයක් ලබා දීමටද ධනපති ක්‍රමයේ ස්වභාවයම ආධාරකාරී වෙයි. නිර්ධන පංතියට දේපල නැති නිසා සටන් වලදී නැතිවීමට දෙයක් ඔවුනට නැත. විමුක්තිය සඳහා සටන් කිරීමේදී, තමා මෙන්ම ධනපති ක්‍රමයට වෛර කරන සෙසු වැඩකරන ජනතාවද සංවිධානය කර ඔවුනට නායකත්වය දීමෙහි නිර්ධන පංතිය සමත් වෙයි. නිර්ධන පංතිය ස්වකීය විමුක්තිය දිනාගැනීමේදී, වෙනත් සියලු වැඩකරන ජනතාවද මුදගෙන මිනිහෙකු විසින් මිනිහකු සූරාගෙන කෑමද සදහටම අහෝසි කර දමනු ඇත. ජයග්‍රහණය ලැබීමෙන් ඉක්බිතිව නිර්ධන පංතිය, වැඩකරන ජනතාව නිපදවන සෑම දෙයක්ම ඔවුනටම ආපසු ලබා දීමෙන්, කෝටි සංඛ්‍යාත වැඩ කරන ජනතාවගේ ශ්‍රමයේ ඵලය අතලොස්සක් පීඩකයන් විසින් අයත් කරගන්නා සමාජ ක්‍රමය අහෝසි කොට, එමගින් විශාලම සමාජ අසාධාරණයද අහෝසි කර දමයි.

ධනපති ක්‍රමය වැඩෙත්ම, නිර්ධන පංතියද වැඩේ. ධනපති පංතියට විරුද්ධව එය ගෙනයන සටන්වල ස්වරූප වඩාත් විවිධාකාර සහ තියුණු වේ.

නිර්ධනයන්ගේ පංති සටන්වල ස්වරූපය

නිර්ධන පංතිය ගෙනයන පංති අරගලයේ මූලික ස්වරූප තුනක් තිබේ. ඒවා ආර්ථික, දේශපාලනමය සහ දෘෂ්ටිමය යනුයි. කම්කරුවන්ට තිබෙන සරලතම සටන් ක්‍රමය ආර්ථික සටනය. නිර්ධනයන්ගේ ද්‍රව්‍යමය තත්වයන් හා වැඩකරන තත්වයන් උසස් කරගැනීම සඳහා ඔවුහු ආර්ථික සටන්වල යෙදෙති. වැටුප් වැඩිකරන ලෙසද, වැඩ කිරීමේ පැය ගණන අඩු කරන ලෙසද ආදී වශයෙන් ඔවුහු සේවා යෝජකයන්ගෙන් ඉල්ලති. මේ ඉල්ලීම් නොලැබෙතොත් ඔවුහු වැඩ වර්ජනවල යෙදෙති.

ඓතිහාසික වශයෙන් නිර්ධන පංතියේ පංති අරගලවල පළමුවැනි ස්වරූපය වන්නේ ආර්ථික අරගලයයි. එය විප්ලවවාදී ව්‍යාපාරය දියුණු කිරීම පිණිස විශාල කාර්ය කොටසක් ඉටු කරයි. පුළුල් කම්කරු කොටස් පංති සටන්වලට ඇදගැනීමට උපකාරවන එම අරගලය ඔවුන්ට සංවිධානය ගැන උගන්වන අනගි පාසලක් ලෙසද ප්‍රයෝජනවත් වේ. අරගලයෙහිදී නිර්ධනයන්ගේ පංති විඥනය සහ පංති සමගිය වැඩිවේ. ඒ අනුව වෘත්තීය සමිති, සමුපකාර සමිති සහ අන්‍යොන්‍යාධාර සමිති වැනි මුල් කම්කරු සංවිධාන බිහිවේ.

එහෙත් ඒ අතරම ආර්ථික සටන ස්වභාවයෙන් සීමා සහිතය. එය ධනපති පංතියට විරුද්ධව සමස්ත නිර්ධන පංතියම කරන අරගලයක් බවට පත් වී නැති අතර කම්කරුවන්ගෙන් කොටසක් එක් හෝ තවත් කම්හල් අයිතිකරුවකු වන ධනපතියකුට විරුද්ධව එක ප්‍රදේශයක කරන සටනක් පමණකි. එපමණක් නොව, එය ධනපති ක්‍රමයේ ප්‍රධාන පදනම වන පෞද්ගලික දේපල අයිතියට අත නොගසන අතර ධනපති පංතියේ දේශපාලන බලය අහෝසි කර දැමීමද අරමුණු නොකරයි. සැලකිල්ලට ගතයුතු ප්‍රධාන කරුණ එයයි. ආර්ථික සටනේ පරමාර්ථය සූරාකෑම අහෝසි කර දැමීම නොව, එය සීමා කොට ලිහිල් කිරීමය.

නිර්ධන පංතියේ වැඩීමත් සමගම එක් එක් කම්හල්වල සහ ප්‍රදේශවල කෙරෙන ආර්ථික අරගලය ඒකාබද්ධ වී, එය මුළු මහත් ධනපති පංතියට විරුද්ධව කරන කම්කරු පංතියේ පොදු අරගලයක් බවට පරිවර්තනය වන්නේය.

දේශපාලන අරගලය — එය ධනපති ක්‍රමයේ බලකණු බිඳ දැමීම සඳහාද, රාජ්‍ය බලය අල්ලා ගැනීම සහ නිර්ධන පංතික ආඥාදායකත්වය පිහිටුවීම සඳහාද කරන අරගලයයි.

ආර්ථික අරගලය තුළින් නිර්ධන පංතියට තම ද්‍රව්‍යමය තත්වය තරමක් යහපත් කර ගැනීමට, නැතහොත්, ධනපති පංතියෙන් කිසියම් ආර්ථික වාසි උදුරා ගැනීමටද හැකිවේ. එහෙත් නිර්ධන පංතියට එහි මූලික ආර්ථික හා දේශපාලන වුවමනාවන් සම්පූර්ණයෙන්ම ඉටුකරගත හැක්කේත්, සූරාකෑම සදහටම අහෝසි කළ හැක්කේත්, ධනපති පංතියේ දේශපාලන බලය විනාශකර දැමීමෙන් සහ තමන්ගේම රාජ්‍ය වන නිර්ධන පංතික ආඥාදායකත්වය ස්ථාපිත කිරීමෙනි.

එම අරමුණ ඉටුකර ගැනීම සඳහා නිර්ධන පංතිය ඉතාමත් විවිධ

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

මාධ්‍යයන් පාවිච්චි කරමින් දේශපාලන අරගල ගෙනයයි. දේශපාලන වැඩ නැවැත්වීම් හා පෙළපාලිද, පාර්ලිමේන්තුව තුළින් සාමකාමී අරගල සහ අවිගත් අරගලද ගෙනයයි. කෙසේ වුවද, මේ සියලු මාධ්‍යයන්ම අවසාන අරමුණ වන සමාජවාදී විප්ලවයට සූදනම්වීමට සහ සාර්ථක කිරීමට යටත්ය. සමාජවාදී නිර්ධන පංතික විප්ලවය, නිර්ධනයන්ගේ පංති සටනේ උසස්තම අවධිය වන්නේය. ධනපති ක්‍රමය අහෝසි කරන සහ නිර්ධන පංතිය විසින් දේශපාලන බලය අල්ලා ගැනීමේ තීරණාත්මක හා එකම මාධ්‍යය වන්නේය.

දෘෂ්ටිමය අරගලය නිර්ධන පංතික විප්ලවවාදී ව්‍යාපාරයට ඉතා වැදගත් වේ. ධනපති සමාජයේ රජ කරන ධනවාදී දෘෂ්ටියට විරුද්ධව හා සමාජවාදී නිර්ධන පංතික දෘෂ්ටියේ ජයග්‍රහණය සඳහා සටන් කිරීම දෘෂ්ටිමය අරගලයයි.

ධනේශ්වර ක්‍රමයේ සංවර්ධනය නිර්ධන පංතියේ සමගියට සහ සංවිධාන වීමට අනිවාරනීය වශයෙන්ම හේතුවේ. එසේවුවද, ධනපති ක්‍රමය විනාශකර දැමීම සඳහා නිර්ධන පංතිය පංතියක් වශයෙන් සංවිධානය විය යුතුවා පමණක් නොව, සිය පංතිමය වුවමනාවන් ගැනද, සිය ශ්‍රේෂ්ඨ ඓතිහාසික කාර්ය භාරය ගැනද විඥත ලෙස දැනගෙන සිටිය යුතුය. නිර්ධන පංතියට මේ සඳහා විප්ලවවාදී න්‍යායයක් අවශ්‍ය වන්නේය. නිර්ධන පංතියට කාලය, සම්පත් සහ සෑහෙන අධ්‍යාපනයක් නැතිකම නිසා ස්වකීය න්‍යායයක් නිර්මාණය කරගැනීමට නොපුළුවන් විය. නිර්ධන පංතියේ පැත්ත ගත් බුද්ධිමතුන් විසින් එම න්‍යායය බිහි කරනු ලැබීය. එම අලුත් විප්ලවවාදී න්‍යායය මාක්ස්, එංගල්ස් හා ලෙනින් විසින් නිර්මාණය කරන ලදී.

ප්‍රගතිශීලී විප්ලවවාදී න්‍යායයක් නිර්මාණය කිරීමෙන් පමණක් කාර්යය අවසන් නොවීය. එය කම්කරුවන් අතර පැතිරවීම අවශ්‍ය විය. කම්කරු පංති ව්‍යාපාරයේ සාංසිද්ධිකතාවයට විරුද්ධවත්, නිර්ධන පංතියේ පුළුල් කොටස්වලට දියුණු මාක්ස්–ලෙනින්වාදී දෘෂ්ටියෙන් සමත්කම් ලබාදීමත්, සඳහා ගෙනයන සටන දෘෂ්ටිමය සටන වන්නේය.

ධනවාදී දෘෂ්ටිවාදීහුද, ප්‍රතිසංස්කරණවාදීහුද, සංශෝධනවාදීහුද මාක්ස්–ලෙනින්වාදයට නිරතුරුවම පහර දෙති. එබැවින් දෘෂ්ටිමය ක්ෂේත්‍රයේ සටන් අරගලවලට මාක්ස්–ලෙනින්වාදී න්‍යායයේ පිරිසුදු බව ආරක්ෂා කරගැනීම සඳහාද සියලු වර්ගවල සතුරන්ගෙන් විශේෂයෙන්ම අධිරාජ්‍යවාදී ප්‍රතිගාමීත්වයේ දෘෂ්ටියෙන් එය ආරක්ෂා කිරීම සඳහාද කරන සටන දෘෂ්ටිමය අරගලයේ වැදගත් කොටසකි.

ආර්ථික අරගලය මෙන්ම දෘෂ්ටිමය ක්ෂේත්‍රයේ අරගලයද ස්වයංසම්පූර්ණ අරමුණක් නොවේ. ධනවාදී පංතිය පෙරළා, නිර්ධන පංතිය

විසින් පාලන බලය අල්ලා ගැනීමේ දේශපාලන කර්තව්‍යයන්ට, එය යටත්ය.

නිර්ධන පංති අරගලයේ සංවිධායකයා සහ නායකයා මාක්ස්වාදී පක්ෂය ය

වැඩකරන ජනතාවගේ සියලු සටන් විධි නිසි ලෙස ඒකාබද්ධ කොට, ඔවුන්ගේ අරගලයට ප්‍රවීණ නායකත්වයක් දිය හැක්කේ නිර්ධන පංතියේ දේශපාලන පක්ෂයකට පමණකි. ධනවාදී ක්‍රමයේ ප්‍රතිවිරෝධතාවයන් ඉතා උග්‍ර තත්වයකට පැමිණීම නිසා සමාජවාදී විප්ලවය ප්‍රත්‍යක්ෂ සහ ප්‍රායෝගික කාර්යයක් බවට පත්වී ඇති අධිරාජ්‍යවාදී යුගයේදී පක්ෂයේ කාර්ය කොටස ඉතා විශාලය.

ධනපති පංතිය සමග සම්මුතියකට පැමිණීමට සහ ප්‍රතිසංස්කරණ වලට පක්ෂවූ දෙවැනි ජාත්‍යන්තරයේ පක්ෂ, අලුත් ඓතිහාසික තත්වයන් යටතේ නිර්ධන පංති ව්‍යාපාරයට නිසි නායකත්වය දීමට අපොහොසත් වූහ. විප්ලවවාදීවූත්, මාක්ස්වාදීවූත්, අලුත් වර්ගයක දේශපාලන පක්ෂයක අවශ්‍යතාවයක් පැන නැගිණි. වි. අයි. ලෙනින් විසින් එය පිහිටුවන ලදී.

මාක්ස්වාදී පක්ෂය, නිර්ධන පංතියේ පෙරමුණේ ගමන් කරන විප්ලවවාදී කණ්ඩායමය. නිර්ධන පංති සංවිධානයේ උසස්තම ආකාරය වන පක්ෂය අන් සියලුම සංවිධාන (වෘත්තීය සමිති සමුපකාර සමිති ආදිය) ඒකරාශී කොට ඒවාට දේශපාලන නායකත්වයක් දෙයි. ධනපති ක්‍රමය පෙරළා දමා සමාජවාදී සමාජයක් බිහිකිරීමේ එකම අරමුණ වටා ඒවායේ කාර්යයන් සංකේන්ද්‍රණය කරයි. වි. අයි. ලෙනින් මෙසේ ලියුවේය. ''රාජ්‍ය බලය අල්ලා ගැනීමෙහිත්, මුළු මහත් ජනතාවම සමාජවාදය කරා මෙහෙයවීමෙහිත්, අලුත් ක්‍රමය මෙහෙයවීමෙහි හා සංවිධානය කිරීමෙහිත් සමත්වූද ධනපති පංතිය නැතිව ධනපතීන්ට විරුද්ධව තමන්ගේ සමාජ ජීවිතය ගොඩනගා ගැනීමේ කර්තව්‍යයෙහිදී වැඩකරන ජනතාව හා සූරාකනු ලබන්නන් සියලු දෙනාටම මග පෙන්වන, ඔවුන්ගේ නායකයා වීමෙහි සමත්වූද, නිර්ධන පංතියේ පෙරමුණු බලඇණියට ගුරුවන්නේ මාක්ස්වාදයයි.''*

මාක්ස්වාදී පක්ෂයට සිය පෙරමුණු බලඇණි කාර්ය භාරයද කම්කරු පංතියේ ඉදිරියෙන්ම සිටින කණ්ඩායම හා මුළු මහත් ජනතාවගේම නායකයා වශයෙන් භාරවන කාර්යයද සපුරාලිය හැක්කේ එය විද්‍යාත්මක මාක්ස්වාදී න්‍යායයෙන්ද, සමාජ සංවර්ධනයේ නියාම පිළිබඳ දැනීමෙන්ද, සමාජය විප්ලවවාදී ලෙස පරිවර්තනය සඳහා

* වි. අයි. ලෙනින්. සම්පූර්ණ කෘතීන්, වෙළුම 33, පිටුව 26.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

එම නියාමයන් භාවිතයට යොදගැනීමේ හැකියාවෙන්ද සන්නද්ධ බැවිනි.

නිර්ධන පංතියේ ඉතා දියුණු හා දේශපාලන හැඟීමකින් යුත් පෙරමුණු බලඇණිය වන පක්ෂය ජනතාවගේ සමාජවාදී විඥනය නිරතුරුවම වර්ධනය කරන අතර දූෂිතකාරී ධනවාදී දෘෂ්ටියේ බලපෑමෙන් කම්කරු පංතිය ආරක්ෂා කරගනී. මාක්ස්වාදය විකෘති කිරීමට හෝ ''සංශෝධනය'' කිරීමට හෝ දරන සෑම ප්‍රයත්නයකටම විරුද්ධව පක්ෂය සමා නැතිව සටන් කරයි. නවීනතම විද්‍යාත්මක ජයග්‍රහණ සහ සමාජයේ ප්‍රායෝගික අත්දැකීම් පදනම් කරගෙන පක්ෂය මාක්ස්වාදය පෝෂණය කරයි.

මාක්ස්වාදී පක්ෂයක් යනු කම්කරු පංතියේ පෙරමුණ දරන විඥත හා සංවිධානයවූ දේශපාලන පක්ෂයක්ද භාවිතයෙහිදී මාක්ස්-ලෙනින්වාදී විප්ලවීය අදහස් ක්‍රියාවට පෙරළීම සඳහා පොදු අභිලාෂයකින් බැඳුනු පක්ෂයක්ද වන්නේය. පක්ෂය අභ්‍යන්තරයෙන් භේද කිරීමට උත්සාහ ගන්නාවූද, එමගින් නිර්ධන පංතියේ පංති සටන්-වලට නායකත්වය දීමට පක්ෂයට ඇති හැකියාව දුර්වල කරන්නාවූද සියලු වර්ගයේ අවස්ථාවාදීන් පක්ෂයට පිළිකුල්ය.

මාක්ස්වාදී පක්ෂය සැබෑ ජනතා පක්ෂයකි. එය ජනතාවගේ විශිෂ්ඨතම නියෝජිතයින් එක්සත් කරයි. එය වැඩ කරන ජනතාව සමග දහසක් සම්බන්ධකම් ඇතිව සිටී. ජනතාවගේ මහඟු අභිලාෂයන් ප්‍රකාශ කරන පක්ෂය ආත්ම ලාභයෙන් තොරව ඔවුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරයි. එනිසා පක්ෂයට ඔවුන්ගේ අසීමිත විශ්වාසය හා ආධාරය ලැබේ. මාක්ස්වාදී පක්ෂයට ජනතාව සමග ඇති ඉතා කිට්ටු සම්බන්ධකම් වලින් පැන නගින අනභිභවනීය ශක්තියක් හා සහයෝගයක් ඇත.

වී. අයි. ලෙනින් විසින් නිර්මාණය කරන ලද සෝවියට් සංගමයේ කොමියුනිස්ට් පක්ෂය එවැනි සැබෑ විප්ලවවාදී, සැබෑ ජනතා පක්ෂයක් වන්නේය.

පංති සහ පංති සටන පිළිබඳ මාක්ස්වාදී න්‍යායයට හාත්පසින් වෙනස්ව යමින් ධනපති දෘෂ්ටිවාදියෝ ධනපති ක්‍රමය යටතේ පංතිමය

පංති සහ පංති සටන පිළිබඳව ධනපතීන්ගේ හා අවස්ථාවාදීන්ගේ න්‍යායයන් බංකොලොත්ය

සාමයක් ගැන දේශනා කරති. විශේෂයෙන්ම සමකාලීන ධනපති ක්‍රමය තුළ පංති හා පංති සටන් නැතැයි ඔවුහු අවධාරණයෙන් පවසති. සමකාලීන ධනපති සමාජයේ සූරාකෑමක් හෝ සතුරු පංති හෝ නැති බවත් පවතින්නේ තම වෘත්තීය, අධ්‍යාපනය, ආදයම, වයස, ආගම, දේශපාලන මත හා අනිකුත් ලක්ෂණ රැසක් අනුව හැඩ ගැසුනු සමාජ

කණ්ඩායම් පමණක් බවත් සමහර සමාජ විද්‍යාඥයෝ පවසති. මේ කණ්ඩායම්වලට අයත් මිනිසුන් පෞද්ගලික අයිතිය පිළිබඳ සම්බන්ධකම්වලින් එකට බැඳී නැති බවත් එම කණ්ඩායම් අතර ඇති සම්බන්ධකම් සම්පූර්ණයෙන් සංසගත ස්වරූපී බවත් පෙන්වීමට උත්සාහ දරති. ඔවුන්ගේ මතය අනුව මිනිහකුට එක් කණ්ඩායමකින් තවත් කණ්ඩායමකට පහසුවෙන් මාරු විය හැකිය.

වෙනත් ධනවාදී සමාජ විද්‍යාඥයෝ පංති තිබෙන බව පිළි ගත්තද සමකාලීන ධනපති සමාජයේ පංති වෙනස්කම් ක්‍රමයෙන් මැකී යන බවත්, පංති සියල්ලම ක්‍රම ක්‍රමයෙන් එක්වී විශාල ''මැද'' පංතියක් බවට පරිවර්තනය වන බවත් පවසති. නිදසුනක් වශයෙන් කල් මත්තෙන් ඇමෙරිකා එක්සත් ජනපදයේ සියලු දෙනාම මෙම ''මධ්‍යම'' පංතියට අයත් වනු ඇති බවද කියති. සුප්‍රසිද්ධ ඇමෙරිකානු සමාජ විද්‍යාඥයකු වන ස්ත්‍රාවුස්-හියුපේ සිය ''උදසීනත්වයේ කලාපය'' (1952) මගින් වර්තමාන ඇමෙරිකා එක්සත් ජනපදයේ සූරා-කන්නන් හා සූරාකනු ලබන්නන් අතර වෙනස සොයාගැනීම ඉතා අපහසු බව පවසයි. දුප්පත්කම ක්‍රමයෙන් නැති වෙමින් පවතින අතර උසස් පංතිය යල්පැනීමට පටන් ගෙන තිබෙන බව කියනු ලැබේ.

ධනපති දෘෂ්ටිවාදීන්ගේ මතය අනුව, ඇමෙරිකන් කම්කරුවෝ නිර්ධන පංතියට අයත් නොවෙති. ඔවුහු උසස් ජීවන තත්වයක් භුක්ති විඳින අතර, මුදල් ඉතිරි කරති, ව්‍යාපාරවල කොටස් මිලදී ගනිති, එනිසා ව්‍යාපාර හිමියන් සේම ලාභ ලබා ගනිති. අනිත් අතින් ව්‍යාපාර හිමියන්ගේ අයිතිවාසිකම් රජය විසින් වැඩි වැඩියෙන් සීමා කිරීමට පටන් ගෙන තිබෙන බැවින්, නිෂ්පාදනයේදී ඔවුන් ඉටුකරන කාර්ය කොටස කුඩාවීමට පටන් ගෙන ඇති බවද ඔවුහු කියති.

සමකාලීන ධනපති සමාජයේ පංති සහ පංති සටන් නැතැයි කියන ධනවාදයට ආවඩන්නන්ගේ සුරංගනා කථාවලට ප්‍රතිසංස්කරණවාදීන්ගේ සහ සංශෝධනවාදීන්ගේද නොමසුරු ආධාරය ලැබේ. සී. අයි. ඕ නැමැති ඇමෙරිකන් වෘත්තීය සමිති සංවිධානයේ නායකයකු වන පිලිප් මරේ, ඇමෙරිකාවේ පංති නැති බවත්, ''සියලු දෙනාම කම්කරුවන්'' බවත් ගොවීන්ගේද, කාර්මික කම්කරුවන්ගේද, වෙළඳ ව්‍යාපාරිකයින්ගේද, කාර්යාල සේවකයින්ගේද, බුද්ධිමතුන්ගේද අයිතිවාසිකම් සියල්ල සර්ව සමවන බවත් පැවසීය.

සංශෝධනවාදීහු මරේගේ කතාව ප්‍රතිරාවය කරමින් පංති පිළිබඳ ලෙනින් විසින් කරන ලද විග්‍රහය යල් පැන ගොස් ඇති බව කියා ඒ වෙනුවට ''කණ්ඩායම'' ආදී වූ සංකල්පය ආදේශ කරති. ඔවුන්ගේ

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

මතය අනුව, මිනිසුන් කණ්ඩායම් වශයෙන් සමගිවී සිටින්නේ නිෂ්පාදන මාධ්‍යයන් කෙරෙහි ඇති ඔවුන්ගේ සම්බන්ධකම් නිසා නොව, වෙනත් ද්විතියික කරුණු නිසාය. පංති තිබෙන බව නොපිළිගන්නා සංශෝධනවාදීහු පංති සටනද අත්හරිති. වත්මන් අවධියේ කම්කරුවන්ගේ කාර්ය භාරය වන්නේ ධනපති පංතියට විරුද්ධව සටන් කිරීම නොව, තාක්ෂණික ප්‍රගතියට ආධාර කිරීම බව කියති. තාක්ෂණික ප්‍රගතිය නිසා පංති සටන හා විප්ලවය නැතිවම, ආණ්ඩු බලය ජනතාව අතට ඉබේටම භාරවන බව ඔවුහු පවසති.

ධනවාදයට ආවඩන්නෝ සහ සංශෝධනවාදී අන්තේවාසිකයෝ, සමකාලීන ධනවාදී සමාජයේ පංති සහ පංති සටන් නැති බව කියන ව්‍යාජ න්‍යායයන් පතුරුවා හරිමින්, ‘‘ශ්‍රමයේ හා ප්‍රාග්ධනයේ අයිතිවාසිකම්වල සංගතයක්’’ ගැන දෙඩවන්නේ කම්කරු පංතිය මුළා කිරීමටය. ධනපති පංතියට විරුද්ධව කරන සටන නිශ්ඵල බව කම්කරුවන්ට ඒත්තු ගැන්වීමටය. කම්කරු පංති ව්‍යාපාරය ප්‍රතිසංස්කරණවාදී මාවත ඔස්සේ දක්කීමටය.

එහෙත් සැබෑ තත්වය කුමක්ද?

සමහර, විශේෂයෙන්ම ඉහළ කොටස්වල ඇමෙරිකන් කම්කරුවන්ගේ ජීවන තත්වය ලෝකයේ වෙනත් ධනපති රටවල කම්කරු පංතියේ ජීවන තත්වයට වඩා උසස් බව ප්‍රකට කරුණකි. එහෙත් මේ උසස් ජීවන තත්වය ඇමෙරිකාවේ සියලු කම්කරුවන් භුක්ති නොවිඳින බව මතක තබා ගත යුතුය. ඇමෙරිකාවේ දසලක්ෂ සංඛ්‍යාත රැකියා වියුක්ත, නීග්‍රෝ, මෙක්සිකානු සහ වෙනත් කම්කරුවෝ යැපීමට අවශ්‍ය අවම ආදායමවත් නොලබති. එහෙත් ඒ අතරම ඇමෙරිකා එක්සත් ජනපදයේ ජනගහණයෙන් 0.5 ක් වන ඇමෙරිකන් ඒකාධිකාරීහු ජාතික ධනයෙන් සියයට 25 ක් අයත් කරගෙන සිටිති. මහා ධන කුවේරයින් දස දහසක් දෙනෙක් (ජනගහණයෙන් සියයට 0.005) වසරකට ඩොලර් පනස් ලක්ෂයක් බැගින් ආදායම් ලබති.

සමහර ඇමෙරිකන් කම්කරුවන් මුදල් ඉතිරි කරන බව සැබෑවකි. එහෙත් මුළු ජාතික ඉතිරියෙන් ඔවුන්ගේ කොටස කොපමණද? ඇමෙරිකා එක්සත් ජනපදයේ ජනගහණයෙන් සියයට පණහක් ඉතිරි කර ඇති මුදල් වල ප්‍රමාණය ජාතික ඉතිරියෙන් සියයට එකක් වන අතර ඉතිරි සියයට පණහට අයත් කොටස සියයට අනූ නවයක් වන්නේය.

සමහර ඇමෙරිකන් කම්කරුවෝ ව්‍යාපාරවල කොටස්ද හිමි කරගෙන සිටිති. එහෙත් ඔවුනට හිමි කොටස් සියල්ලෙහිම වෙළඳ

පොලේ වටිනාකම සියලුම ව්‍යාපාර වස්තුවල වටිනාකමෙන් සියයට 0.2 ක් පමණකි. මුල්‍ය කතිපයාධි මහා ධන කුවේරයින් වන ඩියුපොන්ට් පවුල සතු ව්‍යාපාර කොටස්වලින් දහයෙන් පංගුවක් පමණකි.

සැබෑ තත්වය මෙසේ වූ විට, පංතිවල අතුරුදහන් වීමක් ගැනත්, ‘‘මහා ඇමෙරිකානු මධ්‍යම පංතිය’’ ගැනත් කවර කතාද? ඇමෙරිකා එක්සත් ජනපදය විශාල සමාජමය ප්‍රභේදයන්ගෙන් යුත්, ගැඹුරුතම සමාජ ප්‍රතිවිරෝධීතාවයන් සහිත රටකි. ඇමෙරිකා එක්සත් ජනපදය සමග සසඳන විට, වෙනත් ධනපති රටවල වැඩකරන ජනතාවගේ තත්වය ඊටත් වඩා බොහෝ අහිතකරය. ඒ රටවල ධනපති හා නිර්ධන පංතිය අතර ඇති ප්‍රතිවිරෝධීතාවය ගැඹුරුය, වඩාත් තියුණුය.

සමකාලීන ධනපති සමාජයේ ධනවාදී අයිතිය බලපවත්වන බව නිසැකය. එබැවින් ප්‍රතිවිරෝධී සතුරු පංතීන් වන ධනපති හා නිර්ධන පංති ඇති බවටද සැකයක් නැත. මේ පංති අතරවන දරුණු පංති අරගලය තවමත් ඇවිලෙමින් පවතී.

සමකාලීන ධනපති සමාජයේ පංති සටන

ධනවාදය පොදු අර්බුදයකට මූණ පා සිටින, එමෙන්ම සමාජවාදී රාෂ්ට්‍ර පද්ධතිය ලෝක සංවර්ධනයේ තීරණාත්මක සාධකය බවට පත්වන මෙම වකවානුවේ ධනපති රටවල්වල නිර්ධන පංතිය ධනපති පංතියට විරුද්ධව කරන සටන නව අවධියකට පත්ව ඇත. දැන් තත්වය කම්කරු පංති ව්‍යාපාරයට වඩාත් වාසිදයකය. ජගත් දේශපාලන පොරපිටියේ සාමයට, සමාජ ප්‍රගතියට සහ සමාජවාදයට පක්ෂපාත බලවේගයන්ගේ ශක්තිය හාත්පසින්ම වෙනස් වී ඇත්තේය. සෝවියට් සංගමයේ හා සෙසු සමාජවාදී රටවල්වල බල මහිමය වැඩිවීම නිසා ඒවායේ සාමකාමී විදේශීය ප්‍රතිපත්තිය සාර්ථක වෙමින් පවතී. ලෝක ධනපති ක්‍රමයේ අර්බුදය ගැඹුරුවීමද, පොදු ජනතාව අතර කොමියුනිස්ට් පක්ෂවල බලපෑම වැඩිවීමද, ප්‍රතිසංස්කරණවාදය දෘෂ්ටිමය වශයෙන් පරාජය ලැබීමද නිසා පංති සටන කම්කරු පංතියට වාසිවනසේ වෙනස් වී ඇත. අධිරාජ්‍යවාදීන්ගේ ප්‍රතිගාමී දේශපාලනයට විරුද්ධවද, විශේෂයෙන් අවි තරඟය නිසා වැඩකරන ජනතාව මත පැටවෙන බරට විරුද්ධවද, ඉතා පුළුල් වැඩකරන ජනතා කොටස් අතර අසතුටක් පැන නැගී ඇති බැවින්, කම්කරු පංති ව්‍යාපාරයේ හැකියාවන් වඩාත් පුළුල්වීමට පටන් ගෙන ඇත. ඇතිවී තිබෙන අසීරු තත්වයෙන් ගොඩ ඒමට ඇති එකම මාර්ගය සමාජවාදය බව වඩාත් පුළුල් ජනතා කොටස්වලට ඒත්තු යන නිසා එම කොටස් ධනපති ක්‍රමයට විරුද්ධව ක්‍රියාශීලී අරගලයට සහභාගී කරවා ගැනීමට ඉවහල් වන වාසිදයක තත්වයන් පැන නැග තිබේ.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

සමාජවාදී ක්‍රමය ධනපති ක්‍රමයට වඩා වාසිදායක බව පැහැදිලි ලෙසම පෙන්වන සමාජවාදී රාෂ්ට්‍ර පද්ධතිය විසින් ලබාගත් ජය නිසා නිර්ධන පංති ව්‍යාපාරයේ බලය වැඩිවේ. ධනපති රටවල කම්කරුවන් ගෙනයන සටන්වලට මේ ජයග්‍රහණ නිසා ආස්වාදයක් ලැබෙන අතර සමාජවාදයේ අනාගත ජය පිළිබඳ ඔවුන් තුළ මහත් විශ්වාසයක්ද ඇතිවේ.

සමකාලීන කම්කරු පංති ව්‍යාපාරයේ විශේෂතාවය නම්, නිර්ධන පංතිය සමාජවාදය සඳහා කරන සටන පොදු ජනතාව ගෙන යන සාමය, ජාතික ස්වාධීනත්වය සහ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වූ ව්‍යාපාරය සමග ඒකාබද්ධ වී තිබීමය. සමකාලීන ප්‍රජාතන්තවාදී ව්‍යාපාරය පිළිබඳ විස්තරයක් අපි පසුව ඉදිරිපත් කරමු.

සිය අයිතිය සඳහාත්, ප්‍රජාතන්ත්‍රවාදය හා සමාජවාදය සඳහාත් කරන සටනේදී නිර්ධන පංතිය විවිධ සටන් ක්‍රම අනුගමනය කරයි. වැඩ වර්ජන, පෙළපාලි පැවැත්වීම්, රැස්වීම්, හා සාකච්ඡා ආදී වශයෙනි. නිර්ධන පංතිය පාර්ලිමේන්තු අරගලයද උපයෝගී කරගනී.

අද තත්වයන් යටතේ ඉතාමත් පුළුල් ලෙස යොදගන්නා සටන් ක්‍රමය වැඩ වර්ජනය ය. මාක්ස්වාදයේ සතුරන් නිර්ධන පංතිය හා ධනපති පංතිය අතර පංතිමය සාමයක් ගැන කතා කළද, ධනපති රටවල වැඩ වර්ජන ව්‍යාපාරය ප්‍රමාණයෙන් හා ශක්තියෙන් වර්ධනය වෙමින් පවතී. 1974 දී වැඩ නැවැත්වීම් වලට සහභාගි වූ වැඩකරන ජනතාවගේ සංඛ්‍යව හයකෝටි පනස් ලක්ෂයකි. 1969 හයකෝටියකි. 1965 තුන්කෝටි හැට ලක්ෂයකි.

කම්කරුවන්ගේ ඉල්ලීම්ද ආර්ථික රාමුව බිඳගෙන ගොස් දේශපාලනමය ස්වරූපයක් ගන්නා බවද සටහන් කළ යුතුය. කම්කරු පංතිය හා එහි විප්ලවවාදී පෙරමුණ බල ඇණිය වන මාක්ස්වාදී පක්ෂ තම ප්‍රධාන පහර එල්ල කරන්නේ ප්‍රතිගාමිත්වයේ හා ආක්‍රමණයේ කේන්ද්‍රස්ථානය වන්නාවූද, අවි තරඟයේ සහ වැඩකරන ජනතා විඳින කරදරවලට වගකිව යුතු වැරදි කරුවන් වූද ධනවාදී ඒකාධිකාරීන්ට විරුද්ධවය.

ඒකාධිකාරීන්ට විරුද්ධව සටන් කරන කම්කරු පංතියේ සගයින්ගේ කවය පුළුල් වීම සමකාලීන කම්කරු පංති ව්‍යාපාරයේ වැදගත් විශේෂතාවයකි. දේශපාලනමය වශයෙන් වැදගත් බලවේගයක් වන ගොවිජනතාව නිර්ධන පංතියේ විරාගත හවුල් කරුවාය. නගරබද මැද කොටස් (කුඩා ව්‍යාපාර හිමියෝ, හස්ත කර්මාන්ත කරුවෝ, වෙළෙන්දෝ) සිය අයිතිවාසිකම් සඳහා ක්‍රියාශීලී ලෙස සටන් කරති. විද්‍යා තාක්ෂණික විප්ලවය නිසා ශ්‍රමය වැය කරන

කම්කරු හමුදවට වැඩි වැඩියෙන් බුද්ධිමත්හු ඇතුළු වෙති. ප්‍රජාතන්ත්‍රවාදය සහ සමාජවාදය සඳහා කම්කරු පංතිය ගෙන යන සටන සමග බුද්ධිමතුන්ගේ අයිතිවාසිකම්ද අඛණ්ඩව වෙළී පවතී. තරුණයින්ගේ ක්‍රියාකාරිත්වයද දියුණු වේ. ධනපති ක්‍රමය යටතේ තමන්ට අනාගතයක් නැති බව දකින කම්කරු පංති තරුණයෝද, ශිෂ්‍යයෝද සිය අයිතිවාසිකම් සඳහා පමණක් නොව, ධනපති සමාජයේ පදනම්වලට විරුද්ධවද සටන් කරති. ඒකාධිකාරී ධනවාදයට විරුද්ධව ආගම් විශ්වාස කරන්නෝද, කාන්තාවෝද සටන් කරති.

සාමය, ප්‍රජාතන්ත්‍රවාදය සහ සමාජවාදය සඳහා අධිරාජ්‍යවාදී ප්‍රතිගාමිත්වයට විරුද්ධව ගෙනයන අරගලයේදී වඩාත් විශාල දේශපාලන ක්‍රියාකාරිත්වයක් සහ සුවිශේෂ පුළුල් හැකියාවක් ඇතිවී තිබීම වත්මන් කම්කරු පංති ව්‍යාපාරයේ විශේෂ ලක්ෂණයකි.

කොමියුනිස්ට් හා කම්කරු පක්ෂවල වර්ධනය විසින් වැඩකරන ජනතාවගේ විඥනයේ ගැඹුරු වෙනස්වීම් පෙන්නුම් කෙරේ. මීට අවුරුදු හැටකට පෙර වී. අයි. ලෙනින්ගේ නායකත්වයෙන් රුසියාවේ වැඩකරන ජනතාව ධනපති ක්‍රමය පෙරළා දැමූ අවධියේදී ලෝකය පුරා සිටි කොමියුනිස්ට්වාදීන්ගේ සංඛ්‍යාව හාර ලක්ෂයක් පමණ විය. එහෙත් අද ලෝක කොමියුනිස්ට් ව්‍යාපාරයේ සාමාජික සංඛ්‍යාව කෝටි ගණනකි. එය අතිශයින්ම බල සම්පන්න දේශපාලන බලවේගයකි.

කොමියුනිස්ට් හා ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරයට විරුද්ධව ප්‍රතිගාමී අධිරාජ්‍යවාදී කොටස් තිරස්චීන, මර්දනකාරී පියවර ගනිති. ඔවුහු වැඩි වැඩියෙන් විවෘත ආඥාදායක ක්‍රම උපයෝගී කර ගනිති. ප්‍රජාතන්ත්‍රවාදයේ ඉතිරි කොටස් පවා අකාමකා දමා 'ප්‍රචණ්ඩකාරී' ආණ්ඩු පිහිටුවමින් ජනතාව මර්දනය කිරීමේ ක්‍රම පාවිච්චි කරති. සමහර ධනපති රටවල පැසිස්ට්වාදයේ අශුභ ලක්ෂණ ඇතිවීමට පටන් ගෙන තිබේ.

විප්ලවවාදී ව්‍යාපාරයේ සමාජමය පදනම පුළුල්වීම නිසා ඒකාධිකාරිත්වයට විරුද්ධව එක්සත් පෙරමුණක පදනම ශක්තිමත් විය. මොස්කව්හි පවත්වන ලද කොමියුනිස්ට් හා කම්කරු පක්ෂවල ජාත්‍යන්තර සාකච්ඡාව විසින් සම්මත කර ගන්නා ලද ලියවිල්ලේ මෙසේ සඳහන් වේ. ''සමාජවාදය සඳහා දිගටම සටන් කිරීමට වඩාත් හිතකර තත්වයන් සහතික කරන්නාවූ ආර්ථික සහ දේශපාලන පරිවර්තනයන් ඇති කිරීමට සහ මහා ප්‍රාග්ධනයේ බලය අවසන් කිරීමටද, රටවල්වල ආර්ථිකයේ ක්‍රියා කලාපය තීරණාත්මක ලෙස සීමා කිරීමටද සමත් සියලු ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවණතා එකම දේශපාලන සංගමයකට එක්සත් කිරීමටද හැකියාවක් ලබාදෙන පූර්ව තත්වයන්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ඇතිවෙමින් පවතී. ප්‍රජාතන්ත්‍රවාදී එම හවුලේ ප්‍රධාන බලවේගය කම්කරු පංතිය වන්නේය.''*

අධිරාජ්‍යවාදී ප්‍රතිගාමීත්වය හා කම්කරු පංති ව්‍යාපාරයේ ඔවුන්ගේ හවුල් කරුවන් වන කොමියුනිස්ට් විරෝධී දක්ෂිණාංශික සමාජ ප්‍රජාතන්ත්‍රවාදී නායකයෝද, එමෙන්ම සියලු වර්ගවලට අයත් අවස්ථාවාදියෝද කම්කරු පංතියේ එක්සත්කමට බාධා කරති. භේදකාරී ප්‍රතිපත්ති අනුගමනය කරති. මාක්ස්–ලෙනින්වාදී න්‍යායයේ හරය විකෘති කරමින් කොමියුනිස්ට් ව්‍යාපාරයට මඩ ගැසීමට උත්සාහ කරති. මේ නිසා වත්මන් අවධියේදී කම්කරු පංති ව්‍යාපාරය හා කොමියුනිස්ට් ව්‍යාපාරය තුළ අවස්ථාවාදීන්ට විරුද්ධව කරන සටන ඉතා වැදගත්ය. දක්ෂිණාංශික මෙන්ම ''වාමාංශික'' සංශෝධනවාදයද මාක්ස්-ලෙනින්වාදී මූලධර්මවලට නොගැලපෙන බැවින් මේවාට විරුද්ධව තීරණාත්මක ලෙස නැගී සිටීම අවශ්‍ය වන්නේය. ජාතිවාදය හා ආධිපත්‍යය සමග සම්බන්ධ වී ඇති, මාක්ස්-ලෙනින්වාදයෙන් 'වමට' සහ දකුණට බරවීම විශේෂයෙන්ම අවදනමිය.

ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරයේ සමගිය නිරතුරුවම ආරක්ෂා කිරීමද, එම සමගියට හානිවන කිසිවක් නොකිරීමට වග බලා ගැනීමද යන කොන්දේසි ඉටුකිරීම ජාතික ස්වාධීනත්වය, ප්‍රජාතන්ත්‍රවාදය සහ සාමය සඳහා කරන සටනේදීත්, සමාජවාදී විප්ලවයේ සමාජවාදය හා කොමියුනිස්ට්වාදය ගොඩ නැගීමේ කාර්ය භාරයන් සාර්ථක ලෙස ඉටු කිරීමේදීත් ජයග්‍රහණය සහතික කිරීම සඳහා අවශ්‍ය වන්නේය.

4. ධනවාදයේ සිට සමාජවාදය දක්වා පරිවර්තනය වන යුගයේදී පංති සහ පංති සටන

නිෂ්පාදන මාධ්‍යයන්ගේ පෞද්ගලික අයිතිය සහ ප්‍රතිවිරෝධී සතුරු පංති බිහිවූ ද සිටම සූරාකන්නන් හා සූරාකනු ලබන්නන් අතර සමාදාන නොකළ හැකි අරගලයක් පවතින බව අපි දනිමු. මේ අරගලය අවසානයේදී සමාජවාදී විප්ලවය වෙත යොමුවේ. එහි ප්‍රතිඵලයක් වශයෙන් ධනපති පංතියේ පාලනය ඉවත්කර වැඩකරන ජනතාවගේ ආණ්ඩුවක්, නිර්ධන පංතික ආඥාදායකත්වයක් පිහිටුවනු ලැබේ. එයින්

* ''කොමියුනිස්ට් හා කම්කරු පක්ෂවල ජාත්‍යන්තර සමුළුව''. මොස්කව්, 1969. පිටුව 130.

ධනවාදයේ සිට සමාජවාදය දක්වා පරිවතනය වන අවධියේදී නිර්ධන පංතික ආඥාදායකත්වයක් තහවුරු වන්නේය.

ධනවාදයේ සිට සමාජවාදය දක්වා පරිවර්තනය වන අවධියේදී පංති සටන නොවැළැක්විය හැකිය. අවුරුදු දසක ගණනාක් තිස්සේ තමන් විසින් සූරාකෑමට භාජනය කළ මිනිසුන් ආණ්ඩු බලය අල්ලා ගැනීමත්, තමන් විසින් පරිශුද්ධ දෙයක් ලෙස සලකනු ලැබූ පෞද්ගලික අයිතිය උදුරා ගැනීමත් නිසා ධනපතීහු එම ජනතාවට සමාව නොදෙන අතර බලයෙන් පහ කරනු ලැබූ ඔවුහු එම තත්වය පිළිගෙන නිහඬවීමට කිසිම ලෙසකින්වත් එකඟ නොවෙති. සදාකාලික සහ අනුල්ලංඝනීය සේ පෙනුණු තම කුසීත, කරදර රහිත ජීවිතයද, තම ධනය, වරප්‍රසාද සහ සීමා රහිත බලයද, නිමාවට පැමිණි බව ධනපති පංතිය පිළිනොගනී. නව නිර්ධන පංති රජයට විරුද්ධව ඔවුන් අතිශයින්ම සාහසික ලෙසත්, උන්මත් හා අවිචාර ස්වභාවයකිනුත් සටන් කරන්නේ එබැවිනි.

ධනවාදයේ සිට සමාජවාදය දක්වා පරිවර්තනයේ අවධියේදී පංති සටන

නිර්ධන පංතියට විරුද්ධව කරන සටනේදී ධනපතීහු විවිධ ක්‍රම පාවිච්චි කරති. සිය ආර්ථික තත්වයද, ඉහතදී උසස් පෙළේ බුද්ධිමතුන්, සිවිල් නිලධාරීන් සහ යුද්ධ හමුද නායකයින් සමග ඇති කර ගෙන තිබූ සම්බන්ධකමද පාවිච්චියට ගන්නා ධනපති පංතිය රටේ ආර්ථික ය කඩාකප්පල් කිරීමටද, රාජ්‍ය ආයතනවල හා ආරක්ෂක කටයුතු අවුල් කිරීමටද උත්සාහ දරති. එය ජනතාව කෙරෙහි මානසික වශයෙන් බල පෑමටද ප්‍රයත්න දරයි. අවසානයේදී, ධනපති ක්‍රමය ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා ජාත්‍යන්තර ප්‍රාග්ධනයේ ආධාරය කෙරේ සිය ප්‍රධාන බලාපොරොත්තුව රඳවමින්. එය වැඩකරන ජනතාවට විරුද්ධව විවෘත අවිගත් සටන් ආරම්භ කරයි. ඓතිහාසික අත්දැකීම් (ළදරු සෝවියට් රජයට විරුද්ධව අධිරාජ්‍යවාදී රටවල් 14 ක් එකතුවී කළ ආක්‍රමණයද, කොරියාවේ අධිරාජ්‍යවාදී ආක්‍රමණයද, 1956 ඔක්තෝබර් මාසයේදී හංගේරියාවේ සිද්ධීන්ද) විසින් පෙන්වා දී ඇති පරිදි ජයගත් නිර්ධන පංතියට, තම රටේ ධනපති පංතියට විරුද්ධව පමණක් නොව, ජාත්‍යන්තර ප්‍රතිගාමී ධනපති පංතියට විරුද්ධවද, දරුණු අරගලයක් කිරීමට අනිවාර්ය වශයෙන්ම සිදුවේ.

පරිවර්තන අවධියේදී, දිගටම කෙරීගෙන යන පංති සටන නිර්ධන පංති ආඥාදායකත්වය විසින් අහෝසි නොකෙරෙන බව මෙයින් වැටහේ. එහෙත් දැන් එම අරගලය කෙරෙන්නේ නිර්ධන පංතිය දේශපාලනමය වශයෙන් බලය ලබා ගෙන සිටින සහ එය ආර්ථිකයේ

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ප්‍රධාන ස්ථාන පාලනය කරන තත්වයක් යටතේදීය. එම තත්වයන්ට සරිලන පරිදි පංති අරගලයේ ක්‍රමයද වෙනස්වේ. "නිර්ධන පංතික අඥාදයකත්වය පංති සටනේ අවසානය නොව, අලුත් ක්‍රම අනුව එය දිගටම කරගෙන යාමකි. නිර්ධන පංති ආඥාදයකත්වය යනු, පරාජය කරන ලද, විනාශ නොකරන ලද හා අතුරුදහන් නොවූ ධනපති පංතියට විරුද්ධව සටන් කිරීම නොනැවැත්වූ, වඩාත් දැඩි ලෙස සටන් කරන ධනපති පංතියට විරුද්ධව, දේශපාලන බලය ලබා ගත්, ජයග්‍රාහී නිර්ධන පංතිය විසින් ගෙන යන පංති සටනකි,"* යි ලෙනින් ලීවේය.

ධනපති ක්‍රමයේ සිට සමාජවාදය දක්වා පරිවර්තනය වීමේ කාලයේදී පංති සටන්වල අලුත් ආකාරයන් මෙසේය. ඒවා නම් සමහර විටෙක බලහත්කාරය වුවද යොදවා සූරාකන්නන්ගේ ප්‍රතිවිරෝධනය මැඩ පැවැත්වීමද, ධනපති පංතියේ බලපෑමෙන් ගොවිජනතාව මුදවා ගැනීම සඳහා සහ ඔවුන් සමාජවාදය ඉදිකිරීමේ කටයුතුවලට සහභාගි කරවා ගැනීම සඳහා අරගල කිරීමද ආර්ථිකයේ සේවය සඳහා ධනපති විශේෂඥයින් බඳවා ගැනීමද, සමාජවාදී විනය පිළිබඳ ජීව ගුණයෙන් යුත් අධ්‍යාපනයක් ජනතාවට ලබාදීමද වේ.

පරාජයට පත්වූ නමුදු ප්‍රතිරෝධනයෙහි යෙදී සිටින ධනපති පංතියට විරුද්ධව කම්කරු පංතිය හා ගොවි ජනයා විසින් සමාව නොදෙන සටනක් ගෙනයාම ධනපති ක්‍රමයේ සිට සමාජවාදය කරා පරිවර්තනය වන අවධියේදී සමාජ සංවර්ධනයේ ප්‍රධාන සාධකයක් වන්නේය. මෙ සටන අවසානයේදී ධනපතීන්ගේ පංතිය අහෝසි කිරීමටද, මිනිසකු විසින් මිනිසකු සූරාකෑමක් නැති සමාජයක් පිහිටුවීමටද මග පැදෙයි.

බලහත්කාරය පාවිච්චි කිරීම පිළිබඳව නිර්ධන පංතියේ ආකල්පය

ධනපතීන්ගේ ප්‍රතිරෝධනය මැඩීම සඳහා කම්කරු පංතිය කිනම් මාධ්‍යයන් පාවිච්චි කරන්නේද? බලහත්කාරය යෙදවීම සම්බන්ධයෙන් එහි ආකල්පය කුමක්ද?

නිර්ධන පංතික ආඥාදයකත්වය සීමාරහිත ත්‍රස්තවාදී සහ විනාශකාරී පාලනයක් බව පෙන්වීමට උත්සාහ දරන ධනපති දෘෂ්ටිවාදීහු, ධනපති පංතියට විරුද්ධ සටනේදී නිර්ධන පංතිය යොද ගන්නා එකම මාධ්‍යය බලහත්කාරය' හා අවි ගත් අරගලය වන බව කියති. ඒ කෙසේවුවද, මාක්ස්–ලෙනින්වාදය ඇත්ත වශයෙන් කටයුතු කරන්නේ, එකිනෙකට වෙනස් ක්‍රම වූ බලහත්කාරය හා සාමකාමී ක්‍රම යන දෙකම

* වි. අයි. ලෙනින්. සම්පූර්ණ කෘතීන්, වෙළුම 29, පිටුව 350.

පාවිච්චි කළ හැකිය යන ප්‍රතිපත්තිය න්‍යායික මෙන්ම ව්‍යවහාරික වශයෙන්ද පිළිගැනීම පදනම් කරගෙනය.

අප යුගයේ අතිශයින්ම මානව හිතවාදී පංතිය නිර්ධන පංතියය. එය මිනිස් සංස්කෘතියේ අගනා දෑ ආරක්ෂා කිරීමට හා අභිවර්ධනය කිරීමටද, නිෂ්පාදන මට්ටම උසස් කිරීමට සහ ප්‍රධාන නිෂ්පාදන බලවේගය වන මිනිසා, නැතහොත් වැඩකරන ජනතාව, ආරක්ෂා කිරීමටද වෙරදරයි. ධනවාදයේ සිට සමාජවාදය දක්වා සාමකාමී ලෙස පරිවර්තනය වීම ගැන නිර්ධන පංතිය ඉතා විශාල උනන්දුවක් දක්වන්නේ එබැවිනි. සාමකාමී මාර්ගය උපයෝගී කරගැනීමෙන් ද්‍රව්‍යමය වස්තූන් ඉමහත් සම්භාරයක් ආරක්ෂා කොට, ජීවිත බොහෝ ගණනක් බේරා ගත හැක. එබැවින්, ලෙනින් ලියුවාක් මෙන්, ජනතාව විසින් ගතයුතු ඉතාමත් වේදනා රහිත, ලෙහෙසි, ඉතාම වාසිදායක මාර්ගය එයය.

විප්ලවය ගන්නේ සාමකාමී හෝ සාමකාමී නොවන මගක්ද යන්න රඳා පවතින්නේ හුදෙක් කම්කරු පංතියේ කැමැත්ත පමණක් මත නොවේ. ධනපතීන්ගේ ප්‍රතිරෝධනයේ තරම සහ කටයුතු පහසු කිරීමට ඔවුන් කොතරම් සූදානම්ද යන්න මතය. එය කිසියම් පංතියක අභිලාෂය හෝ පුද්ගලයින්ගේ කැමැත්ත පරිදි හෝ නොව, එක්, එක් රටක පංතිවල වාස්තවික බලතුලනය මත රඳා පවතී.

ජයගත් කම්කරු පංතියේ හා එහි හවුල් කරුවන්ගේ ශක්තිය ධනපතීන්ගේ ශක්තියට වඩා තීරණාත්මක ලෙස වැඩි නම්, අවිගත් සටන් මගින් විරුද්ධවීම බලාපොරොත්තු රහිත දෙයක් බව අවබෝධ කර ගන්නා ධනපති පංතිය, ලෙනින් කීවාක් මෙන් තමන්ගේ "ඔළුගෙඩි රැකගැනීමට" ඉදිරිපත් වනු ඇත. එවිට විප්ලවය සාමකාමී මගක් ඔස්සේ වර්ධනය වීමට ඉඩකඩ ඇතිවේ. නව රජයේ ඉල්ලීම්-වලට ඉඩදීමට ධනපති පංතිය එකඟ නොවෙති නම්, ඉතිහාසයේ ඉදිරි ගමන ආපසු යැවීම සඳහා අවිගත් සටන් කිරීමට ධනපතීන් සූදානම් වෙති නම්, ධනපති ප්‍රතිරෝධනය අවිගත් සටන් අරගල මගින් මැඩ පැවැත්වීම හැර වෙනත් මගක් කම්කරු පංතිය සහ වැඩකරන ජනතාව ඉදිරියේ නැත. එවැනි අවස්ථාවකදී දිනාගත් අයිතිය ආරක්ෂා කිරීම සඳහාත්, වැඩකරන ජනතාව ප්‍රමුඛ සියලු ජනතාවගේ ජීවමය අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහාත් ක්‍රියා කිරීම හැර වෙනත් මගක් නැත.

පළමුවැනි වරට සමාජවාදී විප්ලවය ජයගත් සෝවියට් දේශයේ, ධනපති පංතිය තමන්ට නැතිවුනු බලයත්, පෞද්ගලික අයිතිය සහ වරප්‍රසාදත් යළිත් ලබාගැනීම සඳහා බලහත්කාරය මගින් ප්‍රයත්න

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

දරමින් ජාත්‍යනතර ප්‍රාග්ධනය හා එක්ව අවිගත් සටන් කළේය. එවැනි තත්වයන් යටතේ බලහත්කාරී ශක්තිය මගින් ධනපති පංතිය මැඩීම හැර වෙනත් විකල්පයක් කම්කරු පංතිය ඉදිරියේ නොතිබිණි. ඒ අනුව ධනපති පංතිය මර්දනය කිරීම සඳහා සෝවියට් සංගමයේ පරිවර්තන යුගයේදී ඇතිවූ සිවිල් යුද්ධය, අවිගත් සටන් අරගල පංති සටනේ එක් ස්වරූපයකි. කුලාක් වරුන්ට හෙවත් පොහොසත් ගොවීන්ට විරුද්ධවද බලහත්කාරී ක්‍රම පාවිච්චි කරන ලදී.

එසේවුවද, යුරෝපීය මහජන ප්‍රජාතන්ත්‍ර රාජ්‍යවල පංති සටනේ අත්දැකීම් අනුව, පරිවර්තන අවධියේදී බලහත්කාර ක්‍රම මගින් ධනපති පංතිය මර්ධනය කිරීම පංති අරගලයේදී සැම විටම අවශ්‍ය වන දෙයක් නොවන බව පෙනේ. මේ රටවල නියම බලය නිර්ධන පංතිය පැත්තේ වූ බැවින්, ඒවායේ සිවිල් යුද්ධ ඇති නොවීය. එම රටවල ප්‍රතිගාමී බලවේගවල ප්‍රධාන පදනම් ජර්මන් පැසිස්ට්වාදයට විරුද්ධව කළ විමුක්ති සටනේදී විනාශ කර තිබුණි. ඉතිරිවූ ධනපති කොටස්වලට සෑහෙන බලයක් නොතිබුණෙන්, මහජන ආණ්ඩුවට විරුද්ධව අවිගෙන සටන් කිරීමේ අවදානම් පියවර නොගත්හ. ඒ අතරම, මේ රටවල් නට්සිවාදයෙන් මුදගත් සෝවියට් හමුදාවේ සේනා එහි සිටීම නිසා, ලෝක අධිරාජ්‍යවාදී ප්‍රතිගාමිත්වයටද එම රටවල් තුළ යුද්ධමය ඇඟිලි ගැසීම් සංවිධානය කිරීමට බැරිවිය.

පරිවර්තන යුගයේදී පංති සටන්වල තියුණු භාවය රටින් රටට පමණක් නොව එකම රටකත් එහි සංවර්ධනයේ නොයෙක් අවධිවලදීද විවිධාකාර වේ. සෝවියට් සංගමයේ සහ මහජන ප්‍රජාතන්ත්‍රවාදී රටවල ඓතිහාසික අත්දැකීම් පෙන්වා දී ඇති පරිදි, නිර්ධන පංතික ආඥාදායකත්වය ශක්තිමත් වන හා සමාජවාදී ඉදිකිරීම් සාර්ථක වන කල්හි පංතිවල තුල්‍යතාවය සමාජවාදයට වාසිදායක ලෙස නොනැවතීම වෙනස්වීම නිසා සතුරු පංතිවල නශ්ඨාවශේෂ විසින් ඉදිරිපත් කරන ප්‍රතිරෝධනය දුර්වල වන්නේය. ධනවාදයේ සිට සමාජවාදය කරා පරිවර්තන වන අවධියේදී රටක් අභ්‍යන්තරයේ පංති අරගලයේ පොදු සංවර්ධන ප්‍රවණතාවය එසේය.

පරිවර්තන අවධියේදී පංති සටන විවිධ ආකාර ගත හැකිය යන ප්‍රතිපත්තිය පිළිගන්නා නිර්ධන පංතිය සහ එහි මාක්ස්වාදී පක්ෂය පංති සටන්වල සියලු ආකාර නිපුණත්වයක් ලබාගැනීමේ හා පවත්නා නිශ්චිත තත්වයට ගැලපෙන, එමෙන්ම, වාස්තවික පංති බලතුලනයට ගැලපෙන සටන් ක්‍රම යොදගැනීමේ අරමුණ ඇතිව කටයුතු කරනු ඇත.

5. සමාජවාදී සමාජයේ පංති සංයෝජනය

සෝවියට් සංගමයේ සමාජවාදය ගොඩනැගීමත් සමගම සෝවියට් සමාජයේ පංති සංයුතිය සම්පූර්ණයෙන්ම වෙනස් විය. පෞද්ගලික නිෂ්පාදන අයිතියද, මිනිසකු විසින් මිනිසකු සූරාකෑමද සදහටම නැති කර දමන ලදී. නගරයේ මෙන්ම ගමේද සූරා කන පංතිය නැතිකරනු ලැබීය.

ඉතිරි වූයේ මිතුරු පංති දෙකක්වන කම්කරු පංතිය සහ සමූහ ගොවි ජනතාවද පමණකි. ඊට අමතරව සෝවියට් ආණ්ඩුව පිහිටුවීමෙන් ඉක්බිතිව හාත්පසින්ම වෙනස් වීමකට භාජනය වූ වැඩකරන බුද්ධිමත්හුද වෙති.

මෙම කම්කරු පංතිය ධනපති ක්‍රමය යටතේ සූරාකෑමට භාජනය වූ අයිතිවාසිකම් නැති නිර්ධනයෝ නොවෙති. වෙනත් සියලු ජනතාවද සමග නිෂ්පාදන මාධ්‍යයන් අයත් කරගෙන සිටින කම්කරු පංතිය රටේ සැබෑ ස්වාමියා වන්නේය. සෝවියට් ආණ්ඩු සමය තුළදී කම්කරු පංතිය ප්‍රමාණය හා සංඛ්‍යාව අතින් වැඩී දුන් රටේ වැඩකරන ජනතාවගෙන් හරි අඩක් නියෝජනය කරයි. කම්කරු පංතියේ සංස්කෘතික තාක්ෂණික මට්ටමද, අධ්‍යාපනයද, විනය ගරුක භාවය හා සංවිධානයද බොහෝසේ වැඩිණි. සමාජමය නිෂ්පාදනයේ ප්‍රධාන බලවේගය වන කම්කරු පංතිය අතිශයින්ම විප්ලවවාදී විනය ගරුක, සංවිධානාත්මක සහ විංඥත පංතියය. වර්ධනය වූ සමාජවාදී සමාජයේ කම්කරු පංතිය සමාජමය ව්‍යුහයේද, මුළු සමාජ සම්බන්ධකම් පිළිබඳ මුළු පද්ධතියේද ප්‍රධාන ස්ථානය ගෙන සිටී.

කෘෂිකර්මය සාමූහික කිරීමද සංස්කෘතික විප්ලවයද විසින් සෝවියට් ගොවීන්ගේ තත්වය හාත්පසින්ම වෙනස් කැරිණි. ඉඩම් හිමියන්ගේ හා කුලාකයින්ගේ සූරාකෑමට භාජනය වූ, අසමගිව හා පීඩිතව සිටි ගොවියෝ මහා පරිමාණ යන්ත්‍ර කෘෂිකර්මාන්තයක වැඩකරන සැබෑ නිදහස් පංතියක් බවට පත්වූහ.

සියවස් ගණනක් තිස්සේ කොන්වී සිටි ගොවියා සාමූහිකව වැඩ කිරීම නිසා එම කොන් වීම කෙළවර විය. පෞද්ගලික අයිතිය පිළිබඳව ගොවීන් තුළ තිබූ මානසික හැඟීම්, ඉවතලීමට උපකාර වූ එය ඔවුන් තුළ සාමූහික හැඟීමක්ද මිත්‍රත්වයක් සහ සහයෝගිතාවයක් ඇති කළේය. ගම්බද නවීන තාක්ෂණික ක්‍රම පුළුල් ලෙස ක්‍රියාවට යෙදීම නිසා උසස් පුහුණුවක් ලත් යන්ත්‍ර ශිල්පීහු ඇතිවූහ. මොවුන්ගේ ශ්‍රමය කම්කරුවන්ගේ ශ්‍රමයට වඩා වෙනස් නොවේ.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

සෝවියට් බුද්ධිමත්හුද අති විශාල වෙනසකට පාත්‍ර වූහ. බහුතර වශයෙන් කම්කරුවන් හා ගොවීන් අතරෙන් බිහිවූ සෝවියට් බුද්ධිමත්හු සැබැවින්ම ජනතා බුද්ධිමත්හු වෙති. ජනතාවගෙන් බිහිවූ ඔවුහු ජනතාවට අවංකව හා ආත්ම පරිත්‍යාගී ශීලීව සේවය කරති. නිෂ්පාදනයේ, විද්‍යාවේ, තාක්ෂණිකයේ සහ සංස්කෘතියේ දියුණුවත් සමගම බුද්ධිමතුන්ගේ සංඛ්‍යාව, විශේෂයෙන් තාක්ෂණික හා විද්‍යාව දන්නා අයගේ සංඛ්‍යාව වැඩිවෙමින් පවතී. 1975 දී ජනතා ආර්ථිකයේ සේවය කළ විශේෂඥයින්ගේ සංඛ්‍යාව දහ අට ලක්ෂ හැට හය දහකි. මින් හත් ලක්ෂ දහහතර දහක්ම උපාධිධාරීන්ය. එකොළොස් ලක්ෂ පනස් දෙදහක් මධ්‍යම අධ්‍යාපනය සහ විශේෂ කාර්මික අධ්‍යාපනයක් ලැබූ අය වෙති.

ආධිපත්‍යයේ සහ යටත්භාවයේ පංති සම්බන්ධකම් සෝවියට් සංගමයෙන් සදහටම නැති කර දමා තිබේ. මෙහි වරප්‍රසාද ලබන පංති හෝ කණ්ඩායම් හෝ නැත. සමාජයේ සියලු සාමාජිකයෝ නිෂ්පාදන මාධ්‍යයන් කෙරෙහි එක හා සමාන සම්බන්ධයක් ඇතිව සිටිති. මේ නිසා සූරාකෑමට, නැතහොත් අනුන්ගේ ශ්‍රමය උදුරාගැනීමට හැකියාවක් නැත. ආයෝජනය කරන ලද ප්‍රාග්ධනය අනුව නොව සෑම කෙනෙක්ම කළ වැඩ අනුව ඔහුට ආදයම ලැබේ.

සූරාකන්නන් හා සූරාකනු ලබන්නන් නොමැති බැවින් සහ ඇත්තේ වැඩකරන ජනතාව හා සමාජවාදී සමාජයේ සමාජ කණ්ඩායම් පමණක් වන බැවින් පංති සටන්ද නැත.

සෝවියට් ජනතාවගේ සමාජමය–දේශපාලන හා දෘෂ්ටිමය සමගිය ගොඩ නැගී ඇත්තේ සමාජවාදී සමාජය තුළය. මෙම සමගිය පැන නගින්නේ කම්කරු පංතියේ, ගොවි ජනතාවගේ සහ බුද්ධිමතුන්ගේ මූලික ආර්ථික හා දේශපාලන අරමුණුවලිනි. ඔවුන්ට ශ්‍රේෂ්ඨතම ද්‍රව්‍යමය සහ සංස්කෘතික සෞභාග්‍යයක් ගෙන එන කොමියුනිස්ට්වාදී සමාජය ගොඩනැගීමට ඔවුන් තුළ ඇති ඒකමතික අභිලාෂයෙනි. ඒකාබද්ධ ලෙස ප්‍රයත්න දරමින් දුෂ්කරතම බාධකයන් පරාජය කිරීමටද, ශ්‍රේෂ්ඨ ඓතිහාසික වැදගත්කමක් ඇති කර්තව්‍යයන් ඉටුකිරීමටද හැකිවන සේ එක්ව හා සංගතශීලීව කටයුතු කිරීම පිණිස සෝවියට් ජනතාවගේ උවමනාවන්ගේ මෙම පොදු ස්වභාවය ඔවුනට රුකුලකි. තම උවමනාවන්ගේ පොදු ස්වභාවයෙන් එකට බැඳුනු හා සටන් සමගියෙන් එකට වෙළී සිටින, එමෙන්ම කොමියුනිස්ට්වාදයේ අති බලවත් අදහස්වලින් ඔද වැඩී සිටින දශ ලක්ෂ සංඛ්‍යාත ජනතාවගේ බලමහිමය ශ්‍රේෂ්ඨ අපරාජිත ශක්තියකි.

සෝවියට් සමාජයේ පංති ව්‍යුහය ගාමකශීලීය. එය පංතිමය ආන්තරතාවය සහ සමාජමය ඒකීයතාවය නිසා වර්ධනය වේ. එය පංති භේද මැඩ නැගී සිටී.

6. පංති භේද නැති කිරීමේ මාර්ග

සමාජවාදී සමාජයේ මිතුරු පංති දෙකක් ඇත. ඒ කම්කරු සහ ගොවි පංති ය. මෙයට හේතුව සමාජවාදය යටතේ පොදු ජනතා සහ සමුපකාර හා සමූහ ගොවි යන දේපල ක්‍රම දෙකක් තිබීමය. ඒ නිසා නගරය සහ ගම අතර වෙනස්කම්ද ඇත්තේය. එපමණක් නොව, සමාජවාදය යටතේ බුද්ධිමතුන්ගෙන් සමන්විත සමාජමය තට්ටුවක්ද ඇත්තේය. එය පවතින්නේ මොළය වෙහෙසා සහ කය වෙහෙසා වැඩකරන ජනතාව අතර ඇති තාත්වික වෙනසේ ප්‍රතිඵලයක් වශයෙනි.

එබැවින්, පංති භේදය නැතිකරලීමේ ක්‍රියාදමයට එනම්, එක් අතකින් පංති වෙනස්කම්ද, අනික් අතින් බුද්ධිමතුන්ද, කම්කරුවන් සහ ගොවීන්ද අතර ඇති දෙආකාර වෙනසද මකා දැමීම සඳහා ගෙන යන ක්‍රියාදමයට සැබැවින්ම අයත්වන්නේ නගර හා ගම් අතර ඇති වෙනසත්, මොළය වෙහෙසා සහ කය වෙහෙසා කරන වැඩ අතර ඇති වෙනසත් නැතිකරලීම වන්නේය. සෝවියට් සංගමයේ කොමියුනිස්ට් පක්ෂයේ 24 වැනි සම්මේලනයට ඉදිරිපත් කළ මධ්‍යම කාරක සභාවේ දේශපාලන වාර්තාවේ මෙසේ සඳහන් වේ. ''කම්කරු පංතිය, සමූහ ගොවි ජනතාව බුද්ධිමතුන්ට ළංකරවීම සඳහාද නගරය හා ගම අතර ඇති වෙනසත්, මොළය වෙහෙසා සහ කය වෙහෙසා කරන වැඩ අතර ඇති වෙනසත් ක්‍රමානුකූලව නැති කර දැමීම සඳහාද ක්‍රියා කිරීම පක්ෂයේ ප්‍රතිපත්තිය වේ. පංති රහිත කොමියුනිස්ට්වාදී සමාජය ඉදිකිරීමේදී එය එක් ප්‍රධාන කරුණකි.''*

නිෂ්පාදනීය බලවේගයන්ගේ සහ සමාජවාදී නිෂ්පාදන සම්බන්ධකම්වල අනවරත සංවර්ධනයද ඒවා කොමියුනිස්ට් සම්බන්ධකම් බවට පත්වන සේ වෙනස් වීමද පදනම් කරගෙන සෝවියට් සමාජයේ සමාජ වෙනස්කම් කෙමෙන් ඉවත් කෙරේ.

ධනපති ක්‍රමය යටතේ නගරය අනුකම්පා විරහිත ලෙස ගම සූරාකයි. මේ දෙකෙහි වුවමනාවන් අතර සමථයකට පත් කළ නොහැකි

---

* ''සෝ. ස. කො. පක්ෂයේ 24 සම්මේලනයේ ලියවිලි''. රුසියන් මුද්‍රණය, පිටුව 72.

https://liberationbase.wordpress.com

නගරය සහ ගම අතර ඇති මූලික වෙනස්කම් නැති කර දැමීමේ මාර්ග

ප්‍රතිවිරුද්ධතාවයක් ඇත්තේ එබැවිනි. සමාජවාදය නගරය සහ ගම අතර ඇති ප්‍රතිවිරුද්ධතාවය නැති කර දැම්මද, ආර්ථිකය, සංස්කෘතිය සහ ජීවන රටාව පිළිබඳ වූ තාත්වික වෙනස්කම් ඉතිරිව පවතී. නගරයේ හා කර්මාන්තවල දේපල රජය හෙවත් පොදු ජනතාව සතු අතර ගම්බද සමූහ ගොවිතැනෙහි දේපල කණ්ඩායම් සහ සමුපකාර ගොවිපල් සතුව පවතී. එපමණක් නොව, නගරය හා සසඳා බලන විට ගමේ සංස්කෘතික මට්ටම ඊට අඩුය. ජීවන රටාවද වෙනස්ය.

කොමියුනිස්ට්වාදය ඉදිකිරීමේදී, සමූහ ගොවිපළවල් සතු දේපල තවත් තහවුරු කිරීම නිසා එය ක්‍රමානුකූලව රජයේ දේපලට සමීප වේ. සමූහ ගොවිපළවල තාක්ෂණික පහසුකම් වර්ධනය කරන විට කෘෂිකාර්මික ශ්‍රමය, කර්මාන්තමය ශ්‍රමයේ එක් විශේෂයක් බවට පත්වන නිසා මෙසේ සිදුවේ.

කෘෂිකර්මය වඩාත් යාන්ත්‍රිකමය කිරීමත් සමගම ශ්‍රම ඵලදාවද, කෘෂිකාර්මික කාර්යක්ෂමතාවයද වැඩිවේ. මේ නිසා සමූහ ගොවිපොළවල සහ සමූහ ගොවීන්ගේ ආදායමද වැඩි වේ. සමූහ ගොවීන්ගේ වැටුප් ප්‍රමාණය හා ගෙවීමේ ක්‍රම නගරබද කාර්මික කම්කරුවන්ගේ වැටුප් ප්‍රමාණයට සහ ගෙවීමේ ක්‍රමයට වඩ වඩාත් සමීප වනු ඇත.

කෘෂිකාර්මික නිෂ්පාදනයේ ස්වභාවය වෙනස්වීමේ හේතුවෙන් ගොවීන්ගේ ජීවන රටාව සහ සංස්කෘතික මට්ටමද උසස් වී ගම්වල මුහුණුවරද වෙනස් වේ. ගම්බද පෙදෙස්වල මහා පරිමාණ වෙනස්කම් සිදුවෙයි. රථ ගාල්, යන්ත්‍ර අළුත් වැඩියා කර්මාන්ත ශාලා, විශාල ගබඩා, සත්වපාලන පට්ටි ගොඩනැගිලි, කෘෂිකාර්මික අමු ද්‍රව්‍ය හා ආහාර පිරියත් කිරීමත්, ගොඩනැගිලි ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමත් සඳහා ව්‍යවසායයන්, ආපනශාලා, බාලාංශ හා බාලාගාර, බේකරි, සාප්පු හා වෙනත් විවිධ සේවා ආයතනද සමූහ ගොවිපලවල් විසින් තනාගෙන යනු ලැබේ. සමූහ ගොවීන් සඳහා ගෙවල් සෑදීම වඩාත් විශාල වශයෙන් කෙරේ. නගරබද නිවාසවලට සමාන ලෙස මේවා සාදනු ලැබේ. උණුවතුර සහ ඇල්වතුර සඳහා මධ්‍යම නල ක්‍රමයක්ද, ශීත සමයේදී උණුසුම ලබාගැනීම සඳහා වාෂ්ප බැටරිද, නවීන පන්නයේ වැසිකිළි හා නාන කාමරද මේ අලුත් නිවාසවලට ඇත්තේය. සමූහ ගොවීන්ගේ ගම් ක්‍රමානුකූලව සමෘධිමත් නගරබද ජනපද දක්වා පරිවර්තනය වේ.

සංස්කෘතික මධ්‍යස්ථාන, සමාජශාලා, පුස්තකාල, පාසල්, ක්‍රීඩාංගන, ක්‍රීඩා පිටි ආදිය සඳහා සමූහ ගොවිපලවල් විශාල වශයෙන්

මුදල් ආයෝජනය කරයි. පොත්, දුරකථන, ටෙලිවිෂන් (රූපවාහිණී) සහ ගුවන් විදුලි යන්ත්‍රද සමූහ ගොවි ජීවිතයේ නිත්‍ය අංග ලක්ෂණ බවට පත්වී ඇත. ගම්බද සංස්කෘතික විශ්වවිද්‍යාල, ජනතා රඟහල්, සංගීත විද්‍යාල වඩාත් පුළුල් ලෙස පැතිරෙමින් පවතී. ආධුනික කලාකවයන්ද ජනප්‍රිය වී තිබේ.

ජනගහණය වෘත්තීන් අතර බෙදී යන ආකාරය වෙනස් වීම අනුවද නගරය හා ගම එකිනෙකට සමීප වේ. ඉංජිනේරුවරු, තාක්ෂණික ශිල්පීහු, යන්ත්‍ර ශිල්පීහු, කෘෂිකාර්මික උපාධිධාරීහු සහ සත්ව පාලන විශේෂඥවරු විශාල වශයෙන් ගම්වල ස්ථිර ලෙස පදිංචිවී සිටිති. ගම් පෙදෙස්වල සේවය කරන ගුරුවරුන්ගේ හා දොස්තරවරුන්ගේද වෙනත් විශේෂඥයින්ගේ සංඛ්‍යාවද වැඩිවෙමින් පවතී.

සෝවියට් සංගමය කොමියුනිස්ට්වාදය කරා ළංවත්ම, නගරබද ජනතාවගේ ජීවන තත්වය විශාල වශයෙන් වැඩි දියුණු වනු ඇත. නගරබද ජනයා පදිංචි පෙදෙස්වල තද බදය අහෝසි කරනු ලැබේ. නගරබද ජනතාවට වඩාත් වැඩියෙන් පිරිසිදු වාතය, ආලෝකය, හරිත වර්ණය ලැබෙන අතර මේ අනුව ඔවුන්ගේ ජීවිතය ගම්බද තත්වයට සමීප වනු ඇත.

නගරය හා ගම අතර ඇති වෙනස්කම් නැති කරදැමීමේ මාර්ග එසේය. මෙය සාර්ථක කර ගැනීමෙන් පසුව කම්කරු පංතිය හා ගොවි ජනතාව අතර ඇති වෙනස්කම්ද සදහටම අහෝසි වනු ඇත.

කායික හා බුද්ධිමය ශ්‍රමය අතර ඇති තාත්වික වෙනස්කම් නැති කිරීමේ මාර්ග

බුද්ධිමතුන් බහුතර සංඛ්‍යාව සියවස් ගණන් තිස්සේ සූරාකන පංතීන්ට සේවය කරමින්, වැඩකරන ජනතාව, කය වෙහෙසා වැඩකරන කම්කරුවන් පෑගීම සඳහා උදව් කළහ. කය වෙහෙසා වැඩ කරන්නන් හා මොළය වෙහෙසා වැඩ කරන්නන් අතර බොහෝ කල් සිට පැවත එන ප්‍රතිවිරුද්ධතාවයට හේතුව මෙය ය. සමාජවාදය මේ ප්‍රතිවිරුද්ධතාවයන් අහෝසි කළේය. සෝවියට් බුද්ධිමත්හු කය වෙහෙසා වැඩ කරන කම්කරුවන් හා ගොවීන් සමග එක්වී තම සමාජවාදී මවුබිමේ යහපත සඳහා වැඩකරති. එහෙත් සමාජවාදය යටතේ මොළය වෙහෙසා සහ කය වෙහෙසා වැඩකරන ජනතාව අතර තාත්වික වෙනසක් තවමත් ඇත්තේය. කම්කරුවන්ගේ හා ගොවීන්ගේ සංස්කෘතික තාක්ෂණික මට්ටම බුද්ධිමතුන්ගේ සංස්කෘතික මට්ටමට, තාක්ෂණික දැනුමට වඩා අඩුය. මේ වෙනස නැති කරනු වස් කම්කරුවන්ගේ හා ගොවීන්ගේ සංස්කෘතිය තාක්ෂණය අධ්‍යාපනය බුද්ධිමතුන්ගේ තත්වය දක්වා උසස් කළ යුතුය. පූර්ණ පරිමාණයෙන්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

කොමියුනිස්ට්වාදය ඉදිකිරීමේ අවධියේදී එම කාර්යයන් සපුරාලනු ඇත.

තාක්ෂණික ප්‍රගතිය ඇතිකිරීම සහ එම ප්‍රගතියට අදාල වන පරිදි ශ්‍රමයේ ස්වභාවයද වෙනස් කිරීම එම ගැටළු විසඳීමේ ප්‍රධාන මාධ්‍යය වන්නේය. තාක්ෂණික ශිල්පීය ප්‍රගතිය, වඩාත් අලුත්, සංකීර්ණ සහ ඉතාමත් කාර්යක්ෂම යන්ත්‍ර යෙදවීම, නිෂ්පාදන කටයුතු ස්වයංක්‍රිය කිරීම, හා සම්පූර්ණ වශයෙන් විද්‍යුතන කිරීම, වැඩ කටයුතු සඳහා පරමාණු බලය යෙදවීම, රසායනය සහ විද්‍යා සොයා ගැනීම් ජනතා ආර්ථිකයේ දියුණුව සඳහා පුළුල් ලෙස පාවිච්චියට ගැනීම යන මේ සියල්ල නිසා නිෂ්පාදනයෙහි යෙදෙන කම්කරුවෝ විවිධ, විශේෂ තාක්ෂණික කුසලතාවන් පමණක් නොව, උසස් පොදු අධ්‍යාපනයක් සහ විද්‍යාවේ මූලික දැනීමක්ද ලැබිය යුත්තාහ. තාක්ෂණික ප්‍රගතිය සහ කම්කරුවන්ගේ හා ගොවීන්ගේ පොදු සංස්කෘතික හා තාක්ෂණික වර්ධනය සමග එකට වෙළී පවතී. හැම අතින්ම වර්ධනය වූ පුද්ගලයෙක්වන කොමියුනිස්ට් සමාජයේ සාමාජිකයාද ප්‍රධාන වශයෙන් ගොඩ නැගෙන්නේ මිනිස් ක්‍රියාකාරිත්වයේ මූලික ක්ෂේත්‍රය වන ශ්‍රම ක්‍රියාදාමය තුළිනි.

කායික හා බුද්ධිමය ශ්‍රමය අතර ඇති වෙනස නැතිකරලීම සඳහා මහජන අධ්‍යාපන ක්‍රමයද යොමුවී ඇත. සෝවියට් සංගමයේ මේ අධ්‍යාපන ක්‍රමය වර්ධනය වෙමින් අංග සම්පූර්ණ වේ. එය වඩ වඩාත් නිෂ්පාදන ශ්‍රමය හැඩ ගැස්වීමට පටන් ගෙන තිබේ. එමගින් තරුණ පෙළට අධ්‍යාපනය ලබාදීම වඩාත් යහපත් කරවීමටත්, ජනතා ආර්ථිකයේ හැම ක්ෂේත්‍රයකටම අවශ්‍ය විශේෂඥයින්ගේ ගුණය උසස් කිරීමටත් එය යොමුවී ඇත. සෝවියට් දේශයේ තැපැල් මගින් උගැන්වීමද, උසස් හා මධ්‍යම විශේෂ කාර්මික පාසල්වල හවස පංති පැවැත්වීමද, මැදපාසල්ද, අලුත් යන්ත්‍ර සූත්‍ර හා උපකරණ නිපදවන්නන්ගේ විවිධ පාසල්ද, කෘෂිකාර්මික විද්‍යාව සහ සත්ව පාලනය සඳහා පාඩම් මාලාද, යන්ත්‍ර ශිල්පය උගන්වන පාසල්ද නිරතුරුවම වර්ධනය වෙමින් හා පුළුල් වෙමින් පවතී. මේවා කම්කරුවන්ට හා ගොවීන්ට සිය නිෂ්පාදන මට්ටම හා දැනීමත්, සංස්කෘතික අධ්‍යාපනයත් උසස් කරගැනීම සඳහා සේවය කරයි. ජනතා ආර්ථිකයේ සේවය කරන මිනිසුන්ගෙන් සියයට 77 ක් 1975 දී උසස් අධ්‍යාපනයක් හෝ විශේෂ අධ්‍යාපනයක් හෝ මධ්‍යම අධ්‍යාපනයක් හෝ ලබා සිටියහ. දසවැනි පංතිය දක්වා ඉගෙන ගැනීම අනිවාර්ය වෙමින් පවතී.

සෝවියට් ජනතාවට සිය දැනුම වැඩි කරගැනීම හා සංස්කෘතිය උසස් කර ගැනීම සඳහා අවශ්‍ය නිදහස් කාලය සපයා දීමට සෝවියට් සංගමයේ කොමියුනිස්ට් පක්ෂය හා සෝවියට් ආණ්ඩුව සැලකිලිමත් වී ඇත. වැඩකරන පැය ගණන අඩු කිරීම සඳහා සෝවියට් සංගමය පුළුල් පියවර ගනී. 1967 සිට සෝවියට් සංගමය ජනතාවට සතියකට දින දෙකක නිවාඩුවක් සහ පැය 41 ක වැඩ සතියක් ලැබී ඇත.

කොමියුනිස්ට්වාදය ඉදිකළ කල්හි කය වෙහෙසා වැඩ කරන සහ මොළය වෙහෙසා වැඩ කරන ජනතාව අතර ඇති පරතරය මැකී යනු ඇත. කොමියුනිස්ට් සමාජයේදී, පටු විශේෂඥ බුද්ධිමය ශ්‍රමය මෙන්ම හුදු කායික ශ්‍රමයද අහෝසි වනු ඇත. ගුණාත්මක වශයෙන් අලුත් වර්ගයක ශ්‍රමයක් බිහිවනු ඇත, සකලාංග සම්පූර්ණ ජනතාවකින් සමන්විත කොමියුනිස්ට් සාමාජිකයන්ගේ කායික හා මානසික ව්‍යායාමයත් එහි තුළ සංගත ලෙස සංයෝග වනු ඇත.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

V

මිනිසුන්ගේ පොදුබවේ ඓතිහාසික ආකාර

නිෂ්පාදන ක්‍රමය, ව්‍යුහය හා උඩු ව්‍යුහය හැරුණු විට, සමාජ–ආර්ථික සැකැස්ම, වර්ගය, ගණ ගෝත්‍රය, වංශය හා ජාතිය වශයෙන් මිනිසුන්ගේ නියමිත ඓතිහාසික පොදු බවකින් යුක්ත බව අපි සඳහන් කළෙමු.

1. වර්ගය, ගණ ගෝත්‍රය, වංශය, ජාතිය

වර්ගය හා ගණ ගෝත්‍රය

වර්ගය — ලේ නෑකම්වලින් සහ නියමිත ආර්ථික සම්බන්ධකම් වලින් යුත් මිනිසුන්ගේ ඓතිහාසික පොදු බවකි. සොබාදහමේ බලවේගයන්ට විරුද්ධව පොදු වුවමනාවන් ආරක්ෂා කිරීම සහ සමගිව ඒවාට විරුද්ධව මුහුණ පෑමේදී ඇතිවූ නියමිත සම්බන්ධකමකි. වර්ගයේ පදනම වූයේ නිෂ්පාදන මාධ්‍යයන් පොදුවේ අයත් කර ගැනීම සහ පොදුවේ පාවිච්චි කිරීමය. වර්ගයකට අයත් සමාජිකයෝ පොදුවේ ශ්‍රමය වැය කරමින් දිවි පැවැත්ම සඳහා අවශ්‍ය මාධ්‍යයන් පොදුවේ භුක්ති වින්දෝය. වර්ගයේ නායකයා වූයේ සියලු වැඩිහිටි පිරිමින්ගෙන් හා ගැහැනුන්ගෙන් යුත් මණ්ඩලයකි. මේ මණ්ඩලය විසින් ජ්‍යෙෂ්ඨයින් හා යුද්ධ නායකයින් පත්කිරීම හා පහකිරීම කරන ලදී. වර්ගයේ මුල් සංවර්ධන අවධියේදී එය විග්‍රහ කරන ලද්දේ මවුගේ පාර්ශ්වය (මාතෘ මූලිකත්වය) අනුවය. පසු කලෙක, පුරුෂ ශ්‍රමය ප්‍රධාන තැන ගත් විට, විශේෂයෙන්ම කුඹුරු ගොවිතැන් පුළුල් ලෙස පැතිර ගිය පසු, මාතෘ මූලිකත්වය වෙනුවට පීතෘ මූලිකත්වය ඇති විය. ඒ අනුව වර්ගයකට අයත් වීම පිළිබඳ ප්‍රශ්නය විසඳුවේ පිය

පාර්ශ්වය අනුවය. සමූහයට අයත් දේපල ක්‍රම ක්‍රමයෙන් වර්ගයකට අයත් වීමත් සමගම පියා තම දේපල පුතුට පැවරීමට ඉදිරිපත් විය.

වර්ග කීපයක් එකතුවීමෙන් ගණ ගෝත්‍රය සෑදිණි. ගෝත්‍ර සමාජයේදී පොදු වර්ගයක් පමණක් නොව පොදු භාෂාවක් සහ භූමියක්ද තිබිණි.

වර්ගය හා ගෝත්‍රය ආදි කාලීන සමාජ ක්‍රමයේදී පැවතුනු අතර එය සමාජ සංවර්ධනයේදී අති විශාල ක්‍රියා කලාපයක් ඉටු කළේය. මේ සමාජ ක්‍රමය පැවති සමයේදී මිනිස්සු ලෝකයේ හැම රටකම පාහේ විසිර ගොස් මිනිස් සංහතියේ ද්‍රව්‍යමය හා අධ්‍යාත්මික සංස්කෘතියකට මුළ පිරුහ.

නිෂ්පාදනය වර්ධනය වීමත් පංති සහිත සමාජය සහ රජය පැන නැගීමත් සමගම ලේ නෑකම ක්‍රමයෙන් අභාවයට ගියේය. වර්ගය හා ගණ ගෝත්‍රය අලුත් ඓතිහාසික පොදුතාවයක් වන ජන වංශය ඇතිවිය. කෙසේවුවද, ගණ ගෝත්‍ර සමාජයේ නටබුන් අධිරාජ්‍යවාදීන්ගේ යටත් විජිතවාදයේ විපාකයක් වශයෙන් තවමත් ආසියාවේ හා අප්‍රිකාවේ සමහර රටවල්වල ශේෂව පවතී.

මිනිසුන්ගේ ඓතිහාසික පොදු සමූහය වශයෙන් ජන වංශය වහල් සමාජයට හා රදළ සමාජයට අතිශයින්ම ආවේණික ලක්ෂණයක් විය.

ජන වංශය

ගෝත්‍ර සමාජයේදී මෙන් මෙහිදී ලේ නෑකම් මූලික නොවූ අතර, භූමියේ, භාෂාවේ හා සංස්කෘතියේ පොදු බව ප්‍රධාන තැන දැරීය. එකිනෙකට නෑකම් ඇති ගණ ගෝත්‍ර ඒකරාශීවීම නිසා ජන වංශ ඇතිවිය.

ජන වංශයක පොදු ලක්ෂණය වූයේ භෞමික, භාෂාමය, සංස්කෘතික පමණක් නොව, ස්වාභාවික, ප්‍රධාන වශයෙන් ගොවිතැන්, අතිශයින්ම නොපැහැදිලි සමාජමය ශ්‍රම විභජනයක් සහිත ආර්ථිකයද, ගොවි කර්මාන්තය හා පසු කලෙක රෙදි නිපදවීමද සහිත ද්‍රව්‍යමය පදනමක් ඇතිවීමය. කෙසේ වුවද, ජන වංශය මිනිස් සමූහයේ පොදු බවේ සැහෙන ස්ථිරතාවයක් ඇති නොකළේය. මන්දයත්, වහල් හා රදළ සමාජ ක්‍රම පැවති කාලයේදී රටවල් කීපයක් එකට එක් කරන පරිමාණයක් අනුව ආර්ථික පොදු සැකැස්මයක් ඇති නොවූ බැවිනි. එවැන්නක් රහිතව මිනිසුන් අතර පොදු ස්ථිර, කිට්ටු සම්බන්ධකම් ඇති විය නොහැකිය.

වහල් සමාජයේදී සහ සමහර රටවල රදළ සමාජයේදී පැන නැගුණු සමහර ජන වංශ ධනපති ක්‍රමයේදී සහ සමාජවාදී ක්‍රමයේදීත් සුරැකිව පැවතිනි. එහෙත් මේවා විශේෂ ධනවාදී සහ සමාජවාදී ලක්ෂණ සහිත විය.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ධනපති ක්‍රමය වර්ධනය වීමත් සමගම ආර්ථික අසමගිකම් ක්‍රමයෙන් පහවී ගොස් එක්සත් වෙළඳ පොළක් ඇති විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ජන වංශය, ජාතිය බවට පරිවර්තනය විය. ජාතීන් වූ කලී ''ධනපති අවධියේ සමාජ සංවර්ධනයේ අනිවාරණීය ප්‍රතිඵලයක් සහ අනිවාරණීය ආකාරයක් වන්නේය''* යි වි. අයි. ලෙනින් ලියුවේය.

ජාතිය

ජන වංශයට මෙන්ම ජාතියටද පොදු භූමියක්, භාෂාවක් හා සංස්කෘතියක් ඇත්තේය. එහෙත්, එය ජන වංශය මෙන් නොව, ජාතිය ස්ථාවර ජන සමූහයකි. වි. අයි. ලෙනින් පෙන්වා දුන් පරිදි ''ගැඹුරු තම ආර්ථික සාධක''** විසින් එම ස්ථිර භාවය ඇති කරන ලදී. නිදසුනක් වශයෙන් කීව් රුස්හි ස්ලාව් ජාතික ගෝත්‍ර පොදු භාෂාවක් හා පොදු භූමි භාගයක් ඇති ජන වංශයක් පිළිබිඹු කළද, ඔවුන් ජාතියක් නොවිය. මේ ගෝත්‍ර අතර ජාතියක සම්බන්ධකම් ඇති වූයේ රුසියන් ඉතිහාසයේ (17 වැනි සියවසේදී පමණ) නව අවධියේදී රටේ ආර්ථික බෙදීම් කෙළවර කොට, වෙළඳ භාණ්ඩ නිෂ්පාදනය සංවර්ධනය වී, කුඩා ප්‍රදේශීය වෙළඳ පොළවල් එක්වී, එකම සමස්ත රුසියානු වෙළඳ පොළක් බවට ඒකාබද්ධ වූ විටය. ඒ අනුව ආර්ථික ජීවිතයේ සමූහගත ස්වභාවය ජාතියක ප්‍රධාන අංග ලක්ෂණය වේ. එකම භූමි භාගයක වාසය කරන, පොදු භාෂාවක් ඇති ජනතාවක් ඒකීය සමස්තයක් වනසේ නැතහොත් ජාතියක් වන සේ ඒකාබද්ධ කරන්නේ ආර්ථිකය හා ආර්ථික සම්බන්ධකම් විසිනි. ආර්ථික හා දේශපාලන සංවර්ධන ක්‍රියාදාමයේදී ජාතියෙහි පොදු මනෝ භාවයක් ඇතිවේ. ජාතියක ඓතිහාසික සම්ප්‍රදායයන් තුළ හා එහි සංස්කෘතිකයෙහි සහ ජීවන රටාවෙහි වන විශේෂ අංග ලක්ෂණවලින් එය විද්‍යාමාන වේ.

ජාතියක් වර්ගය සමග මිශ්‍ර නොකර ගත යුතුය. හමේ පාට ඇස්වල හැඩ හුරුකම ආදී සමහර ජීව විද්‍යාත්මක ස්වභාව ලක්ෂණ පදනම් කරගෙන ශාරීරික අංග ලක්ෂණ අනුව ඇති කරගත් ප්‍රභේදයන් වර්ග භේදය වන්නේය. මේ අංග ලංක්ෂණ අනුව ජනතාව වර්ග තුනකට බෙදේ. ඒ සුදු, කහ, කළු යනුවෙනි.

ජනතාවගේ ආර්ථික දේශපාලන හා සංස්කෘතික මට්ටමද, නැතහොත් සමාජයේ මිනිහෙක් එය තුළ දරන තත්වයද, වර්ණ භේද වාදී වෙනස්කම් අනුව පැහැදිලි කිරීමට ප්‍රතිගාමී ධනවාදී දෘෂ්ටිවාදීහු උත්සාහ ගනිති. සුදු වර්ගයාගේ විශිෂ්ඨත්වය ගැන නන් දෙඩවන

* වි. අයි. ලෙනින්. සම්පූර්ණ කෘතීන්, වෙළුම 21, පිටුව 56.
** වි. අයි. ලෙනින්. සම්පූර්ණ කෘතීන්, වෙළුම 20, පිටුව, 369.

ඔවුහු, කළු හා කහ ජාතීන් පාලනය කිරීම ඉරණම අනුව සුදු වර්ගයට උරුම බව කියති. එහෙත් ඉතිහාසයද, විද්‍යාත්මක සාධකද අනුව සියලු වර්ගවලට අයත් මිනිසුන්ට සමාන දක්ෂතාවයක් ඇති බව ඔප්පු වී ඇත. සුදු වර්ගයට අයත් නැති සමහර ජාතීන් නොදියුණුව සිටී නම් ඊට හේතුව ඔවුන්ගේ සමේ හෝ හිසකෙස්වල හෝ වර්ණය නොව, ඔවුන් සියවස් ගණන් තිස්සේ සුදු ජාතික සූරාකන්නන්ගේ යටත් විජිතවාදී පෑගීමට යටවී සිටීමය. පැරණි යටත් විජිතවල හා යටත් රටවල ජනතාව දැන් යටත් විජිතවාදී විය ගස ඉවත ලා තම ආර්ථිකය හා සංස්කෘතිය සාර්ථක ලෙස සංවර්ධනය කරමින් සිටිති. සමාජවාදී සංවර්ධනය ඔස්සේ ගමන් කරන රටවල්වල ජනතාව විශේෂ වේගයකින් ප්‍රගතිය වෙත යමින් සිටිති.

2. ධනපති සමාජයේ ජාතිය හා ජාතික සම්බන්ධකම්

ධනපති සමාජය තුළ ජාතියේ බහුතර සංඛ්‍යාව කම්කරු පංතියට හා වැඩකරන ජනතාවගේ වෙනත් කොටස්වලට අයත් නමුදු, සමාජයේ ආධිපත්‍යය උසුලන්නේ ධනපති පංතිය විසිනි. සියලු නිෂ්පාදන මාධ්‍යයන් ඔවුන් සතුය. රාජ්‍ය බලයද, ජන සන්නිවේදන මාධ්‍යයන්ද ඔවුන්ගේ පාලනයට යටත්ය. ධනපති ජාතියේ මූණුවර ධනවාදී ආර්ථිකය, දේශපාලනය සහ දෘෂ්ටිය විසින් ප්‍රධාන වශයෙන් තීරණය කෙරෙන්නේ එබැවිනි. ආර්ථික හා යුද්ධමය අතින් වඩාත් ශක්තිමත් ජාතීන් විසින් දුර්වල ජාතීන් පීඩනයට පත් කරනු ලැබීම, හා ආධිපත්‍යයට යටත් කරනු ලැබීම ධනපති ජාතීන්ගේ වර්ධනයට අදල නියාමයකි. එබැවින් ධනවාදය යටතේ ජාතීන්ගේ වර්ධනය පීඩිත ජනතාවන් සිය විමුක්තිය සඳහා කරන තියුණු අරගලය හා සමග අවියෝජ්‍ය ලෙස එකට වෙළී ඇත. ජාතික ප්‍රශ්නය එනම් පෑගී සිටින ජාතීන්ගේ විමුක්තිය දිනාගැනීමේ ජාතික පීඩිත ස්වභාවය කෙළවර කිරීමේ සහ ජනතාව අතර සමානාත්මතා සම්බන්ධකම් තහවුරු කරලීමේ ප්‍රශ්නය ධනවාදී ක්‍රමය යටතේ අති තීව්‍ර වන්නේය. එය සමාජ සංවර්ධනයේ මූලික ගැටළු අතුරෙන් එකක් වන්නේය.

ධනපති ක්‍රමයේ වර්ධනයේ විවිධ අවස්ථාවලදී ජාතික ප්‍රශ්නයේ හරය වෙනස් නොවී පැවතුනේ නොවේ. ධනපති ක්‍රමය නැගී එන අවධියේදී එම ප්‍රශ්නය රීතියක් වශයෙන්, එක් රජයක සීමාවෙන් පිටතට නොගියේය. නිදසුනක් වශයෙන් රුසියාව හා ඕස්ට්‍රෝ-හංගේරියාව වැනි බහු ජාතික රජයන් හා වෙනත් පාගන හා පෑගෙන

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ජාතීන් යන දෙකොටසම සිටි ජාතීන්ට පීඩාකිරීමේ සහ ජාතික විමුක්ති සටනේ ප්‍රධාන පොර පිටි වූයේය. එවකට ජාතික ප්‍රශ්නය යතාර්ථ වශයෙන් සුළු ජාතීන්ගේ ප්‍රශ්නවල තත්වයටත්, ඔවුන්ගේ විමුක්ති සටනක හා ඔවුන්ගේ ස්වාධීන ආර්ථිකය සහ සංස්කෘතිය වර්ධනය කිරීම සඳහා කළ සටනක තත්වයටත් සංකෝචනය වී තිබුණි.

අධිරාජ්‍යවාදී යුගය ආරම්භ වීමත් සමගම ජාතීන්ගේ සම්බන්ධකම්වල වෙනසක් ඇතිවිය. අධිපති ජාතීන් වූ ඉතා දියුණු අධිරාජ්‍යවාදී රටවල් අතලොස්සක් එක පැත්තකටද බහුතර සංඛ්‍යාව යටත් විජිත හා පරාධීන රටවල් සහ ජාතීන් තවත් පැත්තකටද බෙදිණ. වී. අයි. ලෙනින් පෙන්වා දුන් පරිදි ජාතීන්, පීඩක සහ පීඩිත ජාතීන් වශයෙන් බෙදීම "අධිරාජ්‍යවාදය යටතේ නොවැලැක්විය හැකි මූලික හා අවශ්‍යතම"* ලක්ෂණයක් විය. අධිරාජ්‍යවාදයේ යටත් විජිත ක්‍රමය ඇතිවිය.

සිය මුල් කාලයේදී රදළවාදයේ වියගසෙන් හා පල්ලියේ ගල ග්‍රහයෙන් ජනතාව මුදවාගත් ධනපති ක්‍රමය, අධිරාජ්‍යවාදී යුගයට එළඹෙත්ම, ජාතීන් පෙළන මහා පීඩකයා බවටත්, අනුකම්පා විරහිත ලෙස ජනතා ස්වාධීනත්වය යටපත් කරන්නා බවටත් පරිවර්තනය විය. ඒ අනුව ජාතික ප්‍රශ්නයේ හරය වෙනස් වූ අතර එහි සීමා සැහෙන ලෙස ව්‍යාප්ත විය. ජාතික ප්‍රශ්නය අන්තර් රාජ්‍ය ප්‍රශ්නයක සිට ලෝකයේ කෝටි සංඛ්‍යාත ජනතාවගේ ඉරණම කෙරෙහි බලපාන අන්තර්ජාතික ප්‍රශ්නයක් දක්වා පරිවර්තනය විය.

අධිරාජ්‍යවාදය යටතේ ජාතික ප්‍රශ්නය එක රජයක සීමා තුළ වන සුළු ජාතීන් පිළිබඳ ප්‍රශ්නයක් නොවේ. එය ජාතික–යටත් විජිත ප්‍රශ්නයකි. ප්‍රථමයෙන්ම එය යටත් විජිතවාදී පීඩනයට විරුද්ධව ජනතාවන් ගෙන යන අරගලය පිළිබඳ ප්‍රශ්නයකි. ඔවුන්ගේ විමුක්තිය හා ප්‍රගතිය පිළිබඳ වූ ප්‍රශ්නයකි.

ජාතික ප්‍රශ්නයේ වැදගත්කම ගැන තක්සේරු කළ මාක්ස් එංගල්ස් හා ලෙනින්, එය විප්ලවවාදී ව්‍යාපාරයේ මූලික ප්‍රශ්නය ලෙස නොසැලකූහ. ඔවුහු එම ප්‍රශ්නය මාක්ස්–ලෙනින්වාදයේ මධ්‍යම ලක්ෂණය වන නිර්ධන පංතික ආඥාදායකත්වයට නිතරම යටත් කළහ. ඔවුහු එම ප්‍රශ්නය සළකා බැලූ හැමවිටම ජාත්‍යන්තර කම්කරු පංති අරගලයත් සාමය සමාජවාදය සහ සමාජමය ප්‍රගතිය සඳහා කරන සටනත් පිළිබඳ රාමුව තුළ එය ලා විමසා බැලූහ.

---

* වී. අයි. ලෙනින්. සම්පූර්ණ කෘතීන්, වෙළුම 27, පිටුව 257.

ධනපති ක්‍රමය යටතේ ජාතීන් අතර සම්බන්ධකම් එකිනෙකට ප්‍රතිවිරුද්ධ ප්‍රවණතාවයන් දෙකක් අනුව සංවර්ධනය වන බව වී. අයි. ලෙනින් හෙළි කළේය. එක් අතකින්, ජාතික විඥානය පිබිදී ජාතික ව්‍යාපාර නැගී එයි. ජාතික පීඩාවට විරුද්ධව අරගල ඇතිවී ජාතික රාජ්‍යයන් ඉදිවෙයි. අනිත් අතට, විවිධ ජාතීන් අතර සම්බන්ධකම් දියුණුවී ජාතික සීමා හා බෙදීම් පහව යයි. ඒකීය ආර්ථික ක්‍රමයක්, නැතහොත් ලෝක වෙළඳ පොළක් හැඩ ගැසෙයි. පළමුවැනි ප්‍රවණතාවය ධනපති ක්‍රමය නැගී එන අවධියේදී දක්නට ඇති අතර දෙවැන්න අධිරාජ්‍යවාදී යුගයේදී, ධනපති ක්‍රමය වෙනුවට සමාජවාදය ඇතිවීම අනිවාරණීය වන යුගයේදී ඇතිවේ.

මේ ප්‍රවණතා දෙකම සමාජ සංවර්ධනයේ අවශ්‍යතාවයන්ගෙන් පැන නගින අතර ඒවා ඓතිහාසික වශයෙන් ප්‍රගතිශීලී වන්නේය. එසේ වුවද, ධනවාදී තත්වයන් යටතේ ඒවා කෙතරම් විකෘති ආකාරයන් ගන්නේද යත්, ඒවා තම වාස්තවික ප්‍රගතිශීලී හරය සමග කොහෙත්ම නොගැළපෙන තත්වයට පත්වේ. යෝධ ජාත්‍යන්තර බැංකු සහ පොකුරු ව්‍යාපාර (ට්‍රස්ට්) ඇතිකරන අධිරාජ්‍යවාදය සමස්ත ලෝකයම අරා සිටින ලෝක ආර්ථිකයක්ද ඇති කරයි. එමගින් සමාජයේ ආර්ථික, දේශපාලන හා සංස්කෘතික ජීවිතය වඩ වඩාත් එක්සත් කර ඒවා ජාත්‍යන්තර තත්වයට ගෙන එයි. එහෙත් එම එක්සත් කරවීම, ජාතීන් "සමීප කරවීම" ධනපති ඒකාධිකාරී ආධිපත්‍යය යටතේ සිදුවන්නක් බැවින් එය බලහත්කාරයෙන්, යටත් විජිතවාදී කොල්ල කෑම්වලින් හා එක් ජාතියක් විසින් නැතහොත් වඩාත් ශක්තිමත් හා දියුණු ජාතියක් විසින් තවත් ජාතියක් පෙළීමෙන් තොරව කිසිසේත්ම නොකළ හැකිය. පෑගී සිටින ජනතාව විමුක්තිය ලැබීම සඳහා කළ හැම වෑයමක්ම බුරුලක් නොදක්වා මර්දනය කළ අධිරාජ්‍යවාදී කොල්ලකාරයන් අතළොස්සක් විසින් ලොකු හා කුඩා ජාතීන් විශාල සංඛ්‍යාවක් සමස්තමය වශයෙන්ද, එමෙන්ම මහා ද්වීපද ඔවුන් අධිරාජ්‍යවාදය යටතේ ගෙන ගිය යටත් විජිතවාදී ව්‍යාප්තියට ගොදුරු කරගන්නා ලදී. ඒ අනුව, ධනපති ක්‍රමය යටතේ ජාතීන් එක්සත් කිරීමේ හා සමීප කිරීමේ ප්‍රවණතාවය, ජාතික ස්වාධීනත්වය සඳහා සහ ජාතික රජයන් බිහිකිරීම සඳහාවූ ප්‍රවණතාවයන් සමග සමහන් කළ නොහැකි ප්‍රතිවිරෝධීතාවයකට එළඹෙයි.

ජාතීන් අතර සම්බන්ධකම් සංවර්ධනය වීමෙහි දක්නට ලැබෙන මෙම ප්‍රවණතාවයන් ජාතිවාදයේ ස්වරූපයෙන් ධනවාදී දෘෂ්ටිය හා දේශපාලනය තුළ පිළිබිඹු වේ. ධනපති ජාතිවාදයේ හැම පිළිබිඹුවකටම මාක්ස්–ලෙනින්වාදය පරම සතුරු වන අතරම අධිපති ජාතීන්ගේ

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ජාතිවාදය (මහ බලවත් ජාත්‍යෝන්මාදය සහ වර්ණ භේදවාදය) සහ පීඩිත ජාතීන්ගේ ජාතිවාදය අතර වෙනස්කමක් තිබෙන බවද එය පිළිගනියි. එක් ජාතියක් මත තවත් ජාතියකගේ ආධිපත්‍යය පැතිරවීම සාධාරණ බව පෙන්වීමට උත්සාහ කරන මහ බලවත් ජාත්‍යෝන්මාදය සහ වර්ණ භේදවාදය අත්‍යන්තයෙන්ම ප්‍රතිගාමී දෘෂ්ටියක් වන බැවින් කම්කරු පංතිය එය සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරයි. අනිත් අතට පීඩිත ජාතීන්ගේ ජාතික හැඟීම අධිරාජ්‍යවාදයට විරුද්ධව ස්වාධීනත්වය සඳහා අරගල කිරීමේ ප්‍රවණතාවයකින් යුක්ත වන බැවින් එය ප්‍රගතිශීලී වන නිසා නිර්ධන පංතිය එයට ආධාර කරයි. ''පීඩිතව සිටින හැම ජාතියකම ධනවාදී ජාතිවාදය තුළ පීඩාවට විරුද්ධව එල්ලකළ පොදු ප්‍රජාතන්ත්‍රවාදී හරයක් ඇත්තේය. එයට අපි කොන්දේසි විරහිතව ආධාර දෙන්නෙමු''* යි වි. අයි. ලෙනින් ලියුවේය. නිදසුනක් වශයෙන්, ආසියාවේ සහ අප්‍රිකාවේ රටවල් ගණනාවක සමකාලීන ජාතිවාදය දැන්විය හැක. අධිරාජ්‍යවාදයට හා යටත් විජිතවාදයටද, රදළ ප්‍රතිගාමිත්වයට හා නොදියුණු භාවයටද විරුද්ධව එම ජාතිවාදය සටන් කරන නිසා එහි ප්‍රගතිශීලී හරයක් ඇත. එම සටන් අතරතුරදී කෝටි සංඛ්‍යාත ගොවි ජනතාව ප්‍රධාන කොටගත් පොදු ජනතාවගේ දේශපාලන විඥනය පිබිදෙයි.

ජාතික විමුක්ති ව්‍යාපාරයේ වන ජාතික ධනපති පංතියේ ජාතිවාදයෙහි ප්‍රගතිශීලී කාර්ය කොටස අස්ථාවර ස්වභාවයේ එකකි. එනිසාම පීඩිත ජාතීන්ගේ ජාතිවාදයේ ප්‍රගතිශීලී භාවයද ස්ථිර නොවේ. එබැවින් පීඩිත ජනතාව සිය විමුක්තිය සඳහා කරන සටනේදී මාක්ස්වාදී පක්ෂය ඔවුන්ට ආධාර කරන අතර ලෝකයේ වැඩකරන ජනතාවගේ සමගිය ප්‍රකාශ කරන නිර්ධන පංතික ජාත්‍යන්තරවාදයට කොහෙත්ම නොගැළපෙන ධනපති ජාතිවාදයේ සියළුම බලපෑම්-වලින් වැඩකරන ජනතාව මුදගැනීමට එය ප්‍රයත්න දරන්නේය. ඕනෑම සමාජමය ව්‍යාපාරයක් තුළ පංති සටනට හිමි තීරණාත්මක කාර්ය කොටස පෙන්වා දෙමින්, සියළුම රටවල නිර්ධනයින්ට සමගි වනසේ ආයාචනය කරමින් මාක්ස්වාදී පක්ෂය ධනපති ජාතිවාදයේ දෘෂ්ටියට විරුද්ධව සටන් කරන්නේය. මේ අයුරින් එය වැඩකරන ජනතාවගේ සිත් තුළ නිර්ධන පංතික ජාත්‍යන්තරවාදය රෝපණය කරයි.

අධිරාජ්‍යවාදී සූරාකන්නන් විසින් කෲර ලෙස හා අමානුෂික ලෙස යටත් විජිත හා තමන්ට ගැති රටවල් සූරාකෑම නිසා ඒ රටවල

* වි. අයි. ලෙනින්. සම්පූර්ණ කෘතීන්, වෙළුම 25, පිටු 275—276.

ජනතාව යටත් විජිතවාදී පීඩනයට විරුද්ධව නිදහස සහ ස්වාධීනත්වය සඳහා විමුක්ති අරගල කිරීමට පටන් ගත්හ.

අප යුගයේ විශේෂ අංග ලක්ෂණය යටත් විජිත වාදයේ බිඳ වැටීමය

ශ්‍රේෂ්ඨ ඔක්තෝබර් සමාජවාදී විප්ලවය ජාතික විමුක්ති ව්‍යාපාරයට බලගතු ආවේ-ගයක් දී, නැගෙනහිර රටවල ජනතාව අතර පිබිදීමක්ද ඇතිකොට, ලෝක විප්ලවවාදී ව්‍යාපාරයේ පොදු රැල්ලට යටත් විජිතවල ජනතාව ඇද ගත්තේය. සෝවියට් සංගමය පීඩිත ජනතාවට දේශපාලන හා අධ්‍යාත්මික ආධාර සපයන නොසිඳෙන උල්පතක් විය.

දෙවෙනි ලෝක මහා යුද්ධයෙන් ඉක්බිතිව ඇතිවූ අලුත් ලෝක බලතුලනයද යුරෝපයේ හා ආසියාවේ රටවල් කීපයකම සමාජවාදී විප්ලවය ජයගැනීමද, ජගත් සමාජවාදී රාෂ්ට්‍ර පද්ධතියක් ඇතිවීමද නිසා ජාතික විමුක්ති අරගලයට විශේෂයෙන්ම වාසිදායක තත්වයක් ඇතිවිය. අධිරාජ්‍යවාදය බහුතර ජනතාවකගේ ජාතික නිදහසේ සහ ස්වාධීනත්වයේ සටන් පාගා දමා, ඔවුන් යටත් විජිත වහල් භාවයේ යදම්වලින් බැඳ තැබුවද, සමාජවාදය බිහිවීමෙන් ඉක්බිතිව පැගී සටින ජනතාවගේ විමුක්ති සටන්වල ප්‍රහාරක යුගය ආරම්භ වී යැයි සෝවියට් සංගමයේ කොමියුනිස්ට් පක්ෂයේ වැඩ පිළිවෙළ සඳහන් කරයි. ජාතික විමුක්ති විප්ලවයේ බලගතු රළවේගය, යටත් විජිත ක්‍රමය සෝදහැර අධිරාජ්‍යවාදයේ පදනම් දෙදරුම් කවා තිබේ. පැරණි යටත් විජිත හා අර්ධ යටත් විජිත තිබුණු රටවල, යෞවන ස්වෛරී රජයන් ඇති විය; ඇතිවන්නේය.

ආසියාවේ මූණුවර හාත්පසින්ම වෙනස් විය. අප්‍රිකාවේ යටත් විජිතවාදය ඇද හැලෙමින් පවතී. දෙවෙනි ලෝක මහා යුද්ධයෙන් අනතුරුව රටවල් 80 ක් නිදහස දිනාගත්හ. අවුරුදු දසක ගණන් තිස්සේ ඇමෙරිකා එක්සත් ජනපදයේ තනි බලයට යටත් වී තිබුණ ලතින් ඇමෙරිකාවේ රටවල් අධිරාජ්‍යවාදයට හා යටත් විජිතවාදයට විරුද්ධව සටන් කිරීම පිණිස නැගී සිටිති. ජනතා විප්ලවය ජයගත් වීරෝධාර කියුබාව, ජාතික නිදහස හා සමාජ ප්‍රගතිය සඳහා ලතින් ඇමෙරිකානු මහා දේශයේ ජනතාවන් කරන සාධාරණ සටනේ ධජය බවට පත්වී තිබේ. මිනිස් ඉතිහාසයේ ඉතා නින්දනීය අංගමාර රෝගයක් බඳු වූ යටත් විජිතවාදය සදහටම නැති කර දැමීමේ දිනය වැඩි ඈත නොවේ. කොමියුනිස්ට් හා කම්කරු පක්ෂවල නියෝජිතයින් විසින් 1960 දී කරන ලද ප්‍රකාශයේ මෙසේ සඳහන් වේ. ''යටත් විජිතවාදය මුළුමනින්ම ඇදහැලීමට ආසන්නය. ජාතික විමුක්ති ව්‍යාපාරයේ ප්‍රහාරය ඉදිරියේ යටත් විජිතවාදී වහල් ක්‍රමය බිඳ වැටීම ජගත්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ඓතිහාසික වැදගත්කම අනුව, ලෝක සමාජවාදී රාෂ්ට්‍ර පද්ධතිය ඇතිවීමට පමණක් දෙවැනි වන්නකි.''*

අධිරාජ්‍යවාදී යටත් විජිත ක්‍රමයේ බිඳ වැටීම විසින් කෝටි සංඛ්‍යාත මිනිසුන් ඉතිහාසය නිර්මාණය කිරීමේ කටයුත්තට ඇදගන්නා නිසා, එය වැදගත් වේ. බිඳ වැටුණු යටත් විජිතවාදී අධිරාජ්‍යයන්ගේ නටබුන් මත පැනනැගුණු යෞවන ස්වෛරී රටවල ජනතාව, නව ජීවිතයක නිර්මාණකයින් ලෙසත් ලෝක කටයුතුවල ක්‍රියාශීලී කොටස් කරුවන් ලෙසත් අධිරාජ්‍යවාදය විනාශ කරන විප්ලවවාදී බලවේගය ලෙසත් පෙරට එති.

තවත් ලෝක යුද්ධයක් ඇතිවීම වැළැක්වීම හා ලෝක සාමය ආරක්ෂා කිරීම සහ තහවුරු කිරීම පිළිබඳවූ අප යුගයේ ප්‍රමුඛ තම ප්‍රශ්නය විසඳීමෙහිලා වැදගත් කාර්ය කොටසක් මෙම යටත් විජිතවාදය ඉවත ලූ ජනතාව අතින් ඉටුවනු ඇත. මේ රටවල ජනතාව සමාජවාදී ලෝකයේ ජනතාව සමග එකතුව ලෝක ජනගහණයෙන් තුනෙන් දෙකොටසක් නියෝජනය කරති. මෙම අති දැවැන්ත බලවේගය අධිරාජ්‍යවාදී ආක්‍රමණිකයින් පසුබස්වාලීමෙහි සමත්ය.

නිදහස ලැබූ රටවල ජනතාව ඉදිරියේ සංකීර්ණ ප්‍රශ්න බොහොමයක් ඇත්තේය. මින් ප්‍රධාන ප්‍රශ්නය අනාගත සංවර්ධනය — ධනවාදී මාවත ඔස්සේද නැතිනම් ධනවාදී නොවන මාවතක් ඔස්සේද — පිළිබඳවය. ධනපති පංතිය රටවල වර්ධනය ධනපති මාවත ඔස්සේ යවමින් පෞද්ගලික දේපල හිමිත්වය සහ සූරාකෑම ආරක්ෂාකර ගැනීමට වැර වෑයම් දරයි. ස්වාධීනත්වයේ හා වාසනාවේ ඒකායන මාර්ගය සමාජවාදය බව වැඩකරන ජනතාව විඥත ලෙස අවබෝධ කරගැනීමට පටන් ගෙන ඇත්තාහ.

තෝරාගත යුත්තේ කිනම් මාර්ගයක්ද යන්න ඒ ඒ රටවල ජනතාවට අයත් අභ්‍යන්තර කාර්යයකි. ලෝකයේ විප්ලවවාදී බලවේගයන්ගේ වැඩිවීමක්ද, නිදහස් වූ ජනතාවට ආධාර හා උපකාර ලබාගත හැකි ජගත් සමාජවාදී රාෂ්ට්‍ර පද්ධතියක් තිබීමද, නිසා සමකාලීන තත්වයන් යටතේ ඔවුන් ඉදිරියේ ධනපති ක්‍රමය මගහැර ධනපති නොවන මාවතක් ඔස්සේ සංවර්ධනය වී, සමාජවාදය වෙත යාමට මාර්ගයද විවෘත වී ඇත්තේය. ඒ මග ජනතාවගේ නිර්භය සටන් හා අසීරු ශ්‍රමය සමග සම්බන්ධ වී තිබේ. මේ සටන් අරගල හා ශ්‍රමය තුළින් සමාජය

* ''ලෝක කොමියුනිස්ට් හා කම්කරු පක්ෂවල නියෝජිතයින්ගේ සාකච්ඡාවේ ප්‍රකාශනය''. 1960, පිටුව 33, රුසියන් මුද්‍රණය.

හාත්පසින්ම සමාජවාදී ලෙස පරිවර්තනය කිරීම සඳහා ද්‍රව්‍යමය (සමකාලීන නිෂ්පාදනය) සහ සමාජයීය (කම්කරු පංතිය හා දේශපාලන පක්ෂය) පූර්ව තත්වයන් බිහිවනු ඇත.

3. සමාජවාදය හා ජාතිය

පෞද්ගලික දේපල සහ සූරාකෑම පදනම් කොට ඇති, ජාතීන් අතර සතුරු බව හා අසමගිය ඇති කරවන ධනවාදී සමාජයට ජාතික ප්‍රශ්නය විසඳිය නොහැකිය. සූරාකෑම සහ පංතිමය ප්‍රතිවිරෝධීතාවය නැතිකර දමන සමාජවාදය ජාතික අසමගිය අවසන් කොට, සැබෑ ප්‍රගතියක් ද, ජාතීන් අතර අන්‍යොන්‍ය විශ්වාසයක්ද ඔවුන් අතර එක්සත්කමක්ද ඇති වීම සහතික කරයි. මාක්ස් හා එංගල්ස් කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රකාශනයේ මෙසේ ලියුවෝය. ''එක් මිනිහකු විසින් තවත් මිනිහකු සූරාකෑම කෙළවර කිරීමේ අනුපාතය අනුවම එක් ජාතියක් විසින් තවත් ජාතියක් සූරාකෑමද අහෝසි වනු ඇත. ජාතියක් තුළ ඇති පංතීන්ගේ සතුරු ප්‍රතිවිරෝධය අහෝසිවන අනුපාතය අනුවම එක් ජාතියක් විසින් තවත් ජාතියක් කෙරෙහි දක්වන සතුරු ආකල්පයද කෙළවර වන්නේය.''*

සෝවියට් සමාජවාදී ජනරජ සංගමයේ ජාතික ප්‍රශ්නය විසඳන හැටි

රුසියාවේ සමාජවාදී විප්ලවය ජාතික පීඩනයේ යදම් බිඳ දැමීය. ජනතාව අතර තිබූ පැරණි සතුරුකම් අහෝසි කොට, ඔවුන් අතර අංග සම්පූර්ණ සහයෝගතාවයකට හා සමීපවීමකට මග හෙළි කළේය. තම ඉරණම තමන් විසින්ම විසඳා ගැනීමේ සහ ස්වකීය ජාතිකත්වය, ආර්ථිකය හා සංස්කෘතිය දියුණු කරගැනීමේ අයිතියද එම විප්ලවය විසින් ජාතීන්ට ලබා දෙන ලදී.

සෝවියට් ආණ්ඩු බලය පිහිටවූ මුල් කාලයේ සිටම ජාතික ප්‍රශ්නය ගැන සෝවියට් කොමියුනිස්ට් පක්ෂයේ සහ සෝවියට් ආණ්ඩුවේ විශේෂ අවධානය යොමුවිය. රටේ වසන සියලු ජාතීන්ගේ අයිතිවාසිකම්වල සමානතාවය සහ ස්වෛරී භාවයත්, හැම ජාතියකටම වෙනම ස්වාධීන රජයක් පිහිටුවා ගැනීම දක්වා ඇති ආත්ම නිර්ණන

* කාල් මාක්ස් සහ ෆ්‍රෙඩ්රික් එංගල්ස්. කෘති එකතුව, වෙළුම 4, පිටුව 445.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

අයිතියත්, සියලු ජාතික වරප්‍රසාද සහ සීමා කිරීම් අහෝසි කර දැමීමත්, සියලු සුළු ජාතීන්ගේ සහ මානව වංශ කණ්ඩායම්වල ස්වාධීන සංවර්ධනයත් පිළිගනිමින් රුසියාවේ ජනතාවන්ගේ අයිතිය පිළිබඳ ප්‍රඥප්තියක් 1917 නොවැම්බර් 15 ද ප්‍රකාශයට පත් කරන ලදී.

මේ ප්‍රඥප්තියෙන් ජාතීන්ගේ පීඩනය කෙළවර කරන ලද අතර රුසියාවේ වසන විශාල සංඛ්‍යාවක් ජාතීන් හා ජන කොටස්වල දේශපාලන, අධිකරණ හා නීතිමය සමානතාවයක්ද ඇති කෙරිනි. එහෙත් ඒ අතරම සියලු ජාතීන් හා ජන කොටස් සිය කැමැත්ත අනුව එකම රජයක් තුළ එක්සත් කරවීම සඳහා ශක්තිමත් පදනමක්ද දමන ලදී. මෙම එක්සත් කිරීමේ උච්ඡ අවස්ථාව වූයේ (1922 දෙසැම්බර් 30 ද) සෝවියට් සමාජවාදී සමූහාණ්ඩු සංගමයක් ඇති කිරීමය. සමාන ජාතික අයිතිය සහ සිය කැමෙත්තෙන් එක්සත් වීම පදනම් කරගත් ලෝකයේ පළමුවැනි බහු ජාතික රජය එය විය. සෝවියට් සමාජවාදී සමූහාණ්ඩු සංගමය පිහිටුවීම නිසා සෝවියට් සමූහාණ්ඩුවල ආර්ථික හා යුද්ධ ශක්තිය වැඩි විය. ඒවායේ දේශපාලන තත්වය තහවුරු විය. ඒකාබද්ධ ලෙස සමාජවාදය ගොඩනැගීම සඳහා ජනතාවන් තව තවත් අන්‍යෝන්‍ය වශයෙන් සමීපස්ථ කිරීමට අදාල වන පූර්වාවශ්‍යතාවයන් ඇති විය.

ජාතීන්ට විමුක්තිය ලබාදීම යන්න ජාතික පීඩනය අහෝසි කිරීමට සහ සමාන දේශපාලන හා නීතිමය අයිතිය ඇති කිරීමට පමණක් සීමා කළ හැකි නොවීම ස්වාභාවිකය. සර්ව බලධාරී සාර් රුසියාවෙන් ලැබුණු දයාදය වශයෙන් කාලාන්තරයක් තිස්සේ පැවත ආ ආර්ථික හා සංස්කෘතික නොදියුණු භාවය නැති කරලීම ප්‍රධාන කාර්යය වූයේය. සෝවියට් සමාජවාදී රජය එම අසීරු කාර්යයත් සාර්ථක ලෙස සපුරාලීය. කලින් පීඩිතව සිටි ජනතාවට එනිසා නිදහසේ දියුණුවීමට අයිතිය ලැබුණා පමණක් නොව, ඔවුන්ගේ නොදියුණුකම ජයගැනීමටත් ඉතා උසස් මට්ටමකට නංවා ගැනීමටත් එයින් පිටිවහලක් ලැබිණි.

පළමු ලෝක යුද්ධයේදී හා සිවිල් යුද්ධයේදී විනාශවුණු ආර්ථිකය යළිත් ගොඩනැගූ කොමියුනිස්ට් පක්ෂය සහ සෝවියට් ආණ්ඩුව රට කර්මාන්තමය කිරීම සඳහා විශේෂයෙන්ම රුසියානු නොවන සමූහාණ්ඩු, කර්මාන්තමය කිරීම සඳහා වහාම වැඩ පටන් ගත්තේය. පක්ෂයේ හා රජයේ නිරන්තර සැළකිල්ලත්, රුසියානු ජනතාව ප්‍රමුඛ අනිකුත් ජාතීන්ගේ ආත්ම ලාභයෙන් තොර, නොමසුරු ආධාරයත්, කලින් නොදියුණුව තිබූ සමූහාණ්ඩුවලට ලැබීම නිසා ඒවා තුළ

ලෝහ කර්මාන්ත, මොටර් වාහන කර්මාන්ත, විදුලි උපකරණ කර්මාන්ත වැනි අලුත් කර්මාන්ත පැන නැගී, ඒවායේ ආර්ථිකය ඉතාමත් උසස් වර්ධන ප්‍රමාණයකින් වැඩී ගියේය. සෝවියට් සංගමයේ කර්මාන්ත සංවර්ධනයේ වේගයට වඩා එම සමූහාණ්ඩුවල කර්මාන්ත සංවර්ධන වේගය සැහෙන තරම් උසස්වීම ස්වාභාවිකය. නිදසුනක් වශයෙන්, සෝවියට් සංගමයේ 1940 දළ කර්මාන්ත නිෂ්පාදනය 1913 සමග සසඳා බලන විට, 11.7 ගුණයකින් වැඩි වුවද, කිර්ගීසියාවේ එය 153 ගුණයකින්ද, තජිකිස්ථානයේ 277 ගුණයකින්ද වැඩි විය. රුසියානු නොවන සෝවියට් සමූහාණ්ඩුවල ලෝහ නිෂ්පාදනය මෝටර් රථ නිෂ්පාදනය, ඉලෙක්ට්‍රොනික් කර්මාන්තය ආදී කර්මාන්ත ඇතිවිය.

රුසියානු නොවන සෝවියට් සමූහාණ්ඩුවල කෘෂිකර්මාන්තය අති විශාල වශයෙන් දියුණු විය. එය සාමූහික, යන්ත්‍රමය උසස් කෘෂිකර්මාන්තයක් බවට පත්විය.

සෝවියට් සමූහාණ්ඩුවල නිෂ්පාදන බලවේග වර්ධනය වීමේ පදනම මත උසස් පුහුණුවක් ලත් ජාතික ශිල්පීහුද, අති විශාල සංඛ්‍යාවක් බුද්ධිමත්හුද ඇතිවූහ. සංස්කෘතික නොදියුණු බවද අකාමකා දමන ලදී. සෝවියට් සංගමයේ ජනතාව ආර්ථික ජීවිතයේ ගැඹුරු විප්ලවයක් ඇති කළා පමණක් නොව, මහා සංස්කෘතික විප්ලවයක්ද ඇති කළහ.

සෝවියට් සංගමයේ හැම සමූහාණ්ඩුවක්ම උගත් ජනතාවගෙන් පිරිගිය අතර ඒවායේ පාසල්, උසස් විද්‍යායතන, විද්‍යා පරීක්ෂණාගාර සහ සංස්කෘතික මාලිගා ඉතා විශාල සංඛ්‍යාවක් ඇති විය. සමාජවාදී හරයක් සහ ජාතික හැඩයක් සහිත සංස්කෘතියක් එම සමූහාණ්ඩුවල වර්ධනය විය. සංස්කෘතික වර්ධනයේ මට්ටම අනුව, රුසියානු නොවන සෝවියට් සමූහාන්ඩු, නැගෙනහිර ධනපති රටවල් අභිභවමින් ඉදිරියට ගියා පමණක් නොව, බටහිර බොහෝ දියුණු රටවල්ද පරාජය කොට ඇත්තේය.

කලින් සාර් රුසියාවට කෘෂිකාර්මික ද්‍රව්‍ය හා අමුද්‍රව්‍ය සපයන උපාංගයක් වශයෙන් පැවති, එමෙන්ම ආර්ථික සහ සංස්කෘතික වශයෙන් නොදියුණුව සිටි පර්යන්ත දේශයන්හී ජාතීන්, සෝවියට් සංගමයේ සමාජවාදය ජය කෙහෙළි නැංවීමේ ප්‍රතිඵලයක් වශයෙන් බොහෝ දියුණුවට පත්වෙමින් ස්වකීය කම්කරු පංතියක් සහ බුද්ධිමතුන් විශාල සංඛ්‍යාවක් සහිත, උසස් ලෙස වර්ධනය වූ කර්මාන්ත සහ කෘෂිකර්මාන්තයක් ඇති දියුණු සමාජවාදී සමූහාණ්ඩු බවට පරිවර්තනය විය.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ධනපති ජාතීන්, ගුණාත්මක නවතාවයකින් යුත් අලුත් සමාජවාදී ජාතීන් බවට පරිවර්තනය විය. බොහෝ ජාතීන් අලුත් සමාජ ආර්ථික පදනමක් මත පිහිටා සමාජවාදී බවට පත්වූහ. මින් ජාතීන් බොහොමයක්ම ධනවාදී අවධිය මග හැර, වෙනත් වඩා දියුණුවූ ජනතාවගේ ආධාර ඇතිව දියුණු රටවල තත්වයට නැග සිටිති.

සෝවියට් සංගමයේ ජාතීන් දියුණු වූයේ ධනපති ක්‍රමයේදී මෙන් ජාතීන් වටා ඉදි කරන ලද බාධක දියුණු කිරීමෙන් හෝ ජාතීන් වෙන්කර තැබීම හා ආත්මාර්ථකාමිත්වය උත්සන්න කිරීමෙන් හෝ නොව, සියලු ජාතීන් එකිනෙකට සමීප කිරීමෙන්ද, ඔවුන් අතර සහෝදරාත්මක අන්‍යොන්‍ය ආධාරය සහ මිත්‍රත්වය ඇතිකිරීමෙන්ද වේ. එක් අතකින් හැම ජාතියක්ම බලවත් ලෙස හා හැම අතින්ම දියුණු කිරීමද, අනිත් අතින් නිර්ධන පංතික ජාත්‍යන්තරවාදයේ ප්‍රතිපත්ති පදනම් කරගනිමින් සමාජවාදී ජාතීන් අන්‍යොන්‍ය වශයෙන් වඩාත් සමීප කිරීමද යනු සමාජවාදය යටතේ ජාතික ප්‍රශ්නය විෂයෙහි ක්‍රියාත්මක වන එකිනෙකට සම්බන්ධ ප්‍රගතිශීලී ප්‍රවණතා දෙක වන්නේය. එහි ප්‍රතිඵලයක් වශයෙන් සෝවියට් සංගමය තුළ මින් පෙර නොදුටු විරූ ඓතිහාසික සමාජයක් — "කම්කරු පංතිය, ගොවි ජනතාව සහ බුද්ධිමතුන්ගේ අනුල්ලංඝනීය සංගමය මත පදනම් වූ සෝවියට් ජනතාවක්ද... සියලු ජාතීන්ගේ සහ ජන කොටස්වල මිත්‍රත්වයක්ද"* ඇතිවිය. නිෂ්පාදන මාධ්‍යයන් සමාජ සතු කිරීමේ පදනම මත එම සමාජය බිහිවිය... නිෂ්පාදන මාධ්‍යයන් සමාජය සතුවීමේද, ආර්ථික සමාජයීය–දේශපාලන සහ සංස්කෘතික ජීවිතය එක්සත් වීමේද, මාක්ස්–ලෙනින්වාදී දෘෂ්ටියේද කම්කරු පංතියේ වුවමනාවන් සහ කොමියුනිස්ට් වාදී පරමාදර්ශයේද පදනම මත සෝවියට් ජනතාව බිහි විය. සෝවියට් සංගමයේ කොමියුනිස්ට් පක්ෂය වටා එක්රැස් වී සිටින ජාතීන්ගේ මේ ශ්‍රෙෂ්ඨ පොදු රාජ්‍ය මණ්ඩලය එකම පවුලක් සේ එක්සත් වී එකම පරමාර්ථයක් කරා කොමියුනිස්ට්වාදය වෙත ඉදිරියට ගමන් කරමින් සිටිති.

සමාජවාදී නිෂ්පාදන සම්බන්ධකම්වල සම්පූර්ණ ආධිපත්‍යය මත සෝවියට් සංගමයේ මින් පෙර නොවූ ජනතා සම්බන්ධකමක් — සහෝදරාත්මක සහයෝගිතාවයේ හා අන්‍යොන්‍ය ආධාරයේ සම්බන්ධකම් ඇති විය. සමාජවාදයේ ජයග්‍රහණයේ ප්‍රතිඵලයක් වශයෙන්, සමාජවාදී සමාජයේ බලසම්පන්න ගාමක බලවේගය

---

* "සෝ. සං.කො. පක්ෂයේ 25 සම්මේලනයේ ලියවිලි", පිටුව 81.

හැටියට සෝවියට් සංගමයේ ජනතා මිත්‍රත්වය පරිවර්තනය විය. එය සෝවියට් සංගමයේ අනභිභවනීයත්වයේ සහ බලමහිමයේ එක් වැදගත් උල්පතක් විය. පැරණි සමාජ ක්‍රමයෙන් රුසියන් ජනතාවට දායාද වශයෙන් ලැබුණු ජාතික ප්‍රශ්නය සම්පූර්ණ ලෙසත්, ක්‍රමවත් ලෙසත් විසඳාලීම, මාක්ස්–ලෙනින්වාදී දෘෂ්ටියේත්, නිර්ධන පංතික ජාත්‍යන්තරවාදයේත් ප්‍රභාවත් ජයග්‍රහණයකි.

ජාතික පීඩනය සම්පූර්ණයෙන් නැතිකර දැමීමද, එකම රජයක් තුළට නිදහස් හා සමාන අයිතිය ඇති ජනතාවන් සිය කැමැත්තෙන් එක්වීමද, සැබෑ ප්‍රගතියක් ලබාගැනීම සහ ජනතාවන් සමගි කරවීමද සඳහා අවශ්‍ය තත්වයන් නිර්මානය කළ හැක්කේ සමාජවාදී විප්ලවයකට පමණක් බව, ජාතික සම්බන්ධකම් පිළිබඳ ක්ෂේත්‍රයේ සෝවියට් සංගමය ලබාගත් අත්දැකීම් යසට පෙන්වා දෙයි. සමාජවාදී ජාතීන්ගේ පොදු රාජ්‍ය මණ්ඩලයේ රටවල් තුළ මෙන්ම එම රටවල් සමස්ථය අතරද ඇති ජාතික ප්‍රශ්න විසඳාලීම සඳහා එම සමාජවාදී රජයන්, සෝවියට් සංගමයේ අත්දැකීම් ප්‍රයෝජනයට ගනිති. යටත් විජිතවාදී යදම් බිඳ ගෙන විමුක්තිය ලැබූ යෞවන ස්වෛරී ජාතික රජයන්ටද සිය විමුක්තිය සඳහා යටත් විජිතවාදයට විරුද්ධව සටන් කරන්නාවූ ජනතාවන්ටද මේ අගනා අත්දැකීම් ඉතා වැදගත් වේ. අධිරාජ්‍යවාදයට හා යටත් විජිතවාදයට විරුද්ධව ඔවුන් ගෙන යන දුෂ්කර අරගලයෙහි දී සෝවියට් ජනතාවන්ගේ ජයග්‍රහණ ඔවුන්ට ආස්වාදයක් හා ශක්තියක් ලබා දෙයි. සමාජවාදී ජාතීන්ගේ වර්තමානය තුළින් ඔවුහු සිය අනාගතය දකිති.

පූර්ණ පරිමානයෙන් කොමියුනිස්ට් ක්‍රමය ගොඩ නැගීම හා සමග සෝවියට් සංගමයේ ජාතීන්ගේ සම්බන්ධකම්වල නව වර්ධන අවධියක් ඇති වේ. ජාතීන් තවදුරටත් අන්‍යොන්‍ය වශයෙන් සමීපවීම සහ ඔවුන් අතර සම්පූර්ණ සමගියක් ඇති කරවීම එම අවධියේ ලක්ෂණ වනු ඇත.

කොමියුනිස්ට් ක්‍රමයේ ද්‍රව්‍යමය හා තාක්ෂණික පදනම ඇති කිරීම නිසා සෝවියට් සංගමයේ සමූහාණ්ඩුවල ආර්ථිකය තවදුරටත් හැම අතින්ම වර්ධනය කිරීමටත්, ඒවා අතර ඇති ශ්‍රම විභජනය නිරතුරු ලෙස වැඩි දියුණු කිරීමටත්, පවත්නා ආර්ථික සම්බන්ධකම් ව්‍යාප්ත කිරීමටත්, අලුත් ආර්ථික සම්බන්ධකම් ස්ථාපිත කිරීමටත් පුළුවන්කම ලැබේ.

කොමියුනිස්ට්වාදී ඉදිකිරීම්වල සාර්ථකත්වයද, පංතීන් වෙන් කොට පෙන්වන සීමාවන් අහෝසිවීමද, කොමියුනිස්ට්වාදී සමාජමය සම්බන්ධකම් වර්ධනය වීමද නිසා ජාතීන්ගේ සමාජමය ඒකීයතාවය වර්ධනය වේ. ඔවුන්ගේ සංස්කෘතියේද, අධ්‍යාත්මයේ සහ පැවැත්මේද

https://liberationbase.wordpress.com

පොදු කොමියුනිස්ට්වාදී අංග ලක්ෂණ වර්ධනය වෙමින් ඔවුනතර අන්‍යෝන්‍ය විශ්වාසය හා මිත්‍රත්වය තවදුරටත් ශක්තිමත් වීම සහතික වන්නේය. ජාතීන්ගේ අධ්‍යාත්මික සමගිය තවත් තහවුරු වනු ඇත. සෝවියට් ජනතාවගේ සමාජවාදී සංස්කෘතියේ වර්ධනය වඩාත් සම්පූර්ණ වී, විවිධ ජාතීන්ගේ ජාතික සංස්කෘතිය අන්‍යෝන්‍ය සමෘධියක් ලබා ඒවා සමීපවනු ඇත.

සෝවියට් සංගමයේ කොමියුනිස්ට් පක්ෂයේ මධ්‍යම කාරක සභාව විසින් 24 වැනි සම්මේලනයට ඉදිරිපත් කරන ලද වාර්තාවේ මෙසේ සඳහන් වේ. ''සෝවියට් ආණ්ඩුවේ පොදු වුවමනාවන් අනුවද, සෝවියට් සංගමයට අයත් සමූහාණ්ඩුවල සංවර්ධන තත්වයන් සැලකිල්ලට ගනිමින්ද, සමාජවාදී ජාතීන්ගේ තවදුර සමෘධිය සහ ඔවුන්ගේ ක්‍රමාණුකූල සමගිය නොකඩවා ඇතිකරමින්ද, සෝවියට් සමාජවාදී සමූහාණ්ඩු සංගමය ශක්තිමත් කිරීමේ ලෙනින්වාදී ප්‍රතිපත්තිය ඉදිරියටත් ක්‍රියාවේ යෙදවීම අනාගතයේදීත් සපුරාලනු ඇත.''*

කොමියුනිස්ට්වාදය ඉදිකිරීමේදී ජාතීන් තව දුරටත් සමීපස්ථ කරවීම වාස්තවික ක්‍රියාදාමයකි. සෝවියට් සමාජවාදී සමූහාණ්ඩු සංගමයේ පනස්වැනි ජයන්තිය නිමිත්තෙන් වාර්තාවක් ඉදිරිපත් කළ ලියනීඩ් ඉල්යිච් බ්‍රෙෂ්නෙව්, ජාතීන් සමීප කිරීමේ ක්‍රියාදාම කෘත්‍රිම ලෙස ඉක්මන් කිරීමට මෙන්ම එය නැවැත්වීමට කවර හෝ ප්‍රයත්නයක් දැරීමටද, ජාතික වෙන්වීම කෘත්‍රිම ලෙස ශක්තිමත් කිරීමටද පක්ෂය විරුද්ධ වේ. සියලු අන්දමේ ජාතිවාදයට සහ කලහකාරී පටුජාතිවාදී හැඟීම්වලට විරුද්ධවද, ජාතික සීමා සහිත භාවයේ සහ විශේෂතාවයේ ප්‍රවණතාවලට විරුද්ධවද, අතීතය පරමාදර්ශී කිරීමට සහ ජනතා ඉතිහාසයේ සමාජයීය ප්‍රතිවිරුද්ධතාවයන් නැතැයි කීමට විරුද්ධවද, යල්පැන ගිය ජනතා සිරිත්වලට විරුද්ධවද පක්ෂය දැඩි ලෙස සටන් කරයි.

අවසානයේදී ජාතීන් ඒකාබද්ධ වනු ඇත. එසේවුවද, ඒවා අතර ඇති වෙනස්කම් නැතිකරලීම, පංතීන් අතර ඇති වෙනස්කම් නැතිකරලීමට වඩා බොහෝසේ ප්‍රමාදී ක්‍රියාදාමයක් වන්නේය. කොමියුනිස්ට්වාදය ජයගැනීමත් හා සමගම පංතිමය වෙනස්කම් අහෝසිවන අතර, ජාතික වෙනස්කම් විශේෂයෙන්ම භාෂා වෙනස්කම් තවත් දීර්ඝ කාලයක් පවතිනු ඇත.

---

* ''සෝ: ස: කො: පක්ෂයේ 24 සම්මේලනයේ ලියවිලි''. රුසියන් මුද්‍රණය, පිටුව 203.

4. පවුල

පවුල ජනතාවගේ පොදු සමූහයක් වශයෙන්

ජනතාවගේ සමූහය ප්‍රකාශ කරන තවත් එක් වැදගත් ආකාරයක් නම් පවුලය. ස්වාභාවික සහ සමාජයීය ක්‍රියාවන් එකිනෙකට ඉතා ළඟින් වෙළී පවතින, පසු කී ක්‍රියාවන් වැඩියෙන් බලපාන්නාවූ සංකීර්ණ හා අති විශේෂ සමූහයක් පවුල නියෝජනය කරයි. ස්ත්‍රී පුරුෂ සම්බන්ධකම්ද, ළමයින් උපදීමද විසින් ස්වාභාවික (කාය විද්‍යාත්මක) ක්‍රියාකාරිත්වය නියෝජනය කළද, සමාජයීය බලපෑම, පංති සහිත සමාජයේ පංතිමය හරය ප්‍රධාන තැන ගන්නේය. ස්ත්‍රීන් හා පුරුෂයින් අතරද, දෙමාපියන් හා ළමයින් අතරද, ජනගහණය වැඩිවීම ආදියද, සමාජමය සම්බන්ධකම්, ප්‍රථමයෙන්ම ආර්ථික සම්බන්ධකම් අනුව සහ නිෂ්පාදන මාධ්‍යයන්ගේ සම්බන්ධකම් අනුව රඳා පවතී.

ස්ත්‍රීය හා පුරුෂයා නියමිත විධියකට සිය සම්බන්ධකම් ක්‍රමවත් කරන්නාවූත්, දරු පරපුරක් සහතික කරන්නාවූත්, දෙදෙනා අතර අඩු වැඩි වශයෙන් ස්ථිර සම්බන්ධකමක් ඇති කරන්නාවූත් විවාහය සමග පවුල අඛණ්ඩ ලෙස වෙළී පවතී. මේ සම්බන්ධය ස්ත්‍රීය හා පුරුෂයා අතර අන්‍යෝන්‍ය ආකර්ෂණයක්, පොදු වුවමනාවන් සහ අධ්‍යාත්මික සමීපතාවයක් ඇති කරවයි.

පවුලේ සමාජයීය හරය සහ එහි සමාජමය ක්‍රියාවන් ප්‍රකාශවන්නේ කෙසේද?

පංති සහිත සමාජයේ එම ක්‍රියාවන් තුනකි.

පළමුවැන්න: සමාජයේ රජකරන ආර්ථික එමෙන්ම විශේෂ අධිකරණ — නීතිමය සහ සදාචාර ධර්ම පදනම් කරගෙන ස්ත්‍රීන් හා පුරුෂයින් අතර සම්බන්ධකම් ක්‍රමවත් කිරීම.

දෙවැන්න: ප්‍රතිනිෂ්පාදනය සහ දූ දරු පරපුර හද වඩා ගැනීම — ශ්‍රමය වැයකිරීමෙහි සමත් සමාජමය පුද්ගලයින්, වෙනත් වචනවලින් කියතොත්, ශ්‍රම ශක්තිය ප්‍රති නිෂ්පාදනය කිරීම.

තෙවැන්න: ගෙදර වැඩ කටයුතු මෙහෙයැවීම සහ පවුලේ සාමාජිකයින්ගේ පැවැත්මට අවශ්‍ය දෑ සැපයීම.

පවුල ඉතා වැදගත් සමාජමය ක්‍රියාකාරිත්වයක් සපුරාලන අතරම එය සමාජමය සම්බන්ධකම් නැමැති පද්ධතිය සමග ඉතා තදින් වෙළී ඇති බව පෙනේ. නියමිත දේපලක් (යටත් පිරිසෙයින් ගෘහමය දේපල) සහිත පවුල පංති සහිත සමාජයේ මූලික ආර්ථික සෛලය වන්නේය. එය සාපේක්ෂ වශයෙන් ස්වාධීනත්වයක් භුක්ති වින්දද සමාජයේ

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ආර්ථික සම්බන්ධකම්වලට එය අයත් වේ. නියමිත නීතිමය හා සදචාර ධර්ම ක්‍රමවත් කිරීමක් මගින් පවුල දෘෂ්ටිමය හා අධ්‍යාත්මික සම්බන්ධකම් පිළිබඳ පද්ධතියට ඇතුලු කර තිබේ.

පවුල් වර්ගය

පවුල ඓතිහාසික ප්‍රවර්ගයකි. නිෂ්පාදන මාධ්‍යයන්ගේ සහ මුළුමහත් සමාජමය සම්බන්ධකම්වල සමස්තයේ වර්ධනය හා වෙනස්වීම සමග පවුල වෙනස් වී වර්ධනය විය. ගණ ගෝත්‍ර ක්‍රමයට මුලින් පැවති ආදිකල්පික අවධියේදී ස්ත්‍රී පුරුෂ සම්බන්ධකම් අක්‍රමිකව පැවති බැවින්, පවුලක් යැයි කිව හැකි කිසිවක් නොතිබිණි. පවුල සමාජමය ප්‍රපංචයක් ලෙස පළමුවෙන්ම පැන නැංගේ ආදිකල්පික සමාජයේදීය. මුලින් එය මාතෘ මූලික අවධියේ කාණ්ඩමය ස්වරූපයක් දැරීය. එවකට එක් ගණ ගෝත්‍රයකට අයත් සියලු ස්ත්‍රීහු තවත් ගණ ගෝත්‍රයකට අයත් පුරුෂයින්ගේ බිරියන් වූහ. ළමයින් සිය පියවරුන් නොදැන සිටි අතර මවුගේ ළඟම නෑයින්ගේ කාණ්ඩ අනුව ඔවුහු මාතෘ මූලික පවුලේ සාමාජිකයෝ වූහ. ක්‍රම ක්‍රමයෙන් කාණ්ඩ පවුල තුළ යුගළ පවුල ඇති විය. මුලදී මෙය අහම්බෙන් සිදුවන, තාවකාලික බවක් දැරුවද අනතුරුව නිත්‍ය යුගළකගේ සහවාසය ඇති විය. තම දේපල රහිත අස්ථිර පවුල වඩාත් ස්ථිර හා නිත්‍ය ඒක භාර්යා (ඒක විවාහ) පවුලට දුන්නේය. මෙය මාතෘ මූලික සමාජයේ සිට පිතෘ මූලික සමාජය දක්වා පරිවර්තනයවීම සමග වෙළී පවතී. සැමියා සහ පියා පවුලේ ප්‍රධානියාවූ අතර බිරිඳ හා ළමයි ඔහු සමග එකම පියස්සක් යට වාසය කළහ. පවුලට දේපල අයත් වූ අතර පියාගේ පෙළපත් නාමයත් සමග එම දේපල ඔහුගේ ඇවෑමෙන් ළමයිනට අයත් විය.

ප්‍රතිවිරෝධී සතුරු පංති සහිත සමාජය බිහිවීමත් සමගම පවුලේ වර්ධනය පෞද්ගලික දේපලේ වර්ධනය සහ සූරාකෑම සමග ඇති සම්බන්ධය සමග අඛණ්ඩ ලෙස වෙළී පවතී. සමාජ–ආර්ථික සැකැස්ම එකිනෙක වෙනස් වීමේ ප්‍රමාණය අනුව මුලදී වහල් සමාජය, අනතුරුව රදළ සමාජය සහ ධනපති සමාජය ඇති විය.

වහල් හා රදළ සමාජවලදී වහලාට සහ ප්‍රවේණිදස ගොවියාට බිරියක් ගත හැකි වූයේ ස්වාමියාගේ කැමැත්ත පරිදිය. බොහෝ විට වහලාට බිරියක් ගැනීමේ අයිතිය නැතිකර දමා තිබිණි. රදළ සමාජය යටතේ විවාහය වංශ හා කුළ අනුව සිදුවිය. විවිධ කුළ අතර විවාහ තහනම් කැරිණි. පවුල පිළිබඳ වහල් සමාජයේ සහ රදළ සමාජයේ ආවේණික ලක්ෂණය වූයේ, බිරිඳ, ළමයින් හා දේපල මත පවුලේ ප්‍රධානියා දැරූ සීමා රහිත ආධිපත්‍යය සහ ස්ත්‍රිය දැරූ පහත් හා පීඩිත තත්වයය.

ධනපති ක්‍රමයේදී විවාහය හා පවුල පිළිබඳ සම්බන්ධකම්වලදී හුදු නීතිමය ස්වාධීනත්වයක් ප්‍රකාශ කළද, පවුලේ ප්‍රධානියාගේ බලය සහ ස්ත්‍රියගේ අසමාන පහත් තත්වය එලෙසම පවතී. මින් ඉහත නොවූ විරූ පරිදි, ධනපති පවුල දේපලවලින් පටන් ගෙන, ධනය එක් රැස් කරමින්, එය සිය දරු මුනුබුරු පරපුරට අයත් කර දීම ප්‍රධාන කාර්යය හා අරමුණ ලෙස සලකයි. ධනපති පවුල මුදල් හා දේපල අනුව පැවතෙන්නකි. ප්‍රාග්ධනය වැඩිකර ගැනීම හෝ සමාජයේ ඉහළ තැනක් ගැනීම හෝ අරමුණු කරගත් ධනපති විවාහය වෙළඳ ගනු දෙනුවක ස්වරූපයක් ගනී. එබැවින් විවාහයේ හා පවුලේ ශුද්ධත්වය ගැන ධනපතීන් කරන දෙඩවිලි වංචාවක් වීම ස්වාභාවික දෙයකි. ප්‍රාග්ධනය පවුල විකෘති කරයි, වංචාකාරී සම්බන්ධකම් උපදවයි, දූරාචාරයටද, සැමියා හා බිරිඳ අතර අන්‍යෝන්‍ය අවිශ්වාසයටද, සමාන නොවන විවාහයටද වෙනත් දේවලටද මුල පුරයි.

ධනපති ක්‍රමය යටතේ වැඩකරන ජනතාවගේ, කම්කරුවන්ගේ පවුල්, මූලික වශයෙන් ආලය, අන්‍යෝන්‍ය ගරුත්වය සහ සැමියාගේ සහ බිරිඳගේ ශ්‍රමකාමී සහයෝගීතාවය පදනම් කරගෙන ඇතිවේ. එසේවුවද කම්කරු පවුල්ද ප්‍රාග්ධනයේ විනාශකාරී බලපෑමට හසුවේ. අඩු පඩි ලබන කම්කරුවන්ටද, විශේෂයෙන් රැකියා රහිත අයටද විවාහ වීමට අවස්ථාවක් ධනපති ක්‍රමය නැතිකර දමයි. වැඩකරන ජනතාවගේ සමහර බිරියන් හා දූවරුන් කුසගිනි නිවා ගැනීම සඳහා ආහාර සොයන්නේ ගණිකා වෘත්තියට වැටීමෙනි. ධනපති ක්‍රමය යටතේ කාන්තාව දෙයාකාර පෑගීමකට හසුවේ. නිතර පාහේ පුරුෂයාට වඩා අඩු වැටුපට ධනපතියා යටතේ කාන්තාවට වැඩ කිරීමට සිදුවන අතර ළමයින් හදා වඩා ගැනීමේ හා ගෙදර වැඩකිරීමේ බරද ඇය පිට පැටවෙයි. කාන්තාවගේ මේ අසමාන තත්වය ධනපති නීතිය මගින් තහවුරු කොට ධනපති සදචාරය හා ආගම විසින් ස්ථිර කරනු ලැබේ.

සමාජවාදී පවුල

පෞද්ගලික දේපල අයිතිය සහ සූරාකෑම නැතිකර දමන සමාජවාදය කාන්තාවගේ අසමාන අයිතිය ඇතුලු සියලු අන්දමේ පීඩනයන් හා අසමානතාවයන් අහෝසිකර දමයි. සමාජවාදය පවුලට සැපත ළඟා කරමින්, පෞද්ගලික දේපල අයිතියෙන් එය මුදවාලයි. සැමියාගේ හා බිරිඳගේ ආලය, මිත්‍රත්වය සහ සහයෝගීතාවය මත පටන් ගැනෙන විවාහයක් සහ පවුලක් ඇතිකර ගැනීමට සමාජවාදය සියලු හැකියාවන් ඇති කර දෙයි. සමාජවාදය යටතේ ස්ත්‍රිය පුරුෂයාට සමාන අයිතියක් ලබන්නීය. සෝවියට් ස්ත්‍රිය පුරුෂයා මෙන්ම සම අයිතියක් ඇත්තියකි. රැකියාවක් කිරීමේ අයිතියද, සමාන වෘත්තියට පුරුෂයාට සමාන වැටුප්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ලැබීමටද, සමාජමය වැඩවලදී ක්‍රියාශීලී වීමටද, සමාජය මෙහෙයැවීමටද, බුද්ධිමය වශයෙන් දියුණු වීමටද ස්ත්‍රීයට සම්පූර්ණ අයිතියක් ඇත්තේය. සෝවියට් සංගමයේ කම්කරුවන්ගෙන්, සමූහ ගොවීන්ගෙන් හා බුද්ධිමතුන්ගෙන් සෑහෙන කොටසක් ස්ත්‍රීන්ය. ගුරුවරුන්ගේද, දොස්තරවරුන්ගේ හා හෙදියන්ගේද, වෙළඳ සේවකයින්ගේද බහුතර සංඛ්‍යාව ස්ත්‍රීහුය. උත්තරීතර සෝවියට් මන්ත්‍රී මණ්ඩලයේ කාන්තා මන්ත්‍රීවරුන් සිය ගණනකි. සමාජ ජීවිතයේ සියලු ක්ෂේත්‍රවල කාන්තාව ක්‍රියාශීලීවීම නිසා මව්වරුන්ට හා ළමයින්ට ආධාර දීමටද, ඉතා පුළුල් වශයෙන් පාසල්, ළමාගාර, බාලාංශ, නේවාසික-පාසල්, පොදු අවන් හල් සහ වෙනත් පෞද්ගලික ආයතන සාදා සමාජවාදී සමාජය ගැන සැලකිලි දක්වීමටද හැකියාවක් ලැබී ඇත්තේය. මේවා සියල්ල පවුල කෙරෙහි හිතවත් ලෙස බලපායි. සැබෑ මානව භක්තික මුල පිරීමක් ඇති කරගැනීමටද, පවුල් සම්බන්ධකම්වලදී සමාජවාදී ආකල්පය ඇති කරගැනීමටද එය ආධාර වෙයි. සමාජවාදී පවුල — සමාජවාදයේ හරය විසින් සහ සමාජවාදී සමාජමය සම්බන්ධකම් විසින් බිහිකරන ලද ගුණාත්මක වශයෙන් අලුත් පවුලකි.

පවුල් සම්බන්ධකම්වලදී, සමාජවාදය යටතේ වුවද තවමත් පැරණි සමාජයේ නටබුන් දැකිය හැක. ගෙදර දොර හා එදිනෙදා වැඩවලදී ස්ත්‍රීය දරන අසමාන තත්වය විසින් මෙය ප්‍රකාශ වේ. සමාජවාදය යටතේ පවුල සිය ගෘහමය දේපල හා ගෙදර දොර ආර්ථිකය ආරක්ෂා කරන බැවින් එහි වැඩි බර හා වගකීම ස්ත්‍රීය පිට පැවරේ. සෝවියට් සංගමයේ සමහර සමූහාණ්ඩුවල රදළ බායිවාදී පැරණි සිරිත්වල නටබුන් (බාල වියේදී තරුණියන් විවාහ කරදීම, බිරියන් මිලදී ගැනීම ආදිය) තවමත් සුරැකිව පවතී. කොමියුනිස්ට්වාදය ඉදිකරත්ම ස්ත්‍රීය දරන අසමාන තත්වය ක්‍රමයෙන් අහෝසි වනු ඇත. දරුවන් හදා වඩා ගැනීම, ආහාර පානාදිය පවුල්වලට සැපයීම සමාජය පවරා ගනු ඇත. කොමියුනිස්ට්වාදී සමාජයේදී පවුල ආර්ථික ඒකකයක් වශයෙන් ක්‍රියා කිරීම අහෝසි වී ගොස්, ස්ත්‍රී පුරුෂ සම්බන්ධකම් ක්‍රමවත් කිරීම, දරු පරපුරක් ඇතිකිරීම හා දරුවන් හදා වඩා ගැනීම රැකගනී. පවුල් සම්බන්ධකම්වල පංතිමය ස්වභාවය අහෝසි වී යන අතර එය කොමියුනිස්ට්වාදී අධ්‍යාත්මික ගුණ ධර්ම අනුව පාලනය වනු ඇත.

VI

රජය

රජය පිළිබඳ ප්‍රශ්නය තරම් ධනපති සමාජ විද්‍යාඥයින් විසින් ව්‍යාකූල කරන ලද තවත් ප්‍රශ්නයක් නැත්තේ යැයි වී. අයි. ලෙනින් පෙන්වා දුන්නේය. මෙසේ වීමට හේතුව, පාලක පංතීන්ගේ වුවමනාවන්ට ඊට වඩා බලපාන වෙනත් ප්‍රශ්නයක් නොමැති වීමය. අනාදිමත් කාලයක සිට දෙවියන් වහන්සේ විසින් මනුෂ්‍යයාට දෙන ලද අද්භූත බලවේගයක් ලෙස රජය හැඳින්වීමට ධනපති දෘෂ්ටිවාදියෝ පුරුදුව සිටිත්. එයට කිසිදු පංතිමය ස්වභාවයක් නැතැයිද, එය කිසිවෙකුට හානියක් නැති හුදු "විනය උපකරණයක් වන්නේ යැයිද, ජනතාව අතර පැන නගිනු හැකි ආරවුල් පංතිමය බැඳීම් කිසිවක් නොසලකා විසඳාලීමට "විනිසුරු" වරයෙකු වෙතියිද ඔවුහු කියති. රජය පිළිබඳ මෙවැනි "න්‍යායයක්" ධනපතීන්ගේ වරප්‍රසාද සහ ධනපති ක්‍රමයේ සූරාකෑම සාධාරන යැයි පෙන්වීමට උපකාර වේ.

රජයේ සම්භවය හා එහි හරය පිළිබඳවද, සමාජ ජීවිතයේ එය ඉටු කරන ක්‍රියා කලාපය පිළිබඳවද විද්‍යාත්මක විස්තරයක් ඉදිරිපත් කරන ලද්දේ මාක්ස්-ලෙනින්වාදය විසින් පමණකි.

1. රජයේ සම්භවය සහ එහි ස්වභාවය

ධනපති දෘෂ්ටි වාදීන්ට ප්‍රති විරෝධ තත්වයක් ගන්නා මාක්ස්වාදය රජය බාහිරින් සමාජයට ඇතුලත් කරන ලද දෙයක් නොවන බවත්, එය සමාජයේ අභ්‍යන්තර සංවර්ධනයේ ප්‍රතිඵලයක් වන බවත් පෙන්වා දෙයි. ද්‍රව්‍යමය නිෂ්පාදනයේ ඇතිවූ වෙනස්වීම් විසින් රජය බිහි කරන ලදී. එක්

<u>රජය සමාජයේ ඓතිහාසික සංවර්ධනයේ ඵලයකි.</u>

https://liberationbase.wordpress.com

නිෂ්පාදන ක්‍රමයක් වෙනුවට තවත් ක්‍රමයක් අනුප්‍රාප්ත වීම නිසා රාජ්‍ය ක්‍රමයේද වෙනස්වීමක් ඇතිවේ.

රජය සැමදා පැවතියේ නොවේ. පෞද්ගලික දේපල නොතිබුණු ආදි කල්පික සමාජයේ පංතීන් හෝ රජයක් හෝ නොවීය. ස්වාභාවික වශයෙන්ම එම සමාජයේද කිසියම් සමාජමය කාර්යයන් තිබුණි. මුළු මහත් සමාජයම විසින් තෝරාගත් මිනිස්සු ඒවා ඉටුකළහ. ඕනෑම වේලාවකදී ඒ මිනිසුන් ඉවත් කොට එම කාර්යයන් වෙනත් අයට පැවරීමේ අයිතිය සමාජයට තිබිණි. ඒ ඈත කාලයේදී මිනිසුන් අතර සම්බන්ධකම් සමාජමය බලවේගය මත පදනම් වී තිබුණේය.

අප දන්නා පරිදි නිෂ්පාදනීය බලවේගයන්ගේ වැඩි දුර වර්ධනය ආදිකල්පික සමාජය බිඳ වැටීමට හේතුවිය. පෞද්ගලික දේපල අයිතියත්, ඒ සමගම පංතීන්, වහල්ලු සහ වහල් හිමියනුත් ඇති වූහ. පෞද්ගලික දේපල ආරක්ෂා කිරීමට, නැතහොත් එය අයිතිකරුවන්ගේ පාලනය හා ආරක්ෂාව සුරක්ෂිත කිරීම අවශ්‍ය විය. මේ හේතු නිසා රජය පැන නැගිණි. රජයේ බිහිවීමත් එහි වැඩිදුර වර්ධනයත් සිදුවූයේ දරුණු පංති අරගලයක්ද සමගය.

රජය වූ කලී පංති සහිත සමාජයේ නිෂ්පාදිතයකි. එය මතු වූයේ පංතිවල උපත සමගය. පංති නැතිවීයාමත් සමගම රජයද අභාවයට යනු ඇත. එහෙත් එය සිදුවන්නේ කොමියුනිස්ට්වාදී සමාජයේදීය.

රජය යනු කුමක්ද?

රජයේ ස්වභාවය

සතුරු පංති සහිත සමාජයක රජය දේශපාලන අවියකි, ''එක් පංතියක පාලන බලයට තවත් පංතියක් යට කර තබා ගැනීම සඳහාවූ යන්ත්‍රයකි.''* ආර්ථික ආධිපත්‍යය උසුලන, එනම් නිෂ්පාදන මාධ්‍යයන් අයත් කරගෙන සිටින පංතිය, පීඩිතයින් හා සූරාකනු ලබන්නන් යටත් කර තබා ගැනීම සඳහා රජය බලසම්පන්න අවියක් කොට ගනී. රජයෙහි සුපැහැදිලි පංතිමය ස්වභාවයක් ඇත. සමාජයක ආර්ථික අඩිතාලම මත ගොඩ නගන ලද උඩු ව්‍යුහයේ ප්‍රධාන කොටස වන රජය, එම අඩිතාලම ශක්තිමත් කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා හැම පියවරක්ම ගනී.

රජයේ අංග ලක්ෂණ කවරේද?

මුළු මහත් ජනතාවගේම නොව, ආර්ථික ආධිපත්‍යය සතු පංතියේ වුවමනාවන් සහ අයිතිවාසිකම් ප්‍රකාශ කරන පතළ (සමාජ) බලයක් තිබීම රජයේ ප්‍රධාන ලක්ෂණය වන්නේය. එම බලය අවිගත් සේනාව වන යුද්ධ හමුදාව සහ පොලීසිය මත රඳා පවතී.

---

* වි. අයි. ලෙනින්. සම්පූර්ණ කෘතීන්, වෙළුම 39, පිටුව 73.

ආදිකල්පික සමාජයේ මුළු මහත් ජනතාවම ආයුධ සන්නද්ධව සිටියහ. එහෙත් සතුරු පංතිවලට බෙදී ඇති සමාජයේ සන්නද්ධ සේනා අධිපති බව දරන පංතිය අත පවතී. ජනතාව මර්ධනය කිරීම සඳහාත් ඔවුන් සූරාකන්නන් අතලොස්සකට යට කිරීම සඳහාත් ඒවා උපයෝගී කරගනු ලැබේ. එම අරමුණ සඳහා නියෝජිත බල මණ්ඩල (පාර්ලිමේන්තු) ද, නිලධාරීන් විශාල හමුදවක් සහිත දැවැන්ත නිලධාරිවාදී පරිපාලන යන්ත්‍රයද, චර පුරුෂ සංවිධානද, උසාවි සහ හිරගෙවල්ද යන මේ සියල්ලම යොදගන්නේ එම කටයුත්ත සඳහාමය. මේවා සියල්ල ඒකකයක් වශයෙන් ගත්විට, එයින් සූරාකන පංතියේ දේශපාලනමය බලය පිළිබිඹු වන්නේය.

පංති ප්‍රතිවිරුද්ධතාවයන් ගැඹුරුවන තරමට සහ පංති සටන් වැඩිවන තරමට රාජ්‍ය යන්ත්‍රය විශාල වේ. රාජ්‍ය යන්ත්‍රය සහ අවි ගත් යුද්ධ සේනා මින් පෙර නොවූ විරූ තරමින් විශාල වී ඇති සමකාලීන ධනපති සමාජයේ එම ක්‍රියාදමය වඩාත් ප්‍රකර්ෂ වී ඇත. මේ යෝධමය රාජ්‍ය යන්ත්‍රය සහ විශේෂයෙන් යුද්ධ හමුදාව නඩත්තු කිරීමේ විශාල බර වැඩ කරන ජනතාව පිට පැටවී තිබේ.

ආදිකල්පික සමාජයේ මිනිසුන් ලේ නෑකම් අනුව කණ්ඩායම් වශයෙන් වාසය කළ අතර රජයක් තුළ ජනගහනය ප්‍රදේශ අනුව, දිසා, අනු දිසා, ප්‍රාන්ත, ප්‍රදේශ ආදිය අනුව බෙදා වෙන් කොට ඇත්තේය. ප්‍රදේශ අනුකූල පදිංචිය ඇතිවූයේ නිෂ්පාදන සංවර්ධනය, ශ්‍රම විභජනයේ ව්‍යාප්තිය, වෙළඳාම සහ වෙළඳ භාණ්ඩ හුවමාරුව දියුණුවීම යන මේවායේ ප්‍රතිඵලයක් වශයෙනි.

2. සූරාකන සමාජයේ රජය

සූරාකන සමාජයක ක්‍රියාකාරිත්වය

සූරාකන හැම සමාජයකම (වහල්, රදළ හා ධනපති) රජය, අභ්‍යන්තර වශයෙන් වෙනත් පංතීන්ගෙන්ද බාහිර වශයෙන් වෙනත් රජයන්ගෙන්ද පාලක පංතියේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා කටයුතු කරයි. ඒ අනුව රජයකට ප්‍රධාන ප්‍රවණතාවයන් නැතහොත් කාර්යයන් දෙකක් ඇත්තේය. ඒ අභ්‍යන්තර හා බාහිර වශයෙනි. අභ්‍යන්තර කාර්යය මින් ප්‍රධාන වන අතර, රජයේ සියලුම විදේශ කටයුතු ඒ අනුව නිගමනය කෙරේ.

මෙම කාර්යයන් පරීක්ෂා කර බලමු.

සූරාකන රජයක අභ්‍යන්තර ක්‍රියාකාරිත්වය වන්නේ වැඩකරන ජනතාව පාලනයට අඩංගුකර තබාගැනීමත්, අතලොස්සක්වූ

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

පීඩකයිනට ඔවුන් යටත් කිරීමත්‍ය. එය රජයේ පංතිමය ස්වභාවය විදහා පෙන්වයි. පීඩිත පංතිවලට විරුද්ධව කරන අරගලයෙන් හා දේශීය ප්‍රතිපත්තියෙන් එය ප්‍රකාශිත වේ. එම අරගලයෙන් ජය ලබාගැනීම සඳහා සූරාකන්නන් සතු ආර්ථික බල කිරීමේ හැකියාව පමණක් ප්‍රමාණවත් නොවේ. නිෂ්පාදන මාධ්‍යයන්ගේ ඒකාධිකාරී අයිතිය ඔවුන් සතු නිසා සූරාකන්නන්ට ආර්ථික බලකිරීමක් කළ හැකිය. ඊට අමතරව බල කිරීමේ විශේෂ යන්ත්‍රයක්ද, නැතහොත් සූරාකන රජයක්ද, අවශ්‍ය වන්නේය.

ප්‍රථම සූරාකන රාජ්‍ය වහල් රාජ්‍ය විය. ඉන් පසු රදළ රජයද, එයිනුත් ඉක්බිතිව ධනපති රජයද ඇතිවිය. මේවා අතර වෙනස්කම් තිබුණද, මේවා හැම එකකටම පොදුවූ එක කර්තව්‍යයක් විය. එය නම් පොදු ජනතාව පාලනය කර තබාගැනීම හා සූරාකෑමෙන් මිදීම සඳහා වැඩකරන ජනතාව දරන හැම ප්‍රයත්නයක්ම පොඩි පට්ටම් කර දැමීමය.

ස්වකීය ස්වාමිවරුන්ට විරුද්ධව නැගී සිටි වහලුන්, වහල් හිමියන්ගේ රජයේ අවි බලයෙන් මඩින ලදී. ප්‍රවේණිදාසයා ඉඩම් හිමියාගේ ඉඩමට බලෙන් බැඳ තැබූ රදළ රජය, රදළ ස්වාමියාට බැල මෙහෙවර කිරීමට අකමැතිවූ ප්‍රවේණිදාසයින්ට කෲර ලෙස දඬුවම් පැමිණවීය. ගොවි කැරළි විශාල සංඛ්‍යාවක් මහා ලේ වැගිරීම්වලින් කෙළවර විය. ප්‍රජාතන්ත්‍රවාදී ඇඳුමින් සැරසී පෙනී සිටීමට ධනපති රජය කැමති වුවද, එය වැඩකරන ජනතාව යටපත් කිරීමේ යන්ත්‍රයක් වන්නේය. ධනපති රජයේ සැබෑ අරමුණ පෞද්ගලික ධනපති දේපල ආරක්ෂා කිරීමත්, වැටුප්-වහල්භාවය ආරක්ෂා කිරීමත්, නිර්ධන පංතියේ විප්ලවවාදී ව්‍යාපාරය මර්ධනය කර දැමීමත්‍ය.

සූරාකන රාජ්‍යයක විදේශීය කාර්යය නම් පිටරටවල් අල්ලා ගැනීම හෝ විදේශීය ආක්‍රමණවලින් තම රට ආරක්ෂා කිරීම හෝ වන්නේය. රජය වෙනත් රජයන් හා සමග පවත්වන සම්බන්ධකම්වලදී මෙය පිළිබිඹු වන අතර එය එහි විදේශීය ප්‍රතිපත්තියෙන් ප්‍රකාශිත වේ. සමකාලීන අධිරාජ්‍යවාදයේ ප්‍රතිගාමී කොල්ලකාරී විදේශීය ප්‍රතිපත්තිය, කම්කරු පංතිය සහ අනිකුත් ප්‍රගතිශීලී බලවේග මර්ධනය කරන එහි දේශීය ප්‍රතිපත්තියේ ස්වාභාවික ඌන පූරකයක් වන්නේය.

රාජ්‍ය වර්ග සහ පාලන විධි

රාජ්‍යයන් කිනම් පංතියට සේවය කරන්නේද? කිනම් ආර්ථික අඩිතාලමක් මත පැන නැගුණේද යන්න අනුව ඒවායේ වර්ගයද වෙනස් වේ. ඉතිහාසය රාජ්‍ය වර්ග හතරක් දනී. ඒ වහල් රදළ ධනපති සහ සමාජවාදී යනුය. සූරාකන්නන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා

කරන මුලින් සටහන් රාජ්‍ය තෛවර්ගය මෙන් නොව, සමාජවාදී රාජ්‍ය අලුත් වර්ගයකට අයත්, සැබෑ ජනතා රාජයකි.

හැම රාජ්‍ය වර්ගයකටම එය ආවේනික ආණ්ඩු ක්‍රමයක්, එනම් පාලන ක්‍රමයක්, නැතහොත්, ආධිපත්‍යය උසුලන පංතියේ ආණ්ඩු සංවිධානයක් ඇත්තේය. හැම රටකම ඇති නියම ඓතිහාසික තත්වයන් සහ රට තුළ ඇති පංතීන් අතර පවතින සහ සම්බන්ධයද, විදේශීය තත්වයන්ද, අනුව පාලන විධි සකස් වේ. ආණ්ඩුවේ ස්වරූපය කෙතරම් විවිධාකාර වුවද එය කෙතරම් වෙනස් වුවද රාජ්‍ය නියමිත ආර්ථික ක්‍රමයක රාමුවක් යටතේ පවතින තාක්කල් එහි වර්ගයත් පංති ස්වභාවයක් නො වෙනස්ව පවතී.

වී. අයි. ලෙනින් පෙන්වා දුන්නාක් මෙන් වහල් සමාජයට ආණ්ඩු ස්වරූප කිහිපයක්ම තිබිණි. ඒවා මෙසේය: එකකුගේ පාලනයක් වන රාජාණ්ඩුවක් අධිරාජයෙක්, රජෙක් තෝරා පත්කරගත් පාලනයක් වන සමූහාණ්ඩුවක්, සාපේක්ෂ වශයෙන් කුඩා කොටසකගේ පාලනයක් වූ සර්ව බලධාරි ඒකාධිපතිත්වයක්, බහුතර සංඛ්‍යාවකගේ පාලනය සහිත ප්‍රජාතන්ත්‍රවාදයක් මේ සියලු වෙනස්කම් ඇති වුවද, වහල් යුගයේ රජය වහල් හිමියන්ගේ රජයක් විය.

රදළ සමාජයේදීද මෙයට සමාන චිත්‍රයක් දැකීමට පුළුවන. පුළුල් ලෙස පැතිර ගිය රදළ ආණ්ඩු ක්‍රමය රාජාණ්ඩුව වුවද, සමහර අවධි-වලදී එය වෙනත් ස්වරූපයක්, ගත්තේය. නිදසුනක් වශයෙන් සමූහාණ්ඩු ස්වරූපයක් ගත්තේය. ආණ්ඩු ස්වරූපය කුමක් වුවද, රදළවාදී රජය ප්‍රවේණිදාස ගොවීන් සහ හස්ත කර්මාන්ත කරුවන් මර්දනය කරන අවියක් සේ ක්‍රියා කළේය.

ධනපති ආණ්ඩුවේ ස්වරූපද විවිධාකාරය. බොහෝ විට එය සමූහාණ්ඩුවක (ඇමෙරිකා එක්සත් ජනපදය, ප්‍රංශය, ඉතාලිය හා වෙනත් රටවල මෙන්) ආකාරයක් ගනී. ධනපති ක්‍රමය තුළදී කලාතුරකින් රාජාණ්ඩු දැකිය හැකිය. එය පවතින රටවල රාජ බලය අඩු වැඩි වශයෙන් ව්‍යවස්ථා මගින් හෝ ව්‍යවස්ථාදායක පණත් මගින් හෝ (එංගලන්තය සහ බෙල්ජියම) සීමා වී ඇත. අධිරාජ්‍යවාදය යටතේ ධනපති පංතිය පැසිස්ට්වාදී ආඥාදායක (හිට්ලර් ජර්මනිය, විලිය ආදී රටවල) ආණ්ඩු ක්‍රමද ප්‍රයෝජනයට ගනී. ධනපති රාජ්‍යයේ කුමණ ස්වරූපය මගින් වුවද ධනපති පංතියේ සීමා රහිත බලය ක්‍රියාත්මක කරනු ලැබේ.

සමාජයේ වර්ධනයත් සමගම රජයේ වර්ග හා විධි වෙනස්වේ. එසේ වුවද ඒවායේ ස්වභාවය වන සූරාකෑම ඉන් වෙනස් නොවේ. සූරාකන ආකාරය වෙනස් වුවද, සූරාකෑම වෙනස් නොවීය.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ධනපති පංතියේ දෘෂ්ටිවාදියෝ සහ දේශපාලඥයෝ ධනපති රජයේ ප්‍රගතිශීලී කාර්ය කොටස ගැන කථා කිරීමට රුචියක් දක්වති.

සමකාලීන ධනපති රජයේ ප්‍රතිගාමී ස්වභාවය

ජනතාවට පූර්ණ නිදහස ලබා දී තිබෙන්නේ මෙම රජය පමණක් බවත් උසස්තම ප්‍රජාතන්ත්‍රවාදය එය වන බවත් ඔවුහු කියති. කම්කරුවන් මෙන්ම ධනපතියන් එකසේ මැඩපැවැත්වීම රජයෙන් කෙරෙන බවත් රජය පංතිවලට ඉහළින් සිටින බලවේගයක් බවත් පෙන්වීමට තැත්කරන සමකාලීන ප්‍රතිසංස්කරනවාදීහු ඒ ගැන බලවත් ඝෝෂාවක් කරති. රජය එක් පංතියක එනම් ධනපති පංතියේ අවයවයක් වූ තත්වය අවසන් වී දැන් ඒ සමාජයේ සියලු පංතිවලට සේවය කරන බවද ඔවුහු පවසති. සමකාලීන ධනපති රාජ්‍යයේ ප්‍රගතිශීලී ස්වාභාවය ගැන සංශෝධනවාදීන් කරන මේ ප්‍රකාශ පදනම් විරහිතය.

ධනපති ක්‍රමයේ අරුණෝදය කාලයේදී, ධනපති රජයට ප්‍රගතිශීලී ලක්ෂණ සමහරක් තිබුණු බව සත්‍යයකි. රදළ සම්බන්ධකම්වලට වඩා දියුණු ධනවාදී නිෂ්පාදන සම්බන්ධකම් ඇති කිරීමට ධනපති රාජ්‍ය උපකාරී විය. එහෙත්, ධනපති රජයේ උත්කර්ෂවත් අවධියේදී වුවද එය සියළු දෙනාටම ප්‍රජාතන්ත්‍රවාදී වූයේ නැත; එය ප්‍රජාතන්ත්‍රවාදී වූයේ තෝරාගත් ස්වල්ප දෙනෙක්වූ ධනපති පංතියට පමණකි. "ධනේශ්වර සමාජයේ ප්‍රජාතන්ත්‍රවාදය ඉතාමත් අල්ප තර අඩු පිරිසකට, ධනවතුන්ට ප්‍රජාතන්ත්‍රවාදයකි." වි. අයි. ලෙනින් ලියුවේය.

LIBERATIONBASE

ධනපති රජය කිනම් ආකාරයෙන් පැවතුනද, එය ධනපති පංතියේ ආඥාදායකත්වයකි, එය කම්කරු පංතිය හා වැඩකරන ජනතාව මර්දනය කිරීමේ මාධ්‍යයකි. ධනපති රජය නිතරම එහි පංති සතුරාට විරුද්ධව බල කිරීම ක්‍රියාත්මක කරයි. වෙනස් විය හැක්කේ එහි ප්‍රමාණය හා ආකාරය පමණකි. අධිරාජ්‍යවාදය ඇත් වීමත් සමගම ධනපති රජය එක එල්ලේම ප්‍රතිගාමීත්වයට හැරුණේය. ඓයිතිහාසික ප්‍රගතියට බොහෝ කලක සිටම බාධාකරන ධනපති ක්‍රමයේ ආර්ථික අඩිතාලම ආරක්ෂා කිරීමේ අපකීර්තිමත් කාර්යය ධනපති රජය භාරගෙන ඇත්තේය.

අධිරාජ්‍යවාදය හැම අංශයකින් ප්‍රතිගාමීය. විශේෂයෙන්ම රාජ්‍ය ප්‍රතිපත්තිය අතින් ප්‍රතිගාමීය. දේශීය ප්‍රතිපත්තිය මෙන්ම විදේශීය ප්‍රතිපත්තිය අතින්ද අධිරාජ්‍යවාදය එකසේ ප්‍රජාතන්ත්‍රවාදය උල්ලංඝණය කිරීමටත් ප්‍රතිගාමී ලෙස ක්‍රියා කිරීමටත් ප්‍රයත්න දරයි. ඒ අනුව බලන විට අධිරාජ්‍යවාදය ප්‍රජාතන්ත්‍රවාදය "පොදු වශයෙන්ද, සෑම ආකාර ප්‍රජාතන්ත්‍රයක්මද "නිෂේධන කරන" බව විවාද රහිතව පිළිගත යුතුය."*

---

* වි. අයි. ලෙනින්. සම්පූර්ණ කෘතීන්, වෙළුම 30, පිටුව 93.

අධිරාජ්‍යවාදය යටතේ රාජ්‍ය ඒකාධිකාරී ධනපති ක්‍රමය පුළුල් ලෙස ව්‍යාප්තවේ. ඒකාධිකාරින් පොහොසත් කරවීම සඳහාත්, නිර්ධන පංති ව්‍යාපාරය හා ජාතික විමුක්ති අරගලය විනාශ කර දැමීම සඳහාත්, ධනපති ක්‍රමය ආරක්ෂා කිරීමට වැර දැරීම සහ ආක්‍රමණකාරී යුද්ධ පටන් ගැනීම සඳහාත්, එය ඒකාධිකාරි ව්‍යාපාරවල ශක්තිය රාජ්‍ය බලය සමග සංයෝජනය කොට, එකම යන්ත්‍රයක් සාදයි. ඒකාධිකාරී ඉහළ තට්ටුවේ කාර්යයන් මෙහෙයැවීමේ කොමිටුවක් බවට රජය පත්වන්නේය. පසුකී තට්ටුවේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා රජය නිරතුරුවම ධනපති නිෂ්පාදනයට අත දමයි, විවිධ විධිමත්කාරී පියවරයන් ක්‍රියාවේ යොදවයි, ඒකාධිකාරීන්ට හැකි තරම් උසස් ලාභ ලබාදීම සඳහා ආර්ථිකයේ එක්, එක් අංශ රජයට පවරා ගනී.

කාලීන ධනපති රජයේ දේශීය සහ විදේශීය ප්‍රතිපත්තිවල ප්‍රතිගාමී ස්වරූපය වසන්කිරීම, නිදහස හා ප්‍රජාතන්ත්‍රවාදය ගැන කරන චතුර කථාවලින් හෝ ධනවාදී ව්‍යවස්ථා ගැන සඳහන් කිරීමෙන් හෝ එසේ නැතහොත්, ධනවාදයේ සභ්‍යත්ව ව්‍යාප්ත කාර්ය භාරය පිළිබඳ ප්‍රකාශනවලින් හෝ කළ නොහැක. අධිරාජ්‍යවාදී රටවල ව්‍යවස්ථා දෙස බලන්නේ නම්, විවිධාකාර නිදහස සහ සියලු පුරවැසියන්ට අයිතිවාසිකම් දීම පිළිබඳ වගන්ති එහි අඩුවක් නැත. සර්වජන ඡන්දය, නිදහස් මැතිවරණ, කතා කිරීමේ හා ප්‍රවෘත්තිපත්‍ර නිදහස ආදීය ගැන වගන්ති එහි ඇත. රට වැසියන්ගේ බහුතර සංඛ්‍යාව වන වැඩ කරන ජනතාවට ඇත්ත වශයෙන් මේ නිදහස වලංගු නැති තත්වයක පවතී. ආර්ථික අවි සහ දේශපාලන ආධිපත්‍යයේ සියලු අවයව, පාලනය කරන ධනපති පංතියට පමණක් වේ. සියලු වරප්‍රසාද සම්පූරණයෙන් භුක්ති විඳීමට පුළුවන.

ඊනියා ස්වාධීන ධනපති ලෝකයේ රැකියා රහිත වූවෝ කෝටි ගණනින් සිටිති. විවේක ගැනීමේ අයිතිය සහ සමාජමය රක්ෂණ ගැන කෙසේ වෙතත්, සියලු වැසියන්ට රැකියාවක් කිරීමේ අයිතිය පවා සහතික කිරීමට ධනපති රජය අසමත් බව ඔප්පු වී ඇත.

ධනවාදී සුරලොවක් ගැන ධනපතින් හා ඔවුන්ගේ දෘෂ්ටිවාදීන් කොපමණ කීවද, සාපේක්ෂ වශයෙන් කුඩා, අතළොස්සක් පමණ වූ සූරාකන්නන් කණ්ඩායමක් විසින් පොදු ජනතාවගේ බහුතර සංඛ්‍යාව පීඩනයට පත් කරවන, කෝටි සංඛ්‍යාත වැඩ කරන ජනතාවට කිසිදු අයිතියක් නැතිව, හිඟාකෑම හා විරැකියාව පමණක් ඇති සමාජයක් වශයෙන් ධනපති සමාජය අතීතයේ මෙන්ම වර්තමානයේත් පවතිනු ඇත. අධිරාජ්‍යවාදී ලෝකයේ ස්වාධීනත්වයේ සැබෑ හරය වන්නේ, ඒකාධිකාරින්ගේ යකඩ සපත්තුවට හසුවන, සිය රටේ පමණක් නොව,

https://liberationbase.wordpress.com

වෙනත් විදේශීය රටවල කම්කරු පංතිය හා වැඩ කරන ජනතාව, සූරාකෑමට ඇති ස්වාධීනත්වය ය.

අධිරාජ්‍යවාදී තත්වයන් යටතේ මූල්‍ය කතිපයාධිපතිත්වය අන්ත ප්‍රතිගාමී පාලන ක්‍රමවලට එනම් විවෘත ත්‍රස්තවාදී ඒකාධිපතිත්වයට නැතහොත් පැසිස්ට්වාදයට වැඩි වැඩියෙන් එළඹෙන අතර, ජනතා කෝපයෙන් මිදීමේ අවසාන තුරුම්පුව වශයෙන්ද, නොවැළැක්විය හැකි විනාශය කල් දැමීමේ එකම හැකියාව වශයෙන්ද යුද්ධ හමුදව හා පොලිසිය පාවිච්චි කරයි.

අධිරාජ්‍යවාදී ප්‍රතිගාමීත්වයද, මිලිටරිවාදීන් සහ පළිගන්නා කවයන්ද ලෝකයේ ප්‍රතිගාමී ආණ්ඩුවලට හැම ආධාරයක්ම දෙන අතර ලෝකයේ සංහිඳියාව ප්‍රතික්ෂේප කොට, ජාත්‍යන්තර නොසන්සුන් තාවය උග්‍ර කරවයි ලෝකයේ විවිධ පෙදෙස්වල නොසන්සුන් තාවය ආරක්ෂා කිරීමට පමණක් නොව, විශේෂයෙන් මැද පෙරදිග ඇතැම් වෙනත් ප්‍රදේශවල අවුල් සහගත තත්වයන් තවත් උග්‍ර කරවීමට අධිරාජ්‍යවාදිහු ක්‍රියා කරති. ඊශ්‍රායලයේ ආක්‍රමණිකයන්ගේ සහ ඔවුන්ගේ ස්වාමිවරුන් වන අධිරාජ්‍යවාදයේ සහ සියනිස්ට්වාදීන්ගේ වැරදි නිසා දැනට වසර කිහිපයක් තිස්සේ මැද පෙරදිග ඉතා අවදානම් සහිත පුපුරන සුළු තත්වයක් පවතී. මේ තත්වය විසඳාලිය හැක්කේ ඊශ්‍රායලය අල්ලා ගෙන සිටින අරාබි රටවලින් ඊශ්‍රායල් හමුද සම්පූර්ණයෙන් ඉවත් කර ගැනීමෙන් සහ මැද පෙරදිග සියලු ආණ්ඩුවල හා ජනතාවගේ ස්වාධීනත්වය සහ නීත්‍යානුකූල අයිතියට ගරු කිරීමෙන් පමණක් බව ප්‍රගතිශීලී හා සමකාමී සියලු ජනතාව සාධාරණ ලෙස විශ්වාස කරති.

යටත් විජිත රටවල ජනතාවගේ 'විමුක්ති කාමියා' ලෙස පෙනී සිටීමට තැත් කරන අධිරාජ්‍යවාදය, ජාතික විමුක්ති ව්‍යාපාරයට විරුද්ධව කෲර තර සටන් මෙහෙයවමින් එම රටවල ජනතාව මත වෙනත් ආකාරයක යටත් විජිතවාදයක් පැටවීමට ක්‍රියා කරයි. නාමික වශයෙන් ස්වාධීනත්වය ලැබ සිටින රටවල ජනතාව පාලනය කිරීම සඳහා අධිරාජ්‍යවාදිහු එම රටවල් ආක්‍රමණකාරී ගිවිසුම්වලට ඇද ගනිමින්, ඌන වර්ධිත රටවලට ඊනියා ආර්ථික "ආධාර" දීම සහ වෙනත් නොයෙක් මාධ්‍යයන් පාවිච්චි කරති.

සෝවියට් සංගමය හෝ වෙනත් සමාජවාදී රටවල් හෝ කිසියම් රටකට තර්ජනය නොකරන බව හොඳ හැටි දැන දැනත්, එම රටවලින් එල්ල වන "කොමියුනිස්ට්වාදී තර්ජනය"ට විරුද්ධව සටන් කිරීමේ ව්‍යාජ ධජය යටතේ අධිරාජ්‍යවාදී රටවල් සිය ප්‍රතිගාමී දේශීය සහ විදේශීය ප්‍රතිපත්ති ගෙන යති. ඇත්ත වශයෙන්, සාමය සඳහාත්,

ධනපති රටවල් සමග සාමකාමී සහපැවැත්ම සඳහාත් සමාජවාදී රටවල් දිගට සටන් කරන බව රහසක් නොවේ. ලෝක සාමය තහවුරු කිරීම සඳහාත් ලෙනින්වාදී සාමකාමී සහජීවන මූලධර්මය ජාත්‍යන්තර සම්බන්ධකම්වලදී සාමාන්‍ය ප්‍රතිපත්තිය බවට පත් කරවීම සඳහාත්, සෝවියට් සංගමය සහ සමාජවාදී රාෂ්ට්‍ර පද්ධතිය නොසැලී, ස්ථිර ලෙස ක්‍රියා කරති. අවි තරඟය නැවැත්වීම, සර්ව සම්පූර්ණ නිරායුධ කිරීම සඳහාත්, දේශපාලනමය සංහිඳියාව යුද්ධමය සංහිඳියාවක් දක්වා පතුරවාලීම සඳහාත්, සංහිඳියාත්මක කලාපය ලෝකයේ සියලු ප්‍රදේශ දක්වා පුළුල් කිරීම සඳහාත්, සෝවියට් සංගමය සහ අනිකුත් සමාජවාදී රටවල් තීරණාත්මක ලෙසත්, නිරතුරුවමත් සටන් කරති.

තම රටේ කවර අන්දමේ ධනපති ආණ්ඩුවක් තිබේද යන්න ගැන සැලකිලිමත් නොවී සිටීමට කම්කරු පංතියට නොහැකිය. ප්‍රතිගාමීත්වයට විරුද්ධවද, සූරාකෑමට හා වහල් භාවයට විරුද්ධවද, කම්කරු පංතියේ අයිතිවාසිකම් සඳහාත්, සාමය ප්‍රජාතන්ත්‍රවාදය සහ සමාජවාදය සඳහාත්, සියලු ප්‍රගතිශීලී බලවේගවල නායකයා ලෙස කම්කරු පංතිය ගෙන යන නොවැළැක්විය හැකි සහ වැදගත් ඓතිහාසික සටන, විවෘත ධනපති ඒකාධිපතිත්වයට වඩා, ධනපති ප්‍රජාතන්ත්‍රවාදය කෙතරම් සීමා සහිත වුවද සැහෙන තත්වයන් ඇති කරවයි.

3. නිර්ධන පංතික ආඥාදායකත්වය

ධනපති ක්‍රමය විනාශ කර දමා, පංති රහිත කොමියුනිස්ට්වාදී සමාජයක් ගොඩනැගීම නිර්ධන පංතියේ ශ්‍රේෂ්ඨ ඓතිහාසික කාර්ය භාරය වන්නේය. එසේ වුවද, එම සමාජය ධනපති ක්‍රමයේ සිට ඉන් එක එල්ලේ හෝ එකවර හෝ පැන නගින්නේ නැත. ධනපති ක්‍රමය සහ කොමියුනිස්ට්වාදී සමාජයේ පළමුවැනි අවධිය වන සමාජවාදය අතර "පළමු වැන්නේ සිට දෙවැන්න දක්වා විප්ලවීය ලෙස පරිවර්තනය වීමේ අවධියක් තිබේ. එයට සරිලන දේශපාලනමය පරිවර්තන අවධියක් ඇති අතර, ඒ අවධියේදී රජය අන් කිසිවක් නොව, නිර්ධන පංතියේ විප්ලවවාදී ආඥාදායකත්වය" යැයි* මාක්ස් පෙන්වා දුන්නේය.

* කාල් මාක්ස් සහ ෆ්‍රෙඩ්රික් එංගල්ස්. කෘති එකතුව, වෙළුම 19, පිටුව 27.

https://liberationbase.wordpress.com

සමාජවාදී විප්ලවය සාර්ථක වීමේ හා ධනපති රජ්‍ය යන්ත්‍රය කඩා බිඳ දැමීමේ ප්‍රතිඵලයක් වශයෙන් නිර්ධන පංතියක ආඥාදායකත්වය පැන නගී. එය ගුණාත්මක වශයෙන් අලුත් වර්ගයක රජයක් නියෝජනය කරන අතර, සිය පංති ස්වභාවය අනුවත්, රාජ්‍ය සංවිධාන ආකාරය අනුවත්, සපුරාලීමට ඇති කාර්ය භාරය අනුවත් එය ඉහත පැවැති සියලු රජයන්ට වඩා හාත්පසින්ම වෙනස්වන්නේය.

> නිර්ධන පංතියක ආඥාදායකත්වය ගුණාත්මක වශයෙන් අලුත් වර්ගයක රජයකි

මීට පෙර පැවැති සියලු රාජ්‍ය වර්ග වැඩකරන ජනතාව යටපත් කිරීම සඳහා සූරාකන්නන්ගේ අවියක් වූ අතර ඒවා සැලසුම් කර තිබුණේ සූරාකන සමාජ ක්‍රම ශක්තිමත් කිරීම සඳහාත්, පීඩකයින් සහ පීඩිතයින් වශයෙන් සමාජය බිඳීම සදාකාලික කිරීම සඳහාත්ය. අනිකුත් සියලු වැඩ කරන ජනතාව සමග එක්වී ධනපති ක්‍රමය විනාශ කර දමා අලුත් සමාජයක්, සතුරු පංති සහ සූරාකන්නන් රහිත සමාජයක් ගොඩ නගන නිර්ධන පංතික ආඥාදායකත්වය වූකලී කම්කරු පංතියේ රජය වන්නේය:

''නිර්ධන පංතික ආඥාදායකත්වය'' යනුවෙන් ලතින් භාෂාවෙන් කියවෙන, විද්‍යාත්මක, ඓතිහාසික දර්ශනික පාඨය සරල බසට පෙරළමු නම්, එය මෙසේ විය යුතු යැයි ලෙනින් ලියුවේය.

''ප්‍රාග්ධනයේ පාලනය පෙරළා දැමීම සඳහා ගෙන යන සටනේදීත් එම පෙරළා දැමීමේ ක්‍රියා දමයේදීත්, ජයග්‍රහණය රැක ගැනීමේ සහ තහවුරු කිරීමේ සටනේදීත්, අලුත් සමාජවාදී සමාජය නිර්මාණ කිරීමේ කටයුත්තේදීත් පංති අහෝසි කර දැමීම සඳහා ගෙන යන මුළු මහත් අරගලයේදීත්, වැඩ කරන හා සූරාකනු ලබන මුළු ජනතාවටම නායකත්වය දීමෙහි සමත්වන්නේ එක් නියමිත පංතියක්, එනම් නගරවල සහ පොදු වශයෙන් පැක්ටරි හා කාර්මික කම්කරුවන් පමණකි.''*

නිර්ධන පංති ආඥාදායකත්වය පිළිබඳ උගැන්වීම මාක්ස්වාදයේ ප්‍රධාන තැන ගනී. නිර්ධන පංතියේ තනි බලය වන ආඥාදායකත්වයට පමණක් ධනපති ක්‍රමය අහෝසි කර දමා සමාජවාදය ගොඩනැගිය හැකිය. ප්‍රතිසංස්කරණවාදයට සහ සංශෝධනවාදයට විරුද්ධව මාක්ස්-ලෙනින්වාදය ගෙන යන දෘෂ්ටිමය අරගලයේදී ස්වාභාවික ලෙසම එහි ප්‍රධාන ස්ථානය නිර්ධන පංති ආඥාදායකත්වය පිළිබඳ ප්‍රශ්නයට හිමිවූයේ එබැවිනි. මාක්ස්වාදය පිළිබඳ සැබෑ අවබෝධය හා පිළිගැනීම

* වි. අයි. ලෙනින්. සම්පූර්ණ කෘතීන්, වෙළුම 39, පිටුව 14.

පිරික්සා බලන උරගල නිර්ධන පංතික ආඥාදායකත්වය බව ලෙනින් අවධාරණය කළේය. මාක්ස්වාදියකු වීමට පංති සටන පිළිගැනීම පමණක් ප්‍රමාණවත් නොවන බව හේ පැවසීය. පංති සටන පිළිගැනීම නිර්ධන පංතික ආඥාදායකත්වය පිළිගැනීම දක්වා පුළුල් කිරීමෙන් මාක්ස්වාදියකු විය හැකිය.

නිර්ධන පංතික ආඥාදායකත්වයේ අවශ්‍යතාවය ප්‍රතික්ෂේප කළ දෙවැනි ජාත්‍යන්තරයේ නායකයින්ට සහ සංශෝධනවාදීන්ට විරුද්ධව වි. අයි. ලෙනින් සමාදනයෙන් තොර ලෙස සටන් කළේය. සමාජවාදය ගොඩනැගිය හැකි එකම මාධ්‍යය නිර්ධන පංතික ආඥාදායකත්වය බව ඔහු දැඩි ලෙස ඔප්පු කළේය. ලෙනින් කෙතරම් නිවැරදිද යන්න ඉතිහාසය පෙන්වා දුන්නේය. සෝවියට් සංගමය තුළ සමාජවාදය පූර්ණ ජයග්‍රහණයක් ලබාගත්තේත්, වෙනත් රටවල් සාර්ථක ලෙස සමාජවාදී මාවතේ ඉදිරියට යමින් සිටින්නේත් නිර්ධන පංතික ආඥාදායකත්වය නිසාය.

කෙසේ වුවද, සමකාලීන සංශෝධනවාදීහු සිය ඓතිහාසික පූර්වගාමීන්ට වඩා සියුම් ක්‍රම පාවිච්චි කරමින් වුවද, නිර්ධන පංතික ආඥාදායකත්වයේ අවශ්‍යතාවය දිගින් දිගටම ප්‍රතික්ෂේප කරති. සමාජවාදී රාෂ්ට්‍ර පද්ධතියට අයත් රටවල නිර්ධන පංතික ආඥාදායකත්වය තිබීම අමතක කිරීමට නොහැකි නිසා, ඔවුහු එය ධනවාදයේ සිට සමාජවාදය දක්වා පරිවර්තන වීමේ සර්වව්‍යාපි රීතියක් හැටියට නොව ප්‍රාග් විප්ලවීය රුසියාව හා සමාන වන ආර්ථික වශයෙන් නොදියුණු රටවලට පමණක් ප්‍රධාන වශයෙන් බලපාන, එක් ජාතික ස්වරූපයක් ලෙස ගණන් ගනිති. ඉතාලි ජාතික සංශෝධනවාදී ජොලිට්ටි, නිර්ධන පංතික ආඥාදායකත්වය සාර්ථක කළ හැක්කේ ආර්ථික වශයෙන් නොදියුණු රටවල බවත්, මේ රටවල නිෂ්පාදන බලවේගයන් පහත් තත්වයක තිබීම සහ දේශපාලන ප්‍රජාතන්ත්‍රවාදී චිරිත් කොහෙත්ම නොතිබුණු බවත් පවසයි. සංශෝධනවාදීන් කියන පරිදි උසස් ලෙස වර්ධනය වූ රටවල ''පිරිසුදු ප්‍රජාතන්ත්‍රවාදයක්'' මගින් සමාජවාදය කරා පරිවර්තනය වනු ඇත. මෙයින් ඔවුන් අදහස් කරන්නේ ධනපති ප්‍රජාතන්ත්‍රවාදය ය.

නිර්ධන පංතික ආඥාදායකත්වයකින් තොරව, සමාජවාදය ගොඩනැගිය නොහැකි බව, ඓතිහාසික අත්දැකීම් විසින් ස්ථිර ලෙසම ඔප්පු කර තිබෙන අතර සංශෝධනවාදීන්ගේ හා ප්‍රතිසංස්කරණ වාදීන්ගේ මත වැරදි බවත් ඓතිහාසික අත්දැකීම්වලට පටහැනි බවත් පෙනී යයි. නිර්ධන පංතික ආඥාදායකත්වයේ කාර්ය භාරයෙහි ප්‍රධාන අංශ මොනවාද යන්න නිගමනය කරන ප්‍රශ්න ගණනාවක්, සමාජවාදය

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ගොඩ නගන අතරතුර එය විසින් විසඳාලනු ලැබේ. දැන් අපි එම කාර්ය භාරයන් මොනවාදැයි සලකා බලමු.

නිර්ධන පංතික ආඥාදායකත්වයේ කාර්ය භාරයන්

නිර්ධන පංතික ආඥාදායකත්වය වූකලී ධනවාදයේ සිට සමාජවාදය කරා පරිවර්තනය වන අවධියේ රජයකි. එම පරිවර්තනයේ ස්වරූපය වන්නේ ආර්ථිකයේ බහු සැකැස්ම හා ධනපති පංතියට විරුද්ධව නිර්ධන පංතිය ගෙනයන තියුණු අරගලය ය. කම්කරු පංතිය ඉදිරියේ මේ අවස්ථාවේදී වැදගත් කාර්ය භාරයක් වන ධනපති ප්‍රහාරය විනාශ කර දැමීම සහ වැඩ කරන සියලු ජන කොටස් සමග සමාජවාදය ගොඩ ගැනීම ඉදිරිපත් වේ. මෙයට සරිලන පරිදි නිර්ධන පංතික රජයේ කාර්ය භාරයන් ඇති වේ.

පරිවර්තන යුගයේදී රට තුළ නිර්ධන පංති රජයේ ප්‍රධාන ක්‍රියාවක් වනුයේ ධනපති පංතිය පුමුඛ සූරාකන පංතීන්ගේ ක්‍රියාවන් පාගා දැමීමය. දේශපාලන ආධිපත්‍යය නැතිවූ විට, ඕනෑම රටක ධනපති පංතිය එම පරාජය පිළිගැනීමට සූදනම් නොවන අතර, නැතිවුණු බලය හා වරප්‍රසාද ලබාගැනීම සඳහා ජයගත් නිර්ධන පංතියට විරුද්ධව තියුණු සටනක් කරනු ඇත.

ධනපති පංතියේ ප්‍රතිරෝධක ශක්තිය නැති කර දැමීමටද, තියුණු පංති සටන්වලදී එය පරාජය කිරීමටද නිර්ධන පංතික ආඥාදායකත්වය අවශ්‍ය වේ. ''නිර්ධන පංතික ආඥාදායකත්වය වූකලී නව පංතිය විසින්, වඩා බලගතු සතුරා වන එමෙන්ම පරාජය වීම නිසා ප්‍රතිරෝධක ශක්තිය දස ගුණයකින් වැඩිවී තිබෙන ධනපති පංතියට විරුද්ධව ගෙනයන ඉතාමත් අධිෂ්ඨාන සහගත හා අනුකම්පා විරහිත යුද්ධය වන්නේයැයි''* වි. අයි. ලෙනින් ලියුවේය.

සූරාකන්නන් පාගා දැමීම ඕනෑම ආකාරයක නිර්ධන පංති රජයකට අනිවාර්ය කාර්යයක් වුවද, ඒ ඒ රටවල ඓතිහාසික තත්වය අනුව එය විවිධ ලෙස ඉටු කළ හැකිය. නිර්ධන පංතික ජනතා රජයට විරුද්ධව රුසියන් ධනපති පංතිය අවිගත් නිසා නිදසුනක් වශයෙන් සෝවියට් සංගමයේ ධනපති පංතියේ දේශපාලන අයිතියද (ඡන්ද බලය අහිමිකිරීම) ආර්ථික අයිතියද (ධනපතීන් සතු දේපල රජය සතු කිරීම, අය බදු වැඩි කිරීම ආදිය) පැහැර ගත්තා පමණක් නොව අවි බලය යොදවා ඔවුන් පාගා දමන ලදී.

ධනපති පංතිය මර්ධනය කිරීම නිර්ධන පංතියේ අවසාන පරමාර්ථයක් නොවන්නේය. එහි ප්‍රධාන අරමුණ සමාජවාදය ඉදිකිරීමය,

* වි. අයි. ලෙනින්. සම්පූර්ණ කෘතීන්, වෙළුම 41, පිටුව 6.

අලුත් සමාජවාදී ආර්ථිකය නිර්මාණය කිරීමය. සාද නිම කරන ලද සමාජවාදී ආර්ථික රටාවන් නැති කලෙක එම කාර්යය සපුරාලීම බෙහෙවින්ම අසීරුය. රටේ ආර්ථික ජීවිතය සංවිධාන කිරීමද, ධනපති ක්‍රමයට වඩා උසස් අලුත් ආර්ථික ක්‍රමයක් වන සමාජවාදී ආර්ථික ක්‍රමය ගොඩ නැගීම සඳහා ක්‍රියා කිරීමද නිර්ධන පංතික ආඥාදායකත්වයේත්, නිර්ධන රජයේත් යුතුකමය. ''නිර්ධන පංති ආඥාදායකත්වය යනු හුදෙක් සූරාකන්නන්ට විරුද්ධව බලය පාවිච්චි කිරීම පමණක් හෝ, ප්‍රධාන වශයෙන් බලය පාවිච්චි කිරීම හෝ නොවේ... ධනපති ක්‍රමය සමග සන්සන්ධනය කරන විට වඩාත් උසස් වර්ගයේ සමාජ ශ්‍රම සංවිධානයක් නිර්ධන පංතිය විසින් නියෝජනය කරනු සහ බිහි කරනු ලැබේ. හරය මෙයයි. කොමියුනිස්ට්වාදයේ සම්පූර්ණ ජයග්‍රහණය සඳහා ශක්තිය හා එහි අනිවාරණීය පූර්ණ ජයග්‍රහණය පිළිබඳ සහතිකයක් ලැබෙන්නේ එයිනි*යි'' වි. අයි. ලෙනින් ලියුවේය.

සමාජවාදී ආර්ථිකයක් ගොඩනැගීම සහ රටේ මුළු මහත් ආර්ථික ජීවිතයටම නායකත්වය දීම රජයේ ක්‍රියාකාරිත්වය වන අතර එය නිර්ධන පංතික ආඥාදායකත්වය සහිත රජයේ වැදගත් ආර්ථික සංවිධානාත්මක කාර්යය වන්නේය. එය සපුරාලීමේදී නිර්ධන පංතික රජයේ කාර්ය භාරය වනුයේ ධනපති ක්‍රමය පරදවා සමාජවාදී ආර්ථික ක්‍රමයේ ජය සහතික කිරීමය, ධනපති ක්‍රමයට වඩා වැඩි සමාජීය ශ්‍රම සංවිධානයක් ඇති කිරීමය. ප්‍රධාන නිෂ්පාදන මාධ්‍යයන් ජනසතු කිරීමෙන් ඉක්බිතිව, නිර්ධන පංතික රජය වහාම ආර්ථිකයේ ප්‍රධාන මර්මස්ථාන සිය අතට ගෙන, ආර්ථිකය සැලැස්මානුකූල ලෙසත්, විද්‍යාත්මක ලෙසත් සංවිධානය කරයි. මාක්ස්වාදී පක්ෂයේ නායකත්වය යටතේ සමාජවාදී කර්මාන්තය සහ සමූහ ගොවිපළවල් ඉදි කරයි. නිෂ්පාදනයේ නිත්‍යමය වර්ධනයක් සහ අංග සම්පූර්ණ වීමක් පදනම් කරගෙන ජනතාවගේ ද්‍රව්‍යමය සමෘධියක් ඇති කරයි. සමාජවාදය සාර්ථක වීමත් සමග ආර්ථික–සංවිධානාත්මක ශ්‍රිතය වඩාත් විශාල පරිමාණයක් ගනී. සමාජවාදය ජයගැනීමෙන් ඉක්බිතිව, එය මුළු මහත් ජනතා ආර්ථිකයට පැතිර යයි.

එහෙත් සමාජවාදය ඉදිකිරීම, සමාජවාදී ආර්ථිකය ගොඩ නැගීමට පමණක් සීමා නොවේ. පොදුජනතාවගේ විඥානය හා සංස්කෘතිය ක්‍රමානුකූල ලෙස උසස් නොකර, ඔවුන්ගේ විඥානයෙහි ඉතිරිව ඇති ධනවාදී නටබුන් විනාශ නොකරන්නේ නම්, එය තේරුම් රහිත වන්නේය. එබැවින් වැඩ කරන ජනතාවගේද විශේෂයෙන් අර්ධ

* වි. අයි. ලෙනින්. සම්පූර්ණ කෘතීන්, වෙළුම 39, පිටුව 13.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

නිර්ධන පංතික කොටස්වලද, ගොවීන්ගේද අධ්‍යාපනය සමාජවාදී අධ්‍යාත්මිකත්වයකින් යුතුව ගෙන යාමද ඔවුන්ගේ පොදු අධ්‍යාපනික මට්ටම, වෘත්තීය හා සංස්කෘතික මට්ටම උසස්කිරීමද නිර්ධන පංතික රජයේ ඉතාම වැදගත් කාර්ය භාරයක් වන්නේය. සූරාකන්නෝ සියවස් ගණනක් තිස්සේ වැඩ කරන ජනතාව වහල්භාවයේ තබාගෙන, සංස්කෘතික වර්ධනයක් හා අධ්‍යාපනයක් ලබා ගැනීමට ඔවුන්ගේ ඇති ආශාවන් හැම අතින්ම පාගා දැමූ නිසා එම කාර්යය සපුරාලීම අත්‍යාවශ්‍ය වන්නේය. සමාජවාදී විප්ලවයේ ඉතා වැදගත් පුරුකක් වන සංස්කෘතික විප්ලවය නිර්ධන පංතික රජයේ නායකත්වයෙන් මෙහෙය වනු ඇත. සංස්කෘතික ඉදිකිරීම් සංවිධානය කිරීමේ රාජ්‍යමය ක්‍රියාකාරිත්වය මගින් වැඩ කරන ජනතාවට අධ්‍යාපනයක් ලබා දෙන අතර, එහි සංස්කෘතික-අධ්‍යාපන ශ්‍රිතය ඉන් ප්‍රකාශවේ.

නිර්ධන පංතික රජයේ විදේශීය ප්‍රතිපත්තිය ජනතාව අතර සාමය ඇති කිරීම සඳහාත්, විදේශීය අධිරාජ්‍යවාදී ආක්‍රමණයෙන් රට ආරක්ෂා කිරීම සඳහාත් යොමු වී ඇත. ලෝක සාමය සඳහා දැඩි ලෙස අරගල කිරීමත්, රටේ ආරක්ෂක ශක්තිය නිතර තර කිරීමත්, යුධ හමුදා ශක්තිය තහවුරු කිරීමත් නිර්ධන පංතික රජයේ කාර්යයන් වන්නේය.

ධනපති ලෝකයේ ඇතැයි කියන 'සර්වජන ප්‍රජාතන්ත්‍රවාදය' 'හැම දෙනාටම ප්‍රජාතන්ත්‍රවාදය' ගැන ධනවාදී දෘෂ්ටිවාදියෝ සහ ඔවුන්ගේ ප්‍රතිසංස්කරණවාදී වන්දි භට්ටයෝ මහා ඝෝෂාවක් කරති. නිලධාරිවාදී වන, ප්‍රජාතන්ත්‍රවාදී නොවන පාලනයක් යැයි කියන නිර්ධන පංති ආඥාදායකත්වය හා සසඳමින් ඔවුහු එම ''පිරිසිදු'' ප්‍රජාතන්ත්‍රවාදය අගය කරති.

> නිර්ධන පංති ආඥාදායකත්වය ප්‍රජාතන්ත්‍රවාදයේ උසස්තම වර්ගයයි

එහෙත් යථාර්ථය මෙහි අනික් පැත්තය. මෙතරම් අගය කරන ධනපති ප්‍රජාතන්ත්‍රවාදය අනිකක් නොව අප පැහැදිලිව දුටු පරිදි සල්ලි මල්ලේ සර්ව බලධාරීත්වය සහ වැඩ කරන ජනතාවට අයිතිවාසිකම් නොමැති-කම වසංකරන කඩතුරාවකි. ධනපති ක්‍රමයත්, ධනවතුන් අතළොස්සක් විසින් කෝටි ගණන් වැඩකරන ජනතාව සූරාකෑමට භාජනය කිරීමත්, සදාකාලිකව පවත්වා ගැනීම ධනපති ප්‍රජාතන්ත්‍රවාදයේ අරමුණ වන්නේය.

සැබැවින්ම ප්‍රජාතන්ත්‍රවාදය වන්නේ නිර්ධන පංති රජය පමණකි. නිර්ධන පංති ආඥාදායකත්වය ගුණාත්මක වශයෙන් අලුත්, උසස්ම වර්ගයේ ප්‍රජාතන්ත්‍රවාදයයි. ලෙනින් ලිවූ පරිදි මෙය ජනතාවගේ අති බහුතර සංඛ්‍යාවට ප්‍රජාතන්ත්‍රවාදයත්, සූරාකන්නන්ට සහ පීඩකයින්ට

මෙම ප්‍රජාතන්ත්‍රවාදය අහිමි කිරීමත් වේ. නිර්ධන පංතික ආඥාදාය-කත්වය එහි සංවර්ධන ක්‍රියාවලියේදී එය වැඩි වැඩියෙන්ම සමස්ත ජනතාවගේ සමාජවාදී ප්‍රජාතන්ත්‍රවාදයක් බවට හැරෙන්නේය.

නිර්ධන පංතික ආඥාදායකත්වයේ ස්වාභාවයක් එහි අරමුණ හා කාර්ය භාරයනුත් නිසාම, එය යටතේ ගුණාත්මක වශයෙන් අලුත් ප්‍රජාතන්ත්‍රවාදයක් පැන නගින්නේය. සූරාකන පංතීන්ගේ ප්‍රතිරෝධය බිඳ හෙළීම, බලය අල්ලාගෙන සිටීම, සමාජවාදය ඉදිකිරීම හා එමගින් ජනතාවට වසනාවන් ජීවිතයක් උදා කිරීම යන මේවා සියල්ලක්ම නිර්ධන පංතියට කළ හැක්කේ සියලු වැඩකරන ජනතාව සහ ප්‍රජාතන්ත්‍රවාදී බලවේගයන් සමග ඇතිකරගත් ශක්තිමත් සමගියක් මගින් සහ පුළුල් බහු ජනතාවගේ ආධාර ලබා ගතහොත් පමණකි. කම්කරු පංතියත් නගරබද හා ගම්බද නිර්ධන පංතික නොවන ජනතාවත්, ප්‍රධාන වශයෙන්ම ගොවි ජනතාවත් අතර සමගිය නිර්ධන පංතික ආඥා-දායකත්වයේ පදනම, එහි උසස්තම මූලධර්මය වන්නේ එහෙයිනි. එයින් නිර්ධන පංති රජයේ සැබෑ ප්‍රජාතන්ත්‍රවාදය (උපරිම ලෙසත් අංග සම්පූර්ණ ලෙසත්) ප්‍රකාශිත වන්නේය.

කම්කරු පංතියේ සහ නගරබද හා ගම්බද වැඩ කරන ජනතාවගේ එක්සත්කම පදනම් වී ඇත්තේ එම පංතීන්ගේ මූලික දේශපාලන හා ආර්ථික වුවමනාවන්ගේ ඒකාකාර භාවයද, සූරාකෑම නැතිකොට සමාජවාදය ගොඩ නැගීමේ පොදු ආශාවද මතය. කම්කරුවන් ධනපති ක්‍රමයේ වැටුප්-වහල් භාවයෙන්ද, ගොවීන් හා නිර්ධන නොවන සෙසු වැඩකරන ජනතාව ව්‍යසනයෙන් හා දුගී බවෙන්ද මුදවාගත හැක්කේ සමාජවාදයට පමණකි. සූරාකන්නන්ට විරුද්ධව හා අලුත් සමාජවාදී සමාජය සඳහා කරන ඒකාබද්ධ සටනේදී කම්කරු පංතිය සහ වැඩ කරන ජනතාවද, ප්‍රජාතන්ත්‍රවාදී බලවේගද අතර එක්සත්කම බිහිවී, වර්ධනය වෙයි. එය නිර්ධන පංති ආඥාදායකත්වයේ නොනැසිය හැකි බල මහිමයේ පදනම වන්නේය.

එසේ වුවද, නිර්ධන පංතියට අර්ධ නිර්ධන පංතිය සමග හැම ආකාරයකම මිත්‍ර සංගම් නොව, කම්කරු පංතියේ නායකත්වය යටතේ පවතින මිත්‍ර සංගමයක් අවශ්‍ය වන බව වී. අයි. ලෙනින් පෙන්වා දුන්නේය. ගොවි ජනතාව සහ නගරබද සුළු ධනපති පංතිය වැනෙන සුලුය. ස්වාභාවය අනුව පරස්පර විරෝධී වන මේ කොටස්, ශ්‍රම වැය කරන අතරම කුඩා දේපල හා ව්‍යාපාර හිමියන් වන බැවින්, ඔවුහු නිර්ධන පංතිය හා ධනපති පංතිය අතර වැනෙත්. ඉතාමත් දියුණු, ස්ථිර ලෙසම විප්ලවවාදී හා සංවිධානය වූ එමෙන්ම මාක්ස්වාදී පක්ෂයේ නායකත්වය ලබන නිර්ධන පංතියට පමණකි. ඔවුන්ගේ

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

වැනෙන සුලු භාවය නැති කරදමා, ඔවුන් ධනපති පංතියෙන් ඉවතට ඇදගෙන, සමාජවාදය ඉදිකිරීමේ මග ඔස්සේ ගෙන යාමට සමත් වන්නේ වැඩකරන ජනතාවගේ අයිතිය ප්‍රකාශ කිරීම පමණක් නොව, ඒවා ක්‍රියාවට යෙදවීමේ අවශ්‍යා තත්වයන්ද ඇති කිරීම නිර්ධන පංති ප්‍රජාතන්ත්‍රවාදයේ ඉතා වැදගත් ලක්ෂණය වන්නේය. නිර්ධන පංති ආඥාදායකත්වය යටතේ, වැඩකරන ජනතාවට ලැබෙන්නේ ධනවාදී රජයක් යටතේ මෙන් හුදෙක් නාමික අයිතිවාසිකම් නොවේ; සැබැවින්ම රට පාලනය කිරීම, කෙළින්ම හෝ නැතිනම් සිය නියෝජිතයින් මගින් රටේ සමස්ත ආර්ථිකය, දේශපාලනය සහ සංස්කෘතික ජීවිතය පාලනය කිරීම කෙරෙන්නේ ඔවුන් විසිනි.

ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් භුක්ති විඳීම සහතික වනු සඳහා නිර්ධන පංති රජය එය සරිලන ද්‍රව්‍යමය පදනමක් ඇති කර දෙයි. වැඩ කරන ජනතාවට සියලු නිෂ්පාදන මාධ්‍යයන් අයත් බැවින්, රටේ ආර්ථික ජීවිතය මෙහෙයවීමටද තම වැඩ කිරීමේ අයිතිය ක්‍රියාවේ යෙදවීමටද ඔවුන්ට හැකිවේ. පාසැල්, විශ්වවිද්‍යාල, විද්‍යායතන, සංස්කෘතික මාළිගා, සුබාගාර සහ විනෝදාගාර ඔවුනට අයත් බැවින් අධ්‍යාපනයක් ලැබීමේ හා විවේක ගැනීමේ හා විනෝදවීමේ හිමිකම භුක්තිවිඳීමේ අවස්ථා ඔවුන්ට ඇත. කතා කිරීමේ, ලිවීමේ රැස්වීමේ හා සංවිධානවීමේ නිදහස ක්‍රියාවේ යෙදවීමට හැකිවනු පිණිස වැඩකරන ජනතාවගේ ප්‍රයෝජනය සඳහා මුද්‍රණාල, කඩදසිතොග, ගුවන් විදුලි ප්‍රචාරක ස්ථාන, හොඳ ගොඩනැගිලි ආදිය වැඩ කරන ජනතාවට ඇත.

සෝවියට් සභා සහ වෙනත් රාජ්‍යමය සංවිධානවලට පුළුල් ලෙස සහභාගි වීම මගින්ද, ඒවාට අනුබද්ධ අති විශාල සංඛ්‍යාවක් කමිටු හා කොමිසම් සභා මගින්ද, එමෙන්ම ඔවුන් පිහිටුවා ගත් සමාජයීය සංවිධාන මගින්ද වැඩ කරන ජනතාව ක්‍රියාශීලී ලෙස රටේ දේශපාලන ජීවිතයටද රාජ්‍ය පාලන කටයුතුවලටද සහභාගි වෙති. වී. අයි. ලෙනින් කීවාක් මෙන් නිර්ධන පංතික ප්‍රජාතන්ත්‍රවාදය ධනපති ප්‍රජාතන්ත්‍රවාදයට වඩා දසලක්ෂ වාරයක් ප්‍රජාතන්ත්‍රවාදීය.

ධනවාදයේ සිට සමාජවාදය දක්වා පරිවර්තනයවීම ක්‍රියාවට යෙදවිය හැක්කේ නිර්ධන පංති ආඥාදායකත්වය තුළින් පමණකි.

නිර්ධන පංති ආඥාදායකත්වයේ විවිධ ආකාර

එසේවුවද නිර්ධන පංති ආඥාදායකත්වය පරිවර්තනීය අවධියේ අවශ්‍යයෙන්ම තිබිය යුතු හරය වන එය විවිධ රටවල විවිධ ආකාර ස්වරූපයෙන් ඇතිවිය හැක. "හැම ජාතියක්ම සමාජවාදය කරා යනු ඇත. එය වැළැක්විය නොහැකිය. එහෙත් සියළු ජාතීන්ම හරියටම ඒකාකාරව නොයනු ඇත. හැම රටකම

එම ගමනේදී තමන්ගේ යමක් එකතු කරනු ඇත; ප්‍රජාතන්ත්‍රවාදයේ කිසියම් ආකාරයක් නිර්ධන පංති ආඥාදායකත්වයේ කිසියම් වර්ගයක් හෝ සමාජීය ජීවිතයේ විවිධ අංශවල සමාජවාදී "පරිවර්තනයේ සීඝ්‍රාකාර පිළිවෙළක් වැනි යමක් හෝ එකතු කරනු ඇත"යි* වී. අයි. ලෙනින් ලියුවේය.

රටක නිර්ධන පංති ආඥාදායකත්වයේ ආකාර රඳාපවතින්නේ ප්‍රධාන වශයෙන්ම ඓතිහාසික තත්වයන් අනුවය, එනම් ඒරටේ ආර්ථික සංවර්ධන මට්ටම පංති බලතුලනය, පංති සටනේ තියුණු භාවය, ජනතාවගේ ජාතික හා ඓතිහාසික සම්ප්‍රදායයන් හා විදේශීය තත්වයද අනුවය.

1917 දී රුසියාවේ කම්කරු පංතියේ විප්ලවවාදී සටන තුළින් කම්කරුවන්ගේ, ගොවීන්ගේ හා සෙබළුන්ගේ සෝවියට් සභා නැමැති නිර්ධන පංතික ආඥාදායක ආකාරය ජනිත කරන ලදී. යුරෝපයේ සහ ආසියාවේ රටවල් කීපයක්ම වෙනත් ආකාරයක නිර්ධන පංතික ආඥාදායකත්වයක්, එනම් මහජන ප්‍රජාතන්ත්‍රවාදය ඇති විය.

නිර්ධන පංතික ආඥාදායකත්වයේ ආකාරයක් වන මහජන ප්‍රජාතන්ත්‍රවාදය හා සෝවියට් සභා අතර වෙනස කුමක්ද?

පළමුව, මහජන ප්‍රජාතන්ත්‍රවාදය පක්ෂ කිහිපයකින් සමාජවාදය ගොඩ නැගීමට පක්ෂපාතවූ, කොමියුනිස්ට් පක්ෂයේ නායකත්වය පිළිගන්නා වූත් දේශපාලන පක්ෂ කිහිපයකට මහජන ප්‍රජාතන්ත්‍රවාදය ඉඩදෙයි. බල්ගේරියාව, ප්‍රජාතන්ත්‍රවාදී ජර්මන් ජන රජය, පෝලන්තය හා චෙකොස්ලොවැකියාව වැනි රටවල බහු පක්ෂ ක්‍රමයක් ඇත්තේය. සුළු දේශපාලන පක්ෂයක් වන වාමාංශික එස්එර් පක්ෂය බොල්ෂෙවික් පක්ෂයට සහයෝගිතාවය දක්වීම ප්‍රතික්ෂේප කර ප්‍රසිද්ධියේම ප්‍රතිවිප්ලවවාදීන්ගේ කඳවුර ගත් බැවින්, සෝවියට් ආණ්ඩු බලය එවැනි තත්වයන් යටතේ ඒක පාක්ෂික ක්‍රමයක් බවට පත්විය.

දෙවනුව, මහජන ප්‍රජාතන්ත්‍රවාදී රාජයන්හි ජනතා (ජාතික) පෙරමුණක් ඇත. සමාජවාදය ඉදිකිරීම සඳහා ජනතාවගේ නානා විධ කොටස් සමගි කරන පොදුජන සංවිධානයක් එහි ඇත. ජනතා පෙරමුණ යනු කම්කරු පංතිය, ගොවීන්, බුද්ධිමතුන් හා සුළු සහ මධ්‍යම ධනපති කොටස් පවා ඇතුලත් නිශ්චිත සංවිධාන රටාවකි. එසේ වුවද කම්කරු පංතිය හා එහි දේශපාලන පක්ෂය එහි නායකත්ව කාරිය කොටස ඉටු කරයි. සෝවියට් සංගමයේ මෙවැනි පොදුජන සංවිධාන නැතිවාක් මෙන්ම තිබුණේද නැත.

* වී. අයි. ලෙනින්. සම්පූර්ණ කෘතීන්, වෙළුම 30, පිටුව 123.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

තෙවනුව, යුරෝපීය මහජන ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයන්හි වූ පාර්ලිමේන්තු ක්‍රම හා සම්ප්‍රදයයන් ධනපති ක්‍රමයට විරුද්ධව සහ සමාජවාදය සඳහා සටන් කිරීමට උපයෝගී කරගනු ලැබේ. රුසියාවේ සර්ව බලධාරී රාජ්‍ය පාලනය යටතේ පාර්ලිමේන්තුවාදය පුළුල් ලෙස වර්ධනය නොවිණි. කිසිදු පාර්ලිමේන්තු සම්ප්‍රධායක් රුසියාවේ නොමැති විය.

නිර්ධන පංතික ආඥාදායකත්වයේ එක් ආකාරයක් වන මහජන ප්‍රජාතන්ත්‍රවාදය, විසින් අධිරාජ්‍යවාදය දුර්වල වීමේ සහ ලෝක දේශපාලන වේදිකාවේ බලතුලනය සමාජවාදයට පක්ෂව වෙනස්වීමේ තත්වයන් යටතේ, සමාජවාදී විප්ලවය වර්ධනවීමේ එක් ආකාරයක් පිළිබිඹු කෙරෙයි. එපමණක් නොව සමාජවාදී සංවර්ධන මාවතට පාතැබූ රටවල ඓතිහාසික හා ජාතික විශේෂත්වයන්ද අනුව එය සකස් වේ.

ඉතිහාසය විසින් මෙතෙක් අපට සෝවියට් සභා සහ මහජන ප්‍රජාතන්ත්‍රවාදය යන නිර්ධන පංති ආඥාදායකත්වයේ ආකාර දෙකක් ඉදිරිපත් කර ඇත. නිර්ධන පංති ආඥාදායකත්වයේ වෙනත් ආකාරයන්ද ඇතිවිය හැකිය. එය කිනම් ආකාරයක් ගත්තද, කම්කරු පංතියේ එහි දේශපාලන පක්ෂයේ නායකත්වය එහි තිබීම අනිවාර්ය ය. ''ධනවාදයේ සිට කොමියුනිස්ට් ක්‍රමය කරා පරිවර්තනය වීමේදී විවිධ දේශපාලන ආකෘතීන් රැසක් ඇතිවනු අනිවාර්යය. එහෙත් ඒ සැම ආකෘතියකම හරය අනිවාරණීය ලෙසම එකක් විය යුතුය — එනම් නිර්ධන පංති ආඥාදායකත්වයයැ''යි* වී. අයි. ලෙනින් පෙන්වා දුන්නේය.

නිර්ධන පංතික ආඥාදායකත්වයකදී මාක්ස්වාදී පක්ෂයේ නායකත්ව කාර්ය කොටස

කම්කරු පංතියේ දියුණු, දේශපාලනමය වශයෙන් විඥාත සහ සංවිධානාත්මක බලඇණිය වන මාක්ස්වාදී පක්ෂය, ධනපති පංතියේ දේශපාලන බලය පෙරළාදමා, නිර්ධන පංති ආඥාදායකත්වය පිහිටුවන පූරෝගාමී බලවේගය වන්නේය. බලය අල්ලා ගැනීම අසීරු කාර්‍යයකි. පාලන බලයෙහි රැඳී සිටීමත්, බලයෙන් නෙරපා දමනු ලැබූ ධනපති පංතිය මැඩ අවසාන වශයෙන් ජය ලබාගැනීමත්, ඊටත් වඩා දුෂ්කරය; කෝටි සංඛ්‍යාත ගොවීන් හා අනිකුත් කුඩා දේපල හිමියන්ගේ පෞද්ගලික අයිතිය හා සම්බන්ධවූ සහජ පුරුදු නැති කර ලීමත් ඔවුන් ධනපති පංතියෙන් වෙන්කර

* වී. අයි. ලෙනින්. සම්පූර්ණ කෘතීන්, වෙළුම 33, පිටුව 35.

ගැනීමත්, ඔවුන් දේශපාලන විඥානයෙන් යුතු සමාජවාදය ඉදි කරන්නන් බවට පත්කරලීමත් සිතාගත නොහැකි තරම් දුෂ්කරය, (වී. අයි. ලෙනින් කී පරිදි දහස් වරකටත් වඩා දුෂ්කරය) මෙම ඉතාමත් දුෂ්කර කර්තව්‍යයන් ඉටු කිරීමෙහි හා සමාජවාදය සහ ඊළඟට කොමියුනිස්ට් ක්‍රමය ගොඩ නැගීමෙහි කම්කරු පංතිය සමත් වන්නේ, එය දැඩිතම සංවිධානයක් හා විනයක් පවත්වා ගතහොත් පමණකි. කම්කරු පංතිය සංවිධානය කිරීම, එහි පිරිස් අතර අයෝමය විනයක් පවත්වා ගැනීම, එයට අධ්‍යාපනයක් ලබාදීම, සුළු ධනපතිවාදී බලපෑමෙන් එය ආරක්ෂා කිරීම, කම්කරු පංතියේ දේශපාලන කටයුතු මෙහෙය වීම හා එමගින් මුළු මහත් වැඩ කරන ජනතාවම කෙරෙහි බලපෑම කළ හැක්කේ මාක්ස්වාදී පක්ෂයට පමණකි. ''සටනෙහිදී පන්නරය ලැබූ අයෝමය පක්ෂයකින් තොරව, නියමිත පංතියේ අවංක සියල්ලන්ගේම විශ්වාසය දිනාගත් පොදු ජනතාවගේ හැඟීම් ගැන විමසිල්ලෙන් සිටිමින් ඔවුන් කෙරෙහි බලපෑමෙහි සමත් පක්ෂයකින් තොරව...''* සමාජවාදය සාර්ථක ලෙස ගොඩ නැගීම ගැන සිතීම පවා අපහසුයැයි ලෙනින් පැවසුවේ එබැවිනි.

සමාජවාදී විප්ලවයේ ජයග්‍රහණයෙන් පසු මාක්ස්-ලෙනින්වාදී පක්ෂය පාලනය කරන පංතියේ දේශපාලන පක්ෂය බවට පත්වේ. මේ නිසා එයමත විශේෂ වගකීමක් පැවරේ; කම්කරු පංතියේ නායකයා හැටියට එහි කාර්ය භාරය අපරිමිත පමණින් උසස්වේ. සමාජ සංවර්ධනයේ වාස්තවික නියාමයන් පිළිබඳ ක්‍රම දැනීම උපයෝගි කරගනිමින්, ජනතාවගේ විප්ලවවාදී අත් දැකීම් සම්පිණ්ඩනය කරමින් සහ ඒවා ප්‍රයෝජනයට ගනිමින්, පක්ෂය නිර්ධන පංතික රජයේ ආර්ථික, දේශපාලනමය සහ සංස්කෘතික කටයුතු සියල්ලටම නායකත්වය දෙයි. රටේ ජන ජීවිතයේ සියලු ක්ෂේත්‍රවලට බලපාන එකම දේශපාලනමය ප්‍රතිපත්තියක් සකස්කරන පක්ෂය, එහි ක්‍රියාවට යෙදවීම සහතික කරනු සඳහා අවශ්‍ය කටයුතු කරයි.

නිර්ධන පංතික ආඥාදායකත්වය යටතේ පක්ෂ සාමාජිකයින්ගේ සමගියේ වැදගත්කමද පෙර කවරදාකටත් වැඩිවේ. සමාජයේ නායකයා හැටියට පක්ෂයට ක්‍රියාකිරීමත්, කම්කරු පංතියේ පාලනය ආරක්ෂාකොට, ශක්තිමත් කිරීමත්, සමාජවාදය හා කොමියුනිස්ට්වාදය ඉදි කිරීමක් කළ හැක්කේ පක්ෂයේ සාමාජිකයින් සියල්ලම අතර අධිෂ්ඨානමය ක්‍රියාකාරිත්ව සමගියක් තිබුණොත් පමණකි. පක්ෂයේ සමගිය බිඳ දැමීමට ඉදිරිපත්වන සියළුම කාණ්ඩවාදීන්ට හා භේද

* වී. අයි. ලෙනින්. සම්පූර්ණ කෘතීන්, වෙළුම 41, පිටුව 27.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

කාරින්ට කිසිදු සමාවක් නොදිය යුතුය. සමාජවාදී සංවර්ධනය කරා පාතැබූ සෝවියට් සංගමයේ කොමියුනිස්ට් පක්ෂයේ සහ අනිකුත් රටවල කොමියුනිස්ට් හා කම්කරු පක්ෂ වල ක්‍රියාකාරිත්වය වෙන්කොට පෙන්වන්නේ මේ කරුණු අනුවය.

රාජ්‍යමය මණ්ඩල සහ සමාජ සංවිධාන අති විශාල සංඛ්‍යාවක් මගින්, වෘත්තීය සමිති, සමුපකාර සමිති, සකල විධ තරුණ සමිති, ක්‍රීඩා සමිති, කලා සංවිධාන හා වෙනත් සංවිධාන මගින්, පක්ෂය එහි නායකත්ව කාර්ය භාරය ක්‍රියාත්මක කරයි. පක්ෂය මේ සියලු සංවිධානවල පරිශ්‍රමය සමගි කොට, ඒවා සියල්ල එක් අරමුණක් කරා මෙහෙයවයි. මෙහිදී රජයේ සහ වෙනත් සංවිධාන වෙනුවට ක්‍රියාකිරීමෙන් වලකින පක්ෂය, ඒවායේ උනන්දුව උපරිම මට්ටමින් වර්ධනය කොට, ඒවායේ වැඩ කටයුතුවලදී උපරිමය ප්‍රජාතන්ත්‍රවාදයක් ක්‍රියාත්මක කිරීමට ප්‍රයත්න දරයි. රාජ්‍ය සහ සමාජ සංවිධාන මගින් කෝටි සංඛ්‍යාත වැඩ කරන ජනතාව සමග සම්බන්ධකම් ඇති කර ගන්නා පක්ෂය, වැඩ කරන ජනතාවට උගන්වන හා දැනුම ලබාදෙන අතරම ඔවුන්ගෙන්ද ඉගන ගනී. ජනතාව සමගත්, ජනතාව පුළුල් ලෙස නියෝජනය කරන මුළු නිර්ධන පංති රජය සමගත් එකතුවී, පක්ෂය නිර්ධන පංති ආඥාදායකත්වය පවතින යුගයේදී සමාජවාදය ගොඩ නැගීම පිළිබඳව ප්‍රධාන ප්‍රශ්න සියල්ල විසඳාලයි.

නිර්ධන පංති රජය ශක්තිමත් කිරීමටත්, ප්‍රජාතන්ත්‍රවාදය දියුණු කිරීමටත්, වැඩි වැඩියෙන් වැඩකරන ජනතාව රට පාලනය කිරීමේ කටයුතුවලට ඇදගැනීමටත් මාක්ස්වාදී පක්ෂය නිරතුරුවම ක්‍රියාකරයි. ධනපති ක්‍රමයට විරුද්ධව කළ අරගලයේදී කලින් පක්ෂය පොදු ජනතාව සමග ඇති කරගත් පුළුල් සම්බන්ධකම්, නිර්ධන පංති ආඥාදායකත්වයේ කාල පරිච්ඡේදයේදී දියුණු වී පක්ෂය හා ජනතාව අතර ස්ථිර සාර සමගියක් දක්වා වැඩෙන්නේය. මාක්ස්වාදී පක්ෂයක ශක්තියක්, එය සතු ශ්‍රේෂ්ඨතම කාර්යය සාර්ථක වන බවට සහතිකයත් එය වන්නේය.

4. සමාජවාදී සමාජයේ රජය

සමාජවාදය ගොඩනැගීමත් සමගම රටේ ආර්ථික ජීවිතයේ විශාල වෙනස්වීම් ඇතිවිය. ආර්ථිකයේ නොදියුණුබව නැති කර දැමූ අතර සූරාකන පංතියද අතුරු දහන් විය. සමාජයේ පොදු අයිතිය මත පදනම් කර ගත් සමාජවාදී ව්‍යුහය ජනතා ආර්ථිකයේ සියලු ක්ෂේත්‍ර මත තහවුරු විය.

ආර්ථික ව්‍යුහයේ වෙනස් වීමත් සමගම සමාජවාදී අධි ව්‍යුහයේද, විශේෂයෙන්ම රජයේ හා එහි ක්‍රියාකාරිත්වයේද වෙනස් වීම් ඇති විය. ඒවා මොනවාදැයි අපි දැන් පිරික්සා බලමු.

සමාජවාදය ගොඩනැගීමත් සමගම නිර්ධන පංතික ආඥාදායකත්වය, කම්කරු පංතියේ නායකත්වය සහ එහි පුරෝගාමී බල ඇණිය වන

පොදු ජන රජය

කොමියුනිස්ට් පක්ෂයේ මග පෙන්වීම සහිත මුළු මහත් ජනතාවගේ දේශපාලනමය සංවිධානයක් ඇති පොදුජන රජයක් දක්වා පරිවර්තන වන්නේය.

සමාජවාදය ජයගැනීමත් සමගම සූරාකන පංතිය අතුරුදහන් වන බැවින්, පෑගීමට කිසිවක් ඉතිරි නොවන නිසා, සූරාකන්නන් පෑගීමේ ක්‍රියාකාරිත්වයක් පොදුජන රජයට අවශ්‍ය නොවේ. එසේ වුවද කම්කරු පංතිය, පංති සටනින් සම්පූර්ණයෙන්ම ඈත්වූ බවක් මින් අදහස් නොකෙරේ. කම්කරු පංතිය සමූහ ගොවීන් සහ වැඩකරන බුද්ධිමතුන් සමග එකතුව ජාත්‍යන්තර අධිරාජ්‍යවාදයටත්, ධනවාදී සහ සුළු ධනවාදී දෘෂ්ටියත් විරුද්ධව සටන් කරයි. එපමණක් නොව, සියලු වැඩ කරන ජනතාවගේ ආධාරයද, විඥනකත්වය හා සංවිධානාත්මකත්වයද ලබාගන්නා කම්කරු පංතිය සමාජවාදී සමාජයේ නීති, රීති, ප්‍රමාණය හා මූලධර්ම කඩ කරන පුද්ගලයින්ට බලකිරීම සඳහා අවශ්‍ය පියවරයන් ගැනීම ප්‍රතික්ෂේප නොකරයි.

නිර්ධන පංති ආඥාදායකත්වය සහ පොදුජන රජය ගුණාත්මක වශයෙන් වෙනත් වර්ග වලට අයත් රජයන් නොවේ. එය එකම වර්ගයකට අයත් සමාජවාදී රජයක වර්ධනයේ විවිධ අවස්ථා — අවධි වන්නේය. පොදුජන රජය නිර්ධන පංතික ආඥාදායකත්වයේ කාර්යය ඉදිරියට ගෙනයයි. කොමියුනිස්ට්වාදය ඉදිකිරීමේ කාර්යයන් තීරණය කිරීමේ සංවිධානාත්මක මුල පිරීම වශයෙන් සේවය කරයි. පොදුජන රජයේ සමාජීය පදනම වූකලී කම්කරු පංතිය සමූහ ගොවීන් හා නිර්ධන පංතිය වන්නේය. සමාජවාදී සමාජයේ ඉතා පුරෝගාමී, සංවිධානාත්මක විඥනාත්මක බලවේගය වන කම්කරු පංතිය එහි නායකත්වය දරයි. නිර්ධන පංතික ආඥාදායකත්වයේ ප්‍රධාන දෙය, එනම් සමාජවාදී ප්‍රජාතන්ත්‍රවාදය වර්ධනය පොදුජන රජය, එය උසස් තත්වයකට නංවාලයි. මීට පෙර කී පරිදි සූරාකන්නන් පෑගීමේ ක්‍රියාව හැරුණු විට, නිර්ධන පංතික ආඥාදායකත්වයේ ප්‍රධාන කාර්යයන් එය ආරක්ෂා කොට වර්ධනය කරයි.

ජනතාවගේ අයිතිය හා නිදහසද, සමාජවාදී නීති ගරුක භාවයද ආරක්ෂා කිරීම සඳහා සමාජවාදී රජය නිරතුරුවම සැලකිලිමත් වේ. සමාජවාදයේ ආර්ථික පදනම් — කොමියුනිස්ට්වාදය සාර්ථක ලෙස

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ඉදිකිරීම සඳහා අනිවාර්ය දෙයක් වන සමාජවාදී දේපල සම්පූර්ණයෙන් වර්ධනය කිරීම සඳහා රජය විශේෂ සැලකිල්ලක් දක්වයි. සමාජවාදී දේපල ආරක්ෂා කිරීමද සහ සමාජවාදී සමාජයේ පුර වැසියන්ගේ නිදහස හා අයිතිය ආරක්ෂා කිරීමද, සමාජවාදී නීතිගරුකභාවය ආරක්ෂා කිරීමද සමාජවාදී රජයක වැදගත් කාර්යයන් වන්නේය. සමාජවාදය බිහිවීමත් සමගම ඇති වූ මේවා, සමාජවාදය ඉදිකිරීමත් සමගම පූර්ණ වර්ධනයකට මුණ පැවේය. සෝවියට් සංගමයේ සමාජවාදය ජයගැනීම නිසා, සමාජවාදී රජයේ ප්‍රධාන කාර්යයන් වන සංවිධාන-ආර්ථික කාර්යයන් හා සංස්කෘතික-අධ්‍යාපන කාර්යයන් අංග සම්පූර්ණ ලෙස දියුණුවීමට හේතු විය.

ආර්ථිකයේ සීඝ්‍ර දියුණුව නිසා සංවිධාන-ආර්ථික කාර්යයන් වඩාත් සංකීර්ණ හා නානාවිධ විය. ධනවාදයේ සිට සමාජවාදය කරා පරිවර්තන වන අවධියේදී රජයේ ආර්ථික-සංවිධානාත්මක කටයුතුවල අරමුණ වූයේ, රට තුළ ධනපති බලවේග පරදවා සමාජවාදී බලවේගයන් ජය ලැබීම සහතික කිරීමය. දැන් සමාජවාදය ගොඩනගා ඇති නිසා එම කටයුතුවල වර්තමාන අරමුණ වන්නේ කොමියුනිස්ට් ක්‍රමය සඳහා අවශ්‍ය ද්‍රව්‍යමය හා තාක්ෂණික පදනම ගොඩනැගීමද, සමාජවාදී නිෂ්පාදන සම්බන්ධකම් කොමියුනිස්ට්වාදී නිෂ්පාදන සම්බන්ධකම් බවට පරිවර්තනය කිරීමද, ජනතාවගේ ජීවන තත්වය තවදුරටත් උසස් කිරීමද යන මේවාය. ශ්‍රම ප්‍රමාණය හා පරිභෝජනයේ ප්‍රමාණය මත තිබෙන රාජ්‍ය පාලනයේ ක්‍රියා කලාප තවත් සියුම් කරනු ඇත.

සමාජවාදය ගොඩනැගීම හේතු කොට ගෙන සෝවියට් රජයේ සංස්කෘතික–අධ්‍යාපනික කාර්යයද විශාල වෙනස් වීමකට භාජනය විය. ජනතාවගේ සමාජ විඥනය හා ඔවුන්ගේ සංස්කෘතික මට්ටම උසස් වූ තරමට, කොමියුනිස්ට් ක්‍රමය කරා පරිවර්තනය වීම වඩාත් සීඝ්‍ර ලෙස කළ හැකි වනු ඇත. අතීතයේ නෂ්ටවශේෂයන්ගෙන් නිදහස්වූ, වැඩ කිරීම ප්‍රජාවෙහි යහපත පිණිස වන බව හඟති, එය යුතුකමක් වශයෙන් නොව, ජීවිතයේ මූලික අවශ්‍යතාවයක් වශයෙන් සලකන, සමාජයේ විඥනයෙන් හෙබි සමාජිකයෙක් හා සැම අතින්ම දියුණු අයෙක් වන නව මිනිසාට අවශ්‍ය අධ්‍යාපනය දීම කොමියුනිස්ට් ක්‍රමය ගොඩනැගීමේදී ඉටුකළ යුතු ප්‍රධාන කර්තව්‍යයන්ගෙන් එකකි.

සමාජවාදයේ සිට කොමියුනිස්ට් ක්‍රමය කරා පරිවර්තනයවීමේ කාල පරිච්ඡේදයේදී, ජාත්‍යන්තර තත්වයේ බැරෑරුම් වෙනස්වීම් සමග වෙළුණු සෝවියට් රජයේ විදේශීය දේශපාලනමය කාර්යය තවදුරටත් වර්ධන වන්නේය. සමාජවාදී රටවල් සමග සහෝදරාත්මක සහයෝගතාවය වර්ධනය කිරීම හා ශක්තිමත් කිරීම, ජගත් සමාජවාදී

රාෂ්ට්‍ර පද්ධතිය බිහිවීම සමග සෝවියට් රජයේ නව කාර්යය එසේ විය. යටත් විජිතවාදී සහ නව යටත් විජිතවාදී පීඩනයෙන් මිදීම සඳහා සටන් කරන ජනතාවට ආධාර කිරීම වැනි නව කාර්යයන්ද ඇතිවිය. ලෝක සාමය තහවුරු කිරීම සඳහා සටන් කිරීමත් සියලු රටවල් සමග සාමාන්‍ය සම්බන්ධකම් පවත්වා ගැනීමත් යන මේ කාර්යය එසේ පැවතුණා සේම එය වර්ධනවිය.

එහෙත් ඒ අතරම සෝවියට් රජය රටේ ආරක්ෂක ශක්තිය තව දුරටත් තර කරයි. ආක්‍රමණකාරී යුද්ධ ඇති කිරීමේ අවදානම් සහිත අධිරාජ්‍යවාදය පවතින තුරු, සමාජවාදී රටකට බාහිර ආක්‍රමණකාරී ආරක්ෂාවීමේ සහතිකයක් නැත්තේය. සමාජවාදී පිතෘභූමිය ආරක්ෂාකිරීම, රටේ ආරක්ෂක ශක්තිය හා සුරක්ෂිතතාවය බලාපොරොත්තු සහගත ලෙස සහතික කිරීම, සෝවියට් යුද්ධ හමුදවල ශක්තිය තවත් තරකිරීම සෝවියට් සමාජවාදී රජයේ වැදගත් කාර්යයක් වන්නේය. ඒ සමගම අනිකුත් සමාජවාදී රටවල් සමග එකතුවී, මුලු මහත් සමාජවාදී රාෂ්ට්‍ර පද්ධතියේ ආරක්ෂාව සහ සුරක්ෂිතතාවය විශ්වාසවත් ලෙස සහතික කිරීම සිය ජාත්‍යන්තර යුතුකමක් ලෙස සෝවියට් සංගමය සළකයි.

සමාජවාදී ප්‍රජාතන්ත්‍රවාදයේ වර්ධනය

සමාජවාදය තව දුරටත් වර්ධනය කරන්නේ නැතිව, කොමියුනිස්ට්වාදය ඉදිකිරීමේ සටනට සියලු වැඩකරන ජනතාව ක්‍රියාශීලී ලෙස යොදවන්නේ නැතිව කොමියුනිස්ට්වාදය ගොඩ නැගීමේ විශාල කාර්යයන් සාර්ථක ලෙස තීරණය කිරීම සිතාගැනීමට පවා බැරිය.

ආර්ථික සංවිධානාත්මක සහ සංස්කෘතික–අධ්‍යාපනික ක්‍රියාකලාපය වර්ධනය වීමත් සමගම ප්‍රජාතන්ත්‍රවාදයද දියුණුවෙයි. කොමියුනිස්ට්වාදය කරා ක්‍රමාණුකූලව පරිවර්තනයවන සමාජවාදී රජයද වර්ධනය වෙයි. ''සමාජවාදී ප්‍රජාතන්ත්‍රවාදය සැම අතින්ම ප්‍රාසාරණය සහ අංග සම්පූර්ණ කිරීමද, රාජ්‍ය පාලන කටයුතුවලට ආර්ථික හා සංස්කෘතික කළමණාකාර කටයුතුවලට, සියලු රට වැසියන් ක්‍රියාත්මක ලෙස සහභාගිවීමද, රාජ්‍ය යන්ත්‍රය වැඩි දියුණු කිරීමද, එහි කටයුතු පිළිබඳ, ජනතා පාලනය දියුණු කිරීමද යන මේවායින් පිළිබිඹු වන්නේ කොමියුනිස්ට්වාදය ඉදිකරන අවධියේදී සමාජවාදී රජයේ වර්ධනය යොමුවී ඇති ප්‍රධාන දිසාවයැ''යි*

* ''සෝවියට් සංගමයේ කොමියුනිස්ට් පක්ෂයේ වැඩ පිළිවෙළ'', පිටුව 101.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

සෝවියට් සංගමයේ කොමියුනිස්ට් පක්ෂයේ වැඩ පිළිවෙළේ සඳහන් වේ.

පක්ෂ හා රජයේ කටයුතු විෂයෙහි ලෙනින්වාදී ප්‍රතිපත්ති පුනරුත්ථාපනය කිරීම සඳහාත්, සෝවියට් ප්‍රජාතන්ත්‍රවාදය තවත් පුළුල් කිරීම සඳහාත් පසුගිය කාලයේදී පක්ෂය හා ආණ්ඩුව අතිවිශාල වැඩ කොටසක් කර තිබේ. මධ්‍යස්ථානයෙන් දෙන නායකත්වය, පර්යන්ත ප්‍රදේශවල ජනතාවගේ ක්‍රියාරම්භකත්වය උත්තේජනය කිරීමද, සෝවියට් සමූහාණ්ඩුවල, ප්‍රදේශීය පාලන මණ්ඩලවල සහ ආර්ථික විධායකයන්ගේ අයිතිවාසිකම් පුළුල් කිරීමද සමග නිසි ලෙස ගළපාලීම සහතික කරමින්, ප්‍රජාතන්ත්‍රවාදී මාධ්‍යගත භාවය පිළිබඳ ලෙනින්වාදී මූලධර්මය ලෙනින්වාදී ප්‍රතිපත්තිය හැම අංශයෙන්ම දියුණු කර තිබේ.

පරිපාලන-භෞමික සම්පාදන සහ වෙනත් වැදගත් ආර්ථික, රාජ්‍ය සහ සංස්කෘතික ඉදිකිරීම්ද, අධිකරණ ක්ෂේත්‍රයේ අයිතියද සෝවියට් සමූහාණ්ඩුවලට භාරදී ඇත. ආර්ථික ප්‍රතිසංස්කරණය විසින් සාමූහික ව්‍යාපාරවලටද, ඒවායේ නායකයින්ටද ද්‍රව්‍ය හා මුදල් මාධ්‍යයන් පාවිච්චි කිරීමට පුළුල් බලතලද, ප්‍රධාන වශයෙන් නිෂ්පාදනය වඩාත් ප්‍රයෝජනවත් ලෙස සංවිධාන කිරීමේ හැකියාවක්ද දෙන ලදී. කොමියුනිස්ට්වාදය ඉදිකිරීමේදී වැඩ කරන ජනතාවගේ සෝවියට් සභාවල ක්‍රියා කලාපය තවත් උසස් වෙමින් පවතී. සිය ස්වාභාවය අනුව සෝවියට් සභා රාජ්‍යමය සංවිධාන වශයෙන් පමණක් නොව, සමාජීය සංවිධානද වන්නේය. කොමියුනිස්ට්වාදය කරා රට ගමන් කරත්ම, ඒවා වඩාත් පුළුල් ජනතාවගේ ක්‍රියා සහභාගිත්වය ඇති සමාජීය සංවිධාන ලෙස ක්‍රියාකාරී වනු ඇත. නිදසුනක් වශයෙන්, සෝවියට් සභාවල කාරක සභා මගින් සංවිධාන ලද ස්ථාවර සභාවලත්, කාර්යාලයීය නොවන අංශවලත්, ජනතා පොදු පිරික්සුම් කොමිටි-වලත්, ආයතනවලත්, කායඝාල මාණ්ඩලික නොවන ආචාර්ය වරුන් හැටියටත් තුන් කෝටි දස ලක්ෂයකට අධික සංඛ්‍යාවක් ක්‍රියාශීලීහු සහභාගි වෙත්.

සෝවියට් සංගමයේ කොමියුනිස්ට් පක්ෂයේ 24 සම්මේලනයේ යෝජනාවට අනුකූලව මන්ත්‍රීවරයකුගේ අයිතීන් හා යුතුකම්ද, එමෙන්ම රාජ්‍ය හා සමාජයීය සංවිධානවලට ඔහුගේ ඇති යුතුකම්ද සුපැහැදිලි ලෙස විග්‍රහ කරන මන්ත්‍රීවරයාගේ තත්වය පිළිබඳව පනතක් සම්මත කර ගන්නා ලදී. ආර්ථිකය මෙහෙයැවීම, සිය ප්‍රදේශවල සමාජයීය ජීවිතය සහ සංස්කෘතිය උසස් කරන ගම්, ජනපද, ප්‍රාදේශීය හා නාගරික සෝවියට් සභා පිළිබඳ පනත්ද එමෙන්ම ස්ථිර කරන ලදී. සෝවියට් සංගමයේ කොමියුනිස්ට් පක්ෂයේ 25 වැනි සම්මේලනය සටහන් කළ පරිදි කෝරළ, දිසා හා පළාත්වල සෝවියට්

සභාවල තත්වය විග්‍රහ කරන පනත් සම්මත කිරීමට පියවර ගනු ඇත.

මිනිසාගේ නිර්මාපක ශක්තිය යොදවන ප්‍රධාන ක්ෂේත්‍රය වන, නිෂ්පාදන ක්ෂේත්‍රයේ ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාවට යෙදවීම වෘත්තීය සමිති විසින් නියත ලෙසම උදව් කරන බව 25 සම්මේලනයට ඉදිරිපත් කරන ලද සෝවියට් සංගමයේ කොමියුනිස්ට් පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ ප්‍රධාන වාර්තාවෙන් කියැවෙයි. අන් හැමටම පළමුව වෘත්තීය සමිති වැඩ කරන ජනතාවගේ අයිතිය සහ වුවමනාවන් ආරක්ෂා කිරීමටද සමාජයීය සහ සේවාවන් පිළිබඳ ප්‍රශ්න ගැන ක්‍රියාශීලී ලෙස කටයුතු කිරීමටද කැප වී සිටිති. මිනිසාගේ වුවමනාවන් සිය ප්‍රධාන කාරිය හැටියට වෘත්තීය සමිති පිළිගන්නා බැවින්, නිෂ්පාදනය දියුණු කිරීම සඳහාද, ශ්‍රම විනය ශක්තිමත් කිරීම සඳහාද, ශ්‍රම ඵලදාව උසස් කිරීම සඳහාද වෘත්තීය සමිති සැලකිලි දක්විය යුතුය.

ආර්ථික හා සංස්කෘතික සංවර්ධනයෙහි ප්‍රධාන ප්‍රශ්න විසඳීමෙහිලා වෘත්තීය සමිති ඉටු කරන කාර්ය කොටස වැඩිවෙමින් පවතී. වෘත්තීය සමිති යනු කොමියුනිස්ට් අධ්‍යාපනය දෙන පාසැල් වෙති; ආර්ථික කළමණාකාරිත්වය හා රාජ්‍ය පාලනය උගන්වන පාසැල් වෙති.

සෝවියට් සංගමයේ කොමියුනිස්ට් පක්ෂයේ 24 සම්මේලනයට ඉදිරිපත් කරන ලද මධ්‍යම කාරක සභාවේ වාර්තාවේ, රටේ ආර්ථිකය තවත් වර්ධනය කිරීම සඳහාද, නිෂ්පාදන හා සමාජීය කාර්යයන් සහ ඒවා මෙහෙය වීමට වැඩ කරන ජනතාව තව තවත් ක්‍රියාශීලීව සහභාගි කරවා ගැනීම සඳහාද, ජනතාවගේ සමෘධිය උසස් කිරීම සහ ශ්‍රම ඵලදාව වැඩි කිරීම සඳහාද, සමාජවාදී නිෂ්පාදන තරඟවල තත්වය උසස් කිරීම සඳහාද, ශ්‍රමය කෙරෙහි කොමියුනිස්ට්වාදී ආකල්පයක් ඇතිකිරීම සඳහාද කරන වැඩ වඩාත් සියුම් කිරීමට වෘත්තීය සම්ගම් වලට භාර දී ඇති බව සටහන්වේ. කම්කරුවන්ගේ සහ මුළුමහත් වැඩ කරන ජනතාවගේ නිත්‍යානුකූල අයිතිවාසිකම් ගැන සැලකිලිමත් වීමද, ඔවුන්ගේ වැඩ කරන තත්වයන් හා දිවි පැවැත්ම වඩාත් යහපත් කිරීම ගැන සැලකිලිමත් වීමද, ශ්‍රමය ආරක්ෂා කිරීමේ ප්‍රමාණ හා ජීවිතාරක්ෂක තාක්ෂණිකද, ශ්‍රමය වැයකිරීමද පිළිබඳව නීති රීති ක්‍රියාවට යෙදවීමේ පාලනය සියුම් කිරීමද, වැඩ කරන ජනතාවගේ සංස්කෘතිය සහ සෞඛ්‍යමය විවේකය වඩාත් උසස් ලෙස සංවිධානය කිරීම පිළිබඳව සැලකිලිමත් වීමද වෘත්තීය සමිතිවල ප්‍රධාන කාර්යයන්ගෙන් එකක් වන්නේය.

කොමියුනිස්ට්වාදය ඉදිකිරීමේදීත්, කොමියුනිස්ට්වාදී ශික්ෂණයක් තරුණයින්ට ලබාදීමේදීත්, ලෙනින්වාදී තරුණ කොමියුනිස්ට් සංගමයේ (කොම්සමෝල්) සේවය ඉතා වැදගත්ය. ආර්ථික හා

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

සංස්කෘතික ඉදිකිරීම්වල හා රටේ දේශපාලන ජීවිතයේ තරුණයින්ගේ ක්‍රියාකාරීත්වය වැඩි කිරීමද, තරුණයින් හා තරුණියන් අතර උසස් දෘෂ්ටිමය හැඟීමක් සහ කොමියුනිස්ට් පක්ෂයේ කාර්යයට කැපවීමක්ද, සමාජවාදී මව්බිමට ආදරයක්ද, එය ආරක්ෂා කිරීමට සූදානමක්ද, සමාජවාදී රටවල වැඩ කරන ජනතාව සමග සහෝදරාත්මක මිත්‍ර හැඟීමක්ද, සූරාකෑමට හා පීඩනයට භාජනය වී සිටින ජනතාව කෙරෙහි ජාත්‍යන්තර සහයෝගිතාවයක් දක්වීමද සඳහා ක්‍රියා කිරීම කොම්සොමෝල් සංවිධානයේ කාර්ය භාරය වන්නේය.

සෝවියට් පුරවැසියාව යෞවන වියේ සිටම උනන්දුවත්, ජීවමය බුද්ධියත්, තරුණ ශක්තියත් ආරක්ෂා කරගත හැකි වනසේ තරුණ කොමියුනිස්ට් සංගමය (කොම්සමෝල්) සැලකිලි දක්වීම වැදගත් බව සෝවියට් සංගමයේ කොමියුනිස්ට් පක්ෂයේ 25 සම්මේලනයේදී අවධාරණය කැරිණි.

සමූපකාරවල (සමූහ ගොවිපළවල, පරිභෝජක සහ වෙනත් සමූපකාර සංවිධානවල) වැදගත්කම උසස් වෙමින් පවතී. සෝවියට් සංගමයේ ක්‍රීඩා සහ වෙනත් පොදුජන සංගම් හා සංවිධානවල විද්‍යාත්මක, විද්‍යා–තාක්ෂණික, සංස්කෘතික–අධ්‍යාපනික වර්ධනය උසස් වෙමින් පවතී. කොමියුනිස්ට්වාදය ඉදිකිරීම් සඳහාත්, වැඩ කරන ජනතාවට කොමියුනිස්ට්වාදී අධ්‍යාපනයක් ලබාදීමේ නොයෙකුත් ආකාර හා විධි මේ සංවිධාන විසින් නියෝජනය කෙරේ.

පෞද්ගලිකත්වයේ සහ සමාජයේ සමගියක් ඇති වන්නේ, සමාජයේ ඉරණම සඳහා පුද්ගලයින්ගේත්, පුද්ගලයින්ගේ ඉරණම සඳහා සමාජයේත් වගකීම වැඩිවන්නේත් එමගින් පමණකි.

කොමියුනිස්ට්වාදය ඉදිකිරීමේදී සෝවියට් සංගමයේ කොමියුනිස්ට් පක්ෂයේ ක්‍රියා කලාපය උසස්වීම

කොමියුනිස්ට්වාදී සමාජය, මීට ඉහත පැවති සමාජ-ආර්ථික සැකැස්ම මෙන් සංසිද්ධිකව ඇතිවන්නාක් නොව පොදු ජනතාවගේ විඥාන සහ අරමුණු සහිත ක්‍රියා කලාපයේ ප්‍රතිඵලයක් වශයෙන්ද, මාක්ස්–ලෙනින්වාදී පක්ෂයේ නායකත්වයන්ද බිහි වන්නකි. ජනතාවගේ සමාජීය–ආර්ථික සංවිධානයේ උසස්තම ආකාරය වන සෝවියට් සංගමයේ කොමියුනිස්ට් පක්ෂය, ජනතාවගේ ශ්‍රේෂ්ඨ නිර්මාණාත්මක වැඩවලට නායකත්වය දෙමින්, කොමියුනිස්ට්වාදය ඉදිකිරීම සඳහා කරන සටනේදී එයට සංවිධානාත්මක, සැලැස්මානුකූල හා විද්‍යාත්මක ස්වරූපයක් ලබාදෙයි. පක්ෂය, රජය හා පොදුජන සංවිධාන මගින් නියමිත, සංයුක්ත කාර්යයන් ඉදිරිපත් කරමින්, එමගින් ජනතාවගේ විඥානයට කොමියුනිස්ට්වාදය සඳහා

කරන සටන කාවද්දමින්, එම කාර්යයන් සාර්ථක ලෙස තීරණය කිරීම සඳහා හැම සමූහයක් සහ මුළුමහත් සෝවියට් ජනතාවත් මෙහෙයවයි. දුර අනාගතය දෙස තීක්ෂණ ලෙස බලන පක්ෂය, ජනතාවට ඉදිරි මග පෙන්වයි; පොදු ජනතාවගේ මහා නිර්මාපක ශක්තිය පුබුදුවාලයි. කොමියුනිස්ට් පක්ෂයේ ක්‍රියාකාරීත්වය මුල සිට අග දක්වා මාක්ස්–ලෙනින්වාදී අනභිභවනීය උගැන්වීම්වලින් නායකත්වය ලබයි. සම්බාවිතයේ පදනම මත එම උගැන්වීම් නිර්මාණාත්මක ලෙස වර්ධනය කරන පක්ෂය ජනතාවගේ සටවන්වල සහ ශ්‍රමයේ අත්දැකීම් ගොනු කරයි, සමාජවාදී රටවල සහෝදර පක්ෂවල, ජාත්‍යන්තර කොමියුනිස්ට් පක්ෂවලද නිර්මාපක චින්තනය හා ප්‍රයෝගික කටයුතු-වල ජයග්‍රහණද පිළිගනී.

කොමියුනිස්ට්වාදය ඉදිකිරීමේ කාර්ය භාරයේ පරිමාණය හා සංකීර්ණත්වයේ වැඩිවීම ද, පොදු ජනතාව ගේ නිර්මාපක ක්‍රියාකාරීත්වය උසස්වීමද, සමාජවාදී ප්‍රජාතන්ත්‍රවාදය තවදුරටත් දියුණුවීමද, විද්‍යාත්මක න්‍යායයේ ක්‍රියා කලාපය උසස්වීමද, වැඩ කරන ජනතාවට කොමියුනිස්ට්වාදී ශික්ෂණයක් ලබාදීමේ අත්‍යඅවශ්‍යතාවය සියුම්වීමද නිසා කොමියුනිස්ට්වාදය ගොඩනැගත්ම, කොමියුනිස්ට් පක්ෂයේ ක්‍රියා කලාපය උසස්වේ.

කොමියුනිස්ට් පක්ෂය ජීවමාන, වැඩෙන සංවිධානයකි (ඓන්ද්‍රියයකි). නිරතුරුවම එම සමාජික සංඛ්‍යාව වැඩි කරගන්නා පක්ෂය, සමාජීය තත්වය අනුව පක්ෂය තුළ ප්‍රධාන තැන කම්කරු පංතිය සතුවීම ගැන සැලකිලි දක්වයි. පක්ෂය සිය වැඩවල ආකාර හා විධි අංග සම්පූර්ණ කරයි, ඒවා ජීවිතයේ ඉල්ලීම්වලටත්, කොමියුනිස්ට්වාදය ඉදිකිරීමේ ප්‍රායෝගික වැඩවලටත්, උචිත වන සේ ගළපාලයි. සමාජ සංවර්ධනයේ පොදු අනාගත සැලැස්ම සම්පාදනය කිරීමද, එය ක්‍රියාවේ යෙදවීම සඳහා වැඩ කරන ජනතාවට දේශපාලනමය මග පෙන්වීමක් සහ ඔවුන් සංවිධානය කිරීමද කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රධාන කාර්යය වන්නේය. කොමියුනිස්ට්වාදී ශික්ෂණයක් ලබා දීමේදීත්, කාඩර්ස් වරුන්ගේ තෝරා පත් කිරීම හා ඔවුන්ට වැඩ බාරදීමේදීත්, පක්ෂයේ හා රජයේ තීරණ ක්‍රියාවේ යෙදවීම පාලනය කිරීමේදීත් නායකත්වයක් දෙයි.

අවුරුදු බොහෝ ගණනක් තිස්සේ ලබා ගන්නා ලද ඓතිහාසික අත් දැකීම්වලින් පෝෂණය වී, ඉතිහාසය විසින් සනාථ කරන ලද වී. අයි. ලෙනින්ගේ මූලධර්ම හා ප්‍රතිමාන වලින් පක්ෂය සිය ජීවිතයේදී හා කටයුතුවලදී මග පෙන්වීම ලබාගනී. මෙම මූලධර්ම-වලින් ඉතාම වැදගත්, අත්හදා බලන ලද අවියක් සහ පක්ෂයේ ශ්‍රේෂ්ඨතම

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

දේශපාලන දයාදය වනුයේ සාමූහික නායකත්වයය. පක්ෂයේ හා මුළු මහත් ජනතාවගේ නිර්මාපක උනන්දුව සාර්ථක ලෙස මෙහෙය විය හැක්කේත්, තත්වය නිවැරදි ලෙස විශ්ලේෂණ කොට, ව්‍යාජ ගරුත්වයෙන් තොරව ජයග්‍රහණයත් වාස්තවික ලෙසත්, බැරෑරුම් ලෙසත් තක්සේරු කළ හැක්කේ, නිසි ලෙස වැරදි සොයා ගෙන, ඒවා හෙළිකර, නිසි පිළියම් යොදා ගත හැක්කේත් ලෙනින්වාදී මූලධර්ම පදනම් වුණු සාමූහික නායකත්වයකට පමණකි.

පක්ෂය ස්වයං තෘප්තියෙන් සහ තම ජයග්‍රහණයන් නිසා සතුටින් පසු නොවේ. සිය වැඩකට යුතු ගැන විවේචනාත්මක ලෙස බැලීම නිසාද, අඩුපාඩුකම් ගැනත්, නොවිසඳු කාර්යයන් ගැන සිය පරිශ්‍රමය යෙදවීම නිසාද, වැඩවල සංවිධානය, ආකාරය සහ විධි නිරන්තරයෙන්ම උසස් කරන නිසාද පක්ෂය කැපී පෙනෙයි.

''සෝවියට් සමාජ සංවර්ධනයේ ගාමකත්වය විසින්ද, කොමියුනිස්ට්වාදී සංවර්ධනයේ වැඩෙන පරිමාණ විසින්ද, ජාත්‍යන්තර දේශපාලන භූමියේ අපේ කාර්‍ය්‍ය කටයුතු විසින්ද ආර්ථිකයේත්, සංස්කෘතියේත්, ජනතාවට අධ්‍යාපනය දීමේත්, පොදු ජනතාව අතර දේශපාලන සහ සංවිධානාත්මක වැඩවලදීත් පක්ෂ නායකත්වයේ මට්ටම නොකඩවා උසස් කළ යුතුයැ''* යි ඉල්ලා සිටින බව සෝ: සං: කො: පක්ෂයේ ම: කා: සභාවේ දේශපාලන වාර්තාවෙන් අවධාරණය වේ.

පක්ෂයේ හැම සමාජිකයකුගෙන්ම උසස් සේවයක් ඉල්ලා සිටින්නාවූද, ශ්‍රමය කෙරෙහි ආදර්ශමත් කොමියුනිස්ට්වාදී ආකල්පයක් දක්වන ලෙසද, උසස් දෘෂ්ටිමය තත්වයක්ද, [අඩුපාඩුකම්වලට, වංචාවට සහ අලසකමට දැඩි විරුද්ධතාවයක් දක්වන ලෙසද ජනතාව කෙරෙහි ආදරයක් සහ සැලකිල්ලක් දක්වන ලෙසද, පක්ෂයට හා ජනතාවට කැපවීමක්ද ඉල්ලා සිටින පක්ෂයේ ව්‍යවස්ථාව, කොමියුනිස්ට්වාදයේ ජය සඳහා කරන සටනේදී සෝවියට් සංගමයේ කොමියුනිස්ට් පක්ෂයේ විශ්වාසදයක සංවිධානාත්ම අවිය වන්නේය. පක්ෂ අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය තව දුරටත් වර්ධනය කිරීමද, පක්ෂයේ මූලික හා පළාත්බද සංවිධානවල ක්‍රියා කලාපය උසස් කිරීමද ව්‍යවස්ථාව අවධාරණය කරයි.

පක්ෂය හා වැඩ කරන පොදු ජනතාව අතර ඇති සම්බන්ධකම් තව දුරටත් පුළුල් කිරීම හා ගැඹුරු කිරීම කොමියුනිස්ට්වාදය සාර්ථක

* ''සෝ: සං: කො: පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ ලියවිලි'', පිටුව 65.

කිරීම සඳහා කරන සටනේ අත්‍යාවශ්‍ය කොන්දේසියකි. දේශීය හා විදේශීය ප්‍රතිපත්ති පිළිබඳ වැදගත් ප්‍රශ්නවලදී ජනතාවගේ උපදෙස් ලබා ගැනීමද, සිය වැඩවලදී, පක්ෂයේ නොවන වැඩ කරන පොදු ජනතාව පුළුල් ලෙස ඇද ගැනීමද සිය ශුද්ධ වූ යුතුකම ලෙස පක්ෂය කල්පනා කරයි.

කොමියුනිස්ට්වාදයේ අනාගත ජයග්‍රහණයේ ඉතා වැදගත් සාධකය සෝවියට් සංගමයේ කොමියුනිස්ට් පක්ෂයේ මග පෙන්වන හා මෙහෙයවන ක්‍රියාකාරීත්වයත්, සංවිධානාත්මක හා අධ්‍යාපනික වැඩ කටයුතුත් වන්නේය.

5. රජය අභාවයට යාම පිළිබඳව

සමාජවාදී රජය ශක්තිමත් කිරීමේ හා වර්ධනය කිරීමේ අවශ්‍යතාවය විසින් එය සදාකාලිකව පවතිතැයි කිසිවිටක අදහස් නොකෙරෙයි. සෝවියට් සංගමයේ කොමියුනිස්ට් පක්ෂයේ වැඩ පිළිවෙළේ සටහන පරිදි, සමාජවාදී රජයේ සංවර්ධනය ක්‍රමානුකූලව සමාජීය කොමියුනිස්ට්වාදී ස්වයං පාලනයක් දක්වා පරිවර්තනය වනු ඇත. එහි සෝවියට් සභා, වෘත්තීය සමිති, සමුපකාර වැඩ කරන ජනතාවගේ වෙනත් බහුජන සංවිධාන එක්සත් වනු ඇත.

වත්මන් කාලයේ රාජ්‍යය විසින් මෙහෙයවනු ලබන ආර්ථික හා සංස්කෘතික ජීවිතය, සමාජීය සංවිධාන විසින් මෙහෙයවන අතර එය කොමියුනිස්ට්වාදී තත්වයන් යටතේ සුරැකිව පවතිනු ඇත. එපමණක් නොව, සමාජයේ වර්ධනයට අනුකූලව ඒවාද නිරතුරුවම වර්ධනයවී වැඩි දියුණු වනු ඇත. එහෙත් ඒවා ඉටු කිරීමේ ස්වාභාවය හා ආකාරය සමාජවාදයට වඩා වෙනස් වනු ඇත. සමාජය කොමියුනිස්ට් ක්‍රමය කරා එළඹෙත්ම, රාජ්‍ය ප්‍රධාන අවයවවල ඇති දේශපාලනමය හා පංතිමය ස්වරූප ක්‍රම ක්‍රමයෙන් අහෝසි වනු ඇත. අවසානයේදී මේවා සමාජය සමග ඒකාබද්ධ වී සමාජීය මහජන ස්වයං පාලන සංවිධාන බවට පත්වනු ඇත. සමාජයේ සියලු සාමාජිකයෝ ආර්ථික හා සංස්කෘතික ජීවිතය මේවා මගින් මෙහෙයවනු ඇත්තාහ. එවිට රජය අභාවයට යනු ඇත.

එසේවුවද, කොමියුනිස්ට්වාදය යටතේ රජය අභාවයට යාමද, රාජ්‍යපාලනය සමාජමය ස්වයං පාලනයක් දක්වා පරිවර්තනයවීමද ක්ෂණික, එකවර සිදුවන දෙයක් සේ සිතීම වැරදිය. රජය අභාවයට යාම සම්පූර්ණ ඓතිහාසික යුගයකට බලපාන ක්‍රමානුකූලව දීර්ඝ කාලීන ක්‍රියාවලියකි. නියමිත කාල පරිච්ඡේදයක් තුළදී රජයේ

https://liberationbase.wordpress.com

නායකත්වය සහ සමාජීය ස්වයං පාලනය අතර සහ පැවැත්මක් ඇතිවනු ඇත. එතැන් සිට ඉදිරියට වර්ධනය වන්නේ, වර්ධනය වූ කොමියුනිස්ට්වාදී තත්වයන් යටතේ රජයක අවශ්‍යතාවය අහෝසි වී ගිය දට, සමාජය ස්වයං පාලනයක් දක්වා මහුකුරා වැඩුණු විටය. ඒ ගැන වි. අයි. ලෙනින් මෙසේ පෙන්වා දුන්නේය. " 'හැම කෙනෙකුගෙන්ම සිය දක්ෂතාවයන් අනුව, හැම කෙනෙකුටම සිය උවමනාවන් අනුව' යන රීතිය සමාජයේ ක්‍රියාවේ යොදවන දට රජය සම්පූර්ණයෙන්ම අභාවයට යනු ඇත. සමාජයේ මූලික රීති පිළිපැදීමට මිනිසුන් ඉතා හොඳින් පුරුදු වූ දට, ඔවුන්ගේ ශ්‍රමය කෙතරම් ඵලදායී වන්නේදයත්, ඔවුන් සිය දක්ෂතාවය අනුව වැඩ කිරීමට සිය කැමැත්තෙන්ම ඉදිරිපත් වනු ඇත".*

රජය අභාවයට යාම පිණිස ඉටුවිය යුතු අභ්‍යන්තර කොන්දේසිය වර්ධනය වුණු කොමියුනිස්ට් සමාජයක් ගොඩ නැගීමය. එසේ වුවද රජය පූර්ණ වශයෙන්ම අභාවයට පත්වීම සඳහා බාහිර කොන්දේසි සම්පූර්ණ වීමද, එනම් ජාත්‍යන්තර වේදිකාවේ සමාජවාදය ජයග්‍රහණය කරා තහවුරු වීමද අවශ්‍ය වන්නේය. රජය අභාවයට යාම ගැන කතා කරන විට, අනිවාර්යයෙන්ම ජාත්‍යන්තර තත්වය කල්පනාවට ගත යුතුය. එක් රටක හෝ තවත් රටක නැතිනම් රටවල් කිහිපයක කොමියුනිස්ට්වාදය ජයගත්තද ලෝකයේ අවිගත් ධනවාදී බලවතුන් සිටින තුරු කොමියුනිස්ට්වාදී සමාජයට තම ආරක්ෂාව සලසා ගැනීමේ රජයේ කාර්යය අනිවාර්ය වශයෙන්ම සුරැකිව පවත්වා ගැනීමට සිදුවනු ඇත. ප්‍රතිගාමී අධිරාජ්‍යවාදී බලවේගයන්ගෙන් පැනනගින ආක්‍රමණකාරී අවදානම සම්පූර්ණයෙන්ම අතුරුදහන් වූ පසු පමණක් මෙම කාර්යය අභාවයට යනු ඇත.

---

*වි. අයි. ලෙනින්. "රජය හා විප්ලවය". පිටුව 93. සිංහල මුද්‍රණය. 1970.

VII

සමාජ විප්ලවය

රජය යනු කුමක්ද, එය පැන නැංගේ කෙසේද, මිනිස් ඉතිහාසයේ ඇති වූ රජයන්ගේ වර්ග කවරේද ආදිය අපි යට දක්වුණු පරිච්ඡේදයන්ගෙන් දැන ගතිමු. දැන් අප ඉදිරියේ ඇති ප්‍රශ්න මේවාය. එක් වර්ගයකට අයත් රජයක් තවත් වර්ගයකට අයත් රජයකට ඉඩ දී ඉවත් වන්නේ කවර හේතුවක් නිසාද, සමාජ ක්‍රම වෙනස් වන්නේ මන්ද, ආධිපත්‍ය දරන එක් පංතියක් වෙනුවට තවත් පංතියක් ඇති වන්නේ මන්ද? සමාජයීය විප්ලවය පිළිබඳ මාක්ස්–ලෙනින්වාදී න්‍යායය එම ප්‍රශ්නවලට පිළිතුරු සපයයි.

1. සමාජ විප්ලවය — ප්‍රතිවිරුද්ධ පංති සහිත සමාජයේ සංවර්ධන නියාමයකි

සමාජ විප්ලවයේ හරය හේතු සහ වැදගත්කම

සමාජ විප්ලවය වූකලී සමාජයේ දේශපාලන, ආර්ථික හා දෘෂ්ටිමය ජීවිතයේ ගැඹුරු පෙරළියක් ආධිපත්‍යය දරන පංති හා රාජ්‍ය වර්ගවල අනුගාමී වෙනස්වීමත්, පැරණි නිෂ්පාදන සම්බන්ධකම් නැතිකර දමා අළුත් ඒවා ඇති කිරීමත්, සමාජමය සිතුම් පැතුම් හා ආයතනයන් හාත්පසින්ම වෙනස්වීමත් සමාජ විප්ලවයේ ප්‍රතිඵලයක් වශයෙන් සිදුවේ.

සමාජ විප්ලවය අහම්බෙන් සිදු වන්නක් නොව, ස්වාභාවික නියාමානුකූල සිද්ධියකි. එය ඇතිවන්නේ, සමාජයේ නියමිත සංවර්ධන අවයවවලදී එහි ජීවිතයේ වන ද්‍රව්‍යමය තත්වයන් හා එහි අභ්‍යන්තර ප්‍රතිවිරෝධිතාවයක් හේතු කොට ගෙන නියාමානුකූල ලෙසටය.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

කාල් මාක්ස් සමාජ විප්ලවයට හේතුන් පෙන්වා දෙමින් ''දේශපාලන ආර්ථික විවේචනයක්'' නැමති කෘතියට ඔහු ලියූ සංඥපනයේ සඳහන් කළේ මෙසේය. සමාජයේ ද්‍රව්‍යමය නිෂ්පාදනීය සමාජ සංවර්ධනයේ එක්තරා බලවේගයන්ගේ එක්තරා සංවර්ධන අවධියක් දක්වා, පවත්නා නිෂ්පාදන සම්බන්ධකම් තුළ ක්‍රියාත්මක වූනු එම බලවේග එතැන් පටන් නිෂ්පාදන සම්බන්ධකම් සමග ගැටෙන්නේය. නිෂ්පාදනීය බලවේගයන්ගේ සංවර්ධන ස්වරූපයක් වී තිබුණු මෙම සම්බන්ධකම්, ඒවා බැඳ තබන රැහැන් බවට පත්වේ. එවිට සමාජයේ විප්ලවයක් ඇරඹේ.

අලුත් නිෂ්පාදනීය බලවේග සහ පැරණි නිෂ්පාදන සම්බන්ධකම් අතර වන ඝට්ටනය සමාජ විප්ලවයේ වාස්තවික ආර්ථික පදනම වන්නේය. අප විසින් මීට පෙර විස්තර කළ පරිදි, නිෂ්පාදන සම්බන්ධකම්, නිෂ්පාදනීය බලවේගයන්ගේ වර්ධනය වඩා නොදියුණු තත්වයක අනිශ්චිත ලෙසින් පැවතිය නොහැකිය. කල්මත්තෙන් හෝ පමා වී හෝ ඒවා නිෂ්පාදනීය බලවේගයන්ට අනුකූලව විය යුතුය. මේ අනුකූලතාවය සමාජ විප්ලවයකින් ඇති වන ප්‍රතිඵලය වේ.

නිෂ්පාදනයේ වන ඝට්ටනයක් නිතරම ප්‍රකාශ වන්නේ පංති අයිතිවාසිකම් පිළිබඳ ඝට්ටනයකින්ය. පැරණි නිෂ්පාදන සම්බන්ධකම්වල ධාරකයා වන ප්‍රතිගාමී පංතිය, අලුත් නිෂ්පාදන සම්බන්ධකම්වල ධාරකයා වන ප්‍රගතිශීලී පංතියට ප්‍රතිපාක්ෂිකව සිටී. එබැවින් ප්‍රගතිශීලී පංතිය හා ප්‍රතිගාමී පංතිය අතර සමහන් නොකළ හැකි අරගලයක් පවතින අතර එය ප්‍රකාශ වන උසස්ම ආකාරය හා එහි පරිසමාප්තිය සමාජ විප්ලවය වන්නේය.

පැරණි, ප්‍රතිගාමී පංතිය පාලන බලය සිය කැමැත්තෙන් පවරා නොදෙයි. පැරණි නිෂ්පාදන සම්බන්ධකම් ආරක්ෂා කර ගැනීම සඳහා එය රජයේ සම්පූර්ණ බලය යොදවයි. එනිසා පැරණි නිෂ්පාදන සම්බන්ධකම් නැතිකර දමා, අලුත් ඒවා ස්ථාපිත කිරීම සඳහා ප්‍රගතිශීලී පංතිය දේශපාලන බලය ලබා ගත යුතුය. වෙනත් වචනවලින් කියතොත්, අලුත් නිෂ්පාදන සම්බන්ධකම් ජය ගන්නේද, නැද්ද යන ප්‍රශ්නය, විප්ලවවාදී පංතිය රාජ්‍ය බලය ලබාගන්නේද යන්න මත රඳාපවතී. රාජ්‍ය බලය අල්ලා ගැනීම පිළිබඳ ප්‍රශ්නය ඕනෑම විප්ලවයක මූලික ප්‍රශ්නය වන්නේ මේ හේතු නිසාය.

සමාජ ජීවිතයට සමාජ විප්ලවය අතිශයින් වැදගත් වේ. පැරණි, ප්‍රතිගාමී සමාජ ක්‍රම විනාශ කොට, අලුත් ප්‍රගතිශීලී ක්‍රමයක් ඉදිරිපත්කළ හැක්කේ මූලික, විප්ලවවාදී වෙනස් කිරීම් මගින් පමණකි. පූර්වගාමී සමාජ සංවර්ධන කාල සීමාව තුළ දිගු කලක් තිස්සේ මුහුකුරා

ගිය ආර්ථික හා පංති විරෝධීතාවයන් විසඳාලිය හැක්කේ සමාජ විප්ලවයකට පමණකි. ආර්ථික, දේශපාලන හා සංස්කෘතික වර්ධනයට බාධා කරන යල් පැනගිය නිෂ්පාදන සම්බන්ධතාවයන් සහ ඒවායේ ප්‍රතිගාමී ධාරකයා වන පැරණි පංති නැති කර දැමීමට උපස්තම්භක වන්නේ විප්ලවයක් පමණකි. සමාජ විප්ලව සමයේදී ජනතාවගේ නිර්මාපක ශක්තිය පිබිදේ. කෝටි සංඛ්‍යාත ජනතාව ක්‍රියාකාරී සමාජය ජීවිතයට ඇදයති; මෙහි ප්‍රතිඵලයක් වශයෙන් සමාජ සංවර්ධන ක්‍රියා දමය බෙහෙවින් වේගවත් වේ. විප්ලවය ඉතිහාසයේ දුම්රි යන්ත්‍රය වශයෙන් මාක්ස් විසින් හඳුන්වනු ලැබුවේ මේ හේතුව නිසාය.

විප්ලවවාදී තත්වය විප්ලවයකදී මනෝමූල සාධකය ඉටු-කරන කාර්ය කොටස

කිසිවකුගේ ''ඇණවුමක්'' පරිදි හෝ අභිමතය පරිදි හෝ විප්ලවයක් සිදුකළ නොහැක. විප්ලවයක් ඇතිවීමට නියමිත ඓතිහාසික තත්වයන්ද, විෂය මූල හා මනෝමූල පූර්වාවශ්‍යතාවයන්ද, සම්පූර්ණවී තිබිය යුතුය. විප්ලවයකට අවශ්‍ය විෂය මූල තත්වයන්ගේ සමස්තය විප්ලවවාදී තත්වය වශයෙන් හැඳින්වේ. වි. අයි. ලෙනින් විප්ලවවාදී තත්වයක ලක්ෂණ වශයෙන් සැලසුවේ මේවාය:

1. එක අතකින් පාලක පංතිවලට පැරණි විදිහට ජීවත්වීමට හා රට පාලනය කිරීමට කොහෙත්ම නොහැකිවීම, ඉහළින් ඇතිවන 'අර්බුදය' ය, අනිත් අතින් පැරණි විදිහට ජීවත්වීමට සූදනම් නැති පීඩිත පංතිවල කොපාග්නිය නැතහොත් පහළින් ඇතිවන අර්බුදය ය. ''(සූරාකන්නන්ට හා සූරාකනුලබන්නන්ට යන දෙකොටසටම බලපාන) ජාති ව්‍යාප්ත අර්බුදයකින් තොරව, විප්ලවයක් ඇතිවිය නොහැකියැ''* යි වි. අයි. ලෙනින් ලියුවේය.

2. පීඩිත ජනතාවගේ දුප්පත්කම හා පීඩනය අතිශයින්ම උග්‍රවීම.

3. පොදුජන ක්‍රියාකාරීත්වයේ සැහෙන වැඩිවීමක් සාමාන්‍ය කාලවලදී මිනිසුන් සාපේක්ෂ වශයෙන් සන්සුන්ව සිටියද, අර්බුද තත්වයන් යටතේ ඔවුහු ස්වාධීන විප්ලවවාදී ක්‍රියාවට යෙදීමට පෙළඹෙත්.

එසේවුවද, හැම විප්ලවවාදී තත්වයක් නිසා විප්ලවයක් ඇති නොවේ. රුසියාවේ 1859 පටන් 1861 දක්වා විප්ලවවාදී තත්වයක් තිබුණාද, විප්ලවයක් ඇති නොවීය. විප්ලවවාදී තත්වයකින් නැතහොත් වාස්තවික සාධකය මුහුකුරා වැඩිමෙන්, ජයග්‍රාහී විප්ලවයක් ඇතිවීමේ

* වි. අයි. ලෙනින්. බිළිඳු වලිප්පුව.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

හැකියාව පමණක් බිහි කරයි. එහෙත් මේ හැකියාව යථාර්ථයක් බවට පරිවර්තනය කිරීමට නම් මනෝමූල සාධකයන් මෝරා තිබිය යුතුය; එනම් වී. අයි. ලෙනින් පෙන්වා දුන් පරිදි "තල්ලු කරන" තුරු "ඇදනොහැළෙන" පැරණි ආණ්ඩුව, පරාජය කර පෙරළා දැමීමට තරම් සෑහෙන, විප්ලවවාදී පොදුජන සටන්වල යෙදීම සඳහා සූදනමක් හා ශක්තියක් විප්ලවවාදී පංතියට තිබිය යුතුය. කම්කරු පංතිය සංවිධානය වී, දේශපාලනමය විඥනකත්වයක් ඇතිව සිටියොත්, එය විශ්වාස කටයුතු මිතුරන් සිටියහොත් හා එය සටන් පලපුරුද්ද ඇති මාක්ස්වාදී පක්ෂයක් විසින් නායකත්වය දෙනු ලැබුහොත් පමණක් සමාජවාදී විප්ලවය ජයග්‍රාහී වන්නේය.

සමාජ විප්ලවවල ස්වාභාවය හා ගාමක බලවේග අනුව ඒවා විවිධ වෙති. බලයට පැමිණෙන පංතිය සහ විප්ලවයේ ප්‍රතිඵලය

විප්ලවයේ ස්වාභාවය හා ගාමක බලවේගය

වශයෙන් ඇති කරනු ලබන නිෂ්පාදන සම්බන්ධතා අනුව එම විප්ලවයේ ස්වාභාවය තීරණය වේ. නිදසුනක් වශයෙන්, රදළයින්ගේ පාලනයක් වෙනුවට, ධනපතීන්ගේ පාලනයක් ඇතිවන, එමෙන්ම, එයට උචිත පරිදි රදළ නිෂ්පාදන සම්බන්ධකම් වෙනුවට, අලුත් ධනපති නිෂ්පාදන සම්බන්ධකම් ඇතිවන විප්ලවයක්, ධනපති විප්ලවයක ස්වාභාවය ගනී.

විප්ලවයක ගාමක බලවේග වනුයේ, අලුත් නිෂ්පාදන සම්බන්ධතාවයන්ගේ ජයග්‍රහණය සඳහා ප්‍රතිගාමී පංතිවලට විරුද්ධව සටන් කරන සහ විප්ලවය කරන සමාජ පංතීන්ය. විප්ලවය කරන පංති අතරින් එක් පංතියක නායකය වන අතර, එයට සහභාගි වන අනිත් පංති සහ සමාජමය කණ්ඩායම් එය අනුගමනය කරයි.

විප්ලවයක ස්වාභාවය සහ එයට පසුබිම් වන ඓතිහාසික තත්වයන් අනුව විප්ලවයක ගාමක බලවේග සහ එහි නායකත්වය ගන්නා පංතිය තීරණය වේ. බටහිර රටවල ධනපති ක්‍රමය නැගී ආ කාලයේදී (17 වැනි සියවසේ සිට 19 වැනි සියවසේ මුල භාගය දක්වා) බටහිර රටවල ඇති වූ ධනපති විප්ලවවාදී ගාමක බලවේග වූයේ ගොවි ජනතාව සහ හස්ත කර්මාන්ත කරුවෝය. රදළවාදයට විරුද්ධව අනිකුත් සියලු බලවේගවලට නායකත්වය දුන් ධනපති පංතිය ඒවායේ නායකයා විය.

අධිරාජ්‍ය යුගයේදී ධනපති විප්ලව කැපී පෙනෙන ප්‍රජාතන්ත්‍රික ස්වභාවයක් ප්‍රකාශ කරයි. (රුසියාවේ 1905—1907 විප්ලවය සහ 1917 පෙබරවාරි විප්ලවය මෙයට නිදසුන්ය). සිය ඉල්ලීම් ඉදිරිපත් කරමින්, විප්ලවයට සහභාගි වන ඉතා පුළුල් ජන කොටස්, ස්වාධීන

ක්‍රියා මාර්ගයක් අනුගමනය කරමින් විප්ලවයේ ගමන් මග කෙරෙහි අති විශාල බලපෑමක් ඇති කරයි. මේ විප්ලවවලදී අධිරාජ්‍යවාදී ධනපති පංතිය ප්‍රතිගාමී පංතියක් ලෙස ක්‍රියා කරයි. ස්වාධීනත්වය සම්පූර්ණ වන හා ප්‍රජාතන්ත්‍රවාදය පුළුල් වන පමණට තම පාලනයට විරුද්ධව කම්කරු පංතිය ගෙන යන අරගලයට වාසිදායක තත්වයන් ඇති කෙරෙන බැවින්, මෙම පංතිය විප්ලවයේ පූර්ණ ජයග්‍රහණයටත්, පුළුල් ප්‍රජාතන්ත්‍රකරනයටත් බොහොසේ බියවෙයි. වි. අයි. ලෙනින් පෙන්වා දුන්නාක් මෙන් ඒකාධිකාරී ධනපති පංතිය විප්ලවය අතරමග නතර කිරීමටද, ඉඩම් හිමියන්ගේ හා පැරණි අධිකාරය සමග සම්මුති ඇති කර ගැනීමට ද උත්සාහ කරයි. අලුත් තත්වය යටතේ එම පංතිය විප්ලවයේ නායකයා හා ගාමක බලවේගය නොවන්නේ එහෙයිනි. රටවල් ගණනාවකම එය එළිපිටම ප්‍රතිවිප්ලවයට ආධාර කරයි. අධිරාජ්‍යවාදී යුගයේදී ධනපති විප්ලවවල ගාමක බලවේගය නිර්ධන පංතිය හා ගොවි ජනතාවය, එහි නායකත්වය ගන්නේ, නිර්ධන පංතිය ය.

2. සමාජවාදී විප්ලවය

සූරාකෑම සහ ජාතික පීඩනයද, විරැකියාව සහ දුප්පත්කමද තුරන් කරලීම සඳහා නිර්ධන පංතිය ධනේශ්වර ක්‍රමය විනාශ කොට, සමාජවාදී සමාජයක් ගොඩ නැගිය යුතුය. මෙය ලබා ගත හැකි එකම මාධ්‍යය වූකලී සමාජවාදී විප්ලවය ය.

මීට පෙර පැවති සියලු සමාජ විප්ලව වර්ගවලට වඩා සමාජවාදී විප්ලවය හාත්පසින්ම වෙනස්වෙයි. මේ වෙනස්කම කවරේද?

සමාජවාදී විප්ලවයේ හරය

පළමුවැන්න: ඉන් පෙර ඇතිවූ විප්ලව එකක්වත් සූරාකෑම අහෝසි කිරීමට අරමුණු නොකළ අතර එහි ආකාරය පමණක් වෙනස් කළේය. සමාජවාදී විප්ලවය සියලු අන්දමකම සූරාකෑම සදහටම නැති කර දමන අතර පංති රහිත සමාජයක් ගොඩ නැගීමේ යුගය උදා කරයි.

දෙවැන්න: ඉන් ඉහත ඇතිවූ විප්ලව අලුත් ආර්ථිකයක් ගොඩ නැගීමේ කාර්යයට මුහුණ නොදුන්නේය. පැරණි සමාජයේ පසුතලයෙන් පැන නැගුණු අලුත් ආර්ථික සම්බන්ධතාවයට උචිත වනසේ දේශපාලන වෙනස් කිරීම පමණක් එම විප්ලව විසින් ඉටු කරන ලදී. ධනවාදයේ කුසෙන් බිහි නොවන අලුත් ආර්ථිකයක්, එනම් සමාජවාදයේ ආර්ථිකය නිර්මාණය කිරීම සමාජවාදී විප්ලවයේ ප්‍රධාන කර්තව්‍යයන් අතුරෙන් එකක් වන්නේය.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

තෙවනුව: සමාජවාදී විප්ලවය තරම් පොදු ජන කොටස් විශාල වශයෙන් ක්‍රියාශීලී කරවන විප්ලවය තවත් නැත. ධනපති ක්‍රමයට විරුද්ධව හා සමාජවාදය සඳහා සටන් කිරීම පිණිස නිර්ධන පංතිය සමාජවාදී විප්ලවයේදී වැඩ කරන ජනතාවගේ සහ ප්‍රජාතන්ත්‍රවාදී බලවේගවල පුළුල් කොටස් තමන් කරා ඒකරාශී කරගනී.

සමාජවාදී විප්ලවයේ තීරණාත්මක බලවේගය කම්කරු පංතිය ය. අතිශයින්ම විප්ලවවාදී හා දියුණු පංතිය වන නිර්ධන පංතිය, මාක්ස්වාදී පක්ෂයේ නායකත්වය ලබමින්, පැරණි ධනපති සමාජයට විරුද්ධව සටන් කරන සියලු වැඩ කරන ජනතාවට මග පෙන්වයි. එය අධිපති තත්වයේ සිටින ධනවාදී ක්‍රමයට විරුද්ධව සටන සංවිධානය කරයි; ධනපති ක්‍රමයේ දේශපාලන බලය බිඳ දමා සිය අධිපත්‍ය පතුරවාලයි. දේශපාලන බලය අල්ලාගත් පසුව, කම්කරු පංතිය වැඩ කරන සියලු ජන කොටස් සමාජවාදී මග ඔස්සේ මෙහෙයවයි.

නිර්ධන පංතිය විසින් දේශපාලන බලය දිනා ගැනීමත් එය තවත් දුර වර්ධනය කිරීම සහ තහවුරු කිරීමත් සමාජවාදී විප්ලවයේ ප්‍රධාන ප්‍රශ්නය වන්නේය. යට කියන පරිදි නිර්ධන පංතියට තම කාර්ය භාරය වන ධනපති ක්‍රමය අහෝසි කිරීම හා නව සමාජයක් ගොඩ නැගීම සපුරාලිය හැක්කේ තමන්ගේම නිර්ධන පංති රජයක් නිර්මාණය කිරීමෙනි. ඒ අනුව, ධනපති රාජ්‍ය යන්ත්‍රය විනාශ කිරීමත්, අලුත් නිර්ධන පංති රජයක් ඉදිකිරීමත් සමාජවාදී විප්ලවයේ ප්‍රධාන කාර්ය භාරය වන්නේය.

අධිරාජ්‍යවාදී යුගයේදී සමාජවාදී විප්ලවය අනිවාරණීයය

ප්‍රතිසංස්කරණවාදීහු කවදත් සමාජවාදී විප්ලවයට විරුද්ධ වූහ. මිනිස් සංහතිය ධනවාදයේ සිට සමාජවාද දක්වා ගමන් කිරීම ඉතිහාසයේ ප්‍රධාන අංග ලක්ෂණය වී ඇති වර්තමාන කාලයේ සමාජවාදී විප්ලවය පිළිබඳ මාක්ස්–ලෙනින්වාදී න්‍යායය නිෂ්ප්‍රභ කිරීමට ප්‍රතිසංස්කරණවාදීහු ඉතාම මූරණ්ඩු ප්‍රයත්නයක යෙදෙති. මේ නියාමානුකූල ක්‍රියාදමය කෙසේ හෝ වලක්වාලීමේ, ධනපති ක්‍රමය ආරක්ෂා කර ගැනීමේ හා කම්කරු පංතිය විප්ලවවාදී අරගලයන් වෙන අතකට යොමුකරවීමේ වැයමක යෙදෙන ප්‍රතිසංස්කරණවාදීහු අද තත්වය අනුව සමාජවාදී විප්ලවයේ අවශ්‍යතාවය අහෝසිවී ඇති බවත්, ධනවාදයේ සිට සමාජවාදය දක්වා ප්‍රතිසංස්කරණවාදී පියවර මගින් පරිණාම වීමේ හැකියාවක් තිබෙන බවත් කියති. ඔවුන්ගේ මතය අනුව සමකාලීන ධනපති ක්‍රමය, මාක්ස් විසින් ''ප්‍රාග්ධනය'' මගින් විස්තර කරන ලද ධනවාදයට වඩා වෙනස්ය.

එය දැන් සූරාකන්නන් හා සූරාකනුලබන්නන් නැති ''ජනතා ධනවාදයක්'' බව ඔවුහු කියති. ධනපති රජයද වෙනස්වී තිබේලු. එහි පංති ස්වාභාවය අහෝසි වී ඇති අතර, එය දැනට පවතින දේශපාලන ක්‍රමයේ රාමුව තුළ ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමෙන්, සමාජවාදය ඇති කිරීමෙහි සමත් ශුභ සාධක රාජ්‍යයක් වන බවත් කියනු ලැබේ.

සමාජවාදී විප්ලවයක අවශ්‍යතාවය ප්‍රතික්ෂේප කරන ප්‍රතිසංස්කරණ-වාදීන්ගේ මතයෙහි සමකාලීන සංශෝධනවාදීන්ද එල්බ සිටිති. සමකාලීන ධනවාදය සමාජවාදය දක්වා පරිවර්තනය වන බව ඔප්පු කරන ප්‍රධාන තර්කය හැටියට ඔවුන් ඉදිරිපත් කරන්නේ, ධනපති රටවල් කිහිපයකම රාජ්‍ය ඒකාධිකාරී ප්‍රාග්ධනයේ වැඩී ඒමය. ධනපති ලෝකයේ රාජ්‍ය-ඒකාධිකාරී ප්‍රවණතාවයේ වැඩී එන නොසන්සුන් තාවය දෙස ඔවුන් බලන්නේ මිනිස් සංහතිය සමාජවාදී යුගයට පා තැබීමේ ප්‍රත්‍යක්ෂ ස්ථිර කිරීමක් හැටියටය.

ධනපති ක්‍රමයේ අඩිතාලම මත පදනම් වන පෞද්ගලික දේපල අයිතිය විනාශ කිරීම ගැන කල්පනා නොකරන ප්‍රතිසංස්කරණවාදීහු, ඔවුන් විසින් වන්දනා මානනයට පත්කර ඇති රාජ–ඒකාධිකාරී ධනපති ක්‍රමය විනාශ වී යනවා දැකීමට අකමැති වෙත්, එය ධනේශ්වර රාජ්‍ය බලය සිය අත්වල සංකේන්ද්‍රණය කර ගන්නවා දැකීමට කැමති වෙත්. විප්ලවයේදී නිර්ධන පංතියේ නායකත්ව කාර්ය භාරය ප්‍රතික්ෂේප කරන ඔවුහු නිර්ධන පංතික රජයක අවශ්‍යතාවයද නොපිළි ගනිති.

පෙර සටහන් කළ පරිදි, අධිරාජ්‍යවාදී තත්වයන් යටතේ 'ජනතා ධනවාදයක්' හෝ, සූරාකන්නන් රහිත ධනපති ක්‍රමයක් හෝ, 'ශුභ සාධක රජයක්' හෝ තිබිය නොහැකි බවට සැක නැත. අධිරාජ්‍යවාදයේ ඇත්තේ අන්ත ප්‍රතිගාමී ස්වභාවයකි. කම්කරු පංතිය සූරාකෑම සියුම් හා උත්සන්න කිරීමෙන්ද, වැඩ කරන ජනතාවගේ ජීවන තත්වය හා ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය බලවත් ලෙස සීමා කිරීමෙන්ද, අවි තරඟයෙන් සහ තවත් යුද්ධයකට සූදනම් වීමෙන්ද අධිරාජ්‍යවාදය එහි අන්ත ප්‍රතිගාමී ස්වරූපයක් හෙළි කරයි. මේ සියල්ල නිසා කම්කරු හා ධනපති පංති අතර ඇති ප්‍රතිවිරෝධීතාවය තවත් ගැඹුරු වීම නොවැළැක්විය හැකිය. පංති අරගල වඩාත් තියුණු වීමෙන්ද, අධිරාජ්‍යවාදයට විරුද්ධව වඩාත් පුළුල් ජනතා ව්‍යාපාර ගෙනයාමෙන්ද, ජනතාවගේ ජීවන තත්වය වැඩි දියුණු කර ගැනීම සඳහාත්, සාමය සහ ප්‍රජාතන්ත්‍රවාදය සඳහාත් ජනතාව ගෙන යන පුළුල් ව්‍යාපාරය මගින්ද එම ප්‍රතිවිරෝධීතාවය ප්‍රකාශිත වේ. ස්වාභාවික වශයෙන් මෙම අරගලය

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

යොමුවන්නේ සමාජවාදී විප්ලවය දෙසටය; එයින් ධනේශ්වර ක්‍රමය විනාශ වී සමාජවාදය විජයග්‍රහණය කරනු ඇත.

අධිරාජ්‍යවාදී යුගයේදී සමාජවාදී විප්ලවය නොවැළැක්විය හැකිය. නවීන නිෂ්පාදන බලවේගවලටද මිනිස් සංහතියේ ප්‍රගතියටද අවහිර කරන බලගතු බාධකය වන ධනපති නිෂ්පාදන සම්බන්ධකම් ඉවත්කර, ඓතිහාසික සංවර්ධනයේ ඉතාම හදිසි අවශ්‍යතාවයන් පිරිමසාලිය හැක්කේ නිර්ධන පංතික විප්ලවයට පමණකි. අධිරාජ්‍යවාදය තවමත් සෑහෙන තරම් ශක්තිමත් වුවද, අධි ලාභ ලබා ගැනීම නිසා කම්කරු පංතියේ ඉහළ කොටසට අල්ලස් දීමට තවමත් අධිරාජ්‍යවාදයට පුළුවන් වුවද, ධනවාදී දෘෂ්ටිවාදීන්ට සහ සංශෝධනවාදී ඔවුන්ගේ හවුල් කරුවන්ට වැඩ කරන ජනතාවගෙන් කොටසක් තවමත් මුලා කිරීමට පුළුවන් වුවද, ධනවාදය ඓතිහාසික ලෙස විනාශයට මුණ පානු නියතය.

විද්‍යාත්මක කොමියුනිස්ට්වාදයේ නිර්මාතෘවරයන් වන කාල් මාක්ස් සහ ෆ්‍රෙඩ්රික් එංගල්ස් ධනවාදයේ නොවැළැක්විය හැකි විනාශය සහ සමාජවාදයේ ජයග්‍රහණය ඔප්පු කොට පෙන්වූහ. ධනපති හා නිර්ධන පංති අතර ඇති ප්‍රතිවිරුද්ධතාවය හෙළිකළ ඔවුහු, එම ප්‍රතිවිරුද්ධතාවයේ ගැඹුරුවීම විසින් අනිවාර්යයෙන්ම සමාජවාදී විප්ලවයක් ඇති කරන බව නිගමනය කළහ.

සමාජවාදී විප්ලවය පිළිබඳව ලෙනින්වාදී න්‍යායය

එහෙත් මාක්ස් හා එංගල්ස් ජීවත් වූයේ ධනවාදය දියුණු වූ, එක්තරා දුරකට සමාන ලෙස වර්ධය වූ අවධියකදී ය. එම තත්වය අනුව, නිර්ධන පංතික විප්ලවය සියලු දියුණු රටවල්වල හෝ ඉන් බහුතර සංඛ්‍යාවක හෝ එක වර ජය ගනු හැකියයි ඔවුහු සිතූහ. මක්නිසාදයත්, එක් රටක සමාජවාදය ඇති කිරීමට දරන ප්‍රයත්නය සියලුම ධනපතීන්ගේ ඒකාබද්ධ ප්‍රයත්නය මගින් විනාශ කර දමනු ලබන හෙයිනි.

19 වැනි සියවසේ අවසානයේදී ධනපති ක්‍රමය සිය අවසාන අවධිය වන අධිරාජ්‍යවාදී ක්‍රමයට පාතැබූ පසු, සමාජවාදී විප්ලවය සඳහා අදාල තත්වය බොහෝ දුරට වෙනස් විය. අධිරාජ්‍යවාදී යුගයට ගැළපෙන පරිදි විප්ලවය පිළිබඳ අලුත් න්‍යාය වී. අයි. ලෙනින් විසින් බිහි කැරිණි.

1905 තරම් ඈත වකවානුවක, ලෙනින්, තම, "ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවය පිළිබඳව සමාජ–ප්‍රජාතන්ත්‍රයේ උපක්‍රම දෙක" යන කෘතියෙන්, ධනපති ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවය සමාජවාදී විප්ලවය දක්වා වැඩීම පිළිබඳ වූ වැදගත් ප්‍රශ්නය ගැන විස්තර විභාග කළේය. නව

ඓතිහාසික තත්වයන් යටතේ ප්‍රධාන වශයෙන් 1905—1907 රුසියානු විප්ලවයේ විශේෂතා ඇතුලුව කම්කරු පංතියේ විප්ලවීය ව්‍යාපාරයේ විශේෂ ලක්ෂණ විශ්ලේෂණය කළ ලෙනින්, අධිරාජ්‍යවාදී යුගයේදී, ධනපති ප්‍රජාතන්ත්‍රික විප්ලවය සාර්ථක වන තුරු අවසානය දක්වා ගෙන යාමට සෘජු උනන්දුවක් දක්වන, නිර්ධන පංතියට පමණක් එම විප්ලවයේ නායකයා විය හැකි බවත්, එය එසේ විය යුතු බවත් නිගමනය කළේය. විප්ලවීය ක්‍රියාදාමය අතරතුර, නිර්ධන පංතිය පළමුව ප්‍රජාතන්ත්‍රික වෙනස් කිරීම් ක්‍රියාත්මක කිරීමෙන් ඉක්බිතිව, ප්‍රජාතන්ත්‍රික විප්ලවයේ සිට, නොපමාවම සමාජවාදී විප්ලවය සපුරාලනු වස් ඉදිරියට යන්නේ යැයි වී. අයි. ලෙනින් පෙන්වා දුන්නේය.

රටවල් කිහිපයක හෝ එක් තනි රටක හෝ සමාජවාදී විප්ලවය ජයගැනීමේ හැකියාවන් තිබෙන බව වී. අයි. ලෙනින් විසින් සොයා ගැනීම විප්ලව පිළිබඳ ඔවුන්ගේ න්‍යායයේ ඉතාම වැදගත් මූලිකාංගය වන්නේය. අධිරාජ්‍යවාදී යුගයේදී ධනපති රටවල වර්ධනය අසමාන ලෙසත්, කඩින් කඩලෙසත් සිදු වෙතැයි යන මූලධර්මය මත පිහිටා ලෙනින් එම නිගමනය කළේය. පෙර නොදියුණු රටක් දියුණු වී ආර්ථික අතින් වර්ධනය වූ රටක් පසුබස්වා ඉදිරියට යයි. බලතුලනය වෙනස් වී ඝට්ටන පැන නගී, ලෝකය නැවත බෙදාගැනීම සඳහා යුද්ධ ඇතිවේ. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ලෝක ධනපති ක්‍රමයේ තත්වය දුර්වල වී, අධිරාජ්‍යවාදී නැමති දම්වැලේ දුර්වල පුරුක බිඳීමේ හැකියාවක් ඇතිවේ. "විවිධ රටවල ධනපති ක්‍රමයේ වර්ධනය ඉමහත් අසමානතාවයකින් යුතුව සිදුවේ" යැයි වී. අයි. ලෙනින් ලියුවේය. "වෙළෙඳ භාණ්ඩ නිපදවීමේ ක්‍රමය යටතේ එය වෙනත් ආකාරයකට සිදුවිය නොහැක. සමාජවාදය එකවර සියලු රටවල ජයගත නොහැකි බව මින් නොබිඳිය හැකිසේ ඔප්පු වෙයි. සමාජවාදය පළමුව එක් රටක හෝ රටවල් කිහිපයක හෝ මුලදී ජය ගනු ඇත. ඉතිරි රටවල් එක්තරා කලක් යන තුරු ධනපති හෝ ප්‍රාග් ධනපති ක්‍රමයේ හෝ පසුවනු ඇත."*

සමාජවාදී විප්ලවය පිළිබඳ ලෙනින්වාදී න්‍යායය අති විශාල ප්‍රායෝගික වැදගත්කමක් දරයි. එය වැඩ කරන ජනතාවගේ විප්ලවවාදී ක්‍රියාරම්භකතාවය මුදවා හරින අතර, සිය ශ්‍රෙෂ්ඨ කාර්යයේ ජයග්‍රහණය පිළිබඳව එක්, එක් රටෙහි කම්කරු පංතියට විශාල විශ්වාසයක් සහ ධනවාදයේ අනිවාර්ය විනාශය හා සමාජවාදයේත්, කොමියුනිස්ට්වාදයේත් ජය ගැන විශ්වාසයක්ද ඇති කරවයි.

* වී. අයි. ලෙනින්. සම්පූර්ණ කෘතීන්. වෙළුම 30, පිටුව 133.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

3. සමකාලීන යුගයේ සමාජවාදී විප්ලවය පිළිබඳව ලෙනින්වාදී න්‍යායයේ ජයග්‍රහණය

සමාජවාදී විප්ලවය පිළිබඳව ලෙනින්වාදී න්‍යායයේ මගපෙන්වීම යටතේ, බොල්ෂෙවික් පක්ෂයේ නායකත්වය ඇතිව, රුසියාවේ කම්කරු පංතිය වැඩ කරන ගොවිජනතාවගේ සහය ලබාගනිමින්, ඉඩම් හිමියන්ගේ හා ධනපතීන්ගේ පාලන බලය විනාශ කොට, දේශපාලන බලය සියතට ගත්තේය. 1917 නොවැම්බර් 17 ද (1917 ඔක්තෝබර් 25 ද) මිනිස් සංහතියේ වර්ධනයේ නව යුගයක් උදා වූ ලෙසද, ධනවාදයේ විනාශ වී යාමේ සහ අලුත් සමාජවාදී සමාජයේ ජයග්‍රහණ යුගයේ ආරම්භය ලෙසද ඉතිහාස ගත විය. එම ඓතිහාසික දිනයේදී වි. අයි. ලෙනින් මෙසේ පැවසීය. ''මෙතැන් සිට රුසියානු ඉතිහාසයේ අලුත් පරිච්ඡේදයක් ආරම්භ විය; මෙම විප්ලවය, තුන්වැනි රුසියානු විප්ලවය, අවසානයේ සමාජවාදයේ ජයග්‍රහණය දක්වා ඉදිරියට යනු ඇත.'' *

ශ්‍රේෂ්ඨ ඔක්තෝබර් විප්ලවය ඇතිවූ දවසේදී ලෙනින්ගේ එම අනාවැකිය සත්‍යයක් බවට පත්විය. එදා සිට අවුරුදු හැටක් ගෙවී ගිය අතර, මාක්ස්-ලෙනින්වාදී අදහස්ද නිර්ධන පංතික ජාත්‍යන්තරවාදයද මැනවින් තහවුරු විය. සිය පැවැත්ම නිසාම සූරාකෑම සහ සෑම සමාජීය පීඩනයක්ම නිෂ්ප්‍රභ කරන සැබෑ සමාජවාදී සමාජයක් පළමුවැනි වරට මිනිස් සංහතියට ලැබිණ. වර්ධනය වූ සමාජවාදී සමාජයක් ඉදි කිරීම, සෝවියට් සංගමයේ කොමියුනිස්ට්වාදය ඉදි කිරීමේ කාල පරිච්ඡේදය ආරම්භ වීම පසු ගිය කාලය තුළ සෝවියට් සමාජ සංවර්ධනයේ ප්‍රධාන ප්‍රතිඵලයක් විය.

ශ්‍රේෂ්ඨ ඔක්තෝබර් සමාජවාදී විප්ලවය ලෝක විප්ලවවාදී ව්‍යාපාරයට බලසම්පන්න දිරියක් දුන්නේය. ධනපති ක්‍රමය ගරාවැටීමේ සහ ධනපති ක්‍රමයේ පොදු අර්බුදයේ ක්‍රියාදාමය ඉන් ආරම්භ විය. මිනිස් සංහතිය ධනවාදයේ සිට සමාජවාදය දක්වා පරිවර්තනය වීමේ යුගය ඉන් පටන් ගැනිණි.

දෙවන ලෝක මහා යුද්ධයෙන් ඉක්බිතිව මධ්‍යම හා අග්නිදිග යුරෝපයේද, ආසියාවේද රටවල් කිහිපයක් ලෝක ධනපති ක්‍රමයෙන් වෙන්විය. ධනපති ක්‍රමය ලෝකයේ එකම ලෝක ව්‍යාප්ත සමාජ–ආර්ථික ක්‍රමය ලෙස පැවතීම ඉන් කෙලවර විය. අද ලෝකයේ ක්‍රම දෙකකි. එකක් මරණාසන්න ධනපති ක්‍රමයයි, අනික යෞවන, වර්ධනය වන සමාජවාදයයි.

---

* වි. අයි. ලෙනින්. සම්පූර්ණ කෘතීන්. වෙළුම 26, පිටුව 208.

සෝවියට් සංගමයේ වැඩ පිළිවෙළින් පෙන්වා දෙන පරිදි, ජගත් සමාජවාදී රාෂ්ට්‍ර පද්ධතිය සමාජවාදී සහ කොමියුනිස්ට්වාදී මග

ජගත් සමාජවාදී රාෂ්ට්‍ර පද්ධතිය

ඔස්සේ ගමන් කරන්නා වූ, උවමනාවන්ගේ සහ පරමාර්ථවල ඓකියතාවයකින් සහ ජාත්‍යන්තර සමාජවාදී සමගියේ දෘඪ බැම්මකින් එකට බැදී සිටින නිදහස් ස්වෛරී ජනතාවන්ගේ සමාජීය, ආර්ථික හා දේශපාලන ප්‍රජාවකි. ජගත් සමාජවාදී රාෂ්ට්‍ර පද්ධතියට යුරෝපයේ, ආසියාවේ සහ ලතින් ඇමෙරිකාවේ රටවල් ඇතුලත් ඉතා විශාල භූමි භාගයක් අයත්ය. සමාජවාදී රටවල ආර්ථික බලමහිමය අතිවිශාලය. ලෝකයේ කර්මාන්ත භාණ්ඩ නිෂ්පාදනයෙන් සියට 40 ක් සමාජවාදී රටවලට අයත්ය.

ජගත් සමාජවාදී රාෂ්ට්‍ර පද්ධතිය ගුණාත්මක වශයෙන් අළුත් වර්ගයක ජාත්‍යන්තර ආර්ථික සහ දේශපාලන සම්බන්ධකම් විශේෂයක් නියෝජනය කරයි. එකම මාක්ස් ලෙනින්වාදී දෘෂ්ටියක් හා ආර්ථික හා දේශපාලනමය උවමනාවන්ගේ ඒකීය ස්වාභාවය පදනම් කරගෙන එම සම්බන්ධකම් හැඩ ගැසී තිබේ. සමාජවාදී ක්‍රමයේ ආර්ථික පදනම සකස් වී ඇත්තේ නිෂ්පාදන මාධ්‍යයන් සමාජය සතුවීමෙනි. එහි දේශපාලන ක්‍රමය කම්කරු පංතියේ නායකත්වයෙන් යුත් ජනතා පාලනයය. මාක්ස්-ලෙනින්වාදය එහි දෘෂ්ටිමය පදනම වන්නේය. සමාජවාදී සියලු රටවල එකම පරමාර්ථය සමාජවාදය හා කොමියුනිස්ට්වාදය ගොඩනැගීමය.

ලොකු හා කුඩා විශේෂයක් නොමැතිව රජයන් අතර සමානතාවය, අන්‍යොන්‍ය දේශීය කටයුතුවලට අත නොදැමීම, ජාතික ස්වෛරී භාවයට හා භෞමික ඒකස්ථ භාවයට ගරු කිරීම, සහෝදරාත්මක ආර්ථික අන්‍යොන්‍යාධාරදීම, ආර්ථික දේශපාලන හා සංස්කෘතික ක්ෂේත්‍රවල කිට්ටු සහයෝගිතාවයක් ඇතිව කටයුතු කිරීම යන ප්‍රතිපත්ති සමාජවාදී රටවල් අතර ඇති සම්බන්ධ කම්වල ප්‍රධාන මූලධර්මයන් වෙති.

සමාජවාදී රටවල් අතර සහයෝගිතාවය හා අන්‍යොන්‍ය ආධාරය ක්‍රියාත්මක කරන ආකාර අතිශයින්ම විවිධාකාරය. සමාජවාදී ආර්ථික ඒකීකරණය තුළින්ද, ජනතා ආර්ථික සැළැස්මයන් එකඟතාවයට පත්කිරීම මගින්ද, නිෂ්පාදනයේ විශේෂඥතා වර්ධනය හා ඒකාබද්ධ කරණය මගින්ද, හැම අංශයකම විද්‍යා–තාක්ෂණික සහයෝගිතාවය ආදිය මගින්ද, සමාජවාදී රටවල් සිය ආර්ථික ක්ෂේත්‍රයේ එම විවිධත්වය ප්‍රකාශ කරයි. අධිරාජ්‍යවාදී ප්‍රතිගාමීත්වය විරුද්ධවත්, සාමය සඳහාත් සමාජවාදය සහ සමාජ ප්‍රගතිය සඳහාත්

https://liberationbase.wordpress.com

එක්ව සටන් කිරීම දේශපාලන ක්ෂේත්‍රයේ සහයෝගයේ හා අන්‍යෝන්‍ය ආධාරයේ ආකාරය වන්නේය. සමාජවාදී රටවල සංස්කෘතිය අන්‍යෝන්‍ය වශයෙන් මහත් සේ පෝෂණයවන පරිදි එම රටවල් අතරවන වඩාත් පුළුල් හා විවිධාකාර සංස්කෘතික සහයෝගතාවයෙන් එම අංශයේ බලපවත්නා එම ආකාරයන් පිළිබිඹු වන්නේය.

සමාජවාදී රටවල් අතර අලුත් අන්‍යෝන්‍ය සම්බන්ධකම්, සහයෝගීතාවය ඇතිවීම සෑහෙන සංකීර්න ක්‍රියාදමයකි. මෙහි අමාරුකම් හා නොවිසඳලද ප්‍රශ්නද ඇත්තේය. මෙයට හේතුව සමාජවාදී රටවල් අතර ආර්ථික හා සංස්කෘතික දියුණුවේද, ඓතිහාසික අතීතයේද, සම්ප්‍රදයයන් හා ජනතා සිරිත්වලද විවිධ මට්ටම් සහ වෙනස්කම් තිබීමය. ඒ පමණක් නොව, ජනතාව සමීප කරවීමේ ක්‍රියාදමයේදී අතීතයේ නටබුන්, විශේෂයෙන් ධනපති ජාතිවාදයේ නටබුන් ඉවතට දැමීමට සිදුවේ. සමාජවාදයේ ශක්තිය වැඩි කරන හා අධිරාජ්‍යවාදයේ ප්‍රතිගාමී බලවේගයන්ට එදිරිව සාර්ථක ලෙස නැගී සිටීමට ආධාරවන සියලු සමාජවාදී රටවල සමගිය හා එකමුතු බව පිළිබඳ අවශ්‍යතාවය ඉන් පැනනගී. මාක්ස්-ලෙනින්වාදී ප්‍රතිපත්ති මූලික පදනම මත පිහිටා සමාජවාදී රාෂ්ට්‍ර පද්ධතියේ සමාගිය හා එකමුතු බව ශක්තිමත් කිරීමටද, එහි බලය හා බලපෑම වැඩි කිරීමටද, ආර්ථික, විද්‍යා–තාක්ෂණික සහයෝගිතාවය සහ සංස්කෘතික සම්බන්ධකම් පුළුල් කිරීමටද, සහෝදර සමාජවාදී රටවල ජනතාව සමග මිත්‍රත්වයේ සහ ජාත්‍යන්තර සහයෝගිතාවයේ ජීවය අනුව සෝවියට් ජනතාවට අධ්‍යාපනය හා ශික්ෂණය ලබාදීමටද සෝවියට් කොමියුනිස්ට් පක්ෂය බලවත් අධිෂ්ඨානයකින් කටයුතු කරයි.

ලෝක සමාජවාදී රාෂ්ට්‍ර පද්ධතිය ජගත් සංවර්ධනයේ තීරණාත්මක සාධකය බවට පරිවර්තනය වීම

විවිධ සමාජ ක්‍රමවල සට්ටනත්, එම අරගල අවසානයේදී වඩාත් ප්‍රගතිශීලී බලවේගයන්ගේ ජයග්‍රහණයෙන් ඒවා අවසානවීමත් ඉතිහාසයේ නොයෙක් වර දැක තිබේ. අප යුගයේදී එකිනෙකට ප්‍රතිවිරුද්ධ ක්‍රම දෙකක් — සමාජවාදය හා ධනවාදය — අතර ඇති අරගලය සමාජවාදී කඳවුරේ සම්පූර්ණ ජයෙන් අවසාන වන බවට සැක නැත. සමාජ සංවර්ධනයේ විද්‍යාත්මක නියාම, ජීවිතයේ සත්‍ය කරුණු මත එම නිගමනය කර තිබේ. සෝවියට් සංගමයේ සමාජවාදය පිහිටා වූ ශ්‍රේෂ්ඨ ඔක්තෝබර් විප්ලවයේ ජයග්‍රහණයත්, ජගත් සමාජවාදී රාෂ්ට්‍ර පද්ධතිය බිහිවී වර්ධනය වීමත් වැනි සමස්ත ලෝක ඓතිහාසික වැදගත් කමක් ඇති සමාජවාදයේ ජීවමය ශක්තිය ගැන සාක්ෂි නොකියතිද? එහෙත් ඒ අතරම ධනවාදය

පොදු අර්බුදයේ අළුත් අවධියකට එළඹීමද, රටවල් කීපයක්ම ධනපති ක්‍රමයෙන් ඈත්වීමද, අධිරාජ්‍යවාදයේ යටත් විජිත ක්‍රමය විනාශ වී යාමද ධනපති ක්‍රමයේ විනාශය නොවැළැක්විය හැකි බව කියන ස්ථිර සාක්ෂි වන්නේය.

සමාජවාදී ලෝකය පුළුල් වන අතර ධනපති ලෝකය පටු වෙමින් පවතී. ධනවාදී ක්‍රමය වෙනුවට ලෝකයේ හැම තැනම සමාජවාදී ක්‍රමය ඇතිවන්නේය. අප යුගයේ ප්‍රධාන හරය මිනිස් සංහතිය ධනපති ක්‍රමයේ සිට සමාජවාදය දක්වා පරිවර්තනය වීමය. සෝවියට් සංගමයේ කොමියුනිස්ට් පක්ෂයේ වැඩ පිළිවෙළින් මෙසේ කියැවෙයි. "ධනපති ක්‍රමයේ සිට සමාජවාදය දක්වා පරිවර්තනය වන ප්‍රධාන හරය සහිත සමකාලීන යුගය එකිනෙකට ප්‍රතිවිරුද්ධ සමාජක්‍රම ඇති රටවල් අතර අරගලයේ යුගයකි, සමාජවාදී සහ ජාතික විමුක්ති විප්ලවයන්ගේ යුගයකි, අධිරාජ්‍යවාදයේ විනාශයේ සහ යටත් විජිතවාදයේ ගරාවැටීමේ යුගයකි, සියලු රටවල ජනතාව සමාජවාදය කරා එළඹීමද, සමස්ත ලෝක පරිමාණයක් මත සමාජවාදී සහ කොමියුනිස්ට්වාදී ජයග්‍රහණයේ යුගයකි. සමකාලීන යුගයේ කේන්ද්‍රස්ථානයේ ජාත්‍යන්තර කම්කරු පංති ව්‍යාපාරය සහ එහි ප්‍රධාන අතිජාත පුත්‍රයා වන සමාජවාදී රාෂ්ට්‍ර පද්ධතියද වන්නේය."*

සමාජවාදී රාෂ්ට්‍ර පද්ධතිය, සමාජවාදී බලවේගවල පමණක් නොව, අප පෘතුවියේ සියලු ප්‍රගතිශීලී බලවේගවලද කේන්ද්‍රස්ථානය බවට පත්වී තිබෙන බව අප යුගයේ මිනිස් සංහතියේ වර්ධනය විසින් ප්‍රත්‍යක්ෂ ලෙස ඔප්පු කොට ඇත. මිනිස් සංහතියේ ප්‍රගතිශීලී ඉදිරිගමනේදී ප්‍රදීපයක් ලෙස පෙනී සිටින හා ජගත් සංවර්ධනය මත අති විශාල විප්ලවවාදී බලපෑමක් ඇති කරන සමාජවාදී රාෂ්ට්‍ර පද්ධතිය මාක්ස්–ලෙනින්වාදී අමරණීය දෘෂ්ටිය ගොනු කරන්නාවූද, අධිරාජ්‍යවාදයට විරුද්ධව කරන සටනේදී ප්‍රධාන බර උසුලන්නාවූද, ලෝක ඉතිහාසයේ ඉරණම සඳහා ප්‍රධාන වගකීමක් දරන්නාවූද බලසම්පන්න ද්‍රව්‍යමය ශක්තිය වනනේය.

සමාජවාදී රාෂ්ට්‍ර පද්ධතිය ජගත් සංවර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපාන්නේ සිය ආර්ථික ඉදි කිරීම් මගිනි. මෙම රටවල ආර්ථික සංවර්ධනයේ විශාල වේගය විසින් ලෝක කර්මාන්ත හා කෘෂිකාර්මික නිෂ්පාදනයේ සමාජවාදී රාෂ්ට්‍ර පද්ධතියේ බලය වැඩි කරවයි. ඉදිකිරීම්වල සාර්ථකත්වයද, මේ සමාජවාදී රටවල ආර්ථික සංවර්ධනයේ සහ දේශපාලන බලමහිමයේද ප්‍රමාණය වැඩිවන තරමට,

* "සෝවියට් සංගමයේ කොමියුනිස්ට් පක්ෂයේ වැඩ පිළිවෙළ". පිටු 5–6.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

විශේෂයෙන් සාමය හා යුද්ධය පිළිබඳ ප්‍රශ්න ඇතුළු වැදගත් ජාත්‍යන්තර ප්‍රශ්න විසඳීමේදී සමාජවාදී රාෂ්ට්‍ර පද්ධතියේ ක්‍රියා කලාපයද වැඩිවේ. සමාජවාදයේ සහ සාමයේ යෝධමය බලවේගයන්ට, අධිරාජ්‍යවාදීන්ගේ ප්‍රතිගාමිත්වය හෙළිදරව් කිරීමට පමණක් නොව, ඔවුන්ගේ ප්‍රතිගාමී ක්‍රියාවන් නිතර පාහේ තීරණාත්මක ලෙස මැඩ පැවැත්වීමටද පුලුවන්කම ලැබී තිබේ.

සමාජවාදී නොවන රටවල ජනතාවගේ සටන්වලට වැඩි වැඩියෙන් අංග සම්පූර්ණ ආධාරදීමට සමාජවාදී රාෂ්ට්‍ර පද්ධතියට හැකි වීම, සමකාලීන ඓතිහාසික වර්ධනයේ අති විශාල වැදගත්කමක් ගෙනදෙයි. සිය ආදර්ශයේ බලය මගින් සමාජවාදී රාෂ්ට්‍ර පද්ධතිය ධනපති රටවල වැඩ කරන ජනතාවගේ සිත්සතන් විප්ලවවාදී කරවයි, ධනපති ක්‍රමයට විරුද්ධවද, ලෝක සාමය, ජාතික ප්‍රගතිය, ප්‍රජාතන්ත්‍රවාදයේ සහ සමාජවාදයේ ජයග්‍රහණය සඳහාද ගෙන යන සටනේදී ඔවුනට ආස්වාදයක් ලබා දෙයි. විප්ලවයක් සඳහා නැඟී සිටින ජනතාවට, ලෝක ප්‍රතිගාමිත්වය ප්‍රතිවිප්ලවය පිටරට පැටවීමට දරන ප්‍රයත්නයට විරුද්ධව කරන සටනේදී සමාජවාදී රාෂ්ට්‍ර පද්ධතියේ ආධාර ලබාගැනීමට හැකියාවක් දැන් ඇතිවී තිබේ. නව සමාජයක් ගොඩනැගීමේදී ජනතාවට පෙර මෙන්ම දැනුදු සමාජවාදී රටවල සහයෝගය ලබගත හැකිය.

සමාජවාදී රටවල් යටත් විජිතවාදයේ පරම සතුරන් වන අතර ජනතාවගේ ජාතික ස්වාධීනත්වයේ සහ ජාතික සමානතාවයේ මිතුරන්ද වෙති. යටත් විජිත අධිපත්‍යයට විරුද්ධව සටන් කරමින්ද, ස්වාධීනත්වය සඳහා ජනතාව ගෙනයන සටන් අරගලවලට හැම අතින්ම ආධාර දෙමින්ද ක්‍රියා කරන සමාජවාදී රාෂ්ට්‍ර පද්ධතිය, ජාතික විමුක්ති ව්‍යාපාරයේ නැගීම සහ අධිරාජ්‍යවාදී යටත් විජිතවාදයේ ගරාවැටීම පිළිබිඹු කරන බලගතු සාධක වන්නේය.

ලෝක සමාජවාදී සහ ධනපති ක්‍රම දෙක අතර ඇති ප්‍රතිවිරුද්ධතාවය විසඳීමේදී විශේෂ ආකාරය විවිධ සමාජක්‍රම ඇති රජයන් අතර සාමකාමී සහපැවැත්මය. සාමකාමී සහපැවැත්ම ප්‍රතිපත්ති හා මූලධර්ම ඉදිරිපත් කොට තහවුරු කරනු ලද්දේ වී. අයි. ලෙනින් විසිනි. ඉක්මනින්ම හෝ පමාවී හෝ ලෝකය පුරාම සමාජවාදය ජය ගන්නා බව ලෙනින් ස්ථිර ලෙසම දැන සිටියේය. එසේවුවද එම ජයග්‍රහණය ලෝකය පුරා එකවර ලබාගත නොහැකි බව ඔහු උගැන්වීය. ආර්ථික තත්වය, පංති සටනේ තීව්‍රතාවය,

> එකිනෙකට ප්‍රතිවිරුද්ධ ක්‍රම දෙකක් අතර ඇති ප්‍රතිවිරුද්ධතාවය විසඳීමේ ආකාරය—සාමකාමී සහපැවැත්මය

නිර්ධන පංතිය සහ ධනපති පංතිය අතර ඇති බලතුලනය සහ වෙනත් තත්වයන් අනුව, සමහර රටවල් තවත් සමහර රටවලට පෙර සමාජවාදය කරා පැමිණෙනු ඇත. මේ තත්වය සැලකිල්ලට ගත් ලෙනින් ඉතිහාසයේ කිසියම් කාලයක් තුළදී සමාජවාදී රටවල් සමග ධනවාදී රටවල්ද පවතිනු ඇතැයිද, සමාජවාදී සහ ධනපති රටවල සහපැවැත්ම නොවැළැක්විය හැකියයිද නිගමනය කළේය. ලෙනින් සාමකාමී සහපැවැත්මට බලවත් ලෙස පක්ෂ විය. සෝවියට් සංගමයේ කොමියුනිස්ට් පක්ෂය හා සෝවියට් ආණ්ඩුව සිය විදේශීය ප්‍රතිපත්තියේ මුල් ගල කොට ගත්තේ ලෙනින්වාදී මූලධර්මයයි. සෝවියට් සංගමයේ කොමියුනිස්ට් පක්ෂයේ සහ සෝවියට් ආණ්ඩුවේ විදේශීය ප්‍රතිපත්තියේ ප්‍රධාන අරමුණ වූ කලී සෝවියට් සංගමයේ කොමියුනිස්ට් ඉදිකිරීම සහ සමාජවාදී රාෂ්ට්‍ර පද්ධතියේ වර්ධනය සඳහා සුදුසු තත්වයන් ඇතිකිරීමත්, විනාශකාරී අළුත් ලෝක යුද්ධයකින් මිනිස් සංහතිය බේරා ගැනීම සඳහා සියළුම සාමකාමී ජනතාවන් සමග එකතුවී ක්‍රියා කිරීමත්ය.

අතිශයින්ම බියජනක විනාශකාරී අවි තිබීම සහ ලෝකයේ ඕනෑම පෙදෙසකට ඒවා යැවීමට මාධ්‍යයන් ඇති සමකාලීන තත්වයන් යටතේ, ලෝක යුද්ධයක් නිසා ඉමහත් විනාශයක් සහ මහා මිනිස් ඝාතනයක් ඇති විය හැකි බැවින්, යුද්ධය හා සාමය පිළිබඳ ප්‍රශ්නය අතිශයින්ම වැදගත් සමකාලීන ප්‍රශ්නය බවට පත්වී ඇත. යුද්ධය හා සාමය පිළිබඳ ප්‍රශ්නය කෝටි සංඛ්‍යාත ජනතාවගේ ජීවිතය හා මරණය පිළිබඳවද, එහෙම පිටින්ම රටවල් හා ආණ්ඩුවල පැවැත්ම පිළිබඳවද ප්‍රශ්නයක් බවට පත්වී ඇත. යුද්ධයට විරුද්ධවත්, ඥනාත්විත පදනමක් මත සාමකාමී සහජීවන ප්‍රතිපත්තියක් සඳහා සෝවියට් ජනතාව සටන් කරන්නේ ඒ නිසාය.

රජයන් අතර ඇතිවන ජාත්‍යන්තර ප්‍රශ්න නිරාකරණය කිරීම සඳහා යුද්ධය මාධ්‍යයක් ලෙස යෙදවීම ප්‍රතික්ෂේප කිරීමත්; ඒවා සාකච්ඡා මගින් විසඳා ගැනීමත්, රජයන් අතර සමාන අයිතියත්, අන්‍යොන්‍ය අවබෝධය හා විශ්වාසයත් එකිනෙකාගේ උවමනාවන් සැලකිල්ලට ගැනීමත්, අන්‍යොන්‍ය අභ්‍යන්තර කටයුතුවලට අත නොදැමීමත්, තමන්ගේ රටවල් තුළ සියලු ප්‍රශ්න තමන්ම විසින් විසඳලීමේ පූර්ණ නිදහස සෑම රටකටම තිබෙන බව පිළි ගැනීමත්; සියලු රටවල ස්වෛරීභාවය සහ භෞමික එකස්ථභාවය සම්පූර්ණයෙන්ම පිළිගැනීමත්; සම්පූර්ණ සම අයිතිය සහ අන්‍යොන්‍ය යහපත පදනම් කරගෙන ආර්ථික හා සංස්කෘතික සහයෝගිතාවය වර්ධනය කිරීමත් යන මේ කරුණු සාර්ථක පදනමක් මත සහපැවැත්ම

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

සඳහා, සාමකාමී සහපැවැත්ම සඳහා අවශ්‍ය වේ. මේ උදර කාර්යයන් සපුරාලීම සඳහා සෝවියට් සංගමයේ කොමියුනිස්ට් පක්ෂයත් අනිකුත් මාක්ස්වාදී පක්ෂත් මහත් පරිශ්‍රමයක් දරයි.

සෝවියට් සංගමයේ කොමියුනිස්ට් පක්ෂයේත්, අනිකුත් සහෝදර කොමියුනිස්ට් පක්ෂවලත් ලෝකයේ සාමකාමී බලවේගයන්ගේත් පරිශ්‍රමයේ ප්‍රතිඵලයක් වශයෙන්, නොසන්සුන්තාවය සංහිදියාවක් බවට පරිවර්තන වීමේද සිසිල් යුද්ධයේ සිට විවිධ සමාජක්‍රම ඇති රටවල් අතර සාමකාමී සහපැවැත්ම දක්වා වෙනස්වීමේද ප්‍රවණතාවයන් වඩාත් පැහැදිලිව දක්නට තිබේ. සංහිදියාවේ සිට පසුබෑමක් ඇති නොවීම සඳහාද දේශපාලනමය සංහිදියාව යුද්ධමය සංහිදියාවක් දක්වා වැඩීම සඳහාද, සංහිදියාවට ස්ථිර ද්‍රව්‍යමය පදනමක් ලබාදීම සඳහාද ක්‍රියා කිරීමට සෝවියට් සංගමය දැඩි අධිෂ්ඨානයකින් ක්‍රියා කරයි.

සාමය හා ජාත්‍යන්තර සහයෝගතාවය සඳහාද, ජනතාවගේ ස්වාධීනත්වය හා නිදහස සඳහාද තව දුරටත් සටන් කිරීමේ වැඩ පිළිවෙළක් පක්ෂයේ 25 වැනි සම්මේලනය විසින් සම්මත කිරීම එයට කදිම සාක්ෂියකි. පක්ෂයේ 24 වැනි සම්මේලනය සම්මත කරගත් සාම වැඩ පිළිවෙළට අමතරව, (නිරායුධකරණය, උපක්‍රමීය අවි නිපදවීම අඩුකිරීම හා සීමා කිරීම, මධ්‍යම යුරෝපයේ යුද හමුද සංඛ්‍යාවෙන් අඩුකිරීම ආදිය) සෝවියට් සංගමයේ කොමියුනිස්ට් පක්ෂයේ 25 සම්මේලනය අළුත් වැදගත් පියවර ගැනීමට බලාපොරොත්තු වෙයි. ජාත්‍යන්තර සම්බන්ධකම්වලදී බලය පාවිච්චි නොකිරීමේ ලෝක ගිවිසුමක් ඇතිකර ගැනීමටද, ආසියාවේ රජයන්ගේ සාමූහික පරිශ්‍රමය සහිතව ආසියාවේ සාමය ආරක්ෂා කිරීමට ද කටයුතු කිරීම ඒවා අතර වේ. මේ පියවර ගැන විශාල උනන්දුවක් දක්වන අප පෘථිවියේ ජනතාව ඒවාට ආධාර කරති.

දැන් මේ වැඩ පිළිවෙළ ඉතා සාර්ථක ලෙස ක්‍රියාවට යෙදෙයි. ජාත්‍යන්තර තත්වයේ හිතකර වෙනස්වීමක් ඇතිවෙමින් පවතී, විවිධ ක්‍රම ඇති රාජ්‍යයන් සාමකාමී සහපැවැත්මේ ප්‍රතිපත්තිය වඩාත් පුළුල් ලෙස පිළිගැනී ඇත, සමාජවාදී හා ධනවාදී රටවල් අතර අන්‍යෝන්‍ය වාසිදායක ආර්ථික සම්බන්ධකම් පුළුල් වී ශක්තිමත් වෙමින් පවතී, ලෝක සාමය, ජාත්‍යන්තර සුරක්ෂිතතාවය හා සංහිදියාව තහවුරු කිරීම සඳහා සංයුක්ත, ස්ථිර පියවරයන් ගැනීමට හැකිවන හිතකර තත්වයන් ඇති වන්නට පටන් ගෙන තිබේ.

මාක්ස්වාදී පක්ෂ ස්ථිර ලෙසම සාමකාමී සහජීවන ප්‍රතිපත්තිය

ක්‍රියාවට නගමින් ස්ථිර ලෝක සාමයක් ඇතිකිරීමට සමත් බලසම්පන්න බලවේගයන් වැඩෙමින් පවතින බව පිළිගනී. ලෝකයේ සියලු රටවල සාමකාමීන්ගේ සිත්සතන් දිනාගත් මධ්‍යස්ථානය වන ජගත් සමාජවාදී රාෂ්ට්‍ර පද්ධතිය බිහිවී ස්ථිර ලෙසම වැඩෙමින් පවතී. සමාජවාදී රටවල් සමග යටත් විජිත පාලනයෙන් මිදුණු, සමාජවාදී නොවන සාමකාමී රජයන් කිහිපයක් ලෝකයේ විශාල පෙදෙසක පැතිරී පවතී. යුද්ධය හා සාමය පිළිබඳ ප්‍රශ්නය තීරණය කිරීම ක්‍රියාශීලී ලෙස තමන් අතට ගන්නා සාමකාමී හටයින්ගේ යුද්ධ විරෝධී බහුජන ව්‍යාපාරය විශාල සාධකයක් බවට පත්වී ඇත.

මෙම කාලයේදී අළුත් ලෝක යුද්ධයක් හට ගැනීම, මේ බලසම්පන්න සාමකාමී බලවේගයන් නිසා වළක්වාලිය හැකි බව සෝවියට් සංගමයේ කොමියුනිස්ට් පක්ෂයත්, අනිකුත් රටවල මාක්ස්වාදී පක්ෂත් නිගමනය කරන්නේ එබැවිනි.

එසේවුවද, සාමකාමී බලවේගයන්ට අලුත් ලෝක යුද්ධයක් ඇතිවීම වැළැක්වීමේ හැකියාවක් තිබුණද, වත්මන් කාලයේ දී යුද්ධ ඇතිවීමේ හැකියාව සම්පූර්ණයෙන්ම අතුරුදහන් වී යැයි කිව නොහැකිය. ධනපති ක්‍රමය පවතින තුරු යුද්ධයක් ඇතිවීමේ හැකියාවද පවතිනු ඇත. ලෝකයේ සදාකාලික සාමය තහවුරු කළ හැක්කේ කොමියුනිස්ට් සමාජයට පමණකි. සමකාලීන තත්වයන් යටතේ සෝවියට් සංගමයත්, අනිකුත් සමාජවාදී රටවලුත්, ලෝකයේ සියලු රටවල අවංක ජනයාත් ලෝක සාමය හා සුරක්ෂිතතාවය සඳහා කරන සටනට විරුද්ධව ඇමෙරිකානු යුද්ධ හමුද ප්‍රධානීන් මුල් කොට ගත්, අධිරාජ්‍යවාදී ආක්‍රමණකාරී බලවේග නැගී සිටී. 'සිසිල් යුද්ධයේ' අධ්‍යාත්මික තත්වය අනුව දිගටම ක්‍රියාකරන මේ බලවේග, හැම ලෙසකින්ම ජාත්‍යන්තර සංහිදියාවට විරුද්ධව නැගී සිටිමින්, සාමය තහවුරු කිරීම සඳහා ජාත්‍යන්තර වශයෙන් ලබා ඇති තත්වයන්ට විරුද්ධව ප්‍රකෝපකාරී ක්‍රියා සහ අවලාද ප්‍රචාරය කරති, යුද්ධ සූදානම වැඩි කිරීම සඳහාත්, ආරාවුල් තීව්‍ර කොට ඒවා විශාල කර පෙන්වීම ආදිය සඳහාත් ක්‍රියා කරති. එබැවින් අධිරාජ්‍යවාදී ප්‍රතිගාමීත්වයන්ගේ ආක්‍රමණකාරී ප්‍රතිපත්තිවලට විරුද්ධව නිරතුරුවම සුපරික්ෂාකාරීව සිටිය යුතුය, සාමකාමී ජනතාව මුලා කිරීම සඳහාත්, ජනතාව අතර අවිශ්වාසය හා සතුරු බව වැපිරීම සඳහාත් ඔවුන් දරන කපටි ප්‍රයත්නවලට විරුද්ධව තීරණාත්මක ලෙස නැගී සිටිය යුතුය.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

සාමකාමී සහජීවනය පංති සටනේ එක් ආකාරයක් වශයෙන්

සමකාලීන සංශෝධනවාදීහු සාමකාමී සහපැවැත්ම පිළිබඳ මූල-ධර්මයේ හරය විකෘති කරති. සමාජවාදී හා ධනපති ක්‍රම අතර ඇති ප්‍රතිවිරුද්ධතා සමහන් වීමත්ද, සමාජවාදී හා ධනපති දෘෂ්ටිය අතර ඇති අරගලය කෙළවර වන බවක්ද සාමකාමී සහපැවැ-ත්මෙන් අදහස් කෙරෙන බව ඔවුන් සලකති.

එහෙත් සැබෑ තත්වය අනුව නම්, සාමකාමී සහපැවැත්ම නිසා සමාජවාදය හා ධනවාදය අතර ඇති ප්‍රතිවිරෝධීතාවයන් සමහන් වීමක් හෝ ඒවා අතර ඇති අරගලය නැවැත්වීමක් හෝ ඇති නොවේ. ''අප කාලයේදී බලවත් වෙමින් පවතින සාමකාමී සහපැවැත්ම සහ ජාත්‍යන්තර සංහිඳියාව රාජ්‍යයන් අතර සම්බන්ධකම්වලදී පමණකි.'' ''එසේ වුවද සංහිඳියාවට කිසි ලෙසකින්වත් පංති සටන පිළිබඳ නියාමයන් වෙනස් කිරීමට හෝ අවලංගු කිරීමට පුළුවන්කමක් නැති අතර සංහිඳියාව එය අවලංගු නොකරයි''* සෝ: සං: කො: පක්ෂයේ ම. කා: සභාව විසින් 25 සම්මේලනයට ඉදිරිපත් කළ වාර්තාවේ එසේ සටහන් වේ. එපමණක් නොව මෑත අවුරුදුවල සිද්ධීන් එයට කදිම සාක්ෂයකි. සාමකාමී සහපැවැත්ම වූකලී එකිනෙකට විරුද්ධ ලෝක සමාජ ක්‍රම දෙකක් අතර ඇති පංති සටනේ විශේෂ ආකාරයකි. සාමකාමී සහපැවැත්ම වූකලී එකිනෙකට ප්‍රතිවිරෝධී ක්‍රම දෙකක් වන සමාජවාදය හා ධනවාදය අතර ජාත්‍යන්තර වේදිකාවේ ඇති සටන් අරගල දිගටම කරගෙන යාමකි. ඒවා ආර්ථික, දේශපාලන හා දෘෂ්ටිමය අරගලයන් මිස කොහෙත්ම යුද්ධමය අරගල නොවේ. එය සාමකාමී මාධ්‍යන් අනුවත්, අවි පාවිච්චි කිරීම හා යුද්ධවලින් තොරවත්, එක් රටක අභ්‍යන්තර තත්වයට තවත් රටක් අත දැමීම් රහිතවත් කෙරෙන සටනකි.

සමාජවාදය හා ධනවාදය අතර ජාත්‍යන්තර පරිමාණයකින් කෙරෙන ආර්ථික තරඟයට පදනම සැපයෙන්නේ සාමකාමී සහපැවැත්මෙනි. ආර්ථික හා සංස්කෘතික වර්ධන පරිමානය හා වේගය සම්බන්ධයනුත්, ජනතාවගේ ද්‍රව්‍යමය සහ සංස්කෘතික අවශ්‍යතාවයන් සපුරාලීම සඳහාත් සමාජවාදය හා ධනවාදය අතර කෙරෙන අපූර්ව අරගලයක් එයින් නියෝජනය කෙරෙයි. තමන්ගේ අවශ්‍යතාවයන් සම්පූර්ණ ලෙස සපුරාලීමට කිනම් සමාජ ක්‍රමයක් සමත්ද යන්න සිය අත්දැකීම්

* ''සෝවියට් සංගමයේ කොමියුනිස්ට් පක්ෂයේ 25 වැනි සම්මේ-ලනයේ ලියවිලි'', පිටුව 33.

අනුව මේ අරගලයේ සිදුවීම් වලින් ජනතාවට ප්‍රත්‍යක්ෂ ලෙස දැන ගැනීමට හැකිවනු ඇත.

තරඟයේ ගමන් මග හා ප්‍රතිඵල විසින්ද, ප්‍රතිපාක්ෂික ක්‍රම දෙක අතර වන තරඟය අනුවද අප යුගයේ ලෝක සංවර්ධනයේ ක්‍රියාදමය නිගමනය කෙරේ. සාමකාමී සහපැවැත්ම විසින් දේශපාලන අරගලයත්, ධනපති පංතියට විරුද්ධව නිර්ධන පංතිය ගෙනයන විප්ලවවාදී අරගලයත්, යටත් විජිතවාදයට හා නව යටත් විජිතවාදයට විරුද්ධව ජාතික ස්වාධීනත්වය සඳහා පැගී සිටින ජනතාව ගෙනයන අරගලයත් ප්‍රතික්ෂේප කරන බවක් කොහෙත්ම අදහස් නොකෙරේ.

එකිනෙකට ප්‍රතිවිරුද්ධ සමාජ ක්‍රම දෙක අතර සාමකාමී සහපැවැත්ම යනුවෙන් අදහස් කෙරෙන්නේ සමාජවාදී හා ධනවාදී දෘෂ්ටි අතර නොසැහෙන දෘෂ්ටිමය අරගලයකි. කම්කරු පංතියේ සහ සියලු වැඩකරන ජනතාවගේ උවමනාවන් ප්‍රකාශ කරන සමාජවාදී දෘෂ්ටිය ධනපති ක්‍රමයට එදිරිව සමාජවාදය හා කොමියුනිස්ට්වාදය සඳහා කරනු ලබන නිර්ධන පංති අරගලයේ ඓතිහාසික අවශ්‍යතාවය ඔප්පු කර පෙන්වයි. එය ධනපති දෘෂ්ටිය සමග සටන ඇවිළී ඇත. ප්‍රතිගාමී අධිරාජ්‍යවාදී බලවේගයන්ගේ අවශ්‍යතාවයන් ප්‍රකාශ කරන ධනවාදී දෘෂ්ටිවාදය අධිරාජ්‍යවාදයේ පැවැත්ම සාධාරණ බව කීමට ප්‍රයත්න දරයි; එය සාමයට, ප්‍රජාතන්ත්‍රවාදයට හා සමාජවාදයට විරුද්ධව කරන සටනේදී අමෝරා ගත් අවියක් ලෙසට උපයෝගී කරගනු ලැබේ. මේ අරමුණ සඳහා ධනවාදීහු හැම මාධ්‍යයකම දෘෂ්ටිමය බලපෑම් පාවිච්චි කරති. මින් ප්‍රධාන මාධ්‍යය කොමියුනිස්ට් විරෝධී භාවය ය. සමාජවාදයට විරුද්ධව ද්වේෂ සහගත බොරු ප්‍රචාර කිරීමද, කොමියුනිස්ට් පක්ෂවල හා මාක්ස්–ලෙනින්වාදයේ ප්‍රතිපත්ති සහ අරමුණු පිළිබඳව අමූලික බොරු ගෙතීමද එහි ප්‍රධාන කාර්යය වී ඇත. ධනවාදී දෘෂ්ටියට විරුද්ධව නිත්‍ය ලෙසත්, අසමාදන ලෙසත් සටන් කිරීම, ධනවාදය සමග ගෙනයන සාමකාමී අරගලයේදී සමාජවාදයේ ජයග්‍රහණය සඳහා ඉටුවිය යුතු අනිවාර්ය කොන්දේසියක් වන්නේය.

සමාජවාදී රාෂ්ට්‍ර පද්ධතියේ පැවැත්ම හා වර්ධනයද ධනවාදී රාෂ්ට්‍ර පද්ධතියට විරුද්ධව ගෙන යන අරගලයද ලෝක විප්ලවවාදී ව්‍යාපාරයේ වර්ධනය සඳහා වඩාත් යහපත් ජාත්‍යන්තර තත්වයක් ඇති කරයි.

ධනපති ක්‍රමයේ පොදු අර්බුදය ගැඹුරු වීමත් සමග එයට ආවේණික සියලු ප්‍රතිවිරුද්ධතාවයන් තීව්‍රවීම නිසා තවතවත් අලුත් රටවල් සමාජවාදය-කරා පරිවර්තනයවීමේ අභ්‍යන්තර තත්වයන්ගේ වඩාත් වාසිදායක භාවය වත්මන් යුගයේ ලක්ෂණයකි.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

සමාජවාදී ලෝකය ශක්තියෙන්, ජීවයෙන් හා සෞඛ්‍යයෙන් පරිපූර්ණව වර්ධනය වෙමින් ඉදිරියටම යන අතර ධනපති ක්‍රමය ඇදවැටීමේ හා බිඳ වැටීමේ ගැඹුරු ක්‍රියාදමයක විලංගුවට හසුවී තිබේ. ධනපති සමාජයේ ආර්ථිකය, දේශීය හා විදේශීය දේශපාලන ප්‍රතිපත්ති හා දෘෂ්ටිය යන හැම ක්ෂේත්‍රයක්ම හසුකරන පොදු අර්බුදයකට ධනපති ක්‍රමය මුණ පා සිටී.

ධනපති ක්‍රමයේ පොදු අර්බුදය ගැඹුරුවීම

ධනපති ක්‍රමයේ පොදු අර්බුදයේ ප්‍රථම අදියරට මුල පුරන ලද්දේ 1917 ඇතිවූ ශ්‍රේෂ්ඨ සමාජවාදී ඔක්තෝබර් විප්ලවය මගිනි. එහි ප්‍රතිඵලයක් වශයෙන් ලෝකයේ පළමුවැනි සමාජවාදී රට — සෝවියට් සංගමය බිහිවිය. එමගින් පෘථිවිය මත ධනපති ක්‍රමය සතුව පැවති තනි අධිපත්‍යය අහෝසි විය.

යුරෝපයේ සහ ආසියාවේ රටවල් කිහිපයක්ම සමාජවාදී විප්ලවය ජය ගැනීමත්, එහි ප්‍රතිඵලයක් වශයෙන් සමාජවාදය එක්රටක සීමාවන්ගෙන් ඔබ්බට ගොස් ලෝක සමාජවාදී රාෂ්ට්‍ර පද්ධතියක් ඇති වීමත් ධනපති ක්‍රමයේ පොදු අර්බුදයේ දෙවන අදියර තුළ සිදුවිය.

ලෝකයේ බලතුලනය හාත්පසින්ම ලෝක සමාජවාදී රාෂ්ට්‍ර පද්ධතියට වාසිවනසේ වෙනස්වීම, ධනපති ක්‍රමයේ පොදු අර්බුදයේ, නව තුන්වන අදියරෙහි වැදගත්ම ස්වාභාව ලක්ෂණය වනනේය. අලුත්, අලුත්, රටවල් ධනපති ක්‍රමයෙන් බිඳී යති. සමාජවාදය සහ සමාජමය ප්‍රගතිය සඳහා සටන් කරන බලවේගයන් ලෝකය පුරාම සීඝ්‍ර ලෙස වැඩිවෙමින් පවතී. සමාජවාදය සමග ගෙනයන සාමකාමී ආර්ථික තරඟයෙන් අධිරාජ්‍යවාදයේ තත්වය එකාන්ත ලෙස දුර්වල වීමට පටන් ගෙන ඇත. ජාතික විමුක්ති ව්‍යාපාරයේ මීත් පෙර නොවූ විරූ නැගීමක් නිසා අධිරාජ්‍යවාදයේ යටත් විජිත ක්‍රමය ගරා හැළිණි.

සමකාලීන ධනපති ක්‍රමය නව තත්වයන් හුරු පුරුදු වී සිටින බව සෝ. සං. කෝ. පක්ෂයේ 24 වැනි සම්මේලනයට ඉදිරිපත් කරන ලද මධ්‍යම කාරක සභාවේ වාර්තාවේ සඳහන් වේ. සමාජවාදයට විරුද්ධව සටන කරන තත්වයන් යටතේ පංති සටන පොදුජන විප්ලවවාදී ව්‍යාපාරයක් දක්වා පරිවර්තන වෙතියි ධනපති රටවල පාලකයෝ බියවෙති. ඒ නිසා ධනපති පංතිය වැඩ කරන ජනතාව සූරාකෑමේ සහ පෑගීමේ ක්‍රම වඩා සැඟවුණු ආකාරයකින් කිරීමට වෑයම් කරති. ජනතාව තම දේශපාලන හා දෘෂ්ටිමය නායකත්වය යටතේ තබාගනු වස් ධනපති පංතිය සමහර අවස්ථාවලදී අර්ධ ප්‍රතිසංස්කරණ පියවර ගනී. "විද්‍යා–තාක්ෂණික ප්‍රගතිය මගින් සිය තත්වය ආරක්ෂා කිරීම සඳහාත්, නිෂ්පාදන වර්ධනය හා වේගය වැඩි

කිරීම සඳහාත් වැඩ කරන ජනතාව සූරාකෑම සහ පෑගීම සඳහාත් ඒකාධිකාරිත්වය ක්‍රියා කරයි.

"අලුත් තත්වය අනුව හැඩ ගැසීමට ඉදිරිපත් වුණද, ධනපති ක්‍රමය ස්ථිර බවක් ඉන් අදහස් නොකෙරේ. ධනපති ක්‍රමයේ පොදු අර්බුදය ගැඹුරු වෙමින් පවතී."*

දැන්, ධනපති ක්‍රමයේ අර්බුදය හැම දෙයක්ම හසුකර ගන්නා ස්වරූපයක් ගෙන තිබෙන බව සෝ. සං. කො. පක්ෂයේ 25 සම්මේලනයට ම. කා. සභාව විසින් ඉදිරිපත් කළ වාර්තාවේ සඳහන් වේ. ධනපති ක්‍රමයේ ආර්ථිකය හා දේශපාලනය ද, එහි දෘෂ්ටිය හා සදාචාරය ද අර්බුදයට හසුවීම ආවේණික ලක්ෂණයකි. මෑත අවුරුදුවල ධනපති ක්‍රමය හසුවී සිටින අර්බුදය එහි තියුණු බව හා ගැඹුර අනුව සමාන කළ හැක්කේ 1930 ගණන් වලදී ඇතිවූ අර්බුදයට පමණකි. ලෝක ධනපති ක්‍රමයේ සියලු මධ්‍යස්ථානයන් එයට හසුවී ඇත. දෙවැනි ලෝක යුද්ධයෙන් ඉක්බිතිව පැනනැගී උසස් ලෙස වර්ධනයවූ රාජ්‍ය-ඒකාධිකාරී ආර්ථිකය අර්බුදයට හසුවී තිබෙන බවකි, මින් අදහස් කරන්නේ. ධනපති රටවල් බහුතර සංඛ්‍යාවක නිෂ්පාදනය විශාල වශයෙන් අඩුවීම සහ විරැකියාව වැඩිවීමත් සමග විදේශීය විනිමය, බලය නිපදවීම, අමුද්‍රව්‍ය පිළිබඳ අර්බුදයක් පැන නැගිණි. නිරන්තරයෙන්ම වැඩිවන යුද්ධ වියදම් නිසා අර්බුදයේදී උද්ධමනය විශේෂ තියුණු බවත් ගෙනදෙයි. පොදු "වෙළඳ පොළ" තුළ සහ නැටෝ සංවිධානය තුළ අන්තර් අධිරාජ්‍යවාදීන්ගේ තරඟ කාරිත්වය සහ භේද උග්‍රවිය. ධනපති ක්‍රමයේ අස්ථිරතාවය වඩාත් පැහැදිලිව පෙනෙන්නට පටන් ගෙන ඇත. අප යුගයේ ධනවාදයට අර්බුදවලින් මිදීමට පුළුවන යන ප්‍රතිසංස්කරණවාදී මිථ්‍යා මත දුරුවිය.

පාලන ආයතන, ධනපති දේශපාලන පක්ෂ පෙළන, සදාචාරයේ මූලික ප්‍රතිමාන සොළවා දමන ධනපති ක්‍රමයේ දෘෂ්ටිමය-දේශපාලනමය අර්බුදය උග්‍රවිය. රාජ්‍ය යන්ත්‍රයේ උසස් ස්ථානවල පවා දූෂණය පැහැදිලිව පෙනෙන්නට පටන් ගෙන ඇත. අධ්‍යාත්මික සදාචාරය පහත බසින අතර අපරාධ වැඩිවී තිබේ.

සමකාලීන ධනපති ක්‍රමයේ පොදු අරගලයේ එක් ලක්ෂණයක් නම් අධිරාජ්‍යවාදයේ දේශීය හා විදේශීය දේශපාලන ප්‍රතිපත්තියේ අර්බුදය උග්‍රවීමය. ධනපති ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රතික්ෂේප කිරීමත්, රටවල් කීපයකම ජාති ද්‍රෝහි පැසිස්ට්වාදී ඒකාධිපති රජයන් ඇතිවීමත්,

* "සෝ. සං. කො. පක්ෂයේ 24 වැනි සම්මේලනයේ ලියවිලි", පිටුව 15.

https://liberationbase.wordpress.com

ජාත්‍යන්තර කටයුතුවලදී අධිරාජ්‍යවාදය සතුව තිබුණු මූලිකත්වය නැතිව යාමත් යන මේවායින් හැම අංශයකම දක්නට ලැබෙන එම අර්බුදය මනාව පිළිබිඹු වේ.

ධනවාදී දෘෂ්ටියද අද ගැඹුරුතම අර්බුදයකට මුණ පා සිටී. එහි ප්‍රධාන අංග ලක්ෂණ නම්, සර්ව අශුභවාදය හා අනාගතය දෙස බිය සහිතව බැලීමද, ගූඪවාදයද, විද්‍යාව මිනිසාගේ නිර්මානශීලී බලවේගයන් හා ශක්‍යතාවයන් ගැන දක්වන අවිශ්වාසයද ප්‍රගතිය ප්‍රතික්ෂේප කිරීම හා කොමියුනිස්ට්වාදයට විරුද්ධව නින්ද අපහස කිරීමද ජනතාව මෙතරම් වෛර කරන වැටුප් වහල් ක්‍රමයට හා පීඩාවට පක්ෂ වීමද, එම අර්බුදයේ ප්‍රධාන අංග ලක්ෂණ වන්නේය. පුළුල් පොදු ජනතාවගේ සිත් ඇදගන්නා අදහස් ඉදිරිපත් කිරීමේ හැකියාව දූන් බොහෝ කලක ධනවාදී දෘෂ්ටියට අහිමිව ඇත. එය ඓතිහාසික වේදිකාවෙන් ඉවත්වී යන පංතියේ දෘෂ්ටියය. ඒ නිසා එය බංකොලොත් ලබනවාට සැක නැත.

ධනපති සමාජයේ නිෂ්පාදනීය බලවේගයන් සහ නිෂ්පාදන සම්බන්ධකම් අතර ප්‍රතිවිරෝධීතාවය අතිශයින්ම තියුණු උග්‍ර තත්වයකට පත් වී ඇත. මහා විද්‍යා–තාක්ෂණික විප්ලවයකට මිනිස් සංහතිය මුණ පා සිටී. එහෙත් ධනවාදී නිෂ්පාදන සම්බන්ධකම් එම විප්ලවයට සෑහෙන තරම් පටුය. ධනවාදය නිෂ්පාදනීය බලවේගයන්ගේ වර්ධනයට අවහිර කරනවා පමණක් නොව, සමාජමය ප්‍රගතියේ වුවමනාවන් සඳහා මිනිස් බුද්ධියේ ජයග්‍රහණයන් පාවිච්චි කිරීමටද බාධාකරයි. එපමණක් නොව ඒවා අතිභයානක යුද්ධ මාධ්‍යයන් බවට පෙරළීමෙන් එම ජයග්‍රහණයෙන් මිනිස් සංහතියට විරුද්ධව පාවිච්චි කිරීමට ඉදිරිපත් වී සිටී. ධනපති නිෂ්පාදන ක්‍රමයේ මෙම මූලික ගැටුම නිසා ධනවාදී සම්බන්ධකම්වල පටු යදම් බිඳ දැමීමේද, මුලු මහත් සමාජයේම අභිවෘද්ධිය සඳහා මිනිසා විසින් බිහි කරන ලද බලසම්පන්න නිෂ්පාදන බලවේගයන් පාවිච්චි කිරීමේද එම බලවේගයන් නිදහස් කිරීමේද කාර්යයන් මිනිස් වර්ගයා හමුවේ තබනු ලැබේ. ධනපති නිෂ්පාදන සම්බන්ධකම් වෙනුවට අලුත් සමාජවාදී නිෂ්පාදන සම්බන්ධකම් ඇති කරන සමාජවාදී විප්ලවයක මාර්ගයෙන් පමණක් එම කාර්යයන් ඉටු කළ හැකි වන්නේ.

අධිරාජ්‍යවාදය විසින් නැති කර ගන්නා ලද ඓතිහාසික මූලිකත්වය යළිත් ලබා ගැනීමට එයට නොහැකිව එය බෙලහීන තත්වයක පවතින බවත්, සමකාලීන ලෝකයේ වර්ධනය ආපසු කැරකැවීමට එයට නොහැකි බවත් 1969 දී මොස්කව්හි පවත්වන ලද කොමියුනිස්ට් හා කම්කරු පක්ෂවල ජාත්‍යන්තර රැස්වීමේ ලියවිල්ලෙන් සඳහන් වේ. මිනිස් සංවර්ධනයේ ප්‍රධාන මාර්ගය ලෝක සමාජවාදී රාෂ්ට්‍ර පද්ධතිය මගින්ද, ජාත්‍යන්තර කම්කරු පංතිය සහ සියලු විප්ලවවාදී බලවේග මගින්ද තීරණය කරයි.

ධනපති ක්‍රමයෙන් තව තවත් රටවල් ඈත්වීම මගින් අනාගතයේදීද සමාජවාදී ලෝකය වර්ධනය වී පුළුල් වනු ඇත.

ප්‍රජාතන්ත්‍රවාදය සඳහා ගෙනයන අරගලය සමාජවාදය සඳහා කරන සටනේ අඛණ්ඩ කොටසකි

විප්ලවීය ක්‍රියාමාර්ගයේදී, සමාජවාදී වෙනස් කිරීම් හා ප්‍රජාතන්ත්‍රවාදී සහ අධිරාජ්‍ය විරෝධී වෙනස් කිරීම් එකිනෙකට වෙළී පවතී. ධනපති–ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවය සමාජවාදී විප්ලවය දක්වා වර්ධනයවීමේ න්‍යායය සංවර්ධනය කරමින් සහ විස්තර කළ වී. අයි. ලෙනින් විවිධාකාර සමාජමය කොටස් හා සම්බන්ධ ප්‍රජාතන්ත්‍රවාදී, අධිරාජ්‍ය විරෝධී ව්‍යාපාරය සමග සම්බන්ධ වී නැති පිරිසුදු විප්ලවය අධිරාජ්‍යවාදී යුගයේදී තිබිය නොහැකි බව පෙන්වා දුන්නේය. එම තත්වයන් යටතේ, පොදු ජනතාවගේ අධිරාජ්‍ය විරෝධී හැඟීම් ඉතා ස්ථිර ලෙස ප්‍රකාශ කරන නිර්ධන පංතිය ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරයට නායකත්වයක දිය යුතුය, එයට සහභාගි වන විවිධ පංති සමගි කොට ධනපති පංතියේ පාලන බලය පෙරළා දමා සමාජවාදයේ ජයග්‍රහණය සඳහා ඒවා මෙහෙයැවිය යුතුය.

රටවල් කීපයක විප්ලවය සාපේක්ෂ වශයෙන් ස්වාධීන අවධි දෙකක්, පසුකර, එනම් පොදු ප්‍රජාතන්ත්‍රවාදී සහ සමාජවාදී අවධි පසුකර යැමේ හැකියාවද අත්තේය. රුසියාවේ විප්ලවය හා වෙනත් සමාජවාදී රටවල් කීපයකම විප්ලව එවැනි මගක් ගත්තේය. රුසියාවේ ශ්‍රේෂ්ඨ ඔක්තෝබර් සමාජවාදී විප්ලවයට පෙර, පෙබරවාරි මාසයේදී ධනපති–ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවය ඇතිවිය. සමාජවාදී රටවල් කීපයකම සමාජවාදී අවධියට පාතැබීමට පෙර අධිරාජ්‍ය විරෝධී ප්‍රජාතන්ත්‍රවාදී අවධි ඇතිවිය. දැනට ධනපති ක්‍රමය පවතින වෙනත් සමහර රටවල විප්ලවයේ වර්ධනය එවැනි මගක් ගැනීමට ඉඩ තිබේ.

ජාතික විමුක්ති ව්‍යාපාරය සහ ජාතික ස්වෛරීභාවය ආරක්ෂා කිරීමේ අරගලයද, සාමය සහ ජාතික සුරක්ෂිතතාවය සඳහා ව්‍යාපාරයද, ධනපති රටවල් කීපයකම ප්‍රජාතන්ත්‍රවාදය සඳහා ගෙනයන අරගලයද වැනි බලසම්පන්න ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාර පශ්චාත් යුද්ධ කාලයේදී පුළුල්ව පැතිර ගියේය. සමකාලීන ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාර ඒවායේ දැවැන්ත පරිමානය සහ සංවිධානාත්මක භාවය නිසා කැපී පෙනෙයි. මේ ව්‍යාපාර අධිරාජ්‍යවාදයට විරුද්ධවද, ඒකාධිකාරවල අභ්‍යන්තර ප්‍රතිගාමී සහ විදේශීය ප්‍රතිපත්තියට විරුද්ධවද එල්ල වී ඇත.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ඒකාධිකාරීත්වයට විරුද්ධ අරගලයත්, සාමය හා ප්‍රජාතන්ත්‍රවාදය සඳහා ගෙනයන අරගලයත් සමාජවාදී ස්වරූපයක් නොගනී. ඒවායේ අරමුණ මිනිසා විසින් මිනිසා සූරාකෑමද, පෞද්ගලික අයිතියද, විනාශකර දැමීම නොවේ. එසේ වුවද, මේ අරගලය නිසා ඒකාධිකාරවල අධිපත්‍යය දුරුවල වෙයි; ජාතික ස්වාධීනත්වය සහ ප්‍රජාතන්ත්‍රවාදය දිනාගැනීමට ආධාර වෙයි. මේ නිසා සමාජවාදී විප්ලවයේ කර්තව්‍යයන් ඉටු කිරීමට යොමුවීම සඳහා අවශ්‍ය තත්වයන් එයින් නිර්මාණය වේ. ''ඒකාධිකාරයට විරුද්ධව ගෙනයන පොදු ප්‍රජාතන්ත්‍රික අරගලය සමාජවාදී විප්ලවයෙන් වෙන් නොකරන අතර එයට ළං වෙයි. ප්‍රජාතන්ත්‍රවාදය සඳහා කරන සටන සමාජවාදය සඳහා ගෙනයන සටනේ අඛණ්ඩ කොටසක් වන්නේ යැයි ''* සෝ. සං. කො. පක්ෂයේ වැඩ පිළිවෙළේ සටහන් වේ.

ධනපති ඒකාධිකාරයට විරුද්ධවත්, ප්‍රජාතන්ත්‍රවාදය හා සාමය සඳහාත් ගෙනයන අරගලය මිත්‍ර සංගමයක් නැමැති කෝවතුළ හැඩ ගැස්වෙන කම්කරු පංතිය සහ සියලු වැඩ කරන ජනයා අතර ඇති වෙයි; ප්‍රථම වශයෙන්ම, කම්කරු පංතිය හා එහි ප්‍රධාන මිත්‍රයා වන ගොවි පංතිය අතර මිත්‍රත්වය ඇතිවෙයි. කම්කරු පංතිය හා එහි මාක්ස්වාදී පක්ෂය වටා ගොවි ජනතාවද, බොහෝ මධ්‍යම පංතික වැඩ කරන කොටස්ද, බුද්ධිමතුන් විශාල පිරිසක්ද සමගි වී, ඒකරාශි වෙමින් ප්‍රතිගාමීත්වයට විරුද්ධ සටනේ ආභාෂය ලබති. ධනපති ක්‍රමය යටතේ, ඒකාධිකාරවල පීඩනයෙන් තමන්ට ගැළවීමක් ලබා ගත නොහැකි බව එම අරගලය තුළින් ඔවුන්ට ප්‍රත්‍යක්ෂ ලෙස අවබෝධ කර ගැනීමට ඉඩ ලැබෙන අතර ගැළවීමේ එකම මාර්ගය ධනපති ක්‍රම විනාශ කිරීම බව ඔවුන් අවබෝධ කර ගනිති. දක්ෂිණාංශික සමාජවාදී හා ප්‍රතිසංස්කරණවාදී මුළාවන් දුරුවන අතර සමාජවාදී විප්ලවයේ දේශපාලන හමුදාව බිහි වන්නේ එලෙසටය.

අප යුගයේ ධනපති ක්‍රමයේ බලකණු විනාශ වන්නේ එක එල්ලේම නිර්ධන පංතියේ සමාජ විප්ලවයේ සිදුවීම්වලින් පමණක් නොවන බව මින් පැහැදිළිව පෙනී යයි. සමාජවාදී විප්ලවද, ජාතික විමුක්ති ව්‍යාපාරයද, අධිරාජ්‍ය විරෝධී විප්ලවද, ජාතික ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවද, පුළුල් ගොවි ජන ව්‍යාපාරද, පැසිස්ට්වාදී හා වෙනත් මානවද්‍රෝහී ඒකාධිපති ආණ්ඩු පෙරළා දැමීමේ පොදු ජන අරගලයද, ජාතික පීඩනයට විරුද්ධව පොදු ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරයද යන මේ සියල්ල ධනපති

* ''සෝවියට් සංගමයේ කොමියුනිස්ට් පක්ෂයේ වැඩ පිළිවෙළ'', පිටුව 38.

ක්‍රමය බිඳ හෙළන හා විනාශ කරන ලෝක විප්ලවීය ක්‍රියාවලියේ පොදු ප්‍රවාහනයට එක්වෙතියි සෝ. සං. කො. පක්ෂයේ වැඩ පිළිවෙළ පවසයි.

සමකාලීන යුගයේදී, මිනිස් සංහතිය සමාජවාදය කරා නොපසු බැස්විය හැකි ලෙස ඉදිරියට යන මේ යුගයේදී, විවිධ රටවල් සමාජවාදය කරා පරිවර්තනයවීමේ යථාභූත ආකාර පිළිබඳ ප්‍රශ්නය අතිශයින්ම වැදගත්වේ. එම ආකාර මොනවාද? ඒවා රඳා පවතින්නේ කුමක් මතද?

විවිධ රටවල් සමාජවාදය කරා පරිවර්තනයවීමේ ආකාරය

ධනවාදයේ සිට සමාජවාදය දක්වා පරිවර්තනයවීමේ ආකාර පළමු කොට ඒ ඒ රටවල පංතිවල සහ සම්බන්ධය මත රඳ පවතින බව නිර්මානශීලී මාක්ස්වාදය පිළිගනියි. කම්කරු පංතිය හා එහි මිතුරන්ගේ බලවේගයන් ධනපති පංතියේ බලවේගයන්ට වඩා ශක්තිමත් බව හොඳින් පැහැදිළි නම්, ප්‍රතිරෝධ දක්වීමෙන් වැඩක් නැති බව ධනපති බලවේගයන් අවබෝධ කර ගන්නේ නම්, ලෙනින් කී ලෙසට තමන්ගේ හිස ගෙඩි රැකගෙන පාලන බලය නිර්ධන පංතියට භාරදීමට ඔවුන් එකඟ වෙති නම්, ධනපති ක්‍රමයේ සිට සමාජවාදයට සාමකාමී ලෙස සංක්‍රමණය වීමේ හැකියාව ඇතිවේ. එසේ වුවද, වාස්තවික ලෙස බලතුලනය පිළිබඳ සැබෑ තක්සේරුවක් කිරීමට ධනපති පංතිය අසමත් බව ඓතිහාසික අත්දැකීම් පෙන්වා දෙයි. ධනපති පංතිය සිය කැමැත්තෙන් සිය බලය හා වරප්‍රසාද පවා නොදෙයි. අවි බලය සහිත සියලු මාධ්‍ය යොදවා එය ආරක්ෂා කිරීමට ධනපති පංතිය ඉදිරිපත් වෙයි. ඒ නිසා ධනපති පංතියේ අවිගත් ප්‍රහාරයන්ගෙන් සිය අයිතිවාසිකම් ආරක්ෂා කරගැනීම සඳහා අවිගෙන නැගී සිටීමට කම්කරු පංතිය නිතර සූදනමින් සිටිය යුතුය.

දේශපාලන බලය සාමකාමී ලෙස අල්ලා ගැනීමට කම්කරු පංතියට නොපුළුවන් බව මින් කොහෙත්ම අදහස් නො කෙරේ. එම හැකියාව හැමදාම තිබිණි. එහෙත් ධනපති ක්‍රමය ලෝකාධිපත්‍යය උසුලන යුගයේදී එම හැකියාව බොහෝ සෙයින්ම සීමා සහිත විය.

1917 රුසියාවේ පෙබරවාරි විප්ලවයෙන් ඉක්බිතිව වී. අයි. ලෙනින් හා බොල්ෂෙවික්වරු විප්ලවයේ සාමකාමී සංවර්ධනය පිළිබඳ ප්‍රශ්නය ඉදිරිපත් කළහ. එය එලෙස සිදු නොවූයේ නිර්ධන පංතියේ වරදින් නොවේ.

අද ලෝක තත්වය වෙනස් වී තිබේ. දෙවැනි ලෝක මහා යුද්ධයෙන් ඉක්බිතිව, ජාත්‍යන්තර දේශපාලන වේදිකාවේ ධනවාදය හා සමාජවාදය අතර ඇති වූ අලුත් බලවේග සහසම්බන්ධය විසින්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

සමාජවාදය කරා සාමකාමී ලෙස පරිවර්තනය වීමේ හැකියාව බෙහෙවින් ව්‍යාප්ත වී ඇත. ධනපති රටවලම මේ හැකියාව වැඩිවෙමින් පවතින්නේය; එසේ වන්නේ ප්‍රජාතන්ත්‍රවාදයේ සහ සමාජවාදයේ බලවේගයන් වර්ධනය වන නිසාත් අතිශයින්ම පුළුල් ජනතා කොටස් අතර කම්කරු පංතියේ හා එහි මාක්ස්වාදී පක්ෂයේ බලපෑම වැඩිවන නිසාත්ය.

මෙවැනි තත්වයන් යටතේ සමහර රටවල කම්කරු පංතියට අධිරාජ්‍ය විරෝධී පුළුල් ජනතා ව්‍යාපාරය කෙරෙහි විශ්වාසය තබමින්, ලේ වැගිරීමකින් හා සිවිල් යුද්ධයකින් තොරව බලය අල්ලා ගැනීමේ හැකියාවක් පවතී.

පාර්ලිමේන්තු ක්‍රමය යනු සමාජවාදී විප්ලවය සාමකාමී ලෙස වර්ධනය වීමේ එක් මාර්ගයක් විය හැක. ධනපති රටවල් ගනනාවකම කම්කරු පංතිය බහුතර ජනතාවගේ ආධාරය ලබාගනිමින්, අවස්ථාවාදීන්ට විරුද්ධව අධිෂ්ඨාන සහගත ලෙස සටන් කරමින්, පාර්ලිමේන්තුව තුළ බහුතර ආසන සංඛ්‍යාවක් ලබා ගැනීමටත්, පාර්ලිමේන්තුව වැඩකරන ජනතාවට මෙහෙකරන උපකරණයක් බවට පරිවර්තනය කිරීමටත්, සමත් වේ නම් ප්‍රතිගාමීන්ගේ ප්‍රතිවිරෝධ බිඳ දමූ කල්හි සාමකාමී ලෙස සමාජවාදී විප්ලවය කිරීමට අවශ්‍ය තත්වයන් නිර්මානය කිරීම එයට කළ හැකි වනු ඇත. පාර්ලිමේන්තු ක්‍රමය සමාජවාදය කරා සංක්‍රමණය වීමේ එක් ක්‍රමයකි. එය කිසිසේත්ම ප්‍රතිසංස්කරණවාදී ක්‍රමයක් නොවේ. එය නිර්දය පංති අරගලයේත්, අලුත් සමාජවාදී සමාජයක් ඇති කිරීමේ මූලික, විප්ලවවාදී වෙනස් කිරීම් ක්‍රියාත්මක කිරීමේත්, මාර්ගය වන්නේය.

සමාජවාදී විප්ලවය සාමකාමී ලෙස සංවර්ධනය වීමේ හැකියාවක් තිබෙන නමුත්, නිර්ධන පංතිය විසින් සාමකාමී නොවන මග අත් හරින බවක් ඉන් අදහස් නොවේ. ධනපති පංතිය තවමත් ලෝකයේ විශාල කොටසක අධිපත්‍ය දරන බවත්, එය සතුව අවි තිබෙන බවත්, ඒවා කම්කරු පංතියට සහ සියළු වැඩ කරන ජනතාවට විරුද්ධව පාවිච්චි කළ හැකි හා එසේ පාවිච්චි කරන බවත්, ස්ථිර ලෙසම මතක තබා ගැනීම අවශ්‍යය.

පැසිස්ට් මිලිටරි ආඥාදායකත්වය විසින් ජනතා විප්ලවය කම්කරු පංතියේ සහ ප්‍රගතිශීලි බලවේගයන්ගේ ලේ සාගරයක ගිල්වා දමූ චිලී රටේ ඛේදවාචකය මේය ඉතාම ප්‍රබල සාක්ෂියකි. ඒ අතරම සෝ. සං. කො. පක්ෂයේ ම. කා. සභාව විසින් 25 වැනි සම්මේලනයට ඉදිරිපත් කළ වාර්තාවේ මෙසේද සඳහන් වේ: ''විප්ලවය සඳහා සාමකාමී මාවත ඇතුළුව — එයට අවශ්‍ය තත්වයන් තිබේ නම් — විවිධ මාවත් ඇති බවට කොමියුනිස්ට්වාදීන් විසින් කරන ලද නිගමනය චිලී රටේ ඛේදවාචකය කොහෙත්ම කටුගා දමා නැත. විප්ලවයට ආරක්ෂාවීමට හැකියාවක් තිබිය යුතු බව එම ඛේදවාචී සිද්ධිය ඉතා තදින් පෙන්වා දෙයි. සමකාලීන පැසිස්ට්වාදයට හා විදේශීය ප්‍රතිගාමීත්වයේ ක්‍රියා ගැන සුපරීක්ෂාවෙන් සිටිය යුතු බව උගන්වන එම ඛේදවාචකය ස්වාධීනත්වයේ සහ ප්‍රගතියේ මාගීය ගන්නා සියලු බලවේගයන්ගේ ජාත්‍යන්තර සහයෝගිතාවයට ආයාචනය කරයි.''*

කම්කරු පංතිය නිතර සූදනමින් සිටිය යුතුය... එබැවින් කම්කරු පංතිය නිතරම සුපරීක්ෂාකාරී විය යතුය; සාමකාමී මෙන්ම සාමකාමී නොවන අරගලයද පාර්ලිමේන්තු හා පාර්ලිමේන්තු නොවන අරගලයද යොදගැනීම සඳහා නිතර සූදනමින් සිටිය යුතුය. අරගලයේ සියලු ආකාර පිළිබඳව මනා ශූරතාවයක් ලැබ සිටීමත්, යථාභූත තත්වයකදී වඩාත් හොඳින් ගැලපෙන අරගල ක්‍රම දක්ෂ ලෙස ක්‍රියාවේ යෙදවීමත්, අරගලයේ එක් ආකාරයක් වෙනුවට තවත් ආකාරයක් හදිසි ලෙස ආදේශ කිරීමේ හැකියාව ඇතිව සිටීමත්, සෑම රටකම සමාජවාදී විප්ලවයේ ජයග්‍රහණය සඳහා අනිවාර්ය කොන්දේසියක් වන්නේය.

* ''සෝවියට් සංගමයේ කොමියුනිස්ට් පක්ෂයේ 25 සම්මේලනයේ ලියවිලි'', 30 පිටුව.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

VIII

සමාජ විඥානය සහ එය සමාජ සංවර්ධනයේදී ඉටුකරන ක්‍රියා කලාපය

ජනතාවගේ ද්‍රව්‍යමය නැතහොත් ආර්ථික සම්බන්ධකම් සමාජ සංවර්ධනයේ පදනම වන්නේය. එම සංවර්ධනය ගැන අවබෝධකර ගැනීමට ආර්ථික සාධක පමණක් කොහෙත්ම ප්‍රමාණවත් නොවේ. ජනතාවගේ නිෂ්පාදන ක්‍රියාකාරිත්වය හැරුණු විට, අධ්‍යාත්මක ජීවිතයක්ද ඇත්තේය. ජනතාව ඔවුන්ගේ නිශ්චිත දේශපාලන සහ සදචාරාත්මක අදහස් අනුව කටයුතු කරති; ඔවුන්ට විද්‍යාත්මක න්‍යායයන්ද, කලා පිළිබඳ මතද තිබේ. මේ සියලු අදහස් හා මත ඒවායේ සම්භාවය සහ වැදගත්කම අනුව බලන කල සමාජමය ස්වභාවයක් දරන අතර ඒවා සමාජමය විඥානය පිළිබඳ ක්ෂේත්‍රයට අයත් වන්නේය.

ඓතිහාසික සංවර්ධනයේදී සමාජමය විඥානය මහත් වැදගත්කමක් දරයි. එබැවින් සමාජමය පිළිබඳ වඩාත් සම්පූර්ණ අදහසක් ලබා ගැනීම සඳහා සමාජමය විඥානය යනු කුමක්ද යන්නත්, එය ඇතිවූයේ කෙසේද යන්නත් සහ සමාජ ජීවිතයේදී එය ඉටු කරන ක්‍රියා කලාපය කවරේද යන්නත් පැහැදිලි කරගත යුතුය.

1. සමාජමය විඥානය සමාජීය සත්තාවෙහි පිළිබිඹුවකි

සමාජමය විඥානයේ හරය හා සම්භාවය

සමාජමය විඥානය වූකලී මිනිස් සමාජයේත් ප්‍රකෘතියේත්, වාස්තවික යථාර්ථය පිළිබිඹු කරන, ජනතාවගේ අදහස්වල, න්‍යායයන්වල සහ මතවලද සමාජමය හැඟීම්වල, පළපුරුදුවල සහ සදචාරවලද සමස්තය වන්නේය. සමාජමය විඥානයෙන් පිළිබිඹු-වන ප්‍රධාන වස්තුව මිනිසුන්ගේ සමාජමය පැවැත්මය. සමාජමය පැවැත්ම විවිධාකාර සහ සංකීර්ණ බැවින් මිනිසුන්ගේ විඥානයද

විවිධාකාර වන්නේය. ප්‍රධාන වශයෙන් මෙහිදී සමාජමය හා පෞද්ගලික විඥානයද, සමාජමය මානසික විද්‍යාව හා දෘෂ්ටියද වෙන්කොට හඳුනාගත යුතුය. සමාජමය විඥානය දේශපාලන සහ අධිකරණ නීතිමය අදහස්ද, අධ්‍යාත්මික, කලා, දර්ශණය, ආගම වැනි විවිධ ආකාරවලින් සමන්විත විය හැකිය. විද්‍යාව සමාජමය විඥානයේ එක් ආකාරයක් වුවද, දැන් එය වඩ වඩාත් සමාජයේ නිෂ්පාදන බලවේගයන්ගේ එකක් බවට පරිවර්තනය වෙමින් පවතී. සමාජමය විඥානය සිය බිහිවීමේ හා වර්ධනයේ විශේෂතාවයන්ගෙන් යුක්ත වේ. ඒවා සමාජමය පැවැත්මේ විවිධ අංශ පිළිබිඹු කරයි. ඒවා විසින් සපුරාලන කාර්යයන්ද විවිධාකාරය. මේ ගැන අවසාන පරිච්ඡේදය මඟින් සවිස්තරව සාකච්ඡා කරමු.

අදහස් හා සමාජමය විඥානය සමාජ ජීවිතය විෂයෙහි ඉටුකරන කාර්ය කොටස ගැන නිවැරදි හා තේරුම්ගත හැකි පැහැදිලි කිරීමක් දීමට විඥානවාදය අපොහොසත්ය. සමාජ සංවර්ධයේ සම්පූර්ණ ක්‍රියා මාර්ගයම නිගමනය කරනු ලබන්නේ අදහස් නොහොත් චින්තනය විසින් යයි විඥානවාදීන් කියන නමුදු, එය යථාර්තය සමග කොහෙත්ම නොගැළපේ.

සමාජයට අදළ දර්ශනවාදී පිළිබඳ මූලික ප්‍රශ්නය නිවැරදි ලෙස විසඳු ඓතිහාසිය භෞතිකවාදය පමණක් ජනතාවගේ සමාජමය විඥානය, ඔවුන්ගේ සමාජමය සත්තාවේ ප්‍රතිඵලයක් බව පෙන්වා දී ඇත, විඥානය ද්වීතික බවත්, එය ද්‍රව්‍යමය, නිෂ්පාදනමය සම්බන්ධ-කම්වල ඵලයක් බවත් පෙන්වා දී ඇත.

සමාජයේ අදහස්වල, මතවල හා න්‍යායයන්ගේ උල්පත සෙවිය යුත්තේ සමාජමය පැවැත්මේ ද්‍රව්‍යමය, මිනිසුන්ගේ නිෂ්පාදනමය ක්‍රියා කලාපය තුළය.

මිනිසුන්ගේ පැවැත්ම හා ඔවුන්ගේ ද්‍රව්‍යමය නිෂ්පාදන සම්බන්ධකම් වෙනස්වූ කල්හි ඔවුන්ගේ විඥානයද වෙනස් වී අලුත් තත්වයන්ට හා සමාජමය අවශ්‍යතාවයන්ට අනුකූල අළුත් අදහස් ජනිතවී පැරණි අදහස් අතුරුදහන්වේ. නිදර්ශනයක් වශයෙන් සමාජවාදයේ ජයග්‍රහණයත් සමග ජනතාවගේ සමාජ සත්තාව හාත්පසින්ම වෙනස්විය. ධනවාදී පෞද්ගලික දේපල වෙනුවට, සමාජවාදී දේපල ඇතිවිය. ඒ අනුව ජනතාවගේ අදහස් හා මතද වෙනස් විය. ධනවාදී සදචාරයේ මුල්ගල වන පෞද්ගලිකත්වය වෙනුවට, කොමියුනිස්ට්වාදී සදචාරයේ පදනම වන සාමූහික මූලධර්මය තහවුරු විය.

එලෙසම ඕනෑම ආකාරයක සමාජමය විඥානයක් විශ්ලේෂණය

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

කරන විට, එහි අන්තික සම්භවය සමාජයේ ද්‍රව්‍යමය ජීවිතය වන බව අපට පෙනෙනු ඇත.

විඥනයේ වර්ධනයේ සාපේක්ෂ ස්වාධීනත්වය

මිනිසුන්ගේ සමාජමය පැවැත්ම පිළිබිඹු කරන විඥනය සාපේක්ෂ වශයෙන් ස්වාධීන ලෙස වර්ධනය වීමේ හැකියාවෙන් යුක්තය. එය ප්‍රකාශ වන්නේ කෙසේද, කුමක් තුළින්ද? සමාජමය සත්තාවෙහි සංවර්ධනයට වඩා හෝ ඉදිරියෙන් හෝ සිටීමට සමාජමය විඥනයට ඇති හැකියාවක් තුළින් එහි සාපේක්ෂ ස්වාධීනත්වය පිළිබිඹු වන්නේය. එමෙන්ම එහි අවිච්ඡින්න සංවර්ධනයෙන්ද එය ප්‍රකාශ වෙයි. සමාජමය විඥනය සමාජමය සත්තාව විෂයෙහි අක්‍රිය ලෙස නොව සක්‍රිය ලෙස බලපාන බැවින්ද, එහි සාපේක්ෂ ස්වාධීනත්වය ප්‍රකාශිත වේ.

සමාජමය සත්තාවට වඩා සමාජමය විඥනය පසු බැස සිටීම පැහැදිලි කළ හැක්කේ පළමුව ජනතාවගේ සමාජ සත්තාව වෙනස්වීමත්, ඉක්බිතිව ඒ අනුව ඔවුන්ගේ විඥනය වෙනස්වීමත් අනුවය මෙම පමාවීමට තවත් හේතුවක් නම්, පැරණි අදහස් හා මතවල ඉමහත් ප්‍රරෝහණ ශක්තිය ය. මේ ප්‍රරෝහණ ශක්තිය අහඹුවක් නොවේ. සමාජයේ සියලු සාමාජිකයින්ගේ සිත් තුළට තමන්ගේ දෘෂ්ටිය තදින් කාවාද්දවීමට ආණ්ඩු කරන පංතිය තමා සතු හැම මාධ්‍යයක්ම යොදවයි. වැඩකරන ජනතාවගේ විඥනයට විෂ පොවා, ඔවුන් දෘෂ්ටිමය ලෙස නිරායුධ කිරීම පිණිස සමකාලීන අධිරාජ්‍යවාදී ධනපති පංතිය, නිදසුනක් වශයෙන් සියලු ජනසන්නිවේදන මාධ්‍යයන් (පුවත්පත්, චිත්‍රපටි, ගුවන් විදුලිය, ටෙලිවිෂන් සේවය ආදිය) යොදවයි. අලුත් ක්‍රමයේ ජයග්‍රහණයෙන් පසුවත් සමහර තනි පුද්ගලයින්ගේ විඥනයෙහි පැරණි දෘෂ්ටියේ නටබුන් දිග කලක් යනතෙක් පවතින්නේ එබැවිනි.

කෙසේ වුවද, මිනිසුන්ගේ විඥනය සමාජ සත්තාවට වඩා පසුබැස සිටිනවා පමණක් නොව, සමහර තත්වයන් යටතේ, එය එහි වර්ධනයට වඩා ඉදිරියට යාමටද පුළුවන. සමාජයේ නියාමයන් විශ්ලේෂණය කරමින්, ඓතිහාසික සංවර්ධනයේ පොදු ප්‍රවනතාවයන් තෝරා බේරා ගනිමින් අනාගතය දැකීමෙහි සමත් විශේෂ දක්ෂකම් ඇති අය වෙති, එනම්, තමන් ජීවත්වන කාලයට වඩා බොහෝ දියුණුවූ න්‍යායයන් බිහිකිරීමට සහ අවුරුදු දසක බොහොමයක් සඳහා අනාගත සංවර්ධන මාර්ගය පෙන්වාදීමට සමත් වෙති. ධනපති යථාර්ථය විශ්ලේෂණය කිරීමේද, එහි සංවර්ධනයේ ප්‍රතිවිරෝධීතාවයන් හැදෑරීමේද පදනම මත පිහිටා කාල් මාක්ස් ධනවාදය නොවැළැක්විය හැකිසේ

විනාශයට පත්වන බවත්, එය වෙනුවට අලුත් කොමියුනිස්ට්වාදී සමාජයක් ඇතිවන බවත් නිගමනය කළේය. විද්‍යාත්මක කොමියුනිස්ට්වාදය පිළිබඳ මාක්ස්වාදී න්‍යායය සමාජමය සිද්ධීන් කලින් දැනගැනීමේ ඉතාමත්ම උසස් ආදර්ශයකි.

සමාජ විඥනයේ සාපේක්ෂ ස්වාධීනත්වය ප්‍රකාශ කරන එක් වැදගත් කරුණක් නම් දෘෂ්ටි වර්ධනයේ අවිච්ඡින්නතාවයය. අලුත් පංතිය ස්වකීයම වූ දෘෂ්ටිය නිර්මාණය කරමින්, මිනිස් චින්තනයේ අතීත ජයග්‍රහණයන් ප්‍රතික්ෂේප නොකර, ඒවා උකහාගෙන තම සේවය පිණිස යොදගනී.

අදහස්වල වර්ධනයේ අවිච්ඡින්නතාවය සමාජ ජීවිතයට ඉතා වැදගත් වන්නේය. අතීත සංස්කෘතියේ ජයග්‍රහණවලින් ප්‍රයෝජනය ලබා ගැනීමට ජනතාවට නොහැකි විණි නම්, ඔවුන්ට හැම දෙයක්ම මුල සිට පටන් ගැනීමට, ඈත කාලයේදී සොයාගත් නියාම යළිත් සොයා ගැනීමට, බොහෝ කලක සිටම දැන සිටි යන්ත්‍ර සූත්‍ර හා යාන්ත්‍රිකයන් සෑදීම මුල සිට යළිත් පටන් ගැනීමට ආදිය සිදුවනු ඇත. අදහස් සංවර්ධනයේ අවිච්ඡින්නතාවය නිසා එවැනි අවශ්‍යතාවයක් නැත. පූර්ව පරම්පරා විසින් කරන ලද දැවැන්ත නිර්මාණයන් තමන් සතුව පවතින බැවින්, සිය පූර්වජයින්ගේ වැඩ කටයුතු දිගටම ඉදිරියට ගෙනයාමටද, ඒවා අලුත් හා උසස් තලය කට ගෙන ඒමටද ජනතාවට හැකියාවක් ලැබී තිබේ.

අතීතයේ එන දෘෂ්ටිමය දයාදය වෙත විවිධ පංති විවිධ ලෙස ළඟාවෙති. ප්‍රතිගාමී පංති අතීතයේ ප්‍රතිගාමී අදහස් ඇදගෙන තම උවමනාවන්ට ගැළපෙනසේ අලුත් ඓතිහාසික තත්වයන්ට ඒවා බද්ධ කරති. අධිරාජ්‍යවාදයේ දෘෂ්ටිවාදීහු, නිදසුනක් වශයෙන් වැඩ කරන ජනතාව අධ්‍යාත්මික වහල් භාවයේ බැඳ තැබීම සඳහා මධ්‍යකාලීන පණ්ඩිත විචාරය සහ ගුඪ වාදයත්, විවිධ විඥනවාදී සහ ආගමික ක්‍රමත් පාවිච්චි කරත්.

යහ සාධනීය වැදගත්කම නොනැසී පවතින හා මිනිස් සංහතියේ ප්‍රගතියට ආධාරවන අතීතයේ දෘෂ්ටිමය දයාදය දියුණු විප්ලවවාදී පංති විසින් ගනු ලැබේ. සියවස් ගණනාවක් තිස්සේ සංවර්ධනය වූ මිනිස් චින්තනයේ ඉතාමත්ම උසස් දේ විවේචනාත්මක ලෙස විමර්ශනයට භාජනය කොට පිළිගත් නිර්ධන පංතියේ දෘෂ්ටිය, අතීතයේ අධ්‍යාත්මික උරුමය ස්ථිර ලෙසත්, සැළකිලිමත් ලෙසත්, සුරක්ෂිත ලෙසත් ආරක්ෂා කරයි.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

සමාජ සංවර්ධනයේදී අදහස් විසින් ඉටුකෙරෙන ක්‍රියාශීලී කාර්ය කොටස

සමාජ විඥනය, නැතහොත් ජනතාවගේ අදහස් හා මත සමග සම්බන්ධ කර බලන කළ, සමාජ සත්තාව ප්‍රධාන වන බව ප්‍රකාශ කරන ඓතිහාසික භෞතිකවාදය, අදහස් විසින් සමාජ සංවර්ධනයේ ක්‍රියාශීලී කාර්ය කොටසක් ඉටු කෙරෙන බවද, ඒ අතරම පිළිගනී. ජීවිතයේ ඕනෑම ක්ෂේත්‍රයක මිනිසුන් ක්‍රියාත්මක වන්නේ විඥනීය ලෙස හා සාර්ථවත් ලෙසය. එබැවින් ඔවුන්ගේ අදහස්, මතිමතාන්තර හා න්‍යායයන් සමාජ ජීවිතයේ හැම අංශයකටම කා වැදී එය මත විශාල බලපෑමක් ඇති කරයි. සමාජමය අදහස් මිනිසුන්ගේ ක්‍රියාකාරිත්වයේදී ඔවුන්ට මග පෙන්වන්නෙක් බඳුව සමහර කර්තව්‍යයන් ඉටුකර ගැනීම සඳහා ඔවුන් සමගි කිරීමෙනුත් ඔවුන්ගේ පරිශ්‍රමය සංකේන්ද්‍රණය කිරීමෙනුත් ඔවුන්ට කරන්නා වූ සේවය තුළින් එම අදහස්වල ක්‍රියාකාරිත්වය විද්‍යාමාන වේ.

LIBERATIONBASE

අදහස් දෙයාකාර කාර්ය කොටසක් ඉටු කරයි. ඒවාට සමාජ සංවර්ධනය සඳහා රුකුල් දිය හැකිය, නැතිනම් එම වර්ධනය ප්‍රමාද කළ හැකිය. අදහස්වලින් ඉටුවන කාර්ය කොටස තීරණය වන්නේ ඒවා ඉදිරිපත් කරන පංතිය අනුවය; ඒවා ඉදිරිපත් කරන පංතිය ප්‍රගතිශීලීද, නැතහොත් ප්‍රතිගාමීද, සමාජයේ ද්‍රව්‍යමය ජීවිතයේ අවශ්‍යතාවයන් ඒවායින් නිවැරදි ලෙස පිළිබිඹු වන්නේද, එම අදහස් ජනතාවගේ උවමනාවන් හා සමග කොතරම් දුරට ගැලපේද යන කරුණු අනුවය.

සමාජයේ ඉතාමත් දියුණු පංතිවල හා ජනතාවගේ උවමනාවන් පිළිබිඹු කරන්නාවූද, ද්‍රව්‍යමය නිෂ්පාදනයේ දියුණුවට අදාළ අවශ්‍යතාවයන්ට අනුකූල වන්නාවූද, පැරණි සමාජ ක්‍රමය විනාශ කොට අලුත් සමාජ ක්‍රමය නිර්මාණය කිරීමට ආධාර වන්නාවූද සංකල්ප පමණක් සමාජ සංවර්ධනයේදී ප්‍රගතිශීලී වැදගත් කමක් දරයි.

එසේ වුවද, අදහස් නොහොත් සංකල්ප කෙතරම් අළුත් හා ප්‍රගතිශීලී වුවද, හුදෙක් ඒවාට පමණක් පැරණි සමාජ ක්‍රමය විනාශ කොට, අලුත් සමාජ ක්‍රමය ගොඩ නැගිය නොහැකිය. එම අදහස් ද්‍රව්‍යමය බලවේගයක් බවට පත්වීමට නම් ඒවා තදලෙස ජනතාවගේ සිත් අල්ලාගත යුතුය හදිසි සමාජමය ගැටළු විසඳීමෙහි සමත් සමාජමය බලවේගය ඇති කිරීමෙහි සමත් වන්නේ ප්‍රගතිශීලී අදහස් මනාව අවබෝධ කරගත් ජනතාව පමණකි.

ලෝකයේ මෙතෙක් දත් සියලු සංකල්ප අතුරෙන්, ඉතා ප්‍රගතිශීලී ඉතා බලවත් සංකල්පය මාක්ස් විසින් නිර්මාණය කරන ලද විද්‍යාත්මක

කොමියුනිස්ට්වාදය ය. අලුත් සමාජ ධර්මයක් වූ එය සූරාකෑම හා වහල් භාවය අහෝසි කර මිහිපිට අතිශයින්ම සාධාරණ සමාජ ක්‍රමය ගොඩනගනු ඇත සමාජ සංවර්ධනයේ වාස්තවික නියාමයන් සැළකිල්ලට ගෙන ඇති බැවින්ද, කෝටි සංඛ්‍යාත වැඩ කරන ජනතාවගේ උවමනාවන්ට සහ සමාජයේ ද්‍රව්‍යමය ජීවිතයේ ප්‍රධාන අවශ්‍යතාවයන්ට ගැලපෙන බැවින්ද එම සංකල්පය ඉමහත් ජීවමය බලයකින් යුක්තය. විද්‍යාත්මක කොමියුනිස්ට්වාදය ලෝකය වෙනස් කරන ද්‍රව්‍යමය බලවේගයක් වන්නේ එබැවිනි.

කොමියුනිස්ට් පක්ෂයේ නායකත්වය යටතේ, ගොවි ජනතාවගේද සහය ඇතිව, ශ්‍රේෂ්ඨ ඔක්තෝබර් සමාජවාදී විප්ලවය ජයග්‍රාහී ලෙස සපුරාලූ රුසියානු කම්කරු පංතිය එම සංකල්පයෙන් ආස්වාදය ලැබීය. සමාජවාදය සඳහා ගෙනගිය විරෝධාර අරගලයේදී එම සංකල්පය සෝවියට් ජනතාවට ප්‍රයෝජනවත් වූ අතර එය දැන් කොමියුනිස්ට් අනාගතයට යන මග ආලෝක කරයි. ලෝකයේ ජනතාව වඩ වඩාත් එම සංකල්පය වෙත ඇදී එති. ධනපති රටවල අධිරාජ්‍යවාදී ප්‍රතිගාමී බලවේගවලට විරුද්ධව සටන් කිරීම සඳහා වැඩකරන ජනතාවට එය ආධාර දෙයි. ධනපති ක්‍රමය විනාශ කළ තන්හි සමාජවාදය සාර්ථක ලෙස ගොඩනැගීමට එය ආධාර වේ. සත්‍ය හා යථාර්ථය විකෘතිකර, ප්‍රතිගාමී පංතිවල වුවමනාවන් ඉටුකරන අනිකුත් අදහස් සමාජ සංවර්ධනයට බාධා කරයි. දැනටමත් යල් පැන තිබෙන ධනපති ක්‍රමයේ අනිවාර්ය විනාශය වළක්වා, එම ක්‍රමය බේරා ගැනීම සඳහා ප්‍රයත්න දරන සමකාලීන ප්‍රතිගාමී ධනපති පංතියේ අදහස් නිදසුනක් වශයෙන් එසේය. තම ප්‍රීතිමත් අනාගතය සඳහා සටන් කරන ජනතාවට බාධා කරන ආගමික මතවල සැටිද එසේය.

විඥනයේ ක්‍රියාකාරිත්වය ගැන කියන විට අදහස්, සංකල්ප හා දෘෂ්ටි පමණක් නොව, සමාජීය මනෝ විද්‍යාවද, විශාල සමාජ කණ්ඩායම් වල, පංතිවල මනෝ විද්‍යාවද විශේෂයෙන් මතක තබා ගත යුතුය. සමාජමය මනෝ විද්‍යාව — බහුජන සමූහ විඥනයකි, එබැවින් එක් හෝ තවත් ඓතිහාසික කාර්ය භාරයක සාර්ථකත්වය සැහෙන දුරට ජනතාවගේ මනෝ විද්‍යාත්මක හැඟීම් මත රඳා පවතී.

වි. අයි. ලෙනින් ඉතිහාසයේ මනෝ විද්‍යාත්මක සාධකයේ ක්‍රියා කලාපය ඉතා උසස් ලෙස අගය කළේය, බහු ජනතාවගේ සමාජීය හැඟීම් හා මනෝ භාවය නිරතුරුවම අධ්‍යායන කළේය, විප්ලවවාදී අරගලවලදීද, සමාජවාදී ඉදිකිරීම්වලදීද ඒවා සැලකිල්ලට ගත්තේය. සෝවියට් සංගමයේ කොමියුනිස්ට් පක්ෂය ලෙනින්ගේ උපදෙස් අනුගමනය කරමින්, සමාජය ඉදිරියේ ඇති කාර්ය භාරයන් තීරණය

https://liberationbase.wordpress.com

කිරීමෙහි සමත්, පොදු වශයෙන් සමාජයේද, හැම පුරුකමද හිතකර ‘මනෝ විද්‍යාත්මක පරිසරයක්’ ඇති කිරීමට කටයුතු කරයි.

මිනිස් සංහතියේ ජීවිතයේ සමාජීය විඥානය හා සංකල්පය වැදගත් ස්ථානයක් දරන බව මින් පෙනී යයි. එබැවින් ප්‍රායෝගික ක්‍රියාකාරීත්වයේදී, සමාජ සත්තාවේ තීරක කාර්ය කොටස පිළිබඳ ප්‍රතිපත්තිය අනුව පමණක් නොව, සමාජ සංවර්ධනයේදී විඥානයේ ක්‍රියාශීලී කාර්ය කොටසද සැලකිල්ලට භාජනය කරමින් කටයුතු කිරීම වැදගත් වන්නේය.

2. පෞද්ගලික හා සමාජීය විඥානය.
සමාජීය මනෝවිද්‍යාව සහ දෘෂ්ටිය

සමාජීය හා පෞද්ගලික විඥානය

කිසියම් සංයුක්ත පුද්ගලයකුගේ, පෞද්ගලික විඥානය ඔවුන්ගේ චින්තනයේ, අදහස්වල, වුවමනාවන්ගේ වෙනත් මානසික ගුණයන්ගේ ගාමක සමස්තයක් නියෝජනය කරයි. එය එම සමාජයේ සමාජීය මාධ්‍යයන්ගේ සංකීර්ණ අන්‍යොන්‍ය ක්‍රියාකාරීත්වයක් ලෙසද, විශේෂ නියමිත පුද්ගලයකුගේ (“ක්ෂුද්‍ර පරිසරය”) සංයුක්ත පරිසරය ලෙසද පිළිබිඹු වේ. එය මිනිසුන්ගේ පොදු හා වෙන්වූ පැවැත්මද පිළිබිඹු කරයි. එපමණක් නොව, පෞද්ගලික විඥානයට ස්වයං විඥානයද එනම් තමා ගැනත් ලෝකය, සමාජය, පංතිය සමූහය කෙරෙහි තමා දක්වන ආකල්පය ගැනත් අයත් වේ.

සමාජයීය හා පෞද්ගලික විඥානයේ සාපේක්ෂ සම්බන්ධතාවය වූ කලී සමාජයේ පොදු හා පෞද්ගලික අධ්‍යාත්මික ජීවිතයේ දයලෙක්තිකයේ සංයුක්ත ප්‍රකාශණයකි. හැම පොදු දෙයක්ම වෙන්, වෙන්වූ කොටස්වලින් යුක්ත වන්නාසේම, සමාජමය සංකල්පයද පුද්ගලයින් මගින් පමණක් ප්‍රකාශවේ. එය ප්‍රකෘති ගුණයකි, මන්දයත් හැඟීමේ හා කල්පනා කිරීමේ ශක්තිය ඇත්තේ සංයුක්ත පුද්ගලයෙකුට පමණක් වන බැවිනි. අනිත් අතින් පෞද්ගලික සංකල්පනය රඳා පවතින්නේ සමාජමය සංකල්පනය මගින් පමණකි. හැම මිනිහකුම ජීවත් වන්නේත් වැඩ කරන්නේත් සමාජය තුළය, ඔවුන් එක්තරා නියමිත පංතියකට, ජාතියකට, සමාජමය සමූහයකට අයත්ය. එබැවින් ඔවුන්ගේ පෞද්ගලික සංකල්පය සමාජයෙන් වෙන්වූ, කොන්වූ එකක් නොව, සමාජමය (පංති, ජාතික) සංකල්පයේ විකාශනයකි. ජීවිතයට පාතබන මිනිසාට සමාජීය පැවැත්ම පමණක් නොව පිළියෙළ වූ සමාජ සංකල්පයක්ද මුණ ගැසෙයි. ඔහු එක් හෝ

තවත් ප්‍රමාණයකින් සහ ආකාරයකින්, අවශ්‍යතාවයකින් යුතුව එය උකහා ගනී.

සමාජයික හා පෞද්ගලික සංකල්පය යන මේ දෙකම එකකි. මේ දෙකේම උල්පත — වන මිනිසුන්ගේ පැවැත්ම — පොදුය; පදනම — ව්‍යවහාරය — එකකි; ප්‍රකාශ කිරීමේ ආකාරය එනම් භාෂාව එකකි. එහෙත් එම ඒකත්වයේ සැඟෙන වෙනස්කම් කිහිපයක් තිබේ. පෞද්ගලික විඥානය සමග සමකරන විට, සමාජයික විඥානය විසින් යථාර්ථය ගැඹුරු ලෙසත්, පරිපූර්ණ ලෙසත් පිළිබිඹු වේ. පුද්ගලයින්ගේ විඥානය සංයුක්ත විශේෂ ලක්ෂණ බොහොමයකින් ඈත්වන සමාජයික විඥානය පෞද්ගලික විඥානයේ පොදු ලක්ෂණ පමණක් උකහා ගනී. පෞද්ගලික විඥානය එක් හෝ තවත් පුද්ගලයෙකුට අයත් සමාජ පොදු ලක්ෂණ හැරුණු විට, එක් පුද්ගලයෙකුට පමණක් අයත් විශේෂ, අනු කරණය නොකළ හැකි, ඔවුන්ගේ සංයුක්ත පැවැත්මේ සුවිශේෂතාවයන්වලින් යුක්ත වේ. හැම මිනිහකුගේම මොළය තුළට කොමියුනිස්ට්වාදී සංකල්පය ඇතුළු කරවීම, කොමියුනිස්ට්වාදී අධ්‍යාපනයේ ප්‍රධාන කාර්ය භාරයක් වන බැවින්, ශික්ෂණයේදී හැම කෙනෙකුගේ විඥානයේත්, මනෝ විද්‍යාත්මක පෞද්ගලික සැකැස්මේත් විශේෂතාවයන් සැලකිල්ලට ගත යුතුය.

කොමියුනිස්ට්වාදී ඉදිකිරීම් වර්ධනයවත්ම, පොදු හා පෞද්ගලික විඥානය වෙනස් වෙයි. විද්‍යාවේ ව්‍යවහාරික අත් දැකීම්වල ජයග්‍රහණය අනුව එය පොහොසත් වෙයි. වැඩි වැඩියෙන් ජනතාව කොමියුනිස්ට්වාදයට පක්ෂපාත වීමට පටන් ගනිති. එසේවුවද පෞද්ගලික විඥානය සමාජමය තත්වය දක්වා උසස් කිරීම නිසා, පෞද්ගලික විඥානයේ විශිෂ්ටතාවයේ මට්ටම පහත් නොවන්නේය. සෝවියට් ජනතාව ගොඩනගමින් සිටින කොමියුනිස්ට්වාදී සමාජයේ සමානතාවය, පුහු හා ව්‍යාජ සිතීම් සහිත මිනිසුන්ගේ නොව ජීවමය, ක්‍රියාකාරී, නිර්මාණාත්මක ලෙස කල්පනා කරන මිනිසුන්ගේ සැබෑ සමානතාවයකි.

සමාජයීය මනෝවිද්‍යාව

සමාජයීය මනෝවිද්‍යාව පංතීන්ගේත් සමාජමය කණ්ඩායම්වලත් වෘත්තීන්ගේත් ශ්‍රමය හා ජීවිතයේ නියම තත්වයන් නිසා ඉඳුරා බලපාන හැඟීම්, පළපුරුදු, දෘෂ්ටි, සෞන්දර්ය අංග ලක්ෂණ, ආවේග, මුළාවීම් සහ මායාවන්වල සමස්තය නියෝජනය කරයි. කෙළින්ම බලපාන ශ්‍රමික හා ජීවන තත්වයන් නිසා කම්කරු පංති තුළ සූරාකෑමට විරුද්ධ හැඟීම්ද, ධනපති

https://liberationbase.wordpress.com

පංතියට විරුද්ධව සටන් කිරීමේ අවශ්‍යතාවයද, ඒකරාශී වීමේ, සංවිධානයවීමේ, සාමූහිකව කටයුතු කිරීමේ හැඟීම්ද වැනි සමාජ–මනෝ විද්‍යාත්මක ලක්ෂණ පහළ වේ. ධනපති පංතියේ මනෝ විද්‍යාවේ මූලික අංග ලක්ෂණ ලාභ ලබාගැනීම සහ පෞද්ගලිකත්වය වන්නේය.

සමාජීය මනෝවිද්‍යාව මගින් පංතිවලත්, සමාජ සමූහයන්ගේත්, තත්වයද, ඒවායේ නියම අරමුණ සහ වුවමනාවන්ද පිළිබිඹු වේ. මේ අවධියේ විඥනය පුළුල් විද්‍යාත්මික ගොනු කිරීම් දක්වා උසස් නොවන අතර අඩ වශයෙන් ඒවා මතුපිට ප්‍රපංච ලෙස පවතී. සමාජ මනෝවිද්‍යාවේ මට්ටමෙහි කම්කරු පංතියේ විඥනයේ තත්වය, "තමන් තුළ පංතිය" ලෙස කාල් මාක්ස් විසින් ඉතා නිවැරදි ලෙස නම් කැරිණි. සමාජයේ තමා සතු තත්වය පිළිබඳවත්, ධනපති ක්‍රමයේ මිනී වළ හාරන්නා සහ අලුත් සමාජවාදී සමාජයේ නිර්මාතෘවරයා හැටියට තමා දරන ඓතිහාසික කාර්ය භාරය පිළිබඳවත් විඥත ලෙස දැනගැනීමේ තත්වය දක්වා කම්කරු පංතිය තවමත් උසස්වී නැත. ධනපති පංතියට වෛර කිරීමේත් කෙළින්ම තමාට බලපාන ආර්ථික වුවමනාවන් සඳහා සටන් කිරීමේත් විඥනය පමණක් කම්කරු පංතියට ඇත්තේය.

පසු කලෙක, සමාජවාදයේ බලපෑම නිසා පමණක්, විප්ලවවාදී සටන්වලට සහභාගිවීමේ ප්‍රතිඵලයක් වශයෙන්, "තමන් තුළ පංතියේ" සිට "තමන් සඳහා පංතියක්" දක්වා පරිවර්තනය වන්නේය, යථාර්ථය විද්‍යාත්මක ලෙස දැන ගැනීම දක්වාත් විද්‍යාත්මක මාක්ස්වාදී දෘෂ්ටිය නතුකර ගැනීම දක්වාත් උසස් වන්නේය.

ධනපතීන්ගේත්, නිර්ධනීන්ගේත්, ධනවාදී බුද්ධිමතුන්ගේත්, ගමේ හා නගරයේ සුලු ධනපති පංතියේත් මනෝ විද්‍යාව පිළිබඳව ගැඹුරු විද්‍යාත්මක විශ්ලේෂණයක් වී. අයි. ලෙනින් විසින් දෙන ලදී.

සමාජීය මනෝ විද්‍යාත්මක විශ්ලේෂණයෙන් තොරව ඉතිහාසය, විද්‍යාව අවබෝධ කරගැනීමට ඒ රටේ ආර්ථිකය පමණක් දැන ගැනීම මදිය, ආර්ථිකයේ සිට සමාජීය මනෝවිද්‍යාව දක්වා වෙනස්වීමට සමත්විය යුතුය. දෘෂ්ටියේ ඉතිහාසය පිළිබඳව භෞතිකවාදී විස්තරයක් දීමට එවැන්නකින් තොරව කොහෙත්ම පුළුවන්කමක් නැත" යි ජී. වී. ප්ලෙහානව් ලීවේය.

අනුභූතිවාදය සහිත සමාජයීය මනෝවිද්‍යාවද, ලෝකය, ප්‍රකෘතිය, සමාජය පිළිබඳ එදිනෙද දැනුමද යථාර්ථයේ ප්‍රථම, පහත් මට්ටම පිළිබිඹු කරන අතර එය සාමාන්‍ය විඥනය හැටියට හැඳින්වෙයි. එවැනි විඥනයක් එකට කැලතුණු, අනියතාකාර, නියමිත

හැඩ-ආකාරවලට අන්තර නොවුණු දෙයක් ලෙස සැළකේ. මේ මට්ටමේදී දේශපාලනමය, සෞන්දර්යමය සහ ආගමික අදහස් හා සංකල්ප එකට මුසුවේ. මේ නයින් බලන විට, සාමාන්‍ය විඥනය, පෞද්ගලික විඥනයට කිට්ටුය. එසේවුවද එය බහුජන, සමූහ විඥනය වන්නේය.

පැවැත්ම පිළිබඳ තත්වයන්ගේ සෘජු බලපෑම් යටතේ බහු ජනතාව අතර එවැනි විඥනයක් ඉබේටම ඇතිවේ. සාමාන්‍ය විඥනය යථාර්ථයේ ද්විතීයික උසස් තලයක් පිළිබිඹු වන, විද්‍යාත්මක; ක්‍රමානුකූල විඥනයක් ඇතිකිරීම සඳහා ද්‍රව්‍ය ලෙස සේවය කරයි. දෘෂ්ටියද, සමාජ සහ ප්‍රකෘති විද්‍යාවද විද්‍යාත්මක සංකල්පයට අයත්ය.

සාමාන්‍ය සහ න්‍යායික විඥනයේ (සංකල්පය) සංස්ලේෂණය, එනම් වාස්තවික තත්වයන් අනුව සමාජයීය පැවැත්ම, දේශපාලනය හා අධ්‍යාත්මය, විද්‍යාව සහ ආගම, සාහිත්‍ය හා කලාශිල්ප ගැන මිනිසුන්ගේ නිගමනයන් වූකලී සමාජයීය මතය වන්නේය. න්‍යායය සහ විද්‍යාව සහිත සමාජය සිද්ධීන් කෙරෙහි දක්වන සාමාන්‍ය, ආනුභවික ආකල්පය මේ මතවල පැටලී ඇත. සමාජය තුළ විද්‍යාව එහි භරය හා ක්‍රියා කලාපය ගැන මීළඟ පරිච්ඡේදයේදී විශේෂ කොටසක් වෙන් කරනු ඇත. දැන් අපි දෘෂ්ටිය ගැන විභාග කරමු.

දෘෂ්ටියේ පංතිමය ස්වරූපය

පංති සහිත සමාජයේ සමාජමය විඥනය පංතිමය ස්වරූපයක් ගනී. එක් නියමිත පංතියක දේශපාලන, නීති, අධිකරණ, අධ්‍යාත්මික, කලා ශිල්පමය ආදී මේ සියලු සංකල්පයන්ගේ සමස්තය, එම පංතියේ දෘෂ්ටිය වන්නේය. දෘෂ්ටියේ පංතිමය ස්වරූපය විස්තර කරන්නේ කෙසේද? එක්, එක් පංතියක් තමාට පමණක් විශේෂ වූ දෘෂ්ටියක් නිර්මාණය කරන්නේ කවර හේතුන් නිසාද? ප්‍රතිවිරෝධීතාවයන් සහිත සමාජයේ පංති එකිනෙකට හාත්පසින්ම වෙනස් තත්වයන් දැරීමත් ඒවා ඉදිරියේ ඇති සමාජමය අරමුණු හා කාර්යයන් විවිධ වීමත් මෙයට හේතුවය. නියමිත සංකල්ප පද්ධතියක් මගින් එක් හෝ තවත් පංතියක් සමාජයේ සිය තත්වය ස්ථිර කරයි, සිය අයිතිය ආරක්ෂා කරයි, සිය අරමුණු ඉටුකර ගැනීමට ඉදිරිපත් වෙයි, සිය කාර්ය භාරයන් සපුරාලීමට ක්‍රියා කරයි. එනයින් ධනපති දෘෂ්ටිය, සිය පංතියේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට ඉදිරිපත් වෙයි, පෞද්ගලික අයිතිය සහ සූරාකෑම සදාකාලික කිරීමේ අභිලාෂයෙන් ක්‍රියා කරයි. නිර්ධන පංතිය, ධනපති පංතිය විනාශ කිරීමේත්, පංති රහිත සූරාකෑමෙන් තොරවූ සමාජවාදී හා කොමියුනිස්ටවාදී සමාජයක් ගොඩ නැංවීමේත් කාර්යයට හිමිකම්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

කියයි. ඒ සඳහා නිර්ධන පංතියට ගුණාත්මක වශයෙන් අලුත් සමාජවාදී දෘෂ්ටියක් අවශ්‍යවෙයි.

සතුරු පංතිවලට බෙදී ඇති සමාජයක් තුළ ඒ අනුව එක් දෘෂ්ටියක් තිබිය නොහැකිය. එහි සූරාකන පංතියේ දෘෂ්ටිය මෙන්ම, සූරාකෑමට භාජනය වන පංතියේ දෘෂ්ටියක්ද තිබීම අනිවාර්ය ය. ආර්ථික හා දේශපාලන වශයෙන් බලය ඇති පංතියේ දෘෂ්ටිය අධිපති භාවයක් උසුලනු ඇත. සතුරා පංතිවලට බෙදී ඇති සමාජයේ දෘෂ්තර දෘෂ්ටිමය අරගලය පංති සටනේ එක් ආකාරයක් බව අපි දනිමු.

දෘෂ්ටිමය අරගලය හැමදම පංති ස්වරූපයක් දරන බැවින් එය සත්‍යය විය හැකිද, පංති වුවමනා අනුව එය වාස්තවිකත්වය විකෘති නොකරතිද? දෘෂ්ටිය සහ සත්‍යය එකිනෙකට නොගැළපෙන බවත්, දෘෂ්ටියේදී එක් හෝ තවත් පංතියක වුවමනා නිසා සත්‍යයට හානි ඇතිවන බවත්, සංශෝධනවාදීහු සලකති. දෘෂ්ටිය කෙරෙහි සංයුක්ත ඓතිහාසික ආකල්පයක් දක්විය යුතුහයි කියන මාක්ස්වාදය එය කිනම් පංතියක — ප්‍රගතිශීලී හෝ ප්‍රතිගාමී — වුවමනා ප්‍රකාශ කරන්නේදැයි බැලිය යුතු බවද කියා සිටී. සමාජ–ඓතිහාසික ක්‍රියාවලියේ එක හෝ තවත් පංතියක් ප්‍රතිගාමී ක්‍රියා කලාපයක් ඉටුකරන තුරු, වාස්තවික යථාර්ථයේ සංවර්ධනය සමග එම පංතියේ වුවමනාවන් ගැළපෙන තුරු එහි දෘෂ්ටිය සත්‍යයෙන් යුක්ත වේ. එහෙත් කිසියම් පංතියක ප්‍රතිගාමී ක්‍රියා කලාපය සිදීගිය විගසම, එම පංතියේ වුවමනාවන් සංවර්ධනයේ වාස්තවික ගමනට විරුද්ධවූ සැටියේම, එම පංතියේ දෘෂ්ටිය තව දුරටත් සත්‍යය නොවන්නේය. එවිට පංතියේ වුවමනාවන් සඳහා යථාර්ථය විකෘති කිරීම පටන් ගැනේ.

නිදසුනක් වශයෙන් ධනවාදී දෘෂ්ටිය ගෙන බලමු. ධනපති පංතිය රදළවාදයට විරුද්ධව සටන්කළ තුරු එහි දෘෂ්ටිය සාපේක්ෂ වශයෙන් ලෝකය නිවැරදි ලෙස පිළිබිඹු කළේය. එහෙත් ධනපති පංතිය පාලන බලය අල්ලාගත් විගසම, එහි ප්‍රගතිශීලී හැකියාවන් සිදී ගොස්, එය සමාජ සංවර්ධනය අවහිර කරන්නක් බවට පරිවර්තනය වූ අතර යථාර්ථය සැබෑ ලෙස පිළිබිඹු කිරීමේ හැකියාව ධනවාදී දෘෂ්ටියට අහිමි විය. ඒ පිළිබඳව මාක්ස් මෙසේ ලියුවේය. ''පරාර්ථකාමී ගවේෂණය වන්දි භට්ට ලියන්නන්ගේ යුද්ධයකටද, සැබෑ විද්‍යාත්මක පරීක්ෂණ වෙනුවට ආවඩන්නන්ගේ වංක හෘදය සාක්ෂියද ඇතිවන්නේය.''*

කම්කරු පංතියේත්, වැඩ කරන සියලු ජනතාවගේත් නියම විද්‍යාත්මක, සැබෑ දෘෂ්ටිය මාක්ස්–ලෙනින්වාදය ය. කම්කරු පංතියේ

---

* ''ප්‍රාග්ධනය'', වෙළුම 1.

පංතිමය උවමනාවන් සහ ඉතිහාසයේ වාස්තවික ගමන හැමදම එකිනෙකට ගැළපෙන බැවින් වර්ධනයේ සියලු අවධි මත මාක්ස්-ලෙනින්වාදයේ සත්‍යතාවය එකසේ බලපායි.

3. මාක්ස්–ලෙනින්වාදී දෘෂ්ටිය

මාක්ස්–ලෙනින්වාදී දෘෂ්ටියේ විශේෂතාවය හා වැදගත්කම

පංතිමය හරය අනුවත්, අරමුණු හා කාර්ය භාරය අනුවත්, මාක්ස්–ලෙනින්වාදී දෘෂ්ටිය ඊට පෙර පැවති අන් සියලු දෘෂ්ටිවලට වඩා වෙනස්ය. පළමුවෙන්ම මාක්ස්–ලෙනින්වාදී දෘෂ්ටිය ඉතිහාසයේ පළමුවැනි වරට, සූරාකන පංතිවලට නොව, කම්කරු පංතියටත්, වැඩ කරන සියලු ජනතාවටත්, කෝටි සංඛ්‍යාත පොදු ජනතාවටත් මුළු මහත් සමාජයේ යහපත සඳහා සටන් කිරීමටද, වැඩ කිරීමට හා ජීවත් වීමටද උගන්වන නිසාත්, දෙවනුව සියලු අන්දමේ සූරාකෑම් මුලිනුපුටා දැමීම සහ පංති රහිත කොමියුනිස්ට්වාදී සමාජයක් ගොඩ නැගීම න්‍යායික වශයෙන් ඔප්පු කරන නිසාත්, තෙවනුව ගැඹුරු ලෙස විද්‍යාත්මක වන එම දෘෂ්ටිය වාස්තවික යථාර්ථය නිවැරදි ලෙස පිළිබිඹු කරන නිසාත් සමාජයේ ප්‍රධානම ද්‍රව්‍යමය අවශ්‍යතාවයන් නිවැරදි ලෙස පිළිබිඹු කරන නිසාත් එය අනිත් දෘෂ්ටිවලට වඩා වෙනස් වේ. සැබෑ තත්වය විකෘති කර පෙන්වන ආගමික විඥාන දර්ශන සමග එය නොගැළපේ. එහි න්‍යායික පදනම වූකලී දයලෙක්තික හා ඓතිහාසික භෞතිකවාදය වන්නේය. පක්ෂය සමගත්, කම්කරු පංතිය ප්‍රමුඛ සියලු ජනතාවට අවංක ලෙස සේවය කිරීම සමගත් මාක්ස්–ලෙනින්වාදී දෘෂ්ටියේ විද්‍යාත්මක භාවය ඉතා දැඩි ලෙස වෙළී පවතී.

මාක්ස්–ලෙනින්වාදී දෘෂ්ටිය අතිශයින්ම මානව හිතකාමී දෘෂ්ටිය වන්නේය. එම දෘෂ්ටියේ උසස්තම පරමාදර්ශ වූකලී ජනතාවන් හා මිනිසුන් අතර සැබෑ මානව අන්‍යොන්‍ය සම්බන්ධකම් තහවුරු කිරීමද, විනාශය ඇති කරන යුද්ධ තර්ජනවලින් මිනිස් සංහතිය බේරාගැනීමද, මිහිපිට සදාකාලික සාමය ඇති කිරීමද, සියලු දෙනාටම නිදහස් ප්‍රීතිමත් ජීවිතයක් ළඟාකර දීමද වන්නේය.

ධනපති ක්‍රමය විනාශ කිරීමේද, පැරණි නිෂ්පාදන සම්බන්ධකම්ද, අධිපත්‍යය සහ පරයීනත්වයද වෙනස් කොට ඒ වෙනුවට සහයෝගිතාවයේ සහ අන්‍යොන්‍ය අවබෝධය ඇති කිරීමේද අවශ්‍යතාවය මාක්ස්–ලෙනින්වාදී දෘෂ්ටිය විද්‍යාත්මක ලෙස තහවුරු කරයි. ධනපති පංතියට විරුද්ධව නිර්ධන පංතිය ගෙනගිය සටන් ව්‍යාපාරය තුළින්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

පැන නැගුණු එම දෘෂ්ටිය, එම සටනේදී මාර්ගෝපදේශකයා ලෙස නිර්ධන පංතියට සේවය කරමින්, සමාජවාදය සහ කොමියුනිස්ට්වාදය ගොඩ නගන මාර්ගය සහ මාධ්‍යයන් පෙන්වා දෙයි. එය සංවිධානයේ සහ ප්‍රතිනිර්මාණයේ ශ්‍රෙෂ්ඨතම බලවේගය වන්නේය.

ජනතාවගේ අතිශයින්ම උසස් අභිලාෂයන් ප්‍රකාශ කරමින්, කම්කරු පංතියේ සහ වැඩ කරන ජනතාවගේ ඉතා පුළුල් කොටස් අතර මුල්බැස ගන්නා බැවින් මාක්ස්–ලෙනින්වාදී දෘෂ්ටිය ශ්‍රෙෂ්ඨ ප්‍රතිනිර්මාණක ක්‍රියා කලාපයක් ඉටු කරයි. කෝටි සංඛ්‍යාත ජනතාවගේ සිත් සතන් නතු කර ගත් මාක්ස්–ලෙනින්වාදය බලසම්පන්න ද්‍රව්‍යමය බලවේගයක් බවට පත්වී තිබේ. එසේ වුවද එය බහු ජනතාව අතර ප්‍රචාරය වූයේ සංසිද්ධික ලෙස නොවේ. සමාජවාදය හා කොමියුනිස්ට්වාදය පිළිබඳ සංකල්ප බහු ජන විප්ලවවාදී ව්‍යාපාරය සමග එක් කරන කොමියුනිස්ට් පක්ෂ විසින් ගෙනගිය අති විශාල දෘෂ්ටිමය වැඩවල ප්‍රතිඵලයක් වශයෙනි. නිරන්තරයෙන්ම ධනපති දෘෂ්ටියත්, සංශෝධනවාදයටත්, ආධාන ග්‍රාහීත්වයටත්, පොතේගුරු වාදයටත් විරුද්ධව සටන් කරන කොමියුනිස්ට් පක්ෂ මාක්ස්–ලෙනින්වාදී න්‍යායයේ පිරිසිදු බව හා නිර්මලත්වය ආරක්ෂා කරති. මේ පක්ෂ විද්‍යාවේ සහ සමාජ ඓතිහාසික ව්‍යවහාරයේ ජයග්‍රහණ පදනම් කරගෙන මාක්ස්–ලෙනින්වාදය වර්ධනය කරති. සෝවියට් සංගමයේ කොමියුනිස්ට් පක්ෂයේ ක්‍රියාකාරීත්වයේ ප්‍රතිඵලයක් වශයෙන්, බොහෝ කලෙක සිට, මාක්ස්–ලෙනින්වාදය සෝවියට් සංගමය තුළ ප්‍රධානතම දෘෂ්ටිය බවට පත්වී තිබේ. සෝවියට් ජනතාවගේ සිත් සතන් දිනාගත් එම දෘෂ්ටිය කොමියුනිස්ට්වාදය ගොඩනැගීමේදී මහඟු ආධාරයක් දෙයි.

කොමියුනිස්ට්වාදය සාර්ථක ලෙස ගොඩ නගත්ම, මාක්ස්–ලෙනින්වාදී දෘෂ්ටියේ ප්‍රති නිර්මාණක ක්‍රියාශීලී ශක්තිය තව තවත් වර්ධනය වේ. කොමියුනිස්ට්වාදය කරා ඉදිරියට තබන හැම පියවරක්ම, ජනතාවගේ නිර්මාණාත්මක උනන්දුවේ සහ වර්ධනයේ විඥානීය ඉහළ නැගීමේ අලුත් අවධියක් වන්නේය.

IX

සමාජීය විඥනයේ ආකාර. විද්‍යාව

සමාජයීය විඥනයේ හරය හා වැදගත්කම පොදුවේ අවබෝධ කරගත් අපි එහි තනි ආකාර පිරික්සා බලමු. සමාජ ජීවිතයේදී විශේෂ වැදගත් කමක් දරන දේශපාලන හා නීති සංකල්පවලින් පටන් ගනිමු.

1. දේශපාලන හා නීති සංකල්ප

දේශපාලනය සහ ආර්ථිකය

දේශපාලනය, නැතහොත් දේශපාලන සම්බන්ධකම් වූකලී පංති අතර සම්බන්ධකම් වෙති; ප්‍රධාන වශයෙන්ම බලය අල්ලා ගැනීම සඳහාත්, සමාජයේ අධිපත්‍යය සඳහාත් පංති අතර ඇති අරගලය වේ. ඒ හැර රජයන් හා ජාතීන් අතර සම්බන්ධකම්ද දේශපාලන ක්ෂේත්‍රයට අයත් වේ. පංති, පංති සටන් සහ රජය බිහිවීමත් සමගම දේශපාලයද ඇතිවිය. රජයේ ක්‍රියාකාරිත්වයෙහි ප්‍රධාන ප්‍රවනතාවය සකස් වන්නේ දේශපාලනයෙනි.

දේශපාලනයද පංති අතර ඇති සම්බන්ධය මෙන් සමාජයේ ආර්ථික ව්‍යුහය හා එහි අඩිතාලම විසින් බිහි කෙරෙයි. දේශපාලනයේ සම්භාවය හෙළිකොට, එය සමාජයේ ආර්ථික ව්‍යුහය සමග අභේද්‍ය ලෙස වෙළී පවතින බව පෙන්වා දුන් වී. අයි. ලෙනින් දේශපාලනය යනු ආර්ථිකයේ සංකේන්ද්‍රණ ගත භාෂිතය හැටියටත්, එහි සාර සංග්‍රහයක් සහ පරිපූර්ණ කරණයක් හැටියටත් හැඳින්වූයේය. පංතීන්ගේ ආර්ථික උවමනාවන් උපරිමය ලෙසත්, සමස්තමය වශයෙනුත් ප්‍රකාශ වන්නේ දේශපාලනය තුළිනි.

ආර්ථිකය විසින් බිහි කරන දේශපාලනය ආර්ථිකය සහ සමාජ සංවර්ධනයේ සමස්ත ක්‍රියාදමයම මත ඉමහත් බලපෑමක් ඇති කරයි. ආර්ථික වර්ධනය සමාජයේ පරිවර්තනය සඳහා පසු බිම සකස් කරයි.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

එහෙත් එම පරිවර්තනය ක්‍රියාත්මක වීම දේශපාලනය විසින් මෙහෙයවනු ලබන ජනතාවගේ විඥානාත්ම ක්‍රියාකාරීත්වයේ ප්‍රතිඵලයකි. සමාජමය සංවර්ධනයේදී දේශපාලනය ඉටු කරන ඉමහත් කාර්ය කොටස සැලකිල්ලට ගත් වි. අයි. ලෙනින්, දේශපාලනය ආර්ථිකයට වඩා ප්‍රධාන වන බව පෙන්වා දුන්නේය. එසේවුවද ආර්ථිකය විසින් දේශපාලනය බිහි කරන බවත්, සමාජ සංවර්ධනයේදී තීරණාත්මක ක්‍රියාකලාපය ආර්ථිකය සතු බවත් කියැවෙන සත්‍යය මින් මටපත් නොවන්නේය. ආර්ථික හා නිෂ්පාදනමය කාර්ය භාරයන් විසඳීමේදී දේශපාලනමය හා පංතිමය දෘෂ්ටි කෝනයකින් ඒවා වෙත ළඟා විය යුතු බව මින් අදහස් වේ. ''... කාරණයට අදල නිසි දේශපාලනමය සමීප වීමකින් තොරව නියමිත පංතියකට සිය අධිපත්‍යය පවත්වා ගත නොහැකිය, ඒ අනුව එයට සිය නිෂ්පාදනමය කාර්යයන් වුවද නිසි පරිදි විසඳාලිය නොහැකැ''*යි වි. අයි. ලෙනින් ලියුවේය.

සෝවියට් සංගමයේ කොමියුනිස්ට් පක්ෂද, අනිකුත් සහෝදර කොමියුනිස්ට් පක්ෂ හා කම්කරු පක්ෂද දේශපාලනමය වශයෙන් තම කටයුතු වෙත සමීප වීම තුළින් ඒවායේ විශේෂතාවය කැපී පෙනෙයි. ඕනෑම ආර්ථික හා සංවිධානාත්මක ප්‍රශ්නයක් විසඳීමේදී කොමියුනිස්ට් පක්ෂය කම්කරු පංතියේ හා සියළු වැඩ කරන ජනතාවගේ වුවමනාවන් පදනම් කරගෙන ක්‍රියා කරයි. නිදසුනක් වශයෙන් රට කාර්මික කිරීම හා කෘෂිකර්මාන්තය සමූහගත කිරීම වැනි මූලික පියවරයන් මගින් සෝවියට් සංගමයේ ජාතික ආර්ථිකය සමාජවාදී පදනමක් මත ප්‍රතිසංවිධානය කිරීමට හේතුවූයේ කම්කරු පංතියේ සහ මුලු මහත් සෝවියට් ජනතාවගේ මූලික වුවමනාවන්ගේ බලපෑමය.

දේශපාලන සංකල්ප සහ ඒවායේ වැදගත්කම

මිනිසුන්ගේ දේශපාලන සංකල්ප හා මත දේශපාලනය සමග සමීප ලෙස සම්බන්ධව පවතී. දේශපාලනයෙන් පංතීන්, ජාතීන් හා රජයන් අතර සම්බන්ධකම් ප්‍රදර්ශනය වන අතර දේශපාලනමය සංකල්පවලින් ඒවා පිළිබිඹු කිරීමක් සහ සනාථ කිරීමක් සිදුවේ. පංති අරගලය හා විප්ලවයත්, සමාජ හා රාජ්‍ය ක්‍රමයත්, රාජ්‍යන් අතර සම්බන්ධකම් හා යුද්ධ හා සාමය පිළිබඳවූ ප්‍රශ්නයත් ගැන කිසියම් පංතියක මති මතාන්තර සම්බන්ධ කම්ද, යුද්ධයේ හා සාමයේ ප්‍රශ්නද දේශපාලන සංකල්පයනට ඇතුලත්ය. පංති අතර එක එල්ලේ කෙරෙන

---

* වි. අයි. ලෙනින්. සම්පූර්ණ කෘතීන්, වෙළුම 42, පිටු 62—63.

අරගලයේදීද, රාජ්‍ය, පක්ෂ හා වෙනත් දේශපාලන ආයතන හා සංවිධානවල ක්‍රියාකාරීත්වයෙහිදීද එම මති මතාන්තර උපයෝගී කරගනු ලැබේ.

රාජ්‍ය ව්‍යවස්ථාවලින්ද, පක්ෂ හා වෙනත් දේශපාලන සංවිධාන වල වැඩ සටහන් හා ප්‍රකාශන මගින්ද, විශේෂ න්‍යායික කෘතීන් හා වෙනත් ලියවිලි මගින්ද එම දේශපාලන සංකල්ප ප්‍රකාශ කෙරේ.

ප්‍රතිවිරෝධී පංති සහිත සමාජයේ දේශපාලන සංකල්පවල ස්වරූපය, රඳ පවතින්නේ, ඒවායින් ප්‍රකාශිත වන්නේ කිනම් පංතියක වුවමනාවන්ද යන්න මතය. සූරාකන පංතිය දේශපාලන සංකල්ප මාධ්‍යයෙන් ස්වකීය අධිපත්‍යය සාධාරණ බව පෙන්වීමටත් ආර්ථික පදනම ශක්තිමත් කිරීමටත් උත්සාහ කරයි.එම පංතියේ සංකල්පවල ස්වාභාවය ඉන් ප්‍රකාශ වේ. සූරාකෑමට භාජනය වන පංතිය, සූරාකන ක්‍රමය විනාශ කිරීමේද, සූරාකන්නන් නැති නව සමාජයක් ගොඩ නැගීමේද අවශ්‍යතාවය ඔප්පු කරමින් සිය දේශපාලන සංකල්ප ඉදිරිපත් කරයි. සූරාකනු ලබන පංතියේ දේශපාලන දෘෂ්ටිය, විප්ලවවාදී අරගලයේත්, පැරණි සමාජය විනාශ කොට නවසමාජයක් ගොඩ නැගීමේත් දෘෂ්ටිය වන්නේය.

වත්මන් ලෝකයේ එකිනෙකට ප්‍රතිවිරුද්ධ දෘෂ්ටි දෙකක් එනම් කම්කරු පංතියේ දෘෂ්ටිය සහ ධනපති පංතියේ දෘෂ්ටිය සටනක යෙදී සිටී. කම්කරු පංතියේ දේශපාලන දෘෂ්ටිය වූකලී නිර්ධන පංතික අන්තර් ජාතිකවාදයේත්, සියලු රටවල වැඩකරන ජනතාවගේ මිත්‍රත්වයේත්, සාමය ප්‍රජාතන්ත්‍රවාදය සහ සමාජවාදය සඳහා කරන පොදු අරගලයේ යෙදී සිටින සියලු ප්‍රගතිශීලී බලවේගයන්ගේ සමගියේ සහ සහයෝගිතාවයේත් දෘෂ්ටිය වන්නේය. මාක්ස්–ලෙනින්වාදී න්‍යායෙන්ද කොමියුනිස්ට් පක්ෂවල වැඩ පිළිවෙළ්වලින්ද, සමාජවාදී රටවල ව්‍යවස්ථා වලින්ද එම දෘෂ්ටිය ඉතාමත් අංග සම්පූර්ණ ලෙසත්, සෑම අංශයකින්මත් ප්‍රකාශ වේ. ධනපති පංතියට විරුද්ධවද, සමාජවාදයේ සහ කොමියුනිස්ට් වාදයේ ජයග්‍රහණය සඳහාද කම්කරු පංතිය සහ සියලු වැඩ කරන ජනතාව ගෙනයන පංති අරගලයේ අවශ්‍යතාවය එම දෘෂ්ටිය විසින් ඔප්පු කෙරේ. කම්කරු පංතිය හා එම පංතියේ දේශපාලන පක්ෂය ගෙන යන දේශපාලන අරගලයේදී, එනම් උසස්තම ආකාරයේ නිර්ධන පංති අරගලයේදී, එම පංතියට මාර්ගදේශකයකු වශයෙන් මාක්ස්–ලෙනින්වාදයෙන් සේවයක් ඉටුවේ.

කම්කරු පංතියේ ප්‍රතිපත්තිය සහ දේශපාලන සංකල්ප සැබවින්ම විද්‍යාත්මක වන්නේය. සමාජ සංවර්ධනයේ නියාමයන් ගැන ඇති

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

කරගත් අවබෝධය මත පදනම් වී ඇති එම දෘෂ්ටිය පොදු ජනතාවගේ වුවමනා සමග සම්පූර්ණයෙන්ම ගැළපෙයි. ඓතිහාසික අත්දැකීම්ද ලෝක කම්කරු හා කොමියුනිස්ට් ව්‍යාපාරයේ ශ්‍රේෂ්ඨ ජයග්‍රහණද එම සංකල්පයන්ගේ ජීව ශක්තිය කෙබඳුද යනු පෙන්නුම් කරයි.

කම්කරු පංතියේ දේශපාලන සංකල්පවලට ප්‍රතිවිරුද්ධ අධිරාජ්‍යවාදී ධනපතීන්ගේ දේශපාලන සංකල්ප නැගී සිටි වැටුප් වහල් ක්‍රමය ශුද්ධ දහමක් කොට විරාගත කිරීම ඒවායේ අරමුණ වේ. රට තුළ කම්කරු පංතිය සහ ප්‍රජාතන්ත්‍රවාදී බලවේග මර්දනය කර දැමීමේත්, ජාතීන් පීඩනයට පත් කිරීමේ සහ නව ලෝක යුද්ධයකට සැරසීමේත් ප්‍රතිපත්ති සාධාරණ කර පෙන්වීමට මේ සංකල්ප උත්සාහ දරයි.

සමකාලීන ප්‍රතිගාමී ධනපති පංතියේ දේශපාලන සංකල්ප විද්‍යාත්මක නොවේ. ඒවා සමාජ සංවර්ධනයේ වාස්තවික නියාමවලටද ජනතාවගේ වුවමනාවන්ටද පටහැණිය, එබැවින් අනිවාර්ය ලෙසම ඒවා බිඳ වැටෙනු නියතය ලෝකාධිපත්‍යය පිළිබඳ වූ නට්සි සංකල්පය බිඳ වැටුනේ යම් සේද, යටත් විජිතවාදී දෘෂ්ටිය හා ප්‍රතිපත්තියද එසේම අප ඇස් හමුවේ බිඳ වැටෙන්නේය; එලෙසම අධිරාජ්‍යවාදී ධනපති පංතියේ අනිත් සියලුම ප්‍රතිගාමී සංකල්පයන්ද බිඳ වැටෙනු නියතය.

සමාජ විඥනයේ සියලු ආකාරයන් අතුරෙන් දේශපාලනය සහ දේශපාලන සංකල්ප අන් හැමටම වඩා ආර්ථික ව්‍යූහයට සමීපව පිහිටා ඇත. රජයේ, පක්ෂවල හා වෙනත් දේශපාලන සංවිධානවල කටයුතු මගින් දේශපාලනය හා දේශපාලන සංකල්ප සමාජ සංවර්ධ–නයේ අඩිතාලමත්, එම සංවර්ධනයේ මුලු මහත් ක්‍රියාදමයත් කෙරෙහි බලපායි. එපමණක් නොව, දේශපාලනය හා දේශපාලන සංකල්ප නීතිය, සදචාරය, කලා ශිල්ප, ආගම, දර්ශනවාදය සහ විද්‍යාව යන සමාජ විඥනයේ අන් සියලු ආකාරයන්ගේ සංවර්ධනය කෙරෙහිද විශේෂයෙන්ම බලපායි. සමාජ විඥනයේ මේ ආකාරයන් සියල්ලම තුළට කාවදින දේශපාලනය සහ දේශපාලන සංකල්ප ඒවාට පංතිමය පක්ෂපාත භාවයක් ලබාදී ඒවා කිසියම් පංතියක උපකරණයක් බවට පත් කරයි.

දේශපාලනය හා දේශපාලන සංකල්පවල කර්තව්‍යය සමාජවාදී සමාජය තුළ විශේෂයෙන්ම විශාලය. සමාජය සතු දේපල ප්‍රධාන ස්ථානය ගැනීමද, සමාජවාදී සමාජයේ සැලැස්මානුගත ආර්ථික සංව–ර්ධනයේ විශේෂතාවයද නිසා සමාජවාදී රජයට හා කොමියුනිස්ට් පක්ෂයට සමාජ සංවර්ධනයේ සම්පූර්ණ ක්‍රියා දමයට විඥනක

නායකත්වයක් දීමට ඉඩ කඩ ලැබෙන්නේය. සමාජවාදී ක්‍රමයේ ජීවමය පදනම කොමියුනිස්ට් පක්ෂයේ දේශපාලන පදනම වන්නේය. සෝවියට් සංගමයේ කොමියුනිස්ට් පක්ෂය සෝවියට් රජයේ දේශීය හා විදේශීය ප්‍රතිපත්ති සකස් කරයි. ජනතාව ඉදිරියේ නියමිත කාර්යයන් ඉදිරිපත් කරන සෝවියට් සංගමයේ කොමියුනිස්ට් පක්ෂය, සමාජ සංවර්ධනයේ වාස්තවික නියාමයන්ගේ ඉල්ලීම් ගැන ඉතා උසස් සැලකිල්ලක් දක්වමින්, එම කාර්යයන් සපුරාලීම සඳහා වැඩ කරන ජනතාව මෙහෙයවයි. කොමියුනිස්ට් පක්ෂයේ අවසාන අරමුණ කොමියුනිස්ට්වාදය ය. එම අරමුණ ඉටු කැර ගැනීම සඳහා පක්ෂය රාජ්‍ය යන්ත්‍රයද, පක්ෂ හා සමාජ සංවිධානද, දෘෂ්ටිමය බලපෑමේ විවිධ මාධ්‍යයන්ද ක්‍රියාවේ යොදවයි.

නීතිය සහ නීතිමය සංකල්ප

සමාජයේ දේශපාලන සම්බන්ධකම් හැරුණු විට, මිනිස් නීතිය මගින් නියාම කරන, නීතිමය සම්බන්ධකම්ද ඇත්තේය. නීතිය වූකලී සමාජයේ මිනිසුන් හැසිරවීම සඳහා පනවන ලද අනිවාර්ය සම්මතයන්ගේ හා රීතිවල සමස්තය වන්නේය. රජය හා එය සතු බලකිරීමේ සහ අධ්‍යාපනය දීමේ බොහෝ ගණනක් අවයව මගින් ආරක්ෂා කරනු ලබන එක් එක් නීතිවලින් මෙම සම්මතයන් හා රීති විස්තර කරනු ලැබේ.

නීතියද, දේශපාලනය මෙන්ම පංති හා රජය බිහිවීමත් සමගම ඇති විය. එය නීතිම ආකෘති අනුව ප්‍රකාශ කරන ලද පාලක පංතියේ මනාපයය. එය එම පංතියේ දේශපාලන හා ආර්ථික වුවමනාවන් ආරක්ෂා කරයි.

සතුරු පංති සහිත සමාජ ඉතිහාසය වහල්, රදළ, ධනපති නීති ගැන දනී. සූරාකන්නන්, සූරාකනු ලබන්නන්ට විරුද්ධව කළ අරගලවලදී මේ නීති හැම එකක්ම එම සූරාකන්නන්ට ආධාරකාරී විය. වැඩ කරන ජනතාවගේ අයිතිවාසිකම් පිළිබිඹු කරන සමාජවාදී නීතිය පමණක් සැබෑ ජනතා නීතිය වන්නේය.

මිනිසුන්ගේ නීතිමය සම්බන්ධකම් හඳුනා ගැනීමේදී, නියමිත සමාජයක නීතිය කෙරෙහි මිනිසුන්ගේ ආකල්පය විස්තර කරන නීති සංකල්ප හා මතවලින්ද, ජනතාවට, රජයට හා ජාතීන්ට අදාල කරුණු–වල නීති සහගත භාවය හා නීති විරෝධී භාවය ගැනත්, අනිවාර්ය හා අනිවාර්ය නොවන ස්වාභාවය ගැනත් දරන මතවලින්ද ඒවා වෙන් කොට ගත යුතුය.

නීති සංකල්ප හා මත පංති ස්වරූපයක් දරන අතර ඒවා නිශ්චිත පංතියක වුවමනාවන් ප්‍රකාශ කරයි. සතුරු පංති සහිත සමාජයක

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

සූරාකන පංතියේ නීති සංකල්ප බලය උසුලයි. බලය අල්ලා ගෙන සිටින පංතිය තම අණසක සමාජයේ වෙනත් පංතීන් මත පැටවීම සඳහා රාජ්‍යයන්ත්‍රය පමණක් නොව, නීති සංකල්පද පාවිච්චි කරයි. එම පංතිය තමන් පැණවූ නීති හා පණත් සාධාරණ බව පෙන්වීමට පමණක් නොව, ඒවායේ පංති ස්වරූපය සැඟවීමටත්, ඒවා මුළු මහත් ජනතාවගේ නීති හැටියට හා සාධාරණත්වයේ සහ යහපත් බවේ උත්තරීතර ප්‍රකාශනයක් හැටියට පෙන්වීමටත් මෙම සංකල්ප උපයෝගී කරගනිමින් උත්සාහ දරයි.

නිදසුනක් වශයෙන් ධනපති සමාජය ගෙන බලමු. ධනපති පංතියේ නීති සංකල්ප මත පදනම් වූණු ධනවාදී නීති පද්ධතියක් එම සමාජයේ තිබේ. ධනවාදී නීතියට වඩා සාධාරණ නීතියක් නැති බවත්, එය ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රතිමූර්තිය බවත්, ධනවාදී අධිකරණය අපක්ෂපාත බවත් යනාදිය ඔප්පු කිරීම මේ සංකල්පවල පරමාර්ථය වන්නේය. එහෙත් සත්‍යය නම් ධනවාදී නීතිය ධනවාදීන්ට සේවය කරමින්, ධනවාදී දේපල ආරක්ෂා කරන බවයි. සූරාකෑමත් සියලු ප්‍රගතිශීලී බලවේග මර්දනය කිරීමත් සාධාරණ කර පෙන්වීමට උපකාර වන බවයි.

සමාජවාදී රජය බිහිවීමත් සමගම සමාජ ඉතිහාසයේ පළමුවැනි වරට මිනිසුන් අතර පංතිමය අසමානතාවය නීති විරෝධී කරන පළමුවැනි නීතිය, එනම් සමාජවාදී නීතිය ඇති වේ.

සමාජවාදී නීතියත්, එහි අඩිතාලම වන නීතිමය සංකල්පයනුත් සතුරු පංති සහිත සමාජයේ නීතියට සහ නීතිමය සංකල්පවලට වඩා හාත්පසින්ම වෙනස්ය. ඒවා මුලු මහත් ජනතාවගේම අයිතිය ප්‍රකාශ කරයි, සමාජවාදී ආර්ථික පදනමත්, සමාජවාදී දේපලත් ආරක්ෂා කොට ඒවා තහවුරු කිරීමට ආධාර දෙයි; සමාජවාදී නීතියට ගරු කිරීමටත්, තම යුතුකම නිසියාකාර ඉටු කිරීමටත් සමාජවාදී රටවල ජනතාවට උගන්වයි. නීතියක් නැති තත්වයත්, පෞද්ගලික වුවමනාවන් පහත්කොට සැලකීමත් සමාජවාදයට කොහෙත්ම නොගැලපේ. එබැවින් සමාජවාදී රටවල් හා කොමියුනිස්ට් පක්ෂ නිරතුරුවම සමාජවාදී නීතිය සවිමත් කරති. එම නීති උල්ලංඝනය කිරීමට දරන ප්‍රයත්න නොඉවසති.

සමාජවාදී සමාජයේ අණ පනත් හා නීති පොදු ජනතාවගේත්, වැඩ කරන ජනතාවගේත් උවමනාවන්ට සම්පූර්ණයෙන්ම ගැළපෙන බැවින්, රටේ ජනගහණයෙන් අති විශාල බහුතර සංඛ්‍යාව අවබෝ-ධයෙන් යුක්තව හා සිය කැමැත්ත අනුවම ඒවා පිළිපදිති. දුෂ්ට චේතනා-වෙන් සමාජ සාමය කඩ කරන සමාජයේ දේපලවලට හානි කරන

සහ වෙනත් අපරාධ කරන අයට පමණක් විරුද්ධව සමාජවාදී රජයන් බලය යොදා කටයුතු කරති.

සමාජය කොමියුනිස්ට්වාදය කරා ඉදිරියට යත්ම, නීති ගරුක වන ලෙස ජනතාවට බලකර බලවේගය වශයෙන් රජය ඉටුකරන කාර්ය කොටස කෙමෙන් අඩු වන්නට පටන් ගනී. එවිට සමාජවාදී නීතිය හා සාමය ආරක්ෂා කිරීමේ කාර්‍ය්‍යය කෙමෙන් සමාජ සංවිධා-නවලට පැවරේ. මෙහිදී සමාජ සංවිධානවල කර්තව්‍ය වන්නේ නීතිය කඩ කරන්නා සොයා ඔහුට දඬුවම් දීමට වඩා නීති කඩ කිරීම වැළැක්වීම සඳහාත්, ජනතාව නීති ගරුක වන සේද, අවබෝධයෙන් යුතුව නීති පිළිපදින සේද ඔවුනට උගැන්වීම සඳහාත් කටයුතු කිරීමය.

අනාගතයේදී, ජනතාවගේ ද්‍රව්‍යමය සහ සංස්කෘතික තත්වයන් වැඩි දියුණු වීමත්, ඔවුන්ගේ සමාජමය විඥානය සහ සංවිධානය දියුණු වීමත් හේතු කොට ගෙන නීති කඩ කිරීම සම්පූර්ණයෙන්ම නැතිකර දැමීමට හා විනයානුකූල දඬුවම්දීම වෙනුවට සමාජමය බලපෑමේ සහ අධ්‍යාපනික පියවරයන් ගැනීම මුළු මනින්ම ආදේශ කිරීමට අවශ්‍යතා-වයන් නිර්මාණය වනු ඇත. කොමියුනිස්ට්වාදයේ පූර්ණ ජය ග්‍රහණයත් සමගම නීතියේ අවශ්‍යතාවයද අහෝසි වනු ඇත. නීතිය හා යුතුකම කොමියුනිස්ට්වාදී ජීවන ක්‍රමයේ ඒකීය දෙයක් බවට පත් කරන ඓන්ද්‍රියමය සමගියක් ඇති වනු ඇත.

2. සදාචාරය

සදාචාරයේ හරය සහ සමාජ ජීවිතය තුළ එයට හිමි ස්ථානය

සදාචාරය හෙවත් ආචාර ධර්ම වූකලී සාධාරණත්වය සහ අසාධා-රණත්වය, ගෞරවය සහ අගෞරවය, හොඳ සහ නරක ආදිය පිළිබඳව මිනිසුන්ගේ අදහස් පිළිබිඹු කරන, සමාජයේ ඔවුන්ගේ හැසිරීම පිළිබඳවූ සම්මතයන් හෝ රීති සම්මතය වන්නේය. නීතිමය සම්මතයන් මෙන්, නීතියෙහි ලේඛනගත කර නැති සදාචාර සම්මතයන්, මහජන මතය, සිරිත්, පුරුදුකම් හා අධ්‍යාපනය මගින්ද මිනිසාගේ අවබෝධ ශක්තිය මගින්ද රැක ගනු ලැබේ. මිනිසා සමාජය සමගත්, වෙනත් ජාතීන් සමගත්, පවුල හා සෙසු මිනිසුන් සමගත් ඇති කරගන්නා සම්බන්ධය එම සම්මතයෙන් හා අනුව නිගමනය කෙරේ.

මිනිස් සමාජය ඇතිවීමත් සමගම සදාචාරයද ඇතිවිය. සමාජය එහි සදාචාර සම්මතවලින් ප්‍රකාශවන පැවතුම් රකින ලෙස එම සාමා-ජිකයන්ට සැමකල්හිම බල කළේය. මේ සම්මතයන් සදාකාලික ඒවා

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

නොවේ. නිෂ්පාදනයේ, විශේෂයෙන්ම නිෂ්පාදන සම්බන්ධකම්වල වෙනස්වීමේ බලපෑම යටතේ ඇතිවන සමාජ සංවර්ධනය හා සමග ඒවා වෙනස් වේ. ආදිකල්පික සමාජයේදී සමාජිකයින් සියලු දෙනාට එක සමාන සදචාර සම්මතයක් තිබිණි. පංති ඇතිවීමත් සමගම සදචාර එක් හෝ තවත් පංතියක වුවමනාවන් නියෝජනය කළේය. සදචාර පංතිමය ස්වභාවයක් ගත්තේය. සතුරු පංති සහිත සමාජයේ සූරාකන්නන්ගේ සදචාරයකුත්, සූරාකනු ලබන්නන්ගේ සදචාරයකුත් තිබෙන අතර පාලනය කරන පංතියේ සදචාරය බලවත්ව සිටී. වහල් සමාජයේදී වහල් හිමියන්ගේ සදචාරයද, රදළ ප්‍රවේණි සමාජයේදී ඉඩම් හිමි රදළයින්ගේ සදචාරයද, ධනපති සමාජයේදී ධනපතීන්ගේ සදචාරයද එලෙස බලවත් විය. ඒවාට විරුද්ධ පැත්තේ වහලුන්ගේ, ගොවීන්ගේ හා නිර්ධනීන්ගේ සදචාර සම්මතයන් සහ ප්‍රතිපත්ති විය.

උඩු ව්‍යුහයේ මූලිකාංගයක් වන සදචාරය සමාජ ජීවිතයේ හැම අංගයකටම බලපායි. වැඩ කිරීම සහ දේපල කෙරෙහි මිනිසුන් දක්වන ආකල්පය තුළින් සදචාරය ආර්ථිකයට බලපායි. නිදසුනක් වශයෙන් සමාජවාදී දේපල සුද්ධ සහ අනුලංඝනීය බව ප්‍රකාශයට පත් කරන කොමියුනිස්ට්වාදී සදචාරය සමාජවාදයේ ආර්ථික පදනම ආරක්ෂා කරයි. සදචාර දේශපාලනයට කෙළින්ම සම්බන්ධ වී තිබේ. රජයේ ඕනෑම දේශපාලන ක්‍රියාවක්ම සදචාර තක්සේරුවකට භාජනය වේ. සමාජයේ ජනතාව එයට කැමැත්ත දක්වති. නැතිනම් අප්‍රසාදය දක්වති. එක් හෝ තවත් දේශපාලන ක්‍රියාවකට පොදු ජනතාවගේ සදචාර අනුමතිය ලැබීම, එය සාර්ථකවීම සඳහා ඉතා වැදගත් සාධකයක් වීම ස්වාභාවිකය. සෝවියට් සංගමය විසින් ක්‍රියාවට නගන සාමකාමී ප්‍රතිපත්තිය සාර්ථක වීමට බොහෝ දුරට හේතුවී ඇත්තේ එයට ලෝකයේ සියලු රටවල ජනතාවගේත්, ප්‍රගතිශීලී මිනිස් සංහතියේ අනුමතිය ලැබී තිබීමය.

වත්මන් අවධියේදී එකිනෙකට විරුද්ධව නැගී සිටින සදචාර දෙකකි: එකක් කොමියුනිස්ට්වාදීය, අනික ධනවාදීය. මේ සදචාරවල හරය කවරේද, ඒවා මෙහෙ කරන්නේ කුමණ නම් සමාජ අරමුණු සාර්ථක කිරීමටද? ධනවාදී සදචාරය අධිරාජ්‍යවාදීන්ගේ වුවමනා ආරක්ෂා කරමින්, සමාජ සංවර්ධනයේදී ප්‍රතිගාමී ක්‍රියා කලාපයක් ඉටු කරයි. එහි ප්‍රධාන පරමාර්ථය, ධනවාදයේ ප්‍රධාන පදනම වන පෞද්ගලික දේපල හිමිකම සහ සූරාකෑම ආරක්ෂා කිරීමය. ආගමික සදචාර ඉටුකරන්නේත් මේ කාර්යමය. අසල්වැසියාට ආදරය කරනු, දුෂ්ටත්වයට සහ ප්‍රචණ්ඩත්වයට විරුද්ධව නැගී නොසිටිනු යනුවෙන් ෙකෙරාටික ලෙස දේශනා කරන ධනවාදී ආගමික සදචාරය ධනවාදී

තත්වයන් යටතේ සූරාකෑමට විරුද්ධව සටන් කරන වැඩකරන ජනතාව එම සටන්වලින් ඈත් කරවයි, යටත්වීම සහ ඉවසීම නිසා මරණින් පසු ස්වර්ගයෙහි සැප සම්පත් ලැබෙන බව කියමින් ඔවුන් අස්වසාලයි.

ධනපති ක්‍රමයේ පරිශුද්ධ වස්තුව වන ලාභය බෙදගැනීමට කරන සටනේදී මිනිසුන් භේද භින්න කරන, ඔවුන් එකිනෙකා අන්‍යොන්‍ය සතුරන් හා තරඟකාරීන් බවට පත්කරන පෞද්ගලික අයිතියේ අධිපත්‍යය අනුව ධනවාදී සදචාරය හැඩ ගැසෙන්නේය. ලාභය ලබාගැනීම සඳහා කරන තරඟයේදී ධනපතියා සියලු මානුෂික සදචාරයන් පාගා දමයි; ඔහු වටා සිටින මිනිසුන්ගේද, සිය රටේ සහ සමස්තයක් වශයෙන් සමාජයේද ඉරණම කෙරෙහි ඔහු මදතුදු නොතකයි. ඔහු සිය ආත්ම ලාභය ලෝකයේ අන් සියලු දේටම වඩා උසස් කොට සලකයි. ධනපති සදචාරයේ ප්‍රධාන මූලධර්මය සීමාන්තික පරමාර්ථ කාමය ය. "මිනිහෙක් මිනිහෙකුට වෘකයෙකි", "තාමාට තමන්ගේම පිහිටය, හැමදෙනාටම දෙවි පිහිටය" ධනපති සමාජයේ සදචාරය ප්‍රකාශයට පත් කරන ආචාර ධර්ම එසේය. පෞද්ගලික අයිතිය රජයන සමාජයක ආචාර ධර්ම මනින උසස්තම මිම්ම මුදල් හැටියට ගැනෙන, ආලය හා අවංකකම, ගරුත්වය හා හෘදය සාක්ෂිය යනාදී හැම දෙයක්ම විකුණනු, හා මිලදී ගනු ලබන, සමාජයක වෙනත් රීතිවලට ඉඩක් ඇත්තේ නැත.

ධනපති සමාජයේ සදචාරයේ හරය වනාහී, පුද්ගලාර්ථවාදය, ආත්ම ලාභය, ලාභ ලබා ගැනීමේ පිපාසය, සතුරු බව සහ තරඟය වන්නේය. ධනපති සමාජය රඳන පදනම වන මිනිසකු විසින් මිනිසා සූරාකෑමේ ප්‍රතිපත්තිය විසින් ආචාර ධර්ම දුෂ්ටතම ලෙස උල්ලංඝනය කරනු ලැබේ.

කොමියුනිස්ට්වාදී සදචාරය වූකලී ලෝකයේ ඉතා ප්‍රතිගාමී, අතිශයින්ම මානව හිතකාමී, උදාර සදචාරය වන්නේය. එය සූරාකන්නන් අතලොස්සකගේ නොව, සමාජයේ අති බහුතර සංඛ්‍යාවකගේ, සියලු වැඩ කරන ජනතාවකගේ වුවමනාවන් හා පරමාදර්ශයන් ප්‍රකාශ කරයි.

වැඩ කරන ජනතාව විසින් සූරාකෑමට හා සදචාරයට පටහැනි දුෂ්චරිතවලට විරුද්ධව ගෙනගිය සටන්වලදී නිර්මාණය වුණු සරල පොදු මානුෂික සදචාරය ගුණ ධර්ම, කොමියුනිස්ට්වාදී සදචාරයට අයත් වේ. නොවක් ගතිය, අවංකත්වය, ආත්ම ශක්තිය, නිර්භයත්වය නිසාත්, තම තමන් කෙරෙහිත්, තම දරු පවුල සහ වැඩිහිටියන් කෙරෙහිත් දක්වන යුක්ති ගරුක ආකල්පය නිසාත් වැඩ කරන ජනතාව විශිෂ්ටත්වයක් දරන බව ප්‍රකටය. සූරාකන්නන්ට විරුද්ධව කළ සටනේදීත්, සමගිව ශ්‍රමය වැය කිරීමේදීත්, අන්‍යොන්‍ය ආධාරය

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

සහෝදරාත්මක සහයෝගිතාවය, අලසයින්, රස්තියාදු කාරයින් නොඉවසීම වැනි සදචාර ගුණ ධර්ම ඔවුහු නිර්මාණය කළහ. සියවස් ගණනක් තිස්සේත්, පරම්පරා කීපයක් තිස්සේත් මාරුවෙමින් පැමිණි ආචාර ධර්මවල චාම් සම්මති වලින් ඒවා සමන්විතය. සමකාලයේ අතිශයින්ම පුරෝගාමී පංතිය වූත්, කොමියුනිස්ට්වාදී සමාජයේ නිර්මාණකයාවූත් කම්කරු පංතියේ සදචාරය, සමාජයේ ආචාර ධර්මවල වර්ධනයේත් කොමියුනිස්ට්වාදී සදචාරයේ සම්මති හා අවශ්‍යතාවයන්ගේත් සැකැසීමේදී විශාල වැදගත්කමක් දරයි.

කොමියුනිස්ට්වාදී සදචාරය බිහිවූයේ ධනපති සමාජයේදීය. එහිදී එය අසමානතාවයට හා සූරාකෑමට විරුද්ධව නැගී සිටියේය, ධනවාදී වහල් භාවයෙන් විමුක්තිය ලබා, මිත්‍රත්වයේ සහ සහෝදරත්වයේත්, සහයෝගිතාවයේ සහ අන්‍යොන්‍ය ආධාරයේත්, සම්බන්ධතාවයන් මත පදනම් වූ රීති තහවුරු කිරීම කොමියුනිස්ට්වාදී සදචාරයේ අභිලාෂය වුයේය. එහෙත් ධනපති සමාජයේ කම්කරුවන්ගේ, වැඩ කරන ජනතාවගේ සදචාරය ප්‍රධාන තත්වයක් නොදරයි. කොමියුනිස්ට්වාදී සදචාරයට එම ස්ථානය ලැබෙන්නේ, ධනපති ක්‍රමය විනාශ කොට සමාජවාදී සමාජයක් ගොඩනැගූ ඉක්බිතිවය. සමාජවාදය ගොඩ නැගීමේ ප්‍රතිඵලයක් වශයෙන්ද, සෝවියට් සංගමයේ කොමියුනිස්ට් පක්ෂයේ සහ සෝවියට් රජයේ අති විශාල සංවිධානාත්මක හා අධ්‍යාපනික ක්‍රියා නිසාද, සෝවියට් සංගමය තුළ කොමියුනිස්ට්වාදී මූලධර්මය බල පාන්නට විය.

වී. අයි. ලෙනින් පෙන්වා දුන් පරිදි, කොමියුනිස්ට්වාදී සදචාරය නිර්ධන පංතියේ පංති අරගලයේ වුවමනාවන්ට යටත්ය. එම සදචාරයේ හරය හා අරමුණ කොමියුනිස්ට්වාදය ගොඩනැගීම හා තහවුරු කිරීමය. සෝ: සං: කො: පක්ෂයේ වැඩ පිළිවෙළ තුළ දක්වා ඇති කොමියුනිස්ට්වාදය ගොඩනගන්නාගේ සදචාර ගුණධර්ම සංග්‍රහය සකස් කොට ඇත්තේ ලෙනින්ගේ එම අදහස් පදනම් කරගෙනය. කොමියුනිස්ට් සදචාරය පිළිබඳ මතය අනුව, සමාජය කොමියුනිස්ට්වාදය කරා යන ඉදිරි ගමනට ආධාර වන දේ සුචරිතවත් වේ. කොමියුනිස්ට්වාදී සද්ව්‍යාපාරයට ඇප කැප වීමත්, අනාගත කොමියුනිස්ට් ක්‍රමය කරා යන මග මිනිස් වර්ගයා සඳහා හෙළි-පෙහෙළි කරන සමාජවාදී මවු බිමට ලැදි වීමත්, සියලු සමාජවාදී රටවලට ලැදි වීමත් සෝවියට් රටවැසියන්ගේ සදචාර ගුණධර්ම සංග්‍රහයේ ප්‍රධාන කොන්දේසිය වන්නේය.

සැම සෝවියට් රටවැසියකුගේම යුතුකම හා ගෞරවයට හේතුවක් වන ශ්‍රමය සමාජයේ ධනය සහ, සමාජවාදී සමාජයේ සැම සාමාජික-

යකුගේම පෞද්ගලික සුබසිද්ධිය ගෙන එන උල්පත වන්නේය. සමාජයේ සුබසිද්ධිය තකා අවංකව වැඩකිරීමද, සමාජයේ දේපල ආරක්ෂා කිරීම සහ වර්ධනය කිරීම සම්බන්ධයෙන් සැම කෙනෙකුගේම උනන්දුවද කොමියුනිස්ට්වාදී සදචාර සංග්‍රහයේ ඉතාම වැදගත් අපෙක්ෂාවන් වන්නේ එබැවිනි. සමාජවාදයේ අනිවාර්ය රීතිය වන වැඩ නොකරන්නේ කවරෙක්ද හේ අනුභව නොකළ යුතුය, යන්න බොහෝ කළක සිට තම රීතිය කරගත් සෝවියට් සංගමයේ අති විශාල බහුතර සංඛ්‍යාව ශ්‍රමය ශුද්ධවූ දෙයක් ලෙස සලකති. මවුබිමේ සුබසිද්ධිය සඳහා වැය කරන ශ්‍රමය තුළින් සෝවියට් ජනතාව සිය ප්‍රීතිය සහ වාසනාව දකිති.

කොමියුනිස්ට් සදචාරයේ මූලධර්මය, සමාජවාදී ක්‍රමයේ ස්වභාවයෙන්ම, එනම්, එහි ආර්ථික පදනම වන නිෂ්පාදන මාධ්‍යයන් සතුවී තිබීමෙන්ම පැන නගී සමාජය සතු දේපල ජනතාව සමගි කරයි; සහෝදරාත්මක මිත්‍රත්වයෙන්, අන්‍යොන්‍ය ගරුත්වයෙන් හා සහයෝගිතාවයෙන් වැඩ කිරීමට සහ ජීවත්වීමට ඔවුනට එය ආධාරකාරී වෙයි. එකා සැමටත්, සැම එකාටත් නැමති උද්යෝග පාඨයෙන් ප්‍රකාශ කෙරෙන සාමූහිකත්වය සහ සහෝදරාත්මක අන්‍යොන්‍යාධාරය වැනි කොමියුනිස්ට්වාදී සදචාරයේ වැදගත් මූලධර්මයන් ඇති වූයේ එහෙයිනි.

මිනිසාගේ හැසිරීමේ ප්‍රධාන අංගය සමාජයට, සමූහයට සේවය කිරීමේත්, පෞද්ගලික වුවමනාවන් සමාජයේ හා පොදු ජනතාවගේ වුවමනාවන්ට යටපත් කිරීමත් සාමූහික මූලධර්මයේ තේරුම වන්නේය. සමාජවාදය ධනවාදී සදචාරයට වඩා හාත්පසින්ම වෙනස් — සහයෝගිතාවයේ සහ සාමූහිකත්වයේත්, මිත්‍රත්වයේ සහ අන්‍යොන්‍ය ආධාරයේත් සදචාරයක් ඉදිරිපත් කරයි. පොදු ජන යහපත සඳහා සේවය කිරීමත්, සාමූහික තත්වයන් යටතේ මිනිස් පෞද්ගලිකත්වය හැම අතින්ම වර්ධනය් කර ගැනීමත්, එම සදචාරයේ ප්‍රධාන ඉල්ලීම වන්නේය. සමාජවාදී සමාජය යටතේ සමාජයේ වුවමනාවන් ගැන සැලකිලිමත්වීම පෞද්ගලික උවමනාවන්ට කොහෙත්ම හානිකර නොවේ. සෝවියට් රටවැසියෙක් කරන හැම යහපත් දෙයක්ම ඔහුගේ මෙන්ම පොදු ජනතාවගේද යහපත පිණිස වන්නේය. තමාගේ වැඩ කොටස හොඳින් සහ නිසිවේලාවට සපුරාලීමෙන් ඔහු තම සගයින් ගැනද සැලකිලි දක්වයි. සගයෝද ඒ අතර හැම දෙනාත්, ඔවුන් වෙනුවෙන් වැඩ කරති. සමාජවාදී සමාජය තුළ සමාජයේ හා පුද්ගලිකත්වයේ මූලික අවශ්‍යතාවයන් ඓන්ද්‍රීයමය ලෙස ගලපාලීම මින් පිළිබිඹු වේ. සමාජවාදී නිෂ්පාදනයේ අරමුණ මිනිසාගේ අවශ්‍යතාවයන් සපුරාලීමය.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

සිය සමාජයටද, සිය ජනතාවටද ප්‍රයෝජනවත් කෙනෙකු වීමේ අභිලාෂය විසින් සමාජවාදී රටවල මිනිසා කාර්ය සාධනය සඳහා පොළඹවනු ලැබේ.

යුතුකම, හෘදය සාක්ෂිය හා ගෞරවය වෙත පිවිසුම් මග පදනම්වී ඇත්තේ සාමූහිකත්වය මතය. සමාජයට ප්‍රයෝජනවත් වීමත්, දියුණුව සඳහා සේවය කිරීමත්, පොදු යහපතට හානිකරන ක්‍රියා නොඉවසීමත් මිනිසාගේ යුතුකම සහ ගෞරවය වන්නේය. සමාජයට ප්‍රයෝජනවත් මිනිසා එහි දියුණුව සඳහා හැම දෙයක්ම කරයි. සමාජයේ හා ජනතාවගේ යහපත පිණිස තමන්ගේ හැකි හැම දෙයක්ම කරන පුද්ගලයාගේ හෘදය සාක්ෂිය පිරිසුදුය; ඔහුට සමාජ යුතුකම පිළිබඳව උසස් හැඟීමක් ඇත්තේය.

නිර්ධන පංතික ජාත්‍යන්තරවාදයද, සමාජවාදී දේශප්‍රෙමීත්වය සහ මානව හිතවාදයද සමාජවාදී සමාජයක අධ්‍යාපනයේ මූලික අනිවාර්ය කොන්දේසි වේ. සමාජවාදී මානව භක්තිය ගුණාත්මක වශයෙන් උසස් අළුත් දෙයකි. එය සැබෑ මානව හිතකාමී සම්බන්ධකම් වලින් හා මිනිසුන් අතර වන අන්‍යොන්‍ය ගෞරවයෙන් සැදුම් ලද්දේය. ඉන් අදහස් වන්නේ මිනිහෙක් මිනිහෙකුට මිතුරෙකි, සගයෙකි, සහෝදරයෙකි යනුයි. මිනිසාට ගරු කිරීමත්, ඇළුම් කිරීමත්, ඔහුගේ ද්‍රව්‍යමය හා අධ්‍යාත්මික ශුභ සිද්ධිය ගැන සැලකිලිමත් වීමත්, යන කරුණු කොමියුනිස්ට්වාදයේත්, සාමයේත්, ජාතීන්ගේත් ස්වධීනත්වයේත් හතුරන් කෙරෙහි දක්වන අසමාදන ආකල්පය සමග එකට සම්බන්ධ කිරීම සමාජවාදී මානව භක්තියෙන් ඉටු කෙරේ.

තම මවුබිම කෙරෙහි ආදරය හා කැපවීමක්ද, මුළු මහත් සමාජවාදී රාෂ්ට්‍ර පද්ධතිය කෙරෙහි නිර්ධන පංතික ජාත්‍යන්තරවාදී ආකල්පයකින් ඇල්මක් හා කැපවීමක් දක්වීමද, ලෝකයේ සියලු රටවල වැඩ කරන ජනතාවටද, සෙසු ලෝක ජනතාවටද සහෝදරාත්මක සමගියක් දක්වීමද, වෙනත් ලොකු හා කුඩා රටවල සියලු රාජ්‍යයන් කෙරෙහි ගෞරවයක් දක්වීමද ආදී මේ සියලු ගුණාංග සංයෝජනය කරන සෝවියට් දෙශ්ප්‍රෙමීත්වයද ගුණාත්මක වශයෙන් නව, උසස් වර්ගයට අයත්ය. ජාතියක් වශයෙන් කොන්වීමේ හා ජනතාවන් අතර භේද ඇතිකිරීමේ දෘෂ්ටිය වන ජාතිවාදයද, ජාතික අසමානතාවය සහ වැඩ කරන ජනතාව අතර අසමගියද සෝවියට් දේශප්‍රෙමීත්වය සමග කොහෙත්ම නොගැළපේ. සෝවියට් සංගමයේ වාසය කරන සියලු ජනතාවන් අතර මිත්‍රත්වය සහ සංහෝදරාත්වය රැකීමද, ජාති හා ගෝත්‍ර භේද නොඉවසීමද කොමියුනිස්ට් සමාජයේ සදචාර ගුණධර්ම සංග්‍රහයෙන් ප්‍රකාශිතය.

සමාජවාදී පොදු ජීවිතයේ රීතීන් අනුගමනය කරන ලෙසත්, වැඩිමහල් අය හා ස්ත්‍රීන් කෙරෙහි ආචාරවත් සැලකිලි දක්වීමත් පවුලේ සාමාජිකයින් අතර අන්‍යොන්‍ය ගරුත්වයක් දක්වීම හා දරුවන් ඇති දැඩි කිරීම ගැන සැලකිලිමත් වීමත් අපේක්ෂා කරන සමාජවාදී ජීවන ක්‍රමයේ රීති අනුගමනය කරන ලෙස කොමියුනිස්ට් සදචාරය ජනතාවට බල කරයි.

කොමියුනිස්ට්වාදී සදචාරයේ මූලධර්ම අනුව මිනිස් චරිතයේ නියමිත ගුණාංග තිබිය යුතුය. අවංක භාවය හා සත්‍ය ගරුක භාවය, සදචාරාත්මක පිරිසුදු බව, සමාජ ජීවිතයේදී සහ පෞද්ගලික ජීවිතයේදී චාම්බව සහ නිහතමානී භාවය පිළිපැදීමත්, අසාධාරණත්වය, පරපෝෂිතවාදය, වංක බව, මුදල් කෑදරකම, හා ආත්මාර්ථ සිද්ධිය ඉවසා නොසිටීමත් යන මේ ගුණාංග තිබීම කොමියුනිස්ට්වාදී සදචාරය විසින් අපේක්ෂා කෙරේ.

3. ආගම

ආගමේ හරය සහ එහි ප්‍රතිගාමී කාර්ය කොටස

ආගම වූකලී යථාර්ථයේ විකෘති, කරන ලද මනඃ කල්පිත පිළිබිඹුවකි. "... කෙසේවුවද සියලුම ආගම් ගත්කළ ඒවා මිනිසුන්ගේ එදිනෙදා ජීවිතය පාලනය කරන්නාවූ බාහිර බලවේග ඔවුන්ගේ සිත් තුළ මනඃකල්පිත ලෙස පිළිබිඹු කර ගැනීමකි; මෙහිදී ලෞකික බලවේග අද්භූත ආකාරයක බලවේග වශයෙන් පෙන්වා ඇත,"*යි ෆ්‍රෙඩ්රික් එංගල්ස් ලියුවේය.

ආගමික හැඟීම මිනිසාට ස්වාභාවිකයෙන්ම ආවේණික වූ දෙයක් ලෙස පෙන්වීමට සූරාකන පංතිවල දෘෂ්ටිවාදියෝ වෑර දරති. එහෙත් ආගම් ඇතිවූයේ සමාජ සංවර්ධනයේ එක්තරා නිශ්චිත අවධියකදීය. ස්වාභාව ධර්මයේ හා සමාජයේ සංස්කාර ධර්මතාවන්ට හේතුවූ සැබෑ කරණු ගැන දැනුමක් නොමැතිකමද, ස්වාභාව ධර්මයේ සාංසිද්ධික බලවේගයන්ගේ බිය ජනක ශක්තිය හා සමාජ පීඩනයද ආගමේ මූලාශ්‍රයන් වශයෙන් ගත හැකිය.

ආගමේ අරටුව අද්භූත දේ ගැන විශ්වාස කිරීමය. ප්‍රකෘතියේ බලවේගයන්ගේ පිහිටාධාරය සෙවූ මිනිසා ඒවාට අත්භූත බලයක් ආරූඪ කොට ඒවා දෙවිවරුන්, භූතයින්, යකුන් හා දේවදූතයින් ආදීන් බවට පත් කළේය. මේ අද්භූත බලවේග සතුටු නොකොළොත් ඒවා

* කාල් මාක්ස් සහ ෆ්‍රෙඩ්රික් එංගල්ස්, කෘතීන් එකතුව, පිටුව 328.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

තමන්ට දුක හා කරදර ගෙන දිය හැකි බවත්, ඒවාට ගරු කොට, වැඳ නමස්කාර කළොත්, ඒවා තමන්ට උදව් කරතියි යනුත් මිනිස්සු බෙලහීනි ලෙස කල්පනා කලහ.

ආගමික ඇදහීම් පැන නැංගේ මේ ආකාරයටය. වැඳීම්, පූද පඬුරු හා බිලි දීම් ආදිය සහිත ආගමික වතාවත් සමස්තයක් ඇති විය. ආගමික වන්දනා මානනය නිසා පූජකයින්, කපුවන්, මන්ත්‍රකාරයින්, පාදිලිවරුන් ආදීන්ද, විවිධ වර්ගවලට අයත් ආගමික සංවිධාන සහ ආයතනද ඇතිවිය.

ම්ලේච්ඡයා ප්‍රකෘතියේ බලවේග ඉදිරියේ අසරණ වන්නා සේම, සූරාකෑම සහ පංති ඇතිවීම නිසා ක්‍රියාත්මක වනු සාංසිද්ධික සමාජ බලවේගයන්ගේ බලපෑම හමුවේ මිනිසා අසරණ විය. ප්‍රකෘතියට විරුද්ධව සටන් කිරීමට බැරි ම්ලේච්ඡයා දෙවියන්, යකුන් ප්‍රතිහාර්ය ආදිය මවාගත් සේම අනිවාරණීය ලෙසට, සූරාකන්නන්ට විරුද්ධව ගෙන ගිය සටනේ ජයක් නොදුටු සූරාකනු ලැබුවන්, ලබන ආත්මයක දී වඩා හොඳ ජීවිතයක් ගත කිරීම ගැන විශ්වාසයක් ඇති කරගත් බැව් වි. අයි. ලෙනින් ලියුවේය. සූරාකන සමාජය තමන්ට ගෙන දෙන දරුණු පීඩාවෙන් හා වදවේදනාවලින් මිදෙනු වස් වැඩ කරන ජනතාව ආගම තුළින් ගැළවීමක් සෙවූහ.

“ ‘ආගම ජනතාවට අබින් මෙනි’ යි යනුවෙන්වූ මාක්ස්ගේ කියමන, ආගම පිළිබඳ මාක්ස්වාදී දර්ශනයේ ප්‍රධාන ප්‍රතිෂ්ඨාව වේ ”* යැයි වි. අයි. ලෙනින් ලියුවේය. උඩු ව්‍යුහයේ මූලිකාංගයක් වන ආගම පංති ප්‍රතිවිරෝධිතා සහිත සමාජයේදී එය රඳා පවතින ආර්ථික පදනම ශක්තිමත් කිරීමටත් සූරාකන ක්‍රමය තහවුරු කිරීමටත් කටයුතු කරයි. සූරාකන්නන්ට කොන්දේසි විරහිතව යටත් වන ලෙසත්, ඉරණම ඉදිරියේ හිස නමන ලෙසත්, දුෂ්ටත්වයට හා ප්‍රචණ්ඩත්වයට විරුද්ධව නොනැගිටින ලෙසත්, දේශනා කරන ආගම එයින් පොදු ජනතාවගේ විප්ලවීය ධෛර්යය සිඳ දමා, ඔවුන් හැම දෙයක්ම දේව කැමැත්ත අනුව සිදුවන තෙක් බලා සිටින අහිංසකයන් බවට පත්කරයි. ස්වර්ග රාජ්‍යය හා මරණින් මතු ලැබෙන ප්‍රීතිමත් ජීවිතය පිළිබඳ කථා මගින් වැඩ කරන ජනතාවගේ සිත් යථාර්ථයේ දැවෙන ප්‍රශ්නවලින්ද, සූරාකෑමට විරුද්ධව හා සාධාරණත්වය සඳහාත්, සැබෑ මානවවාදී සමාජයක් සඳහාත් ගෙන යන විප්ලවවාදී අරගලයෙන්ද ඉවතට යොමු කිරීම ආගම විසින් කරනු ලැබේ.

---

* වි. අයි. ලෙනින්. සම්පූර්ණ කෘතීන්, වෙළුම 15, පිටුව 416.

එසේවුවද දැන් පූජකයින්ට ඔවුන් හමුවේ ඇති අලුත් ඓතිහාසික තත්ත්වයන්ද, සාමය හා සමාජවාදය සඳහා වැඩ කරන ජනතාව දක්වන අභිලාෂයද පිළිගැනීමට සිදුවී තිබීම සත්‍යකි. එබැවින් බැතිමතුන් ඉවත නොයාමත්, අලුත් බැතිමතුන් ලබාගැනීමත් සඳහා පූජකයෝ පොදු ජන චුවමනාවන් ගැන එක්තරා ප්‍රමාණයකට සලකා බලති. සමහර පූජකවරු ලෝක සාම ව්‍යාපාරයේ යෙදී සිටිති. ධනපති ක්‍රමය යටතේ කම්කරු පංතියට විරුද්ධවත්, සාමය හා ප්‍රගතිය සඳහා ගෙනයන සටනට විරුද්ධවත් යොදවන අවියක් ලෙස ආගම සූරා කන්නන් විසින් දිගටම පාවිච්චි කිරීම සහ ආගම්වල ඇති ප්‍රතිගාමී ස්වරූප මින් වෙනස් නොවේ.

ආගම විද්‍යාවටත්, විද්‍යාත්මක ලෝකාවබෝධයටත් දැඩි ලෙසම විරුද්ධවීම එහි තවත් ප්‍රතිගාමී ලක්ෂණයකි. ශත වර්ෂ ගණනාවක් තිස්සේ ආගම අනුකම්පා විරහිත ලෙස විද්‍යාව මර්දන කොට, විද්‍යාඥයින් වදබන්ධනයට හසු කළේය. ප්‍රගතිශීලී අදහස් පැතිරවීම තහනම් කළ ආගම, එම අදහස් ප්‍රචාරය කරන පොත් සියල්ල විනාශ කොට, ඒවායේ කතුවරුන් රටින් පිටුවහල් කිරීම, සිරගෙට දැමීම, කනුවල බැඳ ගිනි තබා මැරීම ආදිය කළේය. සුප්‍රසිද්ධ විද්‍යාඥයින් වන ජෝර්දනෝ බ්‍රූනෝ, ලුචිලියෝ වනීනි වැනි සුප්‍රසිද්ධ විද්‍යාඥයිගන් ඇතුළු තවත් ප්‍රගතිශීලී බොහෝ දෙනෙකුත් කතෝලික පල්ලියේ පරීක්ෂක සභාවේ ගිනිමැල මැද මරුමුවට පත්වූහ.

කොතෙක් වැර දැරුවද විද්‍යාවේ දියුණුව නවත්වාලීමට පල්ලිය අපොහොසත් විය. ද්‍රව්‍යමය නිෂ්පාදනයේ අවශ්‍යතාවයන් විසින් විද්‍යා දියුණුව ඉදිරියටම මෙහෙයැවිණි. අපගේ කාලයේ ශ්‍රේෂ්ඨතම විද්‍යාත්මක ජයග්‍රහණයන් ප්‍රතික්ෂේප කිරීමට පල්ලියට නොහැකි බැවින්, ආගමත්, විද්‍යාවත් එකින් එකට ගැලපෙන සුළු බව පෙන්වීමටත්, විද්‍යාවේ ජයග්‍රහණ ආගමික විශ්වාසයට ප්‍රතිවිරෝධී නොවන බව හා එකඟ වන බව පෙන්වීමටත් උත්සාහ කරයි.

මෙවැනි ප්‍රයත්න අත්‍යන්තයෙන්ම ඵල රහිතය. විද්‍යාව සහ ආගම එකිනෙකට ගැළපිය නොහැක. විද්‍යාව ලෝකය ගැනත්, එහි සංවර්ධන නියාම ගැනත් සත්‍ය කරුණු මිනිසාට සපයයි. ස්වභාව ධර්මයේ හා සමාජයේ බලවේග ජයගෙන නිෂ්පාදන කටයුතු සංවිධාන කරගැනීමට විද්‍යාව ඔහුට ආධාර කරයි. අනිත් අතට, ආගම ලෝකය පිළිබඳ සත්‍ය විකෘති කරයි; එය පිළිබඳව වැරදි අර්ථ නිරූපනයක් කරයි. මිනිසාගේ බුද්ධිය හා අධිෂ්ඨාන ශක්තිය මොට්ට කරයි; විද්‍යාවේ හා ප්‍රගතියේ ජයග්‍රහණය පිළිබඳ ඔහු තුළ ඇති අවබෝධය ඉවත් කරයි.

https://liberationbase.wordpress.com

සෝවියට් සංගමයේ පල්ලිය රජයෙන්ද, පාසල පල්ලියෙන්ද වෙන් කර තිබේ. රාජ්‍ය කාර්යයන්ට අත පෙවීමට පල්ලියට කිසිදු අයිතියක් නැති අතර අධ්‍යාපනයට අඩංගු කරණු හා එහි සංවිධානය පිළිබඳව බල පෑමටද පල්ලියට අවසර නැත. අනික් අතින් ආගමික චාරිත්‍රවලට රජය අත නොදමයි.

රජයෙන් පල්ලිය වෙන් කිරීම යනු රජයේ පාලනයෙන් තොරව පල්ලිය සිය කටයුතු කරතියි අදහස් නොකෙරේ. පූජකයින්ගේ ප්‍රති විප්ලවීය ක්‍රියාද, රාජ්‍ය නීති උල්ලංඝනය කිරීමේ ප්‍රයත්නද මැඩීම වැඩ කරන ජනතාවගේ අයිතිවාසිකම්වලට අදල වන්නේය. නිදසුනක් වශයෙන් ශ්‍රෙෂ්ඨ ඔක්තෝබර් විප්ලවයේ ජයග්‍රහණයෙන් ඉක්බිතිව පූජකයින්ගෙන් වැඩි දෙනෙක් සෝවියට් ආණ්ඩුවට විරුද්ධව නැගී සිටියහ. එබැවින් ඔවුන්ට දඬුවම් පැමිණවීමට සෝවියට් ආණ්ඩුවට සිදුවිය.

ආගම රටවැසියන්ගේ පෞද්ගලික කටයුත්තක් ලෙස කොමියුනිස්ට් පක්ෂය නොසළකයි. 'රාජ්‍ය හා සම්බන්ධයෙන් ගත් කළ ආගම පෞද්ගලික කාර්යයක් ලෙස තිබිය යුතුයැයි අපි කියන්නෙමු; එහෙත් අපගේ පක්ෂයේ වැඩ කටයුතු සම්බන්ධයෙන් ගත් කළ ආගම පෞද්ගලික දෙයක් ලෙස අපි කොහෙත්ම නොසලකමු' යනුවෙන් වි. අයි. ලෙනින් ලියුවේය. ආගම ඇතුළු සියලු අන්දමේ අධ්‍යාත්මික පීඩනයට විරුද්ධව නිරන්තර අරගලයක යෙදෙන ලෙස කොමියුනිස්ට් පක්ෂය එහි සාමාජිකයින්ගෙන් ඉල්ලා සිටී. සමාජවාදය හා කොමියුනිස්ට්වාදය සඳහා නිර්ධන පංතිය ගෙන යන පංති අරගලයේ පොදු කාර්ය භාරයන් සමග ආගමට විරුද්ධව කරන සටනද කොමියුනිස්ට් පක්ෂය සම්බන්ධ කරයි. ආගම තුරන්කර දැමීම සඳහා එහි පංතිමූලය වන සූරාකෑමත්, පොදු ජනයා සමාජීය ලෙස පීඩාවට පත් කිරීමත් සහිත ධනපති සමාජයේ පංති පදනම විනාශ කිරීම ප්‍රධාන කොන්දේසිය වන්නේය.

සෝවියට් සංගමයේ සමාජවාදය ජයග්‍රහණය කිරීමද, සූරාකන පංති අහෝසි කිරීමද නිසා පල්ලියේ පැවැත්මට ආධාරවූ පදනම විනාශවී ගිය අතර ආගමේ සමාජීය මූලාශ්‍රයන් දෙදරා ගියේය. වැඩ කරන ජනතාවගේ සිත් සතන් තුළ අනාගතය පිළිබඳ බියක්ද, අවිශ්වාසයක්ද ඇති කරන ධනපති ක්‍රමයේ සංවර්ධනයේ සාංසිද්ධිකතාවය වෙනුවට, අවබෝධ කරගත් නියාමයන් අනුව සැලැස්මානුකූල ලෙස කරන සමාජ පාලනය ඇතිවිය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් සෝවියට් ජනතාවගේ අති බහුතර සංඛ්‍යාව ආගමෙන් ඈත්වී, දූන් විද්‍යාත්මක ලෝකාවබෝධය තරයේ පිළිගෙන සිටිති.

4. කලාව

කලාව යනු යථාර්ථය කලාත්මක ප්‍රතිරූප පරිද්දෙන් මිනිස් මනස තුළ පිළිබිඹු වන ආකාරයකි. අවට ලෝකය පිළිබිඹු කරන කලාව ජනතාවට එය අවබෝධ කර ගැනීමට ආධාර දෙයි. දේශපාලන, සදාචාරාත්මක හා කලාත්මක අධ්‍යාපනයක් දීමේ බලවත් උපකරණයක් වශයෙන්ද එය ප්‍රයෝජනවත්ය.

කලාවේ ප්‍රධාන ලක්ෂණ සහ සමාජ ජීවිතයේ එය ඉටු කරන කාර්ය කොටස

යථාර්ථයේ සංස්කාර ධර්මතාවල හා සිද්ධීන්ගේ විවිධත්වයද ඒවා පිළිබිඹු කරන ක්‍රමවල විවිධත්වයද අනුව කලාවද නානාවිධි වන්නේය. කාව්‍ය හා ප්‍රබන්ධ, නෘත්‍ය, සංගීතය, සිනමාව, ගෘහ නිර්මාණ ශිල්පය, චිත්‍ර ශිල්පය සහ මූර්ති ශිල්පය කලාවට අයත් වේ.

කලාවේ මූලික අංග ලක්ෂණය නම්, විද්‍යාව මෙන් යථාර්ථය සංකල්පවලින් පිළිබිඹු නොකර, ඉඳුරන් මගින් හඳුනාගත හැකිවන යථාභූත හා කලාත්මක ප්‍රතිරූපය වූ ආකාරයකින් එය ඉදිරිපත් කිරීමයි. කලාත්මක ප්‍රතිරූපයක් නිර්මාණය කරන කලාකරුවා, යථාර්ථයේ පොදු, මූලික අංග ලක්ෂණ හෙළි කරයි; ඔහු මේ ලක්ෂණ එක් එක් චරිත මගින්, බොහෝ විට අසහාය චරිත මගින්ද, ප්‍රකෘතියේ හා සමාජ ජීවිතයේ යථාභූත සංස්කාර ධර්මතා මගින්ද ගෙන හැර දක්වයි. කලාත්මක චරිතයේ පෞද්ගලික ගතිගුණ විචිත්‍රකාර හා ස්පර්ශදායක වූ තරමට එහි ආකර්ෂණ ශක්තිය හා බලපෑමද වැඩිවේ.

මිහායිල් ෂෝලහොව්ගේ "නිසල දොන් නදිය" නැමති නව කථාවේ වීරයා වන ග්‍රිගෝරි මෙලිහොව්ගේ චරිතය නිදසුනක් ලෙස ගනිමු. දොන් පෙදෙසේ මැද පංතියේ කොසාක් ජාතියෙකුට ආවේණික සියලු ලක්ෂණ — ඔහුගේ අස්ථිර ගතියද, වැඩ කරන ජනතාව හා පොහොසතුන් අතර වැනීමද — එම චරිතයට අයත්ය. අළුත් ලෝකය ගොඩනැගූ එම අසීරු කාලයේදී අස්ථිර ගති පාමින්, ජීවිතයේ තමාට අයත් ස්ථානය සෙවූ ග්‍රිගෝරි වැනි අය බොහෝ වූහ. එහෙත් ග්‍රිගෝරි වෙනත් කෙනෙකු සමග පාඨකයා පටලවා නොගනී. ඔහුගේ ලක්ෂණ බෙහෙවින්ම පෞද්ගලිකය, අද්විතීය, සංයුක්තය. ග්‍රිගෝරිගේ චරිත්‍රය පාඨකයාගේ සිත් කළඹවන්නේ එබැවිනි. තම වීරයාගේ ඛේදවාචී ඉරණමට සමාන ඉරණම් ඇති මිනිසුන් දුටු ගත්කරුවා, මිනිසකුට සැබෑ ප්‍රීතිය ලබාගත හැක්කේ තම ජනතාවගේ සටන් අරගල සහ ශ්‍රමය තුළින් බව ඉතා ස්ථිර ලෙස පෙන්වයි.

කලාව බිහිවූයේ මිනිස් සමාජයේ මුල් කාලයේදීය. එය මිනිස් ශ්‍රමයේත්, සම්භාවිතයේත් ක්‍රියාදමයේදී පැන නගිණි. මුලදී කලාව

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

කෙළින්ම ශ්‍රමික ක්‍රියාකාරීත්වය සමග වෙළී සම්බන්ධ වී තිබුණි. වඩාත් මධ්‍යස්ථ ලෙස වුවද, අද දක්වාම කලාව මෙම සම්බන්ධය රැක ගෙන ඇත. සත්‍යවාදී කලාව මිනිසාගේ ශ්‍රමය හා ජීවිතයේ සැබෑ ආධාර කරුවෙක් ලෙස කවදත් ක්‍රියා කළේය. ප්‍රකෘතියේ බලවේගයන් විරුද්ධව සටන් කිරීමට මිනිසුන්ට ආධාර කළ කලාව ඔවුන්ට ප්‍රීතිය ගෙන දුන්නේය, ශ්‍රමයේදී හා සටනේහිදී වීර ක්‍රියා කිරීම සඳහා ඔවුන් කුල්මත් කළේය.

ක්‍රියා දමයේදී මිනිසුන්ගේ රසිකත්වයද, රසාස්වාදනයේ අවශ්‍යතාවයද, ජීවිතයේ සහ කලාවේ සුන්දරත්වය දැකීමේ හැකියාවද වැඩිණ. ජීවිතයේ ඇති සුන්දරත්වය සෙවීමද, එය සාමාරණ කරණය කිරීමද, එහි වග විස්තර දැක්වීමද, ඒවා කලාත්මක ලෙස පිළිබිඹු කිරීමද, ඒවා තුළින් මිනිසාගේ රසාස්වාදී අවශ්‍යතා සපුරාලමින්, ඔහුගේ රසික උද්වේග වර්ධනය කරමින්, ඔහුට රසාස්වාදනය පිළිබඳව අධ්‍යාපනයක් ලබාදීමද කලාවේ ඉතා වැදගත් විශේෂතාවය සහ කාර්ය භාරය වන්නේය.

පංති සහිත සමාජයේ කලාව පංති සහ පාක්ෂික ස්වරූපයක් ගනී. ''පිරිසුදු, පවිත්‍ර'' කලාවක් හෝ ''කලාව සඳහා කලාවක්'' හෝ තිබිය නො හැකිය, ඇත්තේද නැත. කලාවේ සුගමතාවයත්, වටහාදීමේ ඉමහත් බලයත්, උද්වේගී බලයත් නිසා එය පංති සටනේ වැදගත් අවියක් වන්නේය. විවිධ පංති සිය දේශපාලන, සදාචාර සහ වෙනත් අදහස් පතුරුවා හැරීම සඳහා කලාව උපයෝගී කර ගන්නේ එනිසාය.

කලාව උඩු ව්‍යුහයේ කොටසකි; එය එහි වර්ධනයට හේතු වුනු පදනමට සේවය කරයි. නිදසුනක් වශයෙන් සමකාලීන ධනේශ්වර කලාව ප්‍රතිගාමී අධිරාජ්‍යවාදී බලවේගයන්ට සේවය කරයි. සූරාකන්නන්ට විරුද්ධව කරන සටන්වලින් වැඩ කරන ජනතාව වෙනතකට යොමු කරවීමටද, මිනිසුන් අතර දුරාචාර ගතිගුණ බෝ කිරීමටද, වෙනත් ජනතාවන්ටද රජයන්ටද, සාමයේ හා ප්‍රගතියේ බලවේගයන්ටද විරුද්ධ පිළිකුළක් ඇති කිරීමටද ප්‍රතිගාමී කලාව උත්සාහ කරයි. ධනපති ක්‍රමය යටතේ පවතින තත්වයන් ප්‍රසංශා මුඛයෙන් හුවා දැක්වීමටද, කොමියුනිස්ට්වරුනට සහ කොමියුනිස්ට් ව්‍යාපාරයට විරුද්ධව අවලාද ප්‍රචාරය කිරීමටද යොදන ප්‍රධාන මාධ්‍යයකි, ධනවාදී කලාව. යල්පැනගිය පංතිවල වුවමනාවන් රකින ධනපති කලාව ජීවයේ සත්‍යතාවයෙන් ඈත්වී, හරයක් නැති නාම මාත්‍ර කලාවක් බවට පත්වේ. සමකාලීන ධනවාදී කලාකරුවන් අතර ජීවිතය සැබෑ ලෙස හා ගැඹුරු ලෙස පිළිබිඹු කරන යථාර්ථවාදීන්ද සිටින බව සත්‍යකි. එහෙත් මෙවැන්නන්ට බලයේ සිටින අධිරාජ්‍යවාදීන්ගේ ආශීර්වාදය නොලැබෙනවා පමණක් නොව ඔවුන්ට නිතර පාහේ දඬුවම්ද ලැබේ.

හැම පංතියකම සිය පංති වුවමනාවන්ට සහ රසික අවශ්‍යතාවයන්ට ගැළපෙන සේ කලා ශිල්ප නිර්මාණය කරයි. එහෙත් සිය පංතිය සහ අවධිය ඉක්මවා පැවති කලා කෘති බොහෝමයක්ද ඇත්තේය. මේවා නම්, විවිධ තම අවධිවලට අයත් ජනතාවන්ට අවේණික වූ කල්පවත්නා පොදු ගතිගුණ විචිත්‍ර ලෙස හා සත්‍ය ගරුක ලෙස පිළිබිඹු කරන කෘති හා කිසියම් අවධියක හෝ පංතියක හෝ හරය හඳුණා ගැනීමට උපකාර වන්නාවූ කෘතීන්ද වෙති. පුරාණයේ මහා ග්‍රීක ශිල්පයින්ගේ ඉතාමත් මාහැඟි මූර්ති කෘතීන්ද පුනරුත්පාදිත සමයට අයත් චිත්‍රද, 19 වැනි සිය වසේ රුසියානු ස්වරමලා රචකයින්ගේ සහ මුළු මහත් මිනිස් සංහතියේම දායාදය බවට පත්වූ වෙනත් කලා නිර්මාණද මේ ගණයට අයත්ය. මෙයින්, කලාව තවත් විශේෂතාවයක් එනම් එහි සංවර්ධනයේ අවිච්ඡින්නතාවය අවධාරණය වෙයි. හැම නව යුගයකම කලාව, ඊට පෙර පැවති යුගවලට අයත් කලාවේ සියලු ප්‍රගතිශීලී සහ යහපත් දෑ සියල්ල ආරක්ෂා කරයි.

සමාජවාදී කලාව සහ කොමියුනිස්ට්වාදය ඉදිකිරීමේදී එය ඉටුකරන කාර්ය කොටස

කම්කරු පංතියේ විප්ලවවාදී අරගලයත්, එය කොමියුනිස්ට්වාදය කරා ඉදිරියට යන ගමනත් පදනම් කරගෙන ගුණාත්මක වශයෙන් අළුත් සමාජවාදී කලාව බිහිවිය. අතීතයේ වූ ප්‍රගතිශීලී කලාශිල්පවල උසස් දේ සියල්ලම උකහාගත් සමාජවාදී කලාව අළුත් ඓතිහාසික තත්ත්වයන්ට ගැලපෙන්නේය, මෙන්ම එය කලා ශිල්ප වර්ධනයේ වඩාත් උසස් අවධියක්ද නියෝජනය කරයි.

මේ කලාවේ නිර්මාණශීලී ක්‍රමය සමාජවාදී සත්වාදය වන්නේය. අප යුගයේ ප්‍රධාන කාරණය වන සමාජය කොමියුනිස්ට්වාදය කරා ඉදිරියට ගමන් කිරීම සත්‍යවාදී ලෙසත් ඓතිහාසික වශයෙන් යථාභූත හා ඉතාමත් කලාත්මක විධියකින් පිළිබිඹු කළ යුතුය. සමාජවාදී සත්වාදයේ කලාව එක තැන නොලගින අතර එය නිරතුරුවම වර්ධනය වෙමින් හා පෝෂණය වෙමින් පවතී.

සමාජවාදී සත්වාදයේ කලාවේ මූලික මූලධර්ම වූකලී යථාර්ථය පිළිබිඹු කිරීමේදී සත්‍යවාදී භාවය හා ගැඹුරුතාවයද, ජනතා බන්ධුත්වයද, පක්ෂපාත භාවයද, ජීවිතය කලාත්මක ලෙස චිත්‍ර ගත කිරීමේදී නිර්භීත පුරෝගාමී භාවයද වන අතර මේ සියල්ල ජගත් සංස්කෘතියේ සියලු ප්‍රගතිශීලී සම්ප්‍රදයයන්ගේ වර්ධනය සමග සංයෝජනය කිරීම අවශ්‍යය. සමාජවාදී සත්වාදයේ ගැඹුරු සමාජවාදී හරය සහ එහි විචිත්‍ර

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

විවිධාකාර ජාතික හැඩය නිසා කැපීපෙනෙයි. සමාජවාදී සත්වාදයට අදාල ක්‍රමය ගත් කරුවන්ටද, චිත්‍ර ශිල්පීන්ටද, වෙනත් කලාකරුවන්ටද විවිධ නිර්මාණශීලී ආකාර, ශෛලීය, සහ වර්ග විශේෂතා පෙන්වීමටද, සිය නිර්මාණශීලී ක්‍රියාරම්භකත්වය හා උසස් දක්ෂතාවය, පෙන්වීමටද පුළුල් ඉඩකඩ සපයා දෙයි.

සැබෑ යථාර්ථවාදී කලාව කවදත් ජනතාව සමග සම්බන්ධව තිබිණි, එය ජනතාව අතර මුල්බැස තිබිණි. එහෙත් සමාජවාදී කලාව තරම් ජනතාවගේ ශ්‍රමය හා ජීවිතය සමග මනාලෙස එක්වුණු කලාවක් ඉතිහාසය මීට පෙර නොදත්තේය. සමාජවාදී කලාවේ ජනතා ස්වරූපය අවධාරණය කළ වි. අයි. ලෙනින් වරක් මෙසේ පැවසීය. ''කලාව ජනතාවට අයත්ය. එය වැඩ කරන ජනතාවගේ පුළුල් කොටස්වලට ගැඹුරු ලෙස කා වැදෙනු යුතුය. කලාව ජනතාවට අවබෝධ වී, ඔවුන්ගේ ආදරයට පාත්‍ර විය යතුය. එය ජනතාවගේ හැඟීම්, චින්තනය සහ අධිෂ්ඨානය සමගි කොට ඒවා උසස් තත්වයකට පත් කළ යුතුය. කලාව ඔවුන් තුළ ක්‍රියාකාරිත්වය ජනිත කොට ඔවුන්ගේ රසිකත්වය වර්ධනය කළ යුතුය.''*

සමාජවාදී කලාවට ආවේණික වූ ජනතා බන්ධුත්වය පක්ෂපාත භාවය සමග ඓද්‍රීයමය ලෙස වෙළී පවතී. සමාජවාදී කලාව කම්කරු පංතියටත්, වැඩ කරන ජනතාවටත් විවෘත සහ නියම ලෙස සේවය කරයි. එය සිය ඉරණම කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රතිපත්ති සමගත් මාක්ස්-ලෙනින්වාදී ලෝක දෘෂ්ටිය සමගත් සම්බන්ධ කර ඇත.

කලාවේ පක්ෂපාතිත්වය පිළිබඳ මාක්ස්-ලෙනින්වාදී මූලධර්මයට පහර දෙන සංශෝධනවාදීහු කලාවට නායකත්වය දීමට විරුද්ධවත්, නැගී සිටිත්. එය කලාකරුවාගේ නිර්මාණශීලී නිදහස සීමා කරන බවත්, කලාත්මක පෞද්ගලිකත්වය මර්දනය කරන බවත් ආදී විවේචන ඔවුහු ඉදිරිපත් කරති. එහෙත් සැබවින් සිදුවන්නේ, පක්ෂපාතී මූලධර්මය නිසා, සමාජවාදී කලාව අදහස් අතින් හා එහි අඩංගු දේ අනුවත්, කලාත්මක භාවය අනුවත් උසස් මට්ටමකට පත්වීම සහතික වීමය, දැවෙන සමාජීය ප්‍රශ්න විසඳාලීමට අදාල වනසේ එය හැඩ ගැසීමය. එය කලාත්මක නිර්මාණයේ සැබෑ නිදහසේ අනිවාර්ය කොන්දේසි-යක්ද වන්නේය. ''... අප හැම දෙනෙක්ම ලියන්නේ අපේ හෘද සාක්ෂියට එකඟවය; අප කලාව මගින් සේවය කරන පක්ෂයට හා ජනතාවට අපේ හදවත් අයත් වේ.''මිහයිල් ෂෝලොහොව් විසින් සෝවියට්

---

* ''ලෙනින් සංස්කෘතිය සහ කලාව පිළිබඳ'', මොස්කව්, 1956. පිටුව 520.

කලා ශිල්පීන්ගේ අදහස් හා සිතැඟියාවන්ද කොමියුනිස්ට් පක්ෂයට හා සෝවියට් ජනතාවට ඇති ලැදියාවද ඉතා අගනා ලෙස කැටි කොට දක්වන ලද්දේ එලෙසය.

සමාජවාදී කලාවේ වර්ධනය හා සම්පූර්ණත්වය සඳහා විශාල සැලකිල්ලක් යොමු කරන සෝවියට් සංගමයේ කොමියුනිස්ට් පක්ෂය, සෝවියට් කලා කරුවන්ගේ සත්‍යවාදී, උසස් දෘෂ්ටිමය හා උසස් කලාත්මක නිර්මාණ සඳහා කටයුතු කරයි. ජනතාවටත් කොමියුනි-ස්ට්වාදයටත් කැපවීම සඳහා පෙළඹවීම් කරන කොමියුනිස්ට් පක්ෂය, කලාවෙහි දුර්වලකම්, දේශපාලන විචාරයෙන් තොර බව හා අදහස් හා හරය අතින් දුර්වලකම් යන මේවාට සමාව නොදීමේ පුරුද්ද ද ඇති කරයි. ඉදිරියටත් සාහිත්‍ය හා කලාශිල්පවල සෞභාග්‍යය සඳහාද, ආචාර ධර්ම හා සෞන්දර්යතාවය ජනතාව අතර ප්‍රගුණ කිරීම සඳහාද, වැඩ කරන ජනතාව තුළ උසස් කලාත්මක රුචියක් සහ සංස්කෘතික පළපුරුදුකම් ඇති කරවීම සඳහාද පක්ෂය වෙහෙස නොබලා කටයුතු කරනු ඇත.

ජනතාව තුළ උසස් දේශපාලන, සුචරිතමය හා සෞන්දර්යවාදී ගතිගුණ ප්‍රගුණ කිරීමද, ඔවුන්ගේ සිත් තුළින් පැරණි නටබුන් අකාමකා දැමීමද, ජනතාවගේ විරෝදාර ව්‍යායාමයන් ගැඹුරු ලෙස හා සත්‍යවාදී ලෙස පෙන්වීමද, අපේ සමකාලීනයාගේ පොහොසත් ආධ්‍යාත්මික ලෝකයත්, ඔවුන්ගේ හැඟීම්, සංකල්පනා හා අපේක්ෂාවනුත් හෙළිකිරීමද සෝවියට් සමාජයට ඉදිරි ගමනට බාධාකරන හැම දෙයකටම විරුද්ධව අනුකම්පා විරහිත ලෙස පහර දීමද කොමියුනිස්ට්-ක්‍රමය ගොඩනැගීමේදී නව වීර වික්‍රමයක් කිරීමට සෝවියට් ජනතාවට ආශ්වාදයක් ලබාදීමද, පූර්ණ පරිමාණයෙන් කොමියුනිස්ට් ක්‍රමය ගොඩනගන වකවනුවේදී සෝවියට් කලාවේ කාර්ය භාරය වන්නේය. කොමියුනිස්ට්වාදී අධ්‍යාපනයේ ඉතා වැදගත් කොටසක් වන කලාව ජනතාවට සෞන්දර්ය විද්‍යාව පිළිබඳව අධ්‍යාපනයක් ලබාදීමේදී විශිෂ්ට සේවයක් කරන්නේය. සෝවියට් ජනතාවට සුන්දරත්වය අවබෝධ කැර ගැනීමටද, රසික රුචිය වැඩිකර ගැනීමටද, කලා හැකියාව සහ රුචිය පුබුදුවා එය වර්ධනය කර ගැනීමටද ආධාරදීම කලාවේ යුතුකම වන්නේය.

''ජනතාව සමග ඇති සම්බන්ධකම් ශක්තිමත් කිරීමද, සමාජවාදී යථාර්ථවාදයේ පොහොසත් බව හා විවිධත්වය සත්‍යවාදී සහ උසස් කලාත්මක ලෙසත් පිළිබිඹු කිරීමද, අලුත් සැබෑ කොමියුනිස්ට්වාදී ප්‍රති නිර්මාණයන් දීප්තිමත් ලෙස ආභාෂණය කිරීමද, සමාජය ඉදිරියට ගෙනයන හැම දෙයක්ම ඔප් නැංවීමද සාහිත්‍යයේ සහ කලා වර්ධනයේ

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

ප්‍රධාන ප්‍රතිපත්තිය වන්නේයැ''* යි සෝවියට් සංගමයේ කොමියුනිස්ට් පක්ෂයේ වැඩ පිළිවෙළින් පෙන්වා දෙයි. කොමියුනිස්ට්වාදය ගොඩ නැඟීමේදී නව ජයග්‍රහණ ලබාගැනීම සඳහා ජනතාවට සටන් මග පෙන්වාදීම සාහිත්‍යයේ සහ කලාවේ උසස් සමාජීය කාර්ය භාරය වන්නේය.

කලාව තවදුරටත් වර්ධනය කොට පොහොසත් කළ හැක්කේ පොදුජන කලා ආධුනික ව්‍යාපාරයේ සහ වෘත්තීයමය කලාවත් සංකලනය කිරීමේ පදනම අනුවය.

5. විද්‍යාව

විද්‍යාව යනු ප්‍රකෘතිය සමාජය හා චින්තනය පිළිබඳව මිනිසාගේ දැනුම් සම්භාරයයි. එය සංකල්ප, පද්ධති, නියාම, මගින් ලෝකය පිළිබිඹු කරන අතර සම්භාවිත පළපුරුද්ද මගින් ඒවායේ නිවැරදිතාවය පරීක්ෂා කරනු ලැබේ.

විද්‍යාව සමාජයීය විඥනයේ ආකාරයක් වශයෙන්

නවීන විද්‍යාව — ද්‍රව්‍යමය ලෝකයේ නිශ්චිත ක්ෂේත්‍ර හදාරණ විවිධ විද්‍යාවල සමස්තයකි. මේ විවිධ විද්‍යා අතරින් අප විසින් සමාජ විද්‍යා එනම් ඉතිහාසය, දේශපාලන අර්ථ ශාස්ත්‍රය, දර්ශනවාදය හා ආචාර ධර්මද, ප්‍රකෘති විද්‍යා වන යන්ත්‍ර විද්‍යාව, ගණිතය, භෞතික විද්‍යාව, රසායනය, ජීව විද්‍යාව ආදියද වෙන්කොට ගත යුතුය. සමකාලීන විද්‍යාවේ වර්ධනයේ හා ප්‍රගතියේ ක්‍රියාදමය වූකලී සම්ප්‍රදායීය විද්‍යා කොටස්වලටත්, ප්‍රවණතාවලටත් ශාඛාවලටත් කැඩී වෙන්වී යාමය. නිදසුනක් වශයෙන් සත්ත්වයින්ගේ ඉන්ද්‍රියයන් පිළිබඳව ජීව විද්‍යාවෙන් දැන් ප්‍රවේණි (ජනක) විද්‍යාව, පරිසර විද්‍යාව, පරිණාමවාදය, ක්ෂුද්‍ර ජීව විද්‍යාව, භෞත වේදය ආදිය වෙන්වී තිබේ.

විභේදන ක්‍රියාදමය ඒකාග්‍රතාවය සමග අඛණ්ඩ ලෙස වෙළී පවතී. විද්‍යාවන් එක් කිරීමත් සමගම මීට පෙර දැන සිටි විද්‍යා දෙකක හෝ වැඩි ගණනක ජයග්‍රහණ සංශ්ලේෂණය කරමින්, වෙනත් විද්‍යා බිහිවී ඇත. භෞතික රසායනය, රසායනික ජීව විද්‍යාව, ජෛව–යන්ත්‍ර විද්‍යාව, ස්වයං ක්‍රිය–පාලනය, බයෝනික් විද්‍යාව ආදිය බිහිවී ඇත්තේ මේ ආකාරයෙනි. ඉතා ගැඹුරු විද්‍යාත්මක සොයාගැනීම්වලට මග පාදන ලද්දේ විද්‍යා ''පූට්ටු'' කිරීම් හා එකිනෙකට වෙළීමේ ක්‍රියාද–

* ''සෝවියට් සංගමයේ කොමියුනිස්ට් පක්ෂයේ වැඩ පිළිවෙළ'', පිටුව 131.

මයෙනි. මේ යුගයේ ශ්‍රෙෂ්ඨතම සොයා ගැනීමක් වන, කලල සෛලයේ ස්ථිර ජෛව රසායිනික සංයෝජන නියමිතවීමේ රහස හෙළි කරන ජනක (ප්‍රවේණි) රීති එක් නිදසුනකි. මේ සොයා ගැනීම සාර්ථක වූයේ ජීව, රසායන හා භෞතික විද්‍යා තුන පූට්ටු කිරීමෙනි.

ඓතිහාසික වශයෙන් විද්‍යාව බිහිවූයේ ප්‍රායෝගික ක්‍රියාකාරිත්වයෙනි. එය වර්ධනය වන්නේත් එම පදනම මතය. විද්‍යාවට ආවේණිකවූ විශේෂ උල්පත්, අභ්‍යන්තරික තර්කානුකූල වර්ධනයක් ඇති බව සැබෑ නුමුදු විද්‍යාවේ වර්ධනයට ඉවහල් වන ප්‍රධාන ගාමකය ද්‍රව්‍යමය නිෂ්පාදනයේ අවශ්‍යතාවය ප්‍රමුඛ සමාජයීය අවශ්‍යතාවය වන්නේය. ආදිකල්පික යුගයේදී සිය ජීවිකාව සඳහා මාධ්‍යයන් සෙවූ මිනිසා ප්‍රකෘතියේ බලවේග සමග ගැටිණි, එවකට ඔහුට ඉතා සරළ, නොගැඹුරු දැනීමක් ලැබිණි. මෙය අනුභාවික ස්වරූපයක් දරූ අතර විද්‍යාවක තත්වයක් නොඉසිලීය. විද්‍යාව සමාජ විඥනයේ විශේෂ ආකාරයක් ලෙස පසු කලෙක වහල් සමාජය පැන නැංගේ, කය වෙහෙසා හා මොළය වෙහෙසා වැඩ කිරීම දෙකට බෙදී වෙන්වී, විද්‍යා සේවය වෘත්තියක් කරගත් විශේෂ මිනිසුන් කණ්ඩායමක් — විද්‍යාඥයින් ඇතිවූ පසුවය.

විද්‍යා දැනීමේ අවිච්ඡින්නතාවය එහි මූලික විශේෂතාවයකි. හැම අළුත් මිනිස් පරපුරක්ම, අලුතින් බිහිවන හැම සමාජයක්ම, අතීතයේ විද්‍යා ජයග්‍රහණ ඉවත නොදමා ඒවා හිමි කරගෙන, නව ප්‍රායෝගික අවශ්‍යතාවයන් අනුව ඒවා තවදුරටත් වර්ධනය කරයි. ඒ අනුව විද්‍යාව මුළු මහත් මිනිස් සංහතියේ දායාදයක් හැටියටත්, විද්‍යා ශ්‍රමය සමාජයීය ශ්‍රම හැටියටත් ගැනේ.

සමාජයේ ආර්ථික සම්බන්ධතාවයන්, සමාජ–දේශපාලන ස්වරූපය විද්‍යාවේ වර්ධනය මත සෑහෙන ලෙස බලපායි. විද්‍යා වර්ධනයේ වේගයද, ප්‍රවණතාවයද, විද්‍යා ජයග්‍රහණ සමාජය විසින් පාවිච්චි කිරීමද ආදිය රඳ පවතින්නේ එම කරුණු උඩය. ධනවාදය තහවුරු වූ වකවනුවේදී, ධනවාදී නිෂ්පාදන සම්බන්ධතාවය විද්‍යා සංවර්ධනයට බලගතු සාධකයක් විය. ඉමහත් වේගයෙන් වර්ධනය වූ ධනවාදී නිෂ්පාදනය අලුත් සහ අලුත් විද්‍යාඥනය ඉල්ලා සිටියේය. ධනවාදය අධිරාජ්‍යවාදය දක්වා පරිවර්තනය වූ ඉක්බිතිව පහත අප දකින පරිදි එය විද්‍යාවේ ප්‍රගතියට බාධාකරන්නට පටන් ගත්තේය.

එක් නියමිත පංතියක අයිතිවාසිකම් ප්‍රකාශ කරන සමාජයීය විද්‍යා සමාජයට පරායීනව පැවතීම විශේෂයෙන්ම සිදුවන්නකි. ධනවාදී සමාජ විද්‍යාව ධනපති ක්‍රමයට ආවඩා එය අලංකාර කරයි, සමාජවාදයට හා සමාජ ප්‍රගතියට විරුද්ධව සටන් කර එය හැම අතින්ම විඥනවාදී

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

දර්ශනයත්, ආගමික අදහසුත් ප්‍රචාරය කරයි, ප්‍රකෘති විද්‍යාඥයින් මත විඥානවාදයේ හා පාර භෞතිකවාදයේ විධ ශාස්ත්‍රය පටලවයි. අධිරාජ්‍යවාදය හෙළා දකින, භෞතිකවාදයත්, ලෝක සාමය හා ප්‍රගතියත් පිළිගන්නා විද්‍යාඥයින් බෙහෝ ගණනක් ධනපති රටවල ජීවත්වන බව සත්‍යයකි. එහෙත් පාලනය කරන පංතිය විසින් එනම් ප්‍රතිගාමී ඒකාධිකාරී ධනපති පංතිය විසින් විද්‍යා ක්ෂේත්‍රයේ ප්‍රතිපත්තිය මෙහෙයැවේ.

විද්‍යා-තාක්ෂණික විප්ලවය හා එහි සමාජයීය විපාක

ස්වයං ක්‍රිය යන්ත්‍ර, රේඩියෝ-ඉලෙක්ට්‍රොනික් හා ටෙලි-යන්ත්‍ර විද්‍යාවේ අති විශාල දියුණුවක්ද, පරමාණු බලය පාවිච්චි කිරීමද, අජටාකාශය මෙල්ල කිරීමද, ස්වයං ක්‍රිය යන්ත්‍රවලත්, රසායනය, භෞතික විද්‍යාව, ජීව විද්‍යාව ආදී විද්‍යාවල ජයග්‍රහණයනුත් සමග වෙළී ඇති විද්‍යා-තාක්ෂණික විප්ලවයේ සංවර්ධනය අපි දකිමින් සිටිමු.

විද්‍යා-තාක්ෂණික විප්ලවය විද්‍යාවට හා කාර්මික ශිල්පයට පමණක් නොව, නිෂ්පාදනයටද බලපාන්නේය. නිෂ්පාදනයේ කාර්මික ශිල්පය හා තාක්ෂණික විද්‍යාවද, එහි ශක්ති පදනමද ගැඹුරු ගුණාත්මක වෙනසකට හසුවෙමින් පවතී. ශ්‍රම ස්වරූපයද වෙනස් වේ. ශ්‍රමය වඩාත් බුද්ධිමය හරයකින් සමන්විත වීමට පටන් ගෙන ඇත. සිබර්නෙටික්ස් ප්‍රමුඛ විද්‍යාවේ සහ තාක්ෂණිකයේ ප්‍රගතිය නිසා කායික ශ්‍රමය පමණක් නොව මොළය වෙහෙසා වැය කරන ශ්‍රමයේ සමහර අංශද යන්ත්‍ර කිරීමට හා ස්වයං ක්‍රිය කිරීමට පුළුවන් වී ඇත. සංස්කෘතික හා කාර්මික මට්ටම වැඩෙමින් පවතී. නිෂ්පාදන කම්කරුවන්ගේ — ශිල්පීන්ගේ වෘත්තීය පුහුණුව උසස් වෙමින් පවතී.

විද්‍යා-තාක්ෂණික විප්ලවයේ වැදගත්කම කෙතරම් විශාලදයත්, එය අංග සම්පූර්ණ විශ්ලේෂණයකට භාජනය නොකර, ප්‍රධාන වශයෙන් එහි සමාජයීය විපාක ගැන නොතකා, සමකාලීන මිනිස් ඉතිහාසයේ කෙතරම් හෝ කුඩා සිද්ධියක් වුවද අවබෝධ කර ගත නොහැක.

අප යුගයේ විද්‍යා-තාක්ෂණික ප්‍රගතිය, එකිනෙකට ප්‍රතිවිරෝධී සමාජක්‍රම දෙකක් වන සමාජවාදය හා ධනවාදය අතර සටන් අරගලවල ප්‍රධාන ක්ෂේත්‍රයක් බවට පත්වී ඇත. "... ශ්‍රෙෂ්ඨතම තාක්ෂණිකයක්, සංවිධානයක්, විනයක් සහ වඩාත් හොඳ යන්ත්‍ර ඇත්තේ කාටද ඔවුහු ජයගනු ඇතැ"*යි ලෙනින් පැවසීය. "මුළු මහත් විද්‍යාවත්, තාක්ෂණිකයත්, විද්‍යා-ඥනයත්" නැතිව සමාජවාදය ගොඩනැගීමට නොහැකි බැවින් ඒවා "සියතට" ගන්නා ලෙස ලෙනින් ඉල්ලා සිටියේය.

---

*වි. අයි. ලෙනින්. සම්පූර්ණ කෘතීන්, වෙළුම 36, පිටුව 116.

ලෙනින්ගේ උපදෙස් අනුව සෝවියට් සංගමයේ කොමියුනිස්ට් පක්ෂය විද්‍යාවේ සහ තාක්ෂණිකයේ සංවර්ධනය ගැන නිත්‍ය සැලකලි යොමු කරයි. මෙහි දීර්ඝ කාලීන දැඩි සටන් පවතිනු ඇත. සමාජ ජීවිතයේ විවිධ ක්ෂේත්‍ර තුළට විද්‍යාව කා වැද්දවීම හා ආර්ථික සංවර්ධනය වේගවත් කිරීම සඳහාත් සමාජයේ සියලු සමාජිකයින්ගේ අවශ්‍යතාවයන් සපුරාලීම සඳහාත් විද්‍යා-තාක්ෂණික ප්‍රගතියේ හැම දෙයක්ම සම්පූර්ණ ලෙස පාවිච්චි කිරීමද සෝවියට් රජයේ ඉතා වැදගත් ආර්ථික දේශපාලන කාර්යයක් වන්නේය."

සමාජවාදී සහ ධනවාදී විවිධ සමාජ ක්‍රම තුළ විද්‍යා-තාක්ෂණික විප්ලවය වර්ධනය වෙමින් පවතී. මේවායේ සමාජ සංවර්ධන නියාමද, සමාජ නිෂ්පාදනයේ පරමාර්ථද මූලික වශයෙන් එකිනෙකට වෙනස් ය. විද්‍යා-තාක්ෂණික ප්‍රගතිය ඇති කරන අපේක්ෂාද එකිනෙකට වෙනස්ය. ඒවායේ සමාජ-ආර්ථික විපාක සහ පර්යාලෝකද එමෙන්ම වෙනස්ය.

ධනපති ක්‍රමයේ විද්‍යා-තාක්ෂණික ප්‍රගතියේ ප්‍රධාන ගාමකය ලාභය සහ බිහිසුණු තරඟකාරී අරගලය ය. ධනපතීන්ට විද්‍යාව වර්ධනය කිරීමටත් එය පදනම් කරගෙන තාක්ෂණිකය සහ තාක්ෂණික විද්‍යාව දියුණු කිරීමටත් සිදුවී තිබෙන්නේ වැඩි ලාභ ලබාගැනීමට සහ තරඟ කරුවන් විනාශ කර දැමීමටය. නිෂ්පාදනය දියුණු කිරීමටත්, ශ්‍රම ඵලදව වැඩි කිරීමටත්, භාණ්ඩවල ගුණය උසස් කිරීම ආදියටත් වර්ධනය වූ රටවල (ඇමෙරිකා එක්සත් ජනපදය, බ්‍රිතාන්‍යය, ප්‍රංශය, ජපානය, බටහිර ජර්මනිය ආදී රටවල්) ධනපතියෝ විද්‍යාවේ හා තාක්ෂණිකයේ ඉතා නවීන සොයා ගැනීම් දක්ෂ ලෙස ප්‍රයෝජනයට ගනිති. ඒ අනුව මේ රටවල විද්‍යා හා තාක්ෂණික ජයග්‍රහණ අඩුවෙන් තක්සේරු කිරීමද, නිෂ්පාදනය දියුණු කිරීම සඳහා එම රටවල අත්දැකීම් ප්‍රයෝජනයට නොගෙන නොසලකා හැරීමද බලවත් වරදකි. සමාජවාදී ආර්ථිකයේ ගුණාත්මක වෙනස සැලකිල්ලට ගනිමින්, සමාජවාදී තත්වයන් යටතේ එම අත්දැකීම් ප්‍රයෝජනයට ගත යුතුය.

එහෙත් ඒ අතරම ධනපති ක්‍රමය තුළ විද්‍යා-තාක්ෂණික ප්‍රගතියේ ගැඹුරු ප්‍රතිවිරෝධීතා නොදැක සිටිය නොහැක. ධනපති ක්‍රමය විද්‍යාව හා තාක්ෂණිකය සූරාකෑමේ අවි ලෙස පාවිච්චි කරයි. අධිරාජ්‍යවාදය විද්‍යා-තාක්ෂණික වර්ධනය ඒකාංගික කරන්නේ අහම්බෙන් නොවේ. ඒකාධිකාරී ධනපතියෝ තමන්ට විශාල ලාභ ලබාගත හැකි විද්‍යා-තාක්ෂණික අංශවලට ප්‍රධාන සැලකිලි දක්වති. යුද්ධ කටයුතු සඳහා ප්‍රයෝජනවත් විද්‍යා-තාක්ෂණික අංශ වර්ධනය කිරීමට ඔවුහු අති

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

විශාල සැලකිලි දක්වති. යුද්ධායුද වෙළඳම් කිරීම ඉතාම ලාභදායක ජාවාරම්කාර ව්‍යාපාරය වන බැවිනි. සමකාලීන ධනපති සමාජයේ විද්‍යාවේ සහ තාක්ෂණිකයේ ආවේණික ලක්ෂණයත්, ඉතා භයානක අංගයත් මිලිටරිකරණය ය.

විද්‍යාවේ හා තාක්ෂණිකයේ ප්‍රගමනය නිසා ධනපති රටවල නිෂ්පාදනය පුළුල්වීමේ ප්‍රවණතාවයක් දක්නට තිබේ. එසේවූවද ඒ රටවල ජනතාවගේ මිළදී ගැනීමේ ශක්තිය සීමා සහිතය. විදේශීය රටවලට භාණ්ඩ විකිණීමේ හැකියාවද තරඟකාරී අරගල නිසා අමාරුකම් වලට මුණ පා ඇත. අලුත් යන්ත්‍ර හා යාන්ත්‍රණය නිෂ්පාදන ක්ෂේත්‍රයේ වැඩකරන ජනතාව මහ පාරට ඇද දැමීම නිසා විරැකියාව වැඩිවේ. මේ නිසා පොදු ජනතාවගේ මිලදී ගැනීමේ ශක්තිය තවත් අඩුවන බැවින් එය විද්‍යා–තාක්ෂණික ප්‍රගමනයට බාධා කරයි. අරාජිකවාදය හා තරඟය විසින් විද්‍යාවේ වාණිජ රහස් බිහිකරන බැවින් විද්‍යා–තාක්ෂණික සහයෝගතාවයට එය බාධා කරයි. විද්‍යාත්මක කටයුතුවල සමාන්තර–තාවයක් බිහි කරයි. ඒකාධිකාරී ධනපතිහු වැදගත් සොයා ගැනීම් දස දහස් ගණනක් "වාණිජ වටිනාකම" වැඩිකර ගැනීමේ බලාපො–රොත්තුවෙන් සඟවා තබති.

සමාජවාදී තත්වයන් යටතේ විද්‍යා–තාක්ෂණික විප්ලවයේ අරමුණු පර්යාලෝකය සහ ප්‍රතිඵල වෙනස්ය. සමාජයේ සියලුම සාමාජිකයින්–ගේ සම්පූර්ණ වර්ධනය සහ සෞභාග්‍යය සහතික කරනු වස් සමාජ–වාදය සැලැස්මානුකූල නිෂ්පාදන සංවිධානයක් තහවුරු කරන්නේය. මේ හේතුව නිසා සමාජවාදය සහ කොමියුනිස්ටවාදය යටතේ විද්‍යා–තාක්ෂණික විප්ලවයට පූර්ණ ඉඩකඩ හා පහසුකම් ඇති අතර ධනපති ක්‍රමයේදී මෙන් විද්‍යා-තාක්ෂණික ජයග්‍රහණ මිනිසාගේ හානියට නොව ඔහුගේ ප්‍රයෝජනය සඳහා යොදවන්නේය.

25 වැනි සම්මේලනයට ඉදිරිපත් කරන ලද සෝ: සං: කො: පක්ෂයේ ම: කා: සභාවේ වාර්තාවේ මෙසේ සඳහන් වේ: "විද්‍යා–තාක්ෂණික විප්ලවය නිවැරදි, මිනිසාගේ හා සමාජයේ වුවමනාවලට සරිලන ප්‍රවණතාවයක් ලබනුයේ සමාජවාදී තත්වය යටතේ පමණක් බව, කොමියුනිස්ටවාදීන් වන අපි ක්‍රියා සිටිමු. අනිත් අතින් සමාජ විප්ලවයේ කාය්‍ර්යයන් — කොමියුනිස්ටවාදී සමාජය ගොඩනැගීම — අවසාන ලෙස තීරණය කළ හැක්කේ විද්‍යා–තාක්ෂණික අධි සංවර්ධ–නයේ පදනම මතය."*

---

* "සෝ: සං: කො: ප: 25 සම්මේලනයේ ලිවිලි", පිටුව 47.

සමාජවාදී සමාජයේ විද්‍යාව, වැඩකරන ජනතාවගේ ද්‍රව්‍යමය සෞභාග්‍යය උසස් කරලීමටද, සංස්කෘතික මට්ටම දියුණු කර ලීමටද, නිෂ්පාදනය වර්ධනය කිරීමටද වැදගත්වන මාධ්‍යයකි. එමෙන්ම කොමියුනිස්ටවාදය ගොඩනැගීමේ වැදගත් සාධකයකි. කාර්මික ශිල්පය වර්ධනය කොට එය අංග සම්පූර්ණ කිරීමේද, වැඩකරන ජනතාවගේ ශ්‍රමික පළපුරුද්ද උසස්කරලීමේද, ඔවුන්ගේ සෞභාග්‍යය හා සංස්කෘතිය උසස් කර ලීමේද තීරණාත්මක ක්‍රියා කලාපය අයත් වන්නේ ප්‍රකෘති විද්‍යාවන්ටය. සමාජ විද්‍යාවන්ගේ වැදගත්කමද විශාලය. සමාජය ක්‍රියා කිරීමේ හා වර්ධනය කිරීමේ නියාම ගැන ජනතාවට දැනීමක් ලබාදෙන සමාජ විද්‍යාව ආර්ථික හා සමාජ ක්‍රියා ක්‍රියාදමයන්ට මග පෙන්වීමේ විද්‍යාත්මක පදනම සපයයි. කොමියු–නිස්ටවාදී අධ්‍යාපනය ලබාදීමේදීද, වැඩකරන ජනතාවට දයලෙක්තික-භෞතිකවාදී දැනීමක් ලබාදීමේදීද විශාල සේවයක් ඉටුකරයි. සමාජවාදී තත්වයන් යටතේ විද්‍යාව ලෝක සාමයේත්, නිර්මාණයේත්, නොවූ විරූ සමාජ ප්‍රගතියේත් බලසම්පන්න අවියක් වන්නේය.

විද්‍යාව ජනතාවට සේවය කිරීම නිසා පමණක් නොව, පොදු ජනතාවට පුළුල් වශයෙන් විද්‍යාව හැදෑරීමට ඉඩ කඩ ලැබීම නිසා සෝවියට් සමාජයේ විද්‍යා ගැඹුරු පොදු ජනතා ස්වරූපයක් ගැනීම වැදගත් විශේෂතාවයකි. පොදු ජනතාවගෙන් බිහිවූ දසදහස් ගණන් සෝවියට් විද්‍යාඥයෝ සිය ශක්තිය හා දැනීම ජනතා සේවයට යොදවති. සෝවියට් විද්‍යාඥයින් සමග එකතුව කම්කරුවන්ගෙන් සහ සමූහ ගොවීන්ගෙන් පැන නැගි අලුත් යන්ත්‍ර සූත්‍ර සොයා ගන්නෝද, යුක්ති ප්‍රතිපාදකයෝද දස ලක්ෂ සංඛ්‍යාවක් විද්‍යාව ඉදිරියට ගෙනයති.

පොදු රාජ්‍ය සැලැස්මක් මත සමාජවාදී ක්‍රමයේ විද්‍යා පරීක්ෂණ කිරීමටද, ඉතා විශාල සංඛ්‍යාවක් විද්‍යා පරීක්ෂණාගාරවල වැඩ ඒකාබද්ධ කිරීමටද, ඉඩ කඩ සලසන බැවින් ඉතා වැදගත් ගැටළු නිරාකරණය කිරීමට අවධාරණය හා ශක්තිය යොමු කරනු වස් විද්‍යාඥයින්ට ඉඩ ලබා දෙයි. සමාජවාදී සමාජයේ බලපාන දයලෙක්තික–භෞතිකවාදී දර්ශනය විද්‍යාව විඥානවාදයේ හා ආගම්වල බලපෑම්වලින් මුදවාගෙන, ප්‍රකෘතියේ හා සමාජයේ ක්‍රියාදමයන් විද්‍යාත්මක ක්‍රම ඒකමතික සැලැස්මක් අනුව පිරික්සා බැලීමට විද්‍යාඥයින්ට ඉඩ සළසා දෙයි.

කොමියුනිස්ටවාදය ගොඩනගද්දී විද්‍යාව නිෂ්පාදනය සමග වඩාත් කිට්ටුවෙන් වෙළෙයි. නිෂ්පාදනය වඩාත් පුළුල් ලෙස විද්‍යා ජයග්‍රහණ පාවිච්චි කරයි. විද්‍යාව සමාජයේ ස්ථිර නිෂ්පාදන බලවේගයක් බවට වඩාත් පුළුල් ලෙස පරිවර්තනය වෙමින් පවතී.

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

විද්‍යාව නිෂ්පාදන බලයක් හැටියට පරිවර්තනයවීම යනු එය නිෂ්පාදන මාධ්‍යයන් සහ නිෂ්පාදනයේ යෙදී සිටින්නන් වන මිනිසුන් සමග තවත් ස්වාධීන මූලිකාංගයක් ලෙස පෙනී සිටීමක් නොවේ. විද්‍යාව නිෂ්පාදන බලයක් හැටියට පරිවර්තනය වන්නේ තාක්ෂණික සහ මිනිස් බලපෑම යටතේ පමණකි.

විද්‍යාව නිෂ්පාදන බලවේගයක් බවට පරිවර්තනය කිරීම

විද්‍යාව නිෂ්පාදන බලවේගයක් හැටියට සංයුක්ත වශයෙන් ප්‍රකාශ වන්නේ කෙසේද?

පළමුවැන්න, විද්‍යා ජයග්‍රහණය පුරෝගාමී කාර්මික ශිල්පය සහ තාක්ෂණික විද්‍යාව මගින් ක්‍රියාවට යෙදීමය. විද්‍යා ක්ෂේත්‍රයේ පූර්ණ අංශ (න්‍යාෂ්ටික බල නිෂ්පාදනය, රසායනික පොලිමෙයර, ක්ෂුද්‍ර ප්‍රාණීන් නිෂ්පාදනය, විද්‍යුත් ඉලෙක්ට්‍රොනික කර්මාන්තය සහ අනිකුත් කර්මාන්ත) නිෂ්පාදනයන් බවට පත්වී තිබේ. විද්‍යාවෙන් තොරව ඒවා ගැන සිතීමට පවා බැරිය. නිෂ්පාදනයට වඩ වඩාත් විද්‍යාව තාක්ෂණික ලෙස යොදගන්නා වූද, දැනීම ද්‍රව්‍යය බවට පත්කරන්නා වූද, යෝධමය පරීක්ෂාගාරය බවට පත්වෙමින් සිටී.

දෙවැන්න, විද්‍යාවේ ජයග්‍රහණ මිනිසා-නිෂ්පාදකයා තුළින්ද, ඔහුගේ දැනීමෙන්, දක්ෂතාවයෙන් වෘත්තීය පළපුරුද්දෙන්ද ක්‍රියාවට නැගීමය. සංකීර්ණ යන්ත්‍ර කරණයද, සමකාලීන සවයංක්‍රීය නිෂ්පාදනයද විසින් ශ්‍රමයේ බුද්ධිමත් හරය වැඩිකරන අතර කම්කරුවන්ගේ උසස් සංස්කෘතික, කාර්මික ශිල්පමය දක්ෂතාවයක් සහ වෘත්තීමය මට්ටමක් ඉල්ලා සිටිනු ලැබේ. නිෂ්පාදනයේ යෙදී සිටින කම්කරුවාට සමකාලීන දැනීමක් ලබා දෙන විද්‍යාව ඔහුගේ දක්ෂතාවය දියුණු කර ගැනීමටද, ශ්‍රම නිෂ්පාදනය උසස් කර ගැනීමටද, යුක්ති ප්‍රතිපාදනයේ සහ නව සොයාගැනීම්වල උනන්දු සහගතව ක්‍රියාකාරී වීමටද ආධාර කරයි.

තෙවැන්න, විද්‍යාත්මක ශ්‍රමය වඩාත් ස්ථිර ලෙසම ද්‍රව්‍යමය නිෂ්පාදනයේ ක්ෂේත්‍රයට කාවැදී නිෂ්පාදන ශ්‍රමය බවට පත් වන්නේය. ස්ථිර ලෙසම නිෂ්පාදනය තුළින්ද, කම්හල්, සමූහ හා රජයේ ගොවිපළවල්වලට ඒකාබද්ධ අති විශාල සංඛ්‍යාවක් විද්‍යා–පරීක්ෂණ, ක්‍රම සම්පාදක ආයතන, පර්යේෂණාගාර මගින්ද විද්‍යා සොයා ගැනීම් වඩාත් වැඩියෙන් කෙරේ. වෙනත් වචනවලින් කියතොත්, විද්‍යා ක්ෂේත්‍රය සමකාලීන නිෂ්පාදනයේ එක් මූලික වැඩ ශාලාවක් බවට පත්වී ඇත්තේය.

විද්‍යාව කෙළින්ම නිෂ්පාදන බලවේගයක් බවට පරිවර්තනය කිරීම ප්‍රධාන වශයෙන් යාන්ත්‍ර විද්‍යාව, භෞතික විද්‍යාව, රසායනික විද්‍යාව,

ජීව විද්‍යාව ආදී ප්‍රකෘති හා තාක්ෂණික විද්‍යාවලට අයත් කාර්යයකි. එහෙත් ඒ අතරම විද්‍යාවන් බොහොමයක්, විශේෂයෙන්ම ආර්ථික විද්‍යාව වඩාත් ක්‍රියාශීලී ලෙස නිෂ්පාදනයට කා වදී. උසස් ගණිත විද්‍යා ක්‍රම සහ ඉලෙක්ට්‍රොනික ගණිත යන්ත්‍ර පාවිච්චි කරමින් එම විද්‍යා විසින් නිෂ්පාදනය මෙහෙයැවීමටත්, ද්‍රව්‍යමය, ශ්‍රමික හා මූල්‍ය උල්පත් උපරිමය ලෙස ප්‍රයෝජනයට යෙදීමටත් පටන් ගෙන ඇත. සමකාලීන නිෂ්පාදනයේ අති විශාල පරිමාණ අනුව මෙය ඉතා වැදගත්ය. නිෂ්පාදකයින්ගේ අධ්‍යාත්මික ආකල්පය සහ ඔවුන්ගේ ලෝක දර්ශනය මත සාමාජයීය විද්‍යා ඇති කරන බලපෑම් ගැන අපි මෙහිදී සඳහන් නොකරමු.

විද්‍යාව සහ නිෂ්පාදනය අතර ඓන්ද්‍රියමය සම්බන්ධකම් උපයෝගිතාවාදී ලෙස අවබෝධ කැරගෙන විද්‍යාඥයින්ගෙන් වහාම නිෂ්පාදනය සඳහා අවශ්‍ය දෑ ඉල්ලා සිටීම නොකළ යුත්තකි. විද්‍යාව අද පැන නැගී තිබෙන හදිසි ප්‍රශ්න විසඳනවා පමණක් නොව, අනාගතය සඳහා ''සංචිත'' බිහිකිරීමද, සමාජ ප්‍රගතිය, විද්‍යාවේ හා තාක්ෂණිකයේ අලුත් මාර්ග ඇති කරන වැදගත් න්‍යායික ප්‍රශ්න විසඳීමද කළ යුතුය.

සමාජ ජීවිතයේ වැදගත් ක්ෂේත්‍රයක් වන විද්‍යාව ඉතා ඉක්මණින් වර්ධනය වේ. විද්‍යා සේවකයින්ගේ හා විද්‍යායතනවල සංඛ්‍යාව වැඩි වෙමින් පවතී. 1974 දී සෝවියට් සංගමයේ විද්‍යා සේවකයින්ගේ සංඛ්‍යාව එකොළොස් ලක්ෂ දහසය දහසකටත් වඩා වැඩි විය. 1914 රුසියාවේ සිටි සියලුම විද්‍යා සේවකයින්ගේ සංඛ්‍යාව 11,600 ක් පමණකි. ජාතික ආදායමට සහ කර්මාන්ත නිෂ්පාදනයට වඩා වැඩි වේගයකින් විද්‍යාව සඳහා මුදල් වැය කෙරේ.

සෝවියට් ජනතාවගේත්, කොමියුනිස්ට් පක්ෂයේත්, සෝවියට් ආණ්ඩුවේත් සැළකිල්ල නිසා සෝවියට් විද්‍යා ඉතා විශාල ජය ලබා ඇත. අජටාකාශය පිරික්සීමේදී ලත් ජය එය සුපැහැදිලි ලෙස ප්‍රකාශ කිරීමකි.

සෝවියට් විද්‍යාවේ හැකියාවන් තවම සිදී ගොස් නැත. ක්‍රම සම්පාදනයද විද්‍යා පරීක්ෂණ මෙහෙයැවීම සහ උත්තේජනයද උසස් කිරීම සඳහාත්, විද්‍යාවේ ආර්ථික සහ සමාජයීය ප්‍රතිඵල උසස් කිරීම සඳහාත් කොමියුනිස්ට් පක්ෂය සහ සෝවියට් ආණ්ඩුව විශාල සැලකිල්ලක් දක්වති. විද්‍යාව සහ නිෂ්පාදනය අතර ඇති සම්බන්ධකම් ශක්තිමත් කරීමට සහ වර්ධනය කිරීමටත්, විද්‍යා–නිෂ්පාදන ව්‍යවසායයන් සහ සංකීර්ණ විද්‍යායතන සෑදීමටත් විශේෂ අවධාරණය යොමු කෙරේ. පර්යේෂණ, ඉදිකිරීම් හා නිෂ්පාදන සියලු වැඩ කටයුතුද, විශාල කම්හල්වලට සම්බන්ධ විද්‍යා-පරීක්ෂණ ආයතන මගින්

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

අලුත් භාණ්ඩ තොග වශයෙන් නිපදවීමද මේ වැඩ පිළිවෙලට අයත් වේ. සැළැස්මානුකූල ආරම්භය සියුම් කිරීම — විද්‍යා පර්යේෂණවල ප්‍රතිඵලදායකත්වය සහ සම්භාවිතයේදී ඒවා ඉක්මනින් ක්‍රියාවේ යෙදවීම උසස් කිරීමේ පූර්ව කොන්දේසිය වන්නේය.

විද්‍යාවේ බලපෑම යටතේ නිෂ්පාදන බලවේගයන්ගේ වර්ධනයේ ඇතිවූ විප්ලවය වඩාත් වැදගත් හා ගැඹුරු වන බව සෝවියට් සංගමයේ කොමියුනිස්ට් පක්ෂයේ 24 වැනි සම්මේලනයට මධ්‍යම කාරක සභාව විසින් ඉදිරිපත් කරන ලද වාර්තාවෙහි සඳහන් වේ. ඓතිහාසික වැදගත් කාර්ය භාරයක් ඉන් පැන නගී. ''විද්‍යා–තාක්ෂණික විප්ලවයේ ජයග්‍රහණයන් සමාජවාදී ආර්ථික ක්‍රමයේ වාසිය සමග ඓන්ද්‍රියමය වශයෙන් එකට වෙළිය යුතුය. සමාජවාදයට ආවේණික ලක්ෂණයක් වන විද්‍යාව හා නිෂ්පාදනය එකට සම්බන්ධකිරීම තවත් පුළුල් කළ යුතුය.''* 25 වැනි සම්මේලනය පෙන්වා දුන් පරිදි එම කාර්ය භාරය හදිසි දෙයක් බවට පත්වී තිබේ.

සෝවියට් ජනතාවද විද්‍යාඥයෝද, විශේෂඥයෝ සහ කම්කරුවෝද කොමියුනිස්ට්වාදී දර්ශනයෙන් ආශ්වාදය ලැබ, කොමියුනිස්ට් පක්ෂයේ හා සෝවියට් ආණ්ඩුවේ නිත්‍ය සැලකිල්ල හා ආධාරය ලබාගනිමින් තමන් ඉදිරියේ ඇති භාරදූර කර්තව්‍යයන් සපුරාලීමේ දැඩි අධිෂ්ඨානයෙන් ක්‍රියා කරති.

---

* ''සෝවියට් සංගමයේ කොමියුනිස්ට් පක්ෂයේ 24 වැනි සම්මේලනයේ ලියවිලි'', රුසියන් මුද්‍රණය, පිටුව 57.

සමාප්තිය

යථාර්ථය දැනගැනීම සහ විස්තර කිරීමට සමත් එකම විද්‍යාත්මක න්‍යායය සහ විධිය මාක්ස්-ලෙනින්වාදී දර්ශනය ය. ලෝකය ස්වභාවයෙන්ම ද්‍රව්‍යමය බවත්, එහි හැම දෙයක්ම වෙනස් වී වර්ධනය වී පහළ සිට ඉහළ දක්වාත්, පැරණි දේ සිට අලුත් දේ දක්වාත් නොනැවැත්විය හැකි සේ ඉදිරියට යන බවත් එම දර්ශනය නොබිඳිය හැකිසේ ඔප්පු කරයි. ලෝකය පිළිබඳව සැබෑ චිත්‍රයක් ඉදිරිපත් කරන, ප්‍රකෘතියේ හා සමාජයේ වර්ධනය පිළිබඳ වඩාත් පොදු නියාමයන් හෙළිකරන, මාක්ස්–ලෙනින්වාදී දර්ශනය විප්ලවීය ක්‍රියාකාරිත්වයේ බලගතු අවියක් වන්නේය. ඉතිහාසයේ වාස්තවික දයලෙක්තිකය පිළිබිඹු කරන එම දර්ශනය මාක්ස්වාදී පක්ෂයේ උපාය හා උපක්‍රම වල න්‍යායික පදනම ලෙස ක්‍රියා කරයි. සමාජ සංවර්ධනයේ ප්‍රතිවිරෝධිතා පිළිබඳව ගැඹුරු විශ්ලේෂණයක්ද, ඓතිහාසික ප්‍රගමනයේ වුවමනාවන් සඳහා එම ප්‍රතිවිරෝධිතාවයන් හෙළිකොට නිසි වේලාවට ඒවායේ බාධාවලින් බේරීමට ඇති හැකියාවක්ද, ඉතා වැදගත් සමාජයීය ප්‍රශ්න විසඳීමේදී සංයුක්ත ඓතිහාසික ආකල්පයක්ද, සමාජයේ අලුත් දේ දැන හැඳිනගෙන එහි ජයග්‍රහණය සඳහා ක්‍රියා කිරීමේ කලාවද යන මේවා සමාජය විප්ලවවාදී ලෙස වෙනස් කිරීම සඳහා යෝධමය පරිමාණයක සංවිධාන වැඩ කරන මාක්ස්වාදී පක්ෂයක මූලධර්මයන් වන මාක්ස්වාදී දයලෙක්තිකයේ ඉතා වැදගත් අංගයන් වන්නේය. ධනවාදී දෘෂ්ටියත්, සංශෝධනවාදයට සහ ආධාන ග්‍රාහීත්වයටත්, ජාතිවාදයට සහ අන්තවාදයටත් විරුද්ධව කම්කරු පංතිය ගෙනයන සටන්වලදී මාක්ස්වාදී දර්ශනවාදය තියුණුතම න්‍යායික අවියක් වන්නේය.

මාක්ස්–ලෙනින්වාදී දර්ශනවාදය සැදජීවය සහිත නිර්මාණශීලී විද්‍යාවකි. එය එක තැනෙක නොනවතී. වෙනස්වන ජීවිතය සමග

LIBERATIONBASE
https://liberationbase.wordpress.com

එය නිරන්තරයෙන්ම ඉදිරියට ගමන් කරමින්, විද්‍යාවේ සහ සමාජ-ඓතිහාසික සම්භාවිතයෙන් පෝෂණය වෙයි. මහා සමාජ පෙරළි ඇතිවූ තත්වයන් යටතේද, මිනිස් සංහතිය ධනවාදයේ සිට සමාජවාදය කරා පරිවර්තනය වන යුගයේදීද, ප්‍රකෘති විද්‍යාවේ අලුත්ම විප්ලව ඇතිවූ කාලයේදීද මාක්ස්වාදය මත පිහිටා කටයුතු කළ ශ්‍රේෂ්ඨ ලෙනින් එය වර්ධනය කෙළේය.

මාක්ස්ගේ උගැන්වීම් අනභිභවනීය වන්නේ එය සත්‍යය නිසා යැයි වි. අයි. ලෙනින් ලියුවේය. ලෝකයේ ඇතිවූ ශ්‍රේෂ්ඨ විප්ලව සහ සමාජවාදී සමාජ නිර්මාණ කිරීමත් විසින් මාක්ස්වාදයේ සත්‍යතාවය ජීවිතයෙන් හා සම්භාවිතයෙන් ඔප්පු වී ඇත. ජගත් සමාජවාදී රාෂ්ට්‍ර පද්ධතියක් බිහිවීමද, සෝවියට් සංගමයේ සමාජවාදය සම්පූර්ණ ලෙසත්, ස්ථිර ලෙසත් ජයගෙන තිබීමද, මිනිස් සංහතිය දීප්තිමත් කොමියුනිස්ට්වාදය කරා නොසැලී ගමන් කිරීමද මාක්ස්-ලෙනින්වාදී චින්තනයේ ජයග්‍රාහී බල මහිමය ස්ථිර ලෙසත්, අවිවාද ලෙසත් ඔප්පු කොට ඇත.

LIBERATIONBASE

https://liberationbase.wordpress.com

LIBERATIONBASE
ඩිජිටල් පුස්තකාලය

ඩිජිටල් පුස්තකාලය සහ ලේඛණ සංරක්ෂණ ව්‍යාපෘතිය
ආරම්භය (***NMSG Library*** ලෙස): 2010
LIBERATIONBASE ලෙස නැවත නාමකරණය: 2013

සූචිකරණ දත්ත

කෘතිය: මාක්ස්වාදී දර්ශනයේ මූලධර්ම
කතෘ/පරිවර්තක: වී. ජී. අපනාසියෙව්/ ඇදිගම. වී. රුද්‍රිගු
ප්‍රකාශක: ප්‍රගති ප්‍රකාශක මන්දිරය, මොස්කව්
පළමු ඩිජිටල් පළ කිරීම: 2016-05-07
ඩිජිටල් සංස්කරණයන්: V1:2016-05-07, V2:2019-05-31
පිටු ගණන: 225
භාෂා මාධ්‍ය: සිංහල
ගොනු ආකෘතිය: PDF

Web: https://liberationbase.wordpress.com
Email: slradical@ymail.com